විස්තර ගැටපදවිවරණ·

සහිත

# සිදත්සඟරා භාවසන්නය.


විද්‍යෝදය පරිවෙණාධිපති

කහවේ ශ්‍රී සුමඞ්ගල රතනසාරාභිධාන

කොළඹ නවකෝරලේ

ප්‍රධාන සඞ්ඝනායක මාහිමියන්වහන්සේ

විසින්

ලියන ලදී.



තච්ඡිෂ්‍ය

කදුරුපොකුණේ

වෛද්‍ය- ඩී. ඇන්. ඩබ්ලිව්. කුමාරසිංහ

විසින්



මහාබෝධි යන්ත්‍රාලයෙහි මුද්‍රණය කරවා
ප්‍රසිද්ධ කරණලදි.

ශ්‍රී බු. ව. 2472.
ක්‍රි. ව. 1929.

# SIDATSANGARĀ BHĀVA-SANNAYA,

(A Detailed Commentary on the Sidatsangara)

BY

**THE VEN. KAHAVE SIRI SUMANGALA RATANASARA.**

*Chief Elder of Colombo and the Nine Korales,*
*Principal of the Vidyodaya Parivena,*

*COLOMBO.*

---

PUBLISHED BY

**D. N. W. Kumarasinha of Kadurupokuna,**

**Physician.**

---

MAHA-BODHI PRESS.

2472.
1929.

# PREFACE.

For nearly eight hundred years the Sidatsangara has maintained its position as the text-book and vademecum of all students of Sinhalese and no effort is necessary, therefore, to introduce it to those interested in the language. Though very small in bulk, the wide range of its contents and the uniqueness of its method of their treatment have raised the work to the rank of the world's greatest grammatical treatises. Within its succinct aphorisms are to be found all the elements of grammatical science, such as can be gleaned from other similar works only after prolonged study and tedious search. Anawamadarsi's work, therefore, has special claim to the love and esteem of a grateful nation.

The great terseness of the original paraphrase, written to the Sidatsangara, was a serious disadvantage to modern students, who wished to master the work. This drawback was removed, in recent times, with the help of various detailed expositions of the original, written by eminent men of learning, among whom was the Ven. Hikkaduve Siri Sumangala, Nayaka Thera, who thereby earned the lasting gratitude of all students of Sinhalese.

Of late, however, differences of opinion have arisen with regard to the correctness of some at least of the statements contained in the Sidatsangara, and many problems of linguistic importance, treated of therein, have formed subject for debate. I was, therefore, urged by Dr. G. P. Malalasekera, himself a close student of the Sidatsangara, to undertake a detailed paraphrase, as a further contribution to the proper understanding and appreciation of this valuable work. I am glad to say that I have had no occasion to disagree either with the views originally expressed by the author of the Sidatsangara himself or with the explanations given of them by my

commentarial precursors. Nevertheless, it is quite possible that some of the interpretations I have given will not find favour with those who assert that Anawamadarsi's work abounds in error. Their applause has not been my ambition, and if this effort should in any slight degree prove of help to students of the Sidatsangara, that would be my more than ample reward.

I do not propose to catalogue here the excellences of Vedeha's grammar; a perusal of the following pages will, I venture to hope, convince depreciative critics that Vedeha's was a mighty intellect and that what they consider his lapses appear to them so only because of their misunderstanding. But I should like to draw the special attention of readers to the superiority of the nomenclature adopted by him over those used by Pali and Sanskrit grammarians. No better examples of this can be found than in the chapters on Samasa (Compounds) and Piyadu Kiriya (Causative verbs.) Explanations of these and other points raised will be found in the main thesis.

It remains for me to acknowledge my indebtedness to my pupil and colleague the Ven. Baddegama Piyaratana Thera, Vice-Principal of the Vidyodaya Parivena, who helped me with his valuble opinions on various subjects that came up for discussion.

**K. Ratanasara.**

Vidyodaya Parivena.

2472.
25 March 1929.

# සංඥාපනය.

ශතවර්ෂ අටක පමණ කාලයේ පටන් මෙතෙක් කල් හෙළදිව් බස වියරණවිදි උගතුන්ගේ අසහාය ගුරුවරයා සිදත්සඟරාව බැවින් සිංහලයන්ට සිදත්සඟරාව හඳුන්වා ලීමට ප්‍රයත්න කිරීම අනාවශ්‍යක යයි සිතමු. සිදත්සඟරාව ග්‍රන්ථප්‍රමාණයෙන් අතිසංක්ෂිප්ත නමුදු ග්‍රථිතප්‍රමාණයෙන් හා රචනාවිලාසයෙන් අතිශය ගුරුත්වයක් උසුලන්නේ වේ. සිදත් සඟරා පොතේ පිටු පසක් නිසිලෙස ඉගෙණීමෙන් ලැබෙන ව්‍යාකරණ ශාස්ත්‍රඥානය අන්වියරණ පොතක පිටු පණසක් පමණ ඉගෙණීමෙනුත් නො ලැබෙන බැව් වියරණ තතු දන්නෝ දනිති. එබැවින් කෘතඥ වූ සකල සිංහලයන් විසින් සිද්ධාන්ත සඞ්ග්‍රහ කර්තෘභූත අනවමදර්ශි මහාස්ථවිරපාදයන් වහන්සේගේ ශ්‍රීනාමය නිතර මෙනෙහි කිරීමෙන් ගරු කොට සැලකිය යුතුයි.

සිදත්සඟරාවට ලියනලද පුරාණ සන්නය අතිසංක්ෂිප්ත බැවින් ආධුනිකයන්ගේ ඉගෙණීමට පමණ නොවේ යයි සලකා පසුව ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය හික්කඩුවේ ශ්‍රීසුමඞ්ගලාභිධාන අපේ නායක හාමුදුරුවන්වහන්සේ ආදි මහාපණ්ඩිත රත්නයන් විසින් ලියනලද ඉතා ගරුකටයුතු වූ සවිස්තර පදගතාර්ථව්‍යාඛ්‍යානයන්ගෙන් කලක පටන් ආධුනිකයෝ සුවසේ සිදත්සඟරාව උගණිත්. එබැවින් උන්වහන්සේලාගේ ශ්‍රීනාමයෝ ද සියලුදෙනා විසින් ම කෘතඥතා පූර්වක ව නිතර ගෞරවයෙන් මෙනෙහි කටයුතු වෙත්.

තවද සිදත්සඟරාව සුපරීක්ෂ්‍යකාරී ව පරිශීලනය කළ ශාස්ත්‍රාචාර්ය ජී. පී. මලලසේකර මහතා-තවමත් සිදත්සඟරාවේ ආධුනිකයන්ට දුරවබෝධ වූ ගැටමුසු තැන් ඇති බැවිනුත්, දැන් ඇතැම් අය සිදත්සඟරාව දෝෂයන්ගෙන් ගහන වූ පොතක් යයි පළකරණ බැවිනුත්, එයින් ආධුනිකයන් සංශයාපන්න ව සිටින බැවිනුත්, සිදත්සඟරාවේ ඒ ඒ වියරණවිදි ආධුනිකයන්ට සුඛාව බෝධ වන පරිද්දෙන් භාවසන්නයක් ලියතොත් මැනවැ යි ආරාධිත හෙයින් මෙසේ මේ සන්නය ලියන්නට අදහස් විය. මෙහි ඒ ඒ කරුණු විස්තර කිරීමේදී අපට ද ග්‍රන්ථකර්තෘපාදයන්ගේ හා ව්‍යාඛ්‍යාන කර්තෘපාදයන් වහන්සේලාගේ මතයන්ට විරුද්ධ වන්නට ඉඩ නොලැබිත. එහෙත් ඇතැම් කාරුණු පිළිබඳ අපගේ

ඇතැම් අදහස් සිදත්සඟරාව දෙෂයෙන් ගහනය යි ගෙණ සිටින්නවුන්ගේ අමනාපයට මුත් මනාපයට හෙතු නොවේ යයි සිතමු. ඉන් අපට කම්කිම? අපගේ ප්‍රයත්නය ආධුනිකානුග්‍රහය පිණිසයි.

දෙස් කිම නම් ඉතා පහසු කටයුත්තෙකි. ලක්වැස්සෝ අන්‍යයන්ගේ කෘතිවලට දෙස් කියන්නට ඉතා සමත්හු වෙති. ග්‍රන්ථරචනාදිය තබා කවදවත් පත්‍ර සඟරා ආදියකට ලියුම් කෑබැල්ලක් පමණ වත් නොලියූ අය ද දෙස් කිමට නම් දක්‍ෂයෝ වෙත්.

ශාස්ත්‍රඥතාය ඇති ඇතැම් අය ද සූක්‍ෂ්මබුද්ධිමතුන් තමතමන්ගේ ග්‍රන්ථයන්හි කරණලද සූක්‍ෂ්ම ග්‍රන්ථනයෝ ඒ ඒ අයගේ අදහස්වලට සම නොවෙත් නම් එබඳු ග්‍රන්ථනයෝ සදෙස් යයි කියති. ඇතැම්හු තමන්ගේ ඥනයට විෂය නොවන දේ සදෙස් යයි කියති. එබඳු ඇතැම්හු බුද්ධධර්මයේ පවා තමන්ට නොවැටහෙන තැන් ද සදෙස් යයි කියති.

සිද්ධාන්ත සඞ්ග්‍රහ කර්තෘපාදයන් ව්‍යාකරණ ශාස්ත්‍ර විෂයෙහි අතිසූක්‍ෂ්මබුද්ධිමත් උතුමකු බවත්, අන්‍යයන් බොහෝ කරුණු රැසක් පළ කොට අවබොධ කරවන වියරණ විදි නාමමාත්‍රයෙන් අවබොධ කරවීමෙහි නිපුණවූවකු බවත්, ස්වල්පයෙකින් රාශියක් ඉගෙණිය හැකිලෙස ග්‍රන්ථරචනාකිරීමෙහි ශ්‍රෙෂ්ඨයකු බවත්, සිදත් සඟරුවෙන් දතහැකි වේ. ඒ පැවසීමට උන්වහන්සේ සිදතෙහි කළ නාම ව්‍යවහාර කීපයක් මෙහි ගෙණහැර දක්වමු. සිදත සමාස විෂයෙහි "වෙසෙසුන්සමස්, විබත්සමස්, අන්අරුත්සමස්, දඅරුත් සමස්" යන මොහු උන්වහන්සේ කළ නාමව්‍යවහාරයෝ වෙත්. මොවුන්ගේ නාමමාත්‍රයෙන් ම ඒ ඒ සමාසයන්ගේ තත්ත්වය වටහා ගතහැකි වේ. "කර්මධාරය, තත්පුරුෂ, බහුව්‍රිහි, ද්වන්ද්ව" යන මොහු අන්‍යයන් කළ නාමව්‍යවහාරයෝ යි. මේ නාමයන්ගෙන් ඔවුන්ගේ තත්ත්වය වටහා ගැණීම තබා වටහා ලීම වත් දුෂ්කර බැව් කවරෙකුට නම් නොවැටහේද?.

ක්‍රියාධිකාරය පිළිබඳ ව අනුශාසනය කරන්නා වූ සියලු වියරණ කතුවරයෝ ම කෙසේ නුමුත් ධාත්වර්ථ සඞ්ඛ්‍යාත ක්‍රියාව කර්තෘ කෙනෙකුගෙන් සිද්ධවියයුතු බැවින් පළමු කොට එක් කර්තෘ කෙනෙකුගේ ස්වප්‍රාධාන්‍යයෙන් ක්‍රියා සිද්ධිය වීමේදී යෙදෙන ක්‍රියාරූපයන් දක්වා ඉක්බිති ස්වප්‍රාධාන්‍යයෙන්ම නොව අනෙකකුගේ මෙහෙයීම ලැබූ කර්තෘ කෙනෙකුගෙන් වුවත් ක්‍රියාසිද්ධිය වියහැකි බැවින් එසේ ක්‍රියා සිද්ධිය වීමේදී යෙදෙන ක්‍රියාරූප විශෙෂය පිළිබඳ ව අනුශාසනය කළහ. සිදතෙහි එසේ අනුශාසනය කරන්නාහු ඒ ක්‍රියාවිශෙෂයට "පියදූ" කිරියයි නම් කළහ. හෙද ඉතා පැසසිය

යුතුනමෙකි. ක්‍රියා සිඞිවිෂයෙහි කර්තෘ දෙදෙනෙකුන් යෙදෙන තන්හි ඉන් එකෙක් ප්‍රයෝජක නම් ද එකෙක් ප්‍රයෝජ්‍ය නම් ද වේ. එහි ප්‍රයෝජක තෙමේ අනෙකා ක්‍රියාවෙහි හෙවත් ධාත්වර්ථයෙහි යොදන්නේ වේ. ප්‍රයෝජ්‍ය තෙමේ ඒ මෙහෙයීම ලබා ධාත්වර්ථය සිඞ කරන්නේ වේ. යමෙක් ධාත්වර්ථසඞ්ඛ්‍යාත ක්‍රියාව සිඞ කෙරේ නම් ඒ ක්‍රියාව ඔහු පිළිබඳ වේ. පියදූ යන්නෙහි අර්ථය ප්‍රයෝජ්‍ය කර්තෘ යනු යි. එබැවින් පියදූහුගේ කිරිය=පියදූකිරිය නම් වේ. ඇතැම් අයට පියදූ කිරිය ප්‍රයෝජකයාගේ යයි ද සිතිය හැකි වේ. එසේ ගතහොත් පියදූකිරිය පදයෙන් මෙහෙයීම් මාත්‍රය ම මුත් ධාත්වර්ථසිඞියෙක් නොපැවසේ. ප්‍රයෝජකයා මෙහෙයීම පමණක් ම මුත් ධාත්වර්ථසඞ්ඛ්‍යාත ක්‍රියාව නො කරන්නකු බැවිනි. ප්‍රයෝජ්‍යයාගේ ක්‍රියාව පියදූකිරිය යයි ගතහොත් පියදූ කිරිය පදයෙන් මෙහෙයීම හා ධාත්වර්ථසිඞිය යන දෙකම පැවසේ. ප්‍රයෝජ්‍යයා මෙහෙයීම ලබා ක්‍රියාව කරන්නකු බැවිනි. මේ මෙසේ හෙයින් "පියදූ" යන්නෙහි අර්ථවිවරණය කරන්නා වූ සිදත්කතුපානෝ "පරා විසින් මෙහෙයන ලදහු කිරිය පියදූ කිරිය නම්" යනු කිහු. මේ අර්ථවිවරණය ද ඉතා මනහර වේ. ඒ ඒ තන්හි අනෙකකුගේ මෙහෙයීම ලැබීමෙන් ක්‍රියා සිඞිය වන බැවි ක්‍රියාරූපයෙන් හඳුන්වනු වස් සිහල වහරෙහි ධාතු කෙරෙන් 'ව' ප්‍රත්‍යය යෙදීම සිඞයි.

මෙහි කිරියඅදියරෙහි පියදූකිරිය වැණුමේදී මේ පිළිබඳ විස්තරය පැවසුම්හ. එහෙත් සිදත් කතුපානන්ගේ නාමව්‍යව හාර අර්ථවිවරණ ආදියෙහි ශ්‍රෙෂ්ඨභාවය පැවසීමට මෙහි දු මේ ටික ලියන්නට වුවමනා විය.

තවද අපගේ මේ කෘතියෙහි ඇතැම් කරුණු විනිශ්චය කර ගැණීම් ආදියෙහි දී අසමවිශිෂ්‍යායමාණ විද්‍යෝදය පිරිවෙණේ උප ප්‍රධානාචාර්ය බද්දේගම පියරතන ස්ථවිරයන් සහාය වූ බැව් කරුණා සහගත ව මතක් කරමි.

තවද අපේ මේ සන්නය මුද්‍රණයෙන් පසු නැවත නැවත බලන කල්හි අක්ෂරයෝජකයන්ගේ හා අපගේ ද ප්‍රමාදයෙන් සඤ්ජාත වූ ඇතැම් ස්වල්ප විෂමස්ථාන ඇති බැව් පෙණේ. 170 වෙනි පිටේ "දූවිනි" යන්නෙහි ධාතුව "දූ-දූමෙහි" යි විය යුතු යි. ඒ "දව" යි වැටී තිබේ. තවත් මෙබඳුතැන් හා අප අදහස්වලට නො සම තැන් ද ඇතිවිය හැකි වේ. එබඳු තැන් ඇතිවුවොත් ඒ සියල්ල ම මිතීය මුද්‍රණයෙහි දී සකස්කරණ බැව් සැලකිය යුතු යි.

1. සිරිගන මුනි පහන් - මසින් පහයෙහි දල්වා,
සිහලබස රජ වන් - පතිරජ පිරුවනදිපති.

2. විදුදය පහන් වැඹ- සිටුවා කොළොම් පුරවර,
එකෙලි කොට මුලුලකා- සඟ පැමිණී විදුකැල්මෙන්.

3. තෙවලා වදහිසුරු- සිරිසුමඟුල් මාහිමි,
සිරිනැහිසුරු සමිඳු- විදුදය හිමි ව විදු දුන්.

4. සොණුතුරුතෙරිඳුසඳ- සියගුරු හිමි ද සඟපත්,
සිහි කරා නිතර ගුරු- බැතියෙන් පෙරදුරන් හා.

5. සිදත්සඟරාහව්- වියකන ලියා නිම සොනළ,
බුදුවසිනි දෙදහස්- සිවුසිය දෙසැත්තැවසැ.

6. මැදින් මස පුණුපෝ- සඳුදිනා විදුදයදිපති,
සිරිසුමඟුල් රුවන්- සරනාතෙරිඳු කහවේ.

7. විදුදය පිරිවෙණෙහි- උපපදනැදුරුපද පත්,
යති පියරුවන් නම්- ඉවහල් විය මතැතෙනි.

8. "මැපෙළ පමණ සිඹි- කිවිමත් දනන් පසසන,
ගරහත යළිදු කම් කිම්- පඬුවෝ ම මෙහි පමණෝ",.

ඛහවේ රතනසාර
ශාසනස්ථවිර.

2472/1929 මාර්තු 25,
විද්‍යෝදය පිරිවෙණේ දී ය.

卐

# අනුක්‍රමණිකාව.


| විෂය. | පිට. |
| --- | --- |
| ඉටුදෙව් සිහිකිරීම | 1 |
| පදත් සුතුර | 3 |
| වියරණවිදි නම් | 6 |
| සත් විදිය හැදින්වීම | 7 |
| පණකුරු ගතකුරු ආදිය | 9 |
| වණවිනිස | 11 |
| සදවිදිය හැදින්වීම | 14 |
| ලිඟුවිදිය හැදින්වීම | ,, |
| විබත් විදිය ,, | 16 |
| සමස් විදිය ,, | 18 |
| පියවි විදිය ,, | ,, |
| පස විදිය ,, | 22 |
| කිරිය විදිය ,, | 23 |
| ලොප්විදිය ,, | ,, |
| අදෙස් විදිය ,, | 24 |
| අගම් විදිය ,, | ,, |
| පෙරරූ විදිය ,, | 26 |
| දෙරූ විදිය ,, | ,, |
| පෙරළි විදිය ,, | 28 |
| පිළිපෙරළිය ,, | 29 |
| වණපෙරළිය ,, | ,, |
| පදපෙරළිය ,, | 30 |
| විබත්පෙරළිය ,, | ,, |
| කිරිය පෙරළිය ,, | ,, |
| වැඩිවිදිය ,, | 31 |
| අඩුවිදිය ,, | 32 |
| නිපාවිදිය ,, | 33 |
| නියම් අනියම්විදි ,, | 37 |
| අවිදුමන් විදිය ,, | 38 |
| ශබ්දභෙද | 39 |
| දූසද හැදින්වීම | 40 |
| දූවිසද | 42 |
| ගුණසද | ,, |
| කිරියසද | 43 |
| සත්සද | 44 |
| අනුරූත්සද | 45 |
| අරූණුසද | 46 |
| හකර විනිස | 47 |
| අදෙස් හකර | ,, |
| අගම් හකර | 48 |
| පියවිහකර | 49 |
| පණකුරුපා | ,, |
| පණකුරුහකර දෙකාට සම්පා | 50 |
| සදඅදියර | 51 |
| පෙරසර ලොප්සද | 52 |
| පරසරලොප්සද | 53 |
| සරසද | ,, |
| සරදෙස්සද | 54 |
| ගතදෙස්සද | 55 |
| පෙරරූසද | 56 |
| ගතකුරුලොප්සද | ,, |
| අගම්සද | 57 |
| දෙරූසද | ,, |
| ලිඟුඅදියර | 58 |
| ප්‍රාණීවාචක ලිඞ්ග | 59 |
| අප්‍රාණීවාචක ලිඞ්ග | 60 |
| ස්ත්‍රීප්‍රත්‍යය | ,, |
| ස්ත්‍රීප්‍රත්‍යයවත් අභිඛ්‍යා | 61 |
| ,, ,, ,, ගුණශබ්ද | ,, |
| ,, ,, ,, පුරුෂවාචක | 62 |
| අ ආ ඊ ප්‍රත්‍යයවත් ස්ත්‍රීශබ්ද | ,, |
| වහරයෙදනසේ පස යෙදීම | 63 |
| විලිඞ්ග සමශබ්ද | 64 |
| අරූත්: භව්: කිරිය ලිඟුබේ | 66 |
| අලිඟු සද | ,, |
| කිරියවෙසෙසුන් තතු | 67 |
| නිපාසද | 68 |
| උපසගසද | ,, |
| විබත් අදියර | 71 |
| සරඅත්හලත් සද | 72 |
| විබත් අදියර විනිස | ,, |
| පෙරවිබත් සුතුර | 74 |
| කම් විබත් ,, | 78 |
| කතුවිබත් ,, | 85 |
| කරණ විබත් ,, | 90 |
| සපදන් වීබත් ,, | 93 |
| අවදි විබත්සුතුර | 98 |
| සබඳවිබත් සුතුර | 104 |
| අදරවිබත් සුතුර | 108 |
| අලප්විබත් සුතුර | 114 |
| විබත්පස වෙසෙස් | 116 |
| සමස් අදියර | 120 |
| සාමාන්‍ය සමාස ලක්ෂණ | ,, |
| සමස් විනිස | 121 |
| සමස්බේ | 123 |
| අවියසමස් සුතුර | ,, |
| යව් ඇ සමස් | 125 |
| කු ඇසමස් | 126 |

| විෂය. | පිට. |
|---|---|
| ප ඈ සමස් | 127 |
| න අරුත් සමස් | 128 |
| විබත් සමස් සුතුර | 130 |
| කම්විබත් සමස් | ,, |
| කතු විබත් ,, | 131 |
| කරණවිබත් ,, | 132 |
| සපදන්විබත් ,, | 133 |
| අවදි විබත් | ,, |
| සබඳ විබත් ,, | 135 |
| අදර විබත් ,, | ,, |
| වෙසෙසුන් සමස් සුතුර | 136 |
| අන්අරුත් සමස් සුතුර | 139 |
| ද අරුත් සමස් සුතුර | 143 |
| වෙසෙසුන් වෙසෙස් අදියර | 145 |
| වෙසෙසුන් වෙසෙස් ලකුණු | ,, |
| තුල්‍යාධිකරණ විශෙෂණ | 149 |
| භින්නාධිකරණ විශෙෂණ | ,, |
| කිරිය අදියර | 151 |
| අකර්මක සහ සකර්මක ධාතු | ,, |
| කාරක වශයෙන් ධාතු නියමය | 153 |
| පුරුෂ භෙදය හා කාල භෙදය | 154 |
| තෙකල් අන්කරුපස සුතුර | 156 |
| අයුඅන්කරු එකරුත කිරිය | ,, |
| වත්මන් අන්කරු එකරුත කිරිය | 157 |
| අනාඅන්කරු එකරුත කිරිය | 158 |
| අයුඅන්කරු බුහුබස් | .. |
| වත්මන් අන්කරු බුහුබස් | 159 |
| අනාඅන්කරු බුහුබස් | 160 |
| තසද මසද කරුසුතුර | 161 |
| තෙකල් තසදකරු කිරිය | ,, |
| තෙකල් මසදකරු කිරිය | 162 |
| සදදහම්ත්වූ කිරිය වෙසෙස් | 163 |
| කිරියබේ | 165 |
| පියදුකිරිය | 166 |
| විදිකිරිය | 170 |
| ආසිකිරිය | 172 |
| කම්කිරිය | 173 |
| කම්කිරිය වෙසෙස් | 176 |
| අසබහව් කිරිය | 179 |
| පෙරකිරිය හා මුසුකිරිය | 181 |
| පෙර කිරිය නිදසුන් | 182 |
| මුසුකිරිය නිදසුන් | 184 |
| පසරුත් අදියර | 185 |
| පසරුත් සුතුර | 186 |

| විෂය. | පිට. |
|---|---|
| සකරු අරුත් හා හව්නතු | 187 |
| කම්කරුපසින් නිපන්සද | ,, |
| කතුකරු පසින් නිපන් සද | 189 |
| කම්කතු දෙකට සමසද | 191 |
| කරණකරු නිපන්සද | 193 |
| සපදන් කරු ,, | ,, |
| අවදි කරු ,, | ,, |
| අදරකරු ,, | ,, |
| හව්පසින් නිපන්සද | 194 |
| නොමෙන්නිපන් පසරුත්සද | 195 |
| වුත් අවුත් අදියර | 199 |
| හුදුකිරිය පෙදෙන් වුත් අවුත් | 200 |
| අකම්කිරියනෙන් වුත්කත | ,, |
| සකම්කිරියනෙන් වුත්කතු | ,, |
| අරුත්කිරියනෙන් වුත්කම් | 201 |
| කිරියකරු සබඳ අදියර | 203 |
| අලඞ්කාර කාණ්ඩය | 206 |
| ඉටුනිටුගණ | ,, |
| ඉටුනිටුවණ | 210 |
| ඉටුනිටුයොත් | 211 |
| අඹතල චක්‍රය | 212 |
| පදීදුබා දෙස් | 213 |
| පුනරුත් දෙස් | ,, |
| විරුදුඅරුත් ,, | 216 |
| උපිළිවෙළ | 218 |
| නේදෙස් | 219 |
| අසබහව් | 220 |
| ගුළුඅරත් ,, | 221 |
| බුන්ලිඟු ඈදෙස් | 222 |
| ලකර අදියර | 226 |
| උවම් උවමේ ලකුණු | 227 |
| වස්තූපමාලඞ්කාරය | ,, |
| අද්භූතොපමාව | 228 |
| ශෛලෙෂොපමාව | ,, |
| නින්දොපමාව | 229 |
| විරුද්ධොක්තිය | 230 |
| උභය භාෂාලඞ්කාරය | 231 |
| නින්දා ප්‍රශංසාව | 233 |
| අන්‍යාලාපය | ,, |
| උත්‍ප්‍රෙක්ෂාව | 235 |
| රූපකාලඞ්කාරය | ,, |
| හෙතුරූපකය | 237 |
| කර්තෘනාම ශාස්ත්‍රනාම ගර්භචක්‍රය | 239 |

## විස්තර ගැටපදවිවරණ

සහිත

# සිදත්සඟරා භාවසන්නය.

### නමව් මුනිසරණං.

ඉටුදෙව් සිහිකිරීම.

1. **මහද * හඳකිලි කැරැ-සව්නේ ගෙවා දත්හට,**
**දුහුනත් දැනුම් සඳහා-කරණෙම සිදත්සඟරා.**

සාධු ගුණයෝ ම ශිෂ්ටසම්මත වෙත්. සච්චරිත්‍රපාත්‍රත්වය සාධු ගුණයෙකි. ග්‍රන්ථකරණාදි විශිෂ්ටකාර්‍ය්‍යාරම්භයෙහි ඉෂ්ටදෙවතානුස්මරණය පූර්වදෙශීයයන්ගේ සච්චරිත්‍රයෙකි. එයිනුදු ප්‍රාරබ්ධ කාර්‍ය්‍යයාගේ අවිඝ්න පරිසමාප්තිය ඔවුහු තත්ප්‍රයෝජනත්වයෙන් සලකත්. එබැවින් සිද්ධාන්තසඞ්ග්‍රහ කර්තෘපාදයෝ ද ස්වකීය ග්‍රන්ථාරම්භයෙහි ඉෂ්ටදෙවතානුස්මරණය කරන්නාහු "මහද ගඳ කිලි කැරැ" යනාදි ගීය රචනා කළෝ.

1. **භාවය**—දතයුතු සියලු දේ නිරවශෙෂ කොට දැන වදළාවූ මහොත්තමයන් වහන්සේට මාගේ හෘදය ගන්ධකුටිභාවයෙන් පමුණුවා ආධුනිකජනයාගේ දැන ගැණීම පිණිස සිදත්සඟරා නම් වූ මේ හෙළුවියරණය කරන්නෙමි.

**විස්තරය**—ග්‍රන්ථකර්තෘවරයෝ ස්වකීය ඉෂ්ටදෙවතානුස්මරණාත්මක පද්‍යවිෂයෙහි අභිප්‍රෙත ග්‍රන්ථය පිළිබඳ සංඥාදි පඤ්චක නිරූපණය ද කෙරෙත්. එබැවින් මෙහිදු ප්‍රථමාර්ධයෙන් ඉෂ්ටදෙවතානුස්මරණය ද, ද්විතීයාර්ධයෙන් අභිප්‍රෙත ග්‍රන්ථයාගේ ප්‍රයෝජනය හා සංඥානිරූපණය ද ප්‍රකට කෙරෙත්. අප්‍රකටත්වයෙන් "නිමිත්ත කර්තෘ පරිමාණ" යන තුණ ද දැක් වේ.

---

* පුරාණසන්න ඉතා පැරණි පිටපත් කීපයෙක්හි මෙහි "වහද" කියා දක්නා ලැබේ. මෙහි නිපාතශබ්දනිර්දේශයෙහි "ව" යන නිපාතය අසමත් ශබ්දවාචක යයි සිදත්සඟරා පුරාණසන්නයෙහි නිර්දිෂ්ටයි. එකල්හි "වහද" යන්නේ අර්ථය ද මාගේ හෘදය යනුමයි. විමසිය යුතුයි.

මෙබඳු බොහෝ පද්‍යයන්හි ඉෂ්ටදෙවතානුස්මරණයෙහි ලා අභිමත වූ ඉෂ්ටදෙවතාවාගේ නාමය ස්ඵුටත්වයෙන් දක්වත්. එහෙත් මෙහි එසේ නො දක්වුනේය. එබැවින් ඇතමුන් විසින් අභිමත ඉෂ්ටදෙවතාවා පිළිබඳව සැක කට හැකි වේ. "සව්නෝ ගෙවා දත් නට" යන්නෙන් වාච්‍ය වූ අර්ථය ඔවුනොවුන්ගේ ලබ්ධි වශයෙන් ඔවුනොවුන්ට අභිමත වූ . ඊශ්වරාදීන් කෙරෙහි ද ආරොපණය කරගත හැක. එහෙත් මෙහි අභිමත වූ සව්නෝ ගෙවා දත් උතුමා ගඳකිළියක් වාසභවනය කොට ඇති උතුමෙකු විය යුතුයි. මේ "ගඳකිළි" නාමය පාළි "ගන්ධකුටි" නාමයෙන් බිඳුනේ වේ. එහි "ගන්ධ" ශබ්දයෙන් චන්දනාදි සුගන්ධි ද්‍රව්‍ය සමාහාරය හා ඝ්‍රාණෙන්ද්‍රිය ග්‍රාහ්‍යවූ තද්ගුණවිශෙෂය ද වාච්‍ය වේ. "කුටි" ශබ්දයෙන් විශාල ගෘහයක් නොව කුඩා ගෙයක් වාච්‍ය වේ. බුදුරජානන් වහන්සේගේ වාසභවනය චන්දනාදි සුගන්ධිද්‍රව්‍ය නිර්මිත වූ කුඩා ගෙයක් බැවින් ද, විහිදෙන සුවඳින් යුත් බැවින් ද පාළියෙහි "ගන්ධකුටි" නාමය උන්වහන්සේගේ වාසභවනයට ම රූඪ විය. එහෙයින් මෙහි අභිමත ඉෂ්ටදෙවතාවා බුදුරජානන් වහන්සේ ම යයි නිශ්චයට පැමිණිය හැකි වේ.

"ගඳින් යුත් කිළි=ගඳකිළි" යනු "ගඳකිළි" ශබ්දයාගේ නිරුක්තියි. සංස්කෘත භාෂාවිෂයෙහි ද "ගන්ධකුටී" නාමයක් විද්‍යමානයි. එයින් වාච්‍යවන්නේ ගෘහයක් නොවේ. මුරා නම් ගන්ධ ද්‍රව්‍ය යෙකි.

ග්‍රන්ථකර්තෘපාදයන්ගේ හෘදය බුදුරජානන් වහන්සේගේ වාසභවනය වූ ගඳකිළිබවට පමුණුවා ලීමෙන් බුදුරජානන්වහන්සේ තමන්ගේ හෘදයෙහි වාසය කරවා ගත් බැව් ද, එයින් ස්මරණය කළ බැව් ද හැඟේ.

මෙසේ කරණ ඉෂ්ටදෙවතානුස්මරණය : නමස්කාරයකු දු වන්නේ මය. නමස්කාරය වූකලි කායික වාචසික මානසික යයි තෙවැදෑරුම් වේ. එහි සිත පෙරටු කොට ඇති කායව්‍යාපාර යෙන් කරණ නැමීම කායික නම් වේ, දණ්ඩනමස්කාරාදියෙන් යුත් අඤ්ජලිකර්ම යයි. සිත පෙරටු කොට ඇති වාග්ව්‍යාපාරයෙන් නැමීම වාචසික නම් වේ. "වදිමි නමදිමි" යනාදි වාග්ව්‍යවහාර යෙන් වැඳීමයි. ඉෂ්ටදෙවතාවා මෙනෙහි කිරීම මානසික නැමීමයි. මේ තුන්විදියෙන් ම අභවන්නේ ඉෂ්ටදෙවතාවා සැලකී මෙන් අදහන බවයි. එයින් ඔවුන්ගේ ඉෂ්ටාර්ථසිද්ධිය සැලසේය යන අදහසින් මේ තෙවිදියෙන් නැමැදීම පූර්වදෙශීය ශිෂ්ටයන්ගේ සිරිතයි.

"දුහුනන් දැනුම් සඳහා" යන්නෙන් අභිප්‍රේත ග්‍රන්ථකරණයෙහි ප්‍රයෝජනය ද "සිදත්සඟරා" යන්නෙන් තද් ග්‍රන්ථනාමය ද නිර්දිෂ්ටයි.

දැන් ඒ මේ අභිප්‍රේත ග්‍රන්ථයාගේ නාමය අන්වර්ථනාමයක් හෝ වේ ද නොවේ දැයි සලකා බැලිය යුතුයි. "සිදත්සඟරා" යන මේ නාමය එකාන්ත පැසසියයුතු අන්වර්ථනාමයෙකි. මෙහි අන්වර්ථතාව සලකා ගැණීමට "සිදත්සඟරා" යන ශබ්දවයෙහි යථාර්ථය දත යුතුයි. මෙහි 'සිදත්" ශබ්දය "සිද්ධාන්ත" ශබ්දයෙන් ද, "සඟරා" ශබ්දය "සඞ්ග්‍රහ" ශබ්දයෙන් ද බිඳුනේ වේ. එහි "සිද්ධාන්ත" ශබ්දයාගේ අර්ථසමර්ථනය කරන්නා වූ සංස්කෘත ශාබ්දිකයෝ 'යඃ පරීක්ෂකෛර්බහුවිධං පරීක්ෂ්‍ය හෙතුභිඃ සාධයිත්වා ස්ථාප්‍යතෙ නිර්ණීයඃ ස සිද්ධාන්තඃ"යනු කිහු ශබ්දපරීක්ෂකයන් විසින් නානා ප්‍රකාරයෙන් පරීක්ෂා කොට බලා හෙතුවලින් සිදුකොට යම් බඳු නිශ්චයක් තබනු ලැබේ නම් ඒ සිද්ධාන්තය යනු එහි අර්ථයි. මෙහිදී සෛංහලීය ශබ්ද පරීක්ෂකයන් විසින් පිරික්සා බලා සහෙතුකත්වයෙන් නිශ්චිත කොට තබන ලද යම් සිංහල ශබ්ද සමූහයක් වේ නම් ඒ "සිදත්"යයි ගතයුතුයි.

"සඞ්ග්‍රහ" ශබ්දයාගේ නිර්වචන නිරූපණය කරන්නාහු "සංක්ෂෙපෙණ ගෘහ්‍යන්තෙ නානාස්ථානෙෂු විප්‍රකීර්ණා අර්ථා එකත්‍ර බුධ්‍යන්තෙ යෙනෙති=සඞ්ග්‍රහඃ"යනු කිහු. නොයෙක් තන්හි විසිර පවත්නා වූ අර්ථවිශෙෂයන් එක්තැනෙක්හිදී සංක්ෂෙපයෙන් දැනගැණීමට ඉවහල් වූ ග්‍රන්ථවිශෙෂය සඞ්ග්‍රහ (සඟරා) නම් වේ යනු එහි අර්ථයි. "සිදතුන්ගේ සඟරා=සිදත්සඟරා"යනුවෙන් වූ සමස්ත නාමවශයෙන් අර්ථය ගත් කල්හි සෛංහලීය ශබ්ද පරීක්ෂක ශිෂ්ටයන් අතර නිශ්චයප්‍රාප්ත ශබ්ද ලක්ෂණයන් එක් තැනකදී සංක්ෂෙපයෙන් දැනගැණීමට ඉවහල් වූ ග්‍රන්ථය "සිදත් සඟරා" නම් යයි සලකාගත හැකි වේ.

මෙසේ මේ ගීයෙන් ඉෂ්ටදෙවතානුස්මරණාදිය කොට ඉක්බිති ස්වකීය ග්‍රන්ථයාගේ සකලව්‍යාපි උද්දෙශයක් කරන්නාහු "සඳ රුත්විදි සියල්" යනාදි සූත්‍රය රචනා කළෝ. උද්දෙශ නම් සාමාන්‍ය මුඛයෙන් සංක්ෂෙප කථනයයි.

---

පදත්සුතර.

෧. **සඳරුත් විදි සියල්-අනරූ සේපියෝනන්,**
**ඉති සත් සඳ සමස් ඇ-වහරනුසරෙන් සපයා.**

**මෙ සබඳ සිදත් පිරියන් හිම්.**

෧. හා—සදවිදි හා අරුත්විදි යම් පමණක් නම් ඒ සියල්ලම පෞරාණික සෛංහලීය ශාබ්දිකයන්ගේ නිදසුන් වලබු අනුරූප විය යුතුයි. මෙසේ මේ සූත්‍රය මුඛ්‍යස්ථානයෙහි තබා සංදෙස්නි

සමාසාදි සියලු සදරුත්විදි ලක්ෂ්‍යව්‍යවහාරානුසාරයෙන් සපයා ගත යුතුයි. තවද මේ සූත්‍රය සිද්ධාන්ත පරිසමාප්තිය තෙක් සම්බන්ධ කටයුතු වේ.

වි—මෙහි "සදරුත්විදි"යන තන්හි "විදි"ශබ්දය උත්පාදනාර්ථ වශයෙන් ගතයුතුයි. එකල්හි "සදවි" යන්නේ අර්ථය ශබ්දෝත්පත්තිය යනුයි. "අරුත්විදි" යන්නේ අර්ථය අර්ථෝත්පත්තිය යනුයි. ශබ්දව්‍යුත්පත්තිය පිළිබඳ අනුශාසනය ව්‍යාකරණයෙහි ද අර්ථව්‍යුත්පත්තිය පිළිබඳ අනුශාසනය නිරුක්තයෙහි ද ඇතුළත් වේ. එසේ ඇති කල්හි ව්‍යාකරණයට "සදවිදි" යයි කීම ද පමණ වේ. එහෙයින් පාලි සංස්කෘත වෛයාකරණයෝ ද ව්‍යාකරණයට "සද්දනීති, ශබ්දානුශාසන" යන ආදි නාමයන් ව්‍යවහාර කළහ. එහෙත් "නිත්‍යඃ ශබ්දාර්ථසම්බන්ධඃ" යනු හෙයින් ශබ්ද-අර්ථ දෙදෙනාගේ නිත්‍යසම්බන්ධය ඇති බැවින් ව්‍යාකරණ නිරුක්ත දෙදෙනාගේ ද නිත්‍යසම්බන්ධය ඇත්තේ වේ. ව්‍යාකරණයෙන් වර්ණාත්මක ශබ්දවිශෙෂයන් උපදවා ගැනීම ද, නිරුක්තයෙන් ඒ ශබ්දවිශෙෂයන්ගේ ප්‍රකෘතිප්‍රත්‍යය විභාගයෙන් අර්ථයන් උපදවා ගැනීම ද උගන්වනු ලැබේ. එහෙත් සියලු ව්‍යාකරණයන්හි ම අර්ථොත්පාදනාවයව වූ නිරුක්තවිධි ද ඇත්තාහ. විභක්ත්‍යර්ථ නිරූපණාදිය හා විග්‍රහවාක්‍යයෝජනාදිය නිරුක්තාඞ්ග වශයෙන් සැලකිය යුතුයි. මේ සිදත්සඟරාවෙහි ද ඒ දෙවිදිය ම විද්‍යමාන බැවිනුත් කෙසේ වුවත් වෛයාකරණයන් විසින් භාෂාසංව්‍යවහාරයට වුවමනා ශබ්දවිධි අර්ථවිධි දෙකම පිළිබඳව අනුශාසනය කටයුතු බැවිනුත් මෙහි සදවිදි අරුත්විදි දෙක ම ඡෙකප්‍රයොගයන්ට අනුරූප වියයුතු යයි කීහු.

දන ඇත්තේ යන අර්ථයෙහි "දන" යන ශබ්දප්‍රකෘතිය හා "වත්" ප්‍රත්‍යයයොගයෙන් "දනවත්"යි සිද්ධයි. ඒ අර්ථයෙන් ඉතා සවල්ප ධනයක් ඇත්තේ ද "දනවත්"යි කිව හැක්කේ වේ. එහෙත් "දනවත්" යි ව්‍යවහාර කරන්නේ බොහෝ ධනය ඇත්තෙකුට පමණෙකි. "යම් කරුණෙන් බත් සුත්"යන වාක්‍ය යෙහි "සුත්, බත්"යන ශබ්දවය අන්‍යාර්ථ සමාස වීමෙන් "සුත් බත්"යි සිඩයි ඒ අර්ථයෙන් වනාහි බත් සුත්වීමට ඉවහල් වූ බොහෝ දේ වාච්‍ය විය හැකි වෙත්. එහෙත් ඡෙක ප්‍රයොගානුරූප වශයෙන් ගත් කල්හි බත් සුත්වීමට ඉවහල් වූ කලගෑ පමණක් ගැණේ. "තෙල්" ශබ්දය හා "පා" ධාතුවෙන් "ඌ" ප්‍රත්‍යය වීමෙන් සිද්ධ "තෙල්බූ" නාමයෙන් තෙල් බොන සතෙක් වාච්‍ය වියයුතු වේ, එහෙත් ඡෙකප්‍රයොගානුරූප වශයෙන් වාච්‍ය

වන්නේ තෙල් නොබොන සතෙකි. මේ මෙසේ හෙයින් සඳිවිදි අරුත්විදි දෙකම ඡේකප්‍රයොගයන්ට අනුරූප පරිද්දෙන් ම සපයා ගත යුතුයි.

තවද සිදත්සඟරා පුරාණ සන්නයෙහි මේ "සදරුත්" ආදි සූත්‍රයට අඞ්ග සූත්‍ර යයි නම් කළහු. ඒ වනාහි මෙබඳු සූත්‍රයන්ට ව්‍යවහාර කට යුතුවූ අර්ථානුගත විශිෂ්ට නාමයෙකි. එහි අර්ථානුගතතාව "අඞ්ග" ශබ්දයාගේ අර්ථය විමසා බැලීමෙන් දත හැකි වේ. "අඞ්ග" ශබ්දයාගේ අර්ථසමර්ථනය කරන්නා වූ සංස්කෘත ශාබ්දිකයෝ "තදීය ප්‍රධාන ඵලජනකව්‍යාපාරජනකත්වෙ සති තදීයප්‍රධානඵලාජනකත්වම්" යනු කිහ. ඒ ඒ කටයුතු පිළිබඳ ප්‍රධාන ඵලය උපදවන්නවුන්ගේ ව්‍යාපාරජනකභාවය යමෙකු කෙරෙහි ඇතිවත් ම ඔහු ඒ ප්‍රධාන ඵලය නූපදවන බව යනු අඞ්ගශබ්දයාගේ තාත්පර්යයයි. මේ "සදරුත්" ආදි සූත්‍රය ද මේ අර්ථයෙන් යුක්තයි. මේ සූත්‍රය මේ පොතෙහි වියරණවිදි පිළිබඳ ප්‍රධාන ඵලය නූපදවන්නේ වේ. එහෙත් ඒ ප්‍රධානඵලය උපදවන්නවුන්ගේ ව්‍යාපාරය උපදවන්නේ වේ. මේ වියරණෙහි සෙසු සූත්‍රයෝ ඒ ඒ වියරණයන් උපදවන්නෝ වෙත්. ඔවුන් ඒ වියරණයන් උපදවන්නේ "සදරුත්" ආදි සූත්‍රයාගේ අනුශාසනය වශයෙනි. එබැවින් සෙසු සියලු සූත්‍රයෝ ම "සදරුත්" ආදි සූත්‍රයට යටහත්ව සවකිය කටයුතු කෙරෙත්. මේ ලක්ෂණයෙන් "සදරුත්" ආදි සූත්‍රය යමකිසි කම්හලෙක්හි ප්‍රධාන තැන මෙන් ද, සෙසු සූත්‍ර එහි කම්කරුවන් මෙන් ද, ඒ ඒ වියරණවිදි කොටස් කම්හලෙහි ඒ ඒ ක්‍රියාකලාප වශයෙන් පිරිසිඳින ලද කොටස් මෙන් ද, එසේ ම "සදරුත්" ආදි සූත්‍රය රාජ්‍යානුශාසක මහරජෙකු මෙන් ද, සෙසු සූත්‍රයෝ ඒ රාජ්‍යයෙහි ජනසමූහයා මෙන් ද, ඒ ඒ වියරණ පෙදෙස් දනව් පෙදෙස් මෙන් ද සැලකිය යුතුයි.

පාලි සංස්කෘත ව්‍යාකරණයන්හි ද මෙබඳු සූත්‍ර ඇත්තාහ. එහි ඒ සූත්‍රයන්ට "අධිකාර" සූත්‍රයයි කියත්. යථොක්ත "අඞ්ග" ශබ්දයාගේ ලක්ෂණ "අධිකාර" ශබ්දයෙහි ද විද්‍යමානයි. එහි ඒ අධිකාරසූත්‍රයෝ වූකලී ඇතැම් කෙනෙක් සූත්‍ර කිපයක් පිළිබඳ අධිකාරත්වය (ප්‍රධානත්වය) කරන්නෝ ද, ඇතැම් කෙනෙක් අධිකාරයක් (කාණ්ඩයක්) පිළිබඳ අධිකාරත්වය කරන්නෝ ද, ඇතැම් කෙනෙක් මේ "සදරුත්" ආදි සූත්‍රය මෙන් වියරණය මුළුල්ල ම පිළිබඳ අධිකාරත්වය කරන්නෝ ද වෙත්. මේ "සදරුත්" ආදි සූත්‍රය ද පාලිව්‍යාකරණයෙහි සකලව්‍යාපිත්වයෙන් උද්දිෂ්ට "ජිනවචනයුත්තං හි" යන සූත්‍රය වැනි වේ. මෙහි අදහස පාලිය පිළිබඳ සකල ශබ්දසිද්ධි ජිනවචන සඞ්ඛ්‍යාත ඡේකප්‍රයොගයන්ට අනුරූපවිය යුතුය යනුයි.

තවද, මේ "සදරුත්" ආදි සූත්‍රය සිද්ධාන්තපරිසමාප්තිය තෙක් සම්බන්ධ කටයුතු බැව් නිර්දිෂ්ටයි. සිද්ධාන්ත පරිසමාප්තිය පිරිසිඳින්නා වූ ඇතැම් ආචාර්‍ය්‍යවරයෝ ලකාර අදියර අවසන් කොට පිරිසිඳිත්. එබැවින් ඒ පිළිබඳව මදක් විමසා බැලිය යුතුයි. මෙහි ම මේ "සදරුත්" ආදි සූත්‍රය ප්‍රමුඛත්වයෙහි තබා සපයා ගතයුතු වියරණවිදි නිර්දේශ කිරීම සඳහා විරචිත "එබැවින්" යනාදි ගී දෙක්හි අවසානභාගයෙහි "වි විසිවැදූරුම් වියරණවිදි සපයා" යනු කීහු. මෙයින් හැඟෙන්නේ වියණවිදි සැපයීමට මේ සූත්‍රය සම්බන්ධ කටයුතුය කී බවයි.

තවද බොහෝ සංස්කෘත ව්‍යාකරණයෝ ද "සිද්ධාන්තකෞමුදී, සිද්ධාන්ත චන්ද්‍රිකා" යනාදි වශයෙන් සිද්ධාන්ත නාමාරොපණයෙන් ව්‍යවහෘත යහ. මෙයින් හැඟෙන්නේත් සිද්ධාන්ත පරිසමාප්තිය ව්‍යාකරණය පිළිබඳ වියයුතු බවයි. එහෙත් ලකාර අදියරෙහි ඇත්තේත් ඡේකප්‍රයොගයයි ද, එහෙයින් එහි දු මේ සූත්‍රය සම්බන්ධ කටයුතුය යි ද කිව හැකි වේ. එසේ වුවත් ව්‍යාකරණ ශාස්ත්‍රයත් අලඞ්කාරශාස්ත්‍රයත් එකක් ලෙස නො සැලකිය යුතුයි. අලඞ්කාර ශාස්ත්‍රය පමණක් නොව වෛද්‍යශාස්ත්‍රාදි සකල ශාස්ත්‍රයෝ ම ඡේක ප්‍රයොගානුගතවූවෝ මැයි. එපමණ කුදු නොවේ. "සදරුත්" ආදි සූත්‍රය ග්‍රන්ථාවසානය තෙක් සම්බන්ධ කටයුතු යයි ග්‍රන්ථකර්තෘපාදයන්ගේ අදහස නම් "සිදත් පිරියත් හිමි" යි නො පිරිසිඳිය යුතුයි. එසේ නම් "මෙ සබඳ මෙ ගත් හිමි" කියා හෝ, නැත්නම් බාලාවතාරයෙහි "ජිනවචනයුත්තං හීති, සබ්බත්ථාධිකාරො" යන පිරිසිඳීම මෙන් "සච්තන්හි මෙසබඳ" කියා හෝ යෙදිය යුතුයි.

මෙසේ "සදරුත්" ආදි වශයෙන් ප්‍රථමොද්දෙශය කොට ඉක්බිති තදුද්දෙශයාගේ ප්‍රාමුඛ්‍යයෙන් සපයාගතයුතු වියරණවිදි නිර්දේශ කරන්නාහු "එබැවින්" යනාදිය කීහු. උද්දෙශය නිහරණය කොට (උපුටා) කීම නිර්දේශ නම් වේ

---

විියරණ විදි නම්.

෬. **එබැවින් සත් සඳ-ලිඟු විබත් සමස් පියවි,**
**පස කිරිය ලොපදෙස්-අගම් පෙරරූ දෙරූ පෙරළි.**
**වැඩි අඩු නිපා නියම්-අනියම් අවිදුමන් විදි,**
**වි විසිවැදූරුම්-වියරණ විදි සපයා.**

෬. **භා**—ඒ පූර්වොක්තාකාරයෙන්–"1. සත්, 2. සඳ, 3. ලිඟු, 4. විබත්, 5. සමස්, 6. පියවි, 7. පස, 8. කිරිය, 9. ලොප්, 10. අදෙස්,

11. අගම්, 12. පෙරරූ, 13. දෙරූ, 14. පෙරැලි, 15. වැඩි, 16. අඩු, 17. නිපා, 18. නියම්, 19. අනියම්, 20. අවිදුමත්" යන මේ වියරණ විදි විස්ස සපයා ගත යුතුයි.

මෙයින් විංශතිප්‍රකාර ව්‍යාකරණ විධි නම්පමණින් නිර්දිෂ්ටයි. අන්‍යව්‍යාකරණයන්හි මෙලෙසින් කරණ ලද ව්‍යාකරණවිධි නිර්දේශයෙක් නැත්තේයි. එහෙත් සිද්ධාන්තසඞ්ග්‍රහ කතෘපාද යන්ගේ මේ නිර්දේශක්‍රමය ශ්‍රේෂ්ඨතර වේ. යමෙක් පළමු කොට මේ වියරණවිදි විස්ස නිසිලෙස දැන හැඳින ගත්තේ නම් ඔහු වියරණය පිළිබඳ වූ තතු දැන ඉගෙණගන්නෙකු වන බැවිනි. මෙසේ නම්පමණින් සඳහන්කළ ඒ ඒ වියරණවිදි ලකුණු වශයෙනුදු හඳුන්වන්නාහු "පණකුරු" යනාදිය කිහු.

---

1. සන්විදිය හැඳින්වීම.

**1. පණකුරු ගතකුරු ඈ නම්ලකුණෙන් හඳුන්වනු සන් නම්.**

භා—(සඳරුත්විදි සැපයීමේ අවයවවූ) "පණකුරු ගතකුරු" යන ආදිය නාමයෙන් හා ලක්‍ෂණයෙන් හැඳින්වීම සන් (සංඥ) නම් වේ.

යමකට ව්‍යවහාර කරණ නාමය කියා හෝ ලියා හැඳින්වීම නාමයෙන් හැඳින්වීමයි. ඒ මෙහි "පණකුරු, ගතකුරු, සන්, සඳ" ආදි වශයෙන් දතයුතුයි. බොහෝ නාමයෝ වනාහි ලක්‍ෂණානුගතවූවෝ ද වෙත්. එබඳු නාමයෝ ඒ ඒ ලක්‍ෂණයෙනුදු හඳුන්වනු ලැබෙත්. එසේ හැඳින්වීම ලක්‍ෂණයෙන් හැඳින්වීමයි, යමක් පිළිබඳ හැඩහුරුකම කියා හෝ ලියා හැඳින්වීම ලක්‍ෂණයෙන් හැඳින්වීම යයි සලකා ගතයුතුයි.

නාම පිළිබඳ ලක්‍ෂණයෝ වූකලි ඇතැම් කෙනෙක් ඒ ඒ නාමයන්ගේ තත්ත්වාර්ථප්‍රකාශක වාක්‍යසහගත වූවෝ ද, ඇතැම් කෙනෙක් නිදර්ශන සහගත වූවෝ ද වෙත්. එහි වාක්‍යසහගත වූ ලක්‍ෂණයෝ ඝ්‍රාණෙන්ද්‍රියට ද, නිදර්ශනසහගත වූවෝ චක්‍ෂුරින්ද්‍රියට හා කර්ණේන්ද්‍රියට ද විෂය වෙත්. එහිදු ලිඛිතය චක්‍ෂුරින්ද්‍රියට ද කථිතය කර්ණේන්ද්‍රියට ද විෂය වේ. මෙහි "පණකුරු ගතකුරු ඈ නම් ලකුණෙන් හඳුන්වනු" යන වාක්‍යාර්ථ සහගත ලක්‍ෂණයෙන් "සන්" යන වියරණවිදි නාමය හැඳිනේ.

මේ "සන්" යන නාමය වනාහි පාළි "සඤ්ඤ" ශබ්දයෙන් හෝ සංස්කෘත "සංඥ" ශබ්දයෙන් බිඳුනේ වේ. ඒ "සඤ්ඤ" හෝ "සංඥ" ශබ්දයේ අර්ථය හැඳිනීම හෝ හැඳිනීමට ඉවහල් වූවක් යනුයි. එහෙත් මෙහි "සන්" යන්න වැණු පදය "හඳුන්වනු" යනුයි. එහි අර්ථය හැඳින්වීම යනුයි. "හඳුන්වනු" යන්න 'සං' උපසර්ග පූර්ව "ඥා-ඥානම්හි" යන ධාතුවෙන් කාරිත 'ව' ප්‍රත්‍යය හා ඉන් පරව "නු" ප්‍රත්‍යය වීමෙන් සිධයි. ඒ අර්ථයෙහි නිපන් පාලිසංස්කෘත ශබ්ද "සඤ්ඤාපන-සංඥාපන"යනුයි. මේ මෙසේ හෙයින් "හඳුන්වනු සන්නම්"යි කීම සාවද්‍යයයි සිතිය හැකි වේ. එහෙත් සිද්ධාන්තසඞ්ග්‍රහ කර්තෲපාදයන්ගේ අදහස තමන්ගේ වියරණයෙහි වියරණවිදි විස්සක් නිර්දේශ කිරීමත් ඉන් පළමුවන වියරණවිදිය "සන්" යන නාමයෙන් ව්‍යවහාර කිරීමත්ය. උන්වහන්සේ "සන්" යන වියරණවිදියෙන් අදහස් කෙළේ ශාස්ත්‍ර යක් ඉගැන්වීමේදී පළමු කොට ඒ ශාස්ත්‍රය සැපයීමට ඉවහල් අවයව සමූහය හඳුන්වාලීම වුවමනා බැවින් එසේ හඳුන්වාලීමයි. ග්‍රන්ථාදිය පිළිබඳ සංඥාපනයෙන් ඒ ග්‍රන්ථාදිය හඳුන්වන්නාක් මෙන් මේ වියරණවිදියෙන් වියරණවිදි හැඳින්වීම කරණු ලැබේ.

මේ වියරණයේ ගැළපීම වෙන වියරණයන් හා සම නොවේ. වෙන වියරණයන්හි මෙලෙසින් වියරණවිදි හැඳින්වීමක් නැත්තේය. ඒ ඒ ග්‍රන්ථකර්තෲවරයෝ තමතමන්ට අදහස්වූ පරිද්දෙන් ඒ ඒ ග්‍රන්ථයන් රචනා කෙරෙත්. යම්විදියකින් ඉගෙණගණු ලබන ශාස්ත්‍රය එක්ක් වුවත් ඒ උගන්වන ක්‍රමය එකක් ම නොවේ. ඒ වනාහි ඒ ඒ ශාස්ත්‍රයන් උගන්වන ආචාර්යවරයන්ගෙන් දත හැකි වේ. එක් ආචාර්යවරයෙකු මසකින් උගන්වන ශාස්ත්‍රාඞ්ගය තවත් ආචාර්යවරයෙකු දෙතුන් දිනකින් උගන්වනු ලැබේ. සංස්කෘත භාෂාවෙහි ශ්‍රෙෂ්ඨව්‍යාකරණ යයි සලකන පාණිනිය ව්‍යාකරණය ගළපා තිබෙන්නේ ග්‍රන්ථය මුලුල්ලම හදරණ තෙක් ඒ වියරණයෙහි සංඥාව පවා සම්පූර්ණයෙන් නොහැඳිනෙන ලෙසටයි. එහෙත් ඉන් පසු ඒ සූත්‍රයන් ම උපුටා ගෙණ සකු වියරණයන් කළ ආචාර්යවරයන් ඊට වඩා පහසුවෙන් ඉගෙණිය හැකි ක්‍රමවලින් ඒ ඒ වියරණයෝ විරචිතයහ. එබැවින් සූක්ෂම බුඩිමත් පෞරාණික ග්‍රන්ථකර්තෲවරයන්ගේ අදහස් හා ඒ ඒ අදහස් සහගත ක්‍රමයන් ගැණ නොසලකා සාවද්‍යයයි කීම යුතු නොවේ.

මෙහි "හඳුන්වනු" යන්න හෙත්වර්ථ බැවින් මේ වියරණය උගන්වන ආචාර්යවරයා හැඳිනීම් ක්‍රියාවෙහි ලා ශිෂ්‍යයා මෙහෙයන්නා ද, ඒ මෙහෙයීම ලත් ශිෂ්‍යයා ඒ ක්‍රියාව හෙවත් හැඳිනීම කරන්නා ද වියයුතුයි.

"නම්ලකුණෙන්" යන්න "හඳුන්වනු" යන්නෙහි කරණයි. "නම්ලකුණෙන්" යන්නට අරුත් පළකරන්නාවූ ඇතැම් අචාර්‍ය්‍යවරයෝ "නාමයෙන් හා ලක්‍ෂණයෙන්" කියා ද, ඇතැම් ආචාර්‍ය්‍යවරයෝ "නාමසඞ්ඛ්‍යාත ලක්‍ෂණයෙන්" කියා ද අරුත් පළ කෙරෙත්. එහි "නාම සඞ්ඛ්‍යාත ලක්‍ෂණයෙන්" යි කී කල්හි නාමයෙන් හැඳින්වීම මුත් ලක්‍ෂණයෙන් හැඳින්වීමක් ප්‍රකාශ නොවේ. එහෙත් මෙහි සියලුම වියරණවිදි ලක්‍ෂණයෙන් ද හඳුන්වනු ලැබේ. මෙහි ප්‍රධාන හැඳින්වීම ද ලක්‍ෂණයෙන් හැඳින්වීමයි. ඒ බැව් "කිරිය ලකුණු වියනලද මැයි" යන්නෙන් ස්ඵුට වේ. ලක්‍ෂණයෙන් හැඳින්වීම ධර්‍මශාස්ත්‍ර විෂයෙහි ද දක්නා ලැබේ. එහි ඒ ඒ චිත්තචෛතසිකාදි ධර්‍මනාමයෝ ලක්‍ෂණයෙන් ද හඳුන්වනු ලැබෙත්. "විජානනලක්ඛණං විඤ්ඤාණං, ආරම්මණාභිනිරොපණලක්ඛණො විතක්කො" යනාදි වශයෙනි. විශෙෂ දැනගැනීම ලක්‍ෂණ කොට ඇත්තේ විඤ්ඤාණ යයි. අරමුණට සිත නගාලීම ලක්‍ෂණ කොට ඇත්තේ විතක්කයයි යනු එහි අර්ථයි.

මේ "සත්" යන වියරණ විදියට ඇතුළත්වූවෝ බොහෝ වෙත්, එනම්–"පණකුරු, ගතකුරු, ලුහු, ගුරු, සඳ, ලිඟු, විබත්" යන ආදියයි. එහි "පණකුරු, ගතකුරු, ලුහු, ගුරු"යන මොවුන් ගණන් වශයෙන් හා ලකුණු වශයෙන් හඳුන්වන්නාහු "පණකුරු පසෙක්" යනාදිය කීහු.

---

<u>පණකුරු ගතකුරු ආදිය.</u>

෧ **පණකුරු පසෙක් එ ද–ලුහුගුරු බෙසින් දස වේ,**
**ගතකුරු ද වේ විස්සෙක්-වහරට සුහු සියබසැ.**

**අආ ඉඊ උඌ එඒ ඔඕ-මෙ දස පණකුරු නම්.**
**ක ග ජ ට ඩ ණ ත ද න ප බ ම ය ර ල ව ස හ ළ අං–**
**මෙ විසි ගත කුරු නම්.**

෧. භා:—හෙලදිව්බසෙහි ව්‍යවහාරයට යොග්‍යවූ පණකුරු පසෙකි. ඒ පස වනාහි ලඝු ගුරු භෙදයෙන් දසයෙකි, ගතකුරු විස්සෙකි. එහි "අආ" ආදි දසය පණකුරු නම් ද, "ක" ආදි විස්ස ගතකුරු නම් ද වේ.

වි—නිර්වචනාර්ථ සහගත ලක්‍ෂණය ද නාමයන් පිළිබඳ එක් ලක්‍ෂණයෙකි. එයිනුදු ඒ ඒ නාමයෝ හැඳිනෙත්. මෙහි "පණ කුරු" යන නාමයාගේ නිර්වචන "පණ වැනි අකුරු" යනුයි. අකුරු අතුරෙන් යම් අකුරක් සතෙකුගේ ප්‍රාණයට සමාන වේ නම් ඒ අකුර පණකුරු නම් වේ. "ගතකුරු"යන නාමයේ නිර්වචන නම් "ගත වැනි අකුරු" යනුයි. යම් අකුරක් සතෙකුගේ ශරීර යට සමාන වේ නම් ඒ අකුර ගතකුරු නම් වේ. සතෙකුගේ ප්‍රාණබලයෙන් ශරීරයාගේ ක්‍රියාශක්තිය ලැබෙන්නාක් මෙන් පණකුරු බලයෙන් ගාත්‍රාක්‍ෂරයන්ගේ සුබොච්චාරණය හා අර්ථ ප්‍රකාශක ශක්තිය ලැබේ. මේ නිර්වචන ලක්‍ෂණයෙනුදු "පණකුරු, ගතකුරු" යන නම් දෙක හැඳිනේ. ඔවුන් නිදසුන් ලකුණෙන් හඳුන්වන්නාහු "අ ආ"ආදි දසය ද "කගජ" ආදි විස්ස ද දැක්වූහ. මේ නිදසුන් ලකුණු වලිනුදු පණකුරු ගතකුරු දෙකොටස හැඳිනේ.

පණකුරු දසයෙනුදු පසෙක් ලුහු නම් ද පසෙක් ගුරු නම් ද වේ යයි කීහු, ඒ ලුහු ගුරු යන නාමවයේ අර්ථයෙනුදු ඒ නම් දෙක හැඳිනේ. "ලුහු" යන්නේ අර්ථය හ්‍රස්වය යනුයි. යම් වර්ණයක් උච්චාරණයෙන් කෙටි නම් හෙවත් මාත්‍රා එකක් ඇත්තේ නම් ඒ වර්ණය ලුහු යයි හැඳිනේ. "ගුරු"යන්නේ අර්ථය දීර්ඝය යනුයි. යම් වර්ණයක් උච්චාරණයෙන් දීර්ඝ නම් හෙවත් මාත්‍රා දෙකක් ඇත්තේ නම් ඒ වර්ණය ගුරු යයි හැඳිනේ. එහි නිදසුන් ලකුණු නම් "අ ඉ උ එ ඔ" යන පස හා "ආ ඊ ඌ ඒ ඕ" යන පසයි. "අ ඉ" යනාදි පසෙන් "ලුහු" යන්න ද "ආ ඊ"යනාදි පසෙන් ගුරු යන්න ද හැඳිනේ. මෙසේ පණකුරු ගතකුරු ලුහු ගුරු යන මොවුන් දක්වා ඉක්බිති ගුරු පස හා බිඳුවර්ණය පිළිබඳ මතභෙද එකල්හි ඇතිව තුබුනු බැවින් ගුරුපස හා බිඳුවර්ණය ද මෙහි ඇතුළත්විය යුතු බවට නිදසුන් දක්වන්නාහු "ආ ඊල්" යනාදිය හා "තමා වදනය" යනාදිය කීහු.

**ස. "ආ ඊල් ඌල් ඒල් ඕනා" ඈඟි හුදුව ද, "සා ශී සූ සේ සෝ" ඈඟි ගත් අරුණු කැරැ උසුරුවනු හෙයින් ද ගුරුපස ද-**

**"තමා වදනය පොමින්-නො ඉකනැයි හැංගේ"**

**"නරනිඳුහු ඉංගෙන්-සෙමෙනද නැයි පැසැහි"**

**මේ ඈ කව්ලැකියෙහි දු, "හංමැට් වංඇපල" ඈ ලෙව් ලැකියෙහි දු සසුරා උසුරුවනු හෙයින් ද "රග, බගහර" ඈඟි උනුවතින් උසුරුවනු හෙයින් ද මෙහි බිඳු ද රූඟි, මෙ ඈඟි.**

ඝ. භා—මෙහි "ආ ඊල්" යනාදි නිදසුන් පස ශබ්දවිෂයෙහි හුදකලාව දීර්ඝ ප්‍රාණාක්‍ෂර හෙවත් ගුරු අකුරු ඇති බවට ද, "සා සී" ආදි පස ගාත්‍රාක්‍ෂරාරූඪ ව දීර්ඝප්‍රාණාක්‍ෂර ඇති බවට ද "තමා

වදනය" යනාදි කවිලැකියෙන් දැක්වූ "හැංගේ, ඉංගෙන්" යන දෙක හා ලෙව්ලැකියෙන් දැක්වූ "හංමැවි, වංඇපල" යන දෙක සම්පූර්ණ බිඳුවර්ණය ඇතිබවට ද "රඟ බඟහර" යන දෙක අඩබිඳුව ඇති බවට ද නිදසුන් කරණ ලද්දේය. "ආ ර්ල්"යනාදි ශබ්දයන්ගේ අර්ථ හා "තමා වදනය පොමින්" යනාදියෙහි අර්ථ ද පදාර්ථව්‍යාඛ්‍යානයන්ගෙන් දතහැකි බැවින් මෙහි නො ලියමු.

---

වර්ණ විනිස.

මෙහි පණකුරු පිළිබඳ ප්‍රථම නිර්දේශය කරන්නාහු "පණකුරු පසෙක්" යයි කිහු. ඒ පස දශයක් වන්නේ උච්චාරණභෙදයෙනි. උච්චාරණභෙදයෙන් පසළොසක් ද විය හැකි වේ. ස්වරයන් හ්‍රස්ව දීර්ඝ (ලඝු ගුරු) වශයෙන් පමණක් නොව ප්ලුත වශයෙන් ද උච්චාරණය වන හෙයිනි. දුර සිටින්නෙකු කැඳවීමෙහි හෝ ගායනාදියෙහි යෙදෙන ශබ්දයාගේ අන්ත්‍යස්වරය මාත්‍රාදෙකට වඩා කියවෙන බැවින් ප්ලුතය වේ. මේ ප්‍රථම නිර්දේශයෙන් හැඟෙන්නේ මේ වියරණෙහි ප්‍රකෘතිවර්ණ වශයෙන් පණකුරු පසෙක් යයි කී බවයි. ඒ මේ නිර්දේශය වනාහි සංස්කෘත ව්‍යාකරණ යන්ට ද සම වේ. සංස්කෘතව්‍යාකරණයන්හි ස්වර නිර්දේශය කරන්නාහු "අ ඉ උ ඍ ඏ එ ඓ ඔ ඖ" යන නවය ප්‍රකෘතිවර්ණ වශයෙන් දක්වා නැවත අ ආදි පස හ්‍රස්ව දීර්ඝ ප්ලුත වශයෙන් ත්‍රිභෙද යයි ද, එ ආදි සතර දීර්ඝ ප්ලුත වශයෙන් විභෙද යයි ද කිහු.

දැන් සමහරු "ඇ ඈ" යන උච්චාරණ විකාර දෙක ද පණකුරු දෙකක් මෙන් ගෙණ හෙළදිව්බසවියරණෙහි පණකුරු පස හෝ දසය ද නොව දොළොසක් යයි කියති. ශ්‍රෙෂ්ඨ වෛයා කරණයෝ "ඇ ඈ" වැනි උච්චාරණවිකාරයන් වර්ණසංඛ්‍යාවෙහි ලා නො ගිණූහ.

මේ වියරණට ගුරු පස හා බිඳු වර්ණය ද ඇතුලත්කර ගැණීම සඳහා විශෙෂ අනුශාසනයක් ද කළ සිධාන්ත සඞ්ග්‍රහ කර්තෘපාදයන්ට "ඇ ඈ" දෙකත් වර්ණසංඛ්‍යාවෙහි ලා ගිණීම අභිමත නුවූයේ උන්වහන්සේගේ අවිඥභාවයක් නිසා නොවේ. උන්වහන්සේට ද සෙසු වෛයාකරණයන්ට අභිමතවූ හ්‍රස්ව, දීර්ඝ වර්ණ පමණක් ප්‍රාණාක්ෂර සංඛ්‍යාවෙහි ලා ගිණීම අභිමත විය. "ඇ ඈ" දෙක අ ආ දෙකේ ම විකාරයක් බැවි කාහටත් උච්චාරණයෙන්

දත හැකි වේ. එහෙයින් ම වණලකුණු සැපයූ සිංහල පෞරාණිකයෝ ද එහි උච්චාරණ තත්ත්වය සලකා හෙවත් "අ ආ" දෙකම මදක් වක් කොට කෙරෙණ උච්චාරණ විකාරයක් බැව් සලකා ඒ විකාරය පෙණෙන්නට ලියන තන්හි "අ ආ" දෙකම වක් රේඛාවක් සමග ලියන්නට යෙදූහ.

"අ" යන ස්වරය ලඝු වර්ණයෙකි. ඒඅයන්න ම මදක් විකෘත වීමෙන් වූ "ඇ" යන්නත් එබඳුම ලඝුවක් විය හැකි නො වේ. එසේ ම "ආ" යන ස්වරය ගුරු වර්ණයෙකි. ඒ ආයන්න ම මදක් විකෘත වීමෙන් වූ "ඈ" යන්නත් එබඳු ම ගුරක් විය නො හැක, එසේ නො විය හැකි බැවින් තත්ත්වඥ වූ සිද්ධාන්ත සඞ්ග්‍රහ කර්තෘපාදයෝ "ඇ" කියා උච්චාරණය කරණ කල්හි අයන්න මාත්‍රාංශයකින් වැඩේ යයි ද, "ඈ" කියා උච්චාරණය කරණ කල්හි ආයන්න මාත්‍රාංශයකින් වැඩේ යයි ද කිහු. එහෙත් සමහරු "අ" යන්න "ඇ" කියා උච්චාරණය කළ කල්හි කිනම් වෘඩියක් දැයි පරිහාස කෙරෙත්. ඒ එසේ මැයි, මාත්‍රාවෘඩියක් නම් කාහටත් වැටහේ. මේ මාත්‍රා වෘඩියක් නොවේ. මාත්‍රාංශ වෘඩියකි, මාත්‍රාංශය කියන්නේ මාත්‍රාවක කොටසෙකි. ඒ කොටසද ඉතා ස්වල්ප කොටසක් විය හැකි වේ. "අංශ" ශබ්දය ත්‍රිශංද්භාගයට ද ව්‍යවහාර කරණ බැවිනි. එසේ හෙයින් අයන්නේ ශබ්දයට වඩා ඉතා සියුම් වැඩීමක් "ඇ" යන්නේ ද, "ආ" යන්නේ ශබ්දයට වඩා ඉතා සියුම් වැඩීමක් "ඈ"යන්නේ ද ඇති බැව් සැලකිය යුතුයි. දළ වූ දේ නම් කාහටත් දැනේ පෙණේ. සියුම් දේ සියලුදෙනාහට ම නො දැනේ නො පෙණේ. ඔවුනොවුන්ට නො දැනෙන නො පෙණෙන දේ තමතමන්ට නො දැනුනත් නො පෙණුනත් නැතැයි කීම සුදුසු නොවේ.

"ඇ" යන උච්චාරණයේදී අයන්නම මදක් ඇදවී කියවෙන බැව් කාහටත් වැටහේ. ඍජු දණ්ඩකින් ප්‍රමාණ කළ යම්කිසි පෙදෙසක් මදක් වක්වූ දණ්ඩකින් ප්‍රමාණ කළහොත් ඒ වක්වූ දණ්ඩ ඍජු දණ්ඩට වඩා මඳක් වැඩි වූ දණ්ඩක් වේ. එහෙත් එහි වූ ඒ වක් ගතිය මද හෙයින් ඒ බැව් ප්‍රකටව නො පෙණේ.

මේ උච්චාරණවිකාරය ද ලක්දිව සැම කල්හිම එකසේ ම ඇතිවූවක් නොව කලකදී ස්වල්පයක් වැඩි වශයෙන් පැවැති බැව් පොතපතින් පෙණේ. එසේ වීමට හෙතුව කලින්කල ලක්දිව ඇතිවූ නානාජාතිකයන් ගේ සඤ්චාරයයි. සාමාන්‍යයෙන් ම අන්‍ය ජාතිකයෙකු අන්‍ය රටකට පැමිණ ඒ රටේ වාග්ව්‍යවහාරය කරණ කල්හි බොහෝ ශබ්දයන්ගේ උච්චාරණය වෙනස් වේ.

කෙසේ වුවත් "අ" යන ශබ්දයාගේ උච්චාරණය නො සිලුටු නොවේ. ඇතැම් තන්හි ඉතා සිලුටු වේ, එහෙත් ඒ වැඩි වූ කල්හි ඒ සිලුටුබව නැසේ.

කෙසේ වුවත් ව්‍යවහාර කරණ භාෂාව සුශ්ලිෂ්ටභාවයෙන් උසුරුවීම ම යොග්‍ය වේ. බොහෝ සෙයින් ශබ්දප්‍රකෘතිහු ආදෙශාගම විභක්ති ප්‍රත්‍යයාදි අවයව සංයොගයෙන් උච්චාරණයෙහි දී වෙනස් වෙත්. කවරදෙයක් වුවත් ආශ්‍රයෙන් වෙනස්වීම රීති යයි. බොහෝ සෙයින් දන්තජනකාරය මූර්ධජත්වයෙන් උච්චාරණය වන්නේත් ආශ්‍රය වශයෙනි. "කොළොම්" කියා උච්චාරණය කිරීම සිලුටු ද පහසු ද වේ. එහෙත් "කොළොඹ" කියා උච්චාරණය කිරීම සිලුටු ද පහසු ද නොවේ, ඒ "කොළඹ" කියා උසුරුවීම සිලුටු ද පහසු ද වේ. එසේ ම "උදලු" යන ප්‍රකෘතිය "උදූලු" සි උච්චාරණය කරත් හොත් සිලුටු ද පහසු ද නොවේ. ඒ අවයවසංයොගයෙන් "උදූල්ල" සි උසුරුවීම සිලුටු ද පහසු ද වේ. ඒ "උදල්ල" සි උසුරුවීම සිලුටු ද පහසු ද නොවේ.

ශබ්දයන්ගේ උච්චාරණය ද කලින්කල වෙනස්වීම ස්වභාව ධර්මයෙකි. ලොකයේ සියලුදේ ම කලින් කල වෙනස්වන හෙයිනි. සෙසු තත්ත්වයන් මෙන් භාෂාතත්ත්වය ද කලින් කල වෙනස් වේ. අපේ ඉතා පැරණි සිංහල භාෂාව දූන් ව්‍යවහාර නො වන්නේ එහෙයිනි.

එසේම පෙර හෙලුබස වියරණෙහි බින්දුවර්ණය ද ප්‍රකෘති වර්ණයක් වශයෙන් නිර්දේශ නො කළ බැවි බින්දු වර්ණය ගැණීම සඳහා කව්ලැකියෙන් හා ලෙව්ලැකියෙන් නොයෙක් නිදසුන් ගෙණහැර පෑමෙන් සපුට වේ. පෙර බින්දුවර්ණය ප්‍රකෘති වර්ණසප්ලයෙහි නිර්දේශ නො කිරීම ද අශාස්ත්‍රීය ම නොවේ. සංස්කෘත වෛයාකරණයන්ගේ මතයට ද සම බැවිනි. සංස්කෘත වෛයාකරණයෝ වනාහි බින්දුවර්ණය මයන්න හෝ නයන්න පිළිබඳ උච්චාරණවිකෘතියක් යයි කිහු. ඔවුහු එසේම සංස්කෘතභාෂාවිෂයෙහි වූ අර්ධබින්දු විසර්ග ජිහ්වාමූලීය උපධ්මානීය වර්ණයන් ද උච්චාරණවිකෘති වශයෙන් දැක්වූහ. එහෙත් හෙලු වියරණෙහි බින්දුවර්ණය ද ප්‍රකෘති වර්ණසප්ලයෙහි ගිණියයුතු බැවි සිද්ධාන්තසංග්‍රහකාර ආචාර්ය්‍යපාදයන්ගේ මතය විය. කුමක් හෙයින් ද යත්? පාලි සංස්කෘත වඞ්ග හින්දි ආදි ප්‍රාචීන භාෂාවන්හි ඇතැම් ශබ්දයන් සිංහලට බිඳෙන කල්හි එහි ඇතැම් වර්ණයන් වෙනුවට සිංහලෙහි බින්දුවර්ණය වුවමනාවන හෙයිනි. කර්ණාටි-මූඬින්, සිංහල-මූං-මූඟු, පාලි-රඞ්ග, සිංහල-රඟ, යනාදි වශයෙනි. විශේෂ වශයෙන් පාලි සංස්කෘතාදියෙහි වූ ඞ යන්න වෙනුවට සිංහලෙහි බින්දුවර්ණය හැර වෙන වර්ණයක් නැත්තේය.

මෙසේ සත් යන පළමුවන වියරණ විදිය ලකුණු වලින්නුදු හඳුන්වා ඉක්බිති සෙසු එකුන්විසි වියරණවිදි පිළිවෙළින් හඳුන් වන්නාහු "පෙරපර වණන්"යනාදිය කිහු.

---

2. සඳවිදිය හැඳින්වීම.

**2. පෙරපරවණන් ගළපනු සඳ නම්. සඳෙව, මොහොර, ඈගි.**

2. **භා**:—පූර්වාපර වූ වර්ණවයක් හෙවත් ඉතා ආසන්නව සිටි ශබ්ද දෙකකින් පූර්ව ශබ්දයාගේ අන්ත්‍ය වර්ණය හා අපරශබ්දයාගේ ආදි වර්ණය යන දෙක උච්චාරණයෙන් අතර නැති ලෙස එකට ගැළපීම සඳ (සන්ධි) නම් වේ. "සඳෙව්, මොහොර" යනාදිය ඊට නිදසුනි.

**වි**—මේ වාක්‍යාර්ථසහගත ලක්ෂණයෙන් සඳවිදිය හැඳිනේ. "සඳෙව්, මොහොර"යන නිදසුන් ලකුණු දෙකෙනුදු ඒ වඩාත් හැඳිනේ. "සඳ-එව්" යන දෙක "සඳෙව්" කියා ද, "මහ-උර"යන දෙක "මොහොර" කියා ද ඈසෙන පෙණෙන හෙයිනි. මෙහි විස්තරය සඳ අදියරෙහි පැවසේ.

---

3. ලිඟුවිදිය හැඳින්වීම.

**3. මේය මෝය යන වහරට කරුණු වූයේ ලිඟු නම්. දිය, විදු-ඈගි.**

3 **භා**—භාෂාව්‍යවහාරයෙහි වූ යම් ශබ්දලක්ෂණයක් මේය යන ව්‍යවහාරයටත්, යම් ශබ්දලක්ෂණයක් මෝය යන ව්‍යවහාරය ටත් කරුණුවූයේ නම් ඒ ශබ්දලක්ෂණය ලිඟු (ලිඞ්ග) නමැයි කියනු ලැබේ. ඒ ලක්ෂණරු නම් පුරුෂත්වය හෝ ස්ත්‍රීත්වය විය යුතුයි. "දිය, විදු" යනාදිය ඊට නිදසුන් වේ.

**වි**—මේ වාක්‍යාර්ථලක්ෂණයෙන් හා නිදශීනලක්ෂණයෙන් ලිඟුවිදිය හැඳිනේ. භාෂාව්‍යවහාරයෙහි යෙදෙන්නාවූ ශබ්ද වනාහි "නාම ආඛ්‍යාත උපසර්ග නිපාත"යයි සිවු කොටසෙකි, ඔවුනතු රෙන් මේය මෝය යන වහරට කරුණු වූ ලක්ෂණ ඇත්තේ නාම යෙහි පමණෙකි. භාෂාවිෂයෙහි ලිඞ්ගභෙදයක් ඇතිවූයේ ප්‍රාණීන් නිසා වියයුතුයි. භාෂාවෙහි වූ ප්‍රාණිවාචක අප්‍රාණිවාචක ශබ්දයන් අතුරෙන් ප්‍රාණිවාචක ශබ්දයන් මුඛ්‍යස්ථානයෙහි ගිණිය

යුතු බැවිනි, ප්‍රාණීන්ගේ වූකලි පුරුෂත්වය හෝ ස්ත්‍රීත්වය හෝ නැත් නම් උභයමුක්තකත්වය හෝ ඇත්තේ වේ. ඔවුන් හමුවූ කල්හි ඒ ලක්ෂණත්‍රයෙන් හැඳින පුරුෂත්වයෙන් හෝ උභයමුක්තකත්වයෙන් යුක්තවූවහුට මේය කියා ද, ස්ත්‍රීත්වයෙන් යුක්තවූවහුට මෝය කියා ද සිංහලෙහි ව්‍යවහාර කරණු ලැබේ. භාෂාව්‍යවහාරයෙහි වූ අප්‍රාණිවාචක ශබ්දයෝ ද අමුඛ්‍යවශයෙන් මේ ත්‍රිභේදයෙහි හා විභේදයෙහි ද ඇතුළත් වූහ. එසේ නැත්නම් වාග්ව්‍යවහාරය ශාස්ත්‍රීය නොවන බැවිනි. පාලි සංස්කෘත භාෂාවන්හි අප්‍රාණිවාචක ශබ්දයන්ගේ ද පුරුෂත්වය හා ස්ත්‍රීත්වය බොහෝසේ ප්‍රකෘතිරූපයෙනුදු හැඳිනේ. ලිඞ්ගාර්ථප්‍රකාශක විභක්තිරූපයෙන් වනාහි ඒ ත්‍රිභේදය ම හැඳිනේ. එහෙත් අප්‍රාණිවාචක සිංහල ශබ්දයන්ගේ ශබ්දරූපයෙන් හෝ විභක්තිරූපයෙන් එබඳු වෙසෙසක් නො පැණේ. එබැවින් මෙහි ලිඟු විදිය පිළිබඳ ප්‍රතිනිර්දේශවාරයෙහි (ලිඟුඅදියරෙහි) සිහලසදනට ලිඟුබේ ඇත්තේ සකුසත්අනුසෙරෙනැයි කීහ. සකුසත් අනුසෙරෙන් මුත් අන් ලෙසකින් අප්‍රාණිවාචක සිංහල ශබ්දයන්ගේ ලිඞ්ගභේදයක් නො පැණේ. එහිදු පුම ඉතිරි ලිඟු දෙක හැර අන් වහර වෙසෙසක් නො පෙණෙන බැවි ද කීහු.

පාලි සංස්කෘත භාෂාවන්හි වූ නපුංසක ලිඞ්ගශබ්දයෝ සිංහලට බිඳී ව්‍යවහාරප්‍රාප්ත වූවෝ ඇත්තාහ, එබඳු ශබ්දයක් අභිමුඛ කොට ව්‍යවහාරකරණ කල්හිදු මේය කියාම මුත් අන් ලෙසකින් සිංහලයෝ ව්‍යවහාර නො කෙරෙත්. එබැවින් සිඬාන්ත සඞ්ග්‍රහ කර්තෘපාදයන් කිවේ ඒ නපුංසකලිඞ්ග ශබ්දයන් සිංහලෙහි නැති බැවි නොවේ, නපුංසක ලිඞ්ග වශයෙන් වහර වෙසෙසක් නො පෙණෙන බවයි. එහෙත් ඇතැම්හු සිදත්කතුපානන් නපුංසකලිඞ්ගය සිංහලෙන් හළේ යයි උන්වහන්සේට නිකරුණේ දොස් නගත්. සකුසත්වහරෙහි නම් ලිඞ්ගත්‍රයෙහි වෙසෙස පෙණේ. "එෂඃ එෂා එතත්" යනාදි වශයෙනි. "එෂඃ, එතත්" යන දෙකටම සිංහලෙහි "මේ" කියාද, "එෂා" යන්නට "මෝ" කියා ද ව්‍යවහාර කරණු ලැබේ. එහෙත් ඇතැම්හු "එෂඃ" යන පුංලිඞ්ගරූපය වෙනුවට "මේ" කියා ද, "එෂා" යන ස්ත්‍රීලිඞ්ග රූපය වෙනුවට "මෝ" කියා ද, "එතත්" යන නපුංසකලිඞ්ග රූපය වෙනුවට "මේක" කියා ද ව්‍යවහාරවන බැවි කියත්, නුමුත් "මේක" යන ව්‍යවහාරය නපුංසකත්වය සඳහා කරණ ව්‍යවහාරයෙක් නොවේ. බොහෝ සෙයින් ඒ ව්‍යවහාරය කෙරෙන්නේ අප්‍රාණීත්වය ප්‍රකාශකිරීම පිණිසයි.

ලිඟු විදිය හැඳින්වීමට නිදසුන් දක්වන්නාහු "දිය, විඳු" යනු කීහු. මෙසේ නිදසුන් කොළේ ප්‍රාණිවාචකයන්ගේ ලිඞ්ගභෙදය ප්‍රකට බැවිනුත් සකුසත් අනුසරින් ලිඞ්ගභෙදය ගතයුතු බැවිනුත් සාමාන්‍ය නිදේශයෙන් පැවසියයුතු බැවිනුත් වියයුතුයි. හෙළදිව් බස වහරෙහි ලිඟුබේ ඇතිවූයේ සකුසත් අනුසරින් යයි කියන්නට හෙතු කවරේ දැයි සිතියයුතු වේ. සිංහල ශබ්දයන්ට අරුත් පවසන කල්හි බොහෝ සෙයින් ව්‍යවහාර කරන්නේ සංස්කෘත ශබ්දයෙකි, "දිය, ජගත්තෙමේය; විඳු, විද්‍යුත්තාමෝය" යනාදි වශයෙනි. සිංහල ශබ්දව්‍යවහාරයෙහි මෙබඳු සකුබස වහරක් නැත් නම් "දිය" යන්න පුංලිඞ්ගය කියා හෝ "විඳු" යන්න ස්ත්‍රීලිඞ්ගය කියා හෝ හඳුනාගත හැකි නොවේ. මෙසේ හෙයින් සිංහල ශබ්දයන්ගේ ලිඞ්ගභෙදය පෙණෙන්නේ සංස්කෘත ශබ්දානුසාරයෙනි.

ලිඞ්ග ලක්‍ෂණ පවසන්නා වූ පාලි සංස්කෘත වෛයාකරණයෝ ද සප්‍රාණ අප්‍රාණ විශෙෂයක් නැතිව සාමාන්‍ය නිදේශයෙන් දක්වූහ. පාලියෙහි "ධාතුප්පච්චයවිභත්තිවජ්ජිතමත්ථයුත්තං සද්ද රූපං ලිඞ්ගං නාම" යනු කීහ. හුදකලා ධාතුවෙන් හා ප්‍රත්‍යයයෙන් ද විභක්තියෙන් ද තොර වූ අර්ථවත් ශබ්දරූපය ලිඞ්ග නම් වේ යනු එහි අර්ථයි. මෙයින් හැඟෙන්නේ අර්ථවත් සාමාන්‍ය ශබ්දරූපය ලිඞ්ග යයි කී බවයි. මෙසේ හෙයින් සිදතෙහි ද සප්‍රාණ අප්‍රාණ භෙදයක් නො කොට සකුසත් අනුසරින් මේය මෝය යන වහර දෙකට කරුණු වූ "දිය, විඳු" යන දෙක දක්වී යයි ද සිතිය හැකි වේ. සංස්කෘතයෙහි ස්ත්‍රීලිඞ්ග නුවූ සියලු ශබ්දයෝ ම සිංහලෙහි මේය යන වහරට ද, ස්ත්‍රීලිඞ්ගයෝ මෝය යන වහරට ද කරුණු වෙත්.

---

## 4. විබත්විදිය හැඳින්වීම.

**4. නමින් පරව බෙදනු ලබනුයේ විබත් නම්. යෙහෙ, සෙබෙහි-ඈහි.**

4. භා—නාමයෙන් පරව සිට ඒ නාමය පිළිබඳ වූ ලිඞ්ග කර්තෘ කර්මාදි අර්ථ විශෙෂයන් බෙදනු ලැබීමට ඉවහල් වූ ප්‍රත්‍යය විශෙෂය විබත් (විභක්ති) නම් වේ. "යෙහෙ, සෙබෙහි" යනාදිය ඊට නිදසුන් වේ.

**වි**—මෙහි දැක්වූ වාක්‍යාර්ථ ලක්ෂණයෙන් ද විබත්විදිය හැඳිනේ, "යෙහෙ, සෙබෙහි" යන නිදසුන් ලකුණු දෙකෙන් ඒ වඩාත් හැඳිනේ, එනම්- "යහ" යන නාමය ලිඞ්ගාර්ථයට බෙදී මේදී ඉන් පරව සිටි "එ" යන්න ද, "සබ" යන නාමය ආධාරාර්ථයට බෙදීමේදී ඉන් පරව සිටි "එහි" යන්න ද ඔවුන් බෙදනු ලැබීමට ඉවහල්වූ බැව් පෙණේ, ඈසේ. එබැවින් මෙහි නමින් පරව සිටි "එ, එහි" යන දෙක විබත් නම් වේ. මෙසේ යෙදෙන සියලු ප්‍රත්‍යයයෝ ම විබත් නමින් ව්‍යවහාර කරණු ලබත්.

තව ද මෙසේ ප්‍රත්‍යයයොගයෙන් බෙදනු ලැබූ පදයෝ ද විබත් නමින් ව්‍යවහාර කරණු ලබත්. එනම්- "යෙහෙ" යනු පෙර විබති, "සෙබෙහි" යනු අදරවිබති, යනාදි වශයෙනි.

ඇතැම්හු මෙහි "බෙදනු ලබනුයේ විබත් නම්" යී යෙදිම සාවද්‍ය යයි කියති, එසේ කියන්නේ "බෙදනුලබනු" යන්න කර්මාර්ථ වශයෙන් ම සලකා ගෙණ විය යුතුයි. සමහරු "ලබ" ධාතුවෙන් සිඬ පද කර්මාර්ථවශයෙන් ම සලකති, එසේ සැලකිම ශාස්ත්‍රිය නොවේ. සෙසු ධාතුවලින් කර්මාදි ෂට්කාරකයෙහි හා භාවයෙහි යම්සේ පද යන්ගේ සිඬිය වේ නම් "ලබ" ධාතුවෙන් ද එසේමැයි. "න-නු" ප්‍රත්‍යයාන්ත ශබ්ද සාමාන්‍ය වශයෙන් ෂට්කාරකාර්ථයෙහි හා භාවාර්ථයෙහි සිඬවූවෝ වෙත්, ඔවුන්ගේ අර්ථවිශෙෂයෝ තත් තද්වාක්‍යානුසාරයෙන් දතයුතුයි. මෙහි "බෙදනු-ලබනු" කියා පද දෙකෙකි. එහි "බෙදනු" යන්න භාවාර්ථ වශයෙන් ද, "ලබනු" යන්න කරණාර්ථවශයෙන් ද සිඬයි. එකල්හි "බෙදනු" යන්නෙන් "බෙදීම" යන අර්ථය ද "ලබනුයේ" යන්නෙන් ලැබිමට ඉවහල් වනුයේ යන අර්ථය ද ලැබේ. එසේ සලකා බලනකල්හි "බෙදනු ලබනුයේ විබත් නම්" යි යෙදීම සාවද්‍ය යයි නොවැටහේ.

සංස්කෘත "විභක්ති" ශබ්දයේ නිර්වචන වාක්‍යය සිංහලට පරිවර්තනය කොට බැලුව හොත් මෙහි තත්ත්වය වඩාත් වටහාගත හැකි වේ. "විභජ්‍යන්තෙ කර්තෘකර්මාද්‍යර්ථා යයා සා=විභක්තිඃ" යනු සංස්කෘත නිර්වචන වාක්‍යයයි. 'යමක් කරණකොටගෙණ කර්තෘ කර්මාදි අර්ථයෝ බෙදනු ලබත් නම් ඒ විභක්ති නම් වේ" යනු එහි සිංහල පරිවර්තනයයි. මේ වාක්‍යයෙහි අර්ථය පිඬු කොට කියතොත් "බෙදනුලැබීමට කරණවනුයේ විබත් නම් වේ" යනුයි. බොහෝ තන්හි පාලිසංස්කෘත එක් ශබ්දයක් වෙනුවට සිංහල පරිවර්තනයෙහි ශබ්ද දෙකක් ද යෙදෙන බැවින් සංස්කෘත වාක්‍යයෙහි උක්තානුක්තතාව හා සිංහල වාක්‍යයෙහි උක්තානුක්තතාව සම නොවේ. මෙහි "විභජ්‍යන්තෙ" යන කර්මාර්ථක්‍රියාපදයෙන් "කර්තෘ

කර්මාද්‍යර්ථාඃ" යනු උක්තකර්මයි. එහෙත් සිංහල පරිවර්තනයේදී "විභජ්‍යනෙත" යන එක පදය වෙනුවට "බෙදනු-ලබත්" යි පද දෙකෙක් යෙදේ. එබැවින් එහි 'ලබත්" යන ක්‍රියාව කර්තෘර්ථ වේ. "කර්තෘකර්මාදිඅර්ථ" යනු ඒ ක්‍රියාවෙහි උක්ත කර්තෘ යි. "බෙදනු" යනු එහි අනුක්ත කර්මයි.

---

5. සමස් විදිය හැඳින්වීම.

**5. නේසදක් සිංහාව එකසද අයුරක් වන සේ ගලපනු සමස් නම්. මීපල්, නිලුපුලැසි, ඇගි.**

5. භා—ශබ්ද දෙකක් හෝ කීපයක් එකතු ව එක් ශබ්ද යන ආකාරයෙන් ගැලපීම සමස් (සමාස) නම් වේ. "මීපල්, නිලුපු ලැසි" යනාදි වශයෙනි.

වි—මෙයින් සමස්විදිය හැඳිනේ. මෙහි භූමිවාචක"මි"ශබ්දය ද, පාලක වාචක "පල්" ශබ්දය ද යන දෙක. එකට ගැලපීමෙන් "මීපල්" යී එක් ශබ්දයක් ද, "නිල්" ශබ්දය ද, "උපුල්" ශබ්දය ද, "ඇස්" ශබ්දය ද යන තුණ එකට ගැලපීමෙන් "නිලුපුලැසි" යි එක් ශබ්දයක් ද වේ. සමාසවිස්තරය සමස් අදියරෙහි පැවසේ.

---

6. පියවි විදිය හැඳින්වීම.

**6. පියවි දෙවැදූරූම්-දපියවි සද පියවි වි; පදයොන් දපියවි නම්, විබනැනට ඇසිරූ සද පියවි නම්.**

6. භා—මෙහි පියවි විදිය හඳුන්වන්නාහු ධාතුප්‍රකෘතිය ශබ්ද ප්‍රකෘතිය කියා ප්‍රකෘතිය දෙපරිදි යයි ද, එහි පදයන්ගේ උත්පත්ති යට මුල් වූයේ ධාතු ප්‍රකෘති නම් යයි ද, විභක්ති ආදීන්ට ආශ්‍රය ස්ථාන වූයේ ශබ්දප්‍රකෘති නම් යයි ද කීහු.

වි—මින් "පියවි" ශබ්දයාගේ තත්ත්වය තිසිලෙස නොහැඳිනේ. "පස ඉපැත්මට නිමිති වනුයේ පියවි නම්" යනුවෙන් ඒ හැඳිනිය යුතුයි. සාමාන්‍යයෙන් විකාරයට නොපත් මුල් ආකාරය පියවි යයි දතයුතුයි. භාෂාවිෂයෙහි වූ ඒ මුල් ආකාර දෙකෙකි. එකෙක් නම් විකාර නුවූ හුදු ධාතුරූප යයි. ඒ ධාතුරූපය අර්ථවත් ධාතු මූලක සකල ශබ්දයන්ගේ ම උත්පත්තියට මුල් වේ. අනෙක නම් විකාර නුවූ හුදු ශබ්දරූප යයි, ඒ වනාහි විභක්ත්‍යාදීන්ට ආශ්‍රය ස්ථාන වේ. මේ දෙක කෙරෙන් ම ප්‍රත්‍යයයන් යෙදෙන බැවින් මේ දෙක පස ඉපැත්මට නිමිති වේ. සිංහලෙහි වූ ඒ දපියවි සදපියවි දෙක විභාග කොට දක්වන්නාහු "වෙන වෙත" යනාදිය කීහු.

a. **වෙන වෙන දෙසා නිපන්-තසම තබවයි එ තෙබේ,**
**කිසි අන්බසින් නුමුසු-හෙළදිවැ පළ නිපන් නම්.**
**මගද සකු ඈ බණ-සම්වූ බස තසම නම්,**
**බිඳුණේ තබව නම් වී-විමසා දනු එහි පියෝ.**

a. භා—ඒ දුපියවි සදපියවි දෙක වෙන් වෙන් වශයෙන් නිෂ්පන්න තත්සම තද්භව යයි තෙවැදෑරුම් වේ. එහි අන්‍ය භාෂාවක් හා අමිශ්‍රත්වයෙන් ලක්දිව්හි ම පළවූ ධාතු හා ශබ්ද නිෂ්පන්න යයි ද, මාගධ සංස්කෘතාදි ධාතුවලට හා ශබ්දවලට සම්වූ ධාතු හා ශබ්ද තත්සම යයි ද, ඒ මාගධාදියෙන් බිඳුනාවූ ධාතු හා ශබ්ද තද්භව යයි ද කියනු ලැබේ. එහි ප්‍රයොග විමසා දතයුතු. ඒ ප්‍රයොගයන් දක්වන්නාහු "රුකුර" යනාදිය කීහු.

a. **රුකුරු නරඹ ඈ නිපන් දු පියවි නම්.**
**යා දු කර ඈ තසම දුපියවි නම්.**
**දන නැගි සමර තුලුර ඈ තබව දු පියවි නම්.**

b. **කොළඹ කරළු ඈ නිපන් සද පියවි නම්.**
**ගජ කර කිරණ ඈ තසම සද පියවි නම්.**
**අත් රුක් සමක්බහඳුරු ඈඳුරු කන් අඹුල් ඈ**
**තබව සදපියවි නම්.**

a. භා—කරණාර්ථවශයෙන් ව්‍යවහාරයට පැමිණියාවූ "රුකුර" ධාතුව ද, නිරීක්ෂණාර්ථවශ්යෙන් ව්‍යවහාරයට පැමිණියාවූ "නරඹ" ධාතුව ද යන මේ ආදිය ලක්දිව ම නිපන් බැවින් නිපන් දුපියවි නම් ද, ගමනාර්ථවශයෙන් ව්‍යවහාරයට පැමිණියාවූ "යා" ධාතුව ද, දානාර්ථවශයෙන් ව්‍යවහාරයට පැමිණියාවූ "දු" ධාතුව ද, කරණාර්ථ වශයෙන් ව්‍යවහාරයට පැමිණියාවූ "කර" ධාතුව ද යන මේ ආදිය මාගධ හා සමබැවින් තසම දුපියවි නම් ද, ජයාර්ථවශයෙන් ව්‍යවහාරයට පාමිණියාවූ "දන" ධාතුව ද, ලඞ්ඝනාර්ථ වශයෙන් ව්‍යවහාරයට පැමිණියාවූ "නැගි" ධාතුව ද, සමරණාර්ථවශයෙන් ව්‍යවහාරයට පැමිණියාවූ "සමර" ධාතුව ද, ආලිඞ්ගනාර්ථ වශයෙන් ව්‍යවහාරයට පැමිණියාවූ "තුලුර" ධාතුව ද යන මේ ආදිය මාගධ සංස්කෘතාදියෙන් බිඳී ආ බැවින් තබව දු පියවි නම් ද වෙත්.

b. භා—නැව්තොටකට ව්‍යවහාර වූ "කොළඹ" ශබ්දය ද, නව වස්ත්‍රයට ව්‍යවහාර වූ "කරළු" ශබ්දය ද යන මේ ආදිය ලක්දිව නිපන් බැවින් නිපන් සදපියවි නම් ද, හස්තියාට ව්‍යවහාර වූ "ගජ" ශබ්දය ද, හස්තයට හෝ රශ්මියට ව්‍යවහාර වූ "කර" ශබ්දය ද, රශ්මියට ව්‍යවහාර වූ "කිරණ" ශබ්දය ද යන මේ ආදිය මාගධ සංස්කෘත

හා සම බැවින් තත්සම සදපියවි නම් ද, හස්තාදියට ව්‍යවහාරවූ "අත්" ශබ්දය ද, වෘක්ෂයට ව්‍යවහාර වූ "රුක්" ශබ්දය ද, සමන්තභද්‍රයන්ට (බුදුන්ට) ව්‍යවහාරවූ "සමන්බහදුරු" ශබ්දය ද, පණ්ඩිතදීන්ට ව්‍යවහාර වූ "ඇදුරු" ශබ්දය ද, කර්ණයට හෝ නෛත්‍රයට ව්‍යවහාර වූ "කන්" ශබ්දය ද. අම්බිලාදියට ව්‍යවහාර වූ "ඇඹුල්" ශබ්දය ද යන මේ ආදිය මාගධ සංස්කෘතාදියෙන් බිඳී ආ බැවින් තබ්බව සදපියවි නම් ද වෙත්.

වි — මේ නිදසුන් ලකුණුවලින් පියවි විදිය හැඳිනිය හැකි වේ. එහෙත් සිද්ධාන්ත සඞ්ග්‍රහ කර්තෘපාදයන් මේ පියවි මෙසේ නිදසුන් කළ ද පියවිපිළිබඳ විනිශ්චය ඉතා දුෂ්කර වේ. උන්වහන් සේ ද පියවි පිළිබඳ සම්පූර්ණ විනිශ්චයක් නොකළ බැව් "විමසා දනු එහි පියෝ" යනු කීමෙන් හැඟේ. සංස්කෘත වෛයාකරණයෝ ද "ඉන්ද්‍රාදයෝපි යස්‍යාන්තං න යයුඃ ශබ්දවාරිධෙඃ" යනුවෙන් ඉන්ද්‍රාදීන්ට පවා ශබ්දයන්ගේ සම්පූර්ණ විනිශ්චයකට පැමිණිය නොහැකි "වූ බැව් කිහු. සිංහල භාෂාවේ පියවි පිළිබඳ විනිශ්චය අතිශය දුෂ්කර බැව් කිව හැකි වේ. සිංහල භාෂාව මාගධ සංස්කෘත ප්‍රාකෘත වඞ්ග හින්දි මහාරාෂ්ට්‍රි ගුජරාටි උර්දු ද්‍රවිඩාදි භාෂාවන්ගේ පියවි හා සමත්වයෙන් ද එයින් බිඳීමෙන් ද නා නා භාෂා සම්මිශ්‍ර භාෂාවක් බැවිනි. එබැවින් ම මෙහි දක්වූ "රුකුර, නරඹ" යන දෙක නිෂ්පන්නයයි කියා ම නිශ්චයට පැමිණිය හැකි නොවේ, "යා ද, කර" යන තුණ පාළියෙහි ද ඇති බැවින් තත්සමයයි නිශ්චය කටහැක, "දත" යන්න විකරණ සහිත "ජී" ධාතුවෙන් ද හෙවත් ජී නා" යන්නෙන් ද, "නැගි" ධාතුව "ලඝි" ධාතුවෙන් ද, "සමර" යන්න "සමෘ" ධාතුවෙන් ද, බිඳුනේයයි කියති. එහෙත් ඔවුන් බිඳීමට වෙන භාෂාවන්හි මොවුන්ට වඩා ආසන්න ධාතු ඇතිවිය හැකි බැවින් එසේ මයයි නිශ්චය නොකොට හැකි වේ. "තුලුර" යන්න කෙසේත් අවිනිශ්චිත වේ.

"කොළඹ" යන්න ඒ පෙදෙසට ලක්දිව්හි ම නිපිද රූඪ වීයයි සිතිය හැකි වේ. එහෙත් "කරළ" යන්න එසේ නිශ්චය කටහැකි නොවේ. ගුජරාටි භාෂාවෙහි නව වස්ත්‍රයට "කරල" යයි කියත්ලු. "ගජ කර කිරණ" යන තුණ පාළියෙහි ද ඇති බැවින් තත්සම වේ. "අන්ත අත්‍ථ හස්ත අස්ත" ශබ්දාදියෙන් "අත්" කියා ද, "රුක්ඛ" ශබ්දයෙන් "රුක්" කියා ද, "සමන්තභද්‍ර" ශබ්දයෙන් "සමන්බහදුරු" කියා ද, "අද්‍රි" ශබ්දාදියෙන් "ඇදුරු" කියා ද, (දෙමළ) "කණ්" ශබ්දයෙන් හෝ පාළි "කණ්ණ" ශබ්දයෙන් "කන්" කියා ද "අම්බිල" හෝ "කම්බල" ශබ්දයෙන් "ඇඹුල්" කියා ද බිඳේ යයි කියති. ඒත් විමසා බැලිය යුතුයි.

සිංහලෙහි බොහෝ ශබ්දයෝ සවල්ප ආසන්නත්වයක් සලකා අසවල් මාගධ ශබ්දයෙන් හෝ සංස්කෘත ශබ්දයෙන් බිඳුනාහු යයි ද, එසේ නැත් නම් නිෂ්පන්න යයි ද කීම බොහෝදෙනා අතර පව ත්නා සිරිතකි. එහෙත් ඒ ශබ්දයන් බිඳීමට ඊට වඩා ආසන්නවූ ශබ්දයෝ වෙන භාෂාවන්හි ඇත්තාහ. සිංහල "වඳුරු, බත්" යන මේ ශබ්ද මාගධ "වානර, භත්ත" යන මේ ශබ්දවලින් බිඳුනාහු යයි කියති. එහෙත් වඞ්ග හින්දි භාෂාවන්හි වූ "බඳර-භාත්" යන ශබ්දවලින් බිඳීම ඉතා ආසන්න බැව් පෙණේ. එසේම බොහෝ අය "කජු, දෙල්, කොස්" ආදි බොහෝ ශබ්ද නිෂ්පන්නයයි කියති. මේ මෙසේ හෙයින් එහි තත්ත්වය පවසනු වස් වඞ්ග හින්දි ආදි භාෂා වන්හි ශබ්ද සවල්පයක් මෙහි ගෙණහැර දක්වනු ලැබේ.

## වඞ්ග-සිංහල.

| වඞ්ග | සිංහල | වඞ්ග | සිංහල |
|---|---|---|---|
| බඳර | වඳුරු | චාඋල් | සාල් |
| කුල්‍ය | කුලු | පොටලි | පොට්ටනි |
| චීනි | සීනි | ආබාධ්‍ය | ඇබැද්දි |
| ජගඩ | ජගර | ජනාල | ජනෙල් |
| කොර | කොර | රූටි | රොටි |
| ගු | ගු | ආලු | අල |
| ගොලමරිච් | ගම්මිරිස් | ඩෙල | දෙල් |
| මාටි | මැටි | කොෂ | කොස් |
| පිත්තල | පිත්තල | භාත් | බත් |
| බොතල | බෝතල | වාලි | වැලි |
| ආබින් | අබින් | මරිච් | මිරිස් |
| පාලිකි | පල්ලැක්කි | උකුණ | උකුණු |
| පෙයාර් | පේර | මාදුර | පැදුරු |
| කොරාසි | කොරහ | මූට්කි | මූට්ටි |
| චිල් | චිල් | කිරිච් | කිරිච්චි |
| තොඩගර් | තැංගුරම් | ටුපි | තොප්පි |
| ගුදාම | ගුදම | බොතම් | බොත්තම් |

## හින්දි-සිංහල.

| හින්දි | සිංහල | හින්දි | සිංහල |
|---|---|---|---|
| මජ්ටි | මදටි | බොපරා | කොප්පරා |
| මෂවන් | මස්වැන්න | මූගවන් | මූංවැන්න |
| මෙඩාෂිඩගි | මැඩහගු | අනානස් | අන්නාසි |
| කජු | කජු | උක් | උක් |
| කාකරි | කැකිරි | මිරිච් | මිරිස් |

කණ්ණාටි-සිංහල.

| කණ්ණාටි | සිංහල | කණ්ණාටි | සිංහල |
|---|---|---|---|
| එරඬු | එරඬු | නෙල්ලි | නෙල්ලි |
| මඞගුල | මූගටි | මූඞග් | මූං |

මහාරාෂ්ට්‍ර-සිංහල.

| මහාරාෂ්ට්‍ර | සිංහල | මහාරාෂ්ට්‍ර | සිංහල |
|---|---|---|---|
| තුම්බා | තුඹ | තරෙට් | තෝර |
| කාරම්බු | කොළොම් | වෙලකාමූලි | වැල්කසඹිලිය |

තවද බොහෝ සිංහල ශබ්ද වඞග හිඳී ආදි භාෂාවන්හි ශබ්ද වලින් බිඳී ඇවිත් තිබෙන බැව් "කොළොම්" ශබ්දයෙනුදු සිතා ගත හැකි වේ. මෙය "කදම්බ" ශබ්දයෙන් බිඳුනේ යයි බොහෝ අය කියති, එහෙත් එයින් බිඳුනේ නම් එහි මූර්ධන්‍යළකාර ව්‍යව හාරය උචිත නොවේ. මූර්ධන්‍යළකාරයෙන් ව්‍යවහාරප්‍රාප්ත බැවින් එය "කරම්බු" ශබ්දයෙන් බිඳුනේ යයි තීශ්චය කට හැකි වේ.

---

7. පසවිදිය හැඳින්වීම.

**7. දසින් නමින් ශ්හොක කරණුයේ පස නම්, තිළි, කරණි, නියරි, ඇගි.**

7. භා—යථොක්ත ධාතුප්‍රකෘතියකින් හෝ ශබ්දප්‍රකෘතිය කින් හෝ පරව යම් කිසි අර්ථ විශෙෂයක් අපෙක්ෂා කොට කරණු ලබන වර්ණ විශෙෂය පස (ප්‍රත්‍යය) නම් වේ. "තිළි, කරණි, නියරි" යනාදිය ඊට උදාහරණයි.

වි—මෙහි තිදිෂ්ටවාක්‍යාර්ථලක්ෂණයෙන් පසවිදිය හැඳිනේ. අර්ථයක් පැවසීමට හෙතු වන්නේ ප්‍රත්‍යය යි. හුදකලා දාපියවිය හෝ සදපියවිය අර්ථය පවසන්නේ නොවේ. ප්‍රත්‍යය භෙදයෙන් ඒ ඒ ධාතුන්ගේ හා ශබ්දයන් ගේ අර්ථවිශෙෂයෝ ලැබෙත්. කිරිය අදියරෙහි හා පසරුත් අදියර කොටසෙක්හි හෙවත් ආඛ්‍යාත කෘදන්ත දෙක්හි ප්‍රත්‍යයයෝ ධතු ප්‍රකෘති කෙරෙන් ද, පසරුත් අදියර කොටසෙක්හි හෙවත් තද්ධිතයෙහි ප්‍රත්‍යයයෝ ශබ්දප්‍රකෘති කෙරෙන් ද යෙදෙත්, ස්ත්‍රී අර්ථයෙහි ප්‍රත්‍යයෝ ද ශබ්දප්‍රකෘති කෙරෙන් යෙදෙත්. මෙහි "තුස" ධාතුවෙන් අතීතාර්ථ අන්‍යකාරක එකවචනාර්ථාපෙක්ෂාවෙන් "ඊ" ප්‍රත්‍යය යෙදීමෙන් "තිළි"යි සිඞයි. සතුටු වී යන අර්ථයි. මේ ආඛ්‍යාතවශයෙනි. "කර" ධාතුවෙන් කර්තව්‍ය යන අර්ථය අපෙක්ෂා කොට "නී" ප්‍රත්‍යය යෙදීමෙන් "කරණී" යි සිඞයි, කටයුතු යන අර්ථයි. මේ කෘදන්ත වශයෙනි.

"නුවර" යන ශබ්ද ප්‍රකෘතියෙන් වාසාර්ථාදියක් අපෙක්‍ෂා කොට ඊ ප්‍රත්‍යය යෙදීමෙන් "නියරී" යි සිඩයි. නුවර වැසියෙක් යනාදි අර්‍ථයි. මේ තඩිතවශයෙනි. මොවුන්ගේ සිඩිය ආදෙශාදිවශයෙන් සිඩවූ පරිද්දෙන් දතයුතුයි.

---

8. කිරිය විදිය හැඳින්වීම.

**8. නොදුව් නුගුණ දුව් නිසා සකරුණෙන් දු වුවවැ සිදු කිරිය නම්. දිනී වැජඹෙති දෙන්නෙම්, ඇගි**

8' **භා**—ද්‍රව්‍යයක් හෝ ගුණයක් නුවූ ද්‍රව්‍යයක් ඇසුරු කොට කර්‍මාදි ෂට්කාරකයේ උපකාරයෙන් ධාතුවෙන් නිපන් පදයක් ව සිඩවූයේ කිරිය (ක්‍රියා) නමි. "දිනී, වැජඹෙති, දෙන්නෙම්" යනු ඊට උදාහරණයි.

**වි**—ක්‍රියාව වනාහි ද්‍රව්‍යයක් නොවේ. ගුණ ආදියට ආධාර නොවන බැවිනි, ගුණයකුදු නොවේ. නිල් සුදු කුදු මහත් ආදි ආකාර රහිත බැවිනි. ක්‍රියාව තමා ද්‍රව්‍යයක් නුවූවත් ද්‍රව්‍යයක් ඇසුරු කොට පවත්නී වේ. ඒ ක්‍රියාවන්ගේ සිඩියට වනාහි කාරකයෝ උපකාර වෙති, එහෙයින් ම කාරකයට "ක්‍රියාසිඩ්‍යුප කාරක" යයි ද සංස්කෘත වෛයාකරණයෝ කිහු. "සිටි" යනු ක්‍රියාවකි, එහෙත් සිටින කෙනෙකුත් සිටින තැනකුත් නැත් නම් ඒ ක්‍රියාව ද අසිඩයි. "මිනිහා බිම සිටි" යනාදි වශයෙන් යෙදෙන බැවින් "මිනිහා" යි කර්තෘ කාරකයක් හා "බිම" යි ආධාර කාරක යක් උපාකාර වීමෙන් ඒ ක්‍රියාව සිඩයි. ඒ වනාහි "දුව් නිසා" යනු කිහෙයින් ආශ්‍රිත ද්‍රව්‍යය ද වේ. මෙහි විස්තරය කිරිය අදියරෙහි හා කිරියකරුසබඳ අදියරෙහි පැවසේ.

"දිනී, වැජඹෙහි, දෙන්නෙම්" යන තුණ අන්‍යකාරකාදි කාරක තුණෙහි හෙවත් ප්‍රථමාදි පුරුෂ තුණෙහි හා අතීතාදි කාල තුණෙහි ක්‍රියා තුණෙකි. "හේ දිනී, තෝ වැජඹෙහි, මම දෙන් නෙම්" යනාදි වශයෙන් යෙදේ.

---

9. ලොප්විදිය හැඳින්වීම.

**9. වණක් අනුසුරුවීම් ලොප් නම්. නත් වරද මහසුප් රදු බා සා-ඇගි.**

9. **භා**—වර්‍ණයන් උච්චාරණය නොවීම හෙවත් වර්‍ණනාශය ලොප් (ලොප) නම් වේ. "අනත්, යුවරද" යන දෙතන්හි ආදි වර්‍ණය අනුසුරුවීමෙන් "නත්, වරද" කියාද, "මහාසුප්, රජදු"

යන දෙතන්හි මධ්‍යවර්ණය අනුසුරුවීමෙන් "මගසුප්, රදූ" කියා ද, "බාහු, පාද" යන දෙතන්හි අන්ත්‍ය වර්ණය අනුසුරු වීමෙන් "බා, පා" කියා ද ව්‍යවහාර වේ. මේ නිදසුන් ලකුණුවලින් ලොප් විදිය වඩාත් හැඳිනේ. මේ ලොප්විදිය සන්ධිසමාසාදි ව්‍යාකරණවිධි විෂයෙහි හා ශබ්දයන්ගේ සුඛොච්චරණය ශ්‍රෛරක්ෂණය යනාදි තන්හි ද දක්නා ලැබේ.

---

10. අදෙස් විදිය හැඳින්වීම.

**10. වණක්හු ලොපා වණක්හු කිරිම් අදෙස් නම්. සැරියුත්, අයුණු, වැහැප්, ඈගි.**

10. **භා**—ප්‍රකෘතියෙහි තුබූනු වර්ණය නසා ඒ වෙනුවට අන්‍යවූ වර්ණයක් කිරීම අදෙස් (ආදෙශ) නම් වේ. "සැරියුත්" යනාදිය ඊට නිදසුනි.

**වි**—මෙයින් අදෙස් විදිය හැඳිනේ. "සැරිපුත්, අගුණ, වසබි" යි සිටි ප්‍රකෘතීන්ගේ "ප-ග-ස-බි" යන වර්ණයන් නැසීමෙන් ඔවුන් වෙනුවට "ය-ය-හ-ප්" යන මේ වර්ණයන් වීමෙන් "සැරියුත්, අයුණු, වැහැප්" යි අසන්නට දකින්නට ලැබෙන බැවින් මෙයිනුදු අදෙස් විදිය හැඳිනේ.

තුබූනු වර්ණයක් නසා අන්‍ය වර්ණයක් වීමෙන් මේ අදෙස් විදිය සතුරෙකු වැනි යයි සංස්කෘත ශාබ්දිකයෝ කියති. "ශත්‍රුවදාදෙශඃ" යන වාක්‍ය වශයෙනි. මේ අදෙස් විදිය වනාහි උච්චාරණ භෙදය විෂය කොට ද භාෂාවන්හි ඇති වන්නෝ වේ. සිංහල ශබ්ද භෙදයෙහි ආදෙශ වර්ණයන්ගේ හා ආදෙශිවර්ණයන්ගේ විස්තරය ඉතා විශාල වේ. ප්‍රයොගානුසාරයෙන් දතයුතුයි.

---

11. අගම් විදිය හැඳින්වීම.

**11. වණක්හු නිසා ඔහු නොලොපා වනුයේ අගම් නම්. නිරලඹ, රුවාරු, ඈගි.**

11. **භා**—ශබ්දගතව ඇත්තාවූ වර්ණයක් ඇසුරු කොට ඒ වර්ණය නොනසා ආගන්තුක වශයෙන් වන්නාවූ වර්ණ විශෙෂය අගම්(ආගම)නම් වේ. "නිරලඹ, රුවාරු" යනාදිය ඊට උදාහරණයි.

**වි**—මෙයින් අගම් විදිය හැඳිනේ, "මිත්‍රවදාගමඃ" යනුවෙන් ආගමවර්ණය මිතුරෙකු වැනි යයි කියති. ඒ ඒ ශබ්දයන්ගේ උච්චාරණයෙහි යම් ඌනතාවක් වේ නම් කිසිවකු නොපෙළා ඒ සම්පූර්ණ

කිරීමට පැමිණෙන වර්‍ණවිශෙෂයක් බැවිනි. "නි–අලඹ" යන තන්හි උච්චාරණය සිලුටු නොවේ. ඌනතාවක් මෙන් පෙණේ, එබැවින් එහි ආගන්තුක වශයෙන් රයන්න පැමිණීමෙන් "නිර ලඹ" කියා වේ. "රූ–අරූ" යි සිටි තන්හි ද වයන්න පැමිණීමෙන් "රුවාරූ" කියා වේ. මෙහි අකාරදීර්‍ඝය ද වේ. මෙයින් අගම් විදිය හොඳින් හැඳිනේ.

සිංහල භාෂාවෙහි බොහෝ සෙයින් පැමිණෙන්නාවූ ආගම වර්‍ණ නම් "ය ව" දෙකයි. එහි "අ ඉ ඊ ඒ" යන මේ සවරයන් කෙරෙන් යයන්න ද, "ආ උ ඌ ඕ" යන මේ සවරයන් කෙරෙන් වයන්න ද ආගම වන බැව් පෙණේ. "සබ–අ–සබය, කොටි–ආ–කොටියා,මවන්නී–අ=මවන්නිය,ගේ–ඉන්=ගෙයින්,තලා–අ–තලාව, කොටු–අ=කොටුව, රූ–අ=රුව, ලෝ–අ–ලොව" යනාදි වශයෙනි.

සංස්කෘතභාෂාවෙහි වූ "නිර්, පුනර්" ආදි රකාරාන්ත ශබ්ද සිංහලට බිඳීතිබෙන්නේ "නි, පුන" ආදි වශයෙනි. ඔවුන් කෙරෙන් රකාරය ආගම වන බැව් පෙණේ. "නි ·ඔද=නිරොද, පුන–උත්= පුනරුත්" ආදි වශයෙනි. මේ ශබ්ද පාළියෙහි ද "නි–පුන" කියාම වේ. එහිදු "නිරොජ, පුනරුත්ත"යනාදි වශයෙන් රකාරාගමයෙන් ශබ්දනිෂ්පත්තිය වේ. ඇතැම් තන්හි හකාරය ද ආගම වේ, ඒ හකර විතිසෙහි පැවසේ.

මෙහි කි "නිරලඹ, රුවාරූ"යන දෙක "නිරාලම්බ, රූපාරූප" යන දෙකෙන් බිඳෙනු විනා එහි අගම්විදියක් නැතැයි සමහරු කියති. එසේ නොබිඳිය හැකියයි අපිදු නොකියමු. එසේ බිඳීමෙන් මේ නිදේශයට බාධාවක් නොපැමිණේ. "නි–අලඹ, රූ–අරූ" යි වෙන් වශයෙන් පවත්නා වූ ශබ්ද සිංහලෙහි නැත් නම් ඔවුන්ගේ ඒ කිම තරමක් දුර සලකා බැලිය යුතුවේ. "නිර්" යන්නෙන් බිඳී තිබෙන "නි" ශබ්දය ද "ආලම්බ" ශබ්දයෙන් බිඳී තිබෙන "අලඹ" ශබ්දය ද එකතුවීමේදී "නිරලඹ" කියා ද "රූප" ශබ්දයෙන් බිඳී තිබෙන "රූ" ශබ්දය ද "අරූප" ශබ්දයෙන් බිඳී තිබෙන "අරූ" ශබ්දය ද එකතුවීමේදී "රුවාරූ" කියාද වේ. මේ වියරණවශයෙන් කටයුතු අනුශාසනයෙකි. මෙසේ ශබ්ද යන්ගේ බිඳීම සලකා වියරණවිදි අත්හරිතොත් සිංහලට බොහෝ වියරණවිදි වුවමනා නොවෙති. විශෙෂයෙන් සමාස තද්ධිත කෘදන්තයන්ගෙන් වුවමනාවක් නොලැබේ. "යව්දිව්, ගත්කරු, තිලුපුල්, හිරසඳ, මන්වා, දන්වා, සෝගත්, කරණී, පැන්" ආදි සමාස තද්ධිත කෘදන්ත ශබ්ද "යාවජීව, ගන්‍ධකාර, තිලුප්පල,

දම්මින්ද්‍රිය, සුරවන්‍ද, මානව, දූතව, සෞගත, කරණීය, පානීය" යනාදියෙන් බිඳිය හැකි බැවින් සමාසාදි විධි සිංහල ව්‍යාකරණයට වුවමනා නැතැයි ද කිවහැකි වේ.

---

## 12. පෙරරූ විදිය හැදින්වීම.

**12. පරවණහට පෙරරූ කරණු පෙරරූ නම්. විස්සම්-ඈගි.**

12. භා—වර්ණ දෙකක් අතුරෙන් පරවූ වර්ණයට පූර්වවර්ණයාගේ රූපය කිරීම පෙරරූ (පූර්වරූප) නම් වේ. "විස්සම්" යනාදිය උදාහරණයි.

වි—මෙයින් පෙරරූ විදිය හැඳිනේ. මෙහි පරවර්ණය නම් ආසන්න වූ ශබ්ද දෙකකින් පරශබ්දයේ ආදි වර්ණයයි, පූර්වවර්ණය නම් පූර්ව ශබ්දයේ අන්ත්‍යවර්ණ යයි "විස්-කම්" යන තන්හි සයන්නේ රූපය කයන්නට වීමෙන් "විස්සම්" යි සිඩයි. මෙයිනුදු උච්චාරණයේ සිලුටුබව ලැබේ.

---

## 13. දෙරූවිදිය හැඳින්වීම.

**13. වණහට ද පදහට ද දෙරූ දනාවුම් දෙරූ නම්. තුමූ කොළේ ඒ ලොපල්ලා, කුළුණෙන් ලතෙත්තා, තොදියට එක නෙත්තා, රණමැද දියකොත්තා; දි දී, විඳ විඳ, පලපල. පාසාණෝගි සකින් ළසුරුවනු ද රූයි, සක්වලක් පාසා මහමෙර ඈගි.**

13. භා—එක් වර්ණයකට හෝ පදයකට රූප දෙකක් ඉපිද වීම හෙවත් එක් වර්ණයක් හෝ පදයක් දෙක කිරීම දෙරූ (ද්විරූප) නම් වේ. "ලොපල්ලා, ලතෙත්තා" යනාදිය උදාහරණයි.

වි—මේ වාක්‍යාර්ථ ලක්‍ෂණයෙන් දෙරූ විදිය හැඳිනේ. "ලොපල්-ආ=ලොපල්ලා" යන තන්හි එක්ලයන්න දෙක වූ බැව් ද, "ලතෙත්-ආ=ලතෙත්තා, එකනෙත්-ආ=එකනෙත්තා, දියකොත්-ආ=දියකොත්තා" යන තන්හි එක තයන්න දෙක වූ බැව් ද ඇසේ පෙණේ. එසේම "දිදී" යන තන්හි "දී" යන පදය ද "විඳ විඳ" යන තන්හි "විඳ" යන පදය ද "පල පල" යන තන්හි "පල" යන පදය ද දෙක වූ බැව් ඈසේ පෙණේ. එබැවින් දෙරූ විදිය මෙයින් වඩාත් හැඳිනේ.

භාෂාවිෂයෙහි ඇතැම් ශබ්දයන්හි ඇතැම් වර්ණයන් දෙරූ වීමෙන් උච්චාරණයෙහි සිලුටුබව හා ඇසීමෙහි මිහිරිබව ගෙණ දේ. "ලොපල්-ආ" යන තන්හි දෙරූ නො කොට "ලොපලා" යි කී කල්හි ඒ දෙගතියම නොලැබේ. සෙසු තන්හිදු එසේයි. ඉකාර උකාරාන්ත ශබ්දයන් කෙරෙන් විභක්තිස්වරාදිය යෙදෙන තන්හි බොහෝ සෙයින් මේ වර්ණදෙරූ විදිය වන බැව් පෙණේ. "කැති-අ-කැත්-අ=කැත්ත, බටු-අ-බට්=අ-බට්ට" ආදි වශයෙනි. එහෙත් එබඳු ඇතැම් තන්හි ද්විත්වය නොවේ. එනම් "කොටු-අ, පුටු-අ" ආදියෙහි "කොට්ට, පුට්ට" කියා නොවේ. එහි වකාරාගමයෙන් "කොටුව, පුටුව" කියා වේ. සාමාන්‍යයෙන් රකාර හකාර දෙක දෙරූ නොවේ. පාලි සංස්කෘතයන්හි ද රකාර හකාර දෙදෙනාගේ ද්විත්වය නොවේ.

පද පිළිබඳ දෙරූවිදිය වනාහි නානාවිධ අර්ථවිශෙෂයන් අපෙක්ෂා කොට සිද්ධයි. ඒ අර්ථවිශෙෂයෝ ද බොහෝ වෙත්. පූර්වක්‍රියාපදයන් දෙරූවීමෙන් මිශ්‍රක්‍රියාර්ථය ලැබේ. "දිදී, විඳ විඳ" යන දෙතන්හි පූර්වක්‍රියා ද්විත්වයයි. දෙමින් විඳිමින් යන අර්ථයි. "පල පල" යනු ශීඝ්‍රාර්ථාදියෙහි ද්විත්ව විධියි. "පල" යන්න වහිශීමනාර්ථවිධික්‍රියා රූපයක් මෙන් පෙණේ, එහෙත් පුරාණ සන්නයෙහි අනුකරණ ශබ්දරූපයකැයි කිහු. ඒ ඒ ප්‍රාණිවිශෙෂයන් කෙරෙහි ශීඝ්‍රාර්ථාදි වශයෙන් ව්‍යවහාර කරණ තවත් මෙබඳු අනුකරණ ශබ්දයන් ඇති බැව් පෙණේ. "වර වර, ඉජු ඉජු, කූ කූ, වෝ වෝ" යනාදි වශයෙනි. ඒ ඒ ශබ්දයෝ වීප්සාර්ථයෙහි ද දෙරූ වෙත්, වීප්සා නම් භින්න වූ වස්තූන් සම්බන්ධ කරගණු කැමතිබවයි. දෙරූ විදියෙන් ඒ අර්ථය ද ලැබේ. "සක්වලෙක්හි සක්වලෙක්හි මහමෙර" යනාදි වශයෙනි, මේ දෙරූ විදියෙන් එක් සක්වළක් හෝ දෙකක් නොව සියලු සක්වළවල් මහමෙර හා සම්බන්ධ බැව් හැඟේ. මෙසේ මේ අර්ථයෙහි දෙරූ කොට කියයුතු තන්හි "පාසා" යන නිපාතයොගයෙන් එක් රූපය ද ව්‍යවහාරයට පැමිණේ. "සක්වළක් පාසා මහමෙර" යනාදි වශයෙනි, "පාසා" යොගයෙහි දෙරූ කොට කිම ද නිවැරදි වේ. "සක්වළක් සක්වළක් පාසා මහමෙර" කියා ද ව්‍යවහාර් කළ හැකි බැවිනි. එහෙයින් මෙහිදු "පාසායෝහි සකිත් උසුරුවනු ද රූසි" යන වාක්‍යයෙහි "ද" යන්නක් යොදන ලදී. පද දෙරූවිදියට වනාහි පාලියෙහි "ආමෙණ්ඩිත" කියා ද, සංස්කෘතයෙහි "ආම්‍රෙඩිත" කියාද ව්‍යවහාරකරණු ලැබේ.

**"භයෙ කොධෙ පසංසායං තුරිතෙ කොතූහලච්ඡරෙ,**
**හාසෙ සොකෙ පසාදෙ ච කරෙ ආමෙණ්ඩිතං බුධො."**

යනු හෙයින් ආමේඩිත නම් වූ මේ දෙරූ විදිය "භය, ක්‍රොධ, ප්‍රශංසා, ත්වරිත (ශීඝ්‍ර) කුහුල්, ආශ්චර්ය්‍ය හාස (සන්තොෂ) ශොක, ප්‍රසාද" යන මේ අරුත්හි ද පණ්ඩිතයන් ව්‍යවහාර කරණ බැව් නිර්දිෂ්ටයි. "තයා තයා, ගහපිය ගහපිය" යනාදි වශයෙන් නිදසුන් දතයුතුයි.

---

## 14. පෙරළිවිදිය හැඳින්වීම.

**14. පිළිපෙරළි වණ්පෙරළි පදපෙරළි විබත්පෙරළි කිරියපෙරළි වි පෙරළි පස්වැදෑරුම්.**

14. භා—පෙරළි විදිය හඳුන්වන්නාහු "පිළිපෙරළි" යනාදි වශයෙන් පෙරළි විදිය පස්වැදෑරුම් යයි කීහු. මෙයින් පෙරළිය පිළිබඳ භෙද මුත් පෙරළි යන්නෙහි තත්ත්වය නොහැඳින්නේ. හේ නිදසුන්ලකුණුවලින් හැඳිනිය හැකි වේ.

වි—මෙහි පෙරළි යන්නේ . අර්ථය විපර්ය්‍යාසය යනුයි. විපර්ය්‍යාසය නම් ප්‍රකෘතිය වෙනස්වීමයි. ශබ්දයන්ගේ ප්‍රකෘතිය වෙනස් වීම වනාහි ලොපාදෙශාදියෙන් ද වන්නේ මැයි. එහෙත් මේ වෙනස්වීම එසේ නොවේ. මෙහි ඇතැම් ප්‍රයොගයෝ පිළි (ස්වර) මාරුවීමෙන් ද, ඇතැම් ප්‍රයොගයෝ ව්‍යඤ්ජන වර්ණයන් මාරුවීමෙන් ද, ඇතැම් ප්‍රයොගයෝ පදයන් මාරුවීමෙන් ද, ඇතැම් ප්‍රයොගයෝ විබත් මාරුවීමෙන් ද, ඇතැම් ප්‍රයොගයෝ කිරිය මාරුවීමෙන් ද වෙනස් වෙති. ඒ වෙනස්වීම හෝ මාරුවීම එක් ලෙසකින්ම නො වේ. සාමාන්‍යයෙන් මේ විදිය ලොකයා අතර පවතින වෙස් පෙරළීම යන ව්‍යවහාරය සේ සැලකිය හැකි වේ. මේ ශබ්දයන්ගේ වෙස් පෙරළීමෙකි.

සිංහලෙහි පණකුරුවලට "පිළි" යනු නමෙකි. ඔවුන් ගත කුරු කෙරෙහි යොදා ලිවීමෙහි දී ඉස්පිල්ල පාපිල්ල යනාදි වශයෙන් ද ව්‍යවහාර කෙරෙති. එසේම පෙර සිංහල අක්ෂරශික්ෂාවෙහි ස්වරයන් දීර්ඝ භාවයට පෙරළෙන පිළිවෙළ හා ගාත්‍රාක්ෂරරූඪ කරණ පිළිවෙළ ඉගැන්වීමට පිල්ලන් කීමයයි ව්‍යවහාර කිරණ ලද්දේය.

පිළි මාරුවීමෙන් ශබ්දයන්ගේ රූප වෙනස්වීම (වෙස් පෙරළීම) පිළිපෙරළි නම් ද, ගතකුරු මාරුවීමෙන් එසේ වීම වණ පෙරළි නම් ද, පදයන් මාරුවීමෙන් එසේ වීම පදපෙරළි නම් ද, විබත් මාරුවීමෙන් එසේ වීම විබත් පෙරළි නම් ද, කිරිය මාරු

වීමෙන් එසේ වීම කිරිය පෙරළි නම් ද වේ. මේ පස් විදිය නිද සුන් ලකුණු වලින් දතයුතුයි. එහි නිදසුන් දක්වන්නාහු "විසල්" යනාදිය කීහු.

---

<u>පිළිපෙරළිය.</u>

**a. වසල් රික් කිසුම් ඉපැන් ඈ පිළිපෙරළි.**

a. භා—"විසාල" ශබ්දයෙන් සිංහලට "විසල්" කියා සිදේ. විසල් යන්න ප්‍රකෘතිරූපයයි, එහෙත් එහි ඉස්පිල්ල අයන්නට පෙරළි වීමෙන් "වසල්" කියා ද ව්‍යවහාර වේ. "රුක්ඛ, කුසුම, උප්පන්න" ශබ්දයන්ගෙන් "රුක් කුසුම් උපන්" යි සිදේ. ඒ ප්‍රකෘතිරූපයෝයි. මෙහි පාපිල්ල ඉස්පිල්ලට පෙරළිවීමෙන් "රික් කිසුම් ඉපැන්" කියා ද ව්‍යවහාර වේ. මේ ආදිය පිළිපෙරළිවිදි වශයෙන් දතයුතු.

---

<u>වණපෙරළිය.</u>

**b. කෙණෙර හුරිර යහන් මහණ ඈ වණපෙරළි.**

b. භා—හස්තිනීවාචක සංස්කෘත "කරේණු" ශබ්දයෙන් "කෙණෙර" කියා ද, "රුධිර" ශබ්දයෙන් "රුහිර" කියා ද, "සයන" ශබ්දයෙන් "හයන්" කියා ද; "සමණ" ශබ්දයෙන් "හමණ" කියා ද සිදේ. එහි රකාර–ණකාර දෙක ද, හකාර–රකාර දෙක ද, හකාර–යකාර දෙක ද, හකාර–මකාර දෙක ද, එකිනෙකට පෙරළිවීමෙන් "කෙණෙර, හුරිර, යහන්, මහණ"යි සිඩයි. මේ ආදිය වණපෙරළි වශයෙන් දතයුතු.

වි—තවද පාළියෙහි හස්තිනී වාචක "කණෙරු" ශබ්දයක් ඇති බැවින් එයින් සිංහලට පෙරළි රහිතව එකාවිටම "කෙණෙර" යි සිදිය හැකිව තිබිය දී මෙහි මෙසේ පෙරළියක් කිරීම වුවමනා නැතැයි කිවහැකි වේ. ඒ එසේ මැයි. එහෙත් "කරේණු" ශබ්දයෙනුදු වෙන විදියකට නොසිදෙන බැව් දැක්වීම සඳහා "කෙණෙර" යන්න නිදසුන් කරණලදී. එසේ නැත්නම් "කරේණු" ශබ්දයෙන් "කෙරෙණ" කියා සිද ව්‍යවහාර කරන්නට නොබැරි බැවිනි. මේ වෛයාකරණයන්ගේ සිරිතකි. පාලිව්‍යාකරණයෙහි "ගෙ" ධාතුවට "ගී" ආදෙශ කිරීමට "සබ්බත්‍ථ ගෙ ගී" යි සූත්‍රයක් විර චිතයි. එයින් සිඩ පදය "ගීතං" යනුයි. එහෙත් ගෙ ධාතුවේ අර්‍ථයෙහි "ගී" යි ධාතුවක් ඇත්තේ වේ. එයින් ආදෙශවිධි රහිතවම "ගීතං" යි සිඩයි.

පදපෙරළිය.

## c. රජදත් ඈ පදපෙරළි.

c. භා—ඇතැම් සමාස පදයන්හි පදපෙරළිය දක්නා ලැබේ. "ඳුනුඟුන්ගේ රජ" යන වාක්‍යයෙහි සිඹ "දත්රජ" යන පදවය පෙරළිවීමෙන් "රජදත්" යනු වේ. උඩු ඇත්දේ මැද දත් දෙකයි. සංස්කෘතයෙහි ද්‍ර "රාජදන්ත" යනු වේ. "මුනිවර, මුනිතුමා" යනාදිය ද මෙසේයි.

---

විබත්පෙරළිය.

## d. ගතුගතු ද දුදනෝ-සහ කට මෑණ සපුන් මෙන්
## සිරිරැඹ නිරිඳු මලදු-පරනට බියම රුකුළෝ.
## ඈ විබත් පෙරළි.

d. භා—ඇතැම් වාක්‍යයන්හි ඇතැම් විභක්තිරූපයෝ අන්‍ය විභක්තිරූපයන්ට පෙරළි ව්‍යවහාරයෙහි පවතිත්, ඒ විබත් පෙරළි යි. මෙහි "ගතුගතුද දුදනෝ" යනාදි ගීයෙහි "දුදනෝ" යන පදය උපමෙය ද "සපුන්" යන පදය උපමා ද වේ. උපමෙය පදයෙහි විබත උපමාපදයෙහි ද යෙදේ. එහෙත් මෙහි උපමෙය පදයෙහි වූ පෙරවිබත උපමාපදයෙහි යෙදුනේ නම් "සප්හු"යි විය යුතුයි. මෙහි ඒ "සපුන්" යි කම් විබත් රූපයට පෙරළුනේ වේ. ඒ වනාහි "මෙන්" යන නිපාත යොග වශයෙන් වූයේ වේ.(දුර්ජනයෝ ග්‍රන්ථයන් උගත්හු තුමූත් සඳුන්ගස් වෙළාගෙණ අන්‍යයන්ට බිය ගෙණ දෙන්නා වූ කණ්ඨමාණික්‍ය සහිත සර්පයන් මෙන් රජුන් ඇසුරුකොට අන්‍යයන්ට බියක්ම කළාහුය යනු ගීයේ භාවයයි.)

පාලිසංස්කෘත ව්‍යාකරණයන්හි විභක්තිභෙදයෙහි ලා කම්මත්ථ ෂෂ්ඨිය' යනාදි වශයෙන් නිර්දිෂ්ට විභක්ති භෙද විධිය විබත් පෙරළියෙහි ඇතුළත් වේ.

---

කිරියපෙරළිය.

## e. තමා වරදස නොදිස්නේ මොනම්දු එකල්හි පුල්සලග
## නවාගණී ඈ කිරිය පෙරළි.

e. භා—විබත් පෙරළිය මෙන් ඇතැම් වාක්‍යයන්හි ක්‍රියා රූප ද පෙරළි ව්‍යවහාරයෙහි පවතිත්. ඒ කිරිය පෙරළි යි. "තමා වරදස නොදිස්නේ" යන වාක්‍යයට යොග්‍යවූයේ "නොදිසේ" යන වර්තමාන ක්‍රියාවයි. එහෙත් "තමා වරදස නොදිස්නේ-මෙර මා දෙස් දිස්නේ" යන ගී අඞියෙහි ජනෛරක්ෂණය

සඳහා "දිස්නේ" යි අනාගත ක්‍රියාරූපය යොදන ලද්දේ වේ. තමා කෙරෙහි වර්තමාන වූ දෙෂය ස්වල්පයක්වත් තමහට නොපෙණේ යනු එහි තත්වාර්ථයි. එබැවින් එහි අනාගතාර්ථය යෝග්‍ය නොවේ. "මොනරිඳු එකල්හි පුල්සලග නවා ගණී" යන පාඨයෙහි "ගණු" යි විධි ක්‍රියාපදය යෝග්‍ය වේ. එහෙත් "ගණී" යන වර්තමාන ක්‍රියාරූපය යොදන ලද බැවින් කිරිය පෙරළියි. "මයූරේන්ද්‍රය ඒ කාලයෙහි පිපියා වූ මල් ඇති සල්රුකක් මුදුනෙහි නිවාස ග්‍රහණය කරපන්" කියා මයූරයා දූත ක්‍රියාවෙහි යෙදීමට කියන ලද්දක් බැවින් විධි ක්‍රියාරූපය යෝග්‍ය වේ.

---

පෙරළි ආදියට සුදුසු තැන්.

**f. සද්දහමින් සඳසහනි හොත පස්පෙරළි ඈ කරණු.**

f. **භා**—මේ පස්පෙරළි ආදි වියරණ විදි ශබ්දධර්මය හෙවත් ශබ්දස්වභාවය සලකා හෝ ඡන්දෝරක්ෂණය සලකා හෝ කටයුතුයි.

මෙහි ඈසදින් වක්ෂ්‍යමාණ වැඩි අඩු ආදිය හා පූර්වෝක්ත ලෝපාදිය ද ගතයුතුයි. ඒ ඒ ශබ්ද විශේෂයන්ගේ උච්චාරණ ශ්ලිෂ්ටතාව හා ශ්‍රවණමාධුර්‍ය්‍යය ශබ්දධර්මයයි ද පද්‍යවිෂයෙහි පෙරළි ආදියෙන් මාත්‍රාවන් අඩුවැඩි කොට ඡන්දස රැකගැනීම ඡන්දෝ රක්ෂණ යයි ද සැලකිය යුතුයි.

---

15. වැඩිවිදිය හැඳින්වීම.

**15. වැඩි නම් මත්වැඩි. ඈස්, ඈල්, ඈප්, උවාරණ, නවාම් මලවල සලසිහිලෙහි. ඈහි.**

15. **භා**—වැඩි යන වියරණ විදිය හැඳින්වීම සඳහා "වැඩි නම් මත්වැඩි" යනු කීහු. වැඩි යන්නේ අර්ථය කාහටත් වැටහේ. මෙහි වැඩිය නම් මත්වැඩියයි. එනම් ශබ්දධර්මය හෝ ඡන්දෝ රක්ෂණය සඳහා ඇතැම් ප්‍රයෝගයන්හි ශබ්දගත මාත්‍රාප්‍රමාණය වැඩි කොට උසුරුවීමයි. ඒ මාත්‍රාප්‍රමාණය ද මාත්‍රාංශයෙන් හෝ මාත්‍රාර්ධයෙන් හෝ මාත්‍රාවෙන් හෝ වැඩෙන බැව් නිදසුන් වලින් ප්‍රකාශිතයි. එබැවින් ඒ නිදසුන්වලින් හැඳිනේ. "ඈස්" යනාදිය නිදසුන් වේ. පළමුවෙන් "අස් අල් අප්" යි සිටි පියවි ශබ්දධර්මය සඳහා මාත්‍රාංශ වෘද්ධියෙන් විකෘතව "ඈස් ඈල් ඈප්" යි ව්‍යවහාර යට පැමිණියාහු වෙත්. එසේම "උවරණ, නවම්" යි සිටි පියවි පුරා මාත්‍රාවක් වැඩීමෙන් "උවාරණ,නවාම්" යි සිඩයි. "මලවලසල්සිහි ලෙහි" යි සිටි තන්හි ඡන්දෝවිශේෂයක් රැකගනු සඳහා මාත්‍රාර්ධයක්

හා පුරා මාත්‍රාවක් වැඩි කොට "මලවලසල සිහිලේහි" යි යොදන ලද බැව් පෙණේ. මෙහි "සල්" යන තන්හි ලයන්න සවරවත් වීමෙන් අර්ධමාත්‍රයක් ද "සිහිලෙහි" යනතන්හි "ලේ" යන්න වීමෙන් පුරා මාත්‍රාවක් ද වැඩි විය.

ඇතමුන්ට මෙහි "සල්, සල" යන දෙතන්හිම මාත්‍රා ගණන සමාන යයි ද, එහෙයින් මෙහි මාත්‍රාවෘඩියක් නැතැයි ද සැලකිය හැකි වේ. එහෙත් එසේ සැලකීම ශාස්ත්‍රීය නොවේ. ගුරුලඝු විත්‍යාසයෙහි දී හලින් පෙරටු වර්ණය ගුරක් වශයෙන් සැලකීම මුත් එබඳු තන්හි මාත්‍රා දෙකක් ඇති බැව් නො කියති එබඳු තන්හි මාත්‍රාගණතින් ඇත්තේ එකාඩමතෙකි. එබැවින් "සල්" යන්න "සල" යයි කී කල්හි අඩමතක් වැඩි වේ. එසේ වැඩිවීමෙන් ඡන්දසෙහිදී අක්ෂරසඞ්ඛ්‍යාව ද වැඩේ. එයින් ගණභෙදය ද වේ. එබැවින් ඒ සඳහා මෙබඳු මාත්‍රාවෘඩියක් ද සිංහලෙහි උගන්වනු ලැබේ.

තවද සිදත්සඟරා පැරණි පිටපතෙක්හි මේ වාක්‍යය "මලවල සල සීලෙහි" කියා ද දක්නා ලැබේ. එසේ නම් ඒ ආයර්‍යාවෘතන ගී පදයෙකි. එහි ලක්ෂණය නගණ දෙකකින් පරව බගණයක් හා ගුරක් විමයි. සියන්න සීයන්න වීමෙන් බගණයක් වූයේ වේ. පාදන්ත වර්ණය ලඝුවුව ද ගුරු වේ.

මෙහි "වැඩි නම් මත් වැඩි" යන තන්හි "මත් වැඩි" යන් නෙන් මාත්‍රාවක වැඩිම මුත් මාත්‍රාංශයක හෝ මාත්‍රාර්ධයක වැඩි මක් නිර්දිෂ්ට දූයි ඇතමුන්ට පිළිවිසිය හැකි වේ. එසේ පිළි විසින්නෝ අභෙදෙපචාරය නොදූනීමෙනි, එසේ නම් වෘක්ෂලතාදි යම් ජාතියකට ව්‍යවහාර කරණ නාමය ඒ ජාතියේ සුලු අවයවය කට ව්‍යවහාර නොකොට හැකි වේ. එනම් පොල්ගෙඩියකට හෝ පොල් කැබැල්ලකට පොල්යයි ව්‍යවහාර නොකොට හැකි වේ. මත් වැඩි විදියෙන් මාත්‍රාංශය ද ගතයුතු බැව් මත් අඩු විදි යෙන් දතහැකි වේ.

---

16. අඩුවිදිය හැඳින්වීම.

**16. අඩු නම් මත් අඩු, දග, සැඩ, කඳ, බඹු, සෙගුණෙස් නුවණ නිසපුරා, ඇගී.**

16. භා—වැඩි යන්නේ අර්ථය මෙන් අඩු යන්නේ අර්ථය ද කාහටත් වැටහේ. මෙහි වූ අඩු යන්නෙන් වාච්‍ය වන්නේ මත් අඩු වීමයි. ඇතැම් ප්‍රයොගයන්හි ශබ්දධර්මය හෝ ඡන්දෙරක්ෂණය

සඳහා මාත්‍රා අඩුකොට ද ව්‍යවහාර කරණු ලැබේ. මෙ මත් අඩු විදිය ද හැඳිනෙන්නේ නිදසුන් ලකුණු වලිනි. "දඟ" යනාදිය ඊට නිදසුනි.

"ජඞ්ඝා, චණ්ඩ, ඛන්ධ, බ්‍රහ්ම" යන ශබ්දයන් සිංහලට බිඳීමේදී මුල් රූප "දංග, සැණ්ඩ, කන්ද, බම්බු" යනුයි. "දංග" යනාදිය මත්ගණනින් ගිණූ කල්හි දෙමත් අඩ පමණ වේ. එහි බිඳු වර්ණයේ හා "ණ් න් ම්" යන වර්ණයන්ගේ අංශයක් අඩුවී "ග ඩ ද බ" යන වර්ණයන් හා යෙදීමෙන් "දඟ සැඬ කඳ බඹු" කියා වේ. මේ අඩුවීම ශබ්ද ධර්ම වශයෙනි. තවද "ග" ආදි වර්ණයන්හි ඇති මාත්‍රා ගණනට වඩා මාත්‍රාංශයක් "ඟ" ආදියෙහි ඇත් බවත්, එසේ වුවත් එහි වෘද්ධියක් නොපෙණෙන බවත් කාහටත් වැටහේ, අයන්න ඇයන්න වූකල්හිත් එසේ යයි සැලකිය යුතුයි. "සේ ගුණෙන්" යන ප්‍රකෘතිය "සෙගුණෙන්" යි කී කල්හි ද "නුවණති සයුරු" යන්න "නුවණතිසයුරු" කී කල්හි ද මාත්‍රාවක් අඩු වේ. මේ අඩුවීම ඡන්දෝහෙතුවෙන් වූවකි.

---

## 17. නිපාවිදිය හැඳින්වීම.

**17. පියවි නිසා හොත නොනිසා හොත කෙළේ නිපා නම්. ගුරුළුගෝමි, සඳගෝමි, රතැයිපා, ගොස්, ඇඟි.**

17. භා—යම්කිසි පියවියක් ඇසුරු කොට හෝ නොකොට හෝ (ව්‍යවහාර) කළ පද සමූහය නිපා (නිපාතන) නම් වේ.

වි—මෙයින් නිපාවිදිය නිසිලෙස නො හැඳිනේ. ව්‍යාකරණයන්හි නිපාතන විධි දැක්වීම ප්‍රාචීන වෛයාකරණයන්ගේ සිරිතකි. එයින් බෙහෙවින් ව්‍යාකරණයාගේ අනූනත්වය ද ඇති වේ. ව්‍යාකරණයන්හි සොපමණ සූත්‍ර හදලත් භාෂාවෙහි එයින් අසිද්ධ වූවෝ ද ලැබෙත්. භාෂාව විශාල බැවිනි. ඒ සූත්‍රලක්ෂණයන් ගෙන් අසිද්ධවූවෝ ද ශිෂ්ටප්‍රයොග වෙත් නම් නොහළයුත්තෝ වෙත්. එහෙත් මෙබඳු වෛයාකරණානුශාසනයක් නැත් නම් ඔවුහු හළයුතු බවට පැමිණෙත්. එබැවින් වියරණයන්හි මේ අනුශාසන විධිය ඇති විය. නිපාතනවිධිය පිළිබඳ අනුශාසනයක් කළා වූ භාෂ්‍යකාරයෝ "යද්යලලක්ෂණෙනානුත්පන්නං තත් සර්වං නිපාතනාත් සිද්ධම්" යනු කීහු. යමක් යමක් සූත්‍රලක්ෂණයෙන් නූපන්නේ නම් ඒ සියල්ල නිපාතනයෙන් නිෂ්පත්ති හෙතුවෙන්) සිද්ධ වේ, යනු එහි අර්ථයි. "යදනුපපන්නා නිපාතනා සිජ්ඣන්ති" යන පාලි සූත්‍රානුශාසනය ද මෙසේ මැයි. බොහෝ

සංස්කෘතව්‍යාකරණටීකාකාරයෝ "සිඬස්වරූපොච්චාරණං නිපාතනත්‍වමාදෙතෙ ශබ්ද සිඬිං යාන්ති" යනු කීහු. සිඬස්වරූපයෙන් උසුරුවීම නිපාතයි (නිපාතනයි), ඒ හෙතුවෙන් මේ ශබ්දයෝ සිඬියට පැමිණෙති යනු එහි අර්ථයි. තවද සංස්කෘතව්‍යාකරණ යන්හි මේ විධියෙහි ලා "නිපාත–නිපාතන" යන ශබ්දවයම ව්‍යවහෘතයි. ඒ දෙක්හිම අර්ථය එක මැයි. එහෙත් 'නිපාත" කියා අව්‍යය කොටසක් ද ඇති බැවින් බහුලව්‍යවහාරයට නිපාතන යන්න ඩිඩා යොග්‍යයයි හැගේ.

ඇතැම්හු "නිපාතන" යන්නෙන් "නිපතන්" යි බිඳේ යයි ද එහෙයින් මේ වියරණ විදියට "නිපා" යි කීම සදෙස් යයි ද කියත්. එහෙත් නිපාත ශබ්දයෙන් වත් "නිපා" යි බිඳේ නම් සිඬාන්ත සඞග්‍රහකර්තෘපාදයන්ගේ ප්‍රඥප්තියට ඒ පමණ වේ මෙහි ලා නිපාත නිපාතන ශබ්දවය ම එකාර්ථ බැවිනි. නිපාතන යයිවියරණ විදියක් නොමැත්තේ යයි ද ඔවුන්ගේ කීමකි. එසේ නම් පාලි සංස්කෘතව්‍යාකරණයන්හි හඳුලාවූ නිපාතන විධි සූත්‍ර ද ලොප් කටයුතුයි. විධි යන්නේ තත්ත්වාර්ථය මෙසේ දතයුතුයි "අප්‍රාප්ත ප්‍රාපකො විධිඃ" යනු හෙයින් නො පැමිණි ආදෙශාදියක් පමුණු වන්නේ විධියයි, අන්‍යසූත්‍රලක්ෂණයන්ගෙන් නොනිපන් ශබ්ද විශෙෂයන්ගේ සිඬස්වරූපය සලකා බලා එහි ආදෙශාගමාදිය පමුණුවා ගන්නා විධිය නිපාතන විධි යයි.

මෙහි නිර්දිෂ්ටව වූ නිපාතවිධිය පියවියක් නිසා වූයේය, නොනිසා වූයේය, කියා දෙපරිදි වේ. එහි "ගුරුළුගෝමි" යනාදි තුණ පියවි නිසා සිඬවූවන්ට උදාහරණයි. ඒ උදාහරණයන්හි වූ "ගුරුළු, සඳ" යන දෙක පෙර ලක්දිව ග්‍රන්ථ කර්තෘභූතව සිටි පඬිරුවන් දෙදෙනෙකුගේ පියවිනම් දෙකෙකි. ඒ දෙදෙනාම කලක්හි පූජ්‍ය වූ බෞඬොපාසකයෝ වූහ. එබැවින් ඔවුන්ගේ පූජ්‍යභාවය පවසනුවස් "ගෝමි" යන්න ඒ පියවිවලින් පර නිපාතන කොට "ගුරුළුගෝමි, සඳගෝමි" යයි ව්‍යවහාර කරණ ලද්දේය. එසේම "රතැසි" යන්න ද එබඳු පියවි නමෙකි. පා යන්න එයින් පර නිපාතන කොට "රතැසිපා" යි ව්‍යවහාර කරණ ලද්දේය. මොවුහු වනාහි පියවි ඇසුරු කොට නිපාතනයෙන් සිඬවූවෝ වෙත්. "ගොස්" යන්න පියවියක් ඇසුරු නො කොට නිපාතනයෙන් සිඬ වූ සිංහල පෙරකිරිය පදයෙකි.

මෙබඳු පද නිපාතනයෙන් සිඬය කියන්නේ කුමක් නිසා දැයි සැලකිය යුතු වේ. මේ පදචතුෂ්කය සූත්‍රලක්ෂණයෙන් සිඬ කරත් හොත් තුණක් සමාස විධි සූත්‍රයකින් ද එකක් පූර්වක්‍රියා

විධි සූත්‍රයකින් ද සිඬ කටයුතු වේ. එහි "ගුරුළුගෝමි" යනාදි තුණ "ගුරුළු වූයේත් එම ගෝමි වූයේත් එම නුයි–ගුරුළුගෝමි" කියා විශෙෂණ සමාස විධි සූත්‍රයෙන් සිඬ යයි කිව හැකි වේ. "නිරිඳුසඳ. මුනිවර" යනාදිය මෙනි. එසේ කියන්නෝ ද ඇත් නාහ. "නිරිඳුසඳ, මුනිවර" යනාදියෙහි වූ "සඳ, වර" යනාදි පර පදයෝ ව්‍යවහාරයෙහි හුදකලාව ද අර්ථද්‍යොතකයෝ වෙත්."ගෝමි" යනාදියත් එසේ හුදකලාව අර්ථද්‍යොතක වේ නම් "ගුරුළුගෝමි" යනාදිය ද විශෙෂණ සමාස විධි සූත්‍රයෙන් සිඬයයි කිම නිවැරදි වේ. එහිදු "පා" යන්න නම් පූජ්‍යාර්ථවශයෙන් කෙසේවෙතත් හුදකලාව පාදපාත්‍රාදි අර්ථයන් පවසන්නේ වේ. "ගෝමි" යන්න කෙසේවත් සිංහලෙහි හුදකලාව අර්ථද්‍යොතකව පවතින බැව් නොපෙණේ.

මීලඟට "ගොස්" යන්න නිපාතනයෙන් සිඬය කියන්නේ කුමක් නිසා දැයි සැලකිය යුතුයි. "ගොස්" යන්න සිංහලෙහි ගමනාර්ථ පූර්වක්‍රියාවශයෙන් ව්‍යවහාරයෙහි පවතින පදයෙකි. එහෙත් එය අසවල් සූත්‍රලක්‍ෂණයෙන් අසවල් ධාතුවෙන් පරව අසවල් ප්‍රත්‍යය යෙදීමෙන් උපන්නේ යයි නො පෙණේ. කෙසේ වුවත් ඡේකප්‍රයොගයන්හි ද පවතින පදයක් බැවින් හෙද නිපදවා ගත යුතු වේ. එබඳු පද ඒ ඒ ව්‍යවහාරාර්ථයන්හි ලා සිඬස්වරූප යෙන් නිපදවා ගතයුතුයි. ඒ නිපාතන විධිවශයෙනි. සිදතෙහි වූ බොහෝ අනුශාසනයෝ පාලිසංස්කෘතානුශාසනානුගත වූවෝ වෙති. පාලිසංස්කෘතභාෂාවන්හි ඇතැම් පදයන්ගේ කොටසක් සූත්‍රලක්‍ෂණයෙන් ද කොටසක් නිපාතනයෙන් ද සිඬවූයේ වේ. ඇතැම් පදයන්ගේ මුලුල්ලම නිපාතනයෙන් සිඬවූයේ වේ. ඒ මෙසේයි. සංස්කෘතයෙහි පරිමාණාර්ථයෙහි "කිම්, යත්, තත්" ශබ්ද කෙරෙන් "වත්" ප්‍රත්‍යය වීමෙන් "කියත්, යාවත්, තාවත්" යන ශබ්දයෝ සූත්‍රලක්‍ෂණයෙන් සිඬයි. "කති, යති, තති" ශබ්දයෝ ද ඒ අර්ථයෙහි ව්‍යවහෘත වෙත්. ඔවුහු සිඬස්වරූප යෙන් නිපාතනයෙන් සිඬයි. මෙසේ සිඬ වූවෝ බොහෝ වෙත්.

"ගොස්" යන්න නිපාතනයක් නොවේ යයි ද ඒ "ගත්වා" යන පූර්වක්‍රියාවෙන් තද්භවයයි ද සමහරු කියත්. එසේ තද්භව භාවයෙන් නිෂ්ඨාවට පැමිණෙතොත් සිංහල ව්‍යාකරණයක් වුව මනා නැති තරමට පෙණේ. එලෙසින් බිඳින්නට නො හැකි පද වඩා නැති බැවිනි. සෙසු පෙරකිරිය පද හෝ අතිකුදු කිරිය පද

ආදියත් බිඳින්නට බැරි තැන. එහෙත් සිංහල භාෂාවට සුදුසු පරිද්දෙන් ඒ ඒ පදයන් සිද්ධකර ගැණීමට අනුශාසනයන් කිරීම වියරණ කතුතුමන්ගේ යුතුකමයි. ඒ යුතුකම පමණක් ඉටුකරණු සඳහා සිදත් සඟරා කතුතුමා සියවියරණෙහි ඒ ඒ පියවිවලින් සිංහලෙහි විභක්තිරූප ක්‍රියාරූපාදිය යෙදෙන ආකාරය ඉතා සංක්ෂෙපයෙන් දැක්වූහ. විස්තර පාලි සංස්කෘතානුසාරයෙන් දත හැකි බැවිනි. ඒ දැක්විමෙහි ලා පෙරකිරිය පිළිබඳ අනුශාසනයෙහිදී දපියවි කොරෙන් ඒ ඒ ප්‍රත්‍යයවිශෙෂයන් යෙදීමෙන් ඒ ඒ පූර්වක්‍රියා පද සිද්ධ වෙත් යයි කිහු. එහෙත් භාෂාවෙහි "ගොස්" කියා ද පෙරකිරියක් තිබේ. එහි දපියවියක් හෝ වෙන් කරන්නට ප්‍රකටව නොපෙණේ. පෙරකිරිය පිළිබඳ අනුශාසනයට හෝ ඒ ඇතුළත් නොවේ. එහි දැක් වූ ප්‍රත්‍යය විශෙෂයක් "ගොස්" යන්නෙහි නොපෙණෙන බැවිනි. දපියවියක් නොපෙණෙතත් තමන්ගේ අනුශාසනයට අයත් ප්‍රත්‍යයරූපයක් එහි පෙණෙතොත් කොටසක් නිපාතනයෙන් සිද්ධයයි කිය හැකි වේ. එහි ධාතුරූපයක් හෝ ප්‍රත්‍යයරූපයක් හෝ නො පෙණෙන බැවින් "ගොස්" යන්න මුලුල්ලම නිපාතනයෙන් සිද්ධයි. එහෙත් එය සිද්ධකරන්නහු විසින් ධාතු ප්‍රත්‍යය විභාගය සලකාගත යුතුයි. භෙද ව්‍යවහාරයෙහි පවත්නා අර්ථානුසාරයෙන් කටයුතු වේ. "ගොස්" යන්න ගමනාර්ථ පූර්වක්‍රියාවක් බැවින් ඒ සිද්ධියට "යා" ආදි ගමනාර්ථධාතුවක් හා පෙරකිරිය රූප නිපදවා ගැණීමට දැක් වූ "ඇ" ආදි ප්‍රත්‍යයයක් ගතයුතු වේ. ඒ දෙකට නිපාතන වශයෙන් "ගොස්" යි ආදෙශ කිරීමෙන් සිද්ධකටයුතුයි. ආදෙශයෙන් සිද්ධ නම් කිනම් නිපාතනයෙක් දැයි ද ප්‍රශ්නයෙකි. එහෙත් ඒ ප්‍රශ්නය නිපාතන විධිතත්ත්වය දන්නාහු නම් නො කෙරෙති. නිපාතන විධි ලක්ෂණ දක්වන්නා වූ මුග්ධබොධටීකාකාරයෝ:- "යද්‍යල්ලක්ෂණෙනානුත්පන්නං තත්සර්වං නිපාතනාත් සිද්ධමිති භාෂ්‍යම්, තස්‍ය සිද්ධිඃ ක්වචිද්වර්ණාගමෙඃ, ක්වචිද්වර්ණවිපර්යයෙඃ, ක්වචිද්වර්ණවිකාරෙඃ ක්වචිද්වර්ණනාශෙඃ, ක්වචිච්ච ධාත්වර්ථාතිශයෙර්ඥතව්‍යා" යනාදිය කිහු. මෙහි "යද්, යත්" ආදියෙහි අර්ථය පූර්වොක්තයි. ඒ නිපාතනයාගේ සිද්ධිය කිසි තැනෙක්හි වර්ණාගම විධියෙන් ද, කිසිතැනෙක්හි වර්ණවිපර්යාස විධියෙන් ද, කිසි තැනෙක්හි වර්ණවිකාරවිධියෙන් ද, කිසිතැනෙක්හි වර්ණලොප විධියෙන් ද, කිසිතැනෙක්හි අර්ථාතිශය යොග වශයෙන් ද වේ, යනු ශෙෂයෙහි අර්ථයි. මේ මෙසේ හෙයින් වියරණෙහි නිපාතන විධියක් වුවමනා බැවු ද මෙහි දැක් වූ නිදසුන් සතරම සර්වප්‍රකාරයෙන් ම නිපාතනරූප බැව් ද සැලකිය යුතුයි.

18. නියම් විදිය හා, 19. අනියම් විදිය හැඳින්වීම.

## 18. දමෝරා ඈ නියම්විදි 19. කිසි සඳවිබත් ඈ අනියම්විදි.

18. 19. භා— නියම්විදි අනියම්විදි දෙක හඳුන්වන්නාහු දමෝරා යනාදිය නියම්විදි යයි ද කිසි සඳවිබත් ආදියක් අනියම් විදියයි ද කීහු. එහෙත් ඇතැම් අයට මෙපමණකින් ම මේ විදි දෙක හැඳිනිය හැකි නොවේ.

වි— නියම විධිය හඳුන්වන්නා වූ සංස්කෘත වෛයාකරණයෝ "සාමාන්‍ය ප්‍රාප්තස්‍ය විශෙෂාවධාරණං නියමඃ" යනු කීහු. සාමාන්‍ය යෙන් පැමිණි විදියක්හුගේ විශෙෂ නිශ්චයක් කිරීම නියම නම් වේ යනු එහි අර්ථයි. එසේ නැත් නම් අනියම වේ යයි කියා අනියම්විදිය ද මෙයින්ම වටහාගත හැකි වේ. සංස්කෘතව්‍යාකරණ යන්හි සාමාන්‍ය විධිය විශෙෂවිධිය කියන්නේ මේ නියම් අනියම් දෙක මැයි. එහි සාමාන්‍ය විධිය අනියම්විදි වශයෙන් ද විශෙෂ විධිය නියම්විදි වශයෙන් ද සැලකිය යුතුයි. "බහුව්‍යාපකං සාමාන්‍යම්, අල්පව්‍යාපකො විශෙෂඃ" යනුවෙන් බොහෝ විෂයන්හි පැතිරෙණ විධිය සාමාන්‍ය නමැයි ද අල්පවිෂයන්හි පැතිරෙණ විධිය විශෙෂ නමැයි ද කියත්.

මේ සිදතෙහි දු කියවෙන පෙරසර ලොප් සඳවිදිය සාමාන්‍ය යයි සැලකිය යුතුයි, කවර පූර්ව ස්වරයක් වූවත් ලොපට පැමිණීමට අවකාශ ඇති හෙයිනි. එබැවින් මිට සාවකාශවිධියයි ද කියති. සරදෙස්සඳවිදිය විශෙෂ විධියෙකි. සියලුම ස්වරයන් පිළිබඳව පැමිණීමට අවකාශ නැති හෙයිනි. එබැවින් මිට නිරවකාශ විධියයි ද කියති. එනම් "අ ඉ" වෙනුවට එයන්නත් "අ උ" වෙනුවට ඔයන්න හෝ ඕ යන්නත් පමණක් වීම සරදෙස්සඳ විදියෙහි නියමයයි.

මෙහි නිදසුන් කළ "දමෝරා" යන්න විෂ්ණුවාචක වූ සංස්කෘත "දාමොදර" ශබ්දයෙන් බිඳුනේ වේ. ඒ සිඩියේදී පළමුකොට "දාම–උදර=දම–උදර=දම්–උරා" යි සිටී, මෙහි මකාරයෙහි සිට ලොප් වූ අකාරයත් පර වූ උකාරයත් දෙක වෙනුවට ඕකාරය වූ කල්හි "දමෝරා" යනු වේ. මේ ශබ්දයෙහි විශෙෂවිධි හෙවත් නියම්විදි තුණක් ඇතිබැව් පෙණේ. එකක් නම් සමාස වීමටත් නො වීමටත් සාමාන්‍ය වූ සමාස විධිය අන්‍යාර්ථසමාසයෙහි සමාස භාවයෙන් ම සිටීමයි. එකක් නම් සාමාන්‍ය වූ "උදර" ශබ්දය "උරා" යි සිටීමයි. අනෙක නම් සාමාන්‍ය සන්ධිවිධි නො පැමිණ විශෙෂවිධිය වූ ස්වරාදෙශ සන්ධිය පැමිණීමයි. "දමෝදර" ශබ්දය ද

මේ නියම්විදියෙහි ම ඇතුළත් වේ. එහි සමාසවිධියත් සවරුදෙශ සන්ධිවිධියත් යන දෙක පමණක් නියම් විදි වශයෙන් පැමිණියේ වේ. මේ "දමෝරා, දමෝදර" යන ශබ්දදෙක පුරාණනාමාවලි රුවන්මල් පියුම්මල් නිඝණ්ටුවල විෂ්ණුවාචක නාමගණයෙහි ඇතුළත් වේ. ගණපතිවාචක "ලඹෝරා" යන්න ද මෙසේයි.

"කිසි සඳ විබත් ඇ අනියම්විදි" යනුවෙන් කි සඳවිදියේ අනියමත්වය මෙහි කි නියායෙන් දතහැකි වේ. විබත්විදියේ අනියමත්වය මෙසේ දතයුතු. විබත්විදිය පවසන්නාහු නොවෙ සෙසිපදයෙහි පෙරවිබත ද කමරුතෙහි කම් විබත ද කතුඅරුතෙහි කතුවිබත ද යනාදි වශයෙන් ඒ ඒ අරුත්හි ඒ ඒ විබත් පස සාමාන්‍යයෙන් පැමිණෙන බැව් කිහු. එහෙත් ඇතැම් තන්හි කම් අරුතෙහි හා කතු අරුතෙහි සබඳවිබත් පස ද පෙරවිබත් අරුතෙහි සාම්විබත් පස ද, අදර අරුතෙහි සාම් විබත් පස ද යනාදි වශයෙන් විශෙෂවිධි ද පෙණේ, ඒ අනියම්විදි වශයෙනි.

---

## 20. අවිදුමන්විදිය හැඳින්වීම.

**20. සිය රූ නොහල සුදඅත් පඩුඇඹුල් ඈ, අවිබත් අවිය සඳ ඈ අවිදුමන්විදි,**

20. **භා**—සවකීය රූපය නොහළා වූ "සුදඅත්, පඬුඇඹුල්" යනාදි ශබ්දගණය හා අවිභක්තික වූ අව්‍යය ශබ්දාදි ගණය ද අවිදුමන් (අවිද්‍යමාන) විදි නමැයි කියනු ලැබේ.

**වි**—මෙපමණකින් අවිදුමන් විදිය නො හැඳිනේ. මේ අවිදුමන් යන්න පාළි "අවිජ්ජමාන" ශබ්දයෙන් හෝ සංස්කෘත 'අවිද්‍යමාන" ශබ්දයෙන් හෝ බිඳුනේ වේ. එහෙත් පාළියෙහි "අවිජ්ජමාන" යන නමින් හෝ සංස්කෘතයෙහි "අවිද්‍යමාන" යන නමින් හෝ වියරණ විදියක් නැත්තේයි. එසේ වුවද පාලිසංස්කෘත දෙක්හිම ප්‍රකෘතිභාවසන්ධි විධියක් ඇත්තේ වේ. මේ අවිදුමන් විදිය ද අදහස් වශයෙන් ඊට සම වේ. අවිදුමන්විදි යන්නෙහි අර්ථය නොපෙණෙන විදිය යනුයි. යම් ප්‍රයොගයෙක්හි අනිශයින් විය යුතු වූ වියරණ විදියක් පැමිණි බැව් නොපෙණි තිබේ නම් ඒ අවිදුමන් විදි වශයෙනැයි සැලකිය යුතුයි. පාලි සංස්කෘත භාෂාවන්හි ද ඇතැම්තන්හි වියයුතු සන්ධිවිධිවලට නො පැමිණි ප්‍රයොගයෝ ඇත්නාහ, ඔවුහු ප්‍රකෘතිභාවසන්ධිනාමයෙන් ව්‍යවහෘත

වෙත්. ඒ ඒ ශබ්දප්‍රකෘති සඳවිදි ඇසුරු කිරිමෙනුදු ආදෙශාදිය පැමිණීමෙන් විකෘත වෙත්, එසේ විකෘත වූ තන්හි ඒ ඒ වියරණ විදි පැමිණිබැව් ද පෙණේ. "සුදඅත්, පඬුඇඹුල්" යන දෙක "සුඩනත, පණ්ඩුකම්බල" යන ශබ්දදෙකෙන් බිඳුනේ වේ. ඔවුන් බිඳෙන කල්හි "සුදඅත්, පඬුඇඹුල්" කියා වේ. මේ පදදෙක සමාස බැවින් සන්ධියට පැමිණ විකෘත වියයුතුයි. එසේ වූයේ නම් "සුදත්, පඬැඹුල්" කියා වේ. එහෙත් එසේ නොව ප්‍රකෘති යෙන් සිටි බැවින් අවිදුමන් විදියයි.

අව්‍යය ශබ්දයෝ ද විභක්ත්‍යාශ්‍රයෙන් විකෘත නොවන බැවින් අවිදුමන් විදියෙහි ඇතුළත් වෙති. එහි විභක්ති විධියක් නො පෙණෙන බැවිනි. සිංහලෙහි අව්‍යය ශබ්ද පමණක් නොව නාම ශබ්දයෝ ද බොහෝ තන්හි විභක්ත්‍යාශ්‍රයෙන් සිය රූ නොපියා සිටිත්. මෙහි ඈ සදින් එබදු ශබ්දප්‍රයොගයෝ ද අනුකරණ ශබ්දයෝ ද ගතයුතුයි.

**ඉති විසි වැදූරුම් වියරණවිදි නිමි.**

**සව් පදන් සිදුසේ සලකනු**

---

විසිවැදූරුම් වූ වියරණවිදි (හැදින්විම) මෙතෙකින් සමාප්තයි.

මේ සියල්ලම ප්‍රධාන සූත්‍රානුසාරයෙන් සිඩ වූ

පරිද්දෙන් සැලකියයුතුයි.

---

මේ වියරණෙහි වූ පළමුවන අනුශාසනය සදවිදි අරුත්විදි දෙක ජෙනප්‍රයොගානුසාරයෙන් සපයා ගතයුතු බවයි. "සත්" ආදි වියරණ විදි විස්ස මෙහි උපකරණයයි සැලකිය යුතුයි. එබැවින් පළමුකොට ඒ උපකරණයන් හඳුන්වා ඉක්බිති එයින් සපයා ගතයුතු වූ ශබ්ද භෙදයන් පවසන්නාහු "දෑ දෑව්" යනාදිය කීහු.

---

ශබ්දභෙද.

෧. **දෑ දෑව් ගුණ කිරිය-සත් වී සදත් පස්බෙ,**
**අනුරුත් අරුණු බවසෙයින්-විමසා දෙබෙ හා දත්.**

෧. **භා**—භාෂාවෙහි වූ සියලු ම ශබ්දයෝ "ජාති ද්‍රව්‍ය ගුණ ක්‍රියා සංඥ" වශයෙන් පසකට හා "අඛණ්ඩ ආරූඪ" වශයෙන් දෙකකට ද බෙදෙත්. ඒ පවභෙදය හා විභෙදය ලක්‍ෂණානුසාරයෙන් හඳුන් වන්නාහු "බුන්අරුත්හි" යනාදිය කීහු.

## 1. දූ සඳ හැඳින්වීම.

**1. බුන් අරුත්හි නිසසද දෙදෙනා නොබිඳ පවත්වන්නී දූ නම්. සුර නර ගොන් ඈ.**

1. **භා**—(යමක් පිළිබඳ වූ යම් යම් භින්නාර්ථ හෙවත් වෙන් වෙන් වූ වස්තු ඇත්තේ නමුදු ඔහු ඒ) භින්නාර්ථයන් විෂයෙහි ඥානය හා ස්වකීය ශබ්දය යන දෙක භෙද නො කොට හෙවත් වෙනස්නොකොට සමසේ පවත්වා නම් ඒ භින්නපදාර්ථයන්ට මුල් වූ පියවිය ජාති නමැයි කියනු ලැබේ. එනම් "සුර නර ගොන්" ආදියයි.

**වි** – මේ වාක්‍යාර්ථ ලක්ෂණයෙන් ජාතිවාචකයන්ගේ තත්ත්වය හැඳින ගැණීම ආධුනිකයන්ට දුෂ්කර වේයයි සිතමු. අන්‍ය වෛශෙෂිකනිවශ්‍යයන් හෝ අන්කිසි ආකාරයකින් හෝ ජාති ලක්ෂණය හැඳින්විය හැකි වේ. එහෙත් සිද්ධාන්තසඞ්ග්‍රහකර්තෘපාදයන්ගේ මේ නිර්දේශය ඉතා සියුම් බැවින් මේ වාක්‍යයෙන් ම ඒ හැඳිනගැණීම ඉතා ප්‍රයොජනවත් වේ.

යම් යම් ස්වල්පමාත්‍ර විශෙෂයන් නිසා ඒ ඒ ප්‍රධානවස්තූන් ගෙන් බිඳී බිඳී පවත්නා වස්තූහු ද ඇත්තාහ. මෙහි බුන්අරුත් යන්නෙන් ඔවුහු ගතයුතුයි. "ආදිත්‍ය, විශ්ව, වසු. තුෂිත" ආදි සුරභෙදයෝ "සුර" යන වස්තුව පිළිබඳ බුන්අරුත් යයි ද, "ක්ෂත්‍රිය, බ්‍රාහමණ, සිංහල, ඉඞ්ග්‍රිසි, දෙමළ" ආදි නරභෙදයෝ "නර" යන වස්තුව පිළිබඳ බුන්අරුත් යයි ද, "ඛණ්ඩ, මුණ්ඩ" ආදි ගොභෙදයෝ "ගොන්" යන වස්තුව පිළිබඳ බුන්අරුත් යයි ද සලකාගතයුතුයි. එහි "සුර" යයි ප්‍රසිද්ධ වූ මූල් වස්තුව යථොක්ත ආදිත්‍ය ආදි බුන්අරුත් විෂයෙහි වූ ඥානය වෙනස් නො කොට පවත්නේ වේ. ඒ සියල්ලම සුරත්වයෙහි ලා දතහැකි බැවිනි. ඒ "සුර" යන ශබ්දය ද ඔවුන්ගෙන් වෙනස් නො කොට පවත්නේ වේ. "ආදිත්‍යසුර, විශ්වසුර" ආදි වශයෙන් මුල්වස්තුව සහගත ශබ්දය සියල්ලට සාධාරණත්වයෙන් පවත්නා බැවිනි. මෙසිනුදු යථොක්තවාක්‍යයාගේ තත්ත්වාර්ථය දතහැකි වේ. එහෙත් "නර" යන්නෙන් ඒ හැඳිනීම වඩාත් පහසු ද යොග්‍ය ද බැවින් එසිනුදු දතයුතුයි. "නර" යන්නෙන් වාච්‍ය වූ වස්තුව තදනුරූප බොහෝ වස්තූන්ට සාධාරණ වේ. එයින් බිඳී පවත්නා තදනුරූප වස්තු නම් ක්ෂත්‍රිය බ්‍රාහමණාදියයි. ඒ සියලුම බුන් අරුත් හෙවත් ක්ෂත්‍රිය බ්‍රාහමණ සිංහල ඉඞ්ග්‍රිසි දෙමළ ආදි සියල්ලම එක් තැන්කොට බැලුව හොත් ඒ සියල්ල ම නර යයි දතහැකි වේ. චාරිත්‍ර වාරිත්‍ර වර්ණභෙදාදි ස්වල්ප මාත්‍රවිශෙෂයන් නිසා ඔවුන් භින්නාවූවත් ඒ සියල්ලන් කෙරෙහි ම නරත්වය ඇති බැවිනි. ඒ මූලවස්තුත්වයෙන්

සලකන "නර" යන ශබ්දය ද ඒ සියල්ලටම සාධාරණ වේ. "ක්ෂත්‍රියනර, බ්‍රාහ්මණනර" ආදි වශයෙන් සියල්ලට සාධාරණව යෙදෙන බැවිනි. ක්ෂත්‍රිය වූයේත් නරයි, බ්‍රාහ්මණ වූයේත් නරයි, සිංහල වූයේත් නරයි, සෙස්ස ද එසේයි. මේ මෙසේ හෙයින් නර යන්න ජාතිවාචක වේ. යම් ශබ්දයක් හෝ වස්තුවක් ජාතිවාචක වේ නම් ඒ පිළිබඳ වූ බුන්අරුත් ඇතිවිය යුතු යයි ද, එසේම ඒ ශබ්දය හෝ වස්තුව ඒ බුන් අරුත් සියල්ලටම සාධාරණ වියයුතු යයි ද, බුන් අරුත් සියල්ල ම ආකාරයෙන් ඒ මුල් වස්තුවට සමකොට දතහැකි වියයුතු යයි ද සැලකිය යුතුයි. මේ පිළිවෙළින් වනාහි ඒ ඒ වස්තු වලින් භින්න වූ වස්තූන් කෙරෙහි ද බුන් අරුත් ඇත් නම් ඒ වස්තුහු ද ජාතිවාචක වෙත්. සිංහලයා ද නර යන්නෙන් භින්න වූවෙකි. ඒ සිංහලයා කෙරෙහි ද නානාවිධ ක්‍රියාකල්පාදි වශයෙන් හටගත් බුන් අරුත් ඇති බැවින් සිංහල යන්න ද ජාතිවාචක වේ. ඒ සිංහලයාගෙන් භින්නවූවන් කෙරෙහි ද ගොත්‍රාදි වශයෙන් හටගත් බුන් අරුත් ඇති බැවින් ඔවුහු ද ජාතිවාචක වෙත්.

මෙසේ ඒ ඒ වස්තූන්ගෙන් හටගත් භින්නත්වය ද නානාවිධ වේ. එනම්:–නරයන්නෙන් භින්න වූ සිංහල ඉඞ්ග්‍රිසි ආදීන්ගේ විශේෂය ස්වල්පයක් අධික වේ. එයින් භින්නවූවන්ගේ විශේෂය ඊට වඩා මද වේ. ඔවුන්ගෙන් භින්නවූවන්ගේ විශේෂය ඉතා සියුම් වේ.

ජාතිවාචක ශබ්දය හැඳින්වීම සඳහා පාළි බාලාවතාරයෙහි "ඛණ්ඩමුණ්ඩාදිබ්‍යත්ත්‍යනුයායි ගොත්තාදිසාමඤ්ඤං ජාති" යනු කීහු. ඛණ්ඩය මුණ්ඩය යන මේ ආදි ඒ ඒ විශේෂයන්ට අනුගත වූ ගොභාවාදියට සමාන වූවහුගේ භාවය ජාති නම් වේ යනු එහි අර්ථයි. "ඛණ්ඩ මුණ්ඩ" ආදිහු ද ගොවිශේෂයෝයි, හෙවත් ගො යන්නේ බුන් අරුත්හුයි, ගෝ බව වනාහි මේ සියලු විශේෂයන් අනුව යන්නේ වේ. එබැවින් ඊට සම වූ ගෝ බව ජාති නම් වේ. මෙයින් පැවසෙන්නේ ගෝ බව ගොජාති යයි, මිනිස්බව මනුෂ්‍ය ජාති යයි යනාදි වශයෙන් දතයුතු බවයි. ඒ එසේ මැයි, යම් කිසි විශේෂයන් නිසා භින්න වූ ඒ ඒ වස්තු විෂයෙහි ඒ ඒ භාවය ඇත්තේ වේ. එබැවින් ඒ සියල්ල ම භාවවශයෙන් සම වේ. ඒ ක්‍රමයෙන් ගත් කල එක් භාවයක් එක් ජාතියෙකි.

ජාතිශබ්දය හඳුන්වන්නා වූ සංස්කෘත වෛයාකරණයෝ "ආකෘතිග්‍රහණා ජාතිඃ" යනාදි වශයෙන් බොහෝ විස්තර කොට කීහු. එහි දැක්වූ සාමාන්‍ය ලක්ෂණය නම්–අවයව සටහන් නමැති ආකාරයෙන් දැනගැනීම ඇත්තී ජාති නම් වේ යනුයි. මෙයින් පවසනඅදහස ද එක් ආකාර සටහනක් හෙවත් එක් භාවයක් එක් ජාතියක් වේය යනුයි.

2. දූව්සද හැදින්වීම.

**2 ගුණ ඈනට අදරවූසෙය් දූව් නම්. මැඹ, කුඹු ඈ.**

2. භා—ගුණ ආදියට අධාර වූ වස්තුව දූව් (ද්‍රව්‍ය) නම් වේ. මැඹ කුඹු ආදිය ඊට උදාහරණයි.

භා.—මේ වාක්‍යාර්ථලක්‍ෂණයෙන් හා නිදර්ශන ලක්‍ෂණයෙන් දූව්සද හැදිනේ. ද්‍රව්‍යය ගුණයට ආධාරවීම වඩා ප්‍රකට බැවින් මෙහි ගුණ යන්න මුල්කොට "ගුණ ඈ නට" යි කියනලදී. එහෙත් බාලාවතාරයෙහි "ජාත්‍යාදීනමාධාරො දබ්බං" යනුවෙන් ජාති ආදියට ආධාර වූයේ ද්‍රව්‍ය යයි කීහු. ඒ එසේ මැයි. ජාති ගුණ ක්‍රියා සංඥ යන සියල්ලට ම ආධාරවන්නේ ද්‍රව්‍යයයි.

---

3. ගුණසද හැදින්වීම.

**3. දූව් ඇසුරු පෙරලෙනසුලු වී ගුණ නම්. කළු, හෙළ, නැබුළු, ඈ.**

3. භා—ඝට පටාදි ද්‍රව්‍යයක් ඇසුරු කොට එයින් පහව යන ගතිය ගුණ නම් වේ. කළු හෙළ නැබුළු හෙවත් කෘෂ්ණ ශ්වෙත මහත් යනාදිය ඊට උදාහරණයි.

භා—මෙසිනුදු ගුණයාගේ තත්ත්වය මදක් හැදිනේ. සිද්ධාන්ත සඞ්ග්‍රහ කර්තෘපාදයන්ගේ මේ ගුණ ලක්‍ෂණොක්තිය මුග්ධබොධානුසාරයෙන් කරණ ලද්දක් බැව් හැගේ. මුග්ධබොධයෙහි "සත්‍වෙ නිවිශතේ'පෛති පෘථග්ජාතිෂු දෘශ්‍යතෙ" යනාදි වශයෙන් ගුණ ලක්‍ෂණ දක්වූහ. මෙහි "සත්‍වෙ නිවිශතේ'පෛති" යන්නෙන් යම් අදහසක් පැවසේ නම් "දූව් ඇසුරු පෙරලෙන සුලු වී" යන්නෙන් ද ඒ අදහස ම පැවසේ. යමක් ද්‍රව්‍යය ඇසුරු කෙරේ නම් ඉන් පහව ද යේ නම් වෙන් වෙන් ජාතිවල දකිනු ද ලැබේ නම් ඒ ගුණය වේ යනු ශ්ලොකාර්ථයෙහි අර්ථයි මෙහි නිර්දිෂ්ට ගුණයාගේ පෙරලීම පිළිබඳව ඇතැම්හු නොයෙක් විපරීත අදහස් පහළ කෙරෙත්. ඵලාදි ද්‍රව්‍යයන් ඇසුරු කොට පවත්නා වූ නීලාදිගුණය වනාහි රක්තාදි ගුණයක්හුගේ ආශ්‍රයට පැමිණි කල්හි ඉන් පහව යන්නේ වේ. ඒ රක්තාදි ගුණය පවත්නා කල්හි නැවත නීලාදි ගුණයක් පැමිණි විට ඒ රක්තාදි ගුණය ද ඉන් පහව යන්නේ වේ, ඒ ගුණයෙහි ස්වභාව යයි. ද්‍රව්‍යය ද නවත් ද්‍රව්‍යයක් ඇසුරු නො කරන්නේ නො වේ. එහෙත් ඒ ඇසුරු කරන්නා වූ ද්‍රව්‍යය අන්‍ය ද්‍රව්‍යයක්හුගේ ආශ්‍රයට පැමිණි කල්හි ඉන් පහව යන්නේ නොවේ. එබැවින් ද්‍රව්‍යයාගේ **ගුණත්වය** නැත්තේ වේ. ගුණ

යාගේ භාවත් ලක්ෂණයක් නම් වෙන් වෙන් වශයෙන් සියලු ජාතිවිෂයෙහි ම දකිනු ලැබීමයි. එනම් එලජාතියෙහි ඇති නීලත්වය එහි පමණක් නොව තෘණජාති ආදියෙහි ද දක්නා ලැබේ. මෙලෙසින් ගුණ සද හැඳිනිය යුතුයි.

---

## 4. කිරියසද හැඳින්වීම.

**4. කිරියලකුණු වියනලදමැයි, එහි බේ මෙතන්හි නො සැබැහැවිනි බැවින් කිරිය අදියර පවස්නමෝ, හව්කිරිය අරුත් කිරිය වි කිරියසද දෙවැදෑරුම්. නටනු ගනු වසනු නැවුලි පිරිසෙස්ලි, බොඳුන්, නැමඳුම්, ඈ හව්කිරිය සද නම්. දෙන්නේ සේනුයේ ඈ අරුත්කිරිය සද නම්.**

4. භා—කිරිය සද හඳුන්වන්නාහු ක්‍රියාව පිළිබඳ ලක්ෂණය පෙර "නොදැව් නුගුණ" යනාදි වශයෙන් කී බැවි ද, ඒ ක්‍රියාව පිළිබඳ භෙදයන් මෙහි දී වර්ණනා නො කට හැකි බැවින් ක්‍රියාධිකාරයෙහි පවසන බැව් ද කිහු. භාෂාවිෂයෙහි ශබ්දත්වයෙන් හෙවත් නාමත්වයෙන් ව්‍යවහාරප්‍රාප්ත වූ ක්‍රියා කොටස් දෙකෙකි. එනම් භාවක්‍රියා අර්ථක්‍රියා යන දෙකයි. එහි භාවක්‍රියා නම් ක්‍රියාසිද්ධියට මුල් වූ ධාත්වර්ථය පමණක් පවසන ක්‍රියාවයි. එහෙයින් භාවක්‍රියා වෙන් කිසිත් විශෙෂාර්ථයක් උක්ත නොවේ. එනම් "නටනු" යනාදිය භාවක්‍රියායි. එයින් පැවසෙන්නේ "නැටීම" යන ධාත්වර්ථ මාත්‍රය පමණෙකි. "නටනු" යන්නේ ධාතුව "නට" යනුයි. "නටනු" යනු "නට" ධාතුවේ අර්ථමාත්‍ර යයි. "ගනු" යනාදිය ද එසේයි. "ගැසීම, වැසීම, තැවීම, සෙවීම, වැලඳීම, නැමදීම" යනු "ගනු" යනාදියෙහි අර්ථයි.

ධාත්වර්ථය සමග විශෙෂාර්ථයක් ද හෙවත් කර්තෘකර්මාදි කාර කාර්ථයක් ද කියවෙන ක්‍රියාව අරුත්කිරිය (අර්ථක්‍රියා) නම් වේ. මේ "නටනු" යන්න "නටන" කී කල්හි අරුත් කිරිය වේ. "නටන මිනිසා" කී කල්හි "නටන" යන්නෙන් කර්තෘ අර්ථයක් ද, "නටන පදය" කී කල්හි "නටන" යන්නෙන් කාරණාර්ථයක් ද, "නටන තැන" කී කල්හි "නටන" යන්නෙන් ආධාරාර්ථයක් ද කිය වේ. භාවක්‍රියා අර්ථක්‍රියා දෙකේ ලක්ෂණ මෙසින් දතයුතුයි. මේ භාවක්‍රියා අර්ථක්‍රියා දෙක ම නාමභාවයට පැමිණීමෙන් විබත් ඇසුරු කෙරේ. මොවුන්ගේ විස්තරය පසරුත් අදියරෙහි පැවසේ. මෙහි "දෙන්නේ" යන්නෙන් දානය කරන්නෙක් යනාදි අර්ථ ද, "සේනුයේ" යන්නෙන් සුවපත්වන්නෙක් යනාදි අර්ථ ද වාච්‍ය වේ.

**වි**—තව ද මෙහි "නටනු" යනාදි නිදසුන් වලින් සිංහලෙහි පවත්නා භාවක්‍රියා සිවුකොටසක් හඳුන්වන ලද්දේය. එහි "නටනු"යනාදි තුණ එක් කොටසෙකි. නු ප්‍රත්‍යයාන්තයි. පාළි යෙහි "නටන, ගාන, වාදන" යනුයි. "නැවුලි, පිරියෙස්ලි" යන දෙක එක් කොටසෙකි,ලි-ප්‍රත්‍යයාන්තයි. සංස්කෘතයෙහි "නර්‍තති, පර්‍යෙෂණ" යනු වේ, "බොදුන්" යන්න එක් කොටසෙකි. ඒ "උන්" ප්‍රත්‍යයාන්තයි. පාළියෙහි "භොජන" යනුයි. "නැමදුම්" යනු එක් කොටසෙකි."උම්" ප්‍රත්‍යයාන්තයි. පාළියෙහි"නමස්සන" යනුයි. එහෙත් "නැමදුම්" යන තන්හි ධාතුව "නමද" යනුයි. පාළිධාතුව "නමස්ස" යනුයි.

---

5. සන්සද හැඳින්විම.

**ර. කල පණන සන් නම්. දෙව්දත් බඹදත් ඈ.**

5. **භා**—ලොකයෙහි ඒ ඒ අය හැඳින ගැණු පිණිස කරණ ලද ප්‍රඥප්ති සමූහය සන් (සංඥ) නම් වේ. දෙව්දත් බඹදත් යනාදිය ඊට උදාහරණයි.

**වි**—මෙයින් සන් සද හැඳිනගත හැකි වේ. බාලාවතාරයෙහි සන් සද හඳුන්වන්නාහු "පවත්තිනිවුත්තිසඞ්ඛාතවොහාරත්‍ථං කරියමානො සඞ්කෙතො නාමං නාම" යනු කීහු. පැවැත්මය නැවැත්මය කියන ලද ව්‍යවහාරය පිණිස කරණු ලබන සලකුණ නාම නම් වේ යනු එහි අර්‍ථයි. "දෙව්දත්, බඹදත්" ආදිය ව්‍යව හාරය පිණිස තබාගත් නම් බැවින් සන්සදයි."ජයසෙන,සිරිසෙන" යනාදිය මෙනි.

a. **හැළි සිඟුවත් දූවන ගොන් දෙව්දත් නම් වි. මේ පස් සදන් එක පදරුැත්හි විකපන සේ. ඉති පස්බෙ.**

මෙසේ පචවිධ ශබ්දයන් වෙන් වෙන් වශයෙන් හඳුන්වා ඉක්බිති ඒ පචවිධ ශබ්දයන් එක්පදාර්‍ථයෙහි ද්‍ර පැවතිය හැකි බැව් පවසනුවස් "හැළි සිඟුවත්" යනාදිය කීහු.

a. **භා**—සුදුවූ ද අං ඇත්තාවූ ද දුවන්නාවූ ද ගොන් තෙමේ දෙව්දත් නම් විය. මේ පචවිධ ශබ්දයන් එක් පදාර්‍ථයෙහි ලා කල්පනා කරණ ආකාරය යි. ශබ්දයන්ගේ පචභෙදය මෙසේ දතයුතුයි.

**වි**—මෙහි "ගොන්" යන්න ජාතිපදාර්‍ථයි. "හැළි" යන්නෙන් වාච්‍ය වූ ධවලත්වය එහි ම වූ ගුණයෙකි. එසේම "සිඟු" යන්නෙන් වාච්‍ය වූ අවයවය එහි ම වූ ද්‍රව්‍යයෙකි, "දුවන" යන්නේන් වාච්‍ය වූ

ව්‍යාපාරය එහිම වූ ක්‍රියාවකි, "දෙව්දත්" යන්නෙන් වාච්‍ය වූ සඞ්කෙතය එහිම වූ සංඥාවයි. එකල්හි "ගොන්" යන්නෙහි පච විධ ශබ්දය ම විද්‍යමානයි. "නළ දත් ඇති පිසන කළු මිනිහා රන්හාමි නම් වේ" යනාදි වශයෙනුදු මෙසේ සලකා ගතයුතුයි.

---

1. අනුරුත් සද හැඳින්වීම.

**1. පැන් කැසුබු මියුලැසි ඈ අරුත් ඇරැබ නිපන් බැවින් අනුරුත් සද නම්.**

බුන් අරුත්හි යනාදි වශයෙන් ජාත්‍යාදි පචවිධ ශබ්දයන් හඳුන්වා නැවත ශබ්දයන්ගේ අන්වර්‍ථ ආරූඪ යන විභෙදය හඳුන්වන්නාහු "පැන්" යනාදිය කීහු.

1. භා—"පැන් කැසුබු මියුලැසි" යනාදි ශබ්ද අර්‍ථයට අනුව හෙවත් අර්‍ථයන් සලකා නිපන් බැවින් අනුරුත් (අන්වර්‍ථ නම් වේ.

වි – අන්වර්‍ථ ශබ්දයන්ගේ තත්ත්වය මෙයින් මදක් හැඳිනේ,යම් ශබ්දයකින් වාච්‍ය වූ අර්‍ථය තද් වාච්‍යයා කෙරෙහි විද්‍යමාන වේ නම්, හෙවත් ශබ්දය අර්‍ථය අනුව යේ නම් ඒ ශබ්දය අන්වර්‍ථ යයි සලකාගතයුතුයි. "පැන්"යනු ජලවාචක ශබ්දයෙකි,එයින් වාච්‍ය වූ අර්‍ථය පියයුත්තේ යනුයි. ඒ අර්‍ථය පැන් යන්නෙහි විද්‍යමානයි. එසේ ම "පැන්" ශබ්දය පියයුත්තේ යන අර්‍ථය අනුව යන්නේ වේ. එබැවින් "පැන්" යන ශබ්දය අන්වර්‍ථ ශබ්දයෙකි. "කැසුබු" යන්නෙන් වාච්‍ය වූ අර්‍ථය කැසින් බොන්නේ යනුයි. ඒ අර්‍ථය එහි විද්‍යමාන බැවිනුත්, ඒ ශබ්දය ඒ අර්‍ථය අනුව යන බැවිනුත් "කැසුබු" යන්න අන්වර්‍ථ වේ. මේ "කැසුබු" ශබ්දය "කච්ඡප" ශබ්දයෙන් බිඳුනේ වේ,"කච්ඡප" ශබ්දයේ නිරුක්ති දක්වන්නෝ "කච්ඡෙන පිබතීති=කච්ඡපඃ" යි කීහු. මෙහි "කච්ඡෙන" යන්න කරණාර්‍ථතෘතීයායි. එබැවින් මෙහි සමස් අදියරෙහි ද "කැසින් බොනුයේ=කැසුබු" යි කරණවිබත් සමස් වශයෙන් දැක් වේ. කිසිල්ලට හෝ කිසිල්ල වැනි අන්‍යස්ථානයන්ට හෝ කච්ඡ යයි කියනු ලැබේ. එබැවින් දෙතොලින් සෑදෙන මුල්ලට හෝ කච්ඡ යයි කිව හැකි වේ. එසේ හෙයින් කැසුබුවා දෙතොලින් සෑදෙන මුල් ලෙන් හෙවත් දෙතොල්කොණින් දිය උරා බොන්නේ යයි සිතිය හැකි වේ. ඇතැම් ශාබ්දිකයෝ "කච්ඡෙ පිබතීති=කච්ඡපඃ" කියා ද වාක්‍යය යෙදූහ. එහි "කච්ඡෙ" යන්න ආධාරයි. එකල්හි සමුද්‍රාදිය පිළිබඳ කච්ඡයන්හි දිය බොන්නේ යයි සිතිය හැකි වේ. මේ විමසිය යුත්තකි.

"මියුලැසි" යන්නෙන් වාච්‍යවන්නේ මාගධෙනුන්ගේ වැනි ඇස් ඇත්ති යනුයි. එනම් එබඳු ස්ත්‍රියයි. ඒ ශබ්දයේ හෙවත් එයින් වාච්‍ය වූ ස්ත්‍රිය කෙරෙහි ඒ අර්ථය විද්‍යමාන බැවින් "මියුලැසි" ශබ්දය අරුණිසි.

---

2. අරුණුසද හැඳින්වීම.

**2. සෙලු තෙල්බූ මගුල් ඈ අරුත් විලොම් බැවින් අරුණු සද නම්. ඉති දෙබේ.**

2. භා—"සෙලු තෙල්බූ මගුල්" යනාදී ශබ්ද අර්ථයට විරුඞ බැවින් අරුණු (ආරූඪ ශබ්ද) නම් වේ. මේ ශබ්දයන්ගේ විභෙද යයි.

වි— යම් ශබ්දයෙක්හි එයින් වාච්‍ය වූ අර්ථයක් විද්‍යමාන නොවේ නම් ඒ ශබ්දය ආරූඪයයි කියනු ලැබේ. මෙහි "සෙලු" යන ශබ්දයෙන් වාච්‍යවන්නේ ගල් හෝ වස්ත්‍ර ඇත්තේ යනුයි. එහෙත් සෙලු ශබ්දය පක්ෂි විශෙෂයකට හෝ නගනාඪට ව්‍යවහාර නමෙකි. ඔවුන් කෙරෙහි ගල් හෝ වස්ත්‍ර අවිද්‍යමාන බැවින් "සෙලු" යන්න ආරූඪ වේ. "තෙල්බූ" යන්නේ අර්ථය තෙල් බොන්නේ යනුයි. එහෙත් ඒ තෙල් නො බොන සතෙකුට ව්‍යව හාර බැවින් ආරූඪයි. "තෙල්බූ" ශබ්දය "තෙලපායිකා" හෝ "තෛලපායිකා" ශබ්දයෙන් බිඳුනේ යයි ද, ඒ කැරපොත්තාට නම් යයි ද, ඌ තෙල් නො බොන්නේ යයි ද, එහෙයින් ආරූඪ යයි ද සමහරු කියති. එහෙත් ඒ "තෙලපායිකා" හෝ "තෛල පායිකා" ශබ්දයන්ගේ ආරූඪභාවයක් පෞරාණික ශාබ්දිකයෝ නො කිහු. කැරපොත්තා තෙල් නොබොන්නේ යයි කිම ද ගත හැකි නොවේ. කැරපොත්තා පහන්කබල් ආදියෙහි තෙල් බී මැරී සිටිනු පෙණෙන බැවින් ඌට තෙල් විෂ යයි ඇතැම්හු සලකති. එසේ සැලකිම ද ගතහැකි නොවේ. ඌ එසේ මැරී සිටින්නේ තෙල් පිළිබඳ අධික තෘෂ්ණාවෙන් වඩා බීමෙන් විය හැකි වේ. මදුරුවා ලේ බොන සතෙකි, ඌට ලේ විෂ නොවේ. එහෙත් ඌ අධික තෘෂ්ණාවෙන් ලේ බී මරණයට පත් වේ. වඩා ජලපානයෙන් මිනිස්සු ද මැරෙති. එබැවින් "තෙලපායිකා" යන්න ආරූඪ යයි ගතහැකි නොවේ.

"තෙල්බූ" යන්න ගෝනුසු විශෙෂයකට ව්‍යවහාර වූ නමක් යයි සිතිය හැකි වේ. එනම් ශ්වෙතවර්ණ වූ කුඩා ගෝනුසු වෙසෙ සකි. ඔවුන්ට බොහෝ අය "තෙලිසි" යන නම ද කියත්. ඌට

නම් තෙල් විස බවත් ඌ තෙල් නො බොන බවත් ප්‍රසිද්ධයි. එසේ නම් "තෙල්බු" ශබ්දය ආරූඪ වේ. තෙලියි යන්නේ අර්ථය තෙල් කැමැත්තේ යනුයි. එහෙත් ඌ තෙල් නොකැමැත්තෙකු බැවින් "තෙලියි" යන්න ද ආරූඪයි. "තෙල්දිනි" නාමය ද මීට පර්යායය යයි පුරාණ සන්නයේ කීහු. ඒ සතා තෙල්පහළ කල්හි නස්නේලු. මේත් විමසිය යුත්තකි.

"මගුල්" යන්න ශුභවාචක ශබ්දයෙකි. එහෙත් අශුභ ග්‍රහයෙකුට (අඟහරුට) ද මඟුල්යයි කියති. එකල්හි ආරූඪ වේ. මේ පිළිවෙළින් සියලු ශබ්දයන්ගේ ම අර්ථ ආරූඪ භේදය දත යුතුයි.

---

හකාර විනිස.

a. **අදෙස් අගම් විදි-පියවිසබද හකරන්,**
**වෙසෙසා හැදින සොදනු-උගහා නොදුහැ ඇදුරන්.**

මේ කොටසෙහි කරණුලබන්නේ සදවිදිය පිළිබඳ විනිශ්චයයි, අර්ථ සංගත ශබ්දයෝ වර්ණාත්මක වූවෝ වෙත්. එබැවින් ශබ්ද විෂයෙහි යම් යම් වර්ණයන් පිළිබඳ විශෙෂතත්ත්වයක් දකිනු ලැබේ නම් වෛයාකරණයන් විසින් ඒ තත්ත්වය ද විනිශ්චය කටයුතුයි. සිංහල ශබ්ද විෂයෙහි හකාරය පිළිබඳ විශෙෂ තත්ත්වයක් දක්නා ලැබේ. එබැවින් මෙහි ඒ තත්ත්වය විනිශ්චය කරණු සඳහා "අදෙස් අගම් විදි" යනාදිය කීහු.

ෂ. **හා**—සිංහල ශබ්ද විෂයෙහි හකාරය ඇතැම් තන්හි ආදෙශවිධි වශයෙන් ද, ඇතැම් තන්හි ආගම විධි වශයෙන් ද පැමිණියේ වේ. ඒ එකක් ආදෙශහකාර යයි ද එකක් ආගම හකාර යයි ද කියනුලැබේ. එසේ විකාරයකින් ඇති නුවූ හකාරයකුදු ශබ්ද විෂයෙහි පෙණේ. ඊට ප්‍රකෘති හකාර යයි කියනු ලැබේ. හකාරය පිළිබඳ ඒවිශෙෂයන් හැඳින ආචාර්යයන්ගේ ඉගැන්වීම ද නො හැර හකාරයොගය කටයුතුයි.

---

1. අදෙස් හකර හැඳින්වීම.

**1. සුදු හුදු, විසඳු විහිඳු, සිඳි හිඳි, සුදී හුදී, සැමඳු හැමඳු, සැදිනෑ හැදිනෑ, සොබි හොබි, සොබ හොබ, සිඹෑ හිඹෑ, පිරිසිඹු පිරිහිඹු, සුණමින් හුණමින්, ලසුනු ලහුනු, පසණ පහණ, සල් හල්, සුල් හුල්, සැල් හැල්, මුසල් මොහොල්, සුසුල් සුහුල්, සිඹුල් හිඹුල්, සැඳෑසිලි හැඳෑහිලි, සැලි හැලි, සකර හකර, සිගුරු හිගුරු, සුරු හුරු, සූ හූ, සේ හේ, සෝ හෝ, සිම හිම, සැමි හැමි, සික්මුම් හික්මුම, සැඹ හැම, සව් හව්, සවා හවා,**

**සිවන් හිවන්, සිනු හිනු, සුලු හුලු, සඟුළු හඟුළු, සිපි හිපි, විසට වුහුට, සටහන් හටහන්, පසන් පහන්, සසුන් හසුන්, සින් හින්, සන් හන්, සිස්නා හිස්නා, සිස් හිස්, සස් හස්, සිකු හිකු, සැකි හැකි, සැති, හැති, සිඟු හිඟු, සඟු හඟු, ඈ සකරට අදෙස් හකරෙන් සිදු පා.**

භා— සිංහලෙහි වූ ආදෙශහකාරයට නිදසුන් ලකුණු දක්වන්නාහු "සුදු-හුදු" යනාදිය කිහු. මේ "සුදු" යනාදි ශබ්දයන්ගේ අර්ථ පදාර්ථව්‍යාඛ්‍යානවලින් දතහැකි බැවින් මෙහි නො ලියමු

වි—පාලිසංස්කෘතාදියෙන් සිංහලට බිඳී තිබෙන බොහෝ ශබ්දයන්හි වූ සකාරයට විකල්පයෙන් හකාරය ආදෙශ වේ. සකාරයෙන් යුත් පාලිසංස්කෘත ශබ්ද පමණක් නොව පාලිසංස්කෘතාදි ශබ්දයන්හි වූ "ශ, ෂ, ච, ඡ" යනාදි වර්ණයන් වෙනුවට ද සිංහලෙහි සයන්න යෙදේ. ඒ සයන්නට හයන්න වීමෙන් ද වහර යෙදේ. මේ හකර විතිස පිළිබඳව බොහෝ නිදසුන් දැක්වීම නො වුවමනා යයි ද ඇතැම් අයගේ මතයෙකි. එහෙත් සියලු ශබ්දයන්හි ම සකාරයට හකාරය අවිශෙෂයෙන් වේ නම් එක නිදසුනක් දැක්වීම ද පමණ වේ, ඇතැම් ශබ්දයන්හි සකාරයට හකාරය නොවන බැවින් සකාරයට හකාරය වන්නා වූ ශබ්දරාශියක් නිදසුන් කිරීම ග්‍රන්ථකර්තෘපාදයන්ට අභිමත විය, ඒ උන්වහන්සේගේ අවිඥත්වයක් නොවේ. සකාරයට හකාරය කිරීම ශාස්ත්‍රක්‍රමයක් අනුව යාමෙන් සිඩ කටහැකි නොවේ. එසේ හැකි නම් නිදර්ශන රාශියක් වුවමනා නොවේ. මේ වියරණ විදිය නිදර්ශනවලින් ම ඉගෙණිය යුතු වේ. එබැවින් නිදර්ශන රාශියක් දක්වන ලද්දේය. එහෙත් ඇතැම් ශබ්දයන්හි සකාරයට හකාරය නොවන බැවින් එබඳු තැන් ආචාර්‍ය්‍යොපදෙශයෙන් දතයුතු බැවි පවසන්නාහු "උගහා නො දැහැ ඇදුරන්" යනු කිහු. "සියල්, සිරිත්, වෙසෙස්" යනාදි බොහෝ ශබ්දයන්ගේ සකාරයට හකාරය වීමෙන් "හියල්, හිරිත්, වෙහෙස්" ආදිවශයෙන් වහර නො යෙදේ.

---

2. අගම් හසර හැඳින්වීම.

**2. සිදුහත් ඇස්දහර සැඳුහැ සදහම් රජදහන් දහන් ඉදුහු සටහන් අදහස් බහස් ම ඈ අගම් හකරෙන් සිදු පා.**

2. භා—සිංහල ශබ්ද විෂයෙහි ආගම වශයෙන් පැමිණි හකාරය හඳුන්වන්නාහු "සිදුහත්" යනාදිය ආගමහකාරයෙන් සිඩ වූ පාඨ යයි කීහු.

ටී—පාලිසංස්කෘතාදි ශබ්ද විෂයෙහි වූ මහාප්‍රාණාක්ෂරයන් සිංහලට බිඳෙන කල්හි අල්පාක්ෂරයන් වීම ස්වභාවයෙකි, ඇතැම් මහාප්‍රාණාක්ෂරයන් අල්පාක්ෂර වූ තන්හි ඒ අල්පාක්ෂරයන්ගෙන් පරව ආගම වශයෙන් හකාරය යෙදේ, ඊට හෙතුව හකාරය ද මහාප්‍රාණාක්ෂරයක් වීමයි. එහෙත් සියලුම මහාප්‍රාණාක්ෂරයන් අල්පත්වයෙන් බිඳෙන තන්හි එසේ නොවේ, බොහෝ සෙයින් "ධ ඨ භ" යන මහාප්‍රාණාක්ෂරයන් අල්පත්වයෙන් බිඳෙන තන්හි එසේ වන බැව් පෙණේ. "සිඬත්‍ථ අස්සුධාරා සඬා සඬම්ම රාජධානි ධ්‍යාන ඉඞි සණ්ඨාන අධ්‍යාශය භස්ම" යන ශබ්දයන් සිංහලට බිඳෙන කල්හි "සිදුඅත් ඇස්දර සැදෑ සදම් රජදන් දන් ඉදු සටන් අදස් බස්ම" කියා බිඳේ. එසේම වහරෙහි ද යෙදේ, එහි හකාරාගමවිධියෙන් "සිදුහත්" යනාදි වශයෙනු දු වහර යෙදේ.

සංස්කෘතයෙහි හකාරයට "ඛ ඝ ධ ඹ භ" යන වර්ණයන් ආදෙශ වීමෙන් සිඬ සන්ධිවිධියක් ඇති බැවින් හකාරයාගේ හා යථොක්ත මහාප්‍රාණාක්ෂරයන්ගේ සම්බන්ධයක් එහි දු ඇති බැව් පෙණේ. එබැවින් සිංහලෙහි දු ඒ සාම්‍යය ඇති වූයේ යයි සිතිය හැකි වේ.

---

### 3. පියවි හකාර හැඳින්වීම.

**3. හුරු හොරු හොලි හල හමල හැඟි හඬ හුණු හිවි ඈ පියවි සා.**

**ඝා**—ප්‍රකෘතිහකාරය නිදසුන් ලකුණෙන් හඳුන්වන්නාහු "හුරු හොරු" යනාදිය කිහු. මේ නිදසුන්හි හකාරය ආදෙශ වශයෙන් හෝ ආගම වශයෙන් පැමිණියේ නොවේ. ඒ ශබ්දයන්හි ප්‍රකෘතියෙන් ම පිහිටි හකාරයයි සැලකිය යුතුයි. මේ "හුරු" යන්න "සූර" ශබ්දයෙන් බිඳුනේ නොවේ. එසේ නම් ආදෙශ හකාරය වියයුතුයි. මේ "හුරු" ශබ්දය සමානාර්ථ වේ. "ඊට හුරුයි, හැඩහුරුකම" යනාදියෙහි මෙනි. "සූර" ශබ්දයෙන් බිඳුනු "හුරු" ශබ්දය දක්ෂාර්ථයි. තවද "හොරු, හැඟි, හඬ" යන ශබ්දයන්හි හකාරය ලොප්වීමෙන් "ඔරු ඇඟි අඬ" කියා ද වහර යෙදේ.

---

### a. පණකුරු පා හැඳින්වීම.

**a. අඳුන් ඈඳෑ එරුණු අරුණු අග අලු අලුත් අද ඉදි ඔද එළු උළු ඔළු ඇලි අඳු ඇවිණි අස්වස් අල එළෑඹි අසි ඉස් අසිඳෑ ඈ පණකුරු පා.**

**භා**—මෙහි උද්දේශක්‍රමයෙන් ආදේශාදි හකාරත්‍රය නිර්දේශ කොට ඉක්බිති සිංහලෙහි බොහෝ පාඨයන්හි එනම් "හැරැබෑ-ඇරැබෑ" යනාදි පාඨයන්හි හා "හොරු-ඔරු" යනාදි පාඨයන්හි හකාරයෙන් හෝ ප්‍රාණාක්‍ෂරයෙන් උච්චාරණය ලැබෙන බැවින් ඇතැම් පාඨයන් ප්‍රාණාක්‍ෂරයෙන් මුත් හකාරයෙන් ව්‍යවහාර නොකට යුතු බැව් දැක්වීම සඳහා "අඳුන්" යනාදි පාඨයන් පණ කුරුපා යයි නිදසුන් කළහ.

---

b. පණකුරු හකර දෙකට සම පා හැඳින්විම.

d. **හැරැබෑ ඇරැබෑ, හමු අමු, හසර අසර, හසළ අසළ, හැකිළ ඇකිළ, හැඳූරුම් ඇඳූරුම්, ඈ සකරට අඳෙස් හක රෙන් ද අළපසගෙන් ද සමවෑ සිඳුපා.**

**භා**—හකාර අකාර දෙදෙනාගේ සමත්වයෙන් සිඬව ව්‍යවහාර යට පැමිණි පාඨයන් නිර්දේශ කරන්නාහු "හැරැබෑ ඇරැබෑ" යනාදිය කිහු. පාලිසංස්කෘතයන්හි "සං, ආ" යන උපසර්ගවය පූර්වී ව්මෙන් නිපන් ඇතැම් ශබ්දයෝ කිසිවිටෙක අර්ථවශයෙන් සම වෙත්, සිංහලෙහි "සං" උපසර්ගය "ස" කියා ද "ආ" උපසර්ගය "අ" කියා ද වේ.

සංරම්භ-සරබෑ-හැරැබෑ. ආරබ්භ-අරබෑ-ඇරැබෑ.
සම්මුඛ-සමු-හමු. ආමුඛ-අමු.
සඤ්චාර-සසර-හසර. ආචාර-අසර.
සඤ්චරිත-සසළ-හසළ. ආචරිත-අසළ.
සඞ්කුචිත්වා-සකිල-හැකිල. ආකුචිත්වා-අකිල-ඇකිල.
සජ්ඣායන-සඳූරුම්-හැඳූරුම්. අජ්ඣායන-අඳූරුම්-ඇඳූරුම්.

මෙසේ සිඬ වූ බොහෝ පාඨයෝ ඇත්තාහ, මේ අනුසාරයෙන් දතයුතුයි. මෙසේ හකාරයුක්තපාඨවිශෙෂ හා හකාරයොගයෙන් වෙන් වූ ප්‍රාණාක්‍ෂර පාඨ ද දක්වා මේ ප්‍රතිඥවන්ට විරුඬ වූ පාඨයන් දක්වනු වස් "රතත" යනාදිය කිහු.

a. **"රකත දිදි ඉගිල්-වසනතුරෙණ් රසණ් දම්,**
**කිසව කර හලලා-පැහැබර දිගු නුවණ් ලා."**

b. **"කලවන් බිගු මහත්වන හිරු හත්වත."**

**මේ ඈ සේපාගි විසබිසරදස්නෙණ් අනියම්විදිද සලකනු.**

**ඉති හකර විනිස**

## සන් අදියර පළමුවනු.

---

a. **භා**—"හස්ථ" ශබ්දයෙන් "අත්" කියා බිඳීම ද, "ආලෝල" ශබ්දයෙන් "හලළ" කියා බිඳීම ද, "අස්ථ" ශබ්දයෙන් "හත්" කියා බිඳීම ද, ව්‍යභිචාරයෙකි, හෙවත් නියමයට විරුඩ වූ අහේතුක පැවැත්මෙකි, එහෙත් "රතත දිදි" යනාදි ජේ‍යාපාඨයන්හි ද එබඳු ව්‍යභිචාරයන් දක්නා හෙයින් මේ හකාරවිතිසෙහි ලා අනියම් විදියක් හෙවත් නියමයට වෙනස් වූ විශෙෂ විධියක් සැලකිය යුතු බැව් කිහු.

**වි**— මෙහි ජේ‍යාපාඨවශයෙන් දූක් වූ "රතත" යනාදි අසක්දා කාවෙහි "රතත" යන තන්හි "අත" යන්න ද, "හලළා" යන්න ද, "කළවත්" යනාදි මයූරසන්දෙශ කාවෙහි "හත්වත" යන තන්හි "හත්" යන්න ද මිට නිදර්ශනයි. "හස්ථ" ශබ්දයෙන් "හත්" කියා හකාරයෙන් යුක්ත ව බිඳීම නියම යයි, එහෙත් එය සැමතන්හි ම හකාරයෙන් තොර ප්‍රාණාක්ෂරපාඨයක් ව පවත්නේ වේ. "ආලෝළ" ශබ්දයෙන් "අලළ" කියා ද, "අස්ථ" ශබ්දයෙන් "අත්" කියා ද, ප්‍රාණාක්ෂරපාඨවශයෙන් බිඳීම නියම යයි, එහෙත් එය මෙහි "හලළා, හත්" කියා හකාරයුක්ත කොට ව්‍යවහාර කරණ ලද්දේ වේ. "ආලෝල" යන්නෙන් "අලළ" කියා ද, "අස්ථ" ශබ්දයෙන් "අත්" කියා ද බොහෝ තන්හි දක්නා ලැබේ.

a. බුරුල් වූ රෙද්ද අතරෙන් රත් අත දෙමින් මෙවුල්දම සොලොවා පැහැබර වූ දිගුනුවන් යොදා කියව.

b. හිරු අස්තයට ගිය කල්හි භෘඞ්ගයන්ගේ කාලවර්ණය මහත් වන්නේය. යනු වාක්‍යාර්ථයි.

**මේ හකාර විනිශචයයි.**

---

# පළමුවන සංඥාධිකාරය

**මෙතෙකින් සමාප්තයි.**

——— oo ———

<u>සඳ අදියර.</u>

### 1. පෙර පරවණන් නිසි-විදිනි ගලපනු සඳ නම්, වණලොප් අඳදස් ඈ එයි-ලැකිසනුසරින් දන්වන්.

මෙතෙක් තැන් සන් විදිය උද්දෙශ නිර්දෙශ වශයෙන් දක්වා ඉක්බිති එහි ඇතුළත් සඳවිදිය පිළිබඳ වූ ප්‍රතිනිර්දෙශයන් පව සන්නාහු "පෙරපරවණන්" යනාදිය කිහු.

1. **භා**—භාෂාව ලියන කියන කල්හි ඇතැම් ප්‍රයොගයන්හි ඉතා ආසන්නව සිටි ශබ්දයන්ගේ අග මුල දෙක එකටු ගැළපී ලිය වේ කිය වේ. එහි මුල සිටි ශබ්දයක්හුගේ අන්ත්‍ය වර්ණය පූර්

වර්ණ නම් ද, ඊට පරව ආසන්න ව සිටි ශබ්දයාගේ ආදිවර්ණය පර වර්ණ නම් ද වේ. එබඳු වර්ණ දෙකක් ඊට යොග්‍ය වූ වියරණවිදි වලින් එකට ගැළපීම සඳ (සන්ධි) නම් වේ. එහි ලැබෙන වියරණ විදි නම්-ඒ ඒ වර්ණයන්ගේ ලොප ආදෙශ ආදි යයි, හෙවත් "ලොප් අදෙස් අගම් පෙරරූ දෙරූ පෙරළි වැඩි" යන මේ වියරණ විදි සතයි. ඒ ඒ තන්හි මේ වියරණවිදි යෙදෙන පිළිවෙළ උදාහරණානුසාරයෙන් දතයුතුයි.

වි—මේ සන්ධිවිධියෙන් වනාහි ලියුම් කියුම්හි පහසුව ද ඇසීමෙහි මිහිරිබව ද ලැබේ. සන්ධිවිෂයෙහි ඇතිවන්නා වූ ලොප විධිය පූර්වස්වර ලොපවශයෙන් ද, පරස්වරලොප වශයෙන් ද, ගාත්‍රාක්ෂරලොප වශයෙන් ද වේ.

---

1. පෙරසර ලොප් සඳ.

**1. විදුරවියෙය්, දිගා, දිනිසුරූ, කනිල්, බමරුදුල, තොමරූල්, සඳෙව්, යළේහි, පහරූත, හඬෝනා, ආදී පෙරසර ලොපා පරසර ගතා පැමිණි වූ බැවින් පෙරසරලොප් සඳ නම්.**

1. භා—පෙරසරලොප්සඳ නිදසුන් කරන්නාහු "විදුරවියේ" යනාදිය කීහු. "විදුරූ-අවියේ, දිගු-ආ, දින-ඉසුරූ, කනා-ඊල්, බමර-ලදුල, තොමර-ඌල්, සඳ-එව්, යළ-ඒහි, පහර-ඔත, හඬ-ඕනා" යි විසන්ධි වශයෙන් සිටි තන්හි පූර්වපදයන්ගේ අන්ත්‍ය වර්ණයෝ පරපදයන්ගේ ආදිවර්ණයන්ට පූර්වභාගයෙහි සිටි බැවින් පූර්වස්වර වෙත්, ඔවුන් ලොප් වීමෙන් හල් වූ ගාත්‍රාක්ෂරයන්ට පරස්වරයන් ආරූඪවීමෙන් "විදුරවියේ" යනාදිය සිඩයි.

වි—මේ සන්ධිවිධිය පිළිබඳ අනුශාසනය සාමාන්‍ය විධිවශයෙනි, එබැවින් කවර ස්වරයකට වුවත් පූර්ව සිටි ස්වරය ලොප් කට හැකි වේ. තවද මෙහි හල් වූ ගතකුරට පරස්වරය පැමිණවීම කීහු. එහෙත් පාලිසංස්කෘතව්‍යාකරණයන්හි ස්වරරහිත ගාත්‍රාක්ෂරය පරස්වරයට පැමිණ වියයුතු යයි කීහු, ඒ වනාහි ඔවුනොවුන්ගේ අදහස් වශයෙනි, ඇතැම් අයගේ අදහස උච්චාරණශක්තිරහිත වර්ණය ශක්තිය ඇත්තෙකු වෙත පැමිණ ශක්තිය ලබාගතයුතු බවයි, ඇතැම් අයගේ අදහස උච්චාරණ ශක්තිය ඇත්තහු ඒ නැත්තහු වෙත පැමිණ ඔහුට උපකාර වියයුතු බවයි, කෙසේවුවත් න්‍යායවිරුඩතාවක් නොවන බැවින් නිවැරදි වේ.

## 2. පරසර ලොප් සඳ.

**2. ඌලේසුම් සුස්මෙන් තියුණු වැටුසිපත ඈ පරසරලොප් සඳ නම්.**

2. භා—ඌලේ-උසුම්, සු-අස්මෙන්, ති-අයුණු, වැටු-අසිපත, යන ආදිය පරස්වරලොප විධියෙන් "ඌලෙසුම්, සුස්මෙන්,තියුණු, වැටුසිපත"යි සිඩයි.

වි—පරස්වරලොපසන්‍ධිය පාලිව්‍යාකරණයෙහි විශෙෂ විධියක් වශයෙන් නිර්දිෂ්ටයි, එහි පූර්ව ර වූ ස්වර දෙක අසරූප තන්හි පම ණක් හෙවත් රූපයෙන් නොසම තන්හි පමණක් පරස්වරලොපය වන බැව් සූචිතයි. මේ නිදසුන් වලින් හැඟෙන්නේ සිංහලෙහි ද එසේ බවයි. එහෙත් ඇතැම් ආචාය්‍ය්‍යවරයෝ "සුස්මෙන්" යන්න "සු-උස්මෙන්" කියා ද, ඇතැම්හු "සු-ඌස්මෙන්" කියා ද විසන්‍ධි කෙරෙත්. එසේ විසන්‍ධි කළ කල්හි යථොක්ත නියමයට විරුඬ වේ. "සු-උස්මෙන්" යි විසන්‍ධි කොට අරුත් පළකරන්නෝ 'සු' යන්න අව්‍යයක් ලෙස සලකා ඉතා ග්‍රීෂ්මයෙන් යනාදි වශයෙන් කියත්. "සුස්මෙන්" යන්නේ ප්‍රකෘතිය "සුසුම්" යනු යි. "හුසුම්" කියා ද වේ. ශ්වාසය යන අර්‍ථයි. කව්සිළුමිණෙහි-"තනන පියවුරු එහි හරවෙව්ළුමෙ වැ සුස්මෙන්" යන තන්හි ද "සුස්මෙන්" යන්නේ අර්‍ථය ශ්වාසයෙන් යනුයි. මේ මෙසේ හෙයින් මේ කෙසේ සිඬ දැයි විමසිය යුතුයි. සංස්කෘත "ශ්වස්" ධාතුව සිංහලට බිඳීමේදී පළමුකොට "සු-අස්" කියා බිඳේ. පසුව පරස්වරලොප යෙන් "සුස්" කියා වේ. ඉන් පරව 'උම්' ප්‍රත්‍යය වීමෙන් "සුසුම්" යන ප්‍රකෘතිය ද, ඉන් පරව 'එන්' යන කාරණ විභක්තිප්‍රත්‍යය යෙදීමෙන් "සුස්මෙන්" යන රූපය ද සිඬයි. "ශ්වාස" ශබ්දයෙන් "සවස" කියා ද බිඳේ.

---

## 3. සරසඳ.

**3. පසැස් ඈ සරලොප් නැත ද සර ගතට පැමිණ වූ බැවින් සරසඳ නම්.**

3. භා—"පස්- ඇස්" යන්න "පසැස්" කියා සන්‍ධි වේ. මේ ආදි ප්‍රයොගයන්හි පූර්වවර්‍ණය හල්අකුර බැවින් එහි ස්වරලොපයක් නැත්තේ වේ, එහෙත් එබඳු තන්හි පර වූ ස්වරය ගතට පැමිණ වූ බැවින් හෙවත් ගතට පැමිණීමෙන් කාලව්‍යවධාන රහිත වූ බැවින් මේ සරසඳ නම් යයි කිහු.

වි—ඇතැම්හු මෙබඳු තන්හි සන්ධිවිධියක් නැතැයි ද මේ කිනම් සන්ධියකැයි ද යනාදි වශයෙන් සිදත්සඟරාකරුවන්ට පරිහාස කෙරෙත්. සමහරු මීට ස්වරසන්ධි යයි කීම අභාග්‍යයයි ද කියත්. මෙහි සන්ධියක් නැතැයි සලකන්නෝ සංහිතාවශයෙන් වත් සලකත් නම් මැනවි. "පරඃ සන්නිකර්ෂඃ සංහිතා" යනු පාණිනීය යන්ගේ සංහිතාසංඥසූත්‍රයයි. වර්ණයන් පිළිබඳ අතිශයින් කරණ ලද සමීපභාවය සංහිතා නම් වේ යනු එහි අර්ථයි, "පස්-ඇස්"යි උච්චාරණය කළකල්හි 'ස්-ඇ' යන වර්ණ දෙදෙනාගේ අතිශය සමීපභාවය නැතිවීමෙන් කාලව්‍යවධානය ඇති වේ. සංඥවාචක ශබ්දයන්ගේ එබඳු ව්‍යවධානයක් ඇතිවීම අයොග්‍ය වේ. "පසැස්" යන්න ද සංඥවාචකශබ්දයෙකි, එනම්-බුදුරජාණන්වහන්සේට නමෙකි. එබැවින් මෙබඳු තන්හි ලැබෙන්නා වූ සංහිතා සඞ්ඛ්‍යාත ස්වරව්‍යඤ්ජනයන්ගේ සන්ධානයට මෙහි සරසඳ යයි කීහු. සංස්කෘත වෛයාකරණයෝ ද "සන්ධි-සංහිතා" දෙක බොහෝ තන්හි සම කොට සැලකූහ. "සංහිතෛකපදෙ නිත්‍යා-සන්ධිරෙකපදෙ නිත්‍යඃ" යනාදියෙන් ඒස්ඵුටයි. මේ සන්ධියට 'සරසඳ' යයි කියනු විනා අන් කියයුතු නමෙක් නො පෙණේ. පාලිසංස්කෘත වෛයාකරණයෝ "සර-ස්වරසන්ධි, ව්‍යඤ්ජනසන්ධි, නිග්ගහීත-විසර්ගසන්ධි යනුවෙන් සන්ධිනාමයන් ව්‍යවහාර කළහ. මෙහි එසේ නෝව ඒ ඒ සන්ධි කාර්‍ය්‍යයෙහි ප්‍රධාන වූ ව්‍යාකරණ විධිය හෝ අවයවය මුල් කොට "පෙරසරලොප්සඳ, පරසරලොප්සඳ, සරසඳ" යනාදිවශයෙන් නාමව්‍යවහාරය කළහ. සරසඳෙහි ප්‍රධාන විධිය සරගනට පැමිණවීමයි. එබැවින් ඒ මුල් කොට "සරගනට පැමිණීමෙන් වූ සඳ=සරසඳ" යන නිරුක්තියෙහි ලා මධ්‍යපදලොප සමාස වශයෙන් "සරසඳ" යයි කීහු.

---

<u>4. සරදෙස්සඳ.</u>

**4. මෙහෙසුරු මොහොර, ලඹෝර ඈ අ ඉ උ න් ලොපා එ ඔ ඕ අදෙස් කළ බැවින් සරදෙස් සඳ නම්.**

4. **භා**—"මහ-ඉසුරු, මහ-උර, ලඹ-උදර" යනාදියෙහි "අ, ඉ, උ" යන ස්වරයන් ලොප් කොට, ඒ වෙනුවට "එ, ඔ, ඕ" යන ස්වරයන් ආදෙශ කිරීමෙන් "මෙහෙසුරු" යනාදිය සිඬ බැවින් මේ සරදෙස් සඳ නමැයි කීහු.

**වි**—මේ ස්වරාදෙශ සන්ධිය ද විශෙෂවිධිවශයෙන් සිඬයි. මේ විධියෙහිදී පූර්වවර්ණය අවර්ණයක් ද පරවර්ණය ඉවර්ණය හෝ උවර්ණය ද වියයුතුයි. එබැවින් ඒ විශෙෂයෙකි. ඒ පූර්ව සිටි අවර්ණය හා

පරව සිටි ඉවර්‍ණය යන දෙක වෙනුවට එයන්න ද, පූර්‍වව සිටි අව ර්‍ණය හා පරව සිටි උවර්‍ණය යන දෙක වෙනුවට ඔයන්න හෝ ඕ යන්න ද වේ.

මේ සන්‍ධිවිධිය පාලිසංස්කෘතභාෂාවන්හි ද විද්‍යමානයි, පාලියෙහි අසවර්‍ණාදෙශ සන්‍ධි යයි ද, සංස්කෘතයෙහි ගුණසන්‍ධි හෝ එකාරා දෙශසන්‍ධි හා ඔකාරාදෙශ සන්‍ධි යයිද් කියනු ලැබේ. "මහෙස-මහෙශ, මහොදර" යනාදිය එහි උදාහරණයි.

සිංහලෙහි මේ සන්‍ධිවිධියෙහි ලා බොහෝ තන්හි පිළිපෙරළි යද ලැබේ. "මෙහෙසුරු, මොහොර" යන දෙතන්හි මකාර යෙහි සිටි අකාරයට එකාරය හා ඔකාරය විම පිළිපෙරළි යයි. උච්චාරණයේ සිලුටුබව එසේවිමට හෙතු වේ. එබැවින් "ලඹෝරා" යන තන්හි පිළිපෙරළිය නොවිය, එසේ විමෙන් උච්චාරණ ශලිෂ්ට තාව නොලැබෙන බැවිනි. "ලඹෝරා" යන තන්හි "උදර" ශබ්දය "උරා" සි විය. පාලිසංස්කෘතයන්හි "ලම්බොදර" ශබ්දයයි. මෙලෙ සින් බොහෝතන්හි මේසන්‍ධිවිධියෙහි "ලොප් අදෙස් පෙරළි"යන වියරණවිදි තුණ ම ඇතුළත් වේ.

---

## 5. ගතදෙස්සඳ.

**5. අත්වරු සිත්වරු මහණුවම් දඬුවම් ගිනියම් ඈ පර කකරනට වයන් හා, කප්පිල් කැසුප්පොතු ලප්නාරග හෙප් තොට සුත්බත් බුත්සරණ ඈ බදන් සර ලොපා පනත් හා අදෙස්කල බැවින් ගතදෙස් සඳ නම.**

5. **භා** — "අත්-කරු, සිත්-කරු, මහණ(ණු)-කම්, දඬු-කම්, ගිනි-කම්" යනාදියෙහි පරපදයන්හි වූ කකාරයට වකාර යකාර දෙක වීමෙන් "අත්කරු" යනාදිය ද, "කබ-පිල්, කැසුබු-පොතු, ලබු-නාරඟ, හෙබ-තොට, සුදු-බත්, බුදු-සරණ" යනාදියෙහි පූර්‍ව පදයන් පිළිබඳ බකාර දකාරයන්ගේ ස්වරලොපය වීමෙන් හල් වූ බකාර දකාර දෙකට පකාර තකාර වීමෙන් "කප්පිල්" යනාදිය ද සිඩයි.

**වි**—මෙහි පූර්‍වපක්‍ෂයෙහි කකාරයට වකාර යකාර දෙකම වන බැව් අවිශෙෂයෙන් කියතුදු ඒ ස්ථානාසන්නත්වයෙන් වන බැව් පෙණේ, එනම් ආදෙශය ලබන කයන්නට පූර්‍වව සිටි වර්‍ණය වකා රයට ආසන්නවූ වර්‍ණයක් හෙවත් දන්තජ හෝ ඔෂ්ඨජවර්‍ණයක් වුවොත් ඉන් පර කකාරයට වකාරය ද, යකාරයට ආසන්නවර්‍ණ යක් හෙවත් තාලුජවර්‍ණයක් වුවොත් ඉන් පරවූ කකාරයට යකාර ය ද වන බැව් පෙණේ. මෙහි "අත්, සිත්" යන දෙතන්හි "ත් "

යන්න දන්තජ වේ. එබැවින් ඉන් පරවූ කයන්නට දන්තෞෂ්ඨජවූ වයන්න විය, "මහණු, දඹු" යන දෙතන්හි අන්තස්ථඋකාරය ඕෂ්ඨජ බැවින් ඉන් පරවූ කයන්නට ද වයන්න විය. එහි අන්තයෙහි උයන්න නොවීමෙන් "මහණකම්, දඩයම්" කියා ද වේ, එහිදු "දඬුවම්, දඩයම්" දෙක ව්‍යවහාරයෙන් වෙනස් වේ. "දඬුවම්" යන්න අපරාධයක් සඳහා කරණ කම්යට ද, "දඩයම්"යන්න සත්ත්වඝාතනයට ද ව්‍යවහාරකරණු ලැබේ. "ගිති" යන තන්හි ඉයන්න තාලුජ බැවින් ඉන් පරවූ කයන්නට තාලුජ වූ යයන්න විය. "කබ" යනාදියෙහි බකාරස්ථස්වරය ලොප්වූ පසු බකාරයට තද්වර්ගීය වූ පකාරය ද, "සුදු, බුදු" යන දෙතන්හි දකාරස්ථ උකාරය ලොප්වූ පසු දකාරයට තද්වර්ගීය තකාරය ද විය.

"ගොබ-කොල=ගොප්-කොල-ගොක්කොල" යනාදි ඇතැම් තන්හි පූර්වවර්ණයට පරවර්ණය වන බැව් පෙණේ. (ඊට පරරූසඳ යයි ද ඇතැම්හු කියත්.)

---

6. පෙරරූසඳ

**6. අත්කම් වත්කම් ගෙත්කම් පත්කම් විස්කම් ඈ පර කකරනට පෙරරූ ලද්දෙන් පෙරරූසඳ නම්.**

6. භා—"අත්-කම්, වත්-කම්, ගෙත්-කම්, පත්-කම්, විස්-කම්" යනාදියෙහි පරවූ කකාරයට පූර්වවර්ණරූපයන් එනම්-"ත්, න්, ස්" යන වර්ණයන් පැමිණි බැවින් මේ සන්ධිවිධියට පෙරරූසඳ (පූර්වරූපසන්ධි) යයි කියනුලැබේ. "කම්-හල-කම්මල" යනාදි වශයෙන් මේ සන්ධිවිධිය ප්‍රකටව තිබේ.

---

7. ගතකුරුලොප්සඳ.

**7. ගංරන් වංමුතු මුංබියලි නෙළුම්මල් අඹමල් ඈ ගබන් ලොපා මත්වැඩු බැවින් ගතකුරුලොප්සඳ නම්.**

7. භා—"ගඟ-රන්, වඟු-මුතු, මුඟු-බියලි, නෙළුඹු-මල්, අඹ-මල්" යනාදියෙහි ගකාරබකාරයන් ලොප් කොට මාත්‍රාවෘධි විධියෙන් "ගංරන්" යනාදි වශයෙන් නිපන් බැවින් මේ සන්ධිවිධියට ගතකුරුලොප් සඳයයි කියනු ලැබේ.

වි—මෙහි ශබ්ද නිෂ්පත්තියේදී "ගඟ වඟු මුඟු" යි සිටි රූපයන්ගේ ස්වරසහිත ගකාරය ලොප්වීමෙන් එහි සංයොගයට පැමිණ ශෙෂව සිටි අර්ධබින්දුව පිරේ, එයින් මාත්‍රාංශයක් වැඩේ. "නෙළුඹු, අඹ" යි සිටි රූපයන්ගේ ස්වරසහිත බකාරය ලොප්වූපසු එහි සංයුක්ත වූ අර්ධ මකාරය පිරේ, එයිනුදු මාත්‍රාංශයක් වැඩේ.

## 8. අගම්සඳ.

**8. පිරිසත් මියුගුණු සිපිඑව් දුවහ රූවාරූ තුනුවග පුන රූත් නියොද ඈ පෙරසර නොලොපා යවරත් අගම් කෙළෙන් අගම්සඳ නම්.**

8. භා—"පිරි-අත්, මී-අගුණු, සිපි-එව්, දු-අහ, රූ-අරූ, තුනු-අග, පුන-උත්, නි-ඔද" යනාදිය යකාර වකාර රකාර යන් ආගම වීමෙන් "පිරියත්" යනාදිවශයෙන් තිපන් බැවින් මේ සන්ධිවිධියට අගම් සඳ යයි කිහු. ආගම වර්ණයන්ගේ භෙදය අගම් විදියෙහි කී පරිද්දෙන් දතයුතුයි.

---

## 9. දෙරූසඳ

**9. වැල්ලවුරූ, හෙළිල්ලඹු, තඹපල්ලෙන්, කුල්ලෙව්, ඈ පෙරසර ලොපා ගත ව දූරූ දූනවූ බැවින් දෙරූසඳ නම්.**

9. භා—"වැලි-අවුරූ, හෙළිලි-අඹු, තඹපලු-එන්, කුලු-එව්" යනාදියෙහි පූර්වපදයන්ගේ අන්ත්‍යස්වර ලොපයෙන් හා හල් ලකාරය දෙරූ වීමෙන් "වැල්ලවුරූ" යනාදිය සිඬ බැවින් මේ සන්ධිවිධියට දෙරූසඳ යයි කිහු. මේ දෙරූ විදිය ද පෙර කී පරිද්දෙන් දතයුතුයි.

සන්ධිවිධිය වනාහි නිත්‍ය අනිත්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ. ශබ්දනිෂ්පත්ති ආදියෙහි දී ප්‍රකෘතිය ප්‍රත්‍යය යන දෙක එකට ගැළපීම එකාන්තයෙන් ම වියයුතු වේ. එබැවින් එබඳුතන්හි වන්නාවූ සන්ධිවිධිය නිත්‍යසන්ධියයි සැලකිය යුතුයි. එහිදු ශබ්ද ප්‍රකෘතිය හා විභක්තිප්‍රත්‍යය ගැළපීම එක් විධියෙකි, "බල-ඒ= බෙලේ" යනාදිවශයෙනි. ශබ්දප්‍රකෘතිය හා ස්ත්‍රීප්‍රත්‍යයයන් ගැළපීම ද එක් විධියෙකි, "හෙළලු-ඊ=හෙළිල්ලී" යනාදිවශයෙනි. ශබ්ද ප්‍රකෘතිය හා තඬිතප්‍රත්‍යයයන් ගැළපීම ද එක් විධියෙකි, "ගම්-ඉ= ගැමි" යනාදි වශයෙනි. ධාතුප්‍රකෘතිය හා ආඛ්‍යාතප්‍රත්‍යය ගැළපීම ද එක් විධියෙකි, "කර-ඒ=කෙරේ" යනාදිවශයෙනි. ධාතුප්‍රකෘතිය හා කෘදන්තප්‍රත්‍යයයන් ගැළපීම ද එක් විධියෙකි, "කර-අ= කළ-අ=කළ" යනාදි වශයෙනි. මේ සියල්ල ම නිත්‍යසන්ධිවශයෙන් සැලකිය යුතුයි.

සමාසවිෂයෙහි වූ සන්ධිවිධිය ද බොහෝසෙසින් නිත්‍යයයි සලකනු ලැබේ. මේ සන්ධ්‍යධිකාරයෙහි දක්වූ බොහෝ උදහරණයෝ ද සමාස වශයෙන් සන්ධිවූවෝ වෙත්. එහෙත් ඇතැම්

සමාසපදයෝ විසන්ධිවශයෙන් ද දක්නා ලැබෙත්, "සුදඅත්, පඬු ඇඹුල්" යන ආදිවශයෙනි. එබැවින් සිංහලසමාස විෂයෙහි වූ සන්ධි විධිය ඒකාන්තයෙන් ම නිත්‍ය නොවේ. වාක්‍යවිෂයෙහි සන්ධිවිධිය වක්තෘවිවක්‍ෂාවශයෙනි.

## සන්ධ්‍යධිකාරය නිමි.

---

ලිඟු අදියර.

a. **සකුසත් අනුසරෙන්-ඈත ද සදනට ලිඟු බේ,**
**නො පැණේ වහරවෙසෙසක්-පුම ඉතිරි ලිඟු දෙක විනා.**

දෙවන විශරණවිදිය වූ සඳවිදිය පිළිබඳ ප්‍රතිනිදේශවාරය අවසන් කොට ඉක්බිති තුන්වන ලිඟුවිදිය පිළිබඳ ප්‍රතිනිදේශයන් දක්වන්නාහු "සකුසත් අනුසෙරෙන්" යනාදිය කිහු.

a. **භා**—සිංහලශබ්දයන්ගේ ද ලිඞ්ගභෙදය ඇත්තේ වේ, ඒ ඇතිවූයේ සංස්කෘතශාස්ත්‍රානුසාරයෙනි, සංස්කෘතව්‍යවහාරයෙහි වනාහි පුංලිඞ්ග ස්ත්‍රීලිඞ්ග නපුංසකලිඞ්ග යයි ශබ්දයන්ගේ ත්‍රිභෙදයෙක් පණේ, එහෙත් සිංහලෙහි පුංලිඞ්ග ස්ත්‍රීලිඞ්ග දෙක හැර වෙන ව්‍යවහාරවිශෙෂයෙක් නො පැණේ.

**වි**—පෙර ලිඟුවිදිය හැඳින්වීමේ දී ලිඞ්ගභෙදය පිළිබඳ ස්වල්ප වර්ණනයක් කරණ ලද්දේය. දැන් මෙහි සිංහලශබ්ද විෂයෙහි දු සංස්කෘත ශබ්දශාස්ත්‍රානුසාරයෙන් ලිඞ්ගභෙදය ඇතිවූ ආකාරය පමණෙක් දතයුතුයි. යම් භාෂාවෙක්හි නාමශබ්දයන්ගේ ව්‍යවහාරය එක්ලෙසකින් ම පවතිතොත් ඒ භාෂාවෙහි ලිඞ්ගභෙදය නැත්තේ යයි ද, යම් භාෂාවෙක්හි ශබ්දව්‍යවහාරය දෙවිදියකින් පවත්නේ නම් එහි ලිඞ්ගභෙදය දෙවැදෑරුම් යයි ද, යම් භාෂාවෙක්හි තෙවිදියකින් පවත්නේ නම් එහි ලිඞ්ගභෙදය තෙවැදෑරුම් යයි ද සැලකිය යුතුයි. පාලිසංස්කෘතශබ්දයන්ගේ ලිඞ්ගභෙදය වනාහි ශබ්දරූපවශයෙන් ද විභක්තිරූපවශයෙන් ද හැඳිනේ, එහෙත් ශබ්දරූපවශයෙන් පවත්නා භෙදය හැඳිනෙන්නේ දෙවිදියෙකින් පමණෙකි. විභක්තිරූප වශයෙන් පවත්නා භෙදය ලිඞ්ගත්‍රය වශයෙන් හැඳිනේ.

පාලිසංස්කෘතයන්හි පුංලිඞ්ගරූපයෙන් පවත්නා බොහෝ ශබ්දයෝ ඊ ආදි ප්‍රත්‍යයයොගයෙන් ස්ත්‍රීලිඞ්ගරූපයට පෙරළෙත්. ඒ සකුසත් අනුසරින් සිංහලෙහි ද පුංලිඞ්ගරූපයෝ බොහෝසේ ඊ ආදි ප්‍රත්‍යයයොගයෙන් ස්ත්‍රීලිඞ්ගරූපයට පෙර

ලෙත්. ඒ මෙහි දක්වන උදාහරණානුසාරයෙන් දතයුතුයි. මේ සංස්කෘත ශාස්ත්‍රානුසාරයෙන් ලිඞ්ගභෙදය ඇතිවූ ආකාරයයි. සංස්කෘතශබ්දානුසාරයෙන් ද සිංහලශබ්දයන්ගේ ලිඞ්ග භෙදය පෙණේ. "රුක්, විදු" යනාදී සිංහල ශබ්දයන්ගේ ලිඞ්ග භෙදය ඒ සිංහල ශබ්දරූපවලින් නොපැණේ. ඔවුන්ට අරුත් කිෂීමේදී "වෘක්ෂ තෙමේ, විද්‍යු තොමෝ" ආදී වශයෙන් ව්‍යවහාර කරණ කල්හි "වෘක්ෂ" යන රූපයෙන් හා "තෙමේ" යන්නෙන් "රුක්" යන්න පුංලිඞ්ග බවත් "විද්‍යු" යන රූපයෙන් හා "තොමෝ" යන්නෙන් "විදු" යන්න ස්ත්‍රීලිඞ්ග බවත් පැණේ.

සංස්කෘතයෙහි දු නපුංසකලිඞ්ගභෙදය පෙණෙන්නේ විභක්ති රූපයෙන් පමණෙකි. හෙ ද බොහෝසේ පෙණෙන්නේ ලිඞ්ගාර්ථ ප්‍රකාශක විභක්ති රූපයෙනි. සිංහලෙහි ශබ්දරූපයෙන් හෝ විභක්තිරූපයෙන් හෝ ව්‍යවහාරයෙන් හෝ පුංලිඞ්ග ස්ත්‍රීලිඞ්ග දෙකට වඩා වෙනසෙක් නො පෙණේ. මේ මෙසේ හෙයින් පාලි සංස්කෘතයන්හි ස්ත්‍රීලිඞ්ග ශබ්ද සිංහලෙහි දු ස්ත්‍රීලිඞ්ග වශයෙන් ද, පුංලිඞ්ග නපුංසකලිඞ්ග ශබ්ද සිංහලෙහි පුංලිඞ්ග වශයෙන් ද ව්‍යව හාර වේ. මෙසේ ශබ්දයන්ගේ පුංලිඞ්ග ස්ත්‍රීලිඞ්ග යන විභෙදය පවසා නැවත ඒ ඒ භෙදයන්ගේ ලක්ෂණ දක්වන්නාහු "පණින් හදන්යුත්" යනාදිය කීහු.

---

ප්‍රාණිවාචකලිඞ්ග.

b. **පණින් හදන් යුත්-පවසනුයෙ පුමලිඟු වේ.**
**සහයොන් සතුන් කියලූ-සද වේ ඉතිරි ලිඟු නම.**

b. **හා**—පුරුෂව්‍යඤ්ජනයෙන් යුත් ප්‍රාණීන් පවසන ශබ්දය පුංලිඞ්ග නම් ද, ස්ත්‍රීව්‍යඤ්ජනයෙන් යුත් ප්‍රාණීන් පවසන ශබ්දය ස්ත්‍රීලිඞ්ග නම් ද වේ.

**වි**—මෙයින් ප්‍රකාශවන්නේ ප්‍රාණිවාචක ශබ්ද පමණෙකි, එහෙත් ප්‍රාණිවාචක ශබ්දයන්ගෙන් පමණක් භාෂාවක් ව්‍යවහාර යෙහි නො යෙදේ. එබැවින් ප්‍රාණිවාචක නො වන්නා වූ ශබ්ද යෝ ද මේ ලිඞ්ගභෙදයෙන් යුක්ත වෙත්. එහෙත් ලිඞ්ග භෙද යෙහි ලා ප්‍රාණිවාචකයන් ප්‍රධාන බැවින් පළමු කොට ලිඞ්ගවයෙහි ප්‍රාණිවාචකයන් නිදසුන් කරන්නාහු "බඹ, සුර" යනාදිය කීහු.

c. **බඹ සුර අසුර නර නා ගුරුළු පක් පිය ඈ පුමලිඟු.දෙව්දු නැසිනි ගුරුළුමෙණෙවි අඹු සුහුල් ඈ ඉතිරිලිඟු.**

c **භා**—මේ "බඹ සුර" ආදි ශබ්ද පුංලිඞ්ග ද, "දෙව්දූ" ආදි ශබ්ද ස්ත්‍රීලිඞ්ග ද වේ. මෙහි "පත්" යන්නෙන් පාදගාමි සත්ත්වයා (පාබල සෙනග) ගණු ලැබේ. "රිය" ශබ්දයෙන් රථගාමි සත්ත්වයා ගණු ලැබේ. එබැවින් ඒ ශබ්දදෙක ද ප්‍රාණිවාචක වේ. මෙහි "දෙව්දූ අඹු සුහුල්" යන තුණ ස්වාභාවික ස්ත්‍රීලිඞ්ගයි. "නැයිනී, ගුරුළුමෙණෙවී" යන දෙක එසේ නොවේ. "නයි, ගුරුළුමන්වා" යන පුංලිඞ්ගරූප "නැයිනී, ගුරුළුමෙණෙවී" කියා ස්ත්‍රීලිඞ්ග විය.

අප්‍රාණිවාචකලිඞ්ග.

d. **දිය දල ඇදුරු මෙ-අඹ රවිතුරු රණ හදස්,**
**රෝග ගහ මරු දහන්-අග ගුම් සඳ රස රුවන්.**
**පිරිකර බිසෙබ මුනි-පානිදු කට වස් මස්,**
**කෝ සර සර බණ මුළු-වස් සක් දිව් මැයි විසා.**
**පස් සස් ගුණ නගුල්-සත් සෝ බා ඇඹුල් ඈ,**
**පුම ලිඟු සදන් පියසු-බුහුසු සදනු දනුවෝ.**
**විදුලිය වසා පෙල-නිසා දෙනු ලද පැණ පවස්,**
**කිඹු බිම් මෙවුල් ඈ නම්-ඉතිරි ලිඟු වි දන්නෙත්.**

d. **භා**—ප්‍රාණිවාචක ශබ්ද පුංලිඞ්ග හෝ ස්ත්‍රී ලිඞ්ග යයි නියත වශයෙන් කිවහැකි වේ. එහෙත් සිංහලෙහි අප්‍රාණිවාචක ශබ්දයන්ගේ ලිඞ්ග භෙදය නියත වශයෙන් කිව නො හැකි වේ. ශබ්ද රූපයෙන් හෝ විභක්තිරූපයෙන් විශෙෂයක් නො පෙණෙන බැවිනි. එබැවින් මේ අප්‍රාණිවාචකයන්ගේ ලිඞ්ගභෙදයට නිදසුන් කරන්නාහු "දිය දල" යනාදිය දක්වා ශබ්දඥ දත් පඬිවරයන් මෙබඳු ශබ්දයන් බොහෝ සෙයින් පුංලිඞ්ග යයි පැවසූ බැවි ද, "විදුලිය" යනාදිය දක්වා මෙබඳු ශබ්දයන් බොහෝ සෙයින් ස්ත්‍රීලිඞ්ග යයි පැවසූ බැවි ද කීහු. මේ ශබ්දයන්ගේ ලිඞ්ග භෙදය පාලිසංස්කෘතානුසාරයෙන් කියනු විනා වෙන විදියකින් කිය නො හැකි වේ. මෙසේ ලිඞ්ගභෙදය දක්වා ඉත්ථි ස්ත්‍රී ලිඞ්ගත්වයෙන් ව්‍යවහාර කරණ කල්හි යෙදෙන ආකාරය දක්වනු සඳහා "අරුත්කිරියසද" යනාදිය කීහු.

ස්ත්‍රීප්‍රත්‍යය.

e. **අරුත් කිරිය සද-ගුණසද ද වන ඉති අනූ,**
**පුම සද ද ඉති සවසන-ඊ ඈ පස බුහුසු.**

e. **භා**—භාෂාවෙහි වූ අර්ථක්‍රියා ශබ්ද හා ගුණවාචක ශබ්ද පුංස්ත්‍රී යන ලිඞ්ගවයට සාධාරණත්වයෙන් සිඬයි. ඔවුන් ස්ත්‍රී ලිඞ්ගත්වයෙන් ව්‍යවහාර කරණ කල්හි බොහෝසේ ඊ ආදි ප්‍රත්‍යය

යන් යෙදීමෙන් වහර යෙදෙන බැව් ද, එසේ ම පුරුෂයෙකු ප්‍රකාශ කරන්නා වූ යම් ශබ්දයකින් ඒ ජාතියෙහි ස්ත්‍රියකුදු ප්‍රකාශ කරත් හොත් ඒ ශබ්දය කෙරෙනු දු ඊ ආදි ප්‍රත්‍යයන් වීමෙන් වහර යෙදෙන බැව් ද කීහු. මේ කොටස් තුණට නිදසුන් දක්වන්නාහු "තෙමන්නී" යනාදිය කීහු.

---

<u>ස්ත්‍රීප්‍රත්‍යයවත්අඛ්‍යාක්‍රියා.</u>

f. **තෙමන්නි මවන්නි තුස්නි මුස්නි ඈ අරුත් කිරිය සදින් ඊපස. තෙමන්නෝ මවන්නෝ ඈ බුහුබසැ ඊපස ලොපා ඕවිබත් පැමිණවූ සේ.**

f. **භා**—"තෙමන්නී මවන්නී තුස්නී මූස්නී" යනාදියෙහි අඛ්‍යා ක්‍රියා ශබ්දයෙන් ඊ ප්‍රත්‍යය යයි. "කරන්නි, යන්නි, එන්නි" යනාදිය ද මෙසේයි. මේ ශබ්දයන්ගේ පුංලිඞ්ගරූප "තෙමන මවන තුස්නා මූස්නා" යනු යි. ඔවුන් කෙරෙන් ඊ ප්‍රත්‍යය යෙදුනු කල්හි විඤ්චිධියෙන් "තෙමන්නී" යනාදිය සිඞයි. "තෙමන්නි" යනාදිය ස්ත්‍රීලිඞ්ග ශබ්ද ප්‍රකෘති යි.

බුහුබසෙහි වනාහි ඔවුන් කෙරෙන් පරව ඕ විභක්ති ප්‍රත්‍යය යෙදුනු කල්හි පෙරසරලොප් සඳවිදියෙන් "තෙමන්නෝ, මවන්නෝ" යනාදිය සිඞයි. එහෙත් දැන් වහරෙහි බොහෝසේ එබඳු පදයෝ යකාරාගම විධියෙන් සන්ධියට පැමිණ "තෙමන් නියෝ මවන්නියෝ කරන්නියෝ" යනාදි වශයෙන් යෙදෙත්. මේ අරුත්කිරිය සදින් ඊපස වීමේ උදාහරණයි. ඉක්බිති ගුණ සදින් ඊපස යෙදීමට නිදසුන් දක්වන්නාහු "හෙළිල්ලී" යනාදිය කීහු.

---

<u>ස්ත්‍රීප්‍රත්‍යයවද්ගුණශබ්ද.</u>

g. **හෙළිල්ලි, කොමලි, ගොරි, ඈ ගුණ සදින් ඊ පස.**

g. **භා**—"හෙළිල්ලී" යනාදිය ගුණවාචක ශබ්ද කෙරෙන් ඊ ප්‍රත්‍යයට උදාහරණයි.

**වි**—"හෙළලු, කොමල, ගොර" යන ගුණවාචක ශබ්දරූප පුංලිඞ්ගරූපයෝයි. ඔවුන් ස්ත්‍රීලිඞ්ගත්වයෙන් ව්‍යවහාර කිරීමේදී ඊප්‍රත්‍යය යොගයෙන් "හෙළිල්ලී" යනාදිය සිඞයි. "රත්තී, සුද්දී, කල්ලී" යනාදිය ද මෙසේයි.

තවද යම් ගුණවාචක ශබ්දයකින් තද්ගුණවිශිෂ්ට ස්ත්‍රීප්‍රාණියෙක් වාච්‍ය වේ නම් එබඳු තන්හි පමණක් ගුණවාචක ශබ්ද කෙරෙන් ඊප්‍රත්‍යය වේ. "හෙළිල්ලී" යනු හෙළලු වර්‍ණයෙන් විශිෂ්ට වූ ස්ත්‍රියෙකි, සෙස්ස ද එසේයි. "හෙළලු ගැහැණී" යනාදි තන්හි "හෙළිල්ලී ගැහැණී" කියා ව්‍යවහාර කරණු නො ලැබේ. එබඳු තන්හි "හෙළලු ගැහැණී" යනාදි වශයෙන් වේ, ඒ වෙසෙසුන් සමස් වශයෙන් සැලකිය හැකි වේ. වෙසෙසුන් සමස් විෂයෙහි එබඳු ශබ්දයන්ගේ ස්ත්‍රීත්‍වය ලොප් වේ. ඒ පාලිසංස්කෘතානුසාර යෙන් දත යුතුයි. අසමාස වශයෙන් වූකලි "ඒ ගැහැණී හෙළිල් ලියක් වේ" යනාදි වශයෙන් යෙදිය හැකි වේ.

---

ස්ත්‍රීප්‍රත්‍යයවත්පුරුෂවාචකශබ්ද.

**h. නිළි නැයිනි පැටි සැතිරී කුමරී යෙහෙළි මැහැලි ඈ ඉනි අරුත් පුමසඳින් ඊපස.**

h. භා—"නිළී, නැයිනී" යනාදිය පුරුෂවාචක ශබ්දයන් කෙරෙන් ස්ත්‍රී අර්‍ථයෙහි ඊප්‍රත්‍යය වීමට උදාහරණයි.

වි—මෙහි "නළ නයි පැටි සතුරු කුමර යහලු මහලු" ශබ්දයෝ පුරුෂවාචකත්‍වයෙන් නිපන්නාහු වෙත්. ඔවුන් ස්ත්‍රීවාචකත්‍ව යෙන් පවසන කල්හි ඊප්‍රත්‍යය යොගයෙන් පිළිපෙරළි ආදිය වීමෙන් "නිළී, නැයිනී, පැටී, සැතිරී, කුමරී, යෙහෙලී, මැහැලී" යි සිඩයි. තවද මෙහි "නැයිනී" යන තන්හි "නයි" ශබ්දයෙන් පරව "ඉනි" යි යෙදී තිබෙන බැව් පෙණේ. එබැවින් ඒ ඊප්‍රත්‍ය යෙන් පූර්‍වයෙහි නකාරාගම වීමෙන් සිඩයි. "ඇතිනී, වැලහිනී" යනාදිය මෙනි. සංස්කෘතයෙහි ද ඇතැම් ශබ්ද කෙරෙන් ඊ ප්‍රත්‍යය වූ කල්හි "ආන්" ආගම විධියක් ද නියමිතයි. පාළියෙහි "ඉනි" යි ප්‍රත්‍යයක් නියමිතයි.

---

ඉ ආ උෘ ප්‍රත්‍යයවත්ස්ත්‍රීලිඞ්ග.

**i. ඈ සඳින් කැලි වැසි මියුලැසි කලා දුනු ඈ සිදු.**

i. භා—පූර්‍වොක්ත "අරුත් කිරිය සද" යනාදි සූත්‍රයෙහි "ඊ" ඈ පස යනු කීහු, ඉන් ඇඟෙන්නේ ස්ත්‍රී අර්‍ථයෙහි ඊ ප්‍රත්‍යය ම පමණක් නොව තවත් ප්‍රත්‍යයයන් වන බවයි. එබැවින් හෙවත් ඒ "ඈ" ශබ්දය යෙදූ බැවින් "කැලි වැසි" යනාදිය සිඩ යයි කීහු.

**වි**—භාෂාවෙහි "කැලි වැසි" යනාදිය ස්ත්‍රීලිඞ්ගත්‍වයෙන් වහර යෙදෙන බැවින් සූත්‍රයෙහි "ඈ" සද යොදනලදී. මෙහි "කලු වසු මියුලැස්" ශබ්දයන් කෙරෙන් ස්ත්‍රී අර්ථයෙහි "ඉ" ප්‍රත්‍යය යෙදීමෙන් "කැලි වැසි මියුලැසි" සි සිඩයි. "කළා" යන තන්හි "කළු" ශබ්දයෙන් ආප්‍රත්‍ය යයි. "දුනු" යන තන්හි "දුනු" ශබ්දයෙන් ඌප්‍රත්‍යයයි. "කලු, වසු" ශබ්දයන් කෙරෙන් ඊ ප්‍රත්‍යය යෙදීමෙන් "කල්ලී, වැස්සී" කියා ද වේ. "කාල" ශබ්දයෙන් තද්භව වූ "කලු" ශබ්දයෙන් වූ "කැලි" හෝ "කල්ලී" යනු කාලවර්ණ ස්ත්‍රියයි. දක්‍ෂාර්ථ හෝ යොග්‍යාර්ථ 'කල්ල" ශබ්දයෙන් තද්භව වූ "කලු" ශබ්දයා කෙරෙන් ද ඊප්‍රත්‍යය යෙදීමෙන් "කල්ලී" සි ව්‍යවහාර කරණු ලැබේ. එහි අර්ථය දක්‍ෂ වූ හෝ යොග්‍ය වූ ස්ත්‍රිය යනුයි.

දැන් මේ නිදසුන්වලින් "ඊ, ඉ, ආ, ඌ" යන සතරම ස්ත්‍රී ප්‍රත්‍යය වශයෙන් නිදීෂට යි. සංස්කෘතයෙහි ස්ත්‍රීඅර්ථප්‍රකාශක ප්‍රත්‍යය වශයෙන් දක්වනලද්දේ "ඊ ආ ඌ" යන ප්‍රත්‍යය තුණයි. සිංහලෙහි ඉප්‍රත්‍යයක් ද නිදීෂටයි.

---

වහරයෙදෙනසේ පසයෙදීම.

j බුහුසුසඳින් වහර නොලඟනු රූසි.

j. **භා**—"අරුත්කිරියසද" යනාදි සූත්‍රයෙහි "බුහුසු" සි යොදන ලදී. එයින් හඟවන්නේ ඒ සූත්‍රයෙහි දැක්වූ සියලුශබ්දයන් කෙරෙන් ම ඊ ආදි ප්‍රත්‍යයයන් නොවන බවයි, එනම්: ව්‍යවහාරය උල්ලඞ්ඝනය නොකර ඊ ආදි ප්‍රත්‍යයන් යෙදියයුතුබවයි.

**වි**—බුහුසු ශබ්දය සූත්‍රයෙහි නො යෙදුයේ නම් පුංලිඞ්ගයෙහි ව්‍යවහාර කවර ශබ්දයක් කෙරෙන් වුවත් ස්ත්‍රීලිඞ්ගාවස්ථාවෙහි ඊ ආදි ප්‍රත්‍යය යොගය වේ යයි සිතිය හැකි වේ. එහෙත් වහරෙහි ඇතැම් පුංලිඞ්ග ශබ්දයෝ ස්ත්‍රීලිඞ්ගව්‍යවහාරයෙහිදු පුංලිඞ්ගරූපයෙන් ම සිටිත්, ඇතැම් ශබ්දයෝ ස්ත්‍රීවාචක අන්‍ය ශබ්දයන් හා සමාසවීමෙන් ස්ත්‍රීත්‍වය පවසත්, ඇතැම් පුංලිඞ්ගශබ්දයන්ගේ ස්ත්‍රීත්‍වය අන්‍ය වූ ශබ්දරූපයකින් පැවසේ, ඒ හෙද මේ අනුසාරයෙන් දතයුතුයි.

| **පුරුෂ.** | **ස්ත්‍රී.** |
|---|---|
| මී (මූෂික) | මී |
| මී (මා) (මහිෂ) | මීදෙන |
| මුව | මුවැත්තී |
| මොනර | සෙබඩ |

මෙසේ ව්‍යවහාර වන්නාවූ තවත් බොහෝ ශබ්දයෝ ඇත්තාහ. ශබ්දව්‍යවහාරයෙන් තොරව ව්‍යාකරණ සිද්ධියක් නොවේ. බොහෝ සෙයින් ක්‍ෂුද්‍රප්‍රාණීන්ගේ ලිඞ්ගභෙදය ප්‍රකට ව නො පෙණේ. එහෙයින් එබඳු බොහෝ ශබ්දයන්ගේ ස්ත්‍රීලිඞ්ගභෙදයක් වහරෙහි නොයෙදුනේ යයි සිතිය යුතු වේ. එබැවින් එබඳු ශබ්දයන් ස්ත්‍රීත්වයෙන් ව්‍යවහාර කිරීමට ඊ ප්‍රත්‍යයාදිය යෙදීම උචිත නොවේ.

තවද ලිඞ්ගභෙදය පෙණෙන බොහෝ තිරශ්චීනවාචී ශබ්දයන් ස්ත්‍රීලිඞ්ග කිරීමේදී "ධෙනු" ශබ්දයෙන් තද්භව වූ "දෙන්" ශබ්දය පුරුෂවාචක ශබ්දයන්ගේ අන්තයෙහි යෙදේ. එහෙත් ඊප්‍රත්‍යයාදිය යෙදීමෙන් ස්ත්‍රීලිඞ්ග වන්නාවූ බොහෝ ශබ්ද කෙරෙන් එසේ නොයෙදෙන බැව් පෙණේ.

| පුරුෂ. | ස්ත්‍රී. |
|---|---|
| කොටියා | කොටිදෙන |
| මුවා | මුවදෙන |
| එළුවා | එළුදෙන |
| බැටළුවා | බැටළුදෙන |

| පුරුෂ. | ස්ත්‍රී. | අයොග්‍යපාඨ. |
|---|---|---|
| බල්ලා | බැල්ලී | බලුදෙන |
| බළලා | බැළලී | බළල්දෙන |
| වඳුරා | වැඳිරී | වඳුරුදෙන |
| හරකා | හරකී | හරක්දෙන. |

මේ ආදිවශයෙන් දතයුතුයි. මෙසේ ලිඞ්ගවයෙහි නොසමව පවත්නා ශබ්දයන් නිර්දේශ කොට නැවත ලිඞ්ගවයෙහි සමව පවත්නා ශබ්දයන් දක්වන්නාහු "තමඑමෙද" යනාදිය කීහු.

ත්‍රිලිඞ්ගසම ශබ්ද.

**a. ත ම එ මෙ ද රමණී-දිගු සව් තුරුණු මුදු ලොල්, හැලි ඇල් ගුණසද ද-ඳදලිඟු සම වි දන්සේ.**

a. **සා—**"ත ම එ මෙ" යන ශබ්ද හා "දිගු සව් තුරුණු මුදු ලොල් හැලි ඇල්" ආදි ගුණවාචක ශබ්දයන් පුංලිඞ්ග ස්ත්‍රීලිඞ්ග දෙක්හි අවිශෙෂයෙන් සම ව යෙදෙන බැව්, හෙවත් ස්ත්‍රීලිඞ්ගවීමට ඊ ප්‍රත්‍යයාදිය නොයෙදෙන බැව් කීහු.

වි—මෙහි "ත" ශබ්දය යුෂ්මද්වාචක ද, "ම" ශබ්දය අස්මද් වාචක ද වේ. පාළි "තුම්හ, අම්හ" ශබ්ද දෙක හෝ සංස්කෘත "යුෂ්මද්, අස්මද්" ශබ්ද දෙක වාග්ව්‍යවහාරයෙහි ලිඞ්ගභෙද රහිතව පවත්නේ වේ. සිංහලෙහි ද එසේයයි කීහු. එහෙත් "ත" ශබ්දය ස්ත්‍රීත්වයෙන් "තී" කියා ද වහර යෙදේ. පාළි "ත" ශබ්දය හෝ සංස්කෘත "තද්" ශබ්දය වෙනුවට සිංහලෙහි "එ" ශබ්දය ද, පාළි "ඉදං" ශබ්දය හෝ සංස්කෘත "ඉදම්" ශබ්දය වෙනුවට සිංහලෙහි "මෙ" ශබ්දය ද යෙදේ. පාලිසංස්කෘතයන්හි ඒ දෙක ලිඞ්ගභෙද යෙන් යුක්තයි. සිංහලෙහි ඒ දෙක ද විලිඞ්ග සම යයි කීහු. එහෙත් ප්‍රාණිවාචකත්වයෙන් යෙදෙන තන්හි "එ" ශබ්දය පුංලිඞ්ග විෂයෙහි "උ඗ උ඗ට" යනාදි වශයෙන් ද, ස්ත්‍රීලිඞ්ග විෂ යෙහි "ඈ ඈට" යනාදි වශයෙන් ද, "මෙ" ශබ්දය "මූ මූට, මෑ මෑට" යනාදි වශයෙන් ද ලිඞ්ගභෙදයෙන් ව්‍යවහාර කරණුලැබේ.

ස්ත්‍රීත්වයෙන් පවසන කල්හි ගුණවාචක ශබ්ද කෙරෙනු දු ඊ ආදි ප්‍රත්‍යයයන් වන බැව් මෙහි පූර්වොක්තයි, එහෙත් සූත්‍රයෙහි යෙදූ බුහුසූ සදින් බොහෝ ගුණවාචකයන් කෙරෙන්, එනම් "රමණී, දිගු" යනාදිය කෙරෙන් ඊ ආදිය නොවන බැව් හා ඔවුන් ලිඞ්ගසමත්වයෙන් යෙදෙන බැව් ද මෙහි නිර්දිෂ්ටයි. සිංහල ව්‍යවහාර යෙහි ලිඞ්ගභෙදයෙන් පවත්නා ගුණවාචක ශබ්ද ස්වල්පවශයෙන් මුත් අධික වශයෙන් ඇති බැව් නොපෙණේ. මෙහි කී "රමණී" යනාදි ශබ්ද පමණක් නොව "ලකල් මනරම් මහරු යහපත් පිය සොඳ කලණ රුසිරු මනකල් ලුහු ගුරු සුලු අනගි මහඟු උතුරු පුලුල් විපුල් තුමුල්" ආදි බොහෝ ගුණවාචක ශබ්දයෝ ලිඞ්ගභෙද රහිත ව වහර යෙදෙත්. "ඒ පුරිස් තෙමේ රමණී වේ, ඒ ගැහැණි තොමෝ රමණී වේ" යනාදි වශයෙනි, පාලිසංස්කෘත භාෂාවන්හි මොවුහු ලිඞ්ගභෙදයෙන් වහර යෙදෙත්. "සො පුරිසො රම ණීයො, සා ඉත්‍ථි රමණීයා" යනාදි වශයෙනි.

මෙහි කී "සව්" ශබ්දය පාළි "සබ්බ" ශබ්දයෙන් හෝ සංස්කෘත "සර්‍ව" ශබ්දයෙන් බිඳුනේ වේ. එහි "සබ්බ" ශබ්දය හෝ "සර්‍ව" ශබ්දය සර්‍වනාමශබ්දගණයෙහි ඇතුළත් වේ.. පාලිසංස්කෘතාදි යෙහි මෙන් සිංහලෙහි විශෙෂවශයෙන් සර්‍වනාම ශබ්දගණයෙක් නො දක්වන ලද්දේ ය. වරනැගීමෙහි භෙදයක් නැති බැවිනි. එහෙයින් පාලිසංස්කෘතයන්හි සර්‍වනාමශබ්ද මෙහි කී ගුණශබ්ද ගණයෙහි ඇතුළත් කටයුතුයි. මෙසේ විලිඞ්ගසමශබ්දයන් දක්වා ඉක්බිති අකර්‍මක්‍රියා භාවක්‍රියා ශබ්දයන්ගේ ලිඞ්ග භෙදය පවසන්නාහු "අරුත්කිරියසද" යනාදිය කීහු.

<u>අරුත්: හව්: කිරිය ලිඟුබේ.</u>

**a. අරුත් කිරිය සද-නමරුත් වැනි ලිගු බෙජේ,**
**යනු එනු මැගුම් ඇ හව්-කිරිය සද වේ පුමරුත්.**

a. **භා**—අර්ථක්‍රියා ශබ්දයෝ තමන් විසින් වාච්‍ය වූ අර්ථයට සමාන ලිඞ්ගය භජනය කෙරෙති, "යනු එනු" ආදි භාවක්‍රියා ශබ්දයෝ පුංලිඞ්ග වෙත්.

**වි**—අර්ථක්‍රියා ශබ්දයෙන් යම් කිසිවෙක් උක්ත වේ හෙවත් කියවේ. ඒ උක්ත වන්නා වූ අර්ථය පුංලිඞ්ග නම් අර්ථක්‍රියා ශබ්දය ද පුංලිඞ්ග වේ, ස්ත්‍රීලිඞ්ග නම් අර්ථක්‍රියා ශබ්දය ද ස්ත්‍රීලිඞ්ග වේ. 'යන්නේ පුරුෂයෙකි, යන්නී ගැහැණියකි" යනාදි වශයෙන් දතයුතුයි. භාවක්‍රියාශබ්දයෙන් කිසිත් උක්ත නොවේ. එබැවින් භාවක්‍රියා ශබ්දය සාමාන්‍ය වශයෙන් යම් කිසි එක් ලිඞ්ගයක් එනම් සිංහලෙහි පුංලිඞ්ගය භජනය කෙරේ. පාලි සංස්කෘතයන්හි භාවක්‍රියා ශබ්දයෝ බොහෝ සෙයින් නපුංසක ලිඞ්ගය ද, ඇතැම් භාවක්‍රියා ශබ්ද කෙනෙක් පුංලිඞ්ගය ද, ඇතැම් කෙනෙක් ස්ත්‍රීලිඞ්ගය ද භජනය කෙරෙත්. මෙසේ අර්ථක්‍රියා භාවක්‍රියා ශබ්දයන්ගේ ලිඞ්ගභේදය දක්වා නැවත අලිඞ්ග ශබ්ද යන් දක්වන්නාහු "කිරියවෙසෙසුන්සද" යනාදිය කීහු.

---

<u>අලිඟුසද.</u>

**කිරිය වෙසෙසුන් සද-නිති නුබඳ රිසිසේ ඇ,**
**විස්සල් ඉරු යොර යොර-පුන තුමුටු සිති සහසා.**
**සු ඉති යල සැර රඹ-ඉහි නිහියැ නිපා සද,**
**අනු උ පිරි සප නි දු ඇ-උපසග ද වේ ලිඟුමුත්.**

**භා**—"නිති අනුබද රිසිසේ" යනාදි ක්‍රියාවිශෙෂණ ශබ්ද ද, "විස්සල් ඉරු යොරයොර පුන තුමුටු සිති සහසා සු ඉති යළ සැර රඹ ඉහි නිහිය" යනාදි නිපාත ශබ්ද ද, "අනු උ පිරි ස ප නි දු" ආදි උපසර්ග ශබ්ද ද ලිඞ්ගභාවයෙන් මිදුනේ වේ, හෙවත් අලිඞ්ග වේ.

මේ ශබ්දයෝ අලිඞ්ග බැවින් විභක්ති යෙදීමෙන් වර නොනැගෙති. නිපාත උපසර්ග යන කොටස් දෙක අව්‍යය වේ. අව්‍යය යන් දැනගැණීමේ එක ම උපාය විභක්ති විෂයෙහි වරනොනැගීමයි.

මෙසේ අලිඞ්ගශබ්දයන් දක්වා නැවත ඒ අලිඞ්ගත්වයෙන් තිදීෂට ක්‍රියාවිශෙෂණ ශබ්දයන්ගේ තත්වය පවසන්නාහු "සුවසේ ඇ" යනාදිය කීහු.

## කිරියවෙසෙසුන් තතු.

**සුවසේ ඈ ගුණෙන් කිරිය වෙසෙසනා බැවින් කිරියවෙසෙසුන් සද නම්.**

භා—සුවසේ යනාදි ශබ්ද ක්‍රියාවිශෙෂණ ශබ්දගණයෙහි ඇතුළත් වේ. කුමක් හෙයින යත්? ගුණයක් කරණ කොට ගෙණ ක්‍රියාර්‍ථය වෙනස් කරණ බැවිනි.

වි—වාක්‍යවිෂයෙහි වූ විශෙෂණ ශබ්ද දෙකොටසෙකි, නාම විශෙෂණ ක්‍රියා විශෙෂණ වශයෙනි, එහි සාධාරණ නාම පදයක් පිළිබඳ විශෙෂයක් ඇඟවීමට යෙදෙන පදය නාම විශෙෂණ නම් වේ. එහි භෙදය වෙසෙසුන් වෙසෙස් අදියරෙහි පැවසේ.

ක්‍රියාවන් පිළිබඳ වූ අර්‍ථය වනාහි සියලු ගුණයන්ට ම සාධාරණ වේ. සියල්ලට සාධාරණ වූ ක්‍රියාර්‍ථය යම් ගුණවාචක ශබ්ද විශෙෂයකින් වෙනස් කෙරේ නම් ඒ ක්‍රියාවිශෙෂණ නම් වේ. "ඒ මිනිහා ගමට යේ" කී කල්හි "යේ" යන ක්‍රියාව පිළිබද ගම නාර්‍ථය සුව දුක් ආදි සියලු ගුණයන්ට සාධාරණ වේ. "ඒ මිනිහා සුවසේ ගමට යේ" කී කල්හි ඒ ගමන "සුවසේ" යන්නෙන් වෙනස් කරණු ලැබේ. "හෙමින් ගියේය, විගහට ගියේය, හොඳට කෑවේය" යනාදියෙහි "හෙමින්, විගහට, හොඳට" යනාදිය ද ක්‍රියා විශෙෂණයි.

පාලිසංස්කෘත භාෂාවන්හි ක්‍රියාවිශෙෂණ පදය බොහෝ සෙයින් නපුංසක ලිඞ්ගවිතීයා එකවචනයෙන් යෙදේ, සිංහලෙහි එසේ නොවේ. පාළියෙහි "සො සුඛං සෙති" කියා වේ. මෙහි "සුඛං" යනු ක්‍රියාවිශෙෂණයි, නපුංසකලිඞ්ගවිතීයෙක වචනයි. "හෙතෙමේ සුවසේ හොවී" යනු එහි සිංහල වාක්‍ය යයි. පාලි වාක්‍යයෙහි "සුඛං" යන්න වෙනුවට සිංහල වාක්‍යයෙහි යෙදුනේ "සුවසේ" යනු යි. "යම්සේ එසේ මෙසේ" යනාදිය මෙන් "සුවසේ" යන්න ද නිෂ්පන්න නිපාතයක් වියයුතුයි. සිංහලෙහි මෙසේ නිපාත ම පමණක් නොව "හොඳින්, හොඳට" යනාදි වශයෙන් කරණ සම්බන්ධ විභක්ත්‍යන්තපදයෝ ද ක්‍රියාවිශෙෂණත්වයෙන් යෙදෙත්.

මෙසේ ක්‍රියාවිශෙෂණයෙහි තත්ත්වය දක්වා නැවත පූර්‍වොක්ත "ඉහි නිහියැ" යන තන්හි ඈ සදින් ගතයුතු නිපාත ශබ්ද ස්වල්පයක් පවසනු වස් "හිඟුම්" යනාදිය කීහු.

## නිපාසද.

**a. හිඟුම් නිකුත් ව වැනි වනාහි කලි නම් විනා වෙන පු හු ල ලු ද මැ න කි කිම් හොත යම්සේ එසේ මෙසේ සහ අද එදා ඈ නිපාසද නම්.**

a. **භා**—“හිඟුම්” යනාදිය නිපාත නම් වේ. මොවුන්ගේ අර්ථාදිය පදාර්ථව්‍යාඛ්‍යානවලින් දතහැකි වේ.

**වි**—වාක්‍යවිෂයෙහි පදපූරණවශයෙන් හෝ නානාවිධ අර්ථ යන් ප්‍රකාශ කිරීම් වශයෙන් තන්හි තන්හි වැටෙන පද සමූහය නිපාත නම් වේ. භාෂාවන්හි නිපාතයෝ මෙපමණ යයි පිරිසිඳිය නොහැකි වෙත්. නිපාතයෝ විභක්ති විෂයෙහි වරනොනැගෙත්, මෙහි නිර්දිෂ්ට “නම්” යන්න නිපාතයි, නිපාත නුවූ “නම්” ශබ්දය සංඥාපර්යාය වේ. ඒ විභක්ති විෂයෙහි වරනැගේ. පාලිසංස්කෘත යන්හි “නාම” යි නිපාතයක් ද, පාළියෙහි සංඥාවාචක “නාම” ශබ්දයක් හා සංස්කෘත “නාමන්” ශබ්දයක් ද, විද්‍යමානයි. එසේම “කිම්” ශබ්දය ද නිපාතත්වයෙන් පමණක් නොව නාමත්වයෙන් ද ව්‍යවහාර වේ. “අද” යන නිපාතය “අදින්, අදට” කියා ද ව්‍යවහාර වේ. “අද” යන්න ආධාරාර්ථ වශයෙන් ද, “අදින්” යන්න අවධිවශයෙන් ද “අදට” යන්න (තාදර්ථ්‍ය) සම්ප්‍රදාන වශයෙන් ද වහර යෙදේ. “**අද** ආ මිනිහා **අදින්** පසු නො එන ලෙසටත් **අදට** නවතින ලෙසටත් පොරොන්දු විය” යනාදි වශයෙනි. “සෙට අනිද්දා ඊයේ පෙරේදා” යන මොහු ද “අද” යන්න වැනි නිපාතයෝයි. “අද” යනාදි මේ නිපාතයෝ පාළි හෝ සංස්කෘත“අද්‍ය,සෙව, අන්‍යද්‍යුස්, හීයො, පරෙද්‍යුස්” යන මේ නිපාතයන්ගෙන් තද්භව වූවෝ වෙත්. “යම්සේ එසේ මෙසේ” යන මොහු “යම් එ මෙ” යන නාමයන් කෙරෙන් “සේ” ප්‍රත්‍යය වීමෙන් නිෂ්පන්න වූ නිපාතයෝ යි. මෙසේ නිපාතයන් දක්වා ඉක්බිති “අනු උ පිරි සප නි දු ඈ” යන තන්හි ඈ සදින් ගතයුතු උපසර්ගයන් ද සඞ්ග්‍රහකොට උපසර්ගයන් සියල්ල ම සන්දර්ශිතත්ව යෙන් දක්වන්නාහු “ප පහා ඈහි” යනාදිය කීහු.

---

## උපසගසද.

a. **ප-පහා ඈහි, පර-පැරැදූ ඈහි, අව-අවසේ ඈහි, ස-සබඳ ඈහි, අනු-අනුදැනැ ඈහි, නි-නිරෙද නිරසක් ඈහි, වි-විලස් ඈහි, අ-අදර ඈහි, අදි-අදියර ඈහි, සු-සුබැසි ඈහි, උ-උලැඟි ඈහි, අබි-අබියෙස් ඈහි, පිරි-පිරිබුන් ඈහි, උප-**

**උපේ උවසර ඇති, අප-අපදන් පහවූ ඇති, පස්-පසක් රූකක් පාසා ඇති, පිළි-පිළිලැබූ ඇති, අති-ඉතිරි ඉබොහෝ ඉකුත් ඇති, පි-පිහිකුළු ඇති, මේ විසි උපසග සද නම්.**

a. **භා**—ධාතුමූලක ශබ්දයන්ගේ මූල යෙදී එකතුව සිටින ශබ්ද විශෙෂය උපසර්ග නම් වේ.

**වි**—උපසර්ගයෝ වනාහි කිසිතැනෙක්හි ධාතුව පිළිබඳ වූ ප්‍රකට අර්ථය වළක්වාලීමෙන් ද, කිසිතැනෙක්හි ඒ ප්‍රකට වූ අර්ථයට අනුව පැවැත්මෙන් ද, කිසිතැනෙක්හි ප්‍රකට වූ අර්ථය ම වෙසෙසා කීමෙන් ද යුක්ත වූවෝ වෙත්. පාලිසංස්කෘත සඞ්ඛ්‍යාත මාතෘ භාෂාවන්හි ද උපසර්ගයෝ විසිදෙනෙක් තිදීෂ්වයහ. සිංහලෙහි ද එසේ මැයි. මාතෘභාෂා ශබ්ද විශෙෂයන් සිංහලට බිඳෙන කල්හි එහි වූ ඇතැම් උපසර්ගයෝ ඒ රූපයෙන්ම සිටිත්, ඇතැම් කෙනෙක් රූපය මදක් වෙනස් වීමෙන් සිටිත්. එහි "අව අනු නි වි සු උප අප අති" යන මොහු බොහෝ සෙයින් භාෂා ත්‍රයෙහි සමව සිටිත්. "ප උ දු" යන තුණ පාලිසිංහල දෙක්හි සමාන වෙත්, පාලිසංස්කෘත ශබ්දවිෂයෙහි වූ "පරා සං-සම් ආ අධි අභි පරි පති=ප්‍රති අපි" යන මේ උපසර්ගයෝ සිංහල ශබ්ද විෂයෙහි "පර ස අ අදි අබි පිරි පස්-පිළි පි" කියා සිටිත්.

උපසර්ගයෝ ධාතුමූලක ශබ්දයන්ගේ ආදියෙහි සිට ධාත්වර්ථයට උපකාර වන්නෝ වෙත්, හුදකලාව සිට අරුත් පවසන්නෝ නොවෙත්. පාලිසංස්කෘතයන්හි ධාතුවලින් සිඩ උපසර්ග සහිත වූ හෝ රහිත වූ ශබ්දයන් උපසර්ගයන්ගෙන් හෝ ප්‍රත්‍යයාදියෙන් තොරකළ කල්හි එහි ශෙෂ වූ ධාතුමාත්‍රය ගෙණ ඉන් අර්ථවත් ක්‍රියාදිය සිදුකට හැකි වේ. සිංහලෙහි බොහෝ තන්හි ඒ රීතිය නොලැබේ. ඊට හෙතුව බොහෝ සිංහල ශබ්දයන් පාලිසංස්කෘතාදියෙන් තද්භව වීමයි. පාලිසංස්කෘතයන්හි වූ උපසර්ග සහිත බොහෝ ධාතුමූලක ශබ්දයන්ගෙන් සිංහල වූ ශබ්දයන්ගේ ඇතැම් උපසර්ගයෝ විකාරයට නො පැමිණ ස්වරූපයෙන් සිටිත්, "පහාර-පහර, අනුජානාති-අනුදනී, අවමාන-අවමන්" ආදිවශයෙනි, මෙබඳු තන්හි උපසර්ග රහිත වූ කොටස ද අර්ථවත් වේ. "හර, දනී, මන්" යනාදි වශයෙනි. උපසර්ග සහිත බොහෝ පාලිසංස්කෘත ශබ්දයන් සිංහල වූ කල්හි උපසර්ගයන් වෙන් කොට ගතයුතු අර්ථවත් ශෙෂයෙක් නොලැබේ. "පධාන-පදන්, අවධි-අවදි, සණ්ඨාන-සටන්" ආදිවශයෙනි, මෙහි උපසර්ග රහිත කළකල්හි "දන් දි ටන්" යි ශෙෂ වේ, ඒ ශෙෂය නිරර්ථක වේ. බොහෝ පාලිසංස්කෘත ශබ්දයන් සිංහල වූ කල්හි උපසර්ගත්වයෙන් හා ධාතුත්වයෙන් විභාග නොකට හැකි වේ. 'ආදි=ඈ' ආදියෙහි එසේ විභාග නොකට හැකි වේ.

මෙලෙසින් සිංහලෙහි උපසර්ගයන්ගේ තත්ත්වය විෂම බැවින් සිංහලෙහි උපසර්ග විස්සෙක් නැතැයි ද ඇතැම් අයගේ මතයෙකි, සිංහලශබ්ද පාලිසංස්කෘතාදිය මාතෘභාෂා කොට හෙවත් මූල් කොට ඇති බැවින් ඔවුන් බිඳී වෙස් පෙරළීමෙන් විරූප වුවත් ඒ මාතෘභාෂාශබ්දගත උපසර්ගයන් සිංහලෙහි දු උපසර්ග නාම යෙන් ම පිරිසිඳ ගැණීම සිද්ධාන්ත සඞ්ග්‍රහ කර්තෘපාදයන්ට හා රුවන්මල් නිඝණ්ඩුකාරදීන්ට ද අභිමත විය. පරම්පරාගත මූල් නාමගොත්‍රාදිය ඉවත් නො කිරීම ශිෂ්ටයන්ගේ චාරිත්‍ර විශෙෂයෙකි. ප්‍රථමයෙන් යම් කිසි ගොත්‍රයෙක් යමෙකු මූල්කොට ආරබ්ධ වූයේ නම් කල්යාමෙන් ඒ වෙනස් වූයේ නමුදු ඒ පූර්ව නාමය ම මූල්කොට ව්‍යවහාර කරණු ලැබේ. යම් ගොත්‍රයෙක් මුලදී (රාජ) කුමාරයෙකුගෙන් ආරබ්ධවූයේ නම් ඒ ගොත්‍රය සැමදුම "කුමාර" යයි ව්‍යවහාර කරණු ලැබේ. එහෙත් එහි පසු පසුව ඇතිවන්නෝ කුමාරයෝ නොවෙති.

මෙසේ ම සිංහල ශබ්දයෝ ධාතුමූලක නොවෙත් යයි ද, ධාතු මූලක නොවන ශබ්දයන්ගේ උපසර්ග විවෙචනයක් නැතැයි ද බොහෝ අයගේ මතයෙකි, සිංහල භාෂාවෙහි බොහෝ ශබ්දයෝ ධාතුමූලක නොවෙත් යයි අපි දු කියමු, එහෙත් මාතෘභාෂාගත ශබ්දය ධාතුමූලක වේනම් එයින් බිඳුනු ශබ්දය ද ධාතුමූල කත්වයෙන් සැලකිය යුතුයි, පාලිසංස්කෘතයන්හි වූ "සබ්බඤ්ඤු" හෝ "සර්වඥ" ශබ්දය ධාතුමූලක වේ, එබැවින් එහි අර්ථය සියල්ල දන්නෝ යනුයි. එහි "සබ්බ" ශබ්දපපද 'ඤා' ධාතුය කියා ද 'සර්' ශබ්දප පද "ඥ" ධාතුය කියා ද වෙන් කටහැකි වේ. එහෙත් එයින් බිඳුනා වූ සිංහල "සවණ" ශබ්දයෙහි ධාතුව එසේ වෙන් කට හැකි නොවේ. එසේ වුවද එහි අර්ථය සියල්ල දන්නේ යනු මැයි. වෙස්පෙරළීමෙන් ශබ්දය වෙනස්වූයේ නමුදු අර්ථය වෙනස් නොවේ. යථොක්ත උපසර්ගයන් නිදර්ශනයන්ගෙන් පවසන්නාහු "ප පහා" යනාදිය කීහු. එහි අර්ථාදිය පදාර්ථව්‍යාඛ්‍යානයන් ගෙන් දතයුතුයි.

"ප" යන උපසර්ගය "පහා" යනාදි ප්‍රයොගයන්හි ද, "පර" යන උපසර්ගය "පැරුදු" යනාදි ප්‍රයොගයන්හි ද පැණේ, මේ ආදී වශයෙන් දතයුතුයි. මෙහි නිදසුන් කළ "පහා" යන්න "පගා" යයි ද කියති, "පහා-පගා" යන දෙතන්හි ම ප උපසර්ගය ඇති බැවිනුත් දෙකම අර්ථවත් සිංහල ශබ්ද දෙකක් බැවිනුත් මෙහි ලා දෙකම නිවැරදි වේ. තවද "උපේ, උවසර" යන දෙතන්හි "උප" උපසර්ගය ඇති බැවි කීහු. එහි "උවසර" යන තන්හි "උප" යන්නේ

පයන්නට වයන්නයි. "උපේ" යන්න "උපෙක්‍ෂා" ශබ්දයෙන් බිඳුනේ වේ. "උත්‍ප්‍රෙක්‍ෂා" ශබ්දයෙන් ද "උපේ" යි බිඳේ. එකල්හි එහි "උ, ප" යි උපසර්ග දෙකෙකි. "අපදන් පහවැ" යනාදියෙහි "අප" උපසර්ග යයි කිහු. "පහවැ" යන තන්හි "අප" යන්නේ අකාරලොප යයි, ඒ "ප" උපසර්ගය මෙන් පෙණේ. රුකක් පාසා" යනාදියෙහි "පස්" යන උපසර්ගය ඇති බැව් කිහු. "පස්-අක්=පසක්" යනු වේ. පාළියෙහි "පති-අක්ඛ=පච්චක්ඛ" යි සිඩයි. එහි පති යන්න මෙබඳු බොහෝ තන්හි "පච්ච" යි සිඩ බැවින් එයින් සිංහලට "පස්" යි බිඳී තිබේ. "රුකක් පාසා" යන තන්හි "පාසා" යන්න උපසර්ගයෙක් නොවේ. ඒ "පස්" යන උපසර්ගපූර්වකව පූර්වක්‍රියාර්‍ථයෙහි නිපන් නිපාතයෙකි. "පති" යන්න ප්‍රභව කොට ඇති "පස්" යන්න ව්‍යාජාඤර්ථයි. "පාසා" යන්නේ අර්ථය ව්‍යාපතියට පැමිණ හෙවත් පැතිර යනුයි, එබැවින් "රුකක් පාසා" යන්නේ අර්ථය වෘක්‍ෂජාතිය පැතිර යනුයි. "ඉතිරි, ඉබොහෝ, ඉකුත්" යනාදියෙහි "අති" උපසර්ගය ඇතිබැව් කිහු. ශබ්දයන් බිඳීමේදී "අති" උපසර්ගය බොහෝ සෙයින් විකාරයට පැමිණෙන බැව් පෙණේ. "ඉතිරි" යන්න "අතිරිකත" ශබ්දයෙන් බිඳුනේ වේ. එහි "අති" යන්නේ අයන්නට ඉයන්නයි. "ඉබොහෝ" යන්න "අතිබහු" යන්නෙන් ද "ඉකුත්" යන්න "අතික්කන්ත" ශබ්දයෙන් ද බිඳුනේ වේ. එහි "අති" යන්නේ "අත්" යන්න ලොප් වූ බැව් පෙණේ. "අතිසය" යනාදි ඇතැම් තන්හි "අති" යන්න ප්‍රකෘතිරූපයෙන් ම සිටී, "පිහිකුළු" යනාදියෙහි "පි" යන උපසර්ගය බැව් කිහු. පියන්න "අපි" යන උපසර්ගයෙන් බිඳුනේ වේ. පාළිසංස්කෘතයන්හි ද බොහෝ තන්හි "අපි" උපසර්ගයේ අයන්න ලොප් වේ. "අපිධාන,-පිධාන; අපිහිත-පිහිත" යනාදි වශයෙනි.

# ලිඞ්ගාධිකාරය

**නිමි.**

---

විබත් අදියර.

උද්දේශක්‍රමයෙන් තෙවැනි වූ ලිඟුවිදිය පිළිබඳ ප්‍රතිනිර්දේශයන් පවසා ඉත්බිති සතරවැනි වූ විබත් විදිය පිළිබඳවූ ප්‍රතිනිර්දේශයන් පවසන්නාහු 'සදහු" යනාදිය කිහු.

## සරඅත් හලත් සද.

**a. සදහු දෙවැදෑරුම්-සරඅත් හලත් වෙසෙසින්,**
**බුහුසු සිසලු විබෙහ්-එදෙක සියරු නොපියා.**

**b. දම්රජ දන්වා මුනි සැයි මරරුපු බු ගේ ගෝ සිදුහත්**
**ඇ පුමලිඟු. තිස වසා සිරි ගි විදු දු ලේ දෙ කත් ඇ ඉතිරිලිඟු.**

a. **භා** – හෙලදිව්බසෙහි ශබ්දයෝ ද (සංස්කෘතයෙහි මෙන්) ස්වරාන්ත හලන්ත යන විශෙෂයෙන් දෙපරිදි වෙත්. ඒ ශබ්දයෝ වනාහි බොහෝ සෙයින් සියලු විබත් විෂයෙහි ම ස්වකීය රූපය නොහරිත්, හෙවත් විබත් ඇසුරු කොට නොවෙනස්ව ප්‍රකෘතියෙන් සිටිත්. ඒ ශබ්දයන් පුංලිඞ්ග ස්ත්‍රීලිඞ්ග ශබ්දභෙදයෙහි ලා පවසන්නාහු "දම්රජ" යනාදිය කිහු.

b **භා**—"දම්රජ-යෝ" යනාදි ශබ්ද ස්වරාන්තපුංලිඞ්ග යයි ද, "සිදුහත්" යනාදිය හලන්තපුංලිඞ්ග යයි ද, "තිස-දෙ" යනාදි ශබ්ද ස්වරාන්ත ස්ත්‍රීලිඞ්ග යයි ද, "කත්" යනාදිය හලන්ත ස්ත්‍රීලිඞ්ග යයි ද කීහු. හෙලදිව් බසෙහි ස්වර දශයක් ඇතත් මෙහි ස්වරාන්ත ශබ්ද අට අට දක්වූහ, 'එ, ඔ" අන්ත ශබ්දයන් නො දක්වූහ. ගේ එබඳු ශබ්දයන් භාෂාවෙහි නැති බැවිනි.

---

## විබත්අදියර විනිස.

පාලිසංස්කෘතව්‍යාකරණයන්හි විභක්ත්‍යධිකාරය විභක්තිරූප සාධනය මුල් කොට සඞ්ගෘහීතයි, මෙහි එසේ නොව විභක්ත්‍යර්ථ නිරූපණය මුල් කොට සඞ්ගෘහීතයි. පාලිසංස්කෘතයන්හි විභක්ති රූපනිරූපණයෙහි ලා සකල ශබ්දයන්ට සාධාරණත්වයෙන් "සි යො-සි ඖ ජස්" යනාදි වශයෙන් එක් එක් විභක්තිවචනයක් වෙනුවට එක් එක් ප්‍රත්‍යය බැගින් උද්දිෂ්ටයි. එසේ ප්‍රත්‍යයොද්දෙශය කොට ඉක්බිති ශබ්දයන් ගණවශයෙන් බෙදා ඒ ඒ ගණයන්හි යථොක්තප්‍රත්‍යය යොගයෙන් ආදෙශාගමාදිය වීමෙන් සිඬ වූ විභක්තිරූප සාධනය පිළිබඳ විශාල අනුශාසනයක් කළහ. මෙහි විභක්තිරූපයන් පිළිබඳව එබඳු අනුශාසනයක් නොකරණ ලද්දේය. පාලිසංස්කෘතයන්හි මෙන් සිංහලෙහි ශබ්දගණ පිරිසිඳීම නොකාට හැක්කේ ය. සිංහල භාෂාව්‍යවහාරයෙහි ශබ්දයන්ගේ විභක්තිරූපයෝ නොයෙක් ලෙසින් වෙනස් වෙත්, සප්‍රාණ අප්‍රාණ භෙදයෙනු දු වෙනස් වෙත්. ඒ විශෙෂ වනාහි භාෂානුසාරයෙන් දතගැණීමට අනුශාසනය කරණු විනා ඒ පිළිබඳ අන්කිසි අනුශාසනයක් දීම දුෂ්කර වේ. පාලිසංස්කෘත

යන්හි මෙන් විභක්තිරූප සිද්ධිය දුෂ්කර නොවේ. පාලිසංස්කෘත යන්හි මෙන් නොව සිංහලභාෂාව්‍යවහාරයෙහි සියලුවිබත් විෂයෙහි ම ශබ්දයෝ බොහෝසේ ප්‍රකෘතිරූපයෙන් සිටිත්, මේ මෙසේ හෙයින් සිද්ධාන්තසඞ්ග්‍රහකර්තෘපාදයෝ මේ සියල්ල ම සලකා බලා ඊට සුදුසු උපායක් යෙදූහ. උන්වහන්සේ වනාහි අර්ථයාගේ ප්‍රධානභාවය සලකා විභක්ති පිළිබඳ අර්ථනිරූපණය මුල් කොට වහරෙහි බොහෝ පෙණෙන විබත්රූ හඳුන්වා ලීම සඳහා විබතක් විබතක් පාසා ප්‍රත්‍යය රාශිය රාශිය බැගින් දැක්වූහ, එසේම ඒ ඒ විබත් අරුත් හා විබත්රූ හඳුන්වා ලීමට යෝග්‍ය වූ ඡේකප්‍රයෝග වාක්‍යයන් ද ගෙණහැර දැක්වූහ.

තවද සිංහලෙහි පාලිසංස්කෘතව්‍යාකරණයන්හි මෙන් විභක්ත්‍යධිකාරය සපයාලීමේ දුෂ්කරත්වය මෙසේ සලකා ගතයුතුයි. එනම්:–මෙහි නිදසුන් කළ "බළ" ශබ්දයාගේ පෙරවිබත් එකබස රූපය 'ඒ' ප්‍රත්‍යය වීමෙන් "බෙළේ" යි සිද්ධයි, නුමුත් සියලු ශබ්දයන්ගේ ම පෙරවිබත් එකබස රූපය එබඳු ම නොවේ, සියලු අකාරාන්තයන්ගේ හෝ එබඳු ම නොවේ, දෙවෙනි නිදසුන වූ "හර" ශබ්දයේ පෙරවිබත් එකබස රූපය ආ ප්‍රත්‍යය වීමෙන් "හරා" යි සිද්ධයි. එහෙත් "බළ" ශබ්දයෙන් ආ ප්‍රත්‍යය වීමෙන් "බළා" කියා හෝ "හර" ශබ්දයෙන් ඒ ප්‍රත්‍යය වීමෙන් "හෙරේ" කියා හෝ වහර යෙදෙන බැව් නොපෙණේ. පාලියෙහි බොහෝ අකාරාන්ත පුංලිඞ්ගයන්ගේ පෙරවිබත් එක බස "බුද්ධො" යනාදි වශයෙන් ඔකාරාන්ත රූපයෙන් යෙදේ, විශේෂ අකාරාන්ත ශබ්දයන්ගේ භෙද ස්වල්පයෙකි, ඉකාරාන්ත ශබ්ද සියල්ල ම "මුනි" යනාදි වශයෙන් ඉකාරාන්ත රූපයෙන් යෙදේ, මේ ආදි වශයෙන් බොහෝසේ සමව යෙදේ. සංස්කෘතයෙහි සියලුම ස්වරාන්ත පුංලිඞ්ග එකවචන රූපයෝ "දෙවඃ, මුනිඃ, සුධීඃ, භානුඃ" යනාදි වශයෙන් විසර්ගාන්ත රූපයෙන් සිටිත්. සිංහලෙහි විභක්තිරූපයන්ගේ මෙබඳු සමභාවයක් කවර ලෙසකින් වත් නො ලැබේ.

තවද පාලිසංස්කෘතව්‍යාකරණයන්හි විභක්ත්‍යධිකාරයෙහි ලා විභක්තිරූපසිද්ධිය පමණෙක් අනුශිෂ්ටයි, විභක්ත්‍යර්ථනිරූපණය සඳහා "කාරක" යන නමින් අන්‍ය වූ අධිකාරයෙක් පිරිසිඳින ලද්දේ ය. මෙහි විබත් අදියර විභක්ත්‍යර්ථනිරූපණය මුල්කොට කළ බැවින් කාරකය ද මේ විබත්අදියරෙහි ම ඇතුළත් වේ. මෙතැන් පටන් යථොක්ත ලිඞ්ගාර්ථාදිය පිළිබඳ ස්වභාවය ද, ඔවුන් පැවසීමට යෙදී තිබෙන විභක්තිප්‍රත්‍යයයන් ද ඒ ඒ විභක්ති ප්‍රත්‍යයයන් හා අර්ථයන් පැවසීමට යෝග්‍ය වූ ඡේකප්‍රයෝගයන් ද පවසන්නාහු "බජනුයෙ" යනාදිය කීහු.

## 1. පෙරවිබත්සුතුර.

**1. බජනුයෙ පෙරවිබත්-නොවෙසෙසිපදත වුනුවත,**
**එකබසැ ඒ ආ වනුයේ-සල ඕ හු වේ බුහුබස.**

1. භා—කර්මකර්තෘ ආදි අර්ථයක් උක්තවන කල්හි අවිශිෂ්ට පදාර්ථය තෙමේ හෙවත් ලිඞ්ගාර්ථය තෙමේ ප්‍රථමා විභක්තිය භජනය කරන්නේ වේ. ඒ ප්‍රථමාවිභක්තිරූප සිද්ධියෙහි ලා එකවචන විෂයෙහි "ඒ ආ" දෙක ද, බහුවචනයෙහි "ඕ හු" යන දෙක ද විභක්ති ප්‍රත්‍යය වශයෙන් යෙදේ.

**වි**—සියලු නාමශබ්දයෝ ම "ලිඞ්ගාර්ථ කර්මාර්ථ කර්ත්‍රර්ථ කරණාර්ථ සම්ප්‍රදානාර්ථ අවධිඅර්ථ සම්බන්ධාර්ථ ආධාරාර්ථ ආලපනාර්ථ" වශයෙන් නවයට බෙදෙත්. ඒ බෙදීම කරන්නේ "ඒ" ආදි යයි. බෙදෙන්නේ නාමාර්ථ යයි. මේ නවය වනාහි එකවචන බහුවචන වශයෙනු දු දෙකට බෙදේ. එහි-එකක් කීමට ඉවහල් වන්නේ එකවචනයි, බොහොමයක් කීමට ඉවහල් වන්නේ බහුවචනයි. මේ අධිකාරයෙහි මෙසේ නාමාර්ථයන්ගේ බෙදීම කරණ බැවින් මේ අදියර විබත්අදියර යන නමින් ව්‍යවහෘතයි.

ඒ අර්ථ නවය අතුරෙන් කර්මාදි අර්ථ සත වනාහි උක්ත අනුක්ත වශයෙන් දෙකට බෙදේ, උක්ත කර්මාර්ථය අනුක්ත කර්මාර්ථය යනාදි වශයෙනි. එහි යම්කිසි ආඛ්‍යාතක්‍රියාපදයක්හුගේ හෝ අන්‍යාර්ථසමාසපදයක්හුගේ හෝ තද්ධිතපදයක්හුගේ හෝ කෘදන්තපදයක්හුගේ හෝ ශක්තියෙන් කියවෙන කර්මාදි අර්ථයෝ උක්ත නම් වෙත්. "පැසේ" යන්න කර්මාර්ථයෙහි නිපන් අඛ්‍යාතයෙකි, ඒ කර්මාර්ථයෙහි නිපන් බැවින් ඒ ශක්තියෙන් කර්මාර්ථයෙක් කියවේ. එනම්:-ඔදනාදි කිසිවස්තුවෙක් කියවේ. ඒ ක්‍රියාවෙන් කියවෙන කර්මාර්ථය යම් කිසි ලිඞ්ගයක් කෙරෙහි හෙවත් ඒ වස්තුවක් කෙරෙහි පිහිටියේ වේ. ඒ වස්තුවෙහි පිහිටි කර්මාර්ථය වනාහි ඒ ආඛ්‍යාතයෙන් කියවේ, ප්‍රකෘති අර්ථය හෙවත් ලිඞ්ගාර්ථය එයින් නොකියවේ, එබැවින් ඒ පැවසීමට පෙරවිබත යෙදේ. විභක්තියෙන් තොරව අර්ථය ප්‍රකට නොවන බැවිනි. ඒ ලිඞ්ගාර්ථය කර්මාදි අර්ථයෙකින් වෙනස් නො කරණලදබැවින් ඊට අවිශිෂ්ට පදාර්ථ යයි ද කියනුලැබේ.

මෙසේ ම කර්මාර්ථයෙහි නිපන් "එරුණුහස්" යන සමාසපදයෙන් "තලා" යන කර්මාර්ථය ද, කර්මාර්ථයෙහි නිපන් "රුවන්මුවා" යන තද්ධිතපදයෙන් "අබරණ" යනාදි කර්මාර්ථයෙක් ද, කර්මාර්ථයෙහි නිපන් "පැන්" යන කෘදන්තපදයෙන් ජලආදි කර්මාර්ථයෙක් ද කියවේ. ඒ කර්මාර්ථය ද ඒ "තලා" ආදි ලිඞ්ගයන් කෙරෙහි පිහිටියේ

වේ. ඒ ලිඞ්ගාර්ථ සඞ්ඛ්‍යාත ප්‍රකෘත්‍යර්ථය පැවසීමට ඒ "කලා" ආදි ලිඞ්ගයන් කෙරෙන් පෙරවිබත යෙදේ. කර්තෘඅර්ථාදීන්ගේ උක්තභාවය ද මෙලෙසින් දතයුතුයි. ආලපනාර්ථය ද ලිඞ්ගාර්ථ විශෙෂයෙකි.

අනුක්ත කර්මාර්ථාදිය වනාහි කර්මවිභක්ත්‍යාදි විභක්තිශක්ති යෙන් පැවසේ, ඒ අනුක්තකර්මාර්ථාදිය ලිඞ්ගාර්ථයෙන් විශිෂ්ට බැවින් හෙවත් ලිඞ්ගාර්ථය වෙනස් විමෙන් ඇතිවූ බැවින් විශිෂ්ටාර්ථ යයි කිය යුතු වේ. "මිනිහා බත පිසයි" කි කල්හි "පිසයි" යන ක්‍රියාව කර්තෲර්ථ බැවින් ඉන් මිනිහා යන කර්තෘ කියවේ. "බත" යනු කර්මයි, ඒ විභක්තිබලයෙන් පැවසේ. "පිසයි" යන ක්‍රියාවෙන් නොකියවේ, එබැවින් ඒ අනුක්තයි, එහි ඒ අනුක්තකර්මාර්ථය පැවසීමට කර්මවිබත් පස යෙදුනේ වේ.

තවද මේ පෙරවිබත පිළිබඳ මත දෙකෙකි, ඇතැම් ආචාර්ය්‍ය වරයෝ ලිඞ්ගාර්ථ ආලපනාර්ථ උක්තාර්ථ යන තුණෙහි පෙරවිබත වේ යයි ද, ඇතැම් ආචාර්ය්‍යවරයෝ ලිඞ්ගාර්ථයෙහි හා ආලපනාර්ථ යෙහි පමණක් වේයයි ද කියත්. ලිඞ්ගාර්ථයෙහි පෙරවිබත වන්නේ උක්ත තන්හි ය යනු ඔවුන්ගේ මත යයි, මෙහි කී මත දෙකෙන් මුග්ධබොධාචාර්ය්‍ය මතය ද පූර්වමත යයි, බාලාවතාරාදියෙහි මතය අපර මතයයි. පූර්වමතයෙහි සිටින්නෝ ක්‍රියාරහිත ව ද පෙර විබත යෙදේ යයි කියන්නාහු වෙත්, අපර මතිකයෝ ක්‍රියාරහිත වූ වාක්‍යයෙක් නැතැයි කියන්නෝ වෙත්. විමසිය යුතුයි. මේ පෙර විබත් රූපය පැවසීමට ජෙත්‍රප්‍රයොග වාක්‍යයන් නිදර්ශනය කරන්නාහු "බෙළේ" යනාදිය කීහු.

a. ඒ-සබෙළේ බලාම් කොරේ. ආ-හරා අරා කොලෙස් කුළු.
ඕ-බමණෝ කුලදම් රකිත්. ශු-නවසරශු දම් දෙසත්.

b. නිදැළියෝ පෙහෙසුන් නොපලත්, පඬුවෝ දැනුම් වඩත්. මෙ ඇඟි විබනට පෙර වැ යවගම් රූයි.

c. පුමඟුනිරිලිගු දෙක පුටත් අරුත් විසඝන්හි නෙමෙ නොමො තුමූ යනු රූයි.

**ඉති පෙරවිබත්.**

---

a. හා—මෙහි "කොරේ, අරා" යන ආඛ්‍යාතක්‍රියා දෙක කර්තෘ අර්ථ එකවචන බැවින් එයින් එකවචන වූ කර්තෘ අර්ථයෙක් උක්ත වේ. මෙහි ඒ කර්තෘ අර්ථය "බළු, හර" යන ලිඞ්ගයන්හි පිහිටි බැවින් ඒ ලිඞ්ගාර්ථය පැවසීමට ඉන් පරව "ඒ ආ" දෙක යෙදීමෙන්

"බෙළේ, හරු" යි සිඬියි. එහි වූ "බලාම්, කොලෙස්කුළු" යන කම් දෙක කිසිවෙකින් උක්ත නොවේ. එබැවින් ඒ දෙක අනුක්ත කම්යි. ඒ දෙක කම්විබත් ඇසුරු කළ ප්‍රකෘතිරූපයි. "රකිත්, තෙපලත්" යන දෙක කර්තෘ අර්‍ථ බහුවචන ආඛ්‍යාතයි. එයින් උක්ත වූ කර්තෘ අර්‍ථය "බමණ, තවසර" යන ලිඟයන්හි පිහිටි බැවින් ඔවුන්ගේ ලිඟාර්‍ථය බහුවචන වශයෙන් පැවසීමට "ඕ, හු" යන දෙක යෙදීමෙන් "බමණෝ, තවසරහු" යි සිඬයි. එහි සිටි "කුලදම්, දම්" යන කම්දෙක කිසිවෙකින් උක්ත නොවේ. ඒ දෙක ද කම් විබත් ඇසුරු කළ ප්‍රකෘති රූපයි. හට තෙමේ හට කර්‍මය කෙරේ, ඊශ්වරතෙමේ කෛලාස පර්‍වතයට නගී, බ්‍රාහ්ම ණයෝ කුලධර්‍මය රකිත්, තපස්වරයෝ ධර්‍මය කියත්, යනු පිළි වෙළින් ඒ වාක්‍ය සතරෙහි අර්‍ථයි.

b. භා—"නිදැළියෝ, පඬුවෝ" යන දෙතන්හි "නිදැළි-ඕ, පඬු-ඕ" කියා සිටි කල්හි විභක්තිස්වරයෙන් පූර්‍වයෙහි යකාර වකාරාගම වීමෙන් "නිදැළියෝ, පඬුවෝ" යි සිඬයි. නිර්ලජ්ජිකයෝ කෝලාම් කියත්, පණ්ඩිතයෝ ඥානය වඩත් යනු එහි අර්‍ථයි. මේ නිදේශයෙන් ඉවර්‍ණ උවර්‍ණාන්ත ශබ්දයන් කෙරෙන් විභක්ති ස්වර සිටි තන්හි යකාර වකාරාගම වන බැව් සූචිතයි, විභක්ති ස්වර පරකල්හි යකාර වකාරාගම විධිය ඉකාරාන්තයන් කෙරෙන් පමණක් නොව අකාරාන්තාදියෙන් ද වේ. ඒ අගම් විදිය හැඳින් වීමෙහි ලා නිර්දිෂ්ටයි. ඒ එයින් හා භාෂානුසාරයෙන් ද දත යුතුයි.

ඉකාරඋකාරාන්ත ශබ්දයන් කෙරෙන් විභක්ති ස්වර යෙදෙන තන්හි බොහෝ සෙයින් යකාර වකාරාගම විධියෙන් හා ද්විත්වවිධි යෙන් ද, ඇතැම් තන්හි පූර්‍වස්වරලොපවිධියෙන් ද විභක්තිරූප සිඬ වන බැව් වහරෙහි පෙණේ.

| <u>ප්‍ර: එකවචන.</u> | <u>ප්‍ර: බහුවචන.</u> |
|---|---|
| කොටි –ආ=කොටියා | කොටි– ඕ=කොටියෝ |
| වැදි– ආ=වැද්දා | වැදි– ඕ=වැද්දෝ |
| කුදිටි– ආ=කුදිටා | කුදිටි– ඕ=කුදිටෝ |
| වටු– ආ=වටුවා | වටු– ඕ=වටුවෝ |
| බලු– ආ=බල්ලා | බලු ඕ=පල්ලෝ |
| වඳුරු– ආ=වඳුරා | වඳුරු– ඕ=වඳුරෝ. |

අප්‍රාණිවාචක වූ මෙබඳු ශබ්දයන්ගේ පෙරවිබත් එක බසෙහි 'අ' ප්‍රත්‍යය වීමෙන් මෙසේ යකාරාගමාදිය වන බැව් ද බහුබසෙහි ශබ්දප්‍රකෘතියෙන් සිටින බැව් ද පෙණේ.

| **එක.** | **බහු.** |
| --- | --- |
| රොටි-අ=රෝටිය | රොටි |
| මැටි- අ=මැටිට | මැටි |
| මිණි- අ=මිණ | මිණි |
| පුටු- අ=පුටුව | පුටු |
| බටු- අ=බට්ට | බටු |
| පිටු- අ=පිට | පිටු. |

මෙපමණක් නොව සිංහල ශබ්දයන්ගේ විභක්තිරූප පළිබඳ තවත් නානාවිධභෙදයෝ වෙත්, ඒ භෙද ව්‍යවහාරයෙන් මුත් අනුශාසන විධියෙකින් පවසාලීම අතිදුෂ්කර වේ. අසවල් ශබ්දයේ අසවල් විභක්තිරූපය මෙසේ බැවින් මේ ශබ්දයේ ද ඒ විභක්තිරූපය මෙසේ වියයුතු යයි ව්‍යවහාර කළහොත් භාෂා විපරීතයෙක් වේ, විශෙෂවශයෙන් කාලානුරූප ව්‍යවහාරය ද සැලකිය යුතුයි.

පෙරවිබත් එකබසෙහි ද 'අ' ප්‍රත්‍යය වහරෙහි බොහෝ ප්‍රක ටයි, මෙහි කි "රොටිය" යනාදි පදවලින් ද ඒ දතයුතුයි. ඇතැම් ප්‍රයොගයන්හි "මහසතු" යනාදි වශයෙන් 'උ' ප්‍රත්‍යයාන්ත පෙර විබත් එකබස ද දක්නා ලැබේ, කවර භාෂාවන්හි වුවත් අතරතුර එබඳු අනියම්විදි ඇත්තේ වේ, එහෙත් එබදු යෙදුම් බහුල ව්‍යව හාරයට ගැණිම උචිත නොවේ. පෙරවිබත් බුහුබස් වශයෙන් පෙණෙන "න, අන්, උන්" ප්‍රත්‍යයාන්තයෝ ද එසේයි පෙර විබත් බුහුබසෙහි හලන්ත ශබ්දයන් කෙරෙන් 'හු' යන විබත්පස යෙදෙන බොහෝ තන්හි පූර්වරූප විධියෙන් පදසිඩිය වේ."කොක්- හු=කොක්කු, පුත්-හු=පුත්තු" ආදි වශයෙනි. ඇතැම් තන්හි පෙරවිබත් බුහුබසෙහි 'උ' ප්‍රත්‍යයය ද දක්නා ලැබේ. "සිටුවර- උ=සිටුවරු, සමහර-උ=සමහරු" ආදි වශයෙනි. ඇතැම් තන්හි ප්‍රාණිවාචකයන්ගේ බහුවචන විෂයෙහි "ලා" යන්න ද, අප්‍රාණි වාචකයන්ගේ බහුවචන විෂයෙහි 'වල්' යන්න ද යෙදේ. "ඔබවහන්සේලා, ඒ තැනලා, මහත්මයාලා; ගෙවල්, දොරවල්, පාරවල්" ආදි වශයෙනි. මේ "ලා, වල්" යන දෙක බහුවච නාර්ථද්‍යොතක ප්‍රත්‍යය විශෙෂ වියයුතුයි.

c. **භා**—පෙරවිබතෙහි අරුත් පවසන කල්හි පුංලිඞ්ග එක වචනයෙහි "තෙමෙ" යන්න ද,ස්ත්‍රීලිඞ්ග එකවචනයෙහි "තොමො" යන්න ද දෙක්හි ම බහුවචන විෂයෙහි "තුමූ" යන්න ද යෙදේ. "පුරුෂතෙමෙ, ස්ත්‍රීතොමො, පුරුෂයෝතුමූ ස්ත්‍රීහුතුමූ" යනාදි වශයෙනි. "තෙමෙ, තොමො" යන දෙක "තෙමේ, තොමෝ" කියා ද වේ. "තෙමෙ" යනාදිය 'තම' ශබ්දයෙන් වූ පදරූප විය

යුතුයි. "තම" ශබ්දය සංස්කෘත "ආත්මන්" ශබ්දයෙන් හෝ තත්පර්යාය පාළි "තුම ආතුම" ශබ්දයෙකින් හෝ බිඳුන පියවියක් වියයුතුයි. "ආත්මන්" ශබ්දයට සිංහලෙන් අරුත් කියන කල්හි 'තෙමේ" යනාදි වශයෙන් වහර යෙදීමෙන් ඒ සපුට වේ. "ආත්මන්" ශබ්දාදිය ස්වරූපාර්ථයෙහි ද වැටේ. එබැවින් "තෙමේ" යනාදියෙනු දු ලිඞ්ගාර්ථය ප්‍රකට වේ. "හටතෙමේ" යන්නෙහි අර්ථය හටස්වරූපය යනුයි. ඒ ලිඞ්ගාර්ථ යයි. මෙසේ පෙර විබත නිදසුන් සහිත කොට දක්වා පිළිවෙළින් කම්විබත් ආදිය පවසන්නාහු "යුතුකතුකිරිය හා" යනාදිය කිහු.

**ප්‍රථමා විභක්තිය නිමි.**

---

2. කම්විබත් සුතුර.

**2. යුතු කතු කිරිය හා-පදරුත් බෙළේ කම් නම්,**
**එකතැ අ උ ආ හු ට-උන් නා නන් නටන් බුහුබස.**

2. **හා**—ක්‍රියාව කරන්නා කර්තෘයි, ඔහුගේ ක්‍රියාව හා යුක්ත වූ පදය කර්ම නම් වේ. එහි එකවචන විෂයෙහි "අ උ ආ හු ට" යන පස ද, බහුවචන විෂයෙහි "උන් න ආන න් නට අන්" යන සය ද යෙදේ.

**වි**—මෙහි පළමුවන පෙදෙන් කර්මාර්ථයෙහි තත්ත්වය ද, දෙවන පෙදෙන් තත්කර්මාර්ථ ප්‍රකාශක විභක්තිප්‍රත්‍යය ද සූචිතයි. කර්මාර්ථයාගේ තත්ත්වය පවසන්නා වූ පාලිසංස්කෘතවෛයාකරණයෝ ඔවුනොවුන්ගේ ඒ ඒ මත පැවසූහ.

1 කච්චායන මතය-"යං කරොති තං කම්මං"
2 මොග්ගල්ලායන ,, -"කත්තුක්‍රියාභිසම්බන්ධං කාරකං කම්මමුච්‍යතෙ"
3 පාණිනිය ,, -"කර්තුරීප්සිතතමං කර්ම"

1. මතය-කර්තෘතෙමේ යමක් කෙරේ නම් ඒ කර්මය වේ යනුයි. ක්‍රියාර්ථය ලබන පදය කර්මය වේ යනු එහි අදහසයි. 2. මතය-කර්තෘහුගේ ක්‍රියාව හා විශෙෂයෙන් සම්බන්ධ වූ පදය කර්මය වේ යනුයි. 3. මතය-කර්තෘහට අතිශයින් අභිමත වූ පදය කර්ම නම් වේ යනුයි. සිදත්සඟරා මතය ද මොග්ගල්ලායන මතය හා සම වේ. මොග්ගල්ලායන මතයෙහි අන්වර්ථතාව ඉතා ප්‍රකට ව පෙණෙන බැවිනුත් ඒ අර්ථය සියලු කර්මභෙදයන්ට සාධාරණ බැවිනුත් ඒ ශ්‍රෙෂ්ඨ කොට සැලකිය යුතුයි. සෙසු කාරක සියල්ල ම කර්තෘගේ

**යාව හා යුක්ත වේ බැයි. එහෙත් කර්මකාරකයාගේ වනාහි**

අවශෙෂ කාරකයන්ට වඩා ක්‍රියාව හා විශෙෂසම්බන්ධයෙක් ඇත්තේ වේ. "මිනිහා ගින්නෙන් සැලියෙහි බත පිසයි" යන තන්හි "මිනිහා" යනු කර්තෘයි. "පිසයි" යනු ක්‍රියායි. "ගින්නෙන්" යනු කරණ කාරකයි. "සැලියෙහි" යනු ආධාර කාරකයි. මේ කාරක තුණම කර්තෘගේ ක්‍රියාව හා හෙවත් පිසීම හා යුක්ත වේ. එහෙත් මේ තුණෙන් කර්මකාරකය වූ බත පිසීම හා විශෙෂයෙන් යුක්ත වූයේ වේ. පිසීම් සඞ්ඛ්‍යාත වූ ධාත්වර්ථය ගින්න කෙරෙහි ද සැලිය කෙරෙහි ද නොව බත කෙරෙහි විද්‍යමාන බැවිනි. මේ කර්මපදාර්ථය විස්තර කරන්නා වූ භර්තෘහරින් විසින්:-

"යදසජ්ජායතෙ සද්වා ජන්මනා යත් ප්‍රකාශතෙ,
තන්නිර්වර්ත්‍යං විකාර්‍ය්‍යඤ්ච කර්ම ද්වෙධා ව්‍යවස්ථිතම්.
ප්‍රකෘත්‍යුච්ඡෙදසම්භූතං කිඤ්චිත් කාෂ්ඨාදි භස්මවත්,
කිඤ්චිත් ගුණාන්තරොත්පත්ත්‍යා සුවර්ණාදි විකාරවත්,
ක්‍රියාකෘතවිශෙෂාණාං සිද්ධිර්‍යත්‍ර න විද්‍යතෙ.
දර්ශනාදනුමානාද්වා තත් ප්‍රාප්‍යමිහ කථ්‍යතෙ."

යන මේ නිර්දේශයෙන් කර්ම තුණෙක් නිර්දිෂ්ටයි. එනම්:-නිර්වර්ත්‍ය කර්මය, විකාර්‍ය්‍ය කර්මය, ප්‍රාප්‍ය කර්මය" කියායි. එහි-අවිද්‍යමාන වූ යමෙක් ක්‍රියාවෙන් උපදී නම් ඒ නිර්වර්ත්‍ය කර්මයි. "ගෙය කෙරේ, පුතෙකු වදයි" යනාදි වශයෙනි. මෙහි "කෙරේ, වදයි" යන ක්‍රියාවයෙන් අවිද්‍යමාන වස්තු දෙකක්හුගේ විද්‍යමානත්වය සූචිතයි. ඒ ක්‍රියාවවෙන් පෙර එහි ඒ වස්තු අවිද්‍යමානයි. එබැවින් ඒ දෙක නිර්වර්ත්‍යකර්ම යි. විද්‍යමාන වූ යමෙක් ක්‍රියොත්පත්තියෙන් ප්‍රකාශ වේ නම් හෙවත් වෙනස් ව පෙණේ නම් ඒ විකාර්‍ය්‍ය කර්ම යි. ඒ විකාර්‍ය්‍ය කර්මය දෙපරිදි වේ, විද්‍යමාන වූ ප්‍රකෘතිවස්තුවක් සුන් විමෙන් යමෙක් හට ගණී නම් ඒ එක් විකාර්‍ය්‍යයෙකි. "ලිය හලු කෙරේ" යනාදි වශයෙනි. මෙහි ලි සඞ්ඛ්‍යාත වූ ප්‍රකෘතිය සුන් විමෙන් හලු සඞ්ඛ්‍යාත වූ විකාරයක් උපන් බැවින් 'හලු' යනු විකාර්‍ය්‍ය කර්මයි. යමක් කෙරෙහි අන්‍යගුණයක් ඉපැත්මෙන් විශිෂ්ට වස්තුවෙක් උපදී නම් ඒ එක් විකාර්‍ය්‍යයෙකි. "රන් කැබැල්ල කුණ්ඩලාභරණයක් කෙරේ" යනාදි වශයෙනි. මෙහි රන්කැබැල්ල කෙරෙහි ගුණ විශෙෂයක් ඉපදීමෙන් කුණ්ඩලාභරණ සඞ්ඛ්‍යාත විශිෂ්ට වස්තුවක් උපන් බැවින් "කුණ්ඩලාභරණ" යන්න විකාර්‍ය්‍ය කර්මයි. ක්‍රියාවෙන් කරණලද විශෙෂ සිද්ධියක් දැනීමෙන් හෝ අනුමානයෙන් යම් කර්මයක් කෙරෙහි නොපෙණේ නම් ඒ ප්‍රාප්‍යකර්ම නම් වේ. "පොත බලයි, ගමට යයි" ආදි වශයෙනි. මෙහි "පොත-ගම" යන දෙක "බැලීම-යාම" යන ක්‍රියාර්ථ දෙක හා යුක්ත වුව ද ක්‍රියා

වෙන් වූ විශෙෂ සිද්ධියක් ඒ දෙක්හි නොපෙණෙන බැවින් ඒ දෙක ප්‍රාප්‍යකර්මයි, සාමාන්‍යයෙන් නිර්වර්ත්‍ය විකාර්‍ය දෙකෙන් තොර සියලු ම කර්ම ප්‍රාප්‍යකර්ම යයි දතයුතුයි.

මේ හැර තවත් මේ කර්මපදාර්ථය- ඊප්සිත අනීප්සිත උදාසීන වශයෙනුදු තුණට බෙදේ. එහි කර්තෘගේ ඊප්සාව සමග පවත්නා ක්‍රියාවෙන් යුක්ත වූයේ ඊප්සිත නම් ද, ද්වෙෂය සමග පවත්නා ක්‍රියාවෙන් යුක්ත වූයේ අනීප්සිත නම් ද, ඒ දෙගතියෙන් තොර වූ හෙවත් මධ්‍යස්ථ වූ ක්‍රියාවෙන් යුක්ත වූයේ උදාසීන නම් ද වේ. "බත් කයි, විස කයි, ගමට යමින් තණ පාගයි" යන තුණ පිළිවෙළින් ඊට උදාහරණයි. මෙහි බත් කෑම ඊප්සාසහගත බැවින් "බත්" යන්න ඊප්සිත කර්මයි. විස කෑම ද්වෙෂසහගත බැවින් "විස" යන්න අනීප්සිත කර්මයි. ගමට යන්නහුගේ තණ පෑගීම ඊප්සිත අනීප්සිත දෙකෙන් ම තොර බැවින් 'තණ' යන්න උදාසීන කර්මයි. තවත් පාලිසංස්කෘත ව්‍යවහාරයෙහි අකථිත යයි කර්ම භෙදයක් ඇතත් සිංහල භාෂාව්‍යවහාරයෙහි ඒ නොයෙදේ. ඒ කර්මය වනාහි ද්විකර්මක ධාතුවිෂයෙහි යෙදෙන කර්ම දෙකෙන් එකෙකි හේ පාලියෙහි "ගොපාලො ගාවිං ඛීරං දොහති" යනාදි වශයෙන් නිර්දිෂ්ටයි. මේ වාක්‍යයෙහි "ගාවිං, ඛීරං" යන දෙකම කර්මයි; එහි "ගාවිං" යන්න අකථිත කර්මයි. සිංහල ව්‍යවහාරයෙහි "දෙනගෙන් කිරි දෙවී" කියා වේ. එකල්හි "කිරි" යන්න පමණෙක් කර්ම වේ. "ගාවිං" යන්න වෙනුවට වූ "දෙනගෙන්" යන්න අවධියි.

කර්මපදාර්ථයට නිදසුන් දක්වන්නාහු "රජ දම්නියෙන්" යනාදිය කීහු.

**a. 1. අ-රජ දම්නියෙන් මිය පුස්නෝ. 2. උ-සිදුහත් කුමරු සුදවැසියෝ පලමු පිළිගත්හු. 3. ආ-රවුලා මැරී රම්රජ. 4. හු-සුරගු රෙණෙහි විමසනු, 5. ට-රජගෙට පිවිසි මැති ගෙණෙ.**

**b 1. උන්-මහණුන් නමදනෝ. 2 න-පිළිමල්න දනක්නැ. 3, ආන-නරඹන්නැ මොනරන නස්නා. 4, න්-දතන් මහලු පා දෙළේ සොඳ වැඩ්රච් සරුපා. 5, නට-රුක්නට නැගෙත් සාමුවෝ. 6, අන්-දරුවන් බලන්නහු ල සැනගේ.**

c. **"සේනන් බුහුම නස්නේ" ඈ හුණා බැවින් නක්විබතින් සිදුපා.**

a. භා—එකබස-1. වාක්‍යයෙහි "රජ" යනු කතෘයි. "පුස්නේ" යනු ක්‍රියායි. ඒ හා යුක්තවූයේ මියයි. එබැවින් එහි "මි" ශබ්දය කෙරෙන් කර්මාර්ථප්‍රකාශක එකවචන "අ" ප්‍රත්‍යය යි. යකාරාගම විධියෙන් "මිය" යි සිඩයි. මේ ප්‍රාප්‍යකර්මයි. රජතෙමේ ධර්මනීති යෙන් පොළොව රක්නේය යනු වාක්‍යාර්ථයි.

2. වාක්‍යයෙහි "සුදවැසියෝ" යනු කතෘයි. "පිළිගත්හු" යනු ක්‍රියායි. ඒ හා යුක්තවූයේ සිදුහත් කුමරයි, එබැවින් එහි "සිදුහත්කුමර" ශබ්දයා කෙරෙන් 'උ' ප්‍රත්‍යය යි, පූර්වස්වරලොප යෙන් "සිදුහත්කුමරු" යි සිඩයි. මේ ද ප්‍රාප්‍යකර්මයි. ශුඩාවාසික දෙවියෝ සිඞාර්ථකුමාරයන් පළමු කොට පිළිගත්හ යනු වාක්‍යාර්ථයි.

3. වාක්‍යයෙහි "රම්රජ" යනු කතෘයි, "මැරි" යනු ක්‍රියායි. ඒ හා යුක්තවූයේ රවුළායි. එබැවින් එහි "රවුල්" ශබ්දයා කෙරෙන් "ආ" ප්‍රත්‍යය යි. ස්වරසන්ධිවිධියෙන් "රවුළා" යි සිඩයි. මේ විකාර්‍ය්‍ය කර්මයි. රාමරාජ තෙමේ රාවණයා මැරිය, යනු වාක්‍යාර්ථයි.

4. වාක්‍යයෙහි "විමසනු" යනු ක්‍රියායි; ඒ හා යුක්තවූයේ සුරයි. එබැවින් "සුර" ශබ්දයා කෙරෙන් "හු" ප්‍රත්‍යය යි. මේ ද ප්‍රාප්‍ය කර්මයි. යුඩයෙහි දී ශූරයා විමංසනය කරණු යනු වාක්‍යාර්ථයි.

5. වාක්‍යයෙහි "මැතිගෙණේ" යනු කතෘයි, "පිවිසී" යනු ක්‍රියායි. ඒ හා යුක්තවූයේ රජගෙ යයි, එබැවින් "රජගේ" ශබ්ද යෙන් පරව "ට" ප්‍රත්‍යය යි. ශබ්දාන්තයෙහි මාත්‍රාහානිය වීමෙන් "රජගෙට" යි සිඩයි, ප්‍රාප්‍යකර්ම යි, මන්ත්‍රිසමූහ තෙමේ රාජගෘහ යට පිවිසියේය යනු වාක්‍යාර්ථයි.

b. භා—බුහුබස-1. වාක්‍යයෙහි "නමදනේ" යනු ක්‍රියායි, ඒ හා යුක්තවූයේ "මහණුන්" යනුයි. "මහණ" ශබ්දයෙන් පරව "උන්" ප්‍රත්‍යය යි. ප්‍රාප්‍ය කර්මයි. ශ්‍රමණයන් වඳනේය යනු වාක්‍යාර්ථයි.

2. වාක්‍යයෙහි "දනන්නැ" යනු ක්‍රියායි. ඒ හා යුක්තවූයේ "පිළිමල්න" යනුයි. "පිළිමල්" ශබ්දයෙන් පරව "න" ප්‍රත්‍යය යි. විකාර්‍ය්‍ය කර්මයි. විරුඩව පොරට එන්නවුන් ජයගන්නැ යනු වාක්‍යාර්ථයි.

3. වාක්‍යයෙහි "නරඹන්නැ" යනු ක්‍රියායි. ඒ හා යුක්තවූයේ "මොනරුන" යනු යි. "මොනර" ශබ්දයෙන් පරව "ආන" ප්‍රත්‍ය යයි. ප්‍රාප්‍යකර්මයි. නටන්නා වූ මයූරයන් නිරීක්ෂණය කරන්නැ යනු වාක්‍යාර්ථයි.

4. වාක්‍යයෙහි "යොද" යනු ක්‍රියායි. ඒ හා යුක්තවූයේ "දනන්" යනු යි. "දන" ශබ්දයා කෙරෙන් "න්" ප්‍රත්‍යය යි. ප්‍රාප්‍ය කර්‍ම යි. වෘඬබාලජනයන් වැය හා දූලිපිහිය මෙන් (තමතමන්ට) සුදුසු ධුරයෙහි යුක්ත කරව්. යනු වාක්‍යාර්‍ථයි. (මහලු අය වැය මෙන් දැඩි වූ කර්‍මව්‍යහාරයෙහි ද, බාලජනයා දූලිපිහිය මෙන් සියුම් වූ කර්‍මව්‍යහාරයෙහි ද යොදව්.)

5. වාක්‍යයෙහි "නැගෙත්" යනු ක්‍රියායි. ඒ හා යුක්තවූයේ "රුක්නට" යනු යි. "රුක්" ශබ්දයා කෙරෙන් "නට" ප්‍රත්‍ය යයි. ප්‍රාප්‍යකර්‍මයි. ශාඛාමෘගයෝ වෘක්‍ෂයන්ට නැගෙත් යනු වාක්‍යාර්‍ථයි.

6. වාක්‍යයෙහි "බලන්නහු" යනු අර්‍ථක්‍රියායි. ඒ හා යුක්තවූයේ "දරුවන්" යනුයි. "දරු" ශබ්දයා කෙරෙන් "අන්" ප්‍රත්‍යය හා වකාරාගමයි. ප්‍රාප්‍යකර්‍මයි. දරුවන් බලන්නහුගේ සිත සැනසේ යනු වාක්‍යාර්‍ථයි.

ෆ. හා—"සේනන් බුහුමනන්නේ" යන වාක්‍යයෙහි "බුහු මනන්නේ" යනු ක්‍රියායි, ඒ හා යුක්තවූ පදය "සේනන්" යනුයි. එහි ශබ්දප්‍රකෘතිය "සේ" යනුයි, එබැවින් ඉන් පරවූයේ "නන්" ප්‍රත්‍යය යි. එහෙත් සූත්‍රයෙහි "අ" ආදිවශයෙන් විබත්පස එකොළොසෙක් පිරිසිඳින ලද්දේය. ඒ පිරිසිඳීමෙහි ලා "නන්" යන්නෙක් නැත්තේ වේ. ඒ වනාහි ශ්‍රූයමාණ භාවයෙන් ගතයුතු බැව් ග්‍රන්‍ථකර්‍තෘපාදයෝ කීහු. ඇතැම් තන්හි ශ්‍රූයමාණභාව යෙන් ප්‍රත්‍යයාදිය ගතයුතු ලෙස සූත්‍ර හැදෑරීම සූත්‍රකාරයන්ගේ එක් ක්‍රමයෙකි. ඒ ක්‍රමය පැවැත්තේ බොහෝ සෙයින් නොව ස්වල්ප වශයෙනි. භාෂාවෙහි පෙණෙන ඇතැම් පදයන් ඒ විදි යෙන් වහරට ගැණීම පිණිසයි. පාළියෙහි "ගුණාදිතො වන්තු" යනා දිවශයෙන් "ගුණාදිතො" යි "තො" ප්‍රත්‍යයාන්ත පවම්යෙන් සූත්‍ර කීපයක් හදුරා "සත්‍යාදීහිමන්තු" යි සූත්‍රයෙක් හදුරණ ලද්දේය. මේ සූත්‍රය හදුරණ ලද්දේ "මන්තු" ප්‍රත්‍යය විධානය පිණිසයි. එහෙත් එහි හකාරසථ ඉකාරය සමග ශ්‍රූයමාණ භාවයෙන් "ඉමන්ත" ප්‍රත්‍යයය ද ගණු ලැබේ. එහි "මන්තු" ප්‍රත්‍යයයෙන් සිඩ වූ පද "සතිමන්තු" යනාදි යයි. "පුත්තිමන්තු" යනාදිය "ඉමන්තු" ප්‍රත්‍යයයෙන් සිඩයි.

මෙසේ කර්‍මවිභක්ති රූපයන් ප්‍රත්‍යය වශයෙන් නිර්‍දේශ කොට නැවත විශෙෂාර්‍ථ වශයෙන් යෙදෙන කර්‍මවිභක්ති රූපයන් දක්වන්නාහු "තිලෝගුරු" යනාදිය කීහු.

b **1. තිලෝගුරු තෙමස් මුරුනට අබිදම් දෙසී, මෙ ඇ අසත්යෝගි ද, 2. දෙව්දත් මවට වැනවි. ඈ ඉතිබූ අරුත්හි ද, 3. ඉසිවතුන් විනා මෙගත් සාහට නොරිසි ද, මෙ ඇ විනා යෝගි ද, කම් විබත් රුයි, 4. "එලබෑ බුදුන් සාරා" යි මෙ ඈගි මෙවත් අරුත් සදින් වේ.**

**ඉති කම් විබත්.**

---

b. **හා**—"තිලෝගුරු තෙමස් මුරුනට අබිදම් දෙසී" යන වාක්‍යයෙහි "තෙමස්" යන්න අත්‍යන්තසංයොගයෙහි කර්මයි. කාල වාචක ශබ්දයක් හෝ මාර්ගවාචක ශබ්දයක් හෝ ක්‍රියා ගුණ ද්‍රව්‍ය යන් සමග නිරන්තරව යෙදෙන තන්හි ඒ කාලවාචක මාර්ගවාචක ශබ්දයෝ කර්ම විභක්තිය භජනය කෙරෙත්. මෙහි "තෙමස්" යන්න කාලවාචක වේ. ඒ වනාහි "දෙසී" යන ක්‍රියාව හා නිරන්තර භාවයෙන් යුක්ත බැවින් අත්‍යන්තසංයොග කර්මයි. අත්‍යන්තසංයොග කර්මයට අර්ථව්‍යාඛ්‍යානය කරණ කල්හි ශබ්දාර්ථ යෙන් පරකොට "මුලුල්ලෙහි" යන්න යෙදීම සිංහල ව්‍යවහාර යයි. ත්‍රෛලොක්‍යාචාර්ය්‍ය වූ බුදුරජානන් වහන්සේ තුන්මසක් මුලුල් ලෙහි දෙවියන්ට අභිධර්ම්ය දෙසීය යනු වාක්‍යයෙහි අර්ථයි. අතර නො හැර පුරා තුන්මසක් අභිධර්මදෙශනාව පැවති බැව් මෙයින් සූචිතයි. අත්‍යන්තසංයොග නොවන තන්හි කර්මය නොව "තෙම සෙහි" යනාදි වශයෙන් ආධාරය යෙදේ. බුදුරජානන් වහන්සේ භොජනාදියෙන් තොර ව තෙමසක් දම්දෙසුවේ කෙලෙස දැයි සිතිය යුතු වේ. භොජනාදි අවස්ථාවන්හි නිර්ම්මිත බුද්ධ රූපයක් දම් දෙසූ බැවින් තත්ක්‍රියාව නිරතුරුව සිඬයි.

**වි**—මෙකී අත්‍යන්තසංයොගයෙහි යෙදෙන කාලවාචක ශබ්ද නම්:-කාලප්‍රමාණයක් පවසන්නා වූ ක්‍ෂණමුහුර්තාදි යයි. මාර්ග වාචක ශබ්ද නම්:-මාර්ගප්‍රමාණයක් පවසන්නා වූ ක්‍රොශ ගාවුතාදි යයි. ඒ කාලවාචක ශබ්ද හා මාර්ගවාචක ශබ්ද ක්‍රියා ගුණ ද්‍රව්‍ය යන් සමග අත්‍යන්තසංයොග වන්නා වූ පරිදි හා එහි කර්මය යෙදෙන පරිදි මෙසේ දතයුතුයි.

**<u>කාලවාචකශබ්ද.</u>**

ක්‍රියාඅත්‍යන්තසංයොග-ලමයා **පැයක්** නිදාගත්තේය.
ගුණ ,, -එදා **දසපැයක්** සඳ සිත්කලුයි.
ද්‍රව්‍ය ,, -**මසක්** මස් සහිත බතයි.

## මාර්ගවාචකශබ්ද.

ක්‍රියාඅත්‍යන්තසංයෝග-මිනිහා **ගව්වක්** දිවීය.
ගුණ „ „ -නදිය **යොදුනක්** ගැඹුරැයි.
ද්‍රව්‍ය „ „ -ඒ පර්වතය **බඹසියයක්** ගල් සහිතයි.

මෙහි 'පැය' තිදුගැණීම් ක්‍රියාව සමග ද, 'දසපැය' සිත්කලු යන ගුණය සමග ද, 'මස' බත යන ද්‍රව්‍යය සමග ද, 'ගව්ව' දිවීම් ක්‍රියාව සමග ද, 'යොදුන' ගැඹුරු ගුණය සමග ද, 'බඹසියය' ගල් යන ද්‍රව්‍යය සමග ද නිරන්තර සංයෝග බැවින් අත්‍යන්තසංයෝග කර්මයි.

**2. භා**—"දෙව්දත් මවට මැනවි" යන තන්හි "මවට" යනු ඉත්ථම්භාවාර්ථයෙහි කර්මයි. "කස්‍යචිත් ප්‍රකාරස්‍යාපත්තිරිත්ථම්භාවඃ" යනු හෙයින් කිසිත් ප්‍රකාරයකට පැමිණීම ඉත්ථම්භාව යයි කියනුලැබේ. දෙව්දත්හු මව කෙරෙහි නොමනා අයුරකින් සිට මනා අයුරකට පැමිණි බැවි මේ වාක්‍යයෙන් ප්‍රකාශිතයි, එබැවින් ඒ පැමිණීම ලැබූ මවු "මවට" යි කර්මරූපයෙන් සිටියේ වේ. මෙහි විබත කර්මරූප වුව ද ආධාරාර්ථ වශයෙන් ගතයුතුයි.

**වි**—පාලිසංස්කෘතයන්හි ඉත්ථම්භවාර්ථය පැවසීමට "අනු" ආදි උපසර්ගයෝ යෙදෙත්, ඒ උපසර්ගයන් හා යෙදෙන පදය කර්ම විභක්තිය භජනය කෙරේ. පාළියෙහි "සාධු දෙවදත්තො මාතර මනු" යන්න ඉත්ථම්භාවාර්ථ නිදර්ශනයෙකි. "දෙව්දත් මවට මැනවි" යන්න එහි සිංහලපරිවර්තන යයි. මේ පාලිවාක්‍යයෙහි වූ "මාතරං" යන්න විතීයා යි හෙවත් කම්විබති, හෙ ද ආධාරාර්ථයි. "අනු" යන්න ඉත්ථම්භාවාර්ථයි.

**3. භා**—"ඉසිවතුන් විනා" යනාදි වාක්‍යයෙහි "ඉසිවතුන්" යනු "විනා" යන නිපාත යෝගයෙහි කර්මයි. ඊර්ෂ්‍යාවත් අය හැර මේ ග්‍රන්ථය අන් කවරකුට නම් රිසි නොවේ ද, යනු වාක්‍යාර්ථයි.

**වි**—මෙසේ තවත් බොහෝ නිපාතයන්ගේ යෝගයෙහි කම් විබත යෙදේ. "ඔහු පිණිස, ඔහු නිසා, ඔහු සඳහා, ඔහු මිස, ඔහු අනුව, ඔහු මෙන්, ඔහු ගැණ, ගහක් පාසා, ගහක් ගානේ, දවස් පතා" යනාදි වශයෙන් යෙදෙන ප්‍රයෝගයන්හි "පිණිස" ආදි යෝගයෙහි 'ඔහු' ආදිය කම්විබත් යයි සැලකිය යුතුයි.

**4. භා**—"එළඹ බුදුන් කරා" යන මේ ආදි ප්‍රයෝගයන්හි සමීපාර්ථ ශබ්ද කෙරෙනු දු කම් විබත යෙදෙන බැව් කීහු. මෙහි "කර" ශබ්දය සමීපාර්ථයි. ඉන් පරව "ආ" යන කම්විබත් පස යෙදීමෙන් "කරා" යි සිඬයි. ඒ හා සම්බන්ධ වූ බුදුන් යන්න සබඳ විබති. බුදුන්ගේ සමීපයට පැමිණ යනු එහි අර්ථයි.

ඞී—මේ හැර තවත් බොහෝ තන්හි කම්විබත වහර යෙදේ. ක්‍රියාවිශෙෂණාර්ථයෙහි ද යෙදේ, "බත ටිකක් පිසයි" යනාදි වශයෙනි, මෙහි "ටිකක්" යන්න ක්‍රියාවිශෙෂණාර්ථ කර්මයි. අකර්මකධාතු යොගයෙහි කර්මයක් නැත ද කාලවාචක ශබ්ද කම්විබත් භජනය කෙරේ. "කලක් නිදයි, පැයක් සිටි" යනාදි වශයෙනි. මෙහි "නිදයි, සිටි" යන දෙක අකර්මක වුව ද "කලක්, පැයක්" යන දෙක කර්මයි. ඊට කාලාර්ථකර්ම යයි ද කියනු ලැබේ. අකර්මක ධාතු යොගයෙහි භාවවාචක ශබ්ද ද කම් විබත් භජනය කෙරේ. 'නින්දක් නිදයි, නැටුමක් නටයි, වස්විසුමක් වසයි" යනාදි වශයෙනි. මෙහි "නිදයි, නටයි වසයි" යන ක්‍රියාවන් අකර්මක වුව ද "නින්දක් නැටුමක් වස්විසුමක්" යන පද භාවවාචක බැවින් කර්මයි.

තවද ටකාරයෙන් යුත් විභක්තිප්‍රත්‍යය කම්විබත් නොවේ යයි ද එබඳු ප්‍රත්‍යය සම්ප්‍රදාන යයි ද දැන් ඇතමුන්ගේ මතයෙකි, එහෙත් ඒ මතය ශාස්ත්‍රීය නොවේ. "ගමට ගියා" කී තල්හි "ගමට" යන්න කර්ම නොව සම්ප්‍රදාන ම වේ නම් ගමනාර්ථ ක්‍රියා සියල්ල ම අකර්මක විය යුතුයි. ගමනාර්ථධාතු අකර්මක නොවේ. මෙහි නිදීෂට "ගමට" යන පදය සම්ප්‍රදාන යයි කිමට වඩා කර්ම යයි කිමට හෙතු පෙණේ. මේ පදය කර්මය කියා හෝ සම්ප්‍රදානය කියා හෝ නිශ්චය කරගතයුත්තේ ටයන්නෙන් නොවේ. අර්ථ වශයෙනි, "ගමට" යන්නෙහි ඇත්තේ ප්‍රාප්‍ය කර්මලක්‍ෂණ යයි, සම්ප්‍රදාන ලක්‍ෂණයක් එලෙසින් ප්‍රකටව නොපෙණෙන බැවි තත්ත්වය නුවණින් මෙහෙයා බලන කාවරකුට වුවත් වැටහේ. ප්‍රාප්‍යකර්මවිෂයෙහි බොහෝ තන්හි විභක්ති රූපය ටයන්නෙන් යුක්තව සිංහලව්‍යවහාරයෙහි පැවතේ. පාලිසංස්කෘතයන්හි ගමනාර්ථ ධාතුයොගයෙහි විකල්පයෙන් කර්මය සම්ප්‍රදානරූපයෙන් ද සිටින බැවි සූචිතයි, හෙ ද කර්මාර්ථවශයෙන් මැයි. සිංහල ව්‍යවහාරයෙහි දු ඇතැම් තන්හි "ඒ මිනිහා ගෙදර ගියා, ඒ මිනිහා ගෙදරට ගියා" යනාදි වශයෙන් දෙපරිද්දෙන් ම යෙදේ. අර්ථයෙන් "ගෙදර, ගෙදරට" යන දෙක ම සමාන වේ.

**කර්මවිභක්තිය නිමි.**

---

3. කතුවිබත්සුතුර.

**3. මෙහෙයුම් ලද නොලද-කිරිය කරණුයේ කතු නම,**
**දෙබසෙහි සොඳු සමසේ-ට නට විනා කම්විබත්.**

**භා**—කෙසේ නමුදු ක්‍රියාව කරන්නේ කර්තෘ යි. මෙහි කර්තෘ දෙදෙනෙක් නිර්දිෂ්ටයි, ඉන් එකෙක් අන් කිසිවෙකුගේ මෙහෙයීමක් හෙවත් නියෝගයක් ලැබ ක්‍රියාව කරන්නේ ද, එකෙක් එබඳු මෙහෙයීමක් නො ලැබ ස්වප්‍රධානත්වයෙන් ක්‍රියාව කරන්නේ ද වේ. ඒ කර්තෘ අර්ථය අනුක්ත වශයෙන් පවසා ලීමට හෙල දිව්බස වහරෙහි එකවචන වශයෙන් "අ උ ආ හු" යන සතර ද, බහුවචන වශයෙන් "උන් න ආන න් අන්" යන පස ද යෙදේ.

**වි**—මෙහි "මෙහෙයුම් ලද නොලද" යන්නෙන්. කර්තෘහුගේ විවිධත්වයක් ප්‍රකාශිත වුව ද සාමාන්‍යයෙන් ධාතුපාත්තව්‍යාපාරය හෙවත් ධාත්වර්ථය පිළිබඳ ව්‍යාපාරය ඇසුරු කරන්නේ කර්තෘ යයි දතයුතුයි. ප්‍රයොජ්‍ය රහිත ශුඬක්‍රියාමාත්‍රයෙහි ඇත්තේ ව්‍යාපාර එකෙකි, එබඳු තන්හි ව්‍යාපාර එකක් බැවින් කර්තෘපද ද එකෙක් යෙදේ. "කුසුල්තෙමේ බත පිසයි" කී කල්හි ධාතුපාත්ත ව්‍යාපාරය පාකය හෙවත් පිසීම පමණෙකි, එබැවින් ඒ ව්‍යාපාරය ඇසුරු කරන්නේ හුදකලා කුසුල් පමණෙකි, ඒ මෙහෙයුම් නොලැබ ක්‍රියාව කරණ කර්තෘ යි. "ඇමැති තෙමේ කුසුල් ලවා බත පිසවයි" කී කල්හි ධාතුපාත්තව්‍යාපාර දෙකෙකි, ඉන් එකෙක් නම් පාක යයි, අනෙක නම් ප්‍රයොජ්‍යාර්ථ යයි, හෙවත් මෙහෙයීමයි. ඒ ව්‍යාපාර දෙක කර්තෘ දෙදෙනෙකු කෙරෙහි ද ඉන් එකෙක් හෙවත් පාකව්‍යාපාරය කුසුල් කෙරෙහි ද අනෙක හෙවත් ප්‍රයොජ්‍යව්‍යාපාරය ඇමැති කෙරෙහි ද පිහිටියේ වේ. එබැවින් එහි ඒ දෙදෙනා ම කර්තෘහු වෙත්. මෙයින්ප්‍රකාශිතවූයේ සාමාන්‍ය කර්තෘ තත්ත්ව යයි. ඒ කර්තෘ උක්තඅනුක්ත වශයෙන් දෙපරිදි වේ. එහි උක්ත කර්තෘ විෂයෙහි පෙරවිබත යෙදේ. අනුක්ත කර්තෘ අර්ථය පවසන්නේ යථොක්ත "අ" ආදියෙති. මෙහි ඊට නිදසුන් දක්වන්නාහු "සරණතඹර" යනාදිය කීහු.

a. **1. අ-සරණ තඹරවරලස-සෙවෙලවල සරැ අඹියන,**
**රුදුව පෙර කලවමන්-කුසනිඹිඳු ගනාසෙමෙළ්.**

**2. උ-රජු අනුදන්නේ කුලදම්. 3. ආ-මුනිඳු වැලඳූ පාද. 4. හු-පිණ්ඩිපිඩු කල අත්තම,**

**1. උන්-කමන්නැ දදුන් කල වරද. 2. න-මිපල්න ගත් වෙස් රුස්නේ. 3. ආන-නරන කල කමට ඉඳුරෝ දෙස්. 4. න්-කිවින් නුදුවූයේ කෙ උවම්. 5. අන්-අඟනන් වුහුවු නුවන් නරද දිරිය ඇදුරු දුදුරු කොළ්.**

**b. අරුත් විය කත්හි විසින් විබතින් පර ව රූයි, කෙනෙත්හු විසින් කම් දත්.**

1. වාක්‍යයෙහි ධාතුපාත්‍යව්‍යාපාරය "කළ" යන කම්කරු අරුත් කිරිය පදයාගේ ධාත්වර්ථමාත්‍ර යයි, එනම්:-කිරීමයි. ඒ ඇසුරු කළ කර්තෘ රදුව යි. ඒ පැවසීමට "රදු" ශබ්දයෙන් පරව අප්‍රත්‍ය යයි, වකාරාගම විධියෙන් "රදුව" යි සිඩයි.

පාදපද්මය ධම්මිල්ල නමැති ශෛවාලයෙන් අවුල් කොට ආරාධනය කරන්නා වූ රාජදුහිතෘ විසින් පෙර කරණ ලද්දා වූ අවමානය කුසරජතෙමේ සිහි නො කෙළේය යනු ගීයෙහි අර්ථයි.

2. වාක්‍යයෙහි ධාතුපාත්‍යව්‍යාපාරය "අනුදත්තේ" යන කම්කරු අරුත් කිරිය පදයාගේ අර්ථමාත්‍ර යයි, එනම් අනුදැනීමයි, ඒ ඇසුරුකළ කර්තෘ රජ යි, ඒ පැවසීමට "රජ" ශබ්දයෙන් උප්‍රත්‍යය වීමෙන් "රජු" යි සිඩයි. රජු විසින් අනුදන්නාලද්දේ කුලධම් යයි යනු වාක්‍යාර්ථයි.

3. වාක්‍යයෙහි ධාතුපාත්‍යව්‍යාපාරය "වැලඳූ" යන කම්කරු අරුත් කිරිය පදයාගේ අර්ථමාත්‍ර යයි, එනම්:-වැලඳීමයි. ඒ ඇසුරුකළ කර්තෘ මුනිඳු යි. ඒ පැවසීමට "මුනිඳු" ශබ්දයෙන් පරව "ආ" ප්‍රත්‍යය යෙදීමෙන් "මුනිඳා" යි සිඩයි, මුනීන්ද්‍රයන් විසින් පරිභොග කළ පාත්‍රධාතුවයි, යනු වාක්‍යාර්ථයි.

4. වාක්‍යයෙහි ධාතුපාත්‍යව්‍යාපාරය "කළ" යන කම්කරු අරුත් කිරිය පදයාගේ අර්ථමාත්‍රය වූ කිරීමයි, ඒ ඇසුරුකළ කර්තෘ සිත්සිපි යි, ඒ පැවසීමට "සිත්සිපි" ශබ්දයෙන් පරව "හු" ප්‍රත්‍යය යෙදීමෙන් "සිත්සිපිහු" යි සිඩයි, පුණ්‍ය නමැති ශිල්පියා විසින් කළ හස්තකර්ම යයි. යනු වාක්‍යාර්ථයි.

බුහුබස වාක්‍යවිෂයෙහි දු ධාතුපාත්‍යව්‍යාපාර මෙලෙසින් දත යුතුයි. එනම්:- 1-වාක්‍යයෙහි-කළ, 2-ගත්, 3-කළ, 4-නුදුටු, 5-වුහුටු, යන මේ කම්කරු අරුත්කිරිය පදයන්ගේ අර්ථමාත්‍ර වූ "කිරීම, ගැණීම, කිරීම, (නො)දැක්ම, හැරීම" යන මොහු ධාතුපාත්‍යව්‍යාපරයෝ යි. පිළිවෙළින් "දද, මීපල්, නර, කිවි, අඟන" යන මොහු ඒ ව්‍යාපාරයන් ඇසුරුකළ කර්තෘහු වෙත්. ඒ කර්තෘ අර්ථයන් පැවසීමට "දද, මීපල්, නර, කිවි, අඟන" යන ශබ්දයන් කෙරෙන් පරව පිළිවෙළින් "උන්, න, ආන, න්, අන්" යන පස යෙදීමෙන් "දදුන්, මීපල්න, නරාන, කිවින්, අඟනන්" යි සිඩයි.

1. මුග්ධයන් විසින් කළ අපරාධය ඉවසන්නැ. 2. රජුන් විසින් ගත් වෙශය රිසිවන්නේය. 3. මිනිසුන් කළ කර්මයට ඉන්ද්‍රියයෝ සාක්ෂි වෙත්. 4. කවින් විසින් නො දක්නා ලද්දේ කිනම් උපමාවක් ද. 6. ස්ත්‍රීන් විසින් හරිණ ලද නෙත්‍ර නමැති නාරාචය ධෛර්‍ය්‍ය නමැති පර්වතය දුදුරු කෙළේය යනු ඒ ඒ වාක්‍ය යන්ගේ අර්ථයි.

b. භා — කතුවිබතෙහි අර්ථය ප්‍රකට කරණ කල්හි සිංහල ව්‍යවහාරයෙහි කතුවිබත් රූපයෙන් පරව "විසින්" යන නිපාත පදය යෙදෙන බැව් කියා ඊට නිදසුන් වශයෙන් "තෙනෙත්හු විසින් කම් දත්" යනු කිහු. ඊශ්වරයා විසින් අනඞ්ගයා දවන ලද්දේය යනු ඒ වාක්‍යයෙහි අර්ථයි.

"විසින්", යන්න "වස" ශබ්දයෙන් "ඉන්" ප්‍රත්‍යය වීමෙන් වූ නිෂ්පන්න නිපාත පදයෙකි, වස ශබ්දය ප්‍රභූත්වය යන අර්ථයෙහි වැටේ. එබැවින් "විසින්" යන්නෙහි අර්ථය ප්‍රභූත්වයෙන් යනුයි. එකල්හි "තෙනෙත්හු විසින්" යන්නෙහි අර්ථය ඊශ්වරයාගේ ප්‍රභූත්වයෙන් යනුයි.

කර්තෘකාරකය සෙසු සියලු කාරකයන්ට ප්‍රධාන වූ කාරකයෙකි. කුමක් හෙයින්ද යත්, සෙසු කාරකයන් ක්‍රියාවෙහි යොදන්නේ කර්තෘකාරකය විසිනි. කර්තෘ කාරකයෙන් තොරව ක්‍රියාසිද්ධියක් කොතන්හි වත් නොලැබේ. බාලාවතාරයෙහි කර්තෘ ලක්ෂණ පවසන්නාහු:-

"යො යොජයං සකත්‍ථකෙ බලු කාරකානි
අඤ්ඤෙ ක්‍රියෙ යතනයුත්තතයා පධානො,
කම්මඨිතං ක්‍රියමථාත්තඨිතං කරොති
කත්තාති සො නිගදිතො ස ච නෙකභෙදො."

යනු කීහු. යමෙක් සෙසු කාරකයන් තමතමන්ට අයිතිවූ ක්‍රියාවිෂයෙහි යොදමින් උත්සාහවද්භාවයෙන් ප්‍රධානවන්නේ කර්මය කෙරෙහි පිහිටි ක්‍රියාව හෝ තමා කෙරෙහි පිහිටි ක්‍රියාව හෝ කෙරේ නම් හේ කර්තෘ යයි කියනලද්දේ ය. ඒ කර්තෘතෙමේ ද නානාවිධ වේ යනු එහි අර්ථයි.

තවද ඇතැම් තන්හි කරණාර්ථය පැවසීමට ද "විසින්" යන්න යෙදේ. එහෙත් ඒ කරණ විභක්තියෙන් පරව නොව කර්තෘ විභක්තියෙන් පරව ම යෙදේ. එසේ යෙදීමට හෙතුව කරණ කාරකය ද කර්තෘකාරකය මෙන් ම ක්‍රියාසම්පාදනයෙහි උපකාරිත්වයෙන් මුඛ්‍ය වීමයි. මෙසේ කර්තෘත්වය පවසන්නා වූ විභක්තිරූපයන් වාක්‍යවශයෙන් නිදසුන් කොට ඉක්බිති නිපාත යොගවශයෙන් යෙදෙන කතුවිබත් පවසන්නාහු "සුගතිඳු භා" යනාදිය කීහු.

a. **සුගතිඳු හා ක හි සම, වාදේ වර වණින් හා සමර සමර කෙළේ. මේ ඇහි හා සබඳෙහි කතුවිබත් රුසි.**

**ඉති කතුවිබත්.**

---

ෂ. **හා**—"සුගතිඳු හා, වණින් හා" යන දෙතන්හි "සුගතිඳු, වණින්" යන දෙක "හා" යන නිපාතයොගයෙහි කතුවිබති. සුගතෙන්ද්‍රයා හා කවරෙක් වනාහි සම වේ ද, වර්ෂාකාලයෙහි අනඞ්ගතෙමේ විරහිණීන් සමග යුඬ කෙරේ යනු වාක්‍යාර්ථයි.

**වි**—මෙහි හාසබදෙහි කතුවිබත සඳහා නිදසුන් දෙකෙක් නිර්දිෂ්ටයි. සිංහලෙහි 'හා' යන්න දෙපරිද්දෙකින් යෙදෙන බැවින් මෙහි නිදසුන් දෙකෙක් දක්වන ලද්දේ යයි සැලකිය යුතු වේ. පාලිසංස්කෘතයන්හි සහාර්ථ නිපාතයොගයෙහි තෘතීයාව යෙදේ යයි අනුශිෂ්ටයි. සිංහලෙහි "හා සබදෙහි කතු විබත් රුසි" යන්නෙන් පවසනලද්දේත් ඒ අනුශාසනය වියයුතුයි. එහෙත් "සුගතිඳු හා" යන නිදශීනය ඒ පාලිසංස්කෘතානුශාසනයට සම නොවේ. පාලිසංස්කෘතයන්හි සමානාර්ථවාචක "සම" ශබ්දාදීන්ගේ යොගයෙහි ද තෘතීයාව වන බැව් කිම විශෙෂ අනුශාසනයෙකි, සිංහලෙහි ද "සම" ශබ්දාදීන්ගේ යොගයෙහි කතුවිබත යෙදේ. එහෙත් එබඳු තන්හි යෙදෙන කතුවිබත් රූපය "හා" යන්නකුදු සමග යෙදේ. "සුගතිඳු හා ක හි සම" යන නිදශීනය ඊට සාධකයි. පාලියෙහි මේ වාක්‍යය "සුගතින්දෙන කො හි සමො"කියා වේ. මෙහි "සුගතින්දෙන" යනු සම ශබ්දයොගයෙහි තෘතියායි. සංස්කෘතයෙහි ද එසේයි. මේ වාක්‍යය සිංහලට පෙරළීමෙදී "සුගතිඳු හා ක හි සම" කියා වේ. එසේ වුව ද "සම" ශබ්දාදීන්ගේ යොගයෙහි "ඔහු සම" යනාදි වශයෙන් හා යන්නෙන් තොර ව ද යෙදේ. එබඳු තන්හි "ඔහු" යනාදිය සබඳවිබත් විය යුතු වේ. "ඔහුට සම" යනාදි වශයෙන් ද යෙදේ. පාලිසංස්කෘතයන්හි ද "තස්ස සමො" යනාදි වශයෙන් සම්බන්ධවිභක්තිය ද යෙදේ.

මෙහි දක්වූ දෙවන නිදශීනය පාලිසංස්කෘතයන්හි අනුශාසනය කළ සහයොග තෘතීයාව හා සම වේ. "ඉහි, සමන, කැටුව" යනාදිය ද ඒ අර්ථයෙහි යෙදෙන නිපාතයි. එහිදු "ඉහි" යන්න කාව්‍යභාෂාවෙහි ඇතැම් තන්හි දක්නා ලැබේ. "සියන් ඉහි" යනාදි වශයෙනි. සවකියයන් සමග යනු එහි අර්ථයි.

"සහාදි යොගෙ'ප්‍රධානෙ තෘතීයා" යනු සහාදියොගය පිළිබඳ සංස්කෘත වෛයාකරණයන්ගේ විශෙෂ අනුශාසනයෙකි. සහාදි යොගයෙහි අප්‍රධාන පදයෙහි තෘතීයාව වේ යනු එහි අර්ථයි.

මෙබඳු තන්හි පදයන්ගේ ප්‍රධාන අප්‍රධානත්වය ක්‍රියාව අනුව යන පිළිවෙළින් දතයුතුයි. ඒ සඳහා සංස්කෘත ශාබ්දිකයෝ "ක්‍රියාන්වයි ප්‍රධානම්,ක්‍රියානන්වයස්ප්‍රධානම්" යනු කිහු. ක්‍රියාව අනුව යන පදය ප්‍රධානය යනු ද, ක්‍රියාව අනුව නොයන පදය අප්‍රධානය යනු ද එහි අර්ථයි. "පියා පුතා හා ගමට ගියේය" යන තන්හි පියා යන පදය ක්‍රියාව අනුව යන්නේ ද, පුතා යන පදය ක්‍රියාව අනුව නොයන්නේ ද වේ. එබැවින් අප්‍රධාන වූ "පුතා" යන පදය හා සබඳෙහි කතුවිබති. "පුතා පියා හා ගමට ගියේය" යි කී කල්හි "පුතා" යන පදය ක්‍රියාව අනුව යන්නේ වේ. එබැවින් "පියා" යන අප්‍රධාන පදය "හා" සබඳෙහි කතුවිබති. "වී හා තල වපුරයි, තල හා වී වපුරයි" යනාදිය ද මෙලෙසින් දතයුතු. තවද "හා" නිපාතය ඇතැම් ප්‍රයෝගයන්හි සමුච්චයාර්ථවශයෙන් ද යෙදේ. එබඳුතන්හි අවිශෙෂයෙන් සියලු විබත්හු ම යෙදෙත්. "ඔහුගෙන් හා මගෙන්" යනාදි වශයෙනි. මෙහි අර්ථය ඔහුගෙන් ද මගෙන් ද යනුයි

**කත්‍රෘවිභක්තිය නිමි.**

---

4. කරණවිබත්සුතුර.

**4. ක්‍රිය කැපයිමෙහි-ඉවහල් කතු කරණ නම්,**
**ඉන් එන් නෙන් ඉයුතු-වියුතු දෙබසෙහි සම නි ද.**

4 කා—කත්‍රෘකාරකය ක්‍රියාසම්පාදනයෙහි මුඛ්‍ය වේ. කත්‍රෘගේ ක්‍රියාසම්පාදනයෙහි සෙසු- කම් සපදන් ආදි කාරකයන්ට වඩා ඉවහල් වූ නෙවත් ඉතා උපකාර වූ කාරකය කරණ නම් වේ. ඒ කරණාර්ථය පැවසීමට "ඉන් එන් නෙන් ඉනි එනි නෙනි නි" යන මේ විබත්පස සත එකවචන බහුවචන දෙකට සමව යෙදේ.

වි—සියලු කාරකයෝ ම කත්‍රෘගේ ක්‍රියා සම්පාදනයෙහි උපකාර වෙත්, එහෙත් කරණකාරකය අතිශයින් උපකාරවන බැව් කිහු. ඒ එසේ මැයි. "මිනිහා සැලියෙහි ගින්නෙන් බත පිසයි" කී කල්හි මිනිහාගේ ක්‍රියාසම්පාදනයෙහි "සැලිය,බත" යන දෙක ද කාරක බැවින් උපකාර වේ. එහෙත් මෙහි ක්‍රියාර්ථය පිසීමයි, පිසීම නම් බුරුල්වීම හෝ මෙලෙක් වීමයි, ඊට ඉවහල් වූයේ කරණ වූ ගින්නයි. කරණකාරකයෙහි තතත්වය පවසන්නා වූ සංස්කෘතවෛයාකරණයෝ:-

ක්‍රියායාඃ පරිනිෂ්පත්තිර්යද්ව්‍යාපාරාදනන්තරම්,
විවක්ෂ්‍යතෙ යද යත්‍ර කරණං තත් තද ස්මෘතම්.

යනු කීහු. අවිච්ඡෙද ව පවත්නා වූ යමක්හුගේ ව්‍යාපාරය හෙතු කොට ගෙණ ක්‍රියාහුගේ පරිනිෂ්පත්තිය හෙවත් ක්‍රියා සම්පාදනය වේ නම් එලෙසින් යෙදුනා වූ ඒ කාරකය කරණ නම් වේ යනු එහි භාවයයි. කරණයට නිදසුන් දක්වන්නාහු "වතින්" යනාදිය කීහු.

a. **1. ඉන්-වතින් ගුරූන් අපියනු. 2. එන්-ගුණෙන් දනා සඟන්නේ. 3. නෙන්-මෙත්නෙන් වෙර පරයනු. 4. ඉනු-ඉති-සිතිනි වේ දුසිරි සුසිරි. 5. එනි-නිසෙනි පළට වනු. 6 නෙනි-නැන්නෙනි බව පියවි. 7. නි-නමචි හියමගිනි නිවන් වන්.**

b. **"සැරදේ නුවන්මිණිපඩුරෙන්" ඈ උපලකුණු අරුත් හි ද මෙවිබත් රූසි.**

**ඉති කරණවිබත්.**

---

a. **භා**—මෙහි-1. වත වාක්‍යයෙහි කිරිය සැපයීම (ගුරුන්) ඇරයීමයි, හෙවත් ගුරුන් සතුටු කිරීමයි. ඊට ඉවහල් වූයේ වතයි, හෙවත් පැවැත්මයි, එබැවින් "වත්" ශබ්දයා කෙරෙන් "ඉන්" ප්‍රත්‍යය යෙදීමෙන් "වතින්" සි සිඬයි. ව්‍රතය හෙවත් ගුරු පූජාදි චාරිත්‍ර විශෙෂය* කරණකොට ගෙණ ගුරුන් සතුටු කරණු යනු එහි අර්‍ථයි.

2. වාක්‍යයෙහි කිරිය සැපයීම ජනසඞ්ග්‍රහ යයි, ඊට ඉවහල් වූයේ ගුණ යයි, එබැවින් "ගුණ" ශබ්දයා කෙරෙන් "එන්" ප්‍රත්‍යය වීමෙන් "ගුණෙන්" සි සිඬයි. ගුණය කරණ කොට ගෙණ ජනසඞ්ග්‍රහ කරන්නේය යනු වාක්‍යාර්‍ථයි.

3. වාක්‍යයෙහි කිරිය සැපයීම වෙර පැරයීමයි, ඊට ඉවහල් වූයේ මෛත්‍රි යයි, එබැවින් "මෙත්" ශබ්දයෙන් පරව "නෙන්" ප්‍රත්‍යය වීමෙන් "මෙත්නෙන්" සි සිඬයි. මෛත්‍රිය කරණ කොට ගෙණ වෛරය පරදවනු යනු එහි අර්‍ථයි.

4. වාක්‍යයෙහි කිරිය සැපයීම (දුසිරිසුසිරි) ඇතිවීමයි, ඊට ඉවහල් වූයේ සිතයි. එබැවින් "සිත්" ශබ්දයා කෙරෙන් පරව "ඉති" ප්‍රත්‍යය වීමෙන් "සිතිනි" සි සිඬයි. සිත කරණ කොට ගෙණ දුශ්චරිතය හා සුචරිතය වේ.

---

* "ගුරුපූජා ඝෘණා ශෞචං සත්‍යමින්ද්‍රියනිග්‍රහඃ,
ප්‍රවර්‍තනං හිතානාඤ්ච තත් සර්‍වං ව්‍රතමුච්‍යතෙ"

යනුවෙන්-ගුරුන්පිදීම, කරුණාව, පිරිසිදුබව, සත්‍යය, ඉන්ද්‍රියසංයමය, හිත වූ දේ යෙදීම, යන මේ සියල්ල ව්‍රතහ හෙවත් වත් යයි කියනු ලැබේ.

5. වාක්‍යයෙහි කිරිය සැපයීම (පලුට) විමයි, ඊට ඉවහල්වූයේ නියයි. එබැවින් "නී" ශබ්දයා කෙරෙන් පරව "එති" ප්‍රත්‍යය හා යකාරාගම මාත්‍රාහානි යන මේ වියරණ විදි වීමෙන් "නියෙති" යි සිඩයි. ඥාතය කරණ කොට ගෙණ ප්‍රකට වනු යනු එහි අර්‍ථයි.

6. වාක්‍යයෙහි කිරිය සැපයීම (බව) පියාලීමයි, හෙවත් භවය දුරුකිරීමයි, ඊට ඉවහල්වූයේ තැනයි, එබැවින් "තැන්" ශබ්දයා කෙරෙන් පරව "තෙති" ප්‍රත්‍යය වීමෙන් "තැන්තෙති" යි සිඩයි, උත්සාහය කරණ කොට ගෙණ භවය දුරු කරව් යනු එහි අර්‍ථයි.

7. වාක්‍යයෙහි කිරිය සැපයීම (නිවන්වන්නහු) වැදීමයි, ඊට ඉවහල් වූයේ හියමගයි, එබැවින් "හියමග" ශබ්දයා කෙරෙන් "නී" ප්‍රත්‍යය වීමෙන් "නියමගනි" යි සිඩයි. හිත වූ මාර්‍ගය කරණ කොට ගෙණ නිවන් පැමිණියහු වදිව් යනු අර්‍ථයි.

b හා—"සැරදේ නුවන්මිණිපඩුරෙන්" යනාදි තන්හි කරණ විභක්තිය උපලක්‍ෂණාර්‍ථ යයි කිහු. යම් නාමයෙක් සම්පසර් වූ වකු හැඳිනීමට හෙතු වේ නම් ඒ නාමය උපලක්‍ෂණ නම් වේ. ඔහු කෙරෙන් කරණ විබත් යෙදීම ඡෙකයන්ට අභිමත විය. මෙහි "නුවන්මිණිපඩුර" තත්සම්පසර් භාවයෙන් චිරජීවනය කරන්නහු හැඳිනීමට හෙතු වේ. එබැවින් ඉන් පරව"එන්"විභක්ති ප්‍රත්‍යය යෙදීමෙන් "නුවන්මිණිපඩුරෙන්" යි විය. නෙත්‍ර නැමැති මණිප්‍රාභෘතයෙන් උපලක්‍ෂිත ව චිරකාලයක් ජීවත් වේවා යනු එහි අර්‍ථයි.

මෙබඳු තන්හි යෙදෙන කරණය පාළියෙහි ඉත්ථම්භූතාර්‍ථ කරණ යයි ද, සංස්කෘතයෙහි විශෙෂණාර්‍ථකරණ යයි ද, කියත්. පාළියෙහි "පරිබ්බාජකං තිදණ්ඩානාද්දක්ඛි" යනු උදාහරණයි, දණ්ඩත්‍රයෙන් කිසියම් ආකාරයකට පැමිණියාවූ හෙවත් උපලක්‍ෂිත වූ පිරිවැජියා දුටුවේය යනු එහි අර්‍ථයි. සංස්කෘතයෙහි "ජටාභිස්තාපසඃ" යනු උදාහරණයි, ජටාවෙන් වෙනස් කරණ ලද්දේ හෙවත් උපලක්‍ෂිත වූයේ තාපසයායි යනු එහි අර්‍ථයි, මේ උපලක්‍ෂණාදි අර්‍ථත්‍රය ම නාමාර්‍ථවශයෙන් නොසම වුව ද අදහස් වශයෙන් සම වේ.

මෙහි කරණය පිළිබඳ නිදසුන් ආදිය අවිශෙෂයෙන් දක්වුව ද බොහෝ තන්හි කරණ විබත හෙත්වර්‍ථයෙහි ද්‍රයෙදේ. කරණ හෙතු දෙදෙනාගේ භෙදය දතගැණීමෙන් ඒ වෙන්කර ගතයුතුයි. කරණ හෙතු දෙදෙනාගේ භෙදය පවසන්නා වූ සංස්කෘතවෛයාකරණයෝ "කත්‍රීධීනං සාධනම්, ඣදධීනා කත්‍රීඃ

ප්‍රවෘත්තිඃ ස හෙතුඃ" යනු කීහු. කරණය කර්තෘ අධීන කොට ඇත්තේ වේ, හෙවත් කර්තෘට අයිතිවූයේ වේ, කර්තෘගේ ක්‍රියා ප්‍රවෘත්තිය යමක් අධිපති කොට ඇත්තේ නම් හෙවත් යමක් මුල් කොට ඇත්තේ නම් ඒ මුල්වූයේ හෙතුව යි, සාමාන්‍යයෙන් සල කත් හොත් කරණය යම් කිසි ව්‍යාපාරයක් ඇසුරු කරන්නේ වේ, හෙතුව ව්‍යාපාරයක් ඇසුරු නො කෙරේ. "ඒ මිනිසා **පොරොවෙන්** ගස කපයි" කී කල්හි ව්‍යාපාරය කැපීමයි, පොරව ඒ ඇසුරු කෙරේ. කර්තෘට යටත් වූ පොරොවේ මහන්සියෙන් ම ඒ සිද්ධ වන බැවිනි. "**ලොභයෙන්** ක්‍රොධය උපදී" කී කල්හි ව්‍යාපාරය ඉපදීමයි. මෙහි ලොභය ඒ ව්‍යාපාරය ඇසුරු නො කෙරේ. ලොභය වනාහි ඒ උත්පත්තියට මුල් වේ. එබැවින් "ලොභයෙන්" යනු හෙත්වර්ථයෙහි කරණයි. "නියෙති පළුට වනු" යනාදි බොහෝ තන්හි ද හෙත්වර්ථ කරණය දතයුතු යි.

මේ හැර තවත් නොයෙක් අර්ථයන්හි කරණ විබත යෙදේ. "ඒ මිනිසා **වර්ණයෙන්** යුරෝපියයෙකි" මෙහි "වර්ණයෙන්" යනු නාමවිශෙෂණාර්ථයෙහි කරණයි. මිනිසා වෙනස් කරගැනීමට වර්ණය කරණ වේ. "**එක් දිනකින්** ම ඒ අවසන් විය" යන තන්හි "දිනකින්" යනු ක්‍රියාපවර්ගයෙහි කරණයි, ක්‍රියාපවර්ග නම් ක්‍රියාව වහා නිමවීමයි. කරණය ක්‍රියා සිද්ධියට ඉවහල් වූවක් බැවින් ක්‍රියා යොගයෙහි කරණය වීම බහුල සිද්ධයයි, එහෙත් ඇතැම් තන්හි ක්‍රියායොගරහිත ව ද කරණය යෙදේ. "**ප්‍රකෘතියෙන්** මනහරයි, **ස්වභාවයෙන්** අලසයි" යනාදි වශයෙනි.

තවද සිංහලෙහි කරණ විභක්ති ප්‍රත්‍යයයන් අප්‍රාණිවාචක ශබ්දයන් කෙරෙන් මුත් ප්‍රාණිවාචකයන් කෙරෙන් යෙදෙන බැව් නො පෙණේ. එකවචන බහුවචන දෙකට සමව විබත්පස යෙදීම වූයේත් අප්‍රාණිවාචකයන් කෙරෙන් පමණක් යෙදෙන බැවිනි, ප්‍රාණි වාචකයන්ගේ කරණාර්ථය කම්විබතින් පර වූ "කරණ කොට ගෙණ" යන වාක්‍යයෙන් පවසනුලැබේ. "ඒ මිනිසා කරණ කොට ගෙණ" යනාදි වශයෙනි.

**කරණවිභක්තිය නිමි.**

---

සපදන්විබත්සුතුර.

**5. දන් ඈ ලබනුයේ-පිණිස නිසි හා සපදන්,**
**කෙටෙකනැ අනට බුහුබසැ-ට නැන ට යෙදූ කම් විබත්.**

5. හා—දනාදිය ලබන්නේ ද, හෙවත් දනාදිය ලැබීමට යොග්‍ය වූයේ ද, පිණිස යන අර්ථය ඇසුරු කරණ පදය ද සපදන් (සම්ප්‍රදාන) නම් වේ. ඒ අනුකත සම්ප්‍රදානාර්ථය පැවසීමට

ඒකවචන විෂයෙහි-"හට අට උට ආට හුට ට" යන ප්‍රත්‍යය සය ද, බහුවචන විෂයෙහි-"උන්ට නට ආනට න්ට අන්ට අනට" යන සය ද යෙදේ.

**වි**—බොහෝ ව්‍යාකරණානුශාසනයෝ ද මුඛ්‍යාමුඛ්‍යවශයෙන් දෙපරිදි වෙත්, මෙහි "සපදන්" යන්න "සම්පදන" ශබ්දයෙන් හෝ "සම්ප්‍රදාන" ශබ්දයෙන් හෝ බිඳුනේ වේ. මේ කාරකයට සාමාන්‍ය නිර්දේශවශයෙන් දානකාරක යයි නොකියා සම්ප්‍රදාන කාරක යයි කියනු ලැබේ. මේ නාමයට "සම්, ප්‍ර" දෙක එකතු කිරීමෙන් ගතයුතු අර්ථය නම් පූජාබුද්ධියෙන් හෝ අනුග්‍රහ බුද්ධියෙන් දෙනුකැමැති වස්තුවක් ලැබීමට යොග්‍යවූයේ යනුයි. මුඛ්‍යවශයෙන් සම්ප්‍රදාන කාරකය වන්නේ එබඳු තන්හි යයි සැලකිය යුතුයි. එහෙත් සිද්ධාන්තසඞ්ග්‍රහ කර්තෘපාදයන්ගේ අනුශාසනය එබඳු විශෙෂයක් නොතකා සමාන්‍ය නිර්දේශයෙන් කරණ ලද්දක් බැව් "දන් ඈ ලබනුයේ" යන්නෙන් හැගේ.

මෙහි මුඛ්‍යත්වයෙහි ලා ගතයුතු සම්ප්‍රදාන කාරකය වනාහි "අනිරාකර්තෘ, අනුමන්තෘ, ආරාධක" යයි තෙවැදෑරුම් වේ. මෙහි ලා සම්ප්‍රදානය ප්‍රතිග්‍රාහකත්වයෙන් සැලකියයුතුයි. එහි දානක්‍රියාව නොවළක්වන ප්‍රතිග්‍රාහකයා "අනිරාකර්තෘ" නම් වේ. "**ගසට** ජලය දෙයි" යනාදි වශයෙනි. මෙහි ජලප්‍රතිග්‍රාහක වූ ගස ඒ දානක්‍රියාව නොවැළැක්වීමෙන් ප්‍රතිග්‍රහණය කෙරේ. එබැවින් ඒ අනිරාකර්තෘසම්ප්‍රදානයි. දානකර්තෘට තත්ක්‍රියාව සඳහා කැමැත්ත දීමෙන් දානක්‍රියාව ප්‍රතිග්‍රහණය කරන්නේ "අනුමන්තෘ" නම් වේ. "**සඟනට** දන් දෙයි" යනාදි වශයෙනි. සඞ්ඝයා දායකයාගේ ආරාධනාවට කැමැත්ත දී දන් පිළිගන්නේ වේ. එබැවින් "සඟනට" යනු අනුමන්තෘසම්ප්‍රදානයි. දානකර්තෘ සතුටු කිරීමෙන් දන් පිළිගන්නේ "ආරාධක" නම් වේ. "**යදියාට** වතක් දෙයි" යනාදි වශයෙනි. යදියා නොයෙක් වචන වලින් දායකයා සතුටු කොට දානය පිළිගන්නේ වේ. එබැවින් "යදියාට" යනු ආරාධක සම්ප්‍රදානයි. රිසිවීම දූරීම යනාදියට යොග්‍යවූයේ ද සම්ප්‍රදාන වේ. ඒ අමුඛ්‍යවශයෙනි. සපදන් අරුත පවසන නිදසුන් දක්වන්නාහු "ජරඩවින්න" යනාදිය කීහු.

<u>සපදන්එකබස නිදසුන්.</u>

a. **1. හට-ජරඩවින්න වියමුවෙන් සිපා රැහැ උරා නිරෙද තුනුකෙහට මරගම නොදෙන නෙක් තුන්දෙරින් සුසිරි පිරුව සෙහේ. 2. අට-උකටලියට දලැදිලි දෙනු පියසමාම්හි. 3. උට-පපරෙව් රජුට ආසි දේ. 4. ආට-ගදියාට දන් දෙනු. 5. හුට-වෙලඳහුට බඩු දේ. 6. ට-මෙගෙට සෙත් වඩම්.**

භා—මෙහි 1. වාක්‍යයෙහි තුනුනෙහට හෙවත් සිරුරු නමැති සපය දානය කරත්හොත් තත්‍ප්‍රතිග්‍රාහකයා මාරයායි. එබැවින් ඒ පැවසීමට "මර" ශබ්දයා කෙරෙන් "හට" යන විබත්පස යෙදීමෙන් "මරහට" යි සිඩයි. ජරානමැති ඩාකිනිය ව්‍යාධි නමැති මුඛයෙන් සප කොට ලේ උරා නිරොජසක වූ සිරුරු නමැති සපය මාරයාට නො දෙත තෙක් තුන්දෙරින් සුසිරි පිරුවොත් යෙහෙකි. යනු වාක්‍යාර්ථයි.

2. වාක්‍යයෙහි ජලාජලිදානයට යොග්‍ය වූ ප්‍රතිග්‍රාහකයා උකටලියයි. එබැවින් "උකටලි" ශබ්දයා කෙරෙන් "අට" යන විබත් පස යෙදීමෙන් "උකටලියට" යි සිඩයි. ප්‍රියසමාගමයෙහි දී උත්කණ්ඨිතාවට ජලාජලියක් දියයුතුයි යනු වාක්‍යාර්ථයි.

3. වාක්‍යයෙහි ආශිර්දානයට යොග්‍ය වූ ප්‍රතිග්‍රාහකයා රජයි, එබැවින් "රජ" ශබ්දයා කෙරෙන් "උට" යෙදීමෙන් "රජුට" යි සිඩයි. පුරොහිත තෙමේ රජහට ආශීර්වාදදානය කෙරේ යනු වාක්‍යාර්ථයි.

4. වාක්‍යයෙහි දානප්‍රතිග්‍රාහකයා යදියායි, එබැවින් "යදි" ශබ්දයා කෙරෙන් "ආට" යෙදීමෙන් "යදියාට" යි සිඩයි. යාචකයාට දන්දිය යුතුයි යනු වාක්‍යාර්ථයි.

5. වාක්‍යයෙහි භාණ්ඩප්‍රතිග්‍රාහකයා වාණිජයායි, එබැවින් "වෙළඳ" ශබ්දයා කෙරෙන් "හුට" යෙදීමෙන් "වෙළඳහුට" යි සිඩයි. වාණිජයාට භාණ්ඩදානය කෙරේ යනු වාක්‍යාර්ථයි.

6. වාක්‍යයෙහි ශාන්තිදානයට යොග්‍ය වූ ප්‍රතිග්‍රාහකයා ගෘහයයි, එබැවින් "ගේ" ශබ්දයා කෙරෙන් "ට" යන විබත්පස යෙදීමෙන් "ගෙට" යි සිඩයි. මේ ගෘහයට ශාන්තිවර්ධනය කෙරෙමි යනු වාක්‍යාර්ථයි.

<u>සපදන්බුහුබසනිදසුන්.</u>

b. **1. උන්ට-මහතුන්ට කරන පිණ්පා. 2. නට-දුඹුලෝ පරනට පිවු දෙත්. 3. ආනට-කලාකෙළිසෙහි නරඟ දෙබෑර බට පබවත වන තඹරනට නිගා දින්. 4. න්ට-මහන්නෝ පරඟනන්ට උර රුසුන්ට පිවු ද නොදෙත්. 6. අන්ට-මෙමෙහෙලි යන්ට නිසෙනි හැඟි නොපවසනු. 6. අනට-සරසවිය පුදනුවනට නිස දේ.**

b. භා—1. වාක්‍යයෙහි පිණ්පා ලැබීමට යොග්‍යවූවෝ මහත් හුයි. එබැවින් "මහත්" ශබ්දයා කෙරෙන් "උන්ට" යන විබත් පස යෙදීමෙන් "මහතුන්ට" යි සිඩයි. මහාත්මයන්ට ප්‍රණිපාත කරව් යනු වාක්‍යාර්ථයි.

2. වාක්‍යයෙහි පෘෂ්ඨදන ප්‍රතිග්‍රාහකයෝ පරහුයි, එබැවින් "පර" ශබ්දයා කෙරෙන් "නට" යෙදීමෙන් "පරනට" යි සිඩයි. දුශීලයෝ සතුරන්ට පෘෂ්ඨදනය කෙරෙත් (ඉදිරියට නොයෙත්) යනු වාක්‍යාර්ථයි.

3. වාක්‍යයෙහි නිග්‍රහප්‍රතිග්‍රාහකයෝ තඹරහුයි. එබැවින් "තඹර" ශබ්දයා කෙරෙන් "ආනට" යෙදීමෙන් "තඹරානට" යි සිඩයි. විල් සෙළියෙහි රළ දෙකට බෙදා බැස්සා වූ ප්‍රභාවතියගේ වක්‍රය පදමයන්ට නිග්‍රහදනය කෙළේය යනු වාක්‍යාර්ථයි.

4. වාක්‍යයෙහි උරෙදනය කරත් හොත් තත්ප්‍රතිග්‍රාහිකාවෝ පරඟනෝයි, පෘෂ්ඨදනය කරත් හොත් තනප්‍රතිග්‍රාහකයෝ රුප්පුහුයි, එබැවින් "පරඟන-රුප්ප" ශබ්දයන් කෙරෙන් "න්ට" යෙදීමෙන් "පරඟනන්ට-රුප්පන්ට" යි සිඩයි. මහාත්මයෝ පරාඞ්ගනාවන්ට වක්ෂස හා සතුරන්ට පිට ද නොදෙත් යනු වාක්‍යාර්ථයි. මහාත්මයන් පරස්ත්‍රීන් ඉදිරියට නො පැමිණෙන බවත් සතුරන් ඉදිරියට පැමිණෙන බවත් මෙයින් සූචිතයි.

5. වාක්‍යයෙහි අභිප්‍රාය පවසත් හොත් තනප්‍රතිග්‍රාහිකාවෝ මෙහෙලියෝයි (ස්ත්‍රීහුයි.) එබැවින් "මෙහෙලි" ශබ්දයා කෙරෙන් "අන්ට" යෙදීමෙන් "මෙහෙලියන්ට" යි සිඩයි. ස්ත්‍රීන්ට නිරවශෙෂයෙන් අදහස නොපැවසිය යුතුයි. යනු වාක්‍යාර්ථයි.

6. වාක්‍යයෙහි සරසවතියගේ ඥානදන ප්‍රතිග්‍රාහකයෝ තනපූජකයෝයි, එබැවින් "පුදනු" ශබ්දයා කෙරෙන් "අනට" යෙදීමෙන් "පුදනුවනට" යි සිඩයි. සරසවතීතොමෝ පූජාකරන්නවුන්ට ඥානය දේ යනු වාක්‍යාර්ථයි.

මෙහි එකවචන බහුවචන දෙක්හි දක් වූ නිදසුන් අතුරෙන් එකවචන විෂයෙහි වූ 6 වන වාක්‍යය ද, බහුවචන විෂයෙහි වූ-1, 5 වාක්‍ය දෙක ද "දන් ඈ" යන තන්හි ඈ සදින් ගතයුතු උදාහරණයි. මේ හැර තවත් උදාහරණයෝ බොහෝ වෙත්. ඉන් ස්වල්පයක් මෙහි දක්වනු ලැබේ.

| | |
|---|---|
| **මහතුන්ට** සත්බස රිසි වේ. | **මට** රණින් කම් නැත. |
| ඇමතියා **රජහට** සැත් දරයි. | මම තා **කණසනකාට** නොතකමි. |
| **නෙරුවනට** නම කරවි. | ඒ **නෙරුවනට** පූජා වේවා. |
| **ගුණවතුන්ට** තුති කෙරේ. | **උඹට** සැප වේවා. |
| දුදනා **සුදනාට** ශාප කෙරේ. | ඒ බෙහෙත **ලෙඩාට** හිතයි. |
| (ක්‍රොධකෙරේ, ද්‍රොහ කෙරේ, ඊර්ෂ්‍යා කෙරේ,) | **බුදුන්ට** පිළිවදන් ඇස්විය. |

මේ ආදි වශයෙන් දතයුතුයි. පිණිස අරුතෙහි සපදන් විබතට නිදසුන් දක්වන්නාහු "පිණිස" යනාදිය කීහු.

<u>පිණිසඅරුත්සපදන්.</u>

a. **පිණිස නිසිනැන අට–1. සටනම නික්මිනි. 2. මගුලට සැරසිනි. 3. බුජ නම් මැඩිනි දෙන්නට ද කොටන්නට ද. මේ අරූත්හි වස් යනු ද රූසි. "බුදුවන්න වස්" ඇගි.**

**ඉති සපදන්විබත්.**

---

a. **භා**—මෙහි "සටනට, මගුලට, දෙන්නට, කොටන්නට" යන පදයෝ පිණිස අර්ථයෙහි සම්ප්‍රදානයි. මෙහි "සටන්, මඟුල්, දෙනු, කොටනු" යන ශබ්දයන් කෙරෙන් "අට" යන විබත් පසයි, එබැවින් පණිස අර්ථයට යොග්‍ය තන්හි "අට" විබත්පස වේ යයි කීහු. මේ පිණිස අර්ථය වෙනුවට පාළියෙහි "තදත්ථ" කියා ද, සංස්කෘතයෙහි "තාදර්ථ්‍ය" කියා ද ව්‍යවහාර කරණු ලැබේ. ක්‍රියාව යමක් ප්‍රයොජන කොට පවතී නම් තත් ප්‍රයොජනත්වයෙන් සලකන අර්ථය සම්ප්‍රදාන වේ. මෙහි නික්මීම සටන ප්‍රයොජන කොට ඇත්තේ ද, සැරසීම මගුල ප්‍රයොජන කොට ඇත්තේ ද වේ. බාහු මැඩීම දීම හා කෙටීම ප්‍රයොජන කොට ඇත්තේ වේ. මේ වාක්‍යයන්හි අර්ථය සටනපිණිස නික්මුනේය, මගුල පිණිස සැරසුනේය, දීම පිණිසත් සතුරන් කෙටීම පිණිසත් අත මැඩුනේය යනු යි.

මෙබඳු ඇතැම් තන්හි ප්‍රයොජනත්වයෙන් සලකන්නේ යම් යම් දේ පිළිබඳ නිවාරණ යයි,හෙවත් වැළැක්මයි."**මදුරුවන්ට** දුම් කෙරේ, **රොගයට** බෙහෙත් කෙරේ" යනාදි තන්හි තාදර්ථ්‍යය හෙවත් ක්‍රියාවෙන් ලැබෙන ප්‍රයොජනය නිවාරණ යයි. මදුරුවන් වැළැක්වීම පිණිස දුම් කෙරේ,රොගය වැළැක්වීම පිණිස බෙහෙත් කෙරේ යනු එහි අර්ථයි.

තවද පාලිසංස්කෘතයන්හි "තුං–තුම්"ප්‍රත්‍යයාන්ත වූ කෘදන්ත නෛපාතිකක්‍රියා විශෙෂයෙක් ඇත්තේ වේ. ඒ ක්‍රියා විශෙෂය ද තාදර්ථ්‍යයෙහි හෙවත් පිණිස යන අර්ථයෙහි පැවතේ. "කාතුං ගන්තුං" යනාදි යයි. සිංහලෙහි මෙබඳු ක්‍රියාවිශෙෂයෙක් නො මැත්තේ ය. සිංහලෙහි ඒ වෙනුවට "කරණු, යනු" ආදි භාව ක්‍රියාවන් කෙරෙන් යථොක්ත "අට" යන්න යෙදීමෙන් "කරන්නට, යන්නට" යනාදි වශයෙන් ද, "කරණු පිණිස, යනු පිණිස කිරීම පිණිස, යාම පිණිස" යනාදි වශයෙන් ද ව්‍යවහාර කරණු ලැබේ.

තවද සපදන් අරුත්විෂයෙහි කියනලද්දූ වූ "හට"යන්න "ඔහුහට, සිපිහුහට, වරදකළවුන්හට" යනාදි ප්‍රයොගයන්හි එක වචන බහුවචන දෙක්හි කම් විබත් පසින් පරව ද යෙදෙන බැව් පෙණේ. එබැවින් එය සපදන් අරුත හා සබඳ අරුත පවසන නිපාතයෙක් යයි සැලකිය හැකි වේ.

**සම්ප්‍රදානවිභක්තිය නිමි.**

---

6. අවදිවිබත්සුතුර.

**6. පද අත් පැවැත්මට-හිම වූයේ අවදි නම්,**
**කරණ විබත් ද ගෙන් යුත්-ට නට විනා කම්විබත්.**

6. **හා**—පදාර්ථයන්ගේ පැවැත්මට ඉම් වූ කාරකය අවදි නම් වේ. ඒ පැවසීමට "ඉන්" ආදි කරණ විබත් පස හා "ගෙන්" යන්නෙන් යුක්ත වූ "ට, නට" දෙක හැර සෙසු කම් විබත් පස ද යෙදේ.

**වි**—මෙහි "පදඅත් පැවැත්මට හිම් වූයේ" යන්නෙන් කර්තෘ හෝ කර්මය සහිත ක්‍රියාර්ථයට සීමා වූයේ යන අර්ථය ගතයුතුයි. "ධ්‍රැවමපායෙ'පාදානම්" යන පාණිනීයසූත්‍ර මශයෙන් ගත හොත් අපගමන සඞ්ඛ්‍යාත පදාර්ථප්‍රවෘත්ති විෂයෙහි ධ්‍රැවය හෙවත් ස්ථිර වස්තුව අවධි යයි ගත යුතුයි. සාමාන්‍යයෙන් සලකාත්හොත් ආධාරාධෙය වස්තු දෙකක් අතුරෙන් ආධෙය වස්තුව පහව යත්හොත් ආධාරවස්තුව ඊට අවිධි වේ හෙවත් ඉම වේ යයි සැලකිය යුතුයි. මේ අවධිය පිළිබඳ වූ මුඛ්‍යාර්ථයයි. අමුඛ්‍යවශයෙන් ගත හොත් පදාර්ථයක්හුගේ පැවැත්මට යමෙක් ඉම් වේ නම් ඒ අවධි යයි ගතයුතුයි. "පදත්‍ථං කත්තුකම්මඨං ක්‍රියම්වජ්ජන්ති තබ්බිදූ" යනු හෙයින් කර්තෘ කෙරෙහි හෝ කර්මය කෙරෙහි පිහිටි පදාර්ථය ක්‍රියා යි වියූ බැවින් මෙහි දූ "පදඅත්" යන්නෙන් කර්තෘකෙරෙහි හෝ කර්මය කෙරෙහි පිහිටි ක්‍රියාර්ථය ගතයුතුයි. එබඳු පදාර්ථයකට ඉම් වූයේ අවදි නම් වේ."අපාදාන" යනු ද මීටම නමි.

මේ අවධිකාරකය වනාහි "නිර්දිෂ්ටවිෂය, උපාත්තවිෂය, අනුමෙයවිෂය" වශයෙන් ත්‍රිවිධ වේ. යම් තැනෙක්හි අවධියට යොග්‍යවූ පදාර්ථයෙක් නිර්දිෂ්ට නම් එහි යෙදෙන අවධිය නිර්දිෂ්ටවිෂ යයි. "ගමින් පහ වේ" යනාදි වශයෙනි, මෙහි අවධියට යොග්‍යවූ "පහවේ" යන අපගමනාර්ථය නිර්දිෂ්ට බැවින්"ගමින්"යනු නිර්දිෂ්ට විෂයාපාදානයි. යම් තැනෙක්හි අවධියට යොග්‍යවූ පදාර්ථයෙක් අධ්‍යාහාර කොට ගතයුතු වේ නම් එහි යෙදෙන අවධිය උපාත්ත

විෂයාපාදන නම් වේ. "ගෙන් ගෙට ගිය, ගඟෙන් ගඟට ගිය" යනාදි වශයෙනි, මෙහි "ගෙන් නික්ම ගෙට ගිය, ගඟෙන් නික්ම ගඟට ගිය" කියා අවධියට යොග්‍ය පදාර්ථයක් හෙවත් 'නික්ම' යනාදි ක්‍රියා විශෙෂයක් අධ්‍යාහාර කටයුතු බැවින් "ගෙන්,ගඟෙන්" යනු උපාත්තවිෂයාපාදන යි. යම්කිසි ගුණවිශෙෂයක්හුගේ අඩු වැඩි ගතියකට ඉමක් වශයෙන් සලකාගත හැකි ඇතැම්පදයෝ ද අවධිවශයෙන් යෙදෙත්, ඒ අනුමෙය විෂය වශයෙනි, ඒ අවදිය සිංහලෙහි බොහෝ සෙයින් යෙදෙන්නේ සබඳ විබතෙනි. "දනවතාට වඩා නැණවතා උතුම්" යනාදි වශයෙනි, මෙහි නැණවතාගේ උතුම් බැව් පැවසීමට දනවතා ඉම් විය, එබැවින් එහි අවදි අරුත සබඳ විබත යෙදේ. මේ අනුමෙය විෂය වශයෙනි.

මේ හැර අවධිය චලාචල වශයෙන් දෙකට ද බෙදේ. එහි චචල වීමෙන් අවධි වූයේ චලාවධි යයි, "දුවන්නා වූ **අසුපිටින්** මිනිහා වැටුනේය" යනාදි වශයෙනි. චචල නුවූ ඉම අචලාවධි නම් වේ. "මිනිහා **පර්වතයෙන්** වැටුනේය" යනාදි වශයෙනි.

තවද අප්‍රාණිවාචක ශබ්දයන්ගේ අවධි අර්ථය කරණ විබත් පසින් ද, ප්‍රාණිවාචකයන්ගේ අවධි අර්ථය "ගෙන්" යොගයෙහි වූ යථොක්ත කම්විබත් පසින් ද පැවසේ, මේ "ගෙන්" යන්න හා සබඳ විබතෙහි යෙදෙන "ගේ" යන්න ද යන දෙකම විභක්ත්‍යර්ථ ද්‍යොතක නිපාත විය යුතු යි. මේ දෙකම කම් විබත් රූ ඇසුරු කොට පවතින බැව් කිහු, එහි දු අවදි අරුත පවසන "ගෙන්" යන්න නිත්‍යයෙන් ද, සබඳ අරුත පවසන "ගේ" යන්න විකල්පයෙන් ද යෙදෙන බැව් සූත්‍රොක්ත යි. පාලිසංස්කෘතයන්හි දු විභක්ත්‍යර්ථද්‍යොතක "අනු" ආදි නිපාතයෝ ඇත්තාහ, ඔවුහු ද කම්විබත් රූපයක් සමග යෙදෙත්. එවුන්ගේ යොගය වනාහි කර්මවිභක්තිරූපය සමග අව්‍යවධානත්වයෙන් වීම බොහෝ සෙයින් සිඩයි, ඇතැම් ප්‍රයොගයන්හි ව්‍යවධානත්වයෙන් ද වහර යෙදේ. "ගාමං අනු වසති" යන්නෙහි අර්ථය ගමෙහි වෙසේ යනුයි. මෙහි "ගාමං" යන කර්මවිභක්ති රූපය සමග අව්‍යවධානත්වයෙන් යෙදුනා වූ "අනු" යන්න ආධාරාර්ථද්‍යොතක වේ. මේ වාක්‍යය "ගාමං ච අනු වසති" කියා ව්‍යවධානත්වයෙන් ද යෙදේ, ගමෙහි ද වෙසේ යන අර්ථයි. සිංහලෙහි දු මේ "ගේ ගෙන්" යන දෙක කර්මවිභක්තිරූපය සමග අව්‍යවධානවශයෙන් යෙදීම බහුලව්‍යවහාරය යි, එහෙත් ඇතැම් ප්‍රයොගයන්හි ව්‍යවධාන වශයෙන් ද යෙදී තිබෙන බැව් පෙණේ,අමාවතුර ආදියෙහි වූ "අප ද ගේ, සෙස්සනු දු ගේ" ආදි ප්‍රයොගයෝ ඊට සාධකයි,අවධි අර්ථය පැවසීමට කර්මවිභක්තිරූපය සමග "තෙක්, දක්වා" යන නිපාත දෙක ද යෙදේ. ඒ මෙහි උදාහරණ විෂයෙහි පැවසේ. මොහි නිදසුන් දක්වන්නාහු "කතක්" යනාදිය කිහු.

**a. ඉන්-කාතාක් මහසතු සෙලින් හෙළූ. 2. එන්-දෙව්දත් දූහැනෙන් පිරිහිනි. 3. තෙන්-රුක්තෙන් හිනි විලිමුවා. 4. අගෙන්-හිරියගෙන් තොරි නිවට. 5. උගෙන්-සොරුගෙන් බිය වේ. 6. ආගෙන්-නොතහවුරු පරගෙන් ගතු 7. හුගෙන්-සවණක් කඳුඹු මුනිඳුහුගෙන් දිවේ. මේ ඈ සොදනු.**

a. **හා**—මෙහි-1 වාක්‍යයෙහි මහසතුගේ හෙළීම් සඞ්ඛ්‍යාත පදාර්ථප්‍රවෘත්තියට ඉම් වූයේ සෙලයි,එබැවින් ඒ පැවසීමට "සෙල්" ශබ්දයා කෙරෙන් "ඉන්" ප්‍රත්‍යය යෙදීමෙන් "සෙලින්" යි සිඩයි. කානතාවක් තොමෝ මහාසත්ත්වයා පර්වතයෙන් හෙළීය යනු එහි අර්ථයි.

2. වාක්‍යයෙහි දෙව්දත්හුගේ පිරිහීම් සඞ්ඛ්‍යාත පදාර්ථ ප්‍රවෘත්තියට ඉම් වූයේ දූහැනයි. එබැවින් "දූහැන්" ශබ්දයා කෙරෙන් "එන්" ප්‍රත්‍යය යෙදීමෙන් "දූහැනෙන්" යි සිඩයි. දෙව්දත් තෙමේ ධ්‍යානයෙන් පිරිහුනේ ය යන අර්ථයි.

3. වාක්‍යයෙහි විලිමුවාගේ පතිතවීම් සඞ්ඛ්‍යාත පදාර්ථ ප්‍රවෘත්තියට ඉම් වූයේ රුකායි, එබැවින් "රුක්" ශබ්දයා කෙරෙන් "තෙන්" යන විභක්තිප්‍රත්‍යය යෙදීමෙන් "රුක්තෙන්" යි සිඩයි. වලිමුඛ තෙමේ රුකෙන් වැටුනේය යන අර්ථයි.

4. වාක්‍යයෙහි නිවටහුගේ තොරවීම් සඞ්ඛ්‍යාත් පදාර්ථප්‍රවෘත්තියට ඉම් වූයේ හිරිය යි, එබැවින් "හිරි" ශබ්දයා කෙරෙන් "අ" යන කම්විබත් පස හා "ගෙන්" යන්න යෙදීමෙන් "හිරිය ගෙන්" යි සිඩයි. නිගණ්ඨතෙමේ ලජ්ජාවෙන් තොර විය යන අර්ථයි·

5. වාක්‍යයෙහි බියවීම් නැමැති පදාර්ථප්‍රවෘත්තියට හිම්වූයේ සොර යි, එබැවින් "සොර" ශබ්දයා කෙරෙන් "උ" යන් කම්විබත් ,පස හා "ගෙන්" යන්න යෙදිමෙන් "සොරුගෙන්" යි සිඩයි. චෞරයා කෙරෙන් බිය වේ යන අර්ථයි.

6. වාක්‍යයෙහි ගැණීම් සඞ්ඛ්‍යාත පදාර්ථප්‍රවෘත්තියට ඉම්වූයේ පරයි, එබැවින් "පර" ශබ්දයා කෙරෙන් "ආ" යන කම්විබත් පස හා "ගෙන්" යෙදීමෙන් "පරාගෙන්" යි සිඩයි. අන්‍යයාගෙන් ගත් දේ ස්ථාවර නොවේ යන අර්ථයි.

7. වාක්‍යයෙහි සවණක් කඳුඹු දිවීම් සඞ්ඛ්‍යාත පදාර්ථප්‍රවෘත්තියට ඉම් වූයේ මුනිඳුයි, එබැවින් "මුනිඳු" ශබ්දයා කෙරෙන් "හු" යන කම්විබත්පස හා "ගෙන්" යෙදීමෙන් "මුනිඳුහුගෙන්" යි සිඩයි. ෂඩ්වර්ණරශ්මිය මුනීන්ද්‍රයා කෙරෙන් ධාවනය වේ යන අර්ථයි. **මේ ආදි උදාහරණ යෙදිය යුතුයි.**

මෙහි සූත්‍රොක්ත ප්‍රත්‍යයයන්ට නිදසුන් සොළොසක් යෙදිය යුතුයි, අවශෙෂ නිදසුන් යොදාගත හැකි බැවින් මෙයින් සාඞෙපකරණ ලද්දේය. මෙසේ නිදසුන් සතක් පමණක් දක්වා අවධිය පිළිබඳ විශෙෂයන් දක්වන්නාහු "මෙඅරුත්හි" යනාදිය කිහු.

a. **මෙ අරුත්හි තෙක් දක්වා යනු ද රූයි. දිය තෙක් සෙවණ බඳනා. පැලලුප් නුවර දක්වා වහරේ වටි. ඇගි.**

b. **වරින් වර රිවිහු කෙරෙන් සිසි දුරු වේ. මෙ ඈ වෙන් අරුත් සඳින් වෙ.**

a. **භා**—මේ අවධිඅර්ථය පැවසීමෙහි "තෙක් දක්වා" යන නිපාත දෙක ද සිංහල ජේකායන්ට අභිමත විය. "දිය තෙක්" යනාදිය ඊට උදාහරණයි. ලොකය පැතිර ජායාව බඩ ජෙ. පැලලුප් නුවර ඉම් කොට හෙවත් පැලලුප් නුවර හැර සෙසු තන්හි වශීාව වසී යනු වාක්‍යාවයෙහි අර්ථයි.

**වි**—මේ "තෙක්, දක්වා" යන දෙකෙන් පවසන අවධිය පූර්වොක්ත අවධි අර්ථයට සම නොවේ. පූර්වොක්ත අවධිය වනාහි යම් කිසි පදාර්ථයක්හුගේ පහවීම් ආදියට ඉමක් වන බැව් ප්‍රකාශ කෙරේ. යමක් ඉම් කොට ක්‍රියාප්‍රවෘත්තිය වේනම් "තෙක්, දක්වා" යන දෙකෙන් පැවසෙන්නේ එබඳු අවධියෙකි, එහි දූ ඉම් වූවහු සමග ම ක්‍රියාප්‍රවෘත්තිය වේ නම් "තෙක්" යන්නෙන් එබඳු අවධියක් ද, ඉම හැර ක්‍රියාප්‍රවෘත්තිය වේ නම් "දක්වා" යන්නෙන් එබඳු අවධියක් ද පැවසේ. "සඳුදා තෙක් අවකාශකාල යයි" කී කල්හි සඳුදාත් සමග අවකාශකාලය බැව් ද "සඳුදා දක්වා අවකාශකාලය යි" කී කල්හි සඳුදා හැර ඉරිදා තෙක් අවකාශකාලය බැව් ද මේ අර්ථයෙහි ලා සැලකිය යුතුයි. සංස්කෘතයෙහි මේ දෙක පිළිවෙළින් "අභිවිධි, මර්‍යාදා" යි ව්‍යවහාරකරණු ලැබේ.

b. **භා**—"වරින් වර රිවිහු කෙරෙන් සිසි දුරු වේ" යනු නිදර්ශන කොට සමීපාර්ථවාචක ශබ්ද කෙරෙනුදු අවදි විබත වන බැව් කිහු. අවධි වූ ශබ්දය සබඳ විබතින් යුක්ත වීමත්, ඔහු කෙරෙන් පරව සිටින සමීපාර්ථවාචක ශබ්දයෙන් අවදි විබත්පස යෙදීමත් මෙහි රීතියයි. මෙහි "රිවි" ශබ්දය අවධි යයි, ඔහු කෙරෙන් සබඳ අරුතෙහි "හු" යන්න යි, ඉන් පරව සිටි "කර" ශබ්දය සමීපාර්ථ යි, ඉන් පරව "එන්" විබතයි, එකල්හි "රිවිහු කෙරෙන්" යන්නේ අර්ථය සූර්‍ය්‍යයාගේ සමීපයෙන් යනුයි, විටින් විට සූර්‍ය්‍යයාගෙන් චන්ද්‍රයා දුරු වේ යනු වාක්‍යාර්ථයි. මේ සිංහල භාෂාවෙහි අවධි අර්ථය ඉතා ප්‍රකට කිරීම පිණිස වූ ව්‍යවහාරයෙකි.

මින් පසු විශේෂ්‍යාර්ථ වශයෙන් පවත්නා අවදිවිබත් දැක්වීම සඳහා "නරන් කෙරෙන්" යනාදිය කිහු.

**a, නරන් කෙරෙන් කැත් උතුම. රුවනතුරෙන් මහගු රත්මැණ. සන්නස්ගෙන් දුවා සෙදහල්. මෙ ඈ නිදරුණරුත අවදි විබත් රූයි. දූගුණකිරිය ලකුණෙන් සමුදයින් එක් දෙසක්හු වෙන් කිරීම් නිදරුණ නම්.**

**b. බමුණු බරණැසැ සිට එයි. මෙ ඈ සිම්වුව ද පදතුරු ඍසගින් අත්විබත් ගණි.**

**ඉති අවදිවිබත්.**

---

a. **භා**—මිනිසුන් කෙරෙන් ක්ෂත්‍රිය තෙමේ උත්කෘෂ්ටයි, රත්නයන් අතුරෙන් රක්තමාණික්‍යය මහාර්ඝයි, ගමන් කරන්නන් ගෙන් ධාවනය කරන්නේ ශීඝ්‍රයි. මේ ආදියෙහි වූ අවදි විබත නිර්ධාරණාර්ථ වශයෙන් අභිමත යයි කියා නිර්ධාරණාර්ථය වර්ණනා කරන්නාහු "දූගුණකිරියලකුණෙන්" යනාදිය කීහු. උත්කර්ෂ වූ හෝ අපකර්ෂ වූ ජාතිලක්ෂණයක් හෝ ගුණලක්ෂණයක් හෝ ක්‍රියා ලක්ෂණයක් හෝ කාරණ කොට ගෙණ සමූහයකින් එක් කොටසක් වෙන් කිරීම නිර්ධාරණ නම් වේ.

වි—මේ නිර්ධාරණයෙහි වනාහි නිර්ධාර්යමාණ නිර්ධාරණහේතු නිර්ධාරණාශ්‍රය යයි තුනක් ඇතිවිය යුතුයි. එහි වෙන් කරණු ලබන වස්තුව නිර්ධාර්යමාණ නම් ද, වෙන් කිරීමට හේතු වූ ලක්ෂණය නිර්ධාරණහේතු නම් ද, යම් සමූහයකින් වෙන්කරණු ලැබේ නම් ඒ සමූහය නිර්ධාරණාශ්‍රය නම් ද වේ. එයින් අවදි විබත් ඇසුරු කරන්නේ නිර්ධාරණාශ්‍රය යි.

මෙහි "කැත්" යන්නෙන් ගම්‍යමානවූයේ නිර්ධාර්යමාණයි. වෙන් කරණු ලැබූ වස්තුව බැවිනි. කැත් යන ජාතිය නිර්ධාරණ හේතු යි. නරයෝ නිර්ධාරණාශ්‍රය යි. එබැවින් ඒ අවදි විය. මේ ජාතිනිර්ධාරණයි.

දෙවන උදාහරණයෙහි "රත්මැණ" නිර්ධාර්යමාණ යි. එහි වූ "රත්" යන ගුණය නිර්ධාරණ හේතු යි. සාමාන්‍ය වූ මැණ මහාර්ඝ භාවයෙන් වෙන් කිරීමට ඒ හේතු වූ බැවිනි. රුවන් නිර්ධාරණාශ්‍රයයි. එබැවින් ඒ අවදියි මේ ගුණ නිර්ධාරණ යයි. මෙහි නිර්ධාරණයට හේතුවූයේ "මහගු" යන ගුණ යයි සමහරු කියති. එසේ නම් පළමු උදාහරණයේ "උකට" යන්න ද, තෙවෙනි උදාහරණයේ "සෙදහල්" යන්න ද නිර්ධාරණ හේතු විය යුතු යි, සුදු

නිල් ආදි මැණික් සමූහයක් අතුරෙහි රත් මැණික් තුබුනොත් එහි අගනා මැණික ඒ යයි වෙන්කර ගැණීමට හෙතුවන්නේ එහි වූ රක්තවර්ණය බැවි සිතා ගැණීම දුෂ්කර නොවන බැවින් ඒ සඳහා වර්ණනය කිරීම වුවමනා නොවේ.

තෙවන උදාහරණයෙහි "දුවා" යන්නෙන් ගම්‍යමාන පුරුෂයා නිර්ධාර්‍ය්‍යමාණයි, ධාවනක්‍රියාව නිර්ධාරණ හෙතුයි. යන්නාහු නිර්ධාරණාශ්‍රය යි. එබැවින් ඒ අවදියි. මේ ක්‍රියා නිර්ධාරණයි.

බොහෝ පාලිසංස්කෘතව්‍යාකරණයන්හි සංඥනිර්ධාරණය ද දක්වන ලද්දේය. "ඒ වගීයෙහි ඉගෙණගන්නවුන්ගෙන් වික්‍රමසිංහ දක්ෂ යි" යන තන්හි "වික්‍රමසිංහ" යන නාමයෙන් ගම්‍යමානවූයේ නිර්ධාර්‍ය්‍යමාණ යයි ද, ඒ නාමය නිර්ධාරණහෙතු යයි ද, ඒ වගීයෙහි ඉගෙණගන්නාහු නිර්ධාරණාශ්‍රය යි ද සැලකිය යුතුයි.

b. **සා**—"බමුණු බරණැසැ සිට එයි" යන මේ ආදි තන්හි "බරණැස" බමුණාගේ ආගමනක්‍රියාවට ඉම් වුවත් "සිට" යන පෙර කිරියට ආධාරත්වයෙන් සිටි බැවින් අවදි නොව "බරණැසැ" යි අදරවිබත් විය. "සිට" යන් පෙරකිරිය නැත් නම් "බරණැසින්" කියා අවදි විබත් යෙදේ. මෙසේ යෙදෙන අවදි විබත ත්‍යා(ල්‍යප්) ලොපයෙහි (පූර්වක්‍රියා ලොපයෙහි) අවධි යයි පාලිසංස්කෘතයන්හි නිර්දිෂ්ටයි. ඇතැම් වාක්‍යයන්හි පෙරකිරිය ලොප් කොට ඒ පෙරකිරියට කම් වශයෙන් හෝ ආධාර වශයෙන් සිටි පදය අවධි වශයෙන් යෙදේ. සිංහලෙහි ද එසේ යෙදෙන බැවි පෙණේ පාලියෙහි "සො භික්ඛු විනයං අධීයිත්වා, විනයෙ ඨත්වා වා පඤ්හං පුච්ඡති" යන වාක්‍යයෙහි "අධීයිත්වා" යන පෙරකිරියට "විනයං" යනු කම්යි. "ඨත්වා" යන පෙරකිරියට "විනයෙ" යනු ආධාරයි. ඒ පෙරකිරිය දෙක ලොප් කොට "සො භික්ඛු විනයා පඤ්හං පුච්ඡති" යි යෙදිය හැකි වේ. එකල්හි "විනයා" යනු අවදියි. මේ වාක්‍යය සිංහලෙහි ද "ඒ මහණ විනයෙන් පැණ පිළිවිසී" යි යෙදේ. මෙහි අදහස "ඒ මහණ තෙමේ විනය දූන හෝ විනයෙහි පිහිටා පැණ පිළිවිසී" යනුයි.

**දුරින්** හැතැප්මයි. **මවුපසින්** පිරිසිදුයි. **පොළොවෙන්** මිහිරන් උපදී. **සමනළකන්දෙන්** කැලණිගඟ ගලා බසී. **මසකින්** අවසන් වේ. **උසින්** නවවියත යි. **වියරණින්** පැණ පිළිවිසී. **ගුරුන්ගෙන්** සතර උගණී" මේ ආදි ප්‍රයොගයන්හි ද "දුරින්" යනාදිය අවදි යයි සැලකිය යුතුයි.

**අවධිවිභක්තිය නිමි.**

## සබඳවිබත්සුතුර.

**7. සබඳ වෙසෙසන වන-උනුත් පිළිබඳ වත්තෙත්,**
**සපදන් තම්විබත් සව්-ගෙයුතු වියුතු ද සම වේ.**

7. **භා**—අන්‍යොන්‍ය ප්‍රතිබද්ධ වස්තු දෙකක් අතුරෙන් විශෙෂණ වස්තුව සම්බන්ධ නම් වේ. ඒ සම්බන්ධාර්ථය පැවසීමෙහි ලා සපදන් විබත මුලුල්ල ම යෙදේ. හුදකලා නාම්විබත්පස හෝ "ගේ" යන්න සමග යෙදෙන නාම්විබත් පස හෝ යෙදේ.

**වි**—"රජුගේ පුරිස්" කී කල්හි රජ තෙමේ පුරුෂයා පිළිබඳ වූයේ ද පුරුෂ තෙමේ රජ පිළිබඳ වූයේ ද වේ. එබැවින් ඒ දෙක අන්‍යොන්‍යප්‍රතිබද්ධ වස්තු දෙකෙකි, මේ දෙකෙන් එකෙක් අධීන භාවයෙන් සිට අනෙක වෙන්කර ගැණීමට විශෙෂණවූයේ සම්බන්ධ නම් වේ. මෙහි ඊට විශෙෂණ වූයේ රජයි, එබැවින් ඔහුගේ ඒ සම්බන්ධිත්වය පැවසීමට "උ" යන නාම්විබත්පස හා "ගේ" යන්න යෙදීමෙන් "රජුගේ" යි විය. මෙහි "රජුගේ" යන්න විශෙෂණත්වයෙන් සැලකිය · යුතු වන්නේ සියල්ලට සාධාරණ වූ "පුරිස්" යන්න එයින් වෙන් කළ බැවිනි. සාමාන්‍ය යෙන් සලකත් හොත් සබඳ විබත වනාහි ඒ හා සම්බන්ධවන්නා වූ අන්‍යවස්තුහුගේ ස්වාමිත්වය හෝ අධීනත්වය පවසන විබත යයි සැලකිය යුතුයි. එබැවින් ම පාළියෙහි සම්බන්ධයට සාමි යයි ද කියනු ලැබේ. "සාමිස්මිං ඡට්ඨී" යනු එහි සූත්‍රයි. ස්වාම්‍යර්ථයෙහි ෂෂ්ඨිය වේ යනු එහි අර්ථයි.

ඒ ඒ වස්තූන්ගේ අන්‍යොන්‍ය සම්බන්ධිත්වය වනාහි නොයෙක් ක්‍රමවලින් විය හැකි වේ. එබැවින් ඉන් ස්වල්පයක් පැවසීම පිණිස පාලිසංස්කෘත වෛයාකරණයෝ-සම්බන්ධය "ජන්‍යජනක, සෙව්‍ය සෙවක, වාච්‍යවාචක, අවයවාවයවි, විකාර විකාරි, පරිමාණ පරිමෙය, පූරණපූරයිතව්‍ය" ආදි වශයෙන් නන්වැදෑරුම් යයි කීහු.

ජන්‍යජනක-**රජුගේ පුත්** මෙහි-පුත් ජන්‍යයි, රජ ජනකයි.
සෙව්‍යසෙවක-**රජුගේ පුරිස්** „ රජ සෙව්‍යයි, පුරිස් සෙවකයි.
වාච්‍යවාචක-**ශබ්දයාගේ අර්ථය** „ අර්ථය වාච්‍යයි, ශබ්දය වාචකයි.
අවයවාවයවි-**වෘක්ෂයාගේ ශාඛාව** „ ශාඛාව අවයවයි, වෘක්ෂය අවයවියි.
විකාරවිකාරි-**උක්වල සීනි** „ සීනි විකාරයි, උක් විකාරියි.
පරිමාණපරිමෙය-**විවල පත** „ පත පරිමාණයි, වි පරිමෙයයි.
පූරණපූරයිතව්‍ය-**වස්සානයාගේ දෙවනමස** „ වස්සාන පූරයිතව්‍යයි, (දෙවනමස පූරණයි.

මෙලෙසින් ඇතිවිය හැකි සම්බන්ධයෝ බොහෝ වෙත්, ඔවුහු ඒ ඒ තන්හි යෙදෙන පරිද්දෙන් දතයුතුසි. සබඳවිබතෙහි නිදසුන් දක්වන්නාහු "කශ්‍යේකිමි" යනාදිය කීහු.

a. **1. හට-කශ්‍යේකිමි නමහට කිස තබා අඹරෝරට නැඟේ. 2. අට-තිලොවට ගුරු. 3. උට-මුනිඟිරුට විනේනඹරගු සුපැක්හු. 4. ආට-කුළුණැතියාට කො පරහු. 5. අගේ-ගිරිඳුවගේ හිමි නිල්ගෙලේ. 6. උගේ-සඳුගේ පින් සොමි. 7. ආගේ-තුනු වගාගේ පසසරැ සරසඳ මදමරු වසන් වන ඈ. 8. හුගේ-සැසිහුගේ සාහගෙවස් දැරීමෙහි නිවට හන්සළු පිළිගත්. 9. ගෙවියුන් අ-හිරිවමිය පියසාම උඹිඳු. 10. ගෙවියුන් ආ-ගුණෙනින් ගුම් දුම් ගොනා මියුරු රඟ ගත්. 11. ගෙවියුන් හු-රජහු අණ නොලහු. ගම් ඈ සොදනු.**

a. **භා**—මෙහි-1 වාක්‍යයෙහි "නම-කිස" යන දෙදෙනාගේ සම්බන්ධ යසි, එහි "නම" යන්න විශෙෂණත්වයෙන් සිට කිසෙහි ස්වාමිත්වය හෝ අධිනත්වය කරණ හෙයින් ඉන් පරව "හට" යන විභක්තිප්‍රත්‍යය යෙදීමෙන් "නමහට" යි සිඩයි. කණ මැදිරියා නමාගේ කෘත්‍යය තබා අහස්කුහරයට නැඟේ යනු වාක්‍යාර්ථ යි.

2. වාක්‍යයෙහි "තිලෝ-ගුරු" යන දෙදෙනාගේ සම්බන්ධය යි. මෙහි තිලොව ගුරුහුගේ අධීනත්වයෙහි සිටි බැවින් ඒ පැවසීමට "තිලෝ" ශබ්දයා කෙරෙන් "අට" විභක්තිය හා වකාරාගමයෙන් ද මාත්‍රාහානියෙන් ද "තිලොවට" යි සිඩයි, තුන්ලෝවැසියාගේ ගුරුයි යන අර්ථයි.

3. වාක්‍යයෙහි "මුනිඹිර-සුපක්" යන දෙදෙනාගේ සම්බන්ධ යසි, එහි මුනිඹිර සුපක්ෂයන්ගේ අධීනත්වයෙහි සිටි බැවින් ඒ පැවසීමට "මුනිඹිර" ශබ්දයෙන් පරව "උට" විභක්තිය යෙදීමෙන් "මුනිඹිරුට" යි සිඩයි. විනෙය ජන නමැති තාමරසයෝ මුනිඹිරුගේ සුපක්ෂයෝ යි යනු වාක්‍යාර්ථයි. සෙසු උදාහරණ ද මේ පිළිවෙළින් දතයුතුයි.

4. වාක්‍යයෙහි "කුළුණැති-පර" යන දෙදෙනාගේ සම්බන්ධ යයි. එබැවින් "කුළුණැති" ශබ්දයා කෙරෙන් "අට" යන විභක්තිය හා යකාරාගම වීමෙන් "කුළුණැතියාට" යි සිඩයි. කරුණාවන්ත යාගේ සතුරෝ කවරහු ද යනු අර්ථයි.

5. වාක්‍යයෙහි "ගිරිඳු-හිමි" යන දෙදෙනාගේ සම්බන්ධය යි, එබැවින් ඒ පැවසීමට "ගිරිඳු" ශබ්දයෙන් පරව 'අ' යන කම්විබත් පස හා ගේයන්න යෙදී යකාරාගම හා මාත්‍රාහානි වීමෙන් "ගිරිදුවගේ"යි සිඩයි. පාර්වතියගේ ස්වාමියා නීලකණ්ඨයා යි යනු අර්ථයි.

6. වාක්‍යයෙහි "සඳ-පිත්" දෙදෙනාගේ සම්බන්ධයයි, එබැවින් ඒ පැවසීමට "සඳ" ශබ්දයා කෙරෙන් පරව "උ" යන කම්විබත් පස හා "ගේ" යන්න යෙදීමෙන් "සඳුගේ" යි සිඩයි, චන්ද්‍රයාගේ පුත්‍රයා සෞම්‍ය යි හෙවත් බුධයි යන අර්ථයි.

7. වාක්‍යයෙහි "තුනුවඟ-පසසර" දෙදෙනාගේ සම්බන්ධයයි. එබැවින් ඒ පැවසීමට "තුනුවඟ" ශබ්දයා කෙරෙන් "ආ" යන කම් විබත් පස හා "ගේ" යන්න යෙදීමෙන් "තුනුවඟාගේ" යි සිඩයි. අනඞ්ගයාගේ පඤ්චවාරිහු නම් ශරචවක්‍ෂ මන්‍දමාරුත වසන්ත වන ආදීහුයි යන අර්ථයි.

8. වාක්‍යයෙහි "සැසී-දුරිම" යන දෙදෙනාගේ සම්බන්ධයයි, එබැවින් ඒ පැවසීමට "සැසී" ශබ්දයෙන් පරව "හු" යන කම් විබත් පස හා "ගේ" යන්න යෙදීමෙන් "සැසිහුගේ" යි සිඩයි. ශාක්‍යසිංහයාගේ කාෂාය වෙශධාරණයේදී බඹ තෙමේ ඇඳි වත් පිළිගත්තේ ය යන අර්ථයි.

9. වාක්‍යයෙහි "සිරිවමි-පියතම" දෙදෙනාගේ සම්බන්ධයයි, එබැවින් ඒ පැවසීමට "සිරිවමි" ශබ්දයෙන් පරව 'අ'යන විබත්පස හා යකාරාගම වීමෙන් "සිරිවමිය" යි සිඩයි. ශ්‍රීකාන්තාවගේ වල්ලභයා උපෙන්‍ද්‍ර යි යන අර්ථයි.

10. වාක්‍යයෙහි "දුම්යොන්-ගුම්" යන දෙදෙනාගේ සම්බන්ධයයි. එබැවින් ඒ පැවසීමට "දුම්යොන්" ශබ්දයා කෙරෙන් පරව "ආ" යන විබත් පස යෙදීමෙන් "දුම්යොනා" යි සිඩයි. මයූර තෙමේ ධූමයොනිහුගේ ඝොෂය අසමින් නැටීම පටන්ගත්තේය යන අර්ථයි.

11. වාක්‍යයෙහි 'රජ-අණ" දෙදෙනාගේ සම්බන්ධය යි. එබැවින් ඒ පැවසීමට "රජ" ශබ්දයා කෙරෙන් "හු" යන විබත්පස යෙදීමෙන් "රජහු" යි සිඩයි. රජුගේ ආඥාව උල්ලඞ්ඝනය නොකරව යන අර්ථයි. මේ ආදිය යොදගතයුතුයි.

මෙහි දක්වන ලද්දේ නිදසුන් එකොළොසයි, එහෙත් මෙහි සම්පූර්ණවශයෙන් නිදසුන් දක්වත් හොත් සූතිසක් පමණ දක්විය යුතුයි. සෙසු නිදසුන් මේ අනුසාරයෙන් දතයුතුයි. ඉක්බිති සම්බන්ධ විභක්තිහුගේ විශෙෂාර්ථයන් දක්වන්නාහු "සියපානට වඩා" යනාදිය කීහු.

b. **සියපානට වඩා සේගමනපා සපු මෙන්. 2. පැලලුප් නුවරට රජගහ නුවර සන්යොන්නෙක්. 3. මහබෝමැඩට ඉසාන කොන්හි. රුවන් සක්මණ. මේ ඇගි අවදිඅරුත්හි සබඳවිබත් රුසි.**

**ඉති සබඳවිබත්.**

b. **හා**—මේ වාක්‍යයන්හි “සියපාතට, පැළලුප්නුවරට, මහබෝමැඩට” යන තුන්තන්හි සබඳවිබත අවදි අරුත් වශයෙන් යෙදුනේ වේ. මෙහි 1 වාක්‍යයෙහි අපාදක වූ සපියාගේ ගමනෙහි ඡේකභාවය පැවසීමට ශතපදිකයා හෙවත් පත්තෑයා ඉම් කරණ ලද බැවින් “සියපා” යන්න අර්ථ වශයෙන් අවධියි, එහෙත් වහරෙහි සබඳවිබත් පස යෙදීමෙන් “සියපාතට” යි සිඩයි. 2 වාක්‍යයෙහි පැළලුප්නුවර හා රජගහනුවර අතර දූරප්‍රමාණය පැවසිමට පැළලුප්නුවර ඉම් කරණ ලද බැවින් පැළලුප් නුවර අර්ථවශයෙන් අවධියි, එහෙත් වහරෙහි සබඳ විබත් පස යෙදීමෙන් “පැළලුප් නුවරට” යි සිඩයි. 3 වාක්‍යයෙහි රුවන්සක්මණ පිහිටි පෙදෙස පිරිසිඳීමට මහබෝමැඩ ඉම්කරණලද බැවින් මහබෝමැඩ අර්ථ වශයෙන් අවධියි, එහෙත් වහරෙහි සබඳවිබත් පස යෙදීමෙන් “මහබෝමැඩට” යි සිඩයි.

**වි**—“**නැගෙනහිරට** ත් **දකුණට** ත් අතර ගිනිකොණයි.” යන තන්හි ගිනිකොණ පිරිසිඳීමට නැගෙනහිර දකුණ යන දෙකම අවධි වේ. එබැවින් ඒ දෙතන්හිම අවදිඅරුත සබඳවිබති. “**ඌට** වඩා මේ හපනා, **මීට** වඩා ඒක හොඳයි” යනාදි වශයෙන් අවදිඅරුත සබඳ විබත යෙදෙන ප්‍රයොගයෝ බොහෝ වෙත්. භාෂානුසාරයෙන් දතයුතුයි.

පාලිසංස්කෘතයන්හි කර්මාර්ථ කර්ත්‍රර්ථ භාවාර්ථයන්හි සිඩ වූ කෘදන්ත ක්‍රියාවන්ගේ කර්මය හෝ කර්තෘ බොහෝ සෙයින් සබඳ විබත් ඇසුරු කෙරේ. සිංහලෙහි ද භාවක්‍රියාවට යෙදෙනකර්මය හා කර්තෘ බොහෝසේ සබඳවිබත ඇසුරු කෙරේ.

| **සංස්කෘත.** | **සිංහල.** |
|---|---|
| කර්මරුත සබඳ-**භාරතස්‍ය** ශ්‍රවණම්. | **භාරතයාගේ** ඇසීම. |
| කතුඅරුත ,, -**ව්‍යාසස්‍ය** කෘතිඃ. | **ව්‍යාසයාගේ** කිරීම. |

සිංහලෙහි කර්මකාරක ආඛ්‍යාතවිෂයෙහි යෙදෙන කර්තෘ ද බොහෝ තන්හි සබඳවිබත ඇසුරු කෙරේ, “ඔහුට දුර පෙණේ” යනාදි වශයෙනි. මෙහි “ඔහුට” යනු කර්තෘඅර්ථයෙහි සම්බන්ධයි. මේ හැර තවත් බොහෝ තන්හි සබඳවිබත යෙදේ.

| | | |
|---|---|---|
| ඔහුට රිදේවි. | **පවට** භයයි. | **ලෙඩට** හිතයි. |
| **වැඩට** දක්‍ෂයි. | **ගමට** කිට්ටුයි. | **කයට** සැපයි. |
| **කටට** රසයි. | **ඊට** හුරුයි. | **මට** හොඳයි. |
| **මට** වුවමනා නැහැ. | **මස්කට** වරක්. | **පිණට** සතුටුයි. |
| **දවසට** පැය හැට්යි. | **අනට** දූනේ. | **කුලයට** උතුම්. |

මේ ආදි වශයෙන් දතයුතුයි. සබඳ විබතින් යුත් පදය අනෙකක් හා සම්බන්ධය ලබන බැවින් සබඳ විබත භාෂාවෙහි බොහෝ තන්හි පැතිර පවත්නා විබතක් බැව් සැලකිය යුතුයි.

**සම්බන්ධවිභක්තිය නිමි.**

---

8. අදරවිබත්සුතුර.

**8. කතු කම් බැරි කිරිය-දරණුයෙ අදර නම් වෙ,**
**එකබස එහි ඒ හි ඇ-බුහු අන්බස අන්හි වෙ.**

8. **භා**—කර්තෘට හෝ කර්මයට හාරවූ හෙවත් කර්තෘ කෙරෙහි හෝ කර්මය කෙරෙහි පිහිටියා වූ ක්‍රියාව දරන්නේ ආධාර නම් වේ. ඒ ආධාරාර්ථය එකත්වයෙන් පැවසීමෙහි "එහි ඒ හි ඇ" යන විබත්පස සතර හා බහුත්වයෙන් පැවසීමෙහි "අන්හි" යන විබත් පස ද යෙදේ.

වි—ක්‍රියාර්ථය දරණ අර්ථයෙන් ආධාරය යි කියනු ලැබේ. ක්‍රියාධාරණය වනාහි ප්‍රත්‍යක්ෂ අප්‍රත්‍යක්ෂ වශයෙන් දෙපරිදි වේ. එහි-කර්තෘ හෝ කර්මය ප්‍රත්‍යක්ෂ වශයෙන් ක්‍රියාර්ථය දරන්නේ ද, ආධාරය අප්‍රත්‍යක්ෂ වශයෙන් ක්‍රියාර්ථය දරන්නේ ද වේ. "මිනිහා ඇඳෙහි නිදයි" කී කල්හි ක්‍රියාර්ථය නිදීමයි, ඒ වනාහි ප්‍රත්‍යක්ෂ වශයෙන් කර්තෘ කෙරෙහි හෙවත් මිනිහා කෙරෙහි පිහිටියේ වේ, නිදීම මිනිහා පිළිබඳ ව්‍යාපාරයක් බැවිනි, අප්‍රත්‍යක්ෂ වශයෙන් ඇඳ කෙරෙහි ද පිහිටියේ වේ. එහි ක්‍රියාව වනාහි කර්තෘහට මූවහ වීමෙන් ඇඳ කෙරෙහි පිහිටියේ වේ. එබැවින් ඒ දැරීම අප්‍රත්‍යක්ෂ යි. මේ කර්තෘට හාරවූ ක්‍රියාධාරණ යයි. "සැළියෙහි බත පිසයි" කී කල්හි ක්‍රියාර්ථය පිසීමයි, පිසීම නම් මෙලෙක්වීම හෝ බුරුල් වීමයි, ඒ අර්ථය ප්‍රත්‍යක්ෂ වශයෙන් බත කෙරෙහි පිහිටියේ වේ. ඒ මෙලෙක්වීම හෝ බුරුල්වීම බත පිළිබඳ බැවිනි. අප්‍රත්‍යක්ෂ වශයෙන් සැළිය කෙරෙහි පිහිටියේ වේ. කර්මය වූ බතට මූවහ වීමෙන් සැළිය කෙරෙහි පිහිටි බැවිනි. මේ කර්මයට හාර වූ ක්‍රියාධාරණයයි, මේ තත්ත්වය සලකා පාළි බාලාවතාරයෙහි "යො ක්‍රියාතිස්සයභූතානං කත්තු කම්මානං පතිට්ඨා තං ඔකාසං නාම" යනු කීය. ක්‍රියාවට ආශ්‍රය ස්ථාන වූ කර්තෘකර්මයන්ට පිහිටවූ කාරකය ඔකාශ හෙවත් ආධාර නම් වේ යනු එහි අර්ථයි. මේ කාරකයට අධිකරණ යයි ද කියනු ලැබේ.

ආධාරයක් ඇති තන්හි ආධෙයයක් ද ඇතිවිය යුතුයි. දරණ කර්තෘ ආධාරයි, ඔහු විසින් දැරියයුත්ත ආධෙය යි, ඒ ආධාරය විසින් ආධෙයය සතර පරිද්දෙකින් දරණු ලැබේ. එනම්:-

"ඖපශ්ලේෂික, වෛෂයික, සාමීප්‍යක, අභිව්‍යාපක" වශයෙනි. එහි-ආධෙයවස්තුව එක් දෙසක් වැලඳ ගැණීමෙන් දරන්නේ ඖපශ්ලේෂිකාධාරයි. "මිනිහා ඇඳෙහි නිදයි" යන තන්හි ඇඳ ආධෙය වූ මිනිහාගේ එක් දෙසක් වැලඳ ගැණීමෙන් දරණ බැවින් "ඇඳෙහි" යනු ඖපශ්ලේෂිකාධාරයි. ආධෙය වස්තුවට විෂය වූවක්ව සිට දරන්නේ වෛෂයිකාධාරයි. "මිනිස්සු පොළොවෙහි හැසිරෙත්" යන තන්හි ආධාරසංඛ්‍යාත පොළොව විෂයභාවයෙන් සිට ආධෙය වූ මිනිස් නැමති වස්තුව දරණ බැවින් "පොළොවෙහි" යනු වෛෂයිකාධාර යි. ආධෙය වස්තුව සමීපත්වයෙන් සිට දරන්නේ සමීප්‍යකාධාරයි. "මූදු වෙරළෙහි පොල් සිටුවත්" යන තන්හි ආධාර සංඛ්‍යාත මූදුවෙරළ ආධෙය වූ පොල් සමීපත්වයෙන් සිට දරන්නේ වේ. එබැවින් "මූදුවෙරළෙහි" යනු සාමීප්‍යකාධාර යි. සකල්ව්‍යාපිත්වයෙන් ආධෙය වස්තුව දරන්නේ අභිව්‍යාපකාධාරයි. "කිරෙහි තෙල් තිබේ" යන තන්හි ආධාරසංඛ්‍යාත කිර ආධෙය වූ තෙල සකල ව්‍යාපිත්වයෙන් දරණ බැවින් "කිරෙහි" යනු අභිව්‍යාපකාධාරයි. අදර අරුත පවසන නිදසුන් දක්වන්නාහු "කුලෙහි" යනාදිය කීහු.

**ස. 1. එහි-කුලෙහි නොලැගි මුනිපිත්. 2. ඒ-එපුරේ නිරිඳෙක් වී. 3. හි-සිත්හි තබා ඇදුරු උගහ. 4. ඇ-මුනිබසැ කර හැදහිලි. 5. අස්හි-පහනැ කඹරන්හි බමණ බමරමුළු තැඹ පිරිඉසස් සරණ නිඹිරබලල්වලා.**

ස. **භා**-මෙහි-1 වාක්‍යයෙහි මුනිපිත්හු ලගනා වත්හොත් ඊට ආධාර වූයේ කුලයයි, එබැවින් ඒ පැවසීමට "කුල" ශබ්දයා කෙරෙන් "එහි" යන විබත්පස යෙදීමෙන් "කුලෙහි" යි සිඬයි. මුනිපුත්‍රයා කුලෙහි ආසක්ත නොවීය යනු වාක්‍යාර්ථයි.

2. වාක්‍යයෙහි පුරය නිරිඳුගේ වීමට ආධාර වූ බැවින් "පුර" ශබ්දයා කෙරෙන් "ඒ" යන විබත්පස යෙදීමෙන් "පුරේ" යි සිඬයි. ඒ පුරයෙහි රජෙක් විය යනු අර්ථයි.

3. වාක්‍යයෙහි සිත ඇදුරු උගහ තැබීමට ආධාර වූ බැවින් "සිත්" ශබ්දයා කෙරෙන් 'හි' යන විබත්පස යෙදීමෙන් "සිත්හි" යි සිඬයි. ආචාර්යයන්ගේ උද්ග්‍රහණය සිතෙහි තබාගණිව් යනු අර්ථයි.

4. වාක්‍යයෙහි හැදහිලි කිරීමට මුනිබස ආධාර වූ බැවින් "මුනිබස්" ශබ්දයා කෙරෙන් "ඇ" යන්න යෙදීමෙන් "මුනිබසැ" යි සිඬයි. බුඬවචනයෙහි ඇදහීම කරව් යනු අර්ථයි.

5. වාක්‍යයෙහි තඹරන් භ්‍රමර සමූහයාගේ භ්‍රමණයට ආධාර වූ බැවින් "තඹර" ශබ්දයෙන් පරව බහුවචනයෙහි "අන්හි" යන විබත්පස යෙදීමෙන් "තඹරන්හි" යි සිඩයි. අලුයම් කාලයෙහි තාමරසයන්හි භ්‍රමණය කරන්නා වූ භ්‍රමරසමූහතෙමේ අන්ධකාර නමැති මව සොයමින් හැසිරෙන්නා වූ අඳුරුපැටවුන් වැනි වේ යනු වාක්‍යාර්ථයි. ඝනාන්ධකාරයෙහි අඳුර අධික වීමෙන් මීමැස්සන් හැසිරෙන්නාක් මෙන් පෙණේ, එබැවින් ඝනාන්ධකාරය මාතෘරූපයෙන් ද, මීමැසි සමූහයන් මෙන් පෙණෙන අන්ධකාර ඛණ්ඩයන් පොතක රූපයෙන් ද සැලකූහ.

මෙසේ ඒ ඒ විභක්ති ප්‍රත්‍යයන්ට නිදසුන් දක්වා ඉක්බිති ආධාරය පිළිබඳ විශෙෂයන් පවසනු වස් "යෝනන් කෙරෙහි" යනාදිය කීහු.

**1. යෝනන් කෙරෙහි සා හි ගුණ එකයුරු.මේ ඇහි වෙත් අරුත් සඳින් වෙ.**

**2. මදුරඳුන් රන් යාදි වෙසතුරු තනන් දිනි. ඈහි පෙර කිරිය කරන්නහුට අදර අරුතැ කම් විබත් හා එම කිරියට දිපස හා රුසි.**

**3. බලාවැල දලසුතු-විඳුදිව් දහර ලබකෙස්,**
**මහමෙ රකුසු හමු වන-පිය නම් මතුරු දපවණ.**

**මෙ ඈ කල්අරුත් කිරිය විසාහි අදර අරුතැ කම්විබත් රුසි.**

**ඉති අදරවිබත්.**

---

මෙහි 1 වාක්‍යයෙහි "කෙරෙහි" යන සම්පාඨී "කර" ශබ්දයා කෙරෙන් අදර විබතයි. යුවතීන් කෙරෙහි හෙවත් යුවතීන්ගේ සමපයෙහි කි නම් ගුණයෙක් එකාකාර වේද (නොවේ මය)යනු වාක්‍යාර්ථයි.

සිහල වහරෙහි "කම් අවදි .අදර" යන විබත් අරුත් ප්‍රකට කරණු වස් "කර" යන සම්පාඨීවාචක ශබ්දය හා ඉන් පරව "ආ එන් එහි" යන විභක්ති ප්‍රත්‍යයයන් ද යෙදීමෙන්"කරා, කෙරෙන්, කෙරෙහි" යන තුණ සිඩ බැව් සූචිතයි. මේ තුණ සම්බන්ධවිභක් ත්‍යන්තපදයක් කෙරෙන් යෙදීමෙන් "ඔහු කරා,ඔහු කෙරෙන්,ඔහු කෙරෙහි" යනාදි වශයෙන් ව්‍යවහාරකරණුලැබේ. ඇතැම් තන්හි "වෙත්" යන සම්පාඨී ශබ්දය හා "අ ඉන් ඇ" යන විබත් පස ද යෙදීමෙන් "ඔහු වෙත,ඔහු වෙතින්,ඔහු වෙතැ" යනාදි වශයෙන් ද වහර යෙදේ.

2. භා—“මද්‍රිරාජදෙවිය වනයට යද්දී වෙසතුරුරජතෙමේ දරුවන් දුන්නේය” යනු 2 වාක්‍යයෙහි අර්ථ යි.

3 භා—“කොක්පෙල නමැති දළ ඇති, විදුලි නමැති දිව ඇති, ජලධාරා නමැති එල්බෙන කෙස් ඇති, මහාමෙඝ නමැති රකුසා හමුවූ විට ප්‍රියාවගේ නාම නමැති මන්ත්‍රය ජප කරණු” යනු 3 වාක්‍යයෙහි අර්ථ යි.

වි—මෙබඳු වාක්‍යයන්හි වාක්‍ය දෙකක්හුගේ සම්බන්ධයෙන් වාක්‍ය පරිසමාප්තිය වේ. එහි ප්‍රථමවාක්‍යාර්ථය අපරවාක්‍යාර්ථයාගේ ප්‍රවෘත්තිකාලය පිරිසිඳින්නේ වේ. එබැවින් ප්‍රථම වාක්‍යාර්ථය පවසන ක්‍රියාව කාලාර්ථ ක්‍රියාවක් වියයුතුයි.සිංහලෙහි යෙදෙන ඒ කාලාර්ථ ක්‍රියාව දෙපරිදි වේ.ඉන් එකෙක් ‘දී’ ප්‍රත්‍යය යෙන් ද, එකෙක් ‘ත’ ප්‍රත්‍යයයෙන් ද යුක්තයි. එහි අපර වාක්‍ය සහගත ක්‍රියාර්ථය අතීත වේ නම් පූර්වවාක්‍යසහගත කාලාර්ථක්‍රියාව ‘දී’ ප්‍රත්‍යයයෙන් යුක්ත වේ, එසේ නැත් නම් ‘ත’ ප්‍රත්‍යයෙන් යුක්ත වේ. මෙහි ඒ දෙවිදිය ම පවසනු සඳහා නිදසුන් දෙකෙක් නිර්දිෂ්ට යි. එහි “මදුරදුන්” යනාදි වාක්‍යයෙහි “යාදී” යන කාලාර්ථක්‍රියාව ‘දී’ ප්‍රත්‍යයාන්ත යි. ඒ “යද්දී, කරද්දී” යනාදි වශයෙන් ද යෙදේ. “බලාවැල” යනාදි වාක්‍යයෙහි “වත” යන කාලාර්ථක්‍රියාව ‘ත’ ප්‍රත්‍යයාන්ත යි. ඒ කාලාර්ථ ක්‍රියාව කරන්නහු කර්මවිභක්තිරූපයෙන් යෙදීම සිංහලව්‍යවහාර යයි ඒ ආධාරාර්ථ වශයෙනි, පාලිසංස්කෘත ව්‍යවහාරයෙහි ඒ ආධාරවිභක්තියෙන් ම යෙදේ.

මෙබඳු තන්හි යෙදෙන කම්විබත අදරඅරුත්හි යයි කිම සදෙස් යයි ද,ඒ කර්මාර්ථ හෝ කර්ත්‍රර්ථ වියයුතු යයි ද බොහෝ අය කියති,එහෙත් ඒ ඔවුන් කියන කර්මත්වය හෝ කර්තෘත්වය කවරෙකුට වුවත් වටහා ගැණීම දුෂ්කර නොවේ, එය සිද්ධාන්තසංග්‍රහකර්තෘ පාදයන්ට නොවැටහුනේ යයි කිම හාස්‍යජනක වේ.උන්වහන්සේ ව්‍යාකරණශාස්ත්‍රවිෂයෙහි අතිදක්ෂ උතුමෙක් නොවී නම් “අදර අරුතැ කම්විබත්” යි නොකියන්නේ මය, උන්වහන්සේ වනාහි ව්‍යාකරණ විෂයෙහි පාණිනීය වෛයාකරණයන් වැනි උතුමෙකි, එබැවින් උන්වහන්සේ ද ඒ පාණිනීය වෛයාකරණයන් අර්ථයෙන් හා විභක්තිරූපයෙන් ද ආධාරත්වයෙන් සැලකූ පදය සිහලවහරෙහි විබත් පෙරළිවශයෙන් කම්රූපයෙන් සිටියත් එහි අර්ථය ආධාරවශයෙන් ගතයුතු බැව් කීහු. උන්වහන්සේ එසේ කියේ නමුදු එහි කර්මත්වය හෝ කර්තෘත්වය මුත් ආධාරත්වය බොහෝ අයට වටහා ගැණීම දුෂ්කර බැවින් ඒ පිළිබඳ ස්වල්ප මාත්‍ර විනිශ්චයක් ලියන්නෙමු.

පාලිසංස්කෘත වෛයාකරණයෝ මෙබඳු තන්හි යෙදෙන විභක්තියට භාවසප්තමී යයි කිහු. "යස්‍ය ච භාවෙන භාවලක්ෂණම්" යනු ඒ පිළිබඳ පාණිනීය සූත්‍රය යි. කර්තෘවාචක වූ හෝ කර්මවාචක වූ යමකු පිළිබඳ කාලවාචක ප්‍රසිද්ධ ක්‍රියාවකින් අප්‍රසිද්ධ වූ ක්‍රියාන්තරයක් ලකුණුකරණු ලැබේ නම් ඒ කාලවාචක වූ ප්‍රසිද්ධ ක්‍රියාවට ආශ්‍රයස්ථාන වූ ඒ කර්තෘවාචක වූ හෝ කර්මවාචක වූ හෝ නාමයා කෙරෙන් සප්තමී විභක්තිය වේය යනු එහි අර්ථ යි. මීට අර්ථව්‍යාඛ්‍යාවක් කළාවූ තත්ත්වබොධිනී ටීකාකාරයෝ "නිර්ඥාත කාලා හි ක්‍රියා අනිර්ඥාතකාලායාඃ ක්‍රියායාඃ කාලපරිච්ඡෙදකත්වාල්ලක්ෂණං, තත්‍ර ප්‍රසිද්ධක්‍රියාශ්‍රයයොඃ කර්තෘකර්මණොර්වාචකාද් බ්‍රාහ්මණාදි ශබ්දාල්ලක්ෂ්‍යලක්ෂණභාවසම්බන්ධෙ ෂෂ්ඨ්‍යාං ප්‍රාප්තායාමියං සප්තමී" යනු කිහු. නිශ්චය කොට දැනගන්නාලද කාලය ඇති ක්‍රියාව හෙවත් ප්‍රසිද්ධ ක්‍රියාව වනාහි නිශ්චය කොට නොදන්නාලද කාලය ඇති ක්‍රියාහුගේ හෙවත් අප්‍රසිද්ධ ක්‍රියාහුගේ කාලය පිරිසිඳින බැවින් ලක්ෂණ නම් වේ. ඒ ප්‍රසිද්ධ ක්‍රියාවට ආශ්‍රයස්ථාන වූ කර්තෘවාචක වූ හෝ කර්මවාචක වූ බ්‍රාහ්මණාදි ශබ්ද කෙරෙන් ලක්ෂ්‍යලක්ෂණභාවසම්බන්ධයෙහි ෂෂ්ඨිය පැමිණි කල්හි එය වළක්වා සප්තමිය වේ යනු එහි අර්ථයි. භාවසප්තමී විෂයෙහි යෙදෙන ප්‍රසිද්ධක්‍රියාව කාලවාචක බවත් ඒ ලක්ෂණයක් බවත් කර්තෘවාචක ශබ්දයක් හෝ කර්මවාචක ශබ්දයක් ඊට ආශ්‍රයස්ථාන බවත් ඒ කර්තෘවාචක වූ හෝ කර්මවාචක ශබ්දයක් ඇසුරු කොට හෙවත් ආධාරස්ථාන කොට අප්‍රසිද්ධක්‍රියාහුගේ කාලපරිච්ඡෙදය කරණ බවත් එබඳු තන්හි ලක්ෂ්‍යලක්ෂණභාව සම්බන්ධයෙහි ෂෂ්ඨිය පැමිණෙන්නට හැකිවුවත් එහි ආධාරත්වය පැවසීම ඊට වඩා බලවත් බැවින් සප්තමිය පැමිණෙන බවත් මෙයින් ප්‍රකාශිතයි. කර්තෘවාචක වූ හෝ කර්මවාචක වූ හෝ නාමය කාලාර්ථ ක්‍රියාවට ආශ්‍රයස්ථාන වන බව ඒ නාමය ආධාර විභක්තිය හෝ ආධාරාර්ථය ඇසුරු කිරීමෙන් ස්ඵුට වේ. මේ මෙසේ හෙයින් සිදතෙහි ද යථොක්ත ප්‍රසිද්ධ ක්‍රියාවිශෙෂයට කල්අරුත්කිරිය යයි ද, ඒ ඇසුරු කරණ පදය අදරඅරුත කම් විබතින් යෙදේය යි ද කීහු.

තවද මෙබඳු තන්හි අදර අරුත කම්විබත් ඇසුරුකරණ පදය කර්තෘවාචක හෝ කර්මවාචක නොවන්නේ නොවේ. ඔවුන් ඇසුරු කරණ ක්‍රියාව කාලවාචක නොවේ නම් ඔවුනු කර්තෘත්වය හෝ කර්මත්වය පවසන්නාහු මය, එහෙත් ඒ ක්‍රියාව කාලවාචක වීමෙන් ඒ කර්තෘ හෝ කර්මය ඒ කාලයට ආශ්‍රයස්ථාන වන බැවින් ඔවුන්ගේ ඒ කර්තෘත්වය හෝ කර්මත්වය මුවහ වී ආධාරත්වය ප්‍රකට වේ.එබැවින්

පාලිසංස්කෘතයන්හි ඔවුන්ගේ විභක්තිරූපය හා අර්ථය ද යන දෙක ම ආධාරත්වය ඇසුරු කෙරේ. සිංහලෙහි විභක්ති රූපය විපර්‍යාසවශයෙන් සාමීරූපයෙන් යෙදේ, එහෙත් අර්ථ වශයෙන් ආධාර වේ.

යථෝක්ත කාලාර්ථ ක්‍රියාව වනාහි කර්තෘ සාමි යන කාරකවයෙහි ම යෙදේ. කාලාර්ථක්‍රියාව කර්තෘ කාරක වූ තන්හි එයින් උක්ත වූ කර්තෘ ද, කාලාර්ථ ක්‍රියාව සාමිකාරක වූ තන්හි එයින් උක්ත වූ සාමිය ද ආධාර වේ. පාලි සංස්කෘතයන්හි ඒ කාලාර්ථ ක්‍රියාහුගේ කාරක විශේෂය ප්‍රකට ව පෙණේ, එහෙත් සිංහලෙහි කල් අරුත්කිරිය කතු සාමි කාරුදෙකට සම ව යෙදේ, මෙහි දැක්වූ නිදසුන් දෙක්හි ම කල්අරුත්කිරිය කර්තෘකාරක වශයෙන් ගතයුතුයි, එබැවින් එහි අදර අරුත සාමිවිබත් වූයේ කර්තෘවාචක වූ "මදුරදුන්, මහමේරකුසු" යන පද දෙකයි. "ඔහු බත් පිසද්දී ආගන්තුකයෙක් ආයේය, ඔහු දහම් දෙසත මිනිස්සු පහදිත්" යන මෙහි "පිසද්දී, දෙසත" යන ක්‍රියාවය සාමි කාරක වශයෙනුදු ගතහැකි වේ. එසේ ගතහොත් ඒ දෙකට ආශ්‍රයස්ථාන වූයේ "බත්, දහම්" යන දෙකයි, ඒ දෙක සාමිවාචකයි, එබැවින් ඒ දෙක්හි අදරඅරුත සාමිවිබතයි. "ඔහු" යනු අනුක්ත කර්තෘයි.

තවද අර්ථක්‍රියාපදයක් සමග කාලවාචක ශබ්දයක් යොදා ඒ ශබ්දයා කෙරෙන් අදර විබත්පස යෙදීමෙන් ද යථෝක්ත කාලාර්ථක්‍රියාර්ථය සිද්ධ වේ. එ කල්හි "මදුරදුන් රන් ගියකල්හි වෙසතුරු තනන් දිනි, මහමේරකුසු හමුවන කල්හි පිය නම් මතුරු දප වණ" යනාදී වශයෙන් යෙදිය හැකි වේ. "ගියවිට, ගියවර" යනාදි වශයෙන් ද වහර යෙදේ.

තවද අදරඅරුත් පැවසීමට යෙදෙන යථෝක්ත විභක්ති ප්‍රත්‍යයයන් අප්‍රාණිවාචක ශබ්දයන් කෙරෙන් මුත් ප්‍රාණිවාචකයන් කෙරෙන් වහර යෙදෙන බැව් නො පෙණේ. මෙහි නිදීෂ්ට උදාහරණවලිනු දු ඒ හැඟේ. ප්‍රාණිවාචකයන්ගේ ආධාරය "මිනිසා කෙරෙහි මිනිසුන් කෙරෙහි" යනාදි වශයෙන් වහර යෙදේ, අප්‍රාණිවාචක ශබ්ද කෙරෙන් 'වල්' යන්න හා ඉන් පරව 'අ'යන්ත හෝ 'ඇ' යන්න යෙදීමෙන් අදරඅරුත් බුහුබස් පැවසේ. 'වතුවල" යනාදි වශයෙනි. "**අතෙහි** ඩැහැගෙණ, **කෙසෙහෙ** අල්වාගෙණ" යනාදි ප්‍රයොගයන්හි "අතෙහි" යනාදිය සාමි අරුත අදර විබති.

**ආධාරවිභක්තිය නිමි.**

9. අලප්විබත්සුතුර.

**9. එ වියු අලප් නම්-ඇමතුම් තමා අමුහර,**
**ඈ අ ආ එකහැ බුහුබස-ඉන් එන් නෙන් ඉයුතු ද නි.**

9. භා—කථා ආදියෙහි තමාට අභිමුඛ නුවූවෙකු ශබ්දමාත්‍රයෙන් අභිමුඛ කරගැණීම සඳහා ඇමතීම ආලපන නම් වේ, ඒ ආලපනාර්ථය එකාබස්හි ලා පැවසීමට "ඈ අ ආ" යන විබත්පස තුණ ද, බුහුබස්හි ලා පැවසීමට "ඉන් එන් නෙන් ඉනි එනි නෙනි නි" යන සත ද යෙදේ. මීට නිදසුන් දක්වන්නාහු, "පුතැ" යනාදිය කිහු.

a. **1. ඈ-පුතැ තෙමිය හිරෙනි ඉති පුවල තෙප් නලද හව කිම පලකළා. 2. අ-සැරදේ මහරජ. 3. ආ-මෙහ සඳ වණන් නුපුලුස.**

**1. ඉන්-සවණින් සැනගේ සදහමින්. 2. එන්-සජනෙන් මගා පරලෙව්. 3. නෙන්-සත්නෙන් දුලද නොබජව්. 4. (ඉයුතු) නෙතිනි නරඹා මුනිරු. 5. මහණෙනි බවුන් නො පිරිරව්. 6. වත්නෙනි නොවව් ඉසුරුමත්. 7. නි-බිඟුනි මී ලොලින් කල්ඉක් තඹරෝරේ දඟ නොවා. 8. නියවත්නි කණ වනසා.**

**ඉති අලප්විබත්.**

---

a. භා—1 වාක්‍යයෙහි "පුතැ" යනු ආලපනයි, "පුත්" ශබ්දයා කෙරෙන් "ඈ" ප්‍රත්‍යය යි. පුත්‍රය තේමිය කුමාරයෙනි මෙසේ ප්‍රෞඪවූ නෙපි වචකාභාවයක් හෙවත් මෙසා මහත් කපටිකමක් කුමට පළිකළහු ද යනු වාක්‍යාර්ථයි.

2. වාක්‍යයෙහි "මහරජ" යනු ආලපනයි. "මහරජ" ශබ්දයා කෙරෙන් "අ" ප්‍රත්‍යය යි, මහාරාජය තමුන්නාන්සේ බොහෝ කාලක් ජීවත් වනසේක් වා යනු වාක්‍යාර්ථයි.

3. වාක්‍යයෙහි "සඳ" යනු ආලපනයි, "සඳ" ශබ්දයා කෙරෙන් "ආ" ප්‍රත්‍යය යි. එම්බා චන්‍ද්‍රය විරහීන් නුපුලුස්සනු මැන. යනු වාක්‍යාර්ථයි.

බුහුබස 1 වාක්‍යයෙහි "සවණින්" යනු ආලපනයි, "සවන්" ශබ්දයා කෙරෙන් "ඉන්" ප්‍රත්‍යය යි. ශ්‍රවණයෙනි සද්ධර්මයෙන් පිණා යව්. යනු වාක්‍යාර්ථයි.

2. වාක්‍යයෙහි "සජනෙන්" යනු ආලපනයි. "සජන" ශබ්දයෙන් "එන්" ප්‍රත්‍යය යි. සජ්ජනයෙනි පරලොව ගවේෂණය කරව් යනු වාක්‍යාර්ථයි

3. වාක්‍යයෙහි "සත්තෙන්" යනු ආලපනයි. "සත්" ශබ්දයෙන් පරව "තෙන්" ප්‍රත්‍යය යි, සත්ත්වයෙහි දුලීබඩිය භජනය නොකරව් යනු වාක්‍යාර්ථයි.

4. වාක්‍යයෙහි "තෙතිනි" යනු ආලපනයි. "තෙත්" ශබ්දයා කෙරෙන් "ඉනි" ප්‍රත්‍යය යි, නෙත්‍රයෙහි මුනීන්‍ද්‍රරූපය බලව් යනු වාක්‍යාර්ථයි.

5. වාක්‍යයෙහි "මහණෙනි" යනු ආලපන යි. "මහණ" ශබ්දයා කෙරෙන් "එනි" ප්‍රත්‍යය යි. ශ්‍රමණයෙහි භාවනාව නො හරිව් යනු වාක්‍යාර්ථයි.

6. වාක්‍යයෙහි "වත්තෙනි" යනු ආලපනයි. "වත්" ශබ්දයා කෙරෙන් පරව "තෙනි" ප්‍රත්‍යයයි, ප්‍රභූති ඓශ්වර්‍ය්‍යයෙන් මත් නොවව් යනු වාක්‍යාර්ථයි.

7. වාක්‍යයෙහි "බිගුනි" යනු ආලපන යි, "බිඟු" ශබ්දයෙන් පරව "නි" ප්‍රත්‍යය යි, භෘඞ්ගයෙහි මධුවෙහි ලොල්විමෙන් කාලාතික්‍රමණය කොට තාමරසොදරයෙහි බඩ නොවව්.

8. වාක්‍ය යෙහි "නියවත්නි" යනු ආලපන යි. "නියවත්" ශබ්දයා කෙරෙන් පරම 'නි' ප්‍රත්‍යය යි, නැණවත්නි තෘෂ්ණාව වනසව් යනු වාක්‍යාර්ථයි.

වි—මෙහි 7 වෙනි වාක්‍යයෙහි "කල් ඉක්" යන තන්හි "ඉක්" යන්න පෙරකිරියක් මෙන් සලකා සන්නවල අරුත් පළ කොට තිබේ, පෙරකිරියක් නම් "ඉක්මැ" හෝ "ඉක්ම" කියා වියයුතුයි. අපට ලැබුනු සිදත්සඟරා පිට පතෙක්හි එය "ඉකල්" යි දක්නා ලැබේ. "අතිකාල" ශබ්දයෙන් සිංහලට "ඉකල්" යි බිඳිය හැකි ද වේ. "අතිකාල" ශබ්දයේ අර්ථය කාලාතික්‍රමණය කොට හෙවත් කල් ඉක්ම යනුයි. එබැවින් ඒ මැනවැයි ද හැගේ.

තවද "ඉන් එන් තෙන්" ප්‍රත්‍යයාන්ත ආලපනපදයෝ දැන් බොහෝසේ ව්‍යවහාර නොවෙත්. "උතුමනි, මැතිවරුනි" යන රූපයන් ද දැන් ආලපන වශයෙන් ව්‍යවහාර කෙරෙත්. එහි ප්‍රත්‍යය "අනි, උනි" යි වියයුතුයි. එසේ ම දැන් වහරෙහි 'ඔ' ප්‍රත්‍යයාන්ත ආලපනයක් පැවතේ. "මහත්මයො මෙහි එන්න" යනාදි වශයෙනි, දූරාලපනයෙහි හෙවත් දුර වූවෙකු කැඳවීමෙහි එය බොහෝසේ යෙදේ. දූරාලපනයෙහි පලුතොච්චාරණය සැම තන්හි ම යෙදේ. ආලපනයෙහි ප්‍රකෘතිරූපය යෙදීම ද දත යුතුයි, ඒ පාලිසංස්කෘතාදියට ද සම වේ.

**ආලපනවිභක්තිය නිමි.**

## විබත් පස වෙසෙස්.

### a. නො වියු මෙහි විබත්-අකරක් ඇත ඔහු යෙදුම්, ආනෑ පස ද යුත් බස්-ලැකියනුසරින් දන්නේ.

පෙරවිබත් ආදි විබත් නවය ලක්‍ෂ්‍යලක්‍ෂණවශයෙන් ප්‍රතිනිර්දෙශ කොට සිදතෙහි ඇතුළත් නුවූ විබත්පස ආදිය ද ලෝවහරෙන් හැර ගණු සඳහා අනුශාසනය කරන්නාහු "නොවියු" යනාදිය කිහු.

a හා–මේ විබත්අදියරෙහි නොපැවසූ විබත් පස ඇත් නම් ඔවුන්ගේ යෙදීම ද "ආන" ආදි ප්‍රත්‍යයයන්ගෙන් යුත් පදයන්ගේ යෙදීම ද භාෂාවෙහි පෙණෙන ප්‍රයොගයන්ගේ අනුසාරයෙන් දතයුතුයි.

වි–කවර වෛයාකරණයෙකුට වුවත් භාෂාව පිළිබඳ අනූනවූ අනුශාසනයෙක් කටහැකි නොවේ. ඒ ඒ වියරණවිදි පිළිබඳ ප්‍රත්‍යයාදිය කොපමණ පැවසුවත් ශෙෂවූවෝ ලැබෙත්. ඒ භාෂාවන්ගේ සවභාව යයි. එබඳු ශෙෂයන් ලක්‍ෂ්‍යානුසාරයෙන් ගතයුතු බැවි "ලොකාවෙක්‍ෂස්‍ය සිඞිඃ" යනාදි වශයෙන් සංස්කෘත වෛයාකරණයෝ ද කිහු. මෙහි නොවියු විබත් අකුරු සවල්පයක් ඒ ඒ විබත් වැණුම් අවසන්හි වියු බැවින් දූන් මෙහි නොපවසමු. එබැවින් "ආන" ආදි පස පිළිබඳ සවල්පවර්ණනයක් කරමු.

මෙහි නිර්දිෂ්ට වූ 'ආන' ප්‍රත්‍යය හා ඈසදින් ගතයුතු වූ "ඇනි,අනු" යන ප්‍රත්‍යය දෙක ද භාෂාවෙහි ශබ්දගත ව දක්නා ලැබේ. මේ ප්‍රත්‍යයයෝ ආදර ගෞරව සහිත ව කාරණ වාග්ව්‍යවහාරයෙහි හෝ සවාර්‍ථයෙහි හෝ බහුවචනවිෂයෙහි පමණක් යෙදෙත්. "මුනිඳනෝ, වෙදනෝ, දිනිඳනෝ, ගිරණෝ, සිටානෝ, රජනෝ" යනාදිය "ආන" ප්‍රත්‍යයාන්තයි. "බුහුනනියෝ, බැදූනියෝ, මෑනියෝ" යනාදිය "ඇනි" ප්‍රත්‍යයාන්තයි. "මලනුවෝ, පුතනුවෝ, තෙරණුවෝ" යනාදිය "අනු" ප්‍රත්‍යයාන්ත යි.

තව ද මේ ප්‍රත්‍යය තුණ ඇතැම් සිදත්සඟරා පිටපත්වල දන්තජනත්වයෙන් ද ඇතැම් පිටපත්වල මූර්ධජණත්වයෙන් ද දක්නා ලැබේ, මේ කෘතිය සඳහා අප ලබාගත් පැරණි පිටපත් පසෙකි. ඉන් දෙකෙක "ආනෑ" කියා ද, දෙකෙක "ආණෑ" කියා ද, එකෙක "අන්නෑ" කියා ද තිබේ. පැරණි සිංහල ගද්‍යපද්‍යයන්හි ද මේ ප්‍රත්‍යයයන් පිළිබඳ මේ දෙවිදිය සම පමණට වාගේ ඇති බැවි පෙණේ, කෙසේවුවත් ඇතැම් අය මේ නණත්වවිධිය පිළිබඳ ව

ආධානග්‍රාහිත්වයෙන් සිටිත නුමුත් සිංහලෙහි බොහෝ තන්හි මූර්ධන්‍යවිධිය විකල්ප යයි කිව හැකිවේ, ලිවීමෙන් පමණක් දන්තජ හෝ මූර්ධජ හෝ වීම යුක්තිසහගත නොවේ. පෞරාණිකාචාර්යයන් එහි තතු දැන ශබ්ද මධ්‍යයෙහි සිටි ප්‍රකෘති නකාරය හැර බොහෝ තන්හි, විශෙෂවශයෙන්ප්‍රත්‍යය සහගත තන්හි උච්චාරණය ලැබෙන පිළිවෙළින් ඇතැම් ප්‍රයොගයන්හි නත්වයෙන් ද ඇතැම් ප්‍රයොගයන්හි ණත්වයෙන් ද ව්‍යවහාරකළ බැව් පෙණේ. දැන් බොහෝ අය ඒ උච්චාරණභෙදයක් නොතකා ම යම් ලබ්ධියක පිහිටියේ නම් ඒ ලබ්ධියෙහි ම තරයේ පිහිටා සිටිති. ඒ යුක්තිසහගත නොවේ. මේ ණත්වවිධිය විකල්ප බැවින් "ආන" ආදි ප්‍රත්‍යයයන්ගේ ප්‍රකෘතිය දන්තජනත්වයෙන් යුක්තවිය යුතුයි. ඒ වනාහි ඒ ඒ තන්හි ඊට යොග්‍ය වූ අන්‍යවර්ණාශ්‍රයෙන් නැවත මූර්ධජ වේ. ශාස්ත්‍රයුක්තිවලින් පිරී තිබෙන සංස්කෘත ව්‍යාකරණයෙහි ද ඒ රීතිය එසේ මැයි. සංස්කෘතයෙහි "ආයන" යනු තද්ධිත ප්‍රත්‍යයරූපයෙකි, එය "නඩ" ශබ්දදියෙන් පරවූ කල්හි "නාඩායන" යනාදිය වේ.'ගාර්ග්‍ය'ශබ්දදියෙන් පරවූ කල්හි නකාරය මූර්ධන්‍ය වීමෙන් "ගාර්ග්‍යායණ" යනාදිය වේ. සාදන්තයෙහි "අනීය" යනු ප්‍රත්‍යයරූපයෙකි, එය "ගම්" ධාත්වාදියෙන් පර වූ කල්හි "ගමනීය" යනාදිය වේ.'කෘ'ධාත්වාදියෙන් පර වූ කල්හි නකාරය මූර්ධන්‍ය වීමෙන්'කරණීය'යනාදිය වේ.මෙයින් පැණෙන්නේ ඊට යොග්‍ය වූ වර්ණාශ්‍රයෙන් ප්‍රත්‍යයාශ්‍රිත දන්තජනකාරය මූර්ධජ වන බව යි.

ලොකයෙහි ඇතැම් වස්තූහු ආශ්‍රයෙන් විකාරයට පැමිණෙන්නෝ වෙත්, උච්චාරණය ද එසේයි. සියලු ම දන්තජවර්ණයන්ගේ උත්පත්තිය එකලෙසට ම සිද්ධ නොවේ. "තද" ආදි දන්තජයෝ දත් අග ස්පර්ශ කෙරෙත්, "නල" දෙක එසේ නොව ඌර්ධ්වගත ව දත් මුල ස්පර්ශ කෙරේ. ඊට හෙතුව ඒ දෙක අනුනාසික වීමයි. නණ දෙක ප්‍රයත්නාදි සියල්ලෙන් සම වේ. උත්පත්තියෙන් පමණක් වෙනස් වේ. හෙද ස්වල්පවශයෙනි. දන්තජනකාරය දිව අග කරණ වීමෙන් දත් මුල පෙදෙස උපදනේ වේ. මූර්ධජණකාරය දිවග නොව දිවග සමීපය කරණ වීමෙන් දත් මුලට ස්වල්පයක් උඩුපෙදෙස උපදනේ වේ. "දන දෙනවා, පණ දරණවා" යන මේ පාඨ දෙක කල්පනාවෙන් උසුරුවා බැලීමෙන් මෙහි තත්ත්වය සලකා ගතයුතුයි. මේ මෙසේ හෙයින් පූර්ව සිටි 'ර' ආදි ඇතැම් වර්ණයන්ගේ ආශ්‍රයෙන් දන්තජනකාරය මූර්ධජ විය හැකි වේ. සංස්කෘතයෙහි මූර්ධන්‍යවර්ණයන් අතුරෙනු දූ අතිශය මූර්ධන්‍යත්වයෙන් යුත් "ඍ ර ෂ" යන වර්ණත්‍රය නකාරයාගේ මූර්ධන්‍යත්වයට ප්‍රධාන ආශ්‍රය මෙන් සැලකූහු. සිංහලෙහි ඇත්තේ ඉන් රයන්න පමණෙකි. එබැවින් සිංහලෙහි දූ රයන්නෙන් පර නයන්න

මූර්ධන්‍ය වියයුතුයි, සංස්කෘත විෂයෙහි ආශ්‍රයෙන් වූ මූර්ධන්‍ය ණකාරයෙන් යුක්ත වූ බොහෝ ශබ්දයන් සිංහලට බිඳුනුකල්හි ඒ සිංහල ශබ්දයෙහි යථොක්ත රකාරාදීහු පිරිහුනාහු වෙත්, එබඳු සිංහල ශබ්දයන්හි වූ නකාරයාගේ මූර්ධන්‍යත්වය විකල්ප බැව් පෙණේ, "නිශ්ශ්‍රේණ-නිවණ-නිවන. වර්ණ-වණ-වන, කර්ණ-කණ-කන, තෘෂ්ණ- තකණ- තකන" යනාදි වශයෙනි. එහෙත් අර්ථවිරොධයක් වියහැකි තන්හි විකල්ප නොවේ. එනම්- "තෘණ- තණ, ව්‍රණ- වණ" ආදියෙහි නිත්‍යයි. මේ ශබ්ද "තන වන" යි ව්‍යවහාර කළ හොත් අර්ථවිරොධයෙක් වේ, "ථන" හෝ "ස්තන" ශබ්දයෙන් වූ "තන" ශබ්දය පයොධර වාචක වේ, තත්සම වූ "වන" ශබ්දය අරණ්‍යවාචක වේ. මේ ණකාරවිධිය පිළිබඳ ව තවත් කිවයුතු කරුණු බොහෝ ඇතත් මෙහි නොලියමු.

**a. ඉතිරි පුමලිඟු දෙක-එ මෙ ඈ සද විබත් බස්,**
**තම සද දෙක ද නිකැතිස්-වහරෙනි ලොවැ පලට වේ.**

a. භා—පෙර ලිඞ්ගාධිකාරයෙහි දෙලිඟුසම ශබ්ද යයි කියූ "එ මෙ ත ම" යන ශබ්දයන්ගේ ස්ත්‍රීලිඞ්ග පුංලිඞ්ගවයෙහි යෙදෙන විභක්තිවචන විශෙෂය ලොකයෙහි නිතරම ව්‍යවහාරයෙන් ප්‍රකට බැවින් ඒ ශබ්දයන්ගේ විභක්තිවචන සිද්ධිය පිළිබඳව සිදතෙහි විශෙෂ අනුශාසනයක් නොකළ බැව් කීහු.

වි—මේ "එ, මෙ" ආදි ශබ්දයන්ගේ පුංලිඞ්ග ස්ත්‍රීලිඞ්ග දෙක්හි විභක්ති විධිය නිතර කථාව්‍යවහාරයෙහි සියලු දෙනා අතර ප්‍රකටව පවතින බැවින් ඒ ගැණ විශෙෂ අනුශාසනයක් හා විශෙෂ වර්ණනාවක් ද වුවමනා නොවේ. ඔවුන්ගේ ව්‍යවහාරය නොදන්නා වූ කිසිවෙකු දු නැතැයි සිතමු.

**'එ' ශබ්දය.**

| | පුංලිඞ්ග | | ස්ත්‍රීලිඞ්ග | |
|---|---|---|---|---|
| | **එක** | **බහු** | **එක** | **බහු** |
| **පෙර** | -ඒ, හේ, | ඔහු, උහු, ඔවුහු. | ඕ, හෝ, | ඔහු, උහු, ඔවුහු. |
| **කම්** | -ඒ, එය, ඔහු. | උන්, ඔවුන්. | ඈ, ඇය. | උන්, ඔවුන්. |

**'මෙ' ශබ්දය.**

| | | | | |
|---|---|---|---|---|
| **පෙර** | -මේ, | මොහු, මොවුහු. | මෝ, මූ. | මොහු, මොවුහු. |
| **කම්** | -මූ, මෙය. | මුන්, මොවුන්. | මූ, මැය. | මුන්, මොවුන්. |

### 'ත' ශබ්දය.

| | පුංලිඞ්ග | | ස්ත්‍රීලිඞ්ග | |
|---|---|---|---|---|
| | **එක** | **බහු** | **එක** | **බහු** |
| **පෙර**- | තෝ | තෙප්, තෙපි, තොපි. | තෝ, තී. | තෙප්, තෙපි, තොපි, |
| **කම්**- | තා | තොප. | තා, තිය | තොප. |

### 'ම' ශබ්දය.

| | | | | |
|---|---|---|---|---|
| **පෙර**- | මම, මම්. | ඇප්, අපි. | මම, මම්. | ඇප්, අපි. |
| **කම්**- | මා. | අප | මා | අප. |

මේ පෙර වහර හා දූන්වහර විලසින් යථෝක්ත ශබ්දයන්ගේ විභක්තිරූප ස්වල්පයෙකි, සෙස්ස ද වහරෙන් දතයුතුයි. දූන් වහරෙහි මේ ඇතැම් රූප එනම්– "උඹ, ඈ, මූ, මෑ" යනාදි රූප පහත් කොට කරණ කථාව්‍යවහාරයෙහි යෙදේ. ඒ සියල්ල වහරෙන් දයුතුයි මේ ශබ්දයෝ ආලපනයෙහි නොයෙදෙත්.

තවද සාමාන්‍යයෙන් සියලු ම නාම කෙරෙන් "එක්" ප්‍රත්‍යය යෙදේ, ඒ යෙදෙන්නේ අනියමාර්ථවශයෙනි, හෙ ද එකවචනයෙහි පමණක් යෙදෙන බැව් පෙණේ. "මිනිහා ආයේය" කී කල්හි නියම කරගන්නා ලද මිනිහෙකු ආබැව් හැඟේ, "මිනිහෙක් ආයේය" කී කල්හි අනියමිත මිනිසෙකු බැව් හැඟේ. "ඒ මේ අර" ආදි ඇතැම් සර්වනාම ශබ්දයන් කෙරෙන් "අක්" ප්‍රත්‍යය ද යෙදේ. ඒ වනාහි එකවචන බහුවචන දෙකට සාධාරණත්වයෙන් ස්වාර්ථයෙහි යෙදෙන බැව් පෙණේ, "අක්" ප්‍රත්‍යය සංස්කෘතයෙහි ද යෙදේ. සිංහලෙහි "ඒක–ඒකා, ඒකලා, ඒකී, ඒකිලා, මේක–මේකා මේකලා මේකී, මේකිලා, අරක–අරකා, අරකලා, අරකී අරකිලා" යනාදි වශයෙනුදු දූන් ඇතැම්විට ව්‍යවහාර කරණු ලැබේ. එහෙත් ඒ පහත්වශයෙන් කරණ වාග්ව්‍යවහාරයෙහි බැව් පෙණේ. එහිදු "ඒක මේක අරක" යන ව්‍යවහාරය අප්‍රාණිකයන් පිළිබඳ වේ.

මේ විබත් අදියර අවසන් කරණුවෝ මෙහි වර්ණිත වූ විබත් නවය එක් කවෙක්හි සඞ්ග්‍රහ කොට දක්වන්නාහු "දෙනෙ දූන" යනාදිය කිහු.

ඍ. **දෙනෙ දූන මෙම සිදත පතිරජ පිරූ** වන
**සැකෙවිනි පල කල දනුමට සරූ** වන
**දද බැවිනිවරව මහ ගතු කරූ** වන
**සෙබෙ වති වැජඹෙන සජනෙනි වැරූ** වන

ශ. **භා**—මෙහි "දෙනෙ" යන්න පෙර විබත් එකබසයි. ජන තෙමේ යන අර්ථයි. "සිදත" යන්න කම් විබත් එක බසයි. "දූත" යන පෙර කිරියෙහි කර්මයි. "පතිරජපිරුවණ" යන්න කතුවිබත් එක බසයි. ප්‍රතිරාජ පරිවෙණයන් විසින් යන අර්ථයි. "පළකළ" යන කම්කරු අරුත්කිරියෙහි කතෘයි. "සැකෙවිති" යන්න කරණ විබත් එක බසයි. "දැනුමට" යන්න පිණිස අර්ථයෙහි සපදන් එකබසයි. දැනගැණිම පිණිස යන අර්ථයි. "සරුවන" යන්න "සිදත" යන්නෙහි තුල්‍යාධිකරණ විශෙෂණයි, එබැවින් එහිදු කම්විබත් එකබසයි. "දදබැවින්" යන්න අවදිවිබත් එක බසයි. "ඉවරව" යන්නෙහි සීමාවයි, දඟබහාවයෙන් පහව යන අර්ථයි. "මහගතුකරුවන" යන්න සබඳවිබත් බුහුබසයි. "සෙබෙ" යන්න අදර විබත් එකබසයි. සභාවෙහි යන අර්ථයි. "වති" යන්න ක්‍රියාපරිසමාප්තියෙහි 'ඉ' යන නිපාතයෙන් යුත් පෙරවිබත් එකබසයි. "වැජඹෙත" යනු අසම්භාව්‍ය ක්‍රියායි. "විජෘම්භමාණ වෙතොත්" යන අර්ථයි. "සජනෙති" යන්න අප්ල විබත් බුහුබසයි. "රුවන" යන්න පෙර විබත් එකබසයි. "දෙනෙ" යන්නෙහි විශෙෂණයි. රත්නයක් යන අර්ථයි. "වැ" යනු පෙරකිරි යයි. වී යන අර්ථයි.

**වි**—මෙහි පිළිවෙළින් විබත් තවයම නිර්දිෂ්ටයි. මේ වනාහි පාළි බාලාවතාරයෙහි සියලුම විබත් ඇතුළත් කොට "බුද්ධො බුද්ධ සුබං දදති" යනාදි වශයෙන් නිර්දිෂ්ට ගාථාව වැනි වේ. මෙයි නුදු විභක්ත්‍යර්ථ නිරූපණයෙහි පරිවයෙක් ලැබේ.

## විභක්ත්‍යධිකාරය

**නිමි.**

---

### 5. සමස්අදියර.

මෙහි උද්දෙශක්‍රමයෙන් සිවුවැනි වූ විබත් විදිය පිළිබඳ ප්‍රති නිර්දේශවාරය අවසන් කොට පස්වැනි වූ සමස් විදිය පිළිබඳ ප්‍රති නිර්දේශයන් දක්වන්නාහු "කියොලත" යනාදිය කීහු.

#### සාමාන්‍ය සමාස ලක්‍ෂණ.

a. **කියොලත එකඅරුත-සබඳ වැසදන් නනරුත්,**
**එ විසූ සමස් විදි නම්-එහි බෙ දූන් පවස්මෝ.**

a. **භා**—විභක්ත්‍යාශ්‍රයෙන් වෙන් වෙන් වූ අර්ථ ඇති ශබ්ද යන් සම්බන්ධ වැ එක් අර්ථයක් පවසත් හොත් ඒ සමාස නමැයි කීහු. ඒ පිළිබඳ වූ භෙදයන් දැන් මෙතැන් පටන් පවසන්නෙමු.

## සමස්විනිස.

**වි**—යම් කිසි අදහසක් පවසන කල්හි ඊට වුවමනා ශබ්දයන් වෙන් වෙන් වශයෙන් විබත් ඇසුරු කිරීම භාෂාවේ සාමාන්‍ය නියමය යි, එහෙත් එබඳු වාක්‍යයෝ දීඝී වෙත්, ඔජෝගුණ යුක්ත නොවෙත්. එබැවින් වාක්‍යය සංක්ෂිප්ත කිරීම හෙවත් ලුහුඬු කිරීම පිණිසත් මටසිලුටු කිරීම පිණිසත් භාෂාවෙහි සමාසවිධියෙක් පැවතේ, වෛයාකරණයන් හෙ ද ව්‍යාකරණාඞගයක් වශයෙන් අනුශිෂ්ට ය. සමාස ශබ්දයාගේ අර්ථය ද සංක්ෂිප්තභාවයෙන් එකතුව සිටීම හෝ සිටින තැන යනු යි. මේ සංක්ෂිප්තභාවය ලැබෙන්නේ වාක්‍යයන්හි අන්‍යොන්‍ය සම්බන්ධය ඇති පදයන්ගේ විභක්තීන් ලොප් කොට පද දෙකක් හෝ කිපයක් එක පදයක් කිරීමෙනි, අන්‍යොන්‍ය සම්බන්ධය නැති පදයෝ සමාස නොවෙත්.

සංස්කෘත-කාතන්ත්‍ර ව්‍යාකරණයෙහි "නාමනාං සමාසො යුක්තාර්ථඃ, තෙෂාං ලොප්‍යා විභක්තයඃ" යනු ද, ඒ ඇසුරු කොට පාලිව්‍යාකරණයන්හි "නාමානං සමාසො යුත්තත්ථො, තෙසං විභත්තියො ලොපා ච" යනු ද කිහු. නාමයන්ගේ යුක්තාර්ථය තෙමේ හෙවත් එකිනෙකට සම්බන්ධ වූ අර්ථ ඇත්තේ සමාස වේ, සමාසාවස්ථාවේ දී ඔවුන් පිළිබඳ විභක්තීහු ලොප් කටයුතු වෙත් යනු එහි අර්ථ යි. විභක්ති ලොප්වීමෙන් සමාස බවට පැමිණෙන් නාහු නාමයෝ යි, එබැවින් පාලිසංස්කෘත වෛයාකරණයෝ නාම යන්ගේ සමාසය යි කිහු.

"එක් ලකෙහි රජෙකු මුනිහුගේ දහමේ විලසින් රජය කරද්දී ඇත්හු ද අස්හු ද රිය ද පද ද තමාගේ පිරිවර වූහ" යනු වාක්‍යයෙකි, මේ වාක්‍යය සමාස කොට කියත් හොත් "එක් ලක්රජෙකු මුනිදහම්විලසින් රජය කරද්දී ඇත්අස්රිය පද තමපිරිවර වූහ" යනු වේ. එකල්හි වාක්‍යය ලුහුඬු වූයේ ද මට සිලුටු වූයේ ද වේ. මෙහි පූර්ව වාක්‍යය පද එකුන් විස්සෙකින් ද අපරවාක්‍යය පද අටකින් ද යුක්තයි, එබැවින් අපරවාක්‍ය යාගේ ලුහුඬු බව ප්‍රකට ව පෙණේ, එසේ ම එහි මට සිලුටු බව ද පෙණේ.

මෙහි අන්‍යොන්‍ය සම්බන්ධය ඇති පදයෝ ම සමාස වූහ. අන්‍යොන්‍යසම්බන්ධය නැති පදයන් සමාස නොවන බව මෙහි සමාස නොව ශෙෂවූවන්ගෙන් දතහැකි වේ. එහි "ලක්රජෙකු" යන පදයාගේ හා "මුනිදහම්විලසින්" යන පදයාගේ අර්ථවශයෙන් සම්බන්ධය නැත්තේ වේ. සෙස්ස ද මෙලෙසින් දත යුතුයි. අන්‍යොන්‍ය සම්බන්ධය ඇති පද නමුදු සියල්ලම සමාස කටයුතුය

යන නියමයෙක් නැත්තේ වේ, එබැවින් සාමාන්‍ය සමාසවිධිය අනිත්‍යව්‍යාකරණ විධියක් වශයෙන් සැලකිය යුතුයි. අව්‍යයසමාස අන්‍යාර්ථසමාස දෙක හැරයි, ඒ දෙක නිත්‍යසමාස වේ. අනිත්‍ය සමාසයාගේ අසමස්ත වාක්‍යය හා සමස්තපදය යන දෙක ම අර්ථවශයෙන් සමාන බැවින් ඒ දෙක ම සමානාර්ථ භාවයෙන් වහර යෙදේ. "රජුගේ පිරිස ආයේය" යනු අසමස්තවාක්‍ය යි, "රජපිරිස ආයේය" යනු සමස්ත වාක්‍ය යි, මේ වාක්‍යවය ම අර්ථවශයෙන් සම වේ. නිත්‍යසමාස වූ අව්‍යය සමාස අන්‍යාර්ථ සමාස දෙක්හි සමස්තපදයෙන් ලැබෙන අර්ථය අසමස්ත වාක්‍යයෙන් නොලැබේ. "යව්දිව්" යනු අව්‍යය සමාස යි, ජීවිතයාගේ සීමාව යනු එහි අර්ථයි. හුදකලා "යව්" යන අව්‍යය ශබ්දය අර්ථවත් ව වහර නො යෙදේ, හුදකලා "දිව්" ශබ්දයාගේ අර්ථය ජීවිතය යනුයි. "එරුණුහස්" යනු අන්‍යාර්ථ සමාස යි, තඹාගය යනු එහි අර්ථයි, අසමාස වශයෙන් ගත් කල්හි එහි අර්ථය එරුණා වූ හංසයා යනු යි. මේ සමාසවයෙහි සමස්ත පදයෙන් ලැබෙන අර්ථය අසමස්ත පදවලින් නොලැබෙන බව මෙයින් දතයුතු යි.

තවද භාෂාවෙහි වූ පදයෝ සතර දෙනෙකි, "නාම ආඛ්‍යාත උපසර්ග නිපාත" වශයෙනි, මේ සතර "නාම ආඛ්‍යාත" වශයෙන් දෙකට ද බෙදේ. එකල්හි "උපසර්ග, නිපාත" යන දෙකොටස ද නාමයෙහි ම ඇතුළත් වේ. නාමයන්ගේ සමාසය වේය යනු සමාස ශාස්ත්‍රාගත සාමාන්‍ය නියමය යි, එයින් නාම උපසර්ග නිපාත යන තුන්කොටස ම සමාසවිෂයෙහි ලා ගතහැකි වේ. එහෙත් උපසර්ග නිපාත වෙන පදයක් සමග මුත් හුදකලා ව අර්ථවශයෙන් බොහෝසේ සමාසවිෂයෙහි නොයෙදේ. සමාසවිධිය නාමයන් පිළිබඳ යයි අනුශිෂ්ට බැවින් ආඛ්‍යාතය සමාස විෂයෙහි ලා ගතහැකි නොවේ. එසේ වුව ද සමාසවිෂය වූ පදයන්ගේ විශෙෂ විභාග දක්වන්නා වූ සංස්කෘත වෛයාකරණයෝ:-

"සුපාං සුපා තිඩා නාම්නා ධාතුනාථ තිඩාං තිඩා,
සුබන්තෙනෙති ච ප්‍රොක්තඃ සමාසඃ ෂඞ්විධො බුධෛඃ"

යනුවෙන් සමාසවිෂය වන්නා වූ පදයන්ගේ යෙදීම සවැදෑරුම් යයි කීහු-එනම්, නාමවිභක්ත්‍යන්තය සමග නාමවිභක්ත්‍යන්ත යන්ගේ ද, 2 ආඛ්‍යාතය සමග නාමවිභක්ත්‍යන්තයන්ගේ ද, 3 නාමය සමග නාමවිභක්ත්‍යන්තයන්ගේ ද, 4 ධාතු සමග නාම විභක්ත්‍යන්තයන්ගේ ද, 5 ආඛ්‍යාතය සමග ආඛ්‍යාතයන්ගේ ද, 6 නාමවිභක්ත්‍යන්තය සමග ආඛ්‍යාතයන්ගේ ද සමාසය වේයයි කීහු. මෙයින් ආඛ්‍යාතය ද සමාසවිෂය වන බැව් නිර්දිෂ්ටයි.

"රජපිරිස්" යන ආදිය මෙහි කී 1 වන විභාගය වශයෙන් වූ සමාසයි. විභක්ත්‍යන්තපද දෙදෙනෙකුන්ගේ සමාසය බැවිනි. "අනුදනී, සැරදේ" යනාදි ප්‍රයෝග 2 විභාගය හා සම වේ. මේ ආඛ්‍යාතය හා නාම විභක්ත්‍යන්තයන්ගේ හෙවත් උපසර්ග නිපාත යන්ගේ සමාසයි. "ගත්කරු" යනාදිය 3 වන විභාගය වශයෙනි. මෙහි "කරු" යන නාමය සමග "ගත්" යන කර්‍ම විභක්ත්‍යන්ත යාගේ සමාසයයි. මෙහි 'කරු' යන්න විභක්ත්‍යාශ්‍රයෙන් පෙර සමාස වූ බැවින් නාමවශයෙන් සලකනු ලැබේ. "මීපා" යනාදිය 4 වන නියමය වශයෙනි. මෙහි "පා" යන ධාතුව සමග 'මී' යන කර්‍මවිභක්ත්‍යන්තයාගේ සමාසය යි. සෙසු විභාගවයට සුදුසු නිදසුන් සිහල වහරෙහි නො පෙණේ.

තව ද සියලු සමාසයන්හි ම ඒ ඒ පදයන්ගේ විභක්තීන් ලොප් වීමෙන් සමාස වූ ප්‍රකෘතිරූප ශෙෂ වේ, ඒ සමාසරූපය සමාසනාම වශයෙන් සලකා ඉන් පරව වක්තෘවිවක්‍ෂා වශයෙන් විභක්ති යෙදීම කටයුතු යි.

---

සමස්බේ.

a. **අව්‍යසමස් විබත්සමස් වෙසෙසුන්සමස් අන්අරුත්සමස් දඅරුත් සමස් යි සමස් පස්වැදෑරුම්.**

a. **භා**—"අව්‍යයසමාසය, විභක්තිසමාසය, විශෙෂණසමාසය, අන්‍යාර්ථසමාසය, දකාරාර්ථසමාසය" කියා සමාසය පස්පරිදි වේ.

**වි**—පිළිවෙළින් මේ පමාසයන්ගේ පාළිනාමයෝ "අබ්‍යයීභාව, තප්පුරිස, කම්මධාරය, බහුබ්බිහි, ද්වන්ද" කියා ද, සංස්කෘතනාමයෝ "අව්‍යයීභාව, තත්පුරුෂ, කර්‍මධාරය, බහුව්‍රීහි, ද්වන්ද්ව" කියා ද වෙත්. මොවුන්ගේ ලක්‍ෂණ ඒ ඒ සමාස විෂයෙහි ප්‍රකාශ වන බැවින් මෙහි නොපවසමු, වෙන් වෙන් වශයෙන් ඒ ලක්‍ෂණ පවසන්නාහු "පෙරකඩ" යනාදිය කීහු.

---

1. අව්‍යසමස්සුතුර.

**1. පෙරකඩ උසුරුවන-යව් කු පන ඈ අව්‍යන්, පරපද සබඳ ලද හොත්-අව්‍ය සමස් එ වියූ.**

1. **භා**—සමාසපදයෙක්හි ඛණ්ඩ දෙකෙකි, හෙවත් ශබ්ද දෙකෙකි,යම් සමාසයෙක්හි ඒ දෙකෙන් පූර්‍වඛණ්ඩය "යව් කු පන" ආදි අව්‍යයක් ව ඉන් පර වූ පදයක් සමග හෙවත් පර වූ ඛණ්ඩය සමග සම්බන්ධ වුවහොත් ඒ අව්‍ය සමස් නම් යයි කීහු.

**වි**—මේ සමාසලක්‍ෂණානුශාසනයෙන් හැඟෙන්නේ පූර්වපදය අව්‍යය ශබ්දයක් වීම පමණෙකි, මේ අනුශාසනය වනාහි පාලි සංස්කෘත වෛයාකරණානුශාසනයන්ට සම නොවේ. පාලි සංස්කෘතව්‍යාකරණයන්හි අව්‍යයශබ්දයන් පූර්වපද ව සිටීම පමණෙක් අව්‍යයීභාවසමාසත්‍වයෙන් අනුදදිෂ්ටයි. එහෙත් පාලි කාත්‍යායන ව්‍යාකරණයෙහි වූ "උපසග්ගනිපාතපුබ්බකො අබ්‍යයීභාවො" යන සූත්‍රයෙහි අදහස මීට නොසම යයි ද කිවහැකි නොවේ. උපසර්ගනිපාතයන් පූර්ව කොට ඇති සමාසය අව්‍යයීභාව නම් වේ යනු පාලිසූත්‍රයාගේ අදහසයි. එසේ වුව ද උපසර්ග නිපාතයන් පූර්ව ව සිටි පමණෙකින් ම අව්‍යයීභාව සමාසය වනබව පාලිනිදර්ශනයන්ගෙන් නොපැණේ. අව්‍යය ශබ්දයක් පූර්වපද වීමත්, ඒ සමාස වූ ශබ්දදෙකෙන් අව්‍යයශබ්දයාගේ අර්ථය ප්‍රධාන වීමත් පාලිසංස්කෘතයන්හි පෙණෙන ලක්‍ෂණයි.

පාලිසංස්කෘතයන්හි මේ සමාසනාමයාගේ නිර්වචනාර්ථය වශයෙන් සලකන කල්හි මෙහි ලා තවත් ලක්‍ෂණයෙක් ගත හැකි වේ. නිර්වචනාර්ථය නම්–අව්‍යය නුවූවක් මේ සමාස බලයෙන් අව්‍යය වීම යනුයි. "උපකුම්භං" යන්න පාලි හෝ සංස්කෘත අව්‍යයීභාව සමාස පදයෙක් යයි සැලකිය යුතුයි. එහි අර්ථය කුම්භයාගේ සමීපය යනුයි. මෙහි සමීපය යනු. 'උප' යන අව්‍යයයාගේ අර්ථ යි, මෙහි ඒ සමීපාර්ථය කුම්භ යන්නෙහි අර්ථයට වඩා ප්‍රධාන වේ, ක්‍රියාව අනුව යන අර්ථය බැවිනි. "කුම්භ" ශබ්දය මෙසේ සමාස වීමෙන් පෙර අව්‍යයයෙක් නොවේ. එහෙත් සමාස වීමෙන් අව්‍යය භාවයට පැමිණියේ වේ. නිත්‍යයෙන් පචමියත් විකල්පයෙන් තෘතීයා සප්තමී දෙකත් හැර සෙසුවිභක්ති වචනාදියෙහි "උපකුම්භං" කියාම සිටින බැවිනි. "අවියසමස්" යන සිංහල නාමය "අව්‍යයීභාවසමාස" යන්නෙන් බිඳුනේ නොවේ. එසේ නම් "අවියබවසමස්" යි විය යුතුයි. පාලිසංස්කෘත විෂයෙහි වූ බොහෝ අව්‍යයීභාව සමාස පදයන්හි පෙණෙන ලකුණු සිංහලෙහි නොපෙණෙන බැවින් සිදතෙහි සාමාන්‍ය නිර්දේශයෙන් "අවියසමස්" යි නම් කරණලදි. එහි අර්ථය අවියයන් හා වූ සමාසය යනු යි. එසේ නමුදු සිදතෙහි අව්‍යයශබ්දයන්-යව් ආදිගණය, කු ආදිගණය, ප ආදිගණය, න ආදිගණය, කියා සිවුගණයක් කොට අව්‍යයසමාසය සිවු කොටසකින් පිරිසිඳින ලද්දේ ය. ඒ සිවුකොටසෙහි වූ සමාසපදයෝ ලක්‍ෂණවශයෙනුදු සිවුවැදෑරුම් වෙත්. ඒ ලක්‍ෂණ නිදර්ශනානුසාරයෙන් දතයුතු යි.

තවද අව්‍යයශබ්දයන් පූර්ව කොට ඇති සමාසය අව්‍යය සමාසය යි ගත් කල්හි සියලු අව්‍යයශබ්දයෝ ම ඇතුළත් වෙත්. එහෙත් සංස්කෘත වෛයාකරණයෝ බොහෝ සෙයින්:—

| | | |
|---|---|---|
| 1 කාම් | 6 අනුක්‍රම | 11 පශ්චාදර්ථ |
| 2 ආධාර | 7 සමෘද්ධි | 12 අනතික්‍රම |
| 3 සාමීප්‍ය | 8 වීප්සා | 13 ශබ්දප්‍රාදුර්භාව |
| 4 සාදෘශ්‍ය | 9 ශෙෂසීමා | 14 අභාව |
| 5 සාකල්‍ය | 10 යොග්‍යත්ව | 15 එකකාලත්ව |

යන මේ අර්ථයන්හි පවත්නා අව්‍යයයෝ පරපද හා සමාස වෙත් යයි කිහු. සිංහලෙහිදු යව් ආදී ගණයෙහි වූවෝ ඒ අර්ථ යන්හි පවත්නාහු වෙත්. සිදතෙහි යව් ආදි ගණයෙහි නිදසුන් දක්වන්නාහු “සක්කැබිලි” යනාදිය කිහු.

---

## යව්ඇ,සමස්.

**අ. 1. “සක්කැබිලි හිසො අගිනි එක්පසක් යව්දිව්” ඇයි දිව් හිම්=යව්දිව්. 2. යව්අමත් බමුණන් අමන. 3. තුනු හොලවට හල යතලබ සතොස් හින්හල” ඇයි-යම් යම් ලබ= යතලබ. 4. විදිය නොඉක්ම=යතවිදි· 5. පැසුලු බල=අනු බල. මෙ ඇ, යව් ඇ, සමස් නම්.**

අ. භා—1 මේ වාක්‍යයන්හි වූ “යව්දිව්, යව්අමත්, යතලබ, යතවිදි, අනුබල” යන පදයෝ යව් ආදි ගණයෙහි අව්‍යයසමාස වෙත්. මෙහි “යව්දිව්” යන තන්හි සීමාර්ථ වූ “යව්” යන නිපාතය හා “දිව්” ශබ්දයාගේ සමාසය යි. “දිව් හිම්” යනු එහි විග්‍රහයි. ජීවිතසීමාව යන අර්ථ යි. මේ නිදර්ශනය “සක්කැබිලි” යනාදි අසක්දකව ගීපදයෙන් ගෙණ හැර දක්වන ලද්දේ ය. සිරුරෙන් එක්පසක් දිව්හිම් කොට ශඞ්ඛකුණ්ඩයෙන් යුක්තයි යනු ගීපදයෙහි අර්ථයි. මෙහි “කැබිලි” යන්න කුණ්ඩ විශෙෂ වාචක වූ “කපාල” ශබ්දයෙන් භින්නයි.

2. “යව්අමත්” යන තන්හි දු සීමාර්ථ “යව්” නිපාතය හා “අමත්” ශබ්දයාගේ සමාසය යි. “අමත් හිම්” කියා හෝ “අමත් පමණ” කියා හෝ එහි විග්‍රහ යෙදිය යුතුයි. භාජනයන්ගේ ප්‍රමාණයට බමුණන් කැඳවව යනු ඊට සාධකවශයෙන් නිර්දිෂ්ට වාක්‍යයෙහි අර්ථයි.

3. “යතලබ” යන තන්හි “ලබ” ශබ්දය හා “යත” යන නිපාතයාගේ සමාසය යි. මෙහි “යත” යන්න වීප්සාර්ථයි, එහෙයින් “යම් යම් ලබ” යී විභාවයෙන් විග්‍රහ කොදන ලදී. වීප්සා යෙහි තාත්පර්යය දෙරූවිදියෙහි කී පරිද්දෙන් දතයුතුයි. ඒ වීප්සාර්ථ යෙහි ලා මෙහි ලාභ යම් පමණෙක් නම් ඒ සියලු ලාභයෝ ම

"යතලබ" යන්නෙහි සඞ්ග්‍රහිත යි. ලදලද දෙයින් යන අර්ථයි. ඒ සපුට කිරීමට ද "තුනුහොළවට" යනාදි අසක්දකාව ගීපදය නිර්දිෂ්ටයි. ශරීරයාගේ දුඃඛප්‍රවෘත්තිය හැරියේය, යථාලාභ සන්තොෂ චිත්තය හැරියේය යනු එහි අර්ථයි.*

4. "යතවිදි" යන තන්හි "විදි" ශබ්දය හා "යත" යන නිපාතයාගේ සමාසය යි. මෙහි "යත" යන්න අනතික්‍රමණාර්ථ යි. එහෙයින් "විදිය නො ඉක්ම" යි විග්‍රහ කරණ ලදී. "යතදිවි" යන්නේ අර්ථය විදිය නොඉක්ම හෙවත් විධි වූ පරිද්දෙන් යනුයි.

5. "අනුබල" යන තන්හි "බල" ශබ්දය හා "අනු" යන උපසර්ගයාගේ සමාසය යි. මෙහි "අනු" යන්න පශ්චාදර්ථයි. හෙවත් පසු යන අර්ථයි. එහෙයින් "පැසුලුබල" යි විග්‍රහ කරණ ලදී.

මෙහි "යව්දිව්, යව්අමත්" යන දෙක පාළියෙහි "යාවජීව, යාවාමත්ත" කියා ද සංස්කෘතයෙහි "යවජ්ජීව, යාවදමත්‍ර" කියා ද වේ. "යතලබ, යතවිදි, අනුබල" යන තුණ පාලි සංස්කෘත දෙක්හි ම "යථාලාභ, යථාවිධි, අනුබල" යනු වේ. "යව්" ආදි ගණ වශයෙන් දක්වූ මේ සමාසපදයන්ගේ පූර්වපදය හෙවත් අව්‍යයාර්ථය ප්‍රධාන බැව් පෙණේ. එහෙත් "අනුබල" යන්නේ විග්‍රහය "පැසුළුබල" යි දක්වූ බැවින් "පැසුළු" යන්න "බල" යන්නට විශෙෂණ යයි ද එහෙයින් එහි අව්‍යයාර්ථය ප්‍රධාන නොවේ යයි ද සිතිය හැකි වේ. බලයට පසු ලැබෙන බලය අනුබල යයි ගත් කල්හි එසේ නොසිතිය හැකි වේ. "පසුබත්" ආදිය මෙනි. මෙසේ "යව්" ආදි ගණයෙහි නිදසුන් දක්වා "කු" ආදි ගණයෙහි නිදසුන් දක්වන්නාහු "ගැරහුම් ලද" යනාදිය කීහු.

---

කුඅෑ සමස්.

**a. 1. ගැරහුම් ලද පුරිස්=කුපුරිස්, 2. නිදිලද ලද=දුලද, 3. මනා ගඳ=සුවඳ. මෙ අෑ කු අෑ සමස් නම්.**

a. හා—"කුපුරිස්,දුලද,සුවඳ"යන තුණ කු ආදි ගණ වශයෙන් නිර්දිෂ්ටයි. "කුපුරිස්" යන තන්හි "පුරිස්" ශබ්දය හා "කු" යන නිපාතයාගේ සමාසය යි. "ගැරහුම් ලද පුරිස්" යනු එහි විග්‍රහයි. ගර්හා ලත් පුරුෂයා යනු එහි අර්ථ යි. "දුලද" යන තන්හි "ලද"

---

* මේ වාක්‍යය හා අර්ථසම්බන්ධය ද සැකසයිත වේ. මේ වාක්‍යයෙහි මුල් කොටස ඇතැම් සිදත්සඟරා පිටපත් හි "තුනුහොළ වබහල" කියා ද, ඇතැම් පොත්හි "තුනුහොළ වවහළ" කියා ද දක්නා ලැබේ. විමසිය යුතුයි.

ශබ්දය හා "දු" යන අව්‍යයයාගේ සමාසය යි. "නිදිලද ලද" යනු එහි විග්‍රහයි. "නිදැලත් ලබ්ධිය" යනු එහි අර්ථයි. "සුවඳ" යන තන්හි "ගඳ" ශබ්දය හා "සු" යන අව්‍යයයාගේ සමාසය යි. "මනා ගඳ" යනු එහි විග්‍රහයි. යහපත් ගන්ධය යනු අර්ථයි. මෙහි "ගඳ" ශබ්දයාගේ ගයන්නට වයන්න යි.

වි—මේ "කු" ආදි ගණයෙහි සමාසයෝ "යව්" ආදි ගණයෙහි වැනි නොවෙත්. මෙහි අව්‍යයශබ්දාර්ථයෝ ප්‍රධාන නොවෙත්. ඔවුහු වනාහි පරපදාර්ථයන්ට තුල්‍යාධිකරණ විශෙෂණත්වයෙන් සිටිත්. එබැවින් ඒ සමාසයෝ කර්මධාරය සමාස ලක්‍ෂණයෙන් යුත් අව්‍යයසමාස යයි සැලකිය යුතුයි. මෙසේ කු ආදිය දක්වා පඅාදිය දක්වන්නාහු "උකටින්" යනාදිය කීහු.

---

පඅැසමස්.

a. **උකටින් හොබනේ=පබ, වෙනැ වන=උපවන, මෙ අැ ප අැ සමස් නම්.**

a. **භා**—"පබ, උපවන" යන දෙක පඅාදි ගණයෙහි නිදර්ශනයි. "පබ" යන තන්හි "බා" යන ධාතුව හා "ප" යන අව්‍යයයාගේ සමාසය යි ඒ වනාහි ප්‍රත්‍යයාර්ථ ශබ්ද වශයෙන් නිෂ්පන්නයි. "උකටින් හොබනේ" යනු එහි විග්‍රහ යි. උත්කෘෂ්ට ගුණයෙන් ශොභමාන වන්නේ යන අර්ථයි. "උපවන" යන තන්හි "වන" ශබ්දය හා "උප" යන අව්‍යයයාගේ සමාසය යි. "වෙනැ වන" යනු එහි විග්‍රහයි. සමීපයෙහි වූ වනය යන අර්ථයි.

වි—මේ ගණයෙහි සමාසයෝ පූර්වෝක්ත ගණදෙක්හි සමාස යන්ට සම නොවෙත්, මෙහිදු අව්‍යය ශබ්දාර්ථයෝ ප්‍රධාන නොවෙත්. ඔවුහු පරපදයන්ට භින්නාධිකරණ විශෙෂණත්වයෙන් සිටිත්. එහි "ප" යන්නෙන් ගම්‍යමාන වූ අර්ථය කාරණකාරක වශයෙන් ද "උප" යන්නෙන් ගම්‍යමාන අර්ථය ආධාරවශයෙන් ද ගැණේ. එබැවින් මේ සමාසයෝ තත්පුරුෂ සමාස ලක්‍ෂණයෙන් යුත් අව්‍යය සමාසය යි සැලකිය යුතුයි.

තවද සංස්කෘතයෙහි "උපවන" යන්නට විග්‍රහ දක්වන්නාහු "උපමිතං වනෙන" යි කීහු. වනය හා තුල්‍යවූයේ යන අර්ථයි. එනම්—කෘත්‍රිම වූ උද්‍යානය යි. සිදත්සඟරා පුරාණසන්නයෙහි "උපවන" යනු ගෘහොද්‍යානයයි කීහු, ගෘහොද්‍යාන නම් ගෘහසමීපයෙහි වූ වන වෙසෙසෙකි, මෙසේ පඅාදි ගණය නිදසුන් කොට න ආදිගණයට නිදසුන් කරන්නාහු "සුර නොවන්නේ" යනාදිය කීහු.

## නඅරුත්සමස්.

**a. 1. සුර නොවන්නේ=අසුර, නොදෙන ලද්දේ=අයින්, කුසල් නොවන්නේ=අකුසල්, මෙ ඈ න අරුත්හි කෙලෙන් නඅරුත් සමස් නම්. මෙහි පෙරකුරු පණකුරු වුව බහු වෙතැ නඅගම් කර=එකෙක් නොවනුයේ=අනේ, අදර නොවන්නේ= අනදර, මේ ඈ විමසනු.**

a. භා—මෙහි "අසුර, අයින්, අකුසල්, අනේ, අනදර" යන මොහු නකාරාර්ථ සමාසයෝ යි. මෙහි "සුර, දින්, කුසල්, එක්, අදර" යනමේ ශබ්දයන් හා 'න' යන අව්‍යය ශබ්දයාගේ සමාසයි. "සුරනොවන්නේ" යනාදිය එහි විග්‍රහවශයෙන් දක්වන ලද්දේය. මෙහි-මේ සමාස නකාරයාගේ අර්ථවිශෙෂයන්හි ලා කළ හෙයින් නකාරාර්ථ සමාස යයි කීම විශෙෂොක්තියෙකි. පාලිසංස්කෘත ව්‍යාකරණයන්හි සමාසවිෂයෙහි නනිපාතයාගේ අර්ථ සයෙක් සූචිත යි. ඒ බැවි සංස්කෘතව්‍යාකරණයන්හි:-

"තත්සාදෘශ්‍යමභාවශ්ච තදන්‍යත්වං තදල්පතා,
අප්‍රාශස්ත්‍යං විරොධශ්ච නඤර්ථාඃ ෂට් ප්‍රකීර්තිතාඃ" යි

කිහු. තත්සාදෘශ්‍ය (ඊට සමානබව), තදභාව (ඔහුගේ නොවීම), තදන්‍යත්ව (එයින් අනෙකුගේ බව), තදල්පතා (ඉන් අල්ප බව), අප්‍රාශස්ත්‍ය (ඔහුගේ නොපැසසිය යුතු බව), තද්විරොධ (ඊට විරුඬ බව), යන මේ සය න (ඤ්) නිපාතයාගේ අර්ථයි. "අබ්‍රාහමණ, අකරණ, අනශ්ව, අනුදරී, අකෙශී, අසුර" යන මොහු පිළිවෙළින් උදාහරණයි. නනිපාතය යම් පදයක් හා සමාස වූ කල්හි එයින් ඒ අර්ථය වැළැක්මෙන් ඊට සමානවූවෙක් වාච්‍ය වේ නම් ඒ තත්සදෘශ භාවයයි. "අබ්‍රාහමණ" යනු මෙහි. "අබ්‍රාහමණ" යන්නෙන් බමුණෙක් වාච්‍ය නොවේ. බමුණෙකුට සමාන වූවෙක් වාච්‍ය වේ. "අශ්‍රමණ" යනාදිය ද මෙසේයි. න නිපාතය යම් පදයක් හා සමාස වූ කල්හි එයින් ඒ පදාර්ථයාගේ අභාවය පමණෙක් පැවසේ නම් ඒ තදභාව ලක්‍ෂණයි, "අකරණ" යනු මෙහි. "අකරණ" නම් කිරීමේ අභාවයයි. එනම්-නොකිරීමයි. න නිපාතය යම් පදයක් හා මාසස වූ කල්හි එයින් ඒ පදයෙන් වාච්‍යවූවහුගෙන් භින්න වූ අනෙකෙක් වාච්‍ය වේ නම් ඒ තදන්‍යලක්‍ෂණයි. "අනශ්ව" යනු මෙහි. අනශ්ව නම් අශ්වයාගෙන් භින්න වූ හෙවත් අන්‍ය වූ සතෙකි, එනම්-කොටලුවා යි. නනිපාතය යම් පදයක් හා සමාස වූ කල්හි එයින් ඒ පදයාගේ අල්පභාවයෙක් පැවසේ නම් ඒ තදල්පතා ලක්‍ෂණයි. "අනුදරී" යනු මෙහි. අනුදරී යන්නෙන් පැවසෙන්නේ ස්වල්ප උදරයක් ඇත්තියකි. නයන්න යම් පදයක් හා සමාස වූ

කල්හි එයින් ඒ පදාර්ථයාගේ නොපැසසිය යුතු බවෙක් පැවසේ නම් ඒ තදප්‍රාශස්ත්‍ය ලක්‍ෂණ යි, "අකෙශී" යනු මෙනි. "අකෙශී" යන්නෙන් පැවසෙන්නේ නොපැසසිය යුතු කෙස් ඇත්තියකි. නයන්ත යම් පදයක් හා සමාස වූ කල්හි එයින් ඒ පදයට විරුඬ වූවෙක් පැවසේ නම් ඒ තද්විරොධ ලක්‍ෂණ යි, "අසුර" යනු මෙනි. "අසුර" යන්නෙන් පැවසෙන්නේ සුරනට විරුඬ වූවෙකි.

මෙහි නිර්දිෂ්ට උදාහරණයන්හි දු "අසුර, අකුසල්, අනදර" යන තන්හි නයන්ත තද්විරුඬාර්ථය යි ද, "අයින්" යන්නෙහි නයන්ත තදභාවාර්ථය යි ද, "අනේ" යන තන්හි නයන්ත තදන්‍යාර්ථ යයි ද සැලකිය යුතු යි. "අසුර" යන තන්හි නයන්ත තත්සදෘශ යයි ද සමහරු කියත්.

මේ නකාරාර්ථ සමාසයෙහි නයන්ත හා යෙදෙන පදයාගේ පූර්වවර්ණය ව්‍යඤ්ජනයක් වුවොත් එබඳු තන්හි නයන්තට අයන්ත වේ. "නසුර=අසුර" යනාදි වශයෙනි. පූර්වවර්ණය ස්වරයක් වුවොත් එබඳු තන්හි නයන්තට අයන්ත හා ඉන් පරව නකාර යෙක් ආගම ද වේ, හෙවත් "අන්" යන්න වේ. "න-ඒ=අනේ, න-අදර=අනදර" යනාදි වශයෙනි එහෙත් "නකුල්" යනාදි ඇතැම් තන්හි නයන්ත ප්‍රකෘතිරූපයෙන් ද සිටින බැව් සැලකිය යුතුයි. තවද "අනේ" යන තන්හි "න-එක්" යන දෙදෙනාගේ සමාසයෙන් "අනෙක්"යි සිඬයි. ඒ මෙහි කකාරලොපයෙන් හා එකාරයාගේ මාත්‍රාවෘඬියෙන් "අනේ" යි සිඬ යි. බොහෝ යන අර්ථයි. මේ නකාරාර්ථ සමාසය පූර්වොක්ත කොටස් තුණ හා සම නොකොට හැකි බැවින් විශෙෂ කොටසෙක් කරණලදී.

මෙහි න ආදි ගණයෙහි ලා නයන්ත පමණෙක් නිර්දිෂ්ටයි. පාලිසංස්කෘතයන්හි අව්‍යයීභාව සමාස නාම විභක්ති විෂයෙහි රූපභෙදයෙන් වර නො නැගේ එහෙත් අකාරාන්තයන්ගේ පවම්යෙහි විභක්තිරූපය යෙදේ. තෘතීයා සප්තමී විෂයෙහි රූපභෙදය විකල්පයෙන් යෙදේ. සිංහලෙහි දු "යව්දිව්, යව්අමත්, යතලබ" යනාදිපද විභක්ති විෂයෙහි වර නො නැගේ. එහෙත් "යතලබින්" යනාදි වශයෙනු දු දක්නා ලැබේ. මේ පාලිසංස්කෘතයන්හි දු ලැබෙන තෘතීයා රූපයට සමාන භාවයෙනි. "කුපුරිස්" ආදිය වරනැගේ.

| | |
|---|---|
| රුවට සුදුසු=අනුරු. | පහයෙන් යට වූයේ=යටපහය. |
| හෝ පිළිලොම්=පිළිහෝ. | බතින් පෙර වූයේ=පෙරබත්. |
| දොරෙන් බිහි=බිහිදොර. | බතින් පසු වූයේ=පසුබත්.. |

යන ආදිය ද අව්‍යය සමාස වශයෙන් සැලකිය යුතුයි.

**අව්‍යයසමස් නිමි.**

## 2. විබත්සමස්සුතුර

**2. පෙරපසු විබත් හැර-සෙසු සග් විබත් අන්පද, පරපද හා සමස් වන-එ විබත් සමස් නම් වේ.**

2. පෙරවිබත හා අලප්විබත යන දෙක හැර, පූර්වපද ව සිටි සෙසු "කම් කතු කරණ සපදන් අවදි සබඳ අදර" යන මේ විභක්ත්‍යන්ත පදයන් පරපදයක් හා සමාස වුවොත් ඒ විබත් සමස් නම් වේ.

**වි**—මේ සමාසයට පාලිසංස්කෘතයන්හි "තප්පුරිස-තත්පුරුෂ" යි ව්‍යවහෘත යි. මේ වනාහි පූර්වපද ව සිටි විභක්ත්‍යර්ථයන් ප්‍රකාශ කිරීමට සුදුසු පරපදයක් හා සම්බන්ධ වීමෙන් සිද්ධවූ සමාසය බැවින් මෙහි ඒ විබත් සමස් නමින් ව්‍යවහෘත යි. මේ සමාසය සුබොධ බැවින් විශෙෂවර්ණනාවක් නො කරමු. මෙහි පළමු කොට කර්මවිභක්ත්‍යන්තපදයන් හා වූ සමාසයන් නිදසුන් කරන්නාහු "ගත කරණුයේ" යනාදිය කීහු.

---

## කම්විබත්සමස්

**1. ගත කරණුයේ=ගත්කරු, කිවි. කිඩි කරණුයේ=කිඩියර, ඉඳුරුදුලි. මිය පල්නේ=මිපල්, කැත්. මී බොනුයේ=මිපා, සපු. පින බොනුයේ=පිනිපා, කිරි. හිර අවුරණුයේ=හිරවරණ, සත්. මෙ ඈ කම්විබත් සමස්**

1. **භා**—මෙහි "ගත්කරු, කිඩියර, මීපල්, මිපා, පිනිපා, හිර වරණ" යන මොහු කර්ම විභක්ත්‍යන්ත පදයන්ගේ පූර්වත්වයෙන් වූ සමාසයෝයි. "ගත කරණුයේ, කිඩි කරණුයේ" යනාදිය පිළිවෙළින් ඒ සමාසයන්ගේ විග්‍රහ වශයෙන් නිර්දිෂ්ටයි. ග්‍රන්ථය කරණ තැනැත්තේ ගත්කරු යි, එනම්-කිවිතෙමේ යි. ක්‍රීඩා කරණ තැනැත්තේ කිඩියර යි. එනම්-ඉන්ද්‍රජාලිකතෙමේ යි. මිහිය හෙවත් පොළොව පාලනය කරණ තැනැත්තේ මිපල් නම්, එනම්-ක්‍ෂත්‍රිය තෙමේ යි මධු පානය කරන්නේ මීපා නම් වේ, ෂට්පදයි හෙවත් භෘඞ්ගතෙමේ යි. නැවත පානය කරන්නේ පිනිපා නම් වේ. එනම්-හස්තිතෙමේ යි. සූර්‍ය්‍යයා ආවරණය කරන්නේ හිරවරණ නම් වේ. එනම් ඡත්‍රය යි මෙහි "ගත, කිඩි" යනාදිය කර්ම විභක්ත්‍යන්ත පදයි.

**වි**—මේ කර්මවිභක්ති සමාසයෙහි පරපදය බොහෝසේ ධාතු නිෂ්පන්න කර්තෘකාරක කෘදන්තපදයක් විය යුතුයි. මෙහි "ගත් කරු කිඩියර" යන දෙතන්හි පරපදය "කර" ධාතුවෙන් ද, "මීපල්"

යන තන්හි"පල්"ධාතුවෙන් ද, "මීපා පිතිපා" යන දෙතන්හි "පා" ධාතුවෙන් ද "හිරවරණ" යන තන්හි "අ" උපසර්ගපූර්ව "වර (අවුර)"ධාතුවෙන් ද කර්තෘකාරක වශයෙන් නිෂ්පන්න යයි සැලකිය යුතුයි. මේ සමාසපද පාලිසංස්කෘතයන්හි ද මෙසේම කෘදන්ත තත්පුරුෂසමාසත්වයෙන් නිර්දිෂ්ටයි. මෙහි කී "පිතිපා" ශබ්දය හස්තිවාචක වේ. හස්තිවාචක වූ මීට ආසන්න ශබ්දයෙක් පාලි සංස්කෘතයන්හි නො පැණේ, එහෙත් වෙන භාෂාවන්හි ඇතිවිය හැකි වේ. "විප" ශබ්දය අර්ථවශයෙන් මීට ආසන්න වේ. මෙහි දක්වූ විග්‍රහය "පුන බොනුයේ" යි වියහැකි වේ. පුන යන නිපාතය ද්විතීයවාරාර්ථ යි. එකල්හි "පිතිපා" යන්නෙහි අර්ථය දෙවන වරක් පානය කරන්නේ යනු යි. හස්තියා එසේ පැන් බොන්නේ වේ. එසේ නම් හෙවත් පූර්වපදය "පුන" යන නිපාතය නම් කම් විබත් සමස් නොවේ යයි ඇතැම් අය කියති, එබදු කීම් ලදරු කීම් වශයෙන් සැලකිය යුතුයි. නිපාතයෝ ද විබත් ඇසුරු කරන්නාහු වෙත්, මේ "පුන" යන්න ඇසුරු කරණ විබත කම් විබත යි. එය වාරාර්ථ බැවිනි. වාරාර්ථ හෙවත් කාලාර්ථවාචක ශබ්දයන් බොහෝ තන්හි ම කම්විබත් ඇසුරු කිරීම පාලිසංස්කෘත යන්හි සුප්‍රකට යි. "විවාරං ජයත ඉති=විජඃ" යනාදි වශයෙනි. එබැවින් ඒ පදය කම්විබත් සමස් ගෙණෙහි ගිණීමට කිසිත් බාධාවක් ඇතිබැව් නොපෙණේ. මෙසේ කම්විබත් සමස් නිදසුන් කොට කතුවිබත් සමස් නිදසුන් කරන්නාහු "පරාවිසින්" යනාදිය කිහු.

---

<u>කතුවිබත් සමස්.</u>

**2. පරා විසින් පුටුවේ=පරපුටු, සමන්, යදි හෝ. බඹහු විසින් දෙනලද්දේ=බඹදත්, සිවුරු. දෙවිහු විසින් දෙනලද්දේ= දෙව්දත්, බොජුන්. මෙ ඇ කතුවිබත් සමස්.**

මෙහි "පරපුටු, බඹදත්, දෙව්දත්" යන තුණ කතුවිබත්සමස් වශයෙන් නිර්දිෂ්ටයි. එහි "පරා, බඹහු, දෙවිහු" යන කර්තෘ විභක්ත්‍යන්තපදයෝ "පුටු, දත්" යන කර්මකාරක කෘදන්ත වූ පර පද සමග සමාසවූහ. "පරා විසින් පුටුයේ" යනාදිය එහි විග්‍රහ වශයෙන් නිර්දිෂ්ටයි. අන්‍යයකු විසින් පෝෂණය කරණ ලද්දේ පර පුටු නම්, එනම් කොවුලා හෝ යදියා යි. මෙහි අර්ථ සුගම යි. මේ සමාසයෙහි පරපදය කර්මකාරකයෙහි නිෂ්පන්න කෘදන්තයක් විය යුතුයි. මෙහි "බඹදත්" යන්නෙන් හා "දෙව්දත්" යන්නෙන් සියලුම සිවුරු හා සියලුම බොජුන් නොව බුදුරජානන් වහන්සේට පිළිගැන්වූ සිවුරු හා බොජුන් පමණෙක් වාච්‍ය වේ.

## 3. කරණවිබත්සමස්.

**3. බමරකරණෙන් උදුලේ=බමරුදුල, හැති. අත්කරණෙන් වන කම්=අත්තම්. බාකරණෙන් සුරුවූයේ=බාසුරු, කෙසර. කැසින් බොනුයේ=කැසුබු. දීයෙන් හැනු බත්=දීබත්. කිරින් පිසූ බත්=කිරිබත්. මෙ ඈ කරණවිබත් සමස්.**

3. **භා**—මෙහි"බමරුදුල,බාසුරු,කැසුබු,දීබත්, කිරිබත්" යන මේ පදයෝ කරණ විබත් සමස් වශයෙන් නිර්දිෂ්ටයි. "බමරුදුල" යන තන්හි උදුල යන ප්‍රත්‍යයාන්ත නාමය හා "බමරකරණෙන්" යන කරණවිභක්ත්‍යන්තපදයාගේ සමාසය යි. "බමරකරණෙන් උදුලේ" යනු එහි විග්‍රහයි. භෘඞ්ගයන් කරණකොට ගෙණ උජ්ජ්වලිත වූයේ යන අර්ථයි. එනම්-මල්කැණයි. "අත්තම්" යන තන්හි "කම්" ශබ්දයා හා "අත්කරණෙන්" යන කරණ විභක්ත්‍යන්තයාගේ සමාසය යි. "අත්කරණෙන් වන කම්" යනු එහි විග්‍රහ යි. අත කරණ කොට ගෙණ (සිඩ) වන්නාවූ කර්මය යනු එහි අර්ථයි. "බාසුරු" යන තන්හි "සුරු" ශබ්දය හා "බාකරණෙන්" යන කරණවිභක්ත්‍යන්තයාගේ සමාසයයි. "බාකරණෙන් සුරු වූයේ" යනු එහි විග්‍රහයි. බාහුව කරණකොට ගෙණ දක්‍ෂවූයේ යනු එහි අර්ථයි. එනම්-සිංහයායි. "කැසුබු" යන තන්හි "බු" යන ප්‍රත්‍යයාර්ථ නාමය හා "කැසින්" යන කරණ විභක්ත්‍යන්තපදයාගේ සමාසය යි. "කැසින් බොනුයේ" යනු එහි විග්‍රහ යි. කච්ඡයෙන් ජලපානය කරන්නේ යනු එහි අර්ථයි. "දීබත්" යන තන්හි "බත්" යන නාමය හා "දීයෙන්" යන කරණ විභක්ත්‍යන්තපදයාගේ සමාසයයි, "දීයෙන් හැනු බත්" යනු එහි විග්‍රහ යි, දධියෙන් හ්නතලද භක්තය යන අර්ථයි. "කිරිබත්" යන තන්හි "බත්" යන නාමය හා "කිරින්" යන කරණ විභක්ත්‍යන්ත පදයාගේ සමාස යි. "කිරින් පිසූ බත්" යනු එහි විග්‍රහ යි. ක්‍ෂීරයෙන් පිසනලද භක්තය යන අර්ථයි.

වි–මෙහි"බමරකරණෙන්"යනාදි තුන්තන්හි කරණවිභක්ත්‍යර්ථය පැවසීමට යොදන ලද්දේ "කරණෙන්" යනුයි. එබැවින් විභක්තිලොපවිෂයෙහි ලා"කරණෙන්"යන්න ලොප්වීමෙන්"බමරුදුල" යනාදිය සිඩයි. "දීයෙන් හැනු බත්, කිරින් පිසූ බත්" යන වාක්‍යවයයෙහි මධ්‍යයෙහි සිටි "හැනු, පිසූ" යන පද දෙක ද ලොප් විය, මෙබඳු සමාසයන්ට මධ්‍යපද ලොප සමාස යයි කියනු ලැබේ. සමාසවන්නේ වාක්‍යයෙකි, බොහෝ වාක්‍යයන්හි පදයෝ දෙක බැගින් ද ඇතැම් වාක්‍යයන්හි ඊට වැඩියක් ද සිටිත්, පද දෙක සිටි තන්හි පදලොපයෙක් නැත්තේ ය. දෙකට වඩා සිටි

බොහෝතන්හි ප්‍රධාන පද දෙක තිබියදී, මධ්‍යයෙහි සිටි පදයෝ ලොප් වෙත්, එසේ ලොප්වන්නේ ඒ පදයන් නැතත් අර්ථය හැඟෙන තන්හි පමණෙකි. "දීබත්" යි කී කල්හි දී හා මිශ්‍රවූ බත් බැව් හැඟේ. සෙසුතන්හි ද එසේයි. "කැසුබු" යන්න පිළිබඳ ව කියයුතු දේ පෙර කියන ලද්දේ ය.

---

4. සපදන් විබත් සමස්.

**4. බමුණන්ට දියයුතු දන්=බමුණුදන්, සිවුරු පිණිස පිරිණැමූ පිළි=සිවුරුපිළි. මෙ ඈ සපදන්විබත්සමස්.**

4. **භා**—මෙහි "බමුණුදන්,සිවුරුපිළි"යන දෙක සපදන් විබත් සමස් වශයෙන් නිර්දිෂ්ටයි. "බමුණුදන්" යන තන්හි "දන්" ශබ්දය හා "බමුණන්ට" යන සම්ප්‍රදානවිභක්ත්‍යන්තපදයාගේ ද, "සිවුරුපිළි" යන තන්හි "පිළි" ශබ්දය හා "සිවුරු" යන සම්ප්‍රදාන විභක්ත්‍යන්ත පදයාගේ ද සමාස යි. "බමුණන්ට දියයුතු දන්" යනු ද "සිවුරු පිණිස පිරිණැමූ පිළි" යනු ද විග්‍රහ වාක්‍යයි. එහි අර්ථ සුගම යි. මේ වාක්‍යවයයෙහි දු "දියයුතු, පිණිස පිරිණැමූ" යන මධ්‍යපදයෝ ලොප් වූහ. මේ සමාසයෙහි ද පරපදය පූර්වපදයාගේ සම්ප්‍රදානත්වයට යෝග්‍යවූ දානාදි අර්ථවාචක ශබ්දයක් විය යුතුයි.

---

5. අවදිවිබත්සමස්.

**5. සොරුගෙන් බිය=සොරබිය. මිණියෙන් මුතු=මිණිමුතු. රහුකෙරෙන් මුත්=රහුමුත්. මෙ ඈ අවදිවිබත්සමස්.**

5. **භා**—මෙහි "සොරබිය, මිණිමුතු, රහුමුත්" යන පද තුණ අවදිවිබත්සමස්වශයෙන් නිර්දිෂ්ට යි."සොරබිය" යන තන්හි "බිය" ශබ්දය හා "සොරුගෙන්" යන අවධිවිභක්ත්‍යන්තපදයාගේ ද, "මිණිමුතු" යන තන්හි 'මුතු' ශබ්දය හා "මිණියෙන්" යන අවධිවිභක්ත්‍යන්තපදයාගේ ද, "රහුමුත්" යන තන්හි "මුත්" ශබ්දය හා "රහුකෙරෙන්" යන අවධිවිභක්ත්‍යන්ත පදයාගේ ද සමාසයි. "සොරුගෙන් බිය, මිණියෙන් මුතු, රහුකෙරෙන් මුත්" යන තුණ එහි විග්‍රහවාක්‍ය යි. සොරුකෙරෙන් වූ බිය සොර බිය නම් ද, කොෂයෙන් හෝ බන්ධනයෙන් මිදුනේ මිණිමුතු නම් ද, රහු කෙරෙන් මිදුනේ රහුමුත් නම් ද වේ. මේ සමාසයෙහි පරපදය පූර්වපදයාගේ අපාදානත්වයට යෝග්‍ය වූ භය වාචක ශබ්දයක් හෝ අපගමනාද්‍යර්ථවාචක ශබ්දයක් හෝ වියයුතුයි.

6. සබඳ විබත් සමස්.

**6. රජුගේ පිරිස්=රජපිරිස්. බුදුන්ගේ ගුණ=බුදුගුණ. රිය ගේ හිමි=රියහිමි. සුරනට සතුරු=සුරසතුරු. මෙ ඈ සබඳවිබත් සමස්.**

6. **භා**—මෙහි "රජපිරිස්, බුදුගුණ, රියහිමි, සුරසතුරු" යන සතර සම්බන්ධවිභක්තිසමාස වශයෙන් නිර්දිෂ්ට යි. මෙහි "පිරිස්, ගුණ, හිමි, සතුරු" යන පර පද හා "රජුගේ, බුදුන්ගේ; රියගේ, සුර නට" යන සම්බන්ධවිභක්ත්‍යන්තපදයන්ගේ සමාස යි. විග්‍රහ හා එහි අර්‍ථ ද සුගම යි. "රියහිමි" යනු රති නම් දිව්‍යාඞ්ගනාවගේ ස්වාමියා යි, එනම්-අනඞ්ගයා යි, "සුරසතුරු" යනු දෙවියන්ගේ සතුරා යි, එනම්-අසුරයා යි. මේ සමාසයෙහි පරපදය පූර්‍වපදයා ගේ සම්බන්ධිත්වය පැවසීමට යොග්‍ය වූවක් වියයුතුයි.

---

7. අදරවිබත්සමස්.

**7. උරෙහි දු=උරදු. දහම්හි සොඬ=දහම්සොඬ. නෙරලුයේ තෙල්=තැලිතෙල්. තැඹිලියේ තෙල්=තැලිතෙල්. සරාකල්හි සඳ=සරාසඳ. මෙ ඈ අදරවිබත් සමස්. අතැ වසනුයේ=අතැවැසි. මෙ ඈහි විබත් නොලොපා නිපදවනු.**

7. **භා**—මෙහි "උරදු, දහම්සොඬ, තැලිතෙල්, තැලිතෙල්, සරා සඳ, අතැවැසි" යන මේ පද සය ආධාරවිභක්තිසමාසවශයෙන් නිර් දිෂ්ට යි. මෙහි "දු, සොඬ, තෙල්, තෙල්, සඳ, වැසි" යන ශබ්දයන් හා "උරෙහි, දහම්හි, නෙරලුයේ, තැඹිලියේ, සරාකල්හි, අතැ" යන ආධාර විභක්ත්‍යන්තපදයන්ගේ සමාස යි. විග්‍රහ වාක්‍ය මෙහි වූ පරිද්දෙන් දතයුතුයි. වක්‍ෂසෙහි ජාත වූයේ "උරදු" නම් ද, ධර්‍මයෙහි ලොල් වූයේ' 'දහම්සොඬ" නම් ද; නාරිකෙලයේ තෙල් "තැලිතෙල්" නම් ද, සන්නීරයේ තෙල් "තැලිතෙල්" නම් ද, ශරත්කාලයේ චන්‍ද්‍රයා "සරාසඳ" නම් ද, සමීපයෙහි වසන්නේ "අතැවැසි" නම් ද වේ.

**වි**—මෙහි "නෙරලු" ශබ්දයට "තැලි" කියා ද, "තැඹිලි" ශබ්දයට "තැලි" කියාද ආදෙශ යි. "සරාකල්හි" යන තන්හි කාලාර්‍ථාධාරය ප්‍රකට කිරීමට යෙදූ "කල්හි" යන්න විභක්තිලොපවශයෙන් ලුප්තයි. "අතැවැසි" යන තන්හි "අතැ" යන්නේ විභක්තිය ලොප් නොවීමෙන් සිඩයි. එබඳු සමාසයන්ට අලුප්ත සමාසයයි කියනු ලැබේ.

දැන් ව්‍යවහාරයෙහි පවත්නා වූ "කඩකාර, කරත්තකාර, තෙල්කාර" යනාදි නාමයෝ ද මේ විබත්සමස්හි ලා ගතහැකි වෙත්. ඔවුන්ගේ වාක්‍යයෝ ඒ ඒ තන්හි අර්ථයට යෝග්‍ය පරිද්දෙන් යොදාගතයුතුයි. එසේ සලකනකල්හි "කඩෙහි(බඩු විකිණීම) කරන්නේ=කඩකාර" කියා ද, "කරත්තය (දැක්කීම) කරන්නේ=කරත්තකාර" කියා ද, තෙල් (විකිණීම) කරන්නේ=තෙල්කාර= කියා ද ගතයුතුයි. මෙලෙසින් ගත්කල්හි මධ්‍යපදලොපසමාසත්වයෙහි ලා සැලකිය යුතුයි.

විභක්තිසමාසය නිමි.

---

වෙසෙසුන් සමස් සුතුර.

**3. විදූවතින් තොර-සියදූවතට සමවන, වෙසෙසා සබඳ සද වන-වෙසෙසුන්සමස් එ වියූ**

3. භා—විජාතීය වස්තුවෙන් තොර වූ ද, සවජාතිය වස්තුවට සම වූ ද වස්තුව විශෙෂ කොට සමාසත්වයෙන් ශබ්දය සම්බන්ධ වන කල්හි ඒ සමාසය විශෙෂණ සමාස යයි කීහු.

වි—මෙහි පළමු කොට "විදූවතින්, සියදූවතින්" යන දෙදෙනාගේ අර්ථය දැනගතයුතුයි. එහි "විදූ"යන්න"විජාතිය"ශබ්දයෙන් බිඳුනේ වේ. "විභින්නාං ජාතිං ධර්මමහීතීති=විජාතියම්" යනු "විජාතිය" ශබ්දයාගේ නිර්වචනයි. වෙන් වෙන් වූ ජාතිසංඛ්‍යාත සවභාව ධර්මයට සුදුසු වනුයේ විජාතිය නම් වේ යනු එහි අර්ථයි. "සවාං සවියාං ජාතිං ධර්මමහීතීති=සවජාතියම්"යනු "සවජාතිය"ශබ්දයාගේ නිර්වචනයි. සවකීය ජාතිසංඛ්‍යාත සවභාවධර්මයට සුදුසු වනුයේ සවජාතිය නම් වේ යනු එහි අර්ථයි. "නිල් උපුල්"යන තන්හි "උපුල්" යන්න විජාතිය වේ. උපුල නිල් රතු ආදි නොයෙක් සවභාවධර්ම යන්ට සුදුසු බැවිනි. එහෙත් මෙහි ඒ උපුල විජාතිය වස්තුභාව යෙන් තොර ව සවජාතියවස්තුභාවයට පැමිණියේ වේ. තමන් පිළිබඳ ධර්මයට හෙවත් සවකීය නීලධර්මයට යොග්‍ය වූ බැවිනි. එසේ විජාතිය භාවයෙන් තොර ව සවජාතියභාවයට පැමිණියා වූ උපුල "නිල්" යන්න විසින් සුදුරතු ආදි ධර්මයන්ගෙන් වෙන් කරණු ලැබේ. ඒ දෙදෙනාගේ සම්බන්ධයෙන් වූ ඒ සමාසය වෙසෙසුන් සමස් නම් වේ. "කම්මධාරය=කර්මධාරය" යනු පාලිසංස්කෘත ව්‍යාකරණාගත නාම යි.

මෙහි කී විජාතිය යන්නෙන් භින්නාධිකරණත්වය ද, සවජාතිය යන්නෙන් තුල්‍යාධිකරණත්වය ද සූචිතයි. කෙසේ වුවත් මේ සමාසය තුල්‍යාධිකරණපදමයෙකින් ද පෙර කී විභක්තිසමාසය

භින්නාධිකරණ පදවයෙකින්ද යුක්තයි. පදයන්ගේ තුල්‍යාධිකරණ ත්වය පවසන්නාවූ පාළිබාලාවතාරයෙහි "භින්නප්පවත්තිනිමිත්තා සද්දා එකසමිං වත්ථුනි පවත්තා තුල්‍යාධිකරණා" යනු කීහු, වෙන් වෙන් වූ පැවතුම් නිමිතිකොට ඇති ශබ්ද එක්වස්තුවෙක්හි පැවැත් තාහු තුල්‍යාධිකරණ වෙත් යනු එහි අර්ථයි. මෙහි "නිල්" යන්න ගුණයක් නිමිති කොට ද, "උපුල්" යන්න ද්‍රව්‍යයක් නිමිති කොට ද පවත්නේ වේ, ඒ දෙක මෙහි උත්පලාඛ්‍යවූ එක්වස්තුවක් විෂය කොට පවත්නා බැවින් තුල්‍යාධිකරණ වේ. එලෙසින් තුල්‍යාධි කරණ වූ ශබ්දයෝ මෙහි සමාස වෙත්. මෙහි නිදසුන් දක්වන් නාහු "නිල්වූයේ ද එම" යනාදිය කීහු.

**a. නිල්වූයේ ද එම උපුල් වූයේ ද=නිලුපුල්, හෙලිල්ලී වීත් ඔම අඹු විත්=හෙලිල්ලඹු.**

a. ඝා—මෙහි "නිලුපුල්, හෙලිල්ලඹු" යන දෙක විශෙෂණ සමාසයි. "නිල්වූයේ ද එම උපුල් වූයේ ද" යනු ද "හෙලිල්ලී වීත් ඔම අඹු විත්" යනු ද ඒ සමාසපද දෙදෙනාගේ විග්‍රහවාක්‍ය යි. මේ වාක්‍යයන්හි වූ "එම, ඔම, ද, ත්" යන මේ පදයන්ගෙන් සමස්‍ය මාන පදදෙදෙනාගේ තුල්‍යාධිකරණත්වය ප්‍රකටකරණු ලැබේ.

වි—තවද මෙහි වූ "නිලුපුල්" යන්න සාමාන්‍ය නිදර්ශනත්වයට පමණ වේ. "හෙලිල්ලඹු" යන්න දක්වනලද්දේ විශෙෂයක් උගන්වනු සඳහා විය යුතුයි. එනම්–තුල්‍යාධිකරණ විශෙෂණත්ව යෙන් සිටි උක්තපුංසකශබ්දය හෙවත් පුංලිඞ්ගවිෂයෙහිදු ව්‍යවහා රකරණලද ශබ්දය වාක්‍යවිෂයෙහි ස්ත්‍රීලිඞ්ගශබ්දයකට විශෙෂණ වීමෙන් ස්ත්‍රීලිඞ්ගරූපයෙන් සිටියත් බොහෝ තන්හි සමාසාවස්ථා වේදී නැවත පුංලිඞ්ග රූප වන බැව් උගන්වනු පිණිසයි. පාලිසංස් කෘතයන්හි දු ඒ රීතිය එසේ මැයි. එහෙත් මෙහි "හෙලිල්ලඹු" යන්නෙන් ඒ ප්‍රකට නොවේ. මෙහි "හෙලලු" යන ප්‍රකෘතිය වාක්‍ය විෂයෙහි "අඹු" යන ස්ත්‍රීලිඞ්ගශබ්දයට විශෙෂණත්වයෙන් "හෙලිල් ලී" යි ස්ත්‍රීලිඞ්ග විය. ඒ වනාහි සමාසාවස්ථාවේදී "හෙලලු" කියා වේ. එකල්හි "හෙලලු-අඹු" යන දෙක සන්ධි වීමෙන් "හෙලල්ලඹු" කියා හෝ "හෙලලඹු" කියා හෝ විය යුතුයි. "හෙලිල්ලී-අඹු" යන දෙක සන්ධිවුවහොත් පූර්වස්වරලොපවිධියෙන් "හෙලිල්ලඹු" කියා වේ. "රත්තී වීත් ඔම ගැහැණී වීත්=රතුගැහැණී" යනාදිය මෙහි ලා සැලකිය යුතුයි. මේ සමාස විෂයෙහි වූ විශෙෂ නිදර්ශනයන් දක්වන්නාහු "සිහ එව්" යනාදිය කීහු.

b. **සිහ එව්=සිහ, නරවූයේ ද එම සිහ වූයේ ද=නරසිහ. ලිය එව කොමල=ලියකොමල. සරා එව්=සරා, සරණ ම සරා= සරණසරා.**

b. **භා**—මෙහි "නරසී, ලියකොමල, සරණසරු" යන තුණ විශෙෂ නිදර්ශනවශයෙන් නිර්දිෂ්ටයි. එහිදු "නරසී, ලියකොමල" යන දෙක උපමාඋපමෙය වූ විශෙෂණවිශෙෂ්‍ය පදදෙකක්හුගේ සම්බන්ධයෙන් වූ සමාසයි. ඒ උපමාඋපමෙයපදයන්ගේ සම්බන්ධයෙහිදු ඇතැම් තන්හි උපමාපදය පූර්වපදවශයෙන් ද ඇතැම් තන්හි පරපදවශයෙන් ද යෙදේ. "නරසී" යන තන්හි "සී" ශබ්දය උපමා ද, "නර" ශබ්දය උපමෙය ද වේ. එහි "සී" යන උපමාපදය පරපද වූ බැවින් "නරසී" යන්න උපමාපරපද විශෙෂණසමාසයි. සිංහයෙකු වැනි මිනිසා යන අර්ථයි. "ලියකොමල" යන තන්හි "ලිය" යනු උපමාපද යි. එහි උපමාපදය පූර්වපදව සිටි බැවින් ඒ උපමාපූර්වපද විශෙෂණ සමාසයි. ලතාවක් මෙන් කොමල වූවා යන අර්ථයි. "සරණසරු" යන තන්හි "සරු" යන්න උපමාභාවයෙන් සිටිබැවින් උපමාපරපද විශෙෂණ සමාසයි. එහි "නරසී"යන්නට වඩා අන්‍යවිශෙෂයක් ඇති හෙයින් එය ද නිදර්ශන කරණලදි. එනම්–ආලඞ්කාරිකයෝ එබදු සමාසයන්ට රූපකසමාස යයි ද කිහු. අලඞ්කාරශාස්ත්‍රයෙහි "නරසී" යනාදිය උපමාලඞ්කාර වශයෙන් ද, "සරණසරු" යනාදිය රූපකාලඞ්කාරවශයෙන් ද නිර්දිෂ්ටයි. පාළියෙහි ද "නරසීහ, මුනිසීහ, චරණසරොජ, සද්ධම්ම රංසි" යනාදිය ඊට සම වේ. සංස්කෘතයෙහි ද එසේයි. මේ සමාසය පිළිබඳ වාක්‍යවිෂයෙහි සිටි "එව්, ම" යන නිපාතපද අප්‍රයොග වීමෙන් පද දෙක දෙක ම සමාසයට පැමිණි බැව් සැලකියයුතු යි. මෙහි ලා තවත් විශෙෂවිධියක් නිදර්ශන කරන්නාහු "එක ද එම" යනාදිය කිහු.

c. **එක ද එම විරූ ද=එකවිරූ. ලෙව්හු දෙදෙනෙක් එක් කොට සලකන ලදහු=දෙලෝ නම්. තෙසරණ, සිවුසයුරූ, පස් මහඟ, සරස, සන්කුලපවු, අටනාකුල, නවදෙර, දසරජදම්, ඈ මෙ මැගි.**

**ඉති වෙසෙසුන් සමස්.**

---

c. **භා**—මෙහි "එකවිරූ, දෙලෝ, තෙසරණ" යනාදිය ද විශෙෂණ සමාසභාවයෙන් නිර්දිෂ්ටයි. පාලිසංස්කෘතයන්හි මෙබඳු සඞ්ඛ්‍යාපද පූර්ව සමාසයන්ට "ද්විගු" යයි කිහු. පාලිව්‍යාකරණයන්හි ඒ ද්විගුසමාසය ද සමාහාර අසමාහාර වශයෙන් දෙවැදෑරූම් කොට දක්වූහ. එහිදු සමාහාරද්විගු සමාසය නපුංසකලිඞ්ග හා එකවචන බැව් ද කිහු. මෙහි "එකවිරූ" යන්න අසමාහාර

වශයෙන් සැලකිය යුතුයි. එක සඞ්ඛ්‍යාවේ සමාහාරකරණයක් නැති බැවිනි. එහෙයින් මෙහි "එක ද එම විරූ ද" යි වාක්‍යය කීහු. "එක" ශබ්දය සඞ්ඛ්‍යාර්ථයෙහි පමණක් නොව අසහාය අතුල්‍ය යන අර්ථයන්හි ද පවත්නේ වේ. එකල්හි එකවිරූ යන්නෙහි අර්ථය අසහාය විරය අතුල්‍යවිරය යනු යි. පාළියෙහි වූ "එකාවිරෝ එකපුඞ්ගලෝ" යනාදිය මෙනි.

"දෙලෝ" යනාදිය සමාහාරත්වයෙන් නිර්දිෂ්ටයි, එහෙයින් එහි වාක්‍යයන් "ලෙව්හු දෙදෙනෙක් එක්කොට සලකන ලදහු" යනාදි වශයෙන් යෙදූහ. සමාහාර කිරීම නම් රැශියක් එකක් කොට සැලකීමයි, හෙවත් එක පුඩුවෙහි ලා බැඳීමයි. යම්කිසි වස්තු සමූහයක් වෙන් වෙන් වශයෙන් පවත්නා කල්හි ඒ වස්තූන් ගැණීම් ආදි ක්‍රියාවන්හි ලා යොදත් හොත් ඒ වස්තූන්ගේ සඞ්ඛ්‍යාවට ක්‍රියාවෝ ද යෙදිය යුතුයි. ඒ වස්තූන් සමාහාර කළ කල්හි හෙවත් එක් පුඩුවෙක්හි ලා බන්ධනය කළ කල්හි එහි එක් ක්‍රියාවක් යෙදීමෙන් කාර්‍ය්‍යසිද්ධිය වේ. එබැවින් සමාහාර වූ පදය එකත්වයෙන් ව්‍යවහාර කරණලදි. සෑම තන්හිම සමාහාර යෙහි තත්ත්වය මෙයින් වටහා ගතයුතුයි. ලෙවන් දෙදෙනෙකුන්ගේ සමාහාරය දෙලෝ නම් වේ. "තෙසරණ" යනාදියෙහි වාක්‍යයෝ ද "සරණ තිදෙනෙක් එක් කොට සලකන ලදහු" යනාදි වශයෙන් දතයුතු යි. සරණ තිදෙනෙකුන්ගේ සමාහාරය තෙසරණ නම් වේ යනාදි වශයෙන් එහි අර්ථ ගතයුතුයි.

තව ද මේ විශෙෂණ සමාසයෙහි ලා විශෙෂණ පූර්වපද සමාස යයි එක් භෙදයෙකි. "නිලුපුල්" යනාදිය ඊට නිදර්ශනයි. එහි "නිල්" යන විශෙෂණය පූර්වපදව සිටි බැවිනි. විශෙෂණ පරපද යයි ද එක් භෙදයෙකි. "මුනිවර, විදුරපඬි" යනාදිය විශෙෂණ පර පද සමාසයි. මෙහි "වර, පඬි" යන් විශෙෂණයන් පරපද ව සිටි බැවිනි. විශෙෂණ උභය පදයයි ද එක්භෙදයෙකි. "අඳබිහිරි (මිනිහා), සුදුරතු (මල)" යනාදිය ඊට නිදර්ශනයි. "අඳ වූයේත් එම බිහිරි වූයේත්=අඳබිහිරි. සුදු වූයේත් එම රතු වූයේත්=සුදුරතු" යන තන්හි "අඳ බිහිරි" යන දෙක ද, "සුදුරතු" යන දෙක ද විශෙෂණ පදයි. "මිනිහා" යන්නෙහි ද "මල" යන්නෙහි ද විශෙෂණ බැවිනි. උපමාපූර්වපද සමාසාදිය පෙරකී පරිද්දෙන් දතයුතු යි. මේ සමාසය සුගම බැවින් අතිශයවර්ණනාදිය වුවමනා නොවේ.

**විශෙෂණසමාසය නිමි.**

## 4. අන්අරුත්සමස්සූතුර.

**4. කිසොලක අන් අරුත්-පදනත් අනේ වැ සියෝ,**
**එසමස් අන් අරුත් නම්-එහි බේ සත් විබතැ වේ.**

4. භා—වෙන් වෙන් අර්ථ ඇති පද දෙකක් හෝ කීපයක් එකතුව හෙවත් සමාස භාවයට පැමිණ ඒ සමාස වාක්‍යගත පද යන්ගෙන් අන්‍ය වූ අර්ථයක් කියත් හොත් ඒ සමාසය අන්‍යාර්ථ සමාස නම් වේ. එහි භේදය වනාහි විබත්සතෙහි හෙවත් කර්මාදි අර්ථ සතෙහි වේ.

වි—යම් සමාස පදයෙකින් වාක්‍යාර්ථයෙන් අන්‍ය වූ අර්ථයෙක් උක්ත වේ නම් ඒ සමාසය අන්‍යාර්ථසමාස යි. පාලිසංස්කෘතයන්හි "බහුබ්බීහි-බහුව්‍රීහි" යනු ඊට නමි. ඒ උක්තවන්නා වූ අර්ථයෝ වනාහි "කර්ම කර්තෘ කරණ සම්ප්‍රදාන අවධි සම්බන්ධ ආධාර" යන මොහු වෙත්. ඒ උක්ත පදය යම් ලිඞ්ගවචනාදියක් භජනය කෙරේ නම් සමාසපදය ද ඒ ලිඞ්ගවචනාදිය භජනය කෙරේ, ඒ කර්මාදි අර්ථ සතෙහි සමාසයන්ට පිළිවෙළින් නිදසුන් දක්වන්නාහු "හස් එරුණේ" යනාදිය කීහු.

**1. හස් එරුණේ යමකා ද එතෙම=එරුණුහස් නම් තලා. 2. දමනලද ඉඳුරෝ යමක්හු විසින් ද එතෙම=දැමිඳුරු නම්,මුනි. 3. යම් කරණෙන් බත් සුන් එතෙම=සුන්බත, අට. යම් කරණෙන් තුරු සුන් එතෙම=සුන්තුරු, පරසු. 4. දෙනලද වත් යමක්හට එතෙම=දුන්වත් නම්, බමුණු. 5. ගිලිහුනු ගොන ගුල් යමකින් එතෙම=ගුලුගොනගුල් නමි, රුක්. 6. සඳවන් වන්, සිතු වලඟ ඇත්නි, එනමි. දස බල, පස් ඇස්, ඇතියේ එනමි. 2. මන් නේ ගජන් ඇතියේ එනමි, රන්. නන් සුරු විරු බලන් ඇතියේ එනමි. එබඳු රණගණ.**

1. භා—මෙහි "එරුණුහස්" යනු කර්මාර්ථයෙහි වූ අන්‍යාර්ථ සමාස යි. හංසයා යම් ස්ථානයකට බැස ගත්තේ නම් හෙවත් හංසයාගේ බැසීමට යමෙක් කර්ම වූයේ නම් මේ සමාසපදයෙන් ඒ කර්මය උක්ත වේ, හෙවත් වාච්‍ය වේ. එනම්-තඩාගය යි. මෙහි "එරුණු" යන කර්තෘකාරක අර්ථක්‍රියාව හා එහි කර්තෘ වූ "හස්" ශබ්දය යන දෙදෙනාගේ සමාසයයි. ඒ ක්‍රියාපදයාගේ කර්මය ඉන් උක්ත යි. කර්මාර්ථසමාස විෂයෙහි මෙසේ කර්තෘකාරක අර්ථ ක්‍රියාවක් හා එහි කර්තෘපදය යන දෙක සමාස වන බවත් ඉන් එහි කර්මය උක්තවන බවත් සලකාගතයුතු යී.

2. “දැමිඳුරු” යනු කර්ත්‍රර්ථයෙහි වූ අන්‍යාර්ථසමාස යි. යමෙකු විසින් ඉන්ද්‍රියයෝ දමනය කරණ ලද්දාහු නම් හෙවත් ඉන්ද්‍රියයන් දමනය කිරීමට යමෙක් කර්තෘ වූයේ නම් මේ සමාස පදයෙන් ඒ කර්තෘපදය උක්ත වේ, එනම් මුනිතෙමේයි. මෙහි “දැමූ” යන කර්මකාරක අර්ථක්‍රියාව හා එහි කර්මය වූ “ඉඳුරු” ශබ්දය යන දෙදෙනාගේ සමාසය යි. එහි කර්තෘ වූ ‘මුනි” යන්න එයින් උක්ත යි. කර්ත්‍රර්ථ සමාසයෙහි මෙසේ කර්මකාරක අර්ථක්‍රියාවක් හා එහි කර්මය සමාස වන බැව් ද, එයින් එහි කර්තෘ උක්ත වන බැව් ද දතයුතුයි.

“සුන්බත්” යනු ද “සුන්තුරු” යනු ද කරණාර්ථ අන්‍යාර්ථ සමාසයි. යමක් කරණ කොට ගෙණ බත සුන් වී නම්, හෙවත් බත් සුන්වීමට යමෙක් කරණ වීනම් ඒ කරණය “සුන්බත්” නම් වේ. එනම් කිලහය යි. යමක් කරණ කොට ගෙණ ගස කපන ලද්දේ නම් හෙවත් ගස කැපීමට යමෙක් කරණ වී නම් ඒ කරණය “සුන්තුරු” නම් වේ, එනම් පොරෙවයි. මෙහි “සුන්බත්” යන තන්හි “සුන්” යන ස්වයංකර්තෘක අර්ථක්‍රියාව හා එහි කර්මය වූ “බත්” ශබ්දය යන දෙදෙනාගේ ද “සුන්තුරු” යන තන්හි “සුන්” යන කර්මකාරක අර්ථක්‍රියාව හා එහි කර්මය වූ “තුරු” ශබ්දය යන දෙදෙනාගේ ද සමාසය යි. ඒ සමාස පද දෙකෙන් උක්තවූයේ එහි කරණ වූ “අට, පරසු” යන දෙකයි. මෙසේ කරණාර්ථ සමාසයෙහි කර්මකාරක හෝ කර්තෘකාරක අර්ථක්‍රියාව හා ඊට කර්ම වූ හෝ කර්තෘ වූ පදය සමාස වන බැව් ද, කරණය උක්ත වන බැව් ද දතයුතුයි.

4. “දුන්වත්” යනු සම්ප්‍රදානාර්ථ අන්‍යාර්ථ සමාසයි. යමෙකුට වස්ත්‍රය දෙනු ලැබී නම් හෙවත් වස්ත්‍රදානයට යමෙක් සම්ප්‍රදාන වී නම් ඒ සම්ප්‍රදානය “දුන්වත්” නම් වේ. එනම් බමුණු තෙමේයි. මෙහි “දුන්” යන කර්මකාරක අර්ථක්‍රියාව හා ඊට කර්ම වූ “වත්” ශබ්දය යන දෙදෙනාගේ සමාසය යි. ඊට සම්ප්‍රදාන වූ බමුණා ඉන් උක්ත විය. මෙසේ මේ සමාසයෙහි සම්ප්‍රදානයට යොග්‍ය වූ දානාර්ථාදි අර්ථක්‍රියාපදයක් හා එහි කර්මය සමාස වන බවත් ඊට සම්ප්‍රදාන වූවකු උක්ත වන බවත් සලකාගත යුතුයි.

5. “ගුලුගොනඟුල්” යනු අවධ්‍යර්ථ අන්‍යාර්ථ සමාසයි. වානරයා ගලිත වූයේ යමකින් නම් හෙවත් වානරයාගේ ගිලිහීමට යමෙක් අවධි වූයේ නම් ඒ අවධිය “ගුලුගොනඟුල්” නම් වේ. එනම්-රුක යි. මෙහි “ගුලු” යන කර්තෘකාරක අර්ථක්‍රියාව හා එහි කර්තෘ වූ “ගොනඟුල්” ශබ්දය යන දෙදෙනාගේ සමාසයයි. ඊට අවධි වූ රුක එයින් උක්ත යි.මෙසේ මේ සමාසයෙහි අවධියට යොග්‍ය වූ අපගමනක්‍රියාදියක් සමග ඊට යොග්‍ය ශබ්දයක් සමාස වන බවත් ඊට අවධි වූවකු එයින් උක්ත වන බවත් දතයුතුයි.

6. "සඳවත්, සිඟුවලඟ, දසබල, පසැස්" යන සතර සම්බන්ධාර්ථ අන්‍යාර්ථ සමාස වශයෙන් නිදීෂටයි. "සඳ වන් වත් ඇත්තී=සඳ වත්, සිඟු වූ වලඟ ඇත්තී= සිඟුවලඟ, දස බල ඇත්තේ=දසබල, පස් ඇස් ඇත්තේ=පසැස්" යනු ඒ සමාස පදයන්ගේ විග්‍රහ වාක්‍ය යි. සඳ වැනි මුහුණක් ඇත්තී "සඳවත්" නම් ද, කෘශ වූ මධ්‍යප්‍රදෙශය ඇත්ති "සිඟුවලඟ" නම් ද, බල දසයක් ඇත්තේ "දසබල" නම් ද, ඇස්පසක් ඇත්තේ "පසැස්" නම් ද වේ. මෙහි "සඳවත්" යන්නෙන් චන්ද්‍රයා වැනි මුහුණේ හිමියා ද, "සිඟුවලඟ" යන්නෙන් කෘශ වූ මධ්‍යප්‍රදෙශයාගේ හිමියා ද, "දසබල" යන් නෙන් දශවිධ බලයාගේ හිමියා ද, "පසැස්" යන්නෙන් පචවිධ අක්ෂින්ගේ හිමියා ද උක්ත බැවින් සම්බන්ධාර්ථ සමාසයි.

"සඳවන් වත යමකාගේ ද ඒ=සඳවත, සිඟු වූ වලඟ යමකාගේ ද ඒ=සිඟුවලඟ, දසයක් බල යමෙකුගේ ද ඒ=දසබල, පසක් ඇස් යමෙකුගේ ද ඒ=පසැස්" කියා ද මොවුන්ගේ විග්‍රහ යෙදිය හැකි වේ. "සඳවන් වත්" යන තන්හි "වන්" යන්න මධ්‍යපද වශ යෙන් ලොප් විය.

7. "මත්නේගජ, නන්සුරුවිරුබල" යන දෙක ආධාරාර්ථ සමා සයි. මත්වූ නොයෙක් හසතින් ඇතිවීමට ආධාරවූ ස්ථානය "මත්නේගජ" නම්, එනම් වනයයි. මේ පද තුණක් සම්බන්ධ වීමෙන් වූ සමාසයෙකි. නොයෙක් ශූරවීර භටයන් ඇති වීමට විෂය වූයේ "නන්සුරවිරුබල" නම්. එනම් එබදු යුඩාඞගණය යි. මේ පද සතරක් සම්බන්ධ වීමෙන් වූ සමාසයෙකි. මෙයින් "රන්" යන්න හා "රණගණ" යන්න උක්තාධාර යි.

මෙසේ කර්මාදි අර්ථ සතෙහි සමාසයන් දක්වා ඉක්බිති "සහ" යන නිපාතය සමග වූ සමාස විශෙෂයක් නිදසුන් කරන්නාහු "තරුවැල" යනාදිය කීහු.

**b. තරුවැල සහ වූයේ=සහතරුවැල නම්, අඹර. සම උදර ඇතියේ=සොහොවුරු.**

b. **සා**—මෙහි "සහතරුවැල, සොහොවුරු" යන දෙක "සහ" **ශබ්දය** සමග වූ අන්‍යාර්ථසමාස යි. තාරකාවලිය සමග වූයේ යමෙක් නම් ඒ "සහතරුවැල" නම් වේ. එනම් ආකාශය යි. මේ ප්‍රථමාර්ථයෙහි වූ අන්‍යාර්ථසමාස විශෙෂයෙකි. සමාන වූ උදරය හෙවත් කුක්ෂිය ඇති තැනැත්තේ "සොහොවුරු" නම් වේ. "සම උදරය යමෙකුගේ ද ඒ=සොහොවුරු" කියා ද මෙහි වාක්‍යය ගත යුතු යි. මෙයින් සම වූ උදරයාගේ හිමියෙකු උක්ත බැවින් ඒ සම්බන්ධාර්ථ සමාසයයි සැලකිය යුතු යි. තවද මෙහි "සහ"

ශබ්දය වාක්‍යයෙහි "සම" යි යොදනු ලදී. මෙහි "සහ=උදර" යි සිටි කල්හි ස්වරාදෙශ සන්ධිවිධියෙන් හකාරස්ථ අකාරයට හා පර වූ උකාරයට ඔකාරය වීමෙන් හා සකාරස්ථඅකාරයට පිළි පෙරැළි වීමෙන් "සොහොදර" කියා වේ. පසුව දකාරයට වකාරය හා වකාර රකාරස්ථ අකාරයට උකාරය වීමෙන් "සොහොවුරු"යි සිඩයි. ඉක්බිති මේ මුලු සාමාසය පිළිබඳ වූ විභෙදයක් දක්වන්නාහු "ලඹසවන්" යනාදිය කිහු.

**c. ලඹසවන් ඈ තගුණ නම්. ඉකුත්සයුරු ඈ අතගුණ නම්.**

**ඉති අන්අරුත්සමස්.**

---

c. **භා**—"ලඹසවන්" යනාදිය තද්ගුණ සමාස නම් ද "ඉකුත් සයුරු" යනාදිය අතද්ගුණ සමාස නම් ද වේ. ලඹ වූ සවන් යමෙකුගේ ද ඒ=ලඹසවන්, ඉකුත් සයුරු යමෙකු විසින්ද ඒ= ඉකුත්සයුරු" යනු මෙහි විග්‍රහ යි. එල්බෙන්නා වූ කන් ඇත්තේ "ලඹසවන්" නම් ද,ඉක්මවන ලද සාගරය ඇත්තේ "ඉකුත්සයුරු" නම් ද වේ.

වි—යම් සමාසයෙක්හි සමාස කරණු ලැබූ පදයන්ගේ ගුණය හෙවත් අර්ථය එයින් වාච්‍ය වූ අන්‍යපදයෙහි පවතී නම් ඒ තද් ගුණ නම් ද, එසේ නැත් නම් අතද්ගුණ නම් ද වේ. "ලඹසවන්" යන පදයන්ගේ අර්ථය එල්බෙන්නා වූ කන් යනුයි. එයින් වාච්‍ය වූ ක්ෂත්‍රියයා කෙරෙහි ඒ ගුණය පවත්නා බැවින් ඒ තද්ගුණ යි. "ඉකුත් සයුරු" යන පදයන්ගේ අර්ථය අතික්‍රමණය කළ සාගරය යනුයි. එයින් වාච්‍ය වූවෙකු කෙරෙහි ඒ ගුණය නොපවත්නා බැවින් ඒ අතද්ගුණ යි.

තවද මේ සමාසය තුල්‍යාධිකරණ භින්නාධිකරණ වශයෙන් ද දෙපරිදි වේ. යම් සමාසයෙක්හි සමාස පදයෝ විශෙෂණ සමාසයෙහි කී පරද්දෙන් තුල්‍යාධිකරණ වෙත් නම් ඒ සමාසය තුල්‍යාධිකරණ වේ. "එරුණුහස්, දුම්දුරු" යනාදිය මෙනි. මේ පද "එරුණු වූයේත් එම හස් වූයේත්=එරණුහස්" යනාදි වශයෙන් විග්‍රහ කළ හොත් විශෙෂණ සමාසයි, එකල්හි ඉන් වාච්‍ය වූ අන්‍යපදයෙක් නො ලැබේ.යම් සමාසයෙක්හි භින්නා ධිකරණ පදයෝ සමාස වෙත් නම් ඒ සමාසය භින්නාධිකරණ වේ. "පියුම්නැබ" යනාදි වශයෙනි. "නැබෙහි පියුම යමෙකුගේ ද ඒ= පියුම්නැබ" යනු එහි විග්‍රහයි. මෙහි සමාස වූ "නැබෙහි පියුම්"

යන දෙපදය භින්නාධිකරණ යි. පදාර්ථ දෙක එක් වස්තුවෙක්හි නොපවත්නා බැවිනි. භින්නාධිකරණ අන්‍යාර්ථ සමාසයෙහි පූර්ව පදය බොහෝ සෙයින් පරව යෙදේ. "සකත්, මුසලත්,, යනාදිය ද එසේයි.

උපමා පූර්වපද අන්‍යාර්ථ සමාසයෙක් ද වේ. "සඳවත" යනාදි වශයෙනි, නිපාත පූර්වපද අන්‍යාර්ථ සමාසයෙක් ද වේ. "අනඟ" යනාදි වශයෙනි, "අඟ නැත්තේ යමෙකුගේ ද ඒ=අනඟ" යනු එහි විග්‍රහ යි. ආකාර නැත්තේ යන අර්ථයි.

**අන්‍යාර්ථසමාසය නිමි.**

---

5. <u>ද්අරුත්සමස්සූතුර.</u>

**5. අගපාමොක් වන-සමුදා ම හෝ එපදන්,**
**ද් අරුතැ වූ පද සමාම්-ද් අරුත් සමස් නම් වෙ.**

5. **භා**—දකාරාර්ථ විෂයෙහි වූ පදයන්ගේ සමාගමය හෙවත් සම්බන්ධය දකාරාර්ථ සමාස නම් වේ. ඒ වනාහි ඒ දකාරවත් පදයන් අවයවයක් අවයවයක් වෙන් වෙන් වශයෙන් ප්‍රධාන වූ තන්හි හෝ සමුදාය එකක් ව ප්‍රධාන වූ තන්හි හෝ වේ.

**වි**—ඇතැම් පාලි සංස්කෘත ව්‍යාකරණයන්හි මේ සමාසයට චන්ද (චන්ව) සමාස යයි ව්‍යවහාර කෙරෙත්, ඇතැම් ව්‍යාකරණයන්හි චාර්ථසමාස යයි ද කියත්. එබැවින් මෙහි ද දඅරුත් සමස් යයි කිහු. මේ චකාරය හෝ දකාරය වාක්‍යවිෂයෙහි බොහෝ තන්හි යෙදේ, ඒ යෙදීම අර්ථ සතරක් ඇසුරු කරගෙණ බැව් ප්‍රකාශිත යි. ඒ අර්ථ සතර නම්-සමුච්චය අන්වාචය ඉතරේතරයොග සමාහාරයන මොහු යි.

එහි-එකිනෙකට අපෙක්ෂා නොකරන්නා වූ පදයන් එක් ක්‍රියාවෙක්හි සම්බන්ධ කිරීම සමුච්චයයි, ඒ අර්ථයෙහි වූ චකාරයෙන් හෝ දකාරයෙන් යුත් පදයෝ සමාස නොවෙත්. "උඹ විහාරයට ගොස් බුදුන් ද ගුරුන් ද වැඳ වරෙන්" මෙහි දයන්න සමුච්චයාර්ථ යි. මෙහි බුදු ගුරු ශබ්ද දෙක එකිනෙකට අපෙක්ෂා නොකෙරේ. එක තත්ත්වයෙහි ලා නො සැලකියයුතු හෙයිනි, එබැවින් ඒ දෙක සමාස නොවේ. එහෙත් "වැඳ" යන ක්‍රියාව ඒ පද දෙක සමගම යෙදිය හැකි වේ. එබැවින් එසේ සම්බන්ධ කිරීම පිණිස ද වාක්‍යවිෂයෙහි දකාරය යොදන ලදි.

යම් ප්‍රයොගයෙක්හි මුඛ්‍ය වූ පද සම්බන්ධයෙක්හි ලා අන්‍යතර අමුඛ්‍ය සම්බන්ධයකුදු අපෙක්‍ෂා කරත් හොත් ඒ සම්බන්ධ කර ගැණීම සඳහා යෙදෙන දකාරය අන්වාචයාර්‍ථ වේ. එබඳු තන්හි ද සමාස නොවේ. "උඹ ගමට පලයන් ගොණා ද ගෙණ වරෙන්" මෙහි ගමට යාම මුඛ්‍ය සම්බන්ධ යයි ද ගොණා ගෙණ ඊම අමුඛ්‍ය සම්බන්ධ යයි ද සැලකිය යුතුයි. මෙහි වූ "ගම්, ගොන්" ශබ්ද දෙක සමාස නොවේ. මෙබඳු තන්හි විජාතිය ක්‍රියාවයක්හුගේ සම්බන්ධය ඇති බැවින් එබදු ක්‍රියාවන් හා සම්බන්ධ වන්නා වූ පදයන් සමාස වීමෙන් අර්‍ථ විරොධය ද වේ.

එකජාතිය ක්‍රියාවන් සමග වෙන් වෙන් වශයෙන් යෙදෙන්නා වූ පදසම්බන්ධයෙහි යෙදෙන දකාරය ඉතරෙතරයොගාර්‍ථ වේ. "හිර ද යේ සඳ ද යේ" මෙහි "යේ" යන ක්‍රියාවය එකජාතිය වේ. "හිර, සඳ" යන දෙක ඒ ක්‍රියාව හා වෙන් වෙන් වශයෙන් සාධාරණ ව යෙදේ, එබැවින් ඒ දෙක සමාස ව "හිරසඳ යේ" කියා හෝ "හිරසඳ යෙත්" කියා හෝ යෙදේ. තවද පාලිසංස්කෘත යන්හි මේ සමාසයෙහි වූ පද බොහෝසෙයින් ම බහුවචන වේ. ඇතැම්විට එකවචන ද වේ. සිංහලෙහි එසේ නොව බොහෝ සෙයින් එකවචන වන බැවි ද, ඇතැම්විට බහුවචන හෝ වන බැවි ද පෙණේ. මේ මෙහි "අඟපාමොක්" යී කී-සමාසයයි.

තවද ඇතැම් පදසම්බන්ධයන්හි වූ පදයෝ එක් ක්‍රියා පදයක් හා එකවිට සම්බන්ධ වෙත්. එබඳු පදවිෂයෙහි යෙදෙන දකාරය සමාහාරාර්‍ථ වේ. "ඒ මල්ලේ තිබී දුරු ද මිරිස් ද ලුණු ද බිම වැටුනේය" මෙහි වූ "දුරු මිරිස් ලුණු" යන තුණ වෙන් වෙන් වශයෙන් නොව "වැටුනේ" යන ක්‍රියාව හා එකවිට සම්බන්ධ වේ. එබැවින් ඒ තුණ සමාස ව "ඒ මල්ලෙහි තිබී දුරුමිරිස්ලුණු බිම වැටුනේය" කියා යෙදේ. මෙසේ වූ සමාස පදය එකවචන ම වේ. මේ "සමුදුපාමොක්" යී කී සමාසයයි. මේ දෙවැදෑරුම් වූ දකාරාර්‍ථ සමාසයට නිදසුන් දක්වන්නා හු "හිර ද සඳ ද" යනාදිය කිහු.

a. **හිර ද සඳ ද=හිරසඳ. සැරියුත් ද මහමුගලන් ද=සැරියුත් මහමුගලන්. ඇස්හු ද අස්හු ද රිය ද පද ද=ඇත්අස්රියපද. අඟපාමොක් තැන බුහුබස ද රූසි, බඹසුරනරෝ නමදිත්. සමුදුපාමොක් තැන එකබස රූසි. ගිනැවුම්.**

**ද අරුත්සමස් නිමි.**

---

## සමස් අදියර පස්වනු.

a. භා—මේ නිදසුන් සුගම වේ. මෙහි “හිරසඳ, සැරියුත් මහමුගලන්” යන දෙක අඟපාමොක් සමාස යයි ද හෙවත් ඉතරේතරයෝග සමාස යයි ද, “ඇත්අස්රියපද” යන්න සමුදුපාමොක් සමාස යයි ද හෙවත් සමාහාර ද්වන්ද්ව සමාස යයි ද දතයුතුයි. මෙහි අඟපාමොක් තැන බුහු බස ද රිසි වේ යයි කියා “බඬසුර නරෝ නමදිත්” යනු ඊට නිදසුන් කරණ ලද්දේය. මෙයින් අඟවන්නේ සිංහලෙහි ඉතරේතරයෝග ද්වන්ද්ව සමාසය බොහෝ තන්හි එකවචන වන බැව් හා ඇතැම්විට බහුවචන ද වන බවයි. ඒ මෙහි “බුහුබස ද” යන තන්හි දකාරයෙන් පැවසේ. “ගිනැවුම්” යන නිදසුන දක්වා සමුදුපාමොක් තැන එකවචන වන බැව් කිහු.

බොහෝ සෙයින් ඉතරේතරයෝග ද්වන්ද්ව වශයෙන් සමාස වන්නා වූ ශබ්ද විශේෂතත්ත්වයෙක්හි පවත්නවුන් බැව් ද, සමාහාරවශයෙන් සමාස වන්නා වූ ශබ්ද සාමාන්‍යතත්ත්වයෙක්හි පවත්නවුන් බැව් ද භාෂාතත්ත්වයෙන් පෙණේ. එසේ ම සමාස වශයෙන් ශබ්දයන් ගැලපීමේදී ශ්ලිෂ්ටෝච්චාරණය ඇතිවනලෙස ශබ්දයන්ගේ ගැලපීම වන බැව් පෙණේ. බොහෝසෙයින් ශ්ලිෂ්ටෝච්චාරණය ලැබෙන්නේ අල්පස්වර ශබ්දයන්ගේ පූර්ව නිපාතයෙන් හෙවත් පූර්වයෙන් හෙලීමෙන් යයි ද, ස්වරසමත්වය ඇති තන්හි ඒ ශබ්දයන්ගෙන් වාච්‍ය වූ අර්ථයාගේ ප්‍රධානත්වය සලකා එබඳු ශබ්දයන්ගේ පූර්වනිපාතයෙන් යයි ද, ඒ ප්‍රධානත්වය සම තන්හි ඉකාරාන්තයන්ගේ හෝ උකාරාන්තයන්ගේ පූර්ව නිපාතයෙන් යයි ද සංස්කෘත ශාබ්දිකයෝ කිහු.

## සමාසාධිකාරය
## නිමි.

---

### 6. වෙසෙසුන්වෙසෙස්අදියර.

පස්වැනි වූ සමස් විදිය පිළිබඳ ප්‍රතිනිර්දේශයන් දක්වා ඉක්බිති සමාසවිෂයෙහි දු දතයුතු විශෙෂ විධියක් වූ වෙසෙසුන් වෙසෙස් විදිය ද අධිකාරයක් කොට පවසන්නාහු “පාමොක් අත” යනාදිය කීහු.

#### වෙසෙසුන්වෙසෙස්ලකුණු.

a. **පාමොක් අත වෙසෙස්-වණන පද වෙසෙසුන් නම්,**
**වෙසෙසැ යෙදූ ලිඟුවිබත්-වෙසෙසුන් පෙදේ සම වේ.**

b. **යොදන වෙසෙස් සම වේ-වෙසෙසුනැ ලිඟු විබත් බස්,**
**නොයොදන තබ අනියමින්-කිවිකමෙහි තෙර පතුයේ.**

a. **භා**—(වාක්‍යවිෂයෙහි එකිනෙකට සම්බන්ධය ඇත්තා වූ අර්ථයන් අතුරෙන්) ප්‍රධාන වූ අර්ථය විශෙෂ්‍ය නම් ද, ඒ වර්ණනා කරන්නා වූ පදය හෙවත් අර්ථය විශෙෂණ නම් ද වේ. විශෙෂ්‍ය පදයෙහි යොදනලද ලිඞ්ගවිභක්ති (වචන) විශෙෂණ පදයෙහි ද සම වන්නේ වේ.

b. **භා**—ලිඞ්ගවිභක්තිවචනයන් එසේ සම කොට යොදත් හොත් විශෙෂණ පදය විශෙෂ්‍ය පදයට සම වේ, හෙවත් තුල්‍යාධිකරණ වේ. කාව්‍යකර්මයෙහි නිරප්‍රාප්තවූයේ එසේ සම කොට නොයොදත් හොත් අනියමින් තබන්නේය.

**වි**—විශෙෂ්‍යපදයෙහි වූ ලිඞ්ගවිභක්ති වචන විශෙෂණ පද යෙහි යෙදීම නියමය යි. විශෙෂ්‍යයෙහි යම් ලිඞ්ගාදියෙක් වේ නම් විශෙෂණයෙහි ද ඒ ලිඞ්ගාදිය ම යෙදියහැකි බැවිනි. ඒ තුල්‍යාධිකරණ ලක්‍ෂණ යි. විශෙෂ්‍යයෙහි වූ ලිඞ්ගාදිය විශෙෂණයෙහි නො යෙදීම අනියම යයි, එසේ වූ කල්හි විශෙෂණයෙහි යෙදිය යුතු ලිඞ්ගාදියෙහි නියමයක් නැති බැවිනි. මේ භින්නාධිකරණ ලක්‍ෂණයි.

ඒ ඒ වාක්‍ය විෂයෙහි වූ කවර පද දෙකක් වුවත් අර්ථවශයෙන් සම්බන්ධ වත් හොත් ඒ පදදෙකෙන් එකෙක් විශෙෂණ හා එකෙක් විශෙෂ්‍ය ද වේ. විශෙෂණ විශෙෂ්‍ය නො වූ පදයන්ගේ අර්ථවශයෙන් සම්බන්ධයෙක් නොලැබේ. ඒ සම්බන්ධ වන්නා වූ පදදෙක අතුරෙන් මුඛ්‍ය වශයෙන් සැලකිය යුතු පදය විශෙෂ්‍ය නම් වේ, යම් කිසි ගුණාදියකින් වෙනස්කරණු ලබන පදය යන අර්ථයෙන් ඊට විශෙෂ්‍ය යයි කියනු ලැබේ. "විශිෂ්‍යතෙ භෙද්‍යතෙ ගුණාදිභිරිති= විශෙෂ්‍යඃ" යනු එහි නිරුක්ති යි. එහි අමුඛ්‍යවශයෙන් සැලකිය යුතු පදය විශෙෂණ නම් වේ. වෙනස් කිරීමට ඉවහල් වූ පදය යන අර්ථයෙන් විශෙෂණ යයි කියනු ලැබේ. "විශිෂ්‍යතෙ'නෙනෙති= විශෙෂණම්" යනු එහි නිරුක්ති යි.

ඒ විශෙෂණය වනාහි තුල්‍යාධිකරණ භින්නාධිකරණ වශයෙන් දෙපරිදි වේ. එහි තුල්‍යාධිකරණ විශෙෂණයෙන් ලැබෙන වෙනස විශෙෂ්‍යපදයෙහි පවත්නේ යයි ද, භින්නාධිකරණ විශෙෂණයෙන් ලැබෙන වෙනස විශෙෂ්‍යපදයෙහි නොපවත්නේ යයි ද දතයුතුයි. එහි තත්ත්වය විශෙෂණසමාසවිස්තරයෙහි නිර්දිෂ්ටයි. සාමාන්‍ය යෙන්-විශෙෂ්‍යපය යම්කිසි ක්‍රියාපදයක් හා සම්බන්ධ කළ කල්හි විශෙෂණපදයාගේ අර්ථයත් සමග ම සම්බන්ධ වුවොත් ඒ විශෙෂණය තුල්‍යාධිකරණ යයි ද, එසේ නැත් නම් භින්නාධිකරණයයි ද දතයුතු යි. "ඒ උගත් දනවත් ගුණවත් මිනිහා ආයේය" යන

වාක්‍යයෙහි "මිනිහා" යන්න ප්‍රධාන පදය වේ. ඒ පදය "ආයේය" යන ක්‍රියාපදය හා සම්බන්ධ වූ බැවිනි, ඒ මිනිහා වනාහි "ඒ, උගත්, දනවත්, ගුණවත්" යන පදාර්ථයන් සමග ම සම්බන්ධ වූයේ වේ. එබැවින් එහි "ඒ උගත්" යනාදිය තුල්‍යාධිකරණ යි. "මිනිහාගේ අතේ වළල්ල වැටුනේය" යන වාක්‍යයෙහි මුඛ්‍යපදය "වළල්ල" යනු යි, "මිනිහාගේ" යනු ද "අතේ" යනුද එහි විශෙෂණයි. එහෙත් මෙහි "වැටුනේ" යන ක්‍රියාපදය හා සම්බන්ධ වූයේ "වළල්ල" පමණෙකි, වළල්ල මුත් මිනිහා ද අත ද නොවැටුන බැවිනි. මෙබඳු තන්හි ඒ ඒ පදයන්ගේ විශෙෂණ විශෙෂ්‍යත්වය ලැබෙන ආකාරය ද සැලකිය යුතු වේ. බොහෝ දේට සාධාරණ වූ වස්තුවෙක් යමක් කරණකොටගෙණ බහු සාධාරණත්වයෙන් වෙනස් කරගණු ලැබේ නම් ඒ විශෙෂණ වේ. "වළලු" යන වස්තුව බහු සාධාරණ වේ, එහෙත් මෙහි කී වළල්ල ඒ බහුසාධාරණත්වයෙන් වෙනස් කොට මිනිස් යන්නට අයත් වූවෙක් කොළේ වේ, එබැවින් ඊට ඉවහල් වූ "මිනිහාගේ" යන්න විශෙෂණ වේ. එසේ ම "වළල්ල" යන්න අත්පා ආදී බොහෝ අවයවයන්ට සාධාරණ වේ, මෙහි "අතේ වළල්ල" යයි "අත්" යන්නෙන් වෙනස් කළ බැවින් "අතේ" යනු ද විශෙෂණයි. මේ දෙක ම "වළල්ල" යන්න හා විභක්තියෙන් සම නුවූ බැවින් භින්නාධිකරණවිශෙෂණ යි.

තවද විශෙෂ්‍යපදයෙහි වූ ලිඞ්ග විභක්තිවචන තුල්‍යාධිකරණ විශෙෂණයෙහි යෙදෙන බැව් මෙහි කීහු. එහෙත් ඒ සාමාන්‍ය නිර්දෙශයෙකි, භාෂාවෙහි ඇතැම් ශබ්දයෝ නියතලිඞ්ග හා නියතවචන වූවෝ වෙත්, බොහෝ තන්හි එබඳු ශබ්දයන්ගේ ලිඞ්ගය හා වචනය විශෙෂ්‍යයට සමව නොයෙදේ. "ඒ මිනිහා ගැහැණියක් නොවේ" යන වාක්‍යයෙහි "මිනිහා" යන්න විශෙෂ්‍ය වේ, "ගැහැණියක්" යන්න එහි තුල්‍යාධිකරණ විශෙෂණ වේ. මෙහි විශෙෂ්‍යය පුංලිඞ්ග වූයේ ද, විශෙෂණය ස්ත්‍රීලිඞ්ග වූයේ ද වේ. "මිනිස්සු විස්සෙකි" යන වාක්‍යයෙහි "මිනිස්සු" යන්න විශෙෂ්‍ය ද "විස්සෙක්" යන්න එහි තුල්‍යාධිකරණ විශෙෂණ ද වේ. එහෙත් "මිනිස්සු" යන්න බහුවචන ද "විස්සෙක්" යන්න එකවචන ද වේ. මේ මෙසේ හෙයින් පාලිව්‍යාකරණ බාලාවතාරයෙහි–

"විසෙසෙස දිස්සමානා යා ලිඞ්ගසඞ්ඛ්‍යා විභත්තියො,
තුල්‍යාධිකරණෙ භීයො තා කත්තබ්බා තා විසෙසණෙ.

යනු කීහු. මෙහි අදහස විශෙෂ්‍යයෙහි පෙණෙන ලිඞ්ගවචන විභක්ති තුල්‍යාධිකරණ විශෙෂණයෙහි බොහෝ සෙයින් කටයුතුය යනු යි. මෙහි "භීයො" යන්නෙන් හෙවත් බොහෝ සෙයින්

කටයුතු යයි කීමෙන් ප්‍රකාශ කෙළේ නියතලිඞ්ග නියතවචන ශබ්දයන් විශෙෂ්‍යයට නොසමව ද තුල්‍යාධිකරණ විශෙෂණභාවයෙන් යෙදෙන බවයි. මේ මෙසේ හෙයින් තුල්‍යාධිකරණ විශෙෂණයෙහි විශෙෂ්‍යයට සමව ලිඞ්ග වචනයන් යෙදීම නියත නොවේ, විභක්තිය යෙදීම නියත වේ, විභක්තියෙන් භින්න වී නම් භින්නාධිකරණ යි.

තවද ඇතැම්විට තුල්‍යාධිකරණ විශෙෂණ වශයෙන් යෙදෙන පද ගුණවාචක ශබ්ද ම පමණෙක් ද්‍යෙයි සිතිය හැකි වේ. "ජාති ද්‍රව්‍ය ගුණ ක්‍රියා සංඥ" යන සියලු නාමයෝ ම විශෙෂණ වශයෙන් ද ඔවුහු ම විශෙෂ්‍ය වශයෙන් ද යෙදෙත්. "මිනිස් දූ" යි කී කල්හි "මිනිස්" යනු තුල්‍යාධිකරණ වූ ජාති විශෙෂණ යි. මනුෂ්‍ය වූ ජාතිය යන අර්ථයි. මෙහි සර්වසාධාරණ වූ දූ යන්න "මිනිස්" යන්නෙන් වෙනස් කළ බැවින් "මිනිස්" යන්න විශෙෂණ යි. "ඒ දඬුමුවා මිනිසෙකි" යන වාක්‍යයෙහි "දඬුමුවා" යන්න "මිනිස්" යන්නට තුල්‍යාධිකරණ වූ ද්‍රව්‍යවිශෙෂණ යි. "ඒ ලොකු මිනිසෙකි" මෙහි "ලොකු" යනු ගුණ විශෙෂණයි. "ඒ පිසන මිනිසෙකි" මෙහි "පිසන" යන්න ක්‍රියාසඞ්ඛ්‍යාත විශෙෂණයි. "සියාතු මිනිහා ආයේය" මෙහි "සියාතු" යනු සංඥ විශෙෂණ යි, බහු සාධාරණ වූ "මිනිස්" යන්න සියාතු යන්නේ වෙනස් කළ බැවිනි.

මෙකී ජාත්‍යාදි පවකය විශෙෂ්‍ය ද වේ. "මිනිහාගේ දූ" යි කී කල්හි බහු සාධාරණ වූ "දූ" යන ජාතිපදාර්ථය "මිනිස්" යන් යනත් වෙනස් කළ බැවින් "මිනිහාගේ" යන්න විශෙෂණ ය, "දූ" යන ජාතිපදාර්ථය විශෙෂ්‍ය යි. "මිනිසාගේ දඬු, මිනිසාගේ ලොකුව, මිනිසාගේ පිසීම, මිනිසාගේ නම" යා තන්හි "දඬු, ලොකු, පිසීම, නම" යන මේ බහුසාධාරණ වූ ද්‍රව්‍ය ගුණ ක්‍රියා සංඥවෝ විශෙෂ්‍යයෝ යි, ඔවුන් වෙනස් කරගැණීමට ඉවහල් වූ "මිනිහාගේ" යන්න විශෙෂණ යි.

මේ විශෙෂණ විශෙෂ්‍යවිධිය වනාහි ඉතා සියුම් ලෙසින් දු කල්පනා කටයුතු වේ. එසේ කල්පනා කිරීමෙන් විශෙෂණ විශෙෂ්‍ය භෙදය පිළිබඳ සියුම් දැනීමෙක් ද ලැබේ. බොහෝ සෙයින් විශෙෂණ වූ පදය විශෙෂ්‍ය ද විය හැකි වේ. ඒ මෙසේයි. "පිසන මිනිසෙක් වේ" යි කී කල්හි බොහෝ ක්‍රියාවන්ට සාධාරණ වූ මිනිසා "පිසන" යන ක්‍රියාවෙන් වෙනස් කළ බැවින් "පිසන" යන්න විශෙෂණ යි. "පිසන්නේ මිනිසා යි" කී කල්හි බහු සාධාරණ වූ "පිසන" යන ක්‍රියාව "මිනිස්" යන්නෙන් වෙනස් කළ බැවින් "මිනිසා" යන්න විශෙෂණ යි.

එසේ ම "පිසගෙණ කයි" කී කල්හි "සිහාගෙණ මිලදීගෙණ" යනාදි බොහෝ ක්‍රියාවන්ට සාධාරණ වූ කැම "පිසගෙණ" යන් නෙන් වෙනස් කළ බැවින් "පිසගෙණ" යන්න විශෙෂණයි, "කයි" යන්න විශෙෂ්‍ය යි. දීම් විකිණීම් ආදි බොහෝ ක්‍රියාවන්ට සාධාරණ වූ පිසීම කැමෙන් වෙනස් කළ බැවින් "කයි" යන්න විශෙෂණයි, "පිසගෙණ" යන්න විශෙෂ්‍ය යි. මෙලෙසින් ක්‍රියාපදයන්ගේ ද විශෙෂණ විශෙෂ්‍යත්වය ලැබේ. මේ පිළිවෙළින් ඒ ඒ පදයන්ගේ විශෙෂණ විශෙෂ්‍යත්වය සලකා බැලිය යුතුයි. මෙහි විශෙෂණ විශෙෂ්‍යත්වයට නිදසුන් දක්වන්නාහු "නමව්" යනාදිය කිහු.

---

<u>තුල්‍යාධිකරණවිශෙෂණ විශෙෂ්‍ය</u>

a. **නමව් මුනිඳුතුමා-තුමා සිරින් පබසරා,**
**සරාසිසිකල්දසනා-සනාරෙසෙනදහු දියේ.**

**ඉති වෙසෙසුන් වෙසෙස් සම ලිඟු විබත් බස් පියෝ.**

---

a. භා—තමන්වහන්සේගේ දෙහශ්‍රියෙන් ප්‍රභාස්වර වූ ද, ශරච්චන්ද්‍රයා සේ දැකුම්කලු වූ ද, ලෝවැස්සා කෙරෙහි සෙනහ රසයෙන් ආර්ද්‍ර වූ ද මුනීන්ද්‍රොත්තමයන්වහන්සේ වඳිව්.යනු මෙහි අර්ථයි.

වි—මේ ගීයෙහි "නමව්" යන ක්‍රියාපදය හා සම්බන්ධ වූ යේ "මුනිඳුතුමා" යන කර්මපදය යි, එබැවින් ඒ පදය මෙහි මුඛ්‍යයයි ද, එහෙයින් ම විශෙෂ්‍ය ය යිද සැලකිය යුතු යි, ඒ පදය වර්ණනා කළ පද නම් "පබසරා, සරාසිසිකල්දසනා, අදහු" යන තුණයි, මේ පදත්‍රයේ අර්ථ හෙවත් ගුණ මුනිඳුතුමා කෙරෙහි පවත්නා බැවින් ද, එහෙයින් ම "මුනිදුතුමා" යන පදය ඒ පදත්‍රයේ අර්ථයන් සමග ම ක්‍රියාව හා සම්බන්ධ වන බැවිවින් ද ඒ පදත්‍රය තුල්‍යාධිකරණ යි. "මුනිඳුතුමා" යන්න පුංලිඞ්ග කර්මවිභක්ති එකවචන බැවින් මේ පත්‍රය ද එසේයි, ("සිරින්" යන්න "පබසරා" යන්නෙහි ද "තුමා" යන්න "සිරින්" යන්නෙහි ද, "සනාරෙසෙන්" යන්න "අදහු" යන්නෙහි හා දියේ යන්නෙහි ද භින්නාධිකරණ විශෙෂණ යි.)

---

<u>භින්නාධිකරණවිශෙෂණ,</u>

b. **නමව් පිරිසිඳ සැබ-විනයූ අනාවන්මන්,**
**පද අතුනෙක කෙණේ දන්-පවරමුනි රජහු සරණ.**

**ඉති අනියමින් තුබූ වෙසෙසුන්පියෝ.**

b. භා—අතීත අනාගත වර්තමාන යන කාලත්‍රයෙහි වූ පදාර්ථයන් එකවිට තත්වූ පරිද්දෙන් පිරිසිඳ දත වදාළාවූ උතුම්වූ මුනීන්ද්‍රයන්වහන්සේගේ පාදයුගමය වඳිව් යනු මෙහි භාවයයි.

වි—මේ ගීයේ මුඛ්‍යපදය "සරණ" යන්න යි. "නමව්" යන ක්‍රියාපදය හා සම්බන්ධ වූ පදය බැවිනි. බහුසාධාරණ වූ සරණ යන්න ඒ බහුසාධාරණත්වයෙන් වෙනස් කිරීමට යෙදූයේ "මුනිරජහු"යනු යි, එබැවින් "මුනිරජහු" යන්න විශෙෂණ යි. ඒ දෙක එකවස්තුක නොවන බැවින් භින්නාධිකරණ යි. එබැවින් එහි විභක්තිය "සරණ" යන්නෙහි විභක්තියට සම නොකොට අනිය මින් තුබූයේ වේ. මෙහි වූ සෙසු වෙසෙසුන් වෙසෙස් කියනලද අනුසාරයෙන් දතයුතු යි.

---

කිවිකාමසරින්වෙසෙසුන්වෙසෙස්යෙදීම.

**c. වෙසෙසුන් වෙසෙස් විදි–කිවි කම සරිණ් වනුයේ,**
**අරුත්විශකනවරෙහි–වෙසෙසුනැ යොදු වුදු.**

**තෙලෙ යන මහවැහැප් රුවන් නම්. සඳ නම් හෙලිල් ලඹු එන්නී.**

**ඉති කාමසරින්වූ වෙසෙසුන් වෙසෙස් විනිස.**

---

## වෙසෙසුන් වෙසෙස් අදියර සවනු.

---

c. භා—විශෙෂණවිශෙෂ්‍ය විධිය කවිහුට කැමති සේ හැසිරී මෙන් වන බැව් ද, අර්ථය පවසන කල්හි(තුල්‍යාධිකරණ)විශෙෂණ පද අවසානයෙහි 'වූ' යන ධාතුව යෙදිය යුතු බැව් ද කියා "තෙලෙ යන"යනාදිය ඒ සඳහා නිදසුන් කරණ ලද්දේය

වි—පුරාණ සන්න ආදියෙහි මේ නිදසුන්හි ලා කිවිකාමසර වර්ණනය කරන්නාහු "අර යන්නා වූ මහාවෘෂභ තෙමේ රුවන් නම් වේ" යනුවෙන් "මහවැහැප්" විශෙෂ්‍ය කොට ද "අර යන්නාවූ මහාවෘෂභ වූ රුවන්නමැත්තේ ය" යනුවෙන් "රුවන්නම්" යන්න විශෙෂ්‍ය කොට ද, "යන" යන්න දෙකෙන් කවරකට වුවත් විශෙෂණ කොට ද, දෙවන වාක්‍යයෙහි "චන්ද්‍රා නම් වූ ධවලාඞ්ගනා තොමෝ එන්නී ය" යනුවෙන් "හෙලිල්ලඹු" යන්න විශෙෂ්‍ය කොට ද "ධවලාඞ්ගනාවූ චන්ද්‍රා නමැත්තී එන්නීය" යනුවෙන් "සඳනම්" යන්න විශෙෂ්‍ය කොට ද, "එන්නී" යන්න

ඒ දෙකෙන් කවරකට වුවත් විශෙෂණ කොට ද ගැණීම කවිහුට කැමති පරිද්දෙන් කටයුතු යයි කිහු. ඇතැම්විට එකපදය ම විශෙෂණවශයෙන් හෝ විශෙෂ්‍යවශයෙන් සැලකිය හැකි බැව් මෙහි අප විසින් ද නිර්දිෂ්ටයි, එහෙත් මෙහි සිද්ධාන්තසඞ්ග්‍රහ කර්තෘපාදයන්ගේ අදහස අනෙකක් ද විය හැකි වේ. එනම්- අර්ථසම්බන්ධයේ දී විශෙෂණ විශෙෂ්‍ය දෙකෙන් විශෙෂණ පදය පළමු කොට කියවෙන බැවින් වාක්‍ය ද්විත්වයෙහි ද එසේ ම යෙදේ යයි සිතිය හැකි වේ, එහෙයින් ඒ නිරාකරණය කිරීම සඳහා ඒ වෙසෙසුන් වෙසෙස් යෙදීම කිවිකමසරින් වේ යයි පවසනු වස් මෙසේ කියනලද්දේ යයි සිතිය හැකි වේ. මෙහි පූර්වවාක්‍යයෙහි "යන" යන පදය "රුවන්නම්" යන පදය ද විශෙෂණ සි, ඒ මධ්‍යයෙහි සිටි "මහවැහැප්" යන පදය විශෙෂ්‍යයි. දෙවන වාක්‍යයෙහි "සඳ නම්" යන පදයද "එන්නී" යන පදයද විශෙෂණයි, "හෙලිල්ලමු" යන පදය විශෙෂ්‍ය යි. මේ වාක්‍යවයෙහි ද විශෙෂයෙක් පෙණේ, එනම්-පළමුවන වාක්‍යයෙහි විශෙෂණ වූ අර්ථ ක්‍රියාපදය ආදියෙහි ද, දෙවන වාක්‍යයෙහි අවසානයෙහි ද යෙදීමයි. වාක්‍යවිෂයෙහි කවරතන්හි වුවත් අරුත් පවසන කල්හි තුල්‍යාධිකරණ විශෙෂණාන්තයෙහි "වූ" යන්න යෙදිය යුතු බැව් ද කිහු. පාලි ව්‍යාකරණ බාලාවතාරයෙහි "විසෙසන විසෙස්සානං යථෙච්ඡන්තා ක්වචි විසෙසණං පරං හොති" යන කිම ද මීට සාධක වේ. විශෙෂණ විශෙෂ්‍යයන් කැමැති පරිද්දෙන් යෙදිය හැකි බැවින් ඇතැම් තන්හි විශෙෂණපදය පරව ද යෙදේ යනු එහි අර්ථ යි.

## විශෙෂණවිශෙෂ්‍යාධිකාරය

නිමි.

---

### 7. කිරියඅදියර

මෙසේ වෙසෙසුන් වෙසෙස් අදියර දක්වා ඉක්බිති "පියවි පස කිරිය" යන වියරණ විදි තුණ පිළිබඳ ප්‍රතිනිර්දේශයන් දක්වන්නාහු මේ කිරිය අදිරිය හා අටවැති වූ පසරුත් අදියර ද කිහු. එහිදු ක්‍රියාපදයන් ධාතුමය බැවින් පළමුකොට ඒ ධාතුභේදයන් හඳුන්වන්නාහු "ඇති, සිටි" යනාදිය කිහු.

අකම්කසකම්කධාතුභෙද.

a. **ඇති සිටි ගිලි රෙදුම්-නිදි රැඳි බිය වැයි සිනා,**
**තුමු හැඬි තිනුම් පැකුලුම්-දිවි ඇඳ කම විමුන්.**

b. **දිස් ලබ සිඳි දැනුම්-සා රක් වද බඳ බොජුන්,**
**කර පිසිඹි වැහි හර දු-නම් ඇඳු සකම් නම්.**

a. **සා**—වීම, සිටීම, ගැලීම හෝ ගිලිහීම, රිදීම, නිදීම, රුදීම, බියවීම, විසීම, සිනාසීම, තුටුවීම, හැඬීම, සැලීම, පැකිලීම, ජීවත් වීම, යන මේ ආදි අර්ථයන්හි වූ ධාතු අකර්මක නම් වේ.

b. **සා**—දැකීම, ලැබීම, සිඳීම, දැනීම, යාම, රැකීම, කීම, බැඳීම, වැලඳීම, කිරීම, පිසීම, කැමැතිවීම, එළවීම, ගැණීම, දීම, නැමීම, යන මේ ආදි අර්ථයන්හි වූ ධාතු සකර්මක නම් වේ.

**වි**—අකර්මක සකර්මක ධාතු නිදේශය සඳහා සංස්කෘත වෛයාකරණයන් ද මෙලෙසින් කළ පද්‍යයෝ බොහෝ වෙත්. මේ ගී දෙකෙන් පමණක් නොව ඒ පද්‍යයන්ගෙන් ද අකර්මක සකර්මක ධාතූන්ගේ සම්පූර්ණ පරිච්ඡේදයෙක් නොලැබේ. පාලිබාලාවතාර කර්තෘපාදයන් විසින් වනාහි:-

"කත්තුවාචිනි ධාතුම්හි යස්මිං කම්මං ගවෙස්සතෙ,
සකම්මකොති සො ඤෙය්‍යො තබ්බිරුද්ධො අකම්මකො"

යන මෙයින් එහි ලා ඉතා පැසසිය යුතු පිරිසිඳීමෙක් කරණ ලදී. යම් ධාතුවක් කර්තෘවාචක කල්හි හෙවත් ධාත්වර්ථය හා කර්තෘපදයක් යෙදෙන කල්හි කර්මාර්ථයෙකුදු හෙවත් ඒ ධාත්වර්ථය හා යෙදෙන පදාර්ථයෙකුදු සෙවේ නම් හෙවත් සොයන්නට හැකි වේ නම් ඒ ධාතුව සකර්මක වේ, එසේ නොහැකි නම් ඒ ධාතුව අකර්මක වේ යනු එහි අර්ථයි. කවර ධාත්වර්ථයෙක් වුවත් කර්තෘවාචක වේ, කර්තෘ රහිත වූ ධාත්වර්ථයක් නැති බැවිනි. "මිනිසා සිටී" යි කී කල්හි ධාත්වර්ථය කර්තෘවාචක වේ. ඉන් පසු ඒ ධාත්වර්ථයට ආධාර වූ භූමි ආදියක් මුත් කර්මාර්ථයෙක් නො සෙවේ. එබැවින් ඒ ධාත්වර්ථය අකර්මක වේ. "මිනිසා පිසයි" කී කල්හි පිස ධාතුහුගේ අර්ථය හා යුක්ත වූ බත්ආදි කර්මාර්ථයෙක් ද සෙවේ, එබැවින් ඒ ධාත්වර්ථය සකර්මක වේ. ධාතු සියල්ලම මේ ක්‍රමයෙන් දතහැකි වේ.

බොහෝ සකර්මක ධාත්වර්ථයෝ ද ඇතැම් විට කර්මයක් අපේක්ෂා නො කෙරෙත්, එබඳු තන්හි ඒ අකර්මක වේ. එනම්- ගමනාර්ථධාතු සකර්මක යි, හැසිරීම ද ගමනෙකි, ඇවිදීම ද ගමනෙකි. ඒ හැසිරීම් ඇවිදීම් දෙක්හි කර්මය නො යෙදේ. "ඒ මිනිහා පාරේ හැසුරුණේ ය, පාරේ ඇවිද්දේ ය" යනාදි වශයෙන් දත යුතුයි. මෙලෙසින් වූ ධාත්වර්ථ භෙදයෝ බොහෝ වෙත්, පරීක්ෂා වෙන් බලා දතයුතු යි.

ඒ ඒ භාෂාවන් පිළිබඳ වාග්ව්‍යවහාර විලාසයෙන් ද ඇතැම් ධාත්වර්ථයෝ භාෂාවශයෙන් එකිනෙකට වෙනස් වූවෝ වෙත්. පාලි සංස්කෘත වාග්ව්‍යවහාරයෙහි ලා "මර-මෘඞ්" ධාතුව අකර්මක වේ. එහෙත් සිංහලව්‍යවහාරයෙහි සකර්මක වේ. "අබරා බල්ලන් මරයි" යනාදි වශයෙනි. මෙහි "බල්ලන්" යනු කර්මයි. පාලිසංස්කෘතව්‍යව හාරයෙහි "දෙවීම, ඉල්වීම" යනාදි අර්ථයන්හි පවත්නා ධාතුහු ද්විකර්මක වෙත්, එහෙත් සිංහල ව්‍යවහාරයෙහි ද්විකර්මක නොවෙත්. සිංහලව්‍යවහාරයෙහි "දෙනගෙන් කිරි දෙවී, දනවත්හුගෙන් දනය ඉල්වයි" යනාදි වශයෙන් එක් කර්මයක් මුත් කර්ම දෙකෙක් නො යෙදේ. පාළියෙහි "ගොපාලෝ ගාවිං ඛීරං දොහති, යාචකො ධනවන්තං ධනං යාචති" කියා වේ. මෙහි "ගාවිං ඛීරං" යන දෙක ද "ධනවන්තං ධනං" යන දෙක ද කර්මයි. සංස්කෘතයෙහි ද එසේ යි.

---

කාරකවශයෙන්ධාතුනියමය.

෧. **දුපද අකම් වත-කතුභව් පියෝ වනුයේ,**
**කතුකම් යි සව් පියෝ-සහකම්ගෙණෙහි වනුයේ.**

෧. භා—අකර්මකධාතුකක්‍රියාවන් කර්තෘකාරකයෙහි හා භාව යෙහි සිද්ධ බැව් ද, සකර්මකධාතුකක්‍රියාවන් කර්තෘකර්මකාරක දෙක්හි වන බැව් ද මෙයින් සූචිතයි.

වි—පාලිසංස්කෘතව්‍යාකරණයන්හි මේ ක්‍රියාධිකාරය ආඛ්‍යාත යන නමින් ව්‍යවහාර කරණු ලැබේ. එහි වූ කාරක නියමය ද මෙසේ මැ යි. ධාතුනිෂ්පන්න ශබ්ද කොටස් දෙකෙකි, එනම් ආඛ්‍යාතක්‍රියා හා කෘදන්තශබ්ද යි. මේ දෙකොටසෙන් කෘදන්ත ශබ්දයෝ ෂට්කාරකයෙහි හා භාවයෙහි සිද්ධවූවෝ ද ආඛ්‍යාතයෝ කර්ම කර්තෘ යන කාරකවයෙහි හා භාවයෙහි සිද්ධවූවෝ ද වෙත්. ඒ ආඛ්‍යාතයන් අකර්මක ධාතුවලින් කර්තෘ භාව යන දෙක්හි ද, සකර්මක ධාතුවලින් කර්ම කර්තෘ කාරක දෙක්හි ද වන බැව් පාලි සංස්කෘතයන්හි ද නියමය යි, එහෙත් සකර්මකධාතු විෂයෙහි යෙදෙන කර්මය නො කියටි කල්හි සකර්මකධාතුවලිනුදු භාවයෙහි ආඛ්‍යාතපද සිද්ධවිය හැකි බැව් ඇතැම් ආචාර්යවරයෝ කිහු.

මෙහි ආඛ්‍යාත වශයෙන් භාවක්‍රියාසිද්ධිය වන බැව් කී නමුදු ඊට නිදසුන් නො දක්වින, ඇතැම් සන්නයන්හි කෘදන්තභාව යෙහි නිදසුන් ආඛ්‍යාතභාවයෙහි ගෙණහැර දක්වා තිබේ. කෘදන්තභාවය පාලිසංස්කෘතයන්හි හා සිංහලෙහි ද අවිශෙෂ

යෙන් අකර්මක සකර්මක යන සියලු ධාතු වලින් ම සිඬයි. එනම්- “වනු විම” යනාදි යයි. මෙලෙසින් සිඬ පදයෝ ආඛ්‍යාතභාවයෝ නොවෙත්, ඔවුහු කෘදන්තභාවයෝ යි. ආඛ්‍යාත භාවනම්- “වේ” යනාදි ආඛ්‍යාත ක්‍රියා රූප විය යුතුයි. පාලිසංස්කෘත භාෂාවන්හි ද ආඛ්‍යාතභාවක්‍රියාපදයන්ගෙන් යුත් වාක්‍යයන් දකින්නට ලැබෙන්නේ විරල වශයෙනි. සිංහල වාක්‍යවිෂයෙහි දු ඇතැම් විට එසේ ඇතත් ඒ ප්‍රකට ව නොපෙණේ, යම් ආඛ්‍යාතපදයක් භාව නිෂ්පන්න නම් ඊට යෙදෙන කර්තෘපදය කතුවිබතින් යෙදේ, පෙරවිබතින් නොයෙදේ. සිංහල වාක්‍යවිෂයෙහි වූ පෙර විබත හා කතුවිබත බොහෝ සෙයින් රූපයෙන් සම වේ. එසේ ම ක්‍රියා රූපය ද බොහෝ සෙයින් කර්තෘභාව දෙකට සම විය හැකි වේ, පාලිසංස්කෘතයන්හි කර්තෘරූප ක්‍රියාරූප දෙකෙන් ම කර්තෘභාව දෙක ප්‍රකට ව පෙණේ, පාළියෙහි “බ්‍රාහ්මණෙන භුත්වා සුප්‍යතෙ” යනු ද, “රඤ්ඤා පාසාදෙ පාදෙහි ඨීයතෙ” යනු ද භාවප්‍රයොග යි. මේ වාක්‍යවය කර්තෘ ප්‍රයොග වශයෙන් කියත් හොත් “බ්‍රාහ්මණො භුත්වා සුපති, රාජා පාසාදෙ පාදෙහි තිඪති” යනු වේ. මෙසේ හෙයින් එහි කර්තෘ භාවප්‍රයොගයන්ගේ වෙනස පෙණේ. මේ වාක්‍යයන් සිංහලට ව්‍යවහාර කරත්හොත් “බමුණා වලඳා හොවී, රජ පහයෙහි පයින් සිටී” කියා හෝ “බමුණා (විසින්) වලඳා සිටීම, රජ (විසින්) පහයෙහි පයින් සිටීම” කියා හෝ විය යුතුයි. මෙහි අපරපක්ෂ ව්‍යවහාරය කෘදන්තභාව වශයෙනි, එයින් භාවාර්ථය ප්‍රකට වේ. එ බැවින් ම කෘදන්ත භාවයෙන් භවාර්ථය ප්‍රකට කිරීම පාලිසංස්කෘතවෛයාකරණයන්ගේ ද සිරිතෙකි. පාලියෙහි “තෙන තයා මයා වා භූයතෙ” යනු ආඛ්‍යාතභාව නිදර්ශන යි, එහි “තස්ස තව මම වා සම්පති භව නන්තාදො” යනුවෙන් කෘදන්තභාව ප්‍රයොගයෙහිලා අර්ථවිවරණය කළහ. පූර්වවාක්‍යප්‍රයොගයෙන් කර්තෘ අර්ථය මුත් භාවාර්ථය ප්‍රකට නොවේ.

තවද ආඛ්‍යාතභාවය ආත්මනෙපද ප්‍රථමපුරුෂ එකවචන යෙහි පමණක් සිඬ බැව් පාලිසංස්කෘත ව්‍යාකරණයන්හි සූචිතයි. සිංහලෙහි ක්‍රියා පිළිබඳ පරස්මෙපද ආත්මනෙපද විභාගයක් නො මැත්තේ ය. එබැවින් ප්‍රථමපුරුෂ හෙවත් අන්‍යකාරක එක වචනරූප පමණක් වියයුතු යි.

---

<u>පුරුෂභෙදය හා කාලභෙදය.</u>

**ශ. අන් න ම සදන් බඳ-කිරිය දනු නොකලේහි,**
**නිමියේ අයු නොනිමියේ-වත්මන් නොපැමියෙ අනා.**

අ. **භා**—අන්‍යශබ්ද තශබ්ද මශබ්දයන් පිළිබඳවූ ක්‍රියාව අතීත වර්‍තමාන අනාගත යන කාලත්‍රය වශයෙන් සිඩයි. යම් ක්‍රියාවක් කොට නිමියේ නම් ඒ අතීත යයි ද, පටන්ගෙණ නො නිමියේ නම් වර්‍තමාන යයි ද, පටන් නොගත්තේ නම් අනාගත යයි ද දතයුතුයි.

ටී—ක්‍රියාව ධාතුසිඩ යි, ධාත්වර්‍ථය වනාහි සියලු නාමයන්ට හා සියලු කාලයන්ට ද සාධාරණ වේ. එබැවින් ක්‍රියාව යම් කිසි නාමපදයක් හා කාලයක් අපෙක්‍ෂා කොට සිඩ වේ. ක්‍රියාසම්බන්ධ වශයෙන් භාෂාවෙහි වූ නාමයෝ තුණට බෙදෙත්. ක්‍රියාවිෂයෙහි ද අන්‍යයන්ට වඩා අභිනිකාරයා තමා බැවින් තමා යන අර්‍ථය පවසන්නා වූ සිංහල "ම" ශබ්දය හෝ පාලි "අම්හ" ශබ්දය හෝ සංස්කෘත "අස්මත්" ශබ්දය හෝ එක් කොටසෙකි. දෙවන අභිනිකාරයා තමාට අභිමුඛ වූවකු වියයුතු බැවින් අභිමුඛ වූවකුට ව්‍යවහාරකරණ සිංහල "ත" ශබ්ද හෝ පාලි "තුම්හ" ශබ්දය හෝ සංස්කෘත "යුෂ්මත්" ශබ්දය හෝ එක් කොටසෙකි, ඒ දෙකොටසින් වෙන් වූ සියල්ල ම එක් කොටසෙකි. සිංහලෙහි මේ මුල් කොටස අපෙක්‍ෂා කරණ ක්‍රියාව මසදකරු හෙවත් මශබ්දකාරක යයි ද, දෙවනකොටස අපෙක්‍ෂාකරණ ක්‍රියාව තසදකරු හෙවත් තශබ්ද කාරකයයි ද, ඒ හැර අන්‍ය වූ නාමයක් අපෙක්‍ෂා කරණ ක්‍රියාව අන්කරු හෙවත් අන්‍යශබ්ද කාරකය යි ද කියනු ලැබේ. "මසද කරු වූයේ යම් කිරියක්හට ද ඒ=මසදකරු-කිරිය" යනු "මසද කරු" යන්නෙහි නිරුක්ති යයි. මශබ්දය කාරක කොට ඇති ක්‍රියාව යන අර්‍ථයි. සෙස්ස ද එසේ යි. පාලිසංස්කෘතයන්හි අන්‍ය කාරකයට පඨමපුරිස-ප්‍රථමපුරුෂ යයි ද, තශබ්දකාරකයට මජ්ඣිමපුරිස-මධ්‍යමපුරුෂ යයි ද, මශබ්දකාරකයට උත්තමපුරිස-උත්තමපුරුෂ යයි ද කියත්. සිඩාන්තසඞ්ග්‍රහ කර්‍තෘපදයන්ගේ මේ පිළිබඳ නාමව්‍යවහාරය ශ්‍රෙෂ්ඨතර යයි කිය හැකි වේ.

තවද මෙලෙසින් වූ මේ කාරක තුණ "මශබ්දකාරක, තශබ්ද කාරක, අන්‍යකාරක" යන පිළිවෙළින් ව්‍යවහාර කටයුතු බැව් පෙණේ, එහෙත් මෙසේ කියන ලද්දේ අන්‍යකාරකය තශබ්දකාරක යෙහි ද, ඒ දෙක ම මශබ්දකාරකයෙහි ද සඞ්ග්‍රහ වන්නා වූ පිළි වෙළිනි. ඒ මෙසේයි:-"ඒ, ත" යන දෙක සඞ්ග්‍රහ වීමෙන් "තෙපි" කියා ද "ඒ, තූ, ම" යන තුණ සඞ්ග්‍රහ වීමෙන් "අපි" කියාද කිය හැකි වේ. "අපි කරමු" යි කී කල්හි "උඹත් මමත්" කියා හෝ, "එයත් උඹත් මමත්" කියා හෝ අර්‍ථය හැගේ. මෙසේ කාරක භෙදය හා කාලභෙදය පවසා පළමු කොට කාලත්‍රයෙහි අන්‍ය ශබ්දකාරක එකවචන බහුවචන ක්‍රියාරූපයන් පිළිබඳ ප්‍රත්‍යයයන් දක්වන්නාහු "ඒ ඉ ඊ" යනාදිය කීහු.

තෙකල්අන්කරුපසසුතුර.

**a. ඒ ඉ ඊ උ ද අයු-වත්මන් ඉ ඕ ඒආ,**
**නේයුන් අන් එනොන්නේ-අන්කරුඑකතනාවේ,**
**හ හු යුතු වියුතු උඟ-බුහුබසැ ඕ උ උන් හා,**
**යල අති නෙතොත් අන්නෝ-අන්නාහු නාහු ද වෙත්.**

අන්‍යකාරක.

| **එකවචන.** | **බහුවචන.** |
|---|---|
| **අයු**-ඒ, ඉ, ඊ, උ. | උඟහ, උඟහු, උඟ, ඕ, උ, උන්. |
| **වත්මන්**-ඉ, ඕ, ඒ, ආ. | අත්, ඉත්, එත්, ඔත්. |
| **අනා**-අන්නේ, එන්නේ; ඔන්නේ, නේ. | අන්නෝ, අන්නාහු, නාහු. |

භා—විබත් අදියරෙහි මෙන් මෙහිදු හෙවත් මේ ක්‍රියාරූපසිඞ්ධියෙහි දු ප්‍රත්‍යය රාශියෙක් දක්වන ලද්දේ ය. අතීත වර්තමාන අනාගත යන කාලත්‍රයයෙහි අන්‍යකාරක එකවචන බහුවචන වශයෙන් මේ "ඒ, ඉ" ආදිය දැක්වූහ. මෙසේ ප්‍රත්‍යය රාශියක් දැක්වුව ද ඔවුන්ගේ යෙදීම ජේකප්‍රයොගානුසාරයෙන් කටයුතු සි. මේ ප්‍රත්‍යයයන්ට පිළිවෙළින් උදාහරණ දක්වන්නාහු "දිවකුරුමුනි" යනාදිය කීහු.

---

අයුඅන්කරුඑකරුතකිරිය.

**1. ඒ-දිවකුරුමුනි යමාඉදුහු කෙළේ. 2. ඉ-සව්ලෝද එනරඹා තිවි. 3. ඊ-මහදෙනෝ කෙලෙසුන් වැනහි. 4. උ-එතැන බුදුසිරිසයුරෝරේ කුමුවු.**

**ඉති අන්කරු එකරුතැ අයුපස.**

---

1. භා—මෙහි "කෙළේ, තිවි, වැනහී, කුමුටු" යන ක්‍රියා සතර "ඒ ඉ ඊ උ" යන ප්‍රත්‍යය සතරට උදාහරණ සි. "කර, තුස, විපුඞ්-නස, කුමුද" යන ධාතුන්ගෙන් සිඞ සි. මොවුන්ගේ සිඞිය සිඞාකාරයෙන් දතහැකි බැවිනුත්, ව්‍යාඛ්‍යානයන්හි ප්‍රකට බැවිනුත් මෙහි නොලියමු.

වි—මෙහි-1 වාක්‍යයෙහි "කෙළේ" යන්නෙන් "දිවකුරුමුනි" යනු උක්තකර්තෘ සි. දීපඞ්කරසඞ්ඥ තෙමේ යනු එහි අර්ථයි. "යමාඉදුහු" යනු අනුක්තකර්ම සි, යමක සෘඞිය යන අර්ථයි. "කර" ධාතුවෙන් "කෙරි, කෙරී, කෙරූ" යනාදිය ද ව්‍යවහාරප්‍රාප්තයි.

2 වාක්‍යයෙහි "තිටි" යන්නෙන් "සව්ලෝද" යනු උක්තකර්තෘ යි. සකල ලොකධාතුතොමෝ යන අර්ථයි. ධාතුව අකර්මක බැවින් කර්මයෙක් නොසෙවේ. "නරඹා" යනු පෙරකිරිය යි. 'එ' යනු එහි කර්මයි. "සව්ලොද" යනු ම කර්තෘ යි. "තුස" ධාතුවෙන් "තිටි, තුටු" යනාදිය ද ව්‍යවහාරප්‍රාප්තයි. 3 වාක්‍යයෙහි "වැනති" යන්නෙන් "මහදෙනෝ" යනු උක්තකර්තෘ යි, මහාජන තෙමේ යන අර්ථයි. "කෙලෙසුන්" යනු අනුක්තකර්ම යි. ක්ලේශයන් යන අර්ථයි. 'නස' ධාතුවෙන් "නැසි නැසු" යනාදිය ද ව්‍යවහාර ප්‍රාප්තයි. 4 වාක්‍යයෙහි "කුමුටු" යන්නෙන් "මහදෙනෝ" යනු අධ්‍යාහෘත උක්තකර්තෘ යි. "බුදුසිරිසයුරෝරේ" යනු අනුක්තාධාරයි. බුද්ධ ශ්‍රී නමැති සාගරෝදරයෙහි යන අර්ථයි, "එතැන" යනු අනුක්තාධාරයි. ඒ ස්ථානයෙහි යන අර්ථයි. "කුමුද" ධාතුවෙන් "කිමිදි කිමිදී" යනාදිය ද ව්‍යවහාරප්‍රාප්තයි.

---

<u>වත්මන්අන්සරුඑසරුතකිරිය</u>

**1. ඉ-අප සැසිහු නවගසසුන් පවති. 2. ඕ-මුළුලෙව් ඔබ දහමොද බෝ. 3. ඒ-ඔබ අරිසග කොටුවන් දෙනේ. 4. ආ-එතුනුරුවන් නිසවත් පුද.**

**ඉති අන්සරුඑසරුතැවත්මන්පස.**

---

භා—මෙහි "පවති, බෝ, දෙනේ, පුද" යන සතර "ඉ ඕ ඒ ආ" යන ප්‍රත්‍යය සතරට උදාහරණයි. "පපුමී-වතු, පා, දන, පුද" යන ධාතුවලින් සිඩයි.

වි—1 වාක්‍යයෙහි "පවති" යන්නෙන් "නවගසසුන්" යනු උක්තකර්තෘ යි. නවාඞ්ගශාස්තෘශාසනය යන අර්ථයි. ධාතුව අකර්මක බැවින් කර්මයෙක් නොසෙවේ. "සැසිහු" යනු "නවග සසුන්" යන්නෙහි සම්බන්ධයි. භින්නාධිකරණ විශෙෂණයි. ශාක්‍ය සිංහයාගේ යන අර්ථයි. "අප" යනු සැසිහු යන්නෙහි සම්බන්ධයි. තද්භින්නාධිකරණ විශෙෂණ යි. මේ ධාතුවෙන් "පැවතේ" යනාදිය ද සිඩයි. "බෝ" යන්නෙන් "මුළුලෙව්" යනු උක්තකර්තෘයි. සකලලොකතෙමේ යන අර්ථයි. "දහමොද" යනු අනුක්ත කර්මයි. ධර්මෞජස යන අර්ථයි. "ඔබ" යනු තත්සම්බන්ධයි. භින්නාධිකරණ විශෙෂණ යි. උන්වහන්සේගේ යන අර්ථයි. "පා" ධාතුවෙන් "බොයි" යනාදිය ද සිඩයි. 3 වාක්‍යයෙහි "දෙනේ" යන්නෙන් "අරිසග" යනු උක්තකර්තෘ යි. ආර්‍ය්‍යසඞ්ඝතෙමේ යන අර්ථ යි. "කොටුවන්" යනු අනුක්තකර්ම යි. තීර්ථකයන් යන

අර්ථයි. "ඔබ" යනු "අරිසහ" යන්නෙහි සම්බන්ධයි. භිත්‍යාධිකාරණ විශෙෂණ යි. "දත" ධාතුවෙන් "දිතයි, දීතා" යනාදිය ද සිඩයි. 4 වාක්‍යයෙහි "පුදු" යන්නෙන් "තියවත්" යනු උක්ත කර්තෘ යි. ඥාතය ඇත්තෝ යන අර්ථයි. "තුනුරුවන්" යනු අනුක්ත කර්ම යි, රත්නත්‍රය යන අර්ථයි. "පුදු" ධාතුවෙන් "පුදයි" යනාදිය ද සිඩයි.

---

<u>අනා අන්කරු එකරුත කිරිය</u>

**1 අන්නේ-මෙතේදිනිඳු පස්මරුන් දනන්නේ.**

**2 එන්නේ-අපවග අමා දෙන්නේ.**

**3 ඔන්නේ-එ මහදෙනේ බොන්නේ.**

**4 නේ -එ උලෙලැ පොහොන් වැසි වස්නේ.**

භා—මෙහි "දනන්නේ, දෙන්නේ, බොන්නේ, වස්නේ" යන සතර පිළිවෙළින් "අන්නේ, එන්නේ, ඔන්නේ, නේ" යන ප්‍රත්‍යය සතරට උදාහරණ යි. "දන, දා, පා, වස්" යන ධාතුවලින් සිඩයි.

වි—1 වාක්‍යයෙහි "මෙතේ දිනිඳු" යනු "දනන්නේ" යන්නෙහි උක්තකර්තෘ යි, මෛත්‍රෙය ජිනෙන්ද්‍රතෙමේ යන අර්ථයි. "පස් මරුන්" යනු අනුක්තකර්ම යි. පචමාරයන් යන අර්ථයි. 2 වාක්‍ය යෙහි "දෙන්නේ" යන්නෙන් "මෙතේ දිනිඳු" යනුම උක්ත කර්තෘයි. "අපවගඅමා" යනු අනුක්ත කර්ම යි, නිර්වාණාමෘතය යන අර්ථයි. 3 වාක්‍යයෙහි "මහදෙනේ" යනු "බොන්නේ" යන්නෙහි උක්ත කර්තෘ යි. මහාජනතෙමේ යන අර්ථයි. "එ" යනු අනුක්ත කර්මයි. ඒ නිර්වාණාමෘතය යන අර්ථයි. 4 වාක්‍යයෙහි "පොහොන්වැසි" යනු "වස්නේ" යන්නෙහි උක්තකර්තෘ යි. මල්වැසි යන අර්ථයි. ධාතුව අකර්මක් බැවින් කර්මයෙක් නොසෙවේ. "එඋලෙලැ" යනු අනුක්තාධාරයි. ඒ උත්සවයෙහි යන අර්ථයි. "වස්" ධාතුවෙන් "වසින්නේ" කියා ද වේ.

---

<u>අයුඅන්කරුබුහුබස්.</u>

**1 උ9-රුසිහු මහගත් ගෙතූ.** (ගෙතූහ ගෙතූහු)
**හකරෙක් පස නැතිව ද හගු වේ.**

**2 ඕ-පඬිහු අරුත් පළකළෝ.** (කළහ කළහු)

**3 උ-එ නියවත්හු උගත්තු.** (උගත්හ උගත්හු)

**4 උන්-මරසෙන්හු බුන්.** (බුන්හ බුන්හු)

**ඉති අන්කරුහි බුහුබස අයුපස.**

**හා**—මෙහි "ගෙතූ, කළෝ, උගත්තු, බුත්" යන සතර පිළිවෙළින් "ඌ ඕ උ උන්" යන ප්‍රත්‍යය සතරට උදාහරණයි. "ගොත, කර, උපුජි-ගණ, බිඳ" යන ධාතුවලින් සිඩයි.

**වි**—1 වාක්‍යයෙහි "රුසිහු" යනු "ගෙතූ" යන්නෙහි උක්ත කර්තෘ යි, ඍෂිවරයෝ යන අර්ථයි. "මහගත්" යනු අනුක්ත කර්මයි. මහා ග්‍රන්ථයන් යන අර්ථයි. 2 වාක්‍යයෙහි "පඬිහු" යනු "කළෝ" යන්නෙහි උක්තකර්තෘ යි. "අරුත්" යනු අනුක්තප්‍රකෘති කර්මයි, "පළ" යනු විකෘති කර්මයි. 3 වාක්‍යයෙහි "නියවත්හු" යනු "උගත්තු" යන්නෙහි උක්තකර්තෘ යි, ඥානය ඇත්තාහු යන අර්ථයි. "එ" යනු අනුක්තකර්ම යි. 4 වාක්‍යයෙහි "මරසෙන්හු" යනු "බුත්" යන්නෙහි උක්තකර්තෘ යි. මාරසේනාවෝ යන අර්ථයි.

ඇතැම් තන්හි මේ ප්‍රත්‍යයයන් සමග "හ, හු" දෙක යෙදීමෙන් ද බහුවචන ක්‍රියාසිඩිය වේ. "ගෙතූහ-ගෙතූහු, බුත්හ-බුත්හු" යන ක්‍රියාවෝ එලෙසින් සිඩයි. "ඌහ-ඌහු, උන්හ-උන්හු" යනු එහි ප්‍රත්‍යය වශයෙන් සැලකිය යුතුයි. "කෙරූ-කෙරූහ-කෙරූහු, පිසූ-පිසූහ-පිසූහු, දුන්-දුන්හ-දුන්හු" යනාදිය ද මෙලෙසින් සිඩයි.

ඇතැම්තන්හි යථොක්ත ප්‍රත්‍යයයෙන් තොරව හුදකලාව ද "හ හු" වේ. "කළහ-කළහු, උගත්හ-උගත්හු" යන මොහු ඊට උදාහරණ යි. "කිහ-කිහු, ගියහ-ගියහු" යනාදිය ද එසේයි. ප්‍රත්‍යයවිධි සූත්‍රයෙහි "උන් හා" යන තන්හි හාකාරය ඒ විශෙෂයන් ගනු සඳහා යොදන ලදි. එ බැවින් "හකාරෙන් පස නැතිව ද හනු වේ" යනු කිහු.

---

වත්මත් අත්සරුබුහුබස්.

**1 අත්-වත්වත්හු මුනිගුණ වණත්.**
**2 ඉත්-ල ඇතියෝ එ විදිත්.**
**3 එත්-දනැතියෝ දන් දෙත්.**
**4 ඔත්-උඩනුවෝ මෙර බොත්.**
**යළ යනුවෙන් ඉයුතු ද රුයි.**

**ඉති අත්සරුහි බුහුබසැ වත්මන්පස.**

---

හා—මෙහි "වණත්, විදිත්, දෙත්, බොත්" යන සතර පිළිවෙළින් "අත්, ඉත්, එත්, ඔත්" යන සතරට උදාහරණ සි, "වණ විඳ දා පා" ධාතුවලින් සිඩයි.

වි—මෙහි-1 වාක්‍යයෙහි "වත්වත්හු" යනු "වණත්" යන්නෙහි උක්තකර්තෘ යි මුඛ ඇත්තෝ යන අර්ථයි. "මුනිගුණ" යනු අනුක්ත කර්ම යි. බුඩගුණ යන අර්ථයි. 2 වාක්‍යයෙහි "ල ඇතියෝ" යනු "විදිත්" යන්නෙහි උක්තකර්තෘ යි, හෘදය ඇත්තෝ යන අර්ථ යි. "එ" යනු අනුක්ත කර්ම යි. 3 වාක්‍යයෙහි "දනැතියෝ" යනු "දෙත්" යන්නෙහි උක්තකර්තෘයි. ධනය ඇත්තාහු යන අර්ථයි. "දන්" යනු අනුක්ත කර්ම යි. 4 වාක්‍යයෙහි "උඹනුවෝ" යනු "බොත්" යන්නෙහි උක්ත කර්තෘ යි. උඹත වූවෝ යන අර්ථයි. "මෙර" යනු අනුක්ත කර්මයි. මෛරෙය යන අර්ථයි.

තව ද මේ ප්‍රත්‍යයයන්ගේ අන්තයෙහි ඉකාරය වීමෙන් "අති ඉති එති ඔති" කියා ද වේ. එයින් "වණති" යනාදිය ද සිඩයි. ඒ ගණු සඳහා සූත්‍රයෙහි "යළ" යි අධික පදයෙක් යොදනලදී. එබැවින් "යළ යනුවෙන් ඉයුතු ද රූසී" යනු කිහු.

---

අනාඅන්කරු බුහුබස්.

**1 අන්නෝ-සුසිරි කළහු මෙතේ දිනිඳු පුදන්නෝ.**
**2 අන්නාහු-එසස්නෙහි පැවිදි වන්නාහු.**
**3 නාහු -අනතිරියපා කළහු ඔබ නොදක්නාහු.**
**දකරෙන් උ විසුතු ද වේ.**

**ඉති අන්කරුහි බුහුබසැ අනාපස.**

---

හා—මෙහි "පුදන්නෝ, වන්නාහු, දක්නාහු" යන තුණ පිළිවෙළින් "අන්නෝ, අන්නාහු, නාහු" යන තුණට උදාහරණ යි.

වි—"කළහු" යනු "පුදන්නෝ" යන්නෙහි උක්තකර්තෘයි. "සුසිරි" යනු "කළහු" යන අරුත්කිරියෙහි කර්ම යි. සුචරිත කළ අය යන අර්ථයි. "මෙතේ දිනිඳු" යනු "පුදන්නෝ" යන්නෙහි කර්ම යි. 2 වාක්‍යයෙහි "වන්නාහු" යන්නෙන් "(සුසිරි) කළහු" යනු ම උක්ත ප්‍රකෘති කර්තෘ යි. "පැවිදි" යනු විකෘති කර්තෘ යි. "වන් නාහු" යන තන්හි 'වූ' ධාතුව ප්‍රාප්ත්‍යර්ථවශයෙන් ගතහොත් "පැවිදි" යනු අනුක්ත කර්ම යි. "එසස්නෙහි" යනු අනුක්තාධාර යි. ඒ මෛත්‍රෙය සර්වඥයන් වහන්සේගේ ශාසනයෙහි යන අර්ථයි. 3 වාක්‍යයෙහි "කළහු" යනු "නො-දක්නාහු" යන්නෙහි උක්ත කර්තෘ යි. "අනතිරියපා" යනු "කළහු" යන්නෙහි කර්මයි. ආනන්තර්‍ය පාපය කළ අය යන අර්ථයි. "ඔබ" යනු "නොදක්නාහු" යන්නෙහි අනුක්ත කර්ම යි. උන්වහන්සේ යන අර්ථයි.

මෙහි "අන්නාහු, නාහු" යන දෙක උයන්නෙන් වියුක්තව ද යෙදේ. එයින් "නොදක්නාහ, වන්නාහ" යනාදිය ද සිඩසි. ඒ අර්ථය සූත්‍රෝක්ත දකාරබලයෙන් ගණු ලැබේ. ඒ සඳහා "දකරෙන් උවියුතු ද වේ" යනු කීහු.

---

### තසද-මසදකරු සුතුර.

**තසද කරු අරුත-මෙම පස හිහු සියෝ වෙවි,**
**ම සබද ඉයුතු උයුතු-වියුනෝයුතු මකර හා.**

**භා**—ත ශබ්දකාරකාර්ථයෙහි හෙවත් මධ්‍යම පුරුෂයෙහි එක වචනයට යථොක්ත "ඒ ඉ ඊ" ආදි වශයෙන් නිර්දිෂ්ට අනන්‍යකාරක එකවචන ප්‍රත්‍යයයන් සමග "හි" යන්න යොදා "එහි" යනාදිය හා බහුවචනයට ඔවුන් සමග "හු" යන්න යොදා "උහු" ආදිය ගත යුතු බැව් ද, මශබ්දකාරක එකවචනයට ඒ ප්‍රත්‍යයයන් සමග "මි, ම්" දෙක යොදා "එමි, එම්" යනාදිය හා බහුවචනයට ඒ ප්‍රත්‍යයයන් සමග "මූ, මෝ" දෙක යොදා "උමූ, උමෝ" යනාදිය ගතයුතු බැව් ද සූත්‍රෝක්ත යි. මේ සූත්‍රයෙහි **දූ** අවසානයෙහි වූ හායන්නේ බලයෙන් මශබ්දකාරක බහුවචනයෙහි මකාරය සමග "හ, හු" යොදා ගැණීමෙන් "මිහ, මිහු" දෙක ද ගැණේ. මිට නිදසුන් දක්වන්නාහු "තෝ තෙප්" යනාදිය කීහු.

---

### තෙකල් තසදකරු-එකබස්හාබහුබස්.

**1 තෝ, තෙප්, පෙර සුසිරි කෙළෙහි, කළහු.**
**2 දැන් රජ කෙරෙහි, කරහු.**
**3 මතු සෙන්පුර අත්පත් කරන්නෙහි, කරන්නහු.**

**ඉති තසබඳ තෙකල් කිරිය.**

---

**1. භා**—මෙහි "කෙළෙහි, කළහු" යන දෙක අතීතකාලික තශබ්දකාරක එකවචන බහුවචන දෙකට උදාහරණ යි. "තෝ පෙර සුසිරි කෙළෙහි, තෙප් පෙර සුසිරි කළහු" යි යොදාගත යුතුයි. සෙසුතන්හි ද එසේයි. මේ දෙක "කර" ධාතුවෙන් පරව "එහි, අහු" යන ප්‍රත්‍යය දෙක වීමෙන් සිඩසි. "කෙරෙහි, කරහු" යන දෙක වර්තමාන කාලික එකවචන බහුවචන යි. එහි ප්‍රත්‍යය ද "එහි, අහු" යනු ම යි. "කරන්නෙහි, කරන්නහු" යන දෙක අනාගත කාලික යි. එහි ප්‍රත්‍යය "අන්නෙහි, අන්නහු" යනු යි.

යනු කීහු. පාලිසංස්කෘත ව්‍යාකරණයන්හි ආඛ්‍යාතය ඉතා විස්තර

"තෝ" යනු වෙන් වෙන් වශයෙන් "කෙලෙහි, කොරෙහි, කරන්නෙහි" යන තුණෙන් උක්ත කර්තෘ යි. "සුසිරි" යනු "කෙලෙහි" යන්නෙහි හා "කරහු" යන්නෙහි අනුක්ත කර්ම යි. "පෙර" යනු අනුක්තකාලාධාර යි. "රජ" යනු "කොරෙහි" යන්නෙහි හා "කරහු" යන්නෙහි අනුක්ත කර්ම යි. "දැන්" යනු අනුක්ත කාලාධාරයි. "සෙත්පුර" යනු "කරන්නෙහි" යන්නෙහි හා "කරන්නහු" යන්නෙහි අනුක්ත ප්‍රකෘති කර්ම යි, "අත්පත්" යනු අනුක්ත විකෘති කර්ම යි. "මතු" යනු අනුක්ත කාලාධාරයි.

---

තෙකල් මඟදසරු එකබස් හා බුහුබස්.

**1. මම්, ඇප්, පෙර සපුරිසන් බිජිම්, බිජිමි. බිජුමු, බිජුමෝ, බිජුම්හ, බිජුම්හු. 2. දැන් දුලබ මුනිපුන තනතුර බෙජෙම්, බෙජෙමි. බජමු, බජමෝ-බජම්හ, බජම්හු. 3. මතු ලොවුතුරා දහම් බජන්නෙම්, බජන්නෙමි. බජන්නමු-බජන්නමෝ.**

**වහර යෙදෙන සේ පස යොදනු.**

**ඉති මඟබඳ තෙකල් කිරිය.**

---

**2. භා**—මෙහි "බිජිම්, බිජිමි" යන දෙක අතීතකාලික ම ශබ්ද කාරක එකවචනයට උදාහරණ යි. 'බජ' ධාතුවෙන් "ඉම්, ඉමි" ප්‍රත්‍යයයි. "බිජුමු, බිජුමෝ, බිජුම්හ, බිජුම්හු" යන සතර එහි බහුවචනයට උදාහරණ යි. "උමු, උමෝ, උම්හ, උම්හු" යනු ප්‍රත්‍යය යි. "බෙජෙම්-බෙජෙමි" යන දෙක වර්තමාන කාලික එකවචන යි. "එම්-එමි" යනු ප්‍රත්‍යය යි. "බජමු, බජමෝ, බජම්හ, බජම්හු" යනු බහුවචන යි. "උමු, උමෝ, උම්හ, උම්හු" යනු ප්‍රත්‍යය යි. "බජන්නෙම්- බජන්නෙමි" යන දෙක අනාගත එකවචන යි. "එන්නෙම්- එන්නෙමි" යනු එහි ප්‍රත්‍යය යි. "බජන්නමු-බජන්නමෝ" යනු බහුවචනයි. "අන්නමු- අන්නමෝ" යනු ප්‍රත්‍යය යි.

මෙහි "මම්" යනු "බිජිම්, බෙජෙම්, බජන්නෙම්" යනාදි එක වචන ක්‍රියාවන්ගෙන් උක්ත කර්තෘ යි. "ඇප්" යනු බහුවචන ක්‍රියාවලින් උක්ත කර්තෘ යි "සපුරිසන්, මුනිපුත් තනතුරු, ලොවුතුරා දහම්" යනු වෙන් වශයෙන් ත්‍රෛකාලිකක්‍රියාවන්ගේ අනුක්ත කර්මයි. "පෙර, දැන්, මතු" යනු තෙත්‍රකාලි අනුක්තාධාරයි.

මෙසේ මේ ප්‍රත්‍යයයන් සාමාන්‍යයෙන් විධානය කළ නමුදු ව්‍යවහාරයෙහි යෙදෙන පරිද්දෙන් ප්‍රත්‍යයයන්ගේ යෙදීම කටයුතු බැව් අනුශාසනය කරණු සඳහා "වහරයෙදෙන සේ පස යොදනු"

සහිත වේ. සාමාන්‍යයෙන් මේ සිදතෙහි සියලුම වියරණවිදි සංක්‍ෂිප්ත වේ. නාමයන් හා ධාතූන් වරනැඟීම වඩාත් සංක්‍ෂෙප කරණලද්දේ ය. එබැවින් මෙහි අවසානයෙහි "කල්කිරිය අරුත් පවසනු වස් මෙහි සන්පමණෙක් වියතලදි, විතර වහරෙන් විමසනු,, යනු කිහු. එබැවින් මෙහි සිංහල ධාතු සියල්ල ම ක්‍රියා රූපයන්හි ලා වරනැඟීමට විශෙෂ අනුශාසනයෝ නො කරණ ලද්දාහ. එසේ කෙළේ නම් මේ පොත මෙයින් විසිතිස් ගුණයක ටත් වඩා මහත් වියයුතු වේ, එසේ නොකරණ ලද්දේ ආචාර්‍ය්‍යොප දෙශයෙනුත් ව්‍යවහාරයෙනුත් මාතෘභාෂා ව්‍යාකරණානුසාර යෙනුත් දතහැකි බැවින් වියයුතු යි.

ධාත්වර්ථය ත්‍රෛකාලික බැවින් ඒ පැවසීම හා ක්‍රියාවිශෙෂ යන් පැවසීම පමණක් ග්‍රන්ථකර්තෘපාදයන්ගේ අදහස බැව් මෙහි වූ සූත්‍රොදාහරණවලින් දතහැකි වේ. සංස්කෘතයෙහි සූත්‍ර පන්සියය කටත් අධික ගණනකින් අනුශාසනය කරණ ලද ක්‍රියාධිකාරය පිළිබඳ මේ කොටස මෙහි සූත්‍රතුණෙකින් අනුශාසනය කරණ ලද්දේ ය. පාලිසංස්කෘතයන්හි ධාතු විශෙෂයන් වරනැඟීම සඳහා විශෙෂ සූත්‍රයන් දක්වීමෙන් ඒ මූල් කොට නිදසුන් දක්වන ලද්දේ ය. මෙහි එසේ නොව මේ කොටසෙහි ධාත්වර්ථයන් පිළිබඳ කාලකාරක (පුරුෂ) වචනයන් පැවසීම මූල් කොට නිදසුන් දක්වන්නානු "දිවකුරුමූනි යමාඉදුහු කෙළේ" යනාදි වශයෙන් තදනුරූප වාක්‍යයන් ගෙණහැර දැක්වූහ.

තවද සිංහලෙහි ආඛ්‍යාත ක්‍රියාරූප හා අන්‍යක්‍රියාරූප බොහෝසේ සමානත්වයෙන් පෙණෙන බැවින් ඔවුන්ගේ විශෙෂය පවසනු වස් "දූන් සදහම් රජකරන්නෝ" යනාදිය කිහු.

---

සදදහමින් වූ කිරියවෙසෙස්.

**උ. 1 දූන් සදහම් රජ කරන්නෝ ගොයුමා. 2 පණින් වෙල පන්නී අවිදු. 3 මායා තුසිපුරෙහි වුසූ. 4 මහමුහුණු සොමි නස් නම් පසේබුදු වනුයේ. 5 විසාළවැසි රහත්පල බජන්නි ඈ සදදහමින් අරුත්කිරිය සදවන කල් නො ඇරබ පස ලදින් ලිඟුවිබත් බෙජේ.**

උ. භා—මෙහි වූ "කරන්නෝ" යන රූපය ආඛ්‍යාත අනාගත කාලිකක්‍රියාවිෂයෙහි ද ඇතුළත් වේ. මෙහි වූයේ කල් නො ඇරබ තිපත් "කරණ" යන අරුත්කිරිය සදින් සිඬ වූ පුංලිඞ්ග පෙරවිබත් එක බස යි. එයින් වාච්‍යවූ පදය "ගොයුමා" යන පුං ලිඞ්ග පෙරවිබත් එක බස බැවින් හෙ ද එසේ විය. ඒ මෙහි වර්ත මාන කාලිකත්වයෙන් ව්‍යවහෘත යි. දූන් සඬම් රාජ්‍යය කරන්නෝ ගෞතම තෙමේ ය යන අර්ථයි.

2 වාක්‍යයෙහි "වෙළුපන්නී" යන්න "වෙළුපන" යන අරුත් කිරිය පෙදෙන් ස්ත්‍රීලිඞ්ග ප්‍රථමා විභක්ති එකවචන වශයෙන් සිඬ සි. එයින් වාච්‍ය වූ පදය "අවිදු" යන ස්ත්‍රීලිඞ්ග ප්‍රථමා විභක්ති එක වචනය බැවිනි. හේ ත්‍රෛකාලික වේ. ප්‍රාණීන් මූළා කරන්නී අවිද්‍යාවයි, යන අර්ථ යි.

3 වාක්‍යයෙහි "වුසු" යන්න "වස" ධාතුවෙන් නිපන් "වුසු" යන අරුත්කිරිය පෙදෙන් ස්ත්‍රීලිඞ්ග ප්‍රථමා විභක්ති එකවචන වශයෙන් සිඬ සි. එයින් වාච්‍ය වූ පදය "මායා" යන ස්ත්‍රීලිඞ්ග ප්‍රථමාවිභක්ති එකවචනය බැවිනි. එහි ස්ත්‍රීලිඞ්ගත්වයෙහි වූයේ "ඌ" ප්‍රත්‍යය යි, හේ මෙහි අතීත වශයෙන් ව්‍යවහෘත යි. මහාමායා තෝමෝ තුසී පුරයෙහි වාසය කළා යන අර්ථ යි. "වුසු" යි ආඛ්‍යාත අතීත වශයෙනු ද ක්‍රියාරූපයෙක් සිඬ යි.

4 වාක්‍යයෙහි "වනුයේ" යන්න "වනු" යන අරුත් කිරිය පෙදෙන් පුංලිඞ්ග පෙරවිබත් එකබස් වශයෙන් සිඬ යි. එයින් වාච්‍ය වූ පදය "මහමුහුණු" යන පුංලිඞ්ග පෙරවිබත් එකබස බැවිනි. හේ මෙහි අනාගත වශයෙන් ව්‍යවහෘත යි. උලූකපක්ෂී තෙමේ සොම්නස් නම් පසේබුදු වන්නේය යන අර්ථයි.

5 වාක්‍යයෙහි "බජන්නී" යන්න "බජන" යන අරුත්කිරිය පෙදෙන් ස්ත්‍රීලිඞ්ග ප්‍රථමාවිභක්ති එකවචන වශයෙන් සිඬ යි. එයින් වාච්‍ය වූ පදය "විසාඋවැසි" යන ස්ත්‍රීලිඞ්ග පෙරවිබත් එක බස බවිැනි. හේ මෙහි අනාගත වශයෙන් ව්‍යවහෘත යි. විශාඛා උපාසිකා තොමෝ රහත්පලය භජනය කරන්නී වේ යන අර්ථ යි. මෙසේ කල් නොඇරබ ශබ්දස්වභාවයෙන් නිපිද ලිඞ්ගවිභක්ති භජනය කරන්නා වූ අර්ථක්‍රියා විශෙෂයන් ඇතිබවත් ඔවුන් යථොක්ත ආඛ්‍යාතයන් නොවන බවත් මෙයින් නිර්දිෂ්ටයි.

වි—මෙහි ආඛ්‍යාතවිෂයෙහි නිදිෂ්ට බොහෝ අතීතක්‍රියා පදයෝ අර්ථක්‍රියාපදයන් මෙන් ද, එසේම පාලිසංස්කෘත කෘදන්ත යන්ගෙන් තදභව වූවන් මෙන් ද පෙණෙත්. කෙසේ නමුදු ඔවුන් රූපයෙන් අර්ථක්‍රියාවන්ට සම වුවත් අර්ථවශයෙන් ආඛ්‍යාත යයි සැලකිම සදෙස් නොවේ. පාලිසංස්කෘතයන්හි ද රූපයෙන් කෘදන්තයන්ට සම වූ ආඛ්‍යාතයෝ ඇත්තාහ. ඔවුන්ගේ විශෙෂය පෙණෙන්නේ ලිඞ්ගවිභක්ති භජනය කිරීමෙනි. ආඛ්‍යාත යන්ගේ ලිඞ්ගභෙදයෙක් නැත්තේ වේ. ආඛ්‍යාතය අලිඞ්ග බැවිනි. ආඛ්‍යාතය විභක්ති භජනය කරන්නේ නමුදු ඒ නාම විභක්ති නොවේ. එහෙත් සංස්කෘතයෙහි නාම විභක්තිරූප යන්ට සම වූ ඇතැම් ආඛ්‍යාත විභක්තිරූපයෝ ද ඇත්තාහ.

එනම්–"කෘඤ්" ධාතු ආඛ්‍යාත ලුට් විභක්ති ප්‍රථමපුරුෂ එකවි බහුවචන රූප "කර්තා කර්තාරෞ කර්තාරඃ" යනු යි. කෘදන්ත "කර්තෘ" ශබ්දයාගේ ප්‍රථමා විභක්ති එකවිබහුවචන රූප ද "කර්තා "කර්තාරෞ කර්තාරඃ" යනු යි. මේ ආදි වශයෙන් සමානවූවෝ ඇත්තාහ.

තවද පාලිසංස්කෘතයන්හි නිෂ්ඨාර්ථ "ත, තවන්තු, තාවී-ක්ත ක්තවතු" ප්‍රත්‍යයාන්ත කෘදන්තයෝ වාක්‍යවිෂයෙහි අර්ථවශයෙන් ආඛ්‍යාතයන්ට සමව යෙදෙත්. පාලියෙහි "සො ගාමං අගමාසි" යන වාක්‍යය ආඛ්‍යාත වශයෙනි. "සො ගාමං ගතො" යන වාක්‍යය කෘදන්තයොග වශයෙනි. මේ දෙක්හි ම සිංහලවාක්‍යය 'හෙ තෙමේ ගමට ගියේ" යනු යි. මේ මෙසේ හෙයින් මෙහි දක්වූ උදාහරණයන්හි පෙණෙන කෘදන්තස්වරූප ආඛ්‍යාත පද ආඛ්‍යාත නොවේ යයි සැලකිම යුතු නොවේ. එහෙයින් මෙහි ලිඞ්ගවිභක්ති භජනය කරන්නවුන් කෘදන්තභාවයෙන් ද ලිඞ්ගවිභක්ති භජනය නොකරන්නවුන් ආඛ්‍යාතභාවයෙන්ද සැලකිය යුතු බැව් 'දූන් සදහම් රජ කරන්නේ" යනාදියෙන් ප්‍රකාශිත යි.

තවද සිංහලෙහි අනාගත ක්‍රියා රූපවිශෙෂයෙක් නැතැයි ද ඇතැම් අයගේ මතයෙකි. අති පුරාණ සිංහල භාෂාවෙහි වර්තමාන ක්‍රියාරූපය ම අනාගතවශයෙන් ව්‍යවහාර කර තිබේ. ඒ ව්‍යව හාරය ද නිවැරදි වේ. පාලිසංස්කෘතයන්හි ද වර්තමාන ක්‍රියාරූප යන්ගේ හා අනාගතක්‍රියාරූපයන්ගේ අන්‍යොන්‍ය විශෙෂය ඉතා ස්වල්පයෙකි. එහෙයින් ම අනාගතක්‍රියා විධිය පවසන්නාවූ සංස්කෘත වෛයාකරණයෝ වර්තමාන ක්‍රියාසිද්ධියෙහි ලා විධාන කළ "තිප් තස් අන්ති" යනාදි විභක්ති ප්‍රත්‍යයයන් ම "ස්‍ය" යන් නක් සහිත කොට ගැණීම සඳහා අනුශාසනය කළහ. එහෙයින් වර්තමාන වූ "භවති භවතඃ භවන්ති" යනාදි රූපයෝ ම අනාගතවශ යෙන් "භවිෂ්‍යති, භවිෂ්‍යතඃ, භවිෂ්‍යන්ති" යනාදි වශයෙන් සිද්ධ යි. එහෙත් පසු කලකදී සිංහලෙහි කාලභෙදය ප්‍රකට කිරීම සඳහා "වන්නේ පිසන්නේ" යනාදි ක්‍රියාරූපයන් අනාගතකාලික වශ යෙන් ව්‍යවහාර කළ බැව් පෙණේ.

මෙසේ ත්‍රෛකාලික වශයෙන් ක්‍රියාවන්ගේ සාමාන්‍ය නිර්දේ ශය කොට ඉක්බිති විශෙෂාර්ථ ප්‍රකාශක වූ ක්‍රියාභෙදයන් පව සන්නාහු "පියදූකිරිය බේ" යනාදිය කිහු.

---

කිරිය බේ.

**a. පියදූකිරිය බේ–අන්තසද විදි ආසි,**
**කමරූක කොකාල් කිරිය ද–දනු පද අසබහව හා.**

අ. භා.—ප්‍රයොජ්‍ය ක්‍රියාව පිළිබඳ භෙදය ද, අන්‍යශබ්දකාරකයෙහි හා තශබ්දකාරකයෙහි සිද්ධ වූ විධි ක්‍රියාව ද, ත්‍රෛකාලික වශයෙන් වූ කර්මාර්ථ ක්‍රියාව ද, අසම්භාව්‍ය ක්‍රියාව ද මෙහි ලා දතයුතු සි.

---

## පියඳු කිරිය.

**1. පරු විසින් මෙහෙයන ලදහු කිරිය පියඳු කිරිය නම්. මෙහි දසින් පරව වපස රුසි. කම්කෙලෙස් සසර පණන් බැම වි. මනගොනා ළඳුන් කෙළවා. මෙතේ සිඟතිඳු ලෙවන් ගලවන්නේ. නම සඳ දෙක්හි ද යෙදිය යුතු.**

අ. භා.—අන්‍යයකු විසින් ප්‍රෙරණය කරණ ලද්දහුගේ හෙවත් ක්‍රියාවෙහි ලා මෙහෙයන ලද්දහුගේ ක්‍රියාව පියඳුකිරිය (ප්‍රයොජ්‍ය ක්‍රියා) නම් වේ. මේ ප්‍රයොජ්‍ය ක්‍රියාසිද්ධියෙහි ධාතු කොරෙන් පරව "ව" ප්‍රත්‍යය අභිමතවිය යුතු සි. "බැමවී කෙළවා ගලවන්නේ" යන තුණ ත්‍රෛකාලික අන්‍යකාරක එකවචන ප්‍රයොජ්‍යක්‍රියාවන්ට උදාහරණ සි. ඒ ක්‍රියාරූපත්‍රය පිළිවෙළින් "බම, කෙළ, ගල" යන ධාතු කොරෙන් ප්‍රයොජ්‍යාර්ථ 'ව' ප්‍රත්‍යය හා "ඊ, ආ, අන්නේ" යන විභක්ති ප්‍රත්‍යයයන් වීමෙන් සිද්ධ සි. "කර්මක්ලෙශ තෙමේ සංසාරයෙහි ප්‍රාණීන් භ්‍රාන්ත කෙළේ ය. අනඞ්ග තෙමේ තරුණියන් ක්‍රීඩා කරවයි. මෛත්‍රෙය සුගතෙන්ද්‍ර තෙමේ ලෝවැස්සන් ගලවන්නේය හෙවත් සසරින් මුදන්නේ ය, යනු වාක්‍යත්‍රයෙහි අර්ථසි.

වි—සිංහලෙහි වූ "පියඳු" යන්න "ප්‍රයොජ්‍ය" යන්නෙන් බිඳුනේ වේ. ප්‍රකර්ෂයෙන් යොදන ලද්දේ හෙවත් මෙහෙයන ලද්දේ යනු එහි අර්ථ සි. ප්‍රයොජ්‍යයකු ඇති තන්හි ප්‍රයොජකයකුදු ඇති වියයුතු සි. "ප්‍රයොජක" යන්නේ අර්ථය මෙහෙයන්නා යනු සි. එබැවින් මෙහි පියඳුකිරිය වණන්නාහු "පරු විසින් මෙහෙයන ලදහු කිරිය පියඳුකිරිය නම්" යනු කිහු. මෙහි "පරු" යන්නෙන් ප්‍රයොජකයා ගත යුතු සි.

මේ ප්‍රයොජ්‍ය විෂයෙහි වනාහි ක්‍රියාසිද්ධිය පිළිබඳ වූ ව්‍යාපාර දෙකෙකි. එබැවින් ඒ දෙක පිළිබඳ වූ කර්තෘහු ද දෙදෙනෙක් වෙත්. ඒ ව්‍යාපාර දෙකෙන් එකෙක් නම් ප්‍රයොජ්‍ය ප්‍රත්‍යයයෙහි අර්ථ යයි, හෙවත් මෙහෙයීම සි. අනෙක නම් ධාත්වර්ථ යයි. ඉන් ප්‍රයොජ්‍යාර්ථය හෙවත් මෙහෙයීම ප්‍රයොජකයාගේ ද, ධාත්වර්ථය ප්‍රයොජ්‍යයාගේ ද වේ. "මහත්මයා මෙහෙකරුවා ලවා පොළොව කොටවයි" යන වාක්‍යයෙහි ධාත්වර්ථය කෙටීම සි. ඒ වනාහි මෙහෙකරුවාගේ මහන්සියෙන් සිද්ධ සි. එබැවින් ඒක්‍රියාව මෙහෙකරු

වාගේ විය යුතු යි. ඒ ප්‍රයොජ්‍ය කර්තෘ යි. ඒ ධාත්වර්ථයෙහි ලා මෙහෙකරුවා මෙහෙයන්නේ මහත්මයා යි. ඒ මෙහෙයීම මහත්මයාගේ මහන්සියෙන් සිද්ධ යි. එබැවින් ඒ ක්‍රියාව මහත්මයාගේ වියයුතුයි, ඒ මහත්මයා ප්‍රයොජක කර්තෘ යි. එසේ වුවද ක්‍රියාර්ථයෙහි ලා ප්‍රයොජක තෙමේ මුඛ්‍ය වේ. ක්‍රියාඵලය ලබන්නහු බැවිනි. බොහෝ සෙයින් ක්‍රියාඵලය නොලබන බැවිනුත් ප්‍රයොජකයාගේ මෙහෙයීමට යටහත් වන බැවිනුත් ප්‍රයොජ්‍ය තෙමේ අමුඛ්‍ය වේ. මෙහෙයීමට යටහත් වන බැවින් ඒ අමුඛ්‍යයා කර්ම ද වේ. එහෙත් ක්‍රියාව කරණ බැවින් හේ කර්ත්‍රර්ථ වේ.

මේ ප්‍රෙරණය වනාහි-"ප්‍රෙෂණ, අනුග්‍රහ, අධ්‍යෙෂණ, අනුමති" වශයෙනුදු නන්වැදෑරුම් වේ. එහි මෙහෙකරු ආදීන් ක්‍රියාවෙහි යෙදීම ප්‍රෙෂණප්‍රෙරණ යි. "මහත්මයා මෙහෙකරුවා ලවා පොළොව කොටවයි" යනු ඊට නිදර්ශනයි. මෙබඳු තන්හි ක්‍රියාජන්‍යඵලය ප්‍රයොජකයා පිළිබඳ වේ. ක්‍රියාව නොකොට ඉන්නවුන් අනුග්‍රහ පූර්වක අනුශාසනයෙන් ක්‍රියාවෙහි යෙදීම අනුග්‍රහ ප්‍රෙරණයි. "මෙතෝ සුගතිදු ලෙවන් ගලවන්නේ" යනු ඊට උදාහරණ යි. මෙහි ධාත්වර්ථය මිදීමයි, මිදෙන්නෝ ලෙව්හු යි. ඔව්හු ප්‍රයොජ්‍ය වෙත්, මෙතෝසුගතිදු ප්‍රයොජක වේ. මෙහි ක්‍රියාජන්‍ය ඵලය ප්‍රයොජ්‍යයා පිළිබඳ වේ. සත්කාරපූර්වක ආරාධනයෙන් ක්‍රියාවෙහි යෙදීම අධ්‍යෙෂණප්‍රෙරණ යි. "උපාසක මහත්මයා හාමුදුරුවන් ලවා බණ කියවයි" යනු ඊට උදාහරණ යි. මෙහි ක්‍රියාජන්‍යඵලය ප්‍රයොජකයා පිළිබඳ වේ. අනුදැනිමක් හෙවත් අවසරයක් නොලැබීමෙන් ක්‍රියාවෙහි නොයෙදී ඉන්නහු අනුදැනීමෙන් ක්‍රියාවෙහි යෙදීම අනුමතිප්‍රෙරණයි. "ඇදුරුතෙමේ අතැවැසියා ලවා හිස මුඩු කරවයි" යනු ඊට උදාහරණ යි. මෙහිදු ක්‍රියාජන්‍යඵලය ප්‍රයොජකයා පිළිබඳ වේ.

ක්‍රියාව ප්‍රයොජ්‍ය රහිත අවස්ථාවෙහි වූ කර්තෘ ප්‍රයොජ්‍ය සහිත වූ කල්හි කර්මය වේ. එකල්හි ප්‍රයොජ්‍ය ප්‍රත්‍යයබලයෙන් ලැබෙන ප්‍රයොජකයා හෙවත් මෙහෙයන්නා කර්තෘ වේ. ඒ ධාත්වර්ථයෙහි කර්තෘ නොව මෙහෙයීමේ කර්තෘය යි දතයුතු යි. "සසරපණුහු බැමූ, යෝනෝ කෙළිත්, ලෙව්හු ගලන්නාහු" යනු යථොක්ත උදාහරණයන්ගේ ප්‍රයොජ්‍යරහිතාවස්ථා යි. මෙහි "බැමූ, කෙළිත්, ගලන්නාහු" යන ක්‍රියාවන්ට "සසරපණුහු, යෝනෝ, ලෙව්හු" යන මොහු කර්තෘ වෙත්. ප්‍රයොජ්‍යාවස්ථාවෙහි ඔවුහු "සසරපණන්" යනාදි වශයෙන් කර්ම වූහ. ප්‍රයොජ්‍ය වූ පසු ප්‍රයොජකයාගේ වශයෙන් ක්‍රියාව යෙදේ. මේ නිදසුන් තුණෙහි ම ධාතු අකර්මක වේ. ප්‍රයොජ්‍ය බලයෙන් අර්ථය සකර්මක විය.

තවද මේ ප්‍රයෝජ්‍යව්‍යවහාරය සියලු ක්‍රියාර්ථයන් විෂයෙහි ම යෙදේ. හේ මෙසේ දතයුතුයි.

---

## කරධාතු.

---

| ක්‍රියා. | අප්‍රයෝජ්‍ය. | ප්‍රයෝජ්‍ය. | ක්‍රියා. | අප්‍රයෝජ්‍ය. | ප්‍රයෝජ්‍ය. |
|---|---|---|---|---|---|
| විධි– | කරව | කරවව | මිශ්‍රක්‍රියා– | කරමින් | කරවමින් |
| ආශීර්වාද– | කෙරේවා | කරවාවා | අතීතක්‍රියා– | කළ | කරවූ |
| කාමාර්ථ– | කෙරේ | කෙරවේ | ,, | කරණ | කරවන |
| අසම්භාව්‍ය– | කරන | කරවන | භාවක්‍රියා– | කරණු | කරවනු |
| පූර්වක්‍රියා– | කරලා | කරවාලා | ,, ,, | කිරීම | කරවීම |

මේ සියල්ල ම ව්‍යවහාරානුසාරයෙන් යොදගත යුතු යි.

තවද මෙහි නිදසුන් කළ "ගලවන්නේ" යන්නෙහි ධාතුව "ගල" ධාතුව නොවේ යයි ද මොචනාර්ථ "ගල" ධාතුවෙක් නැතැයි ද, එසේ ඇත් නම් ප්‍රයෝජ්‍යරහිතව එයින් සිද්ධ වූ පද ඇතිවිය යුතු යයි ද, මෙහි ධාතුව "ගලව" යි වියයුතු යයි ද, "ගලව" ධාතුව වුවොත් නිදර්ශනය ස්ථානෝචිත නොවේ යයි ද ඇතැම්හු කියති. එසේවුව ද මෙහි ධාතුව "ගල" ධාතු ම වියයුතු යි. මොචනාර්ථ හෙවත් ච්‍යවනාර්ථ "ගල" ධාතුවෙක් පාලිසංස්කෘත දෙක්හි ද විද්‍යමාන යි. ඒ අකර්මක ද වේ. "ගලිත" යනාදිය එයින් සිද්ධයි. සිංහලෙහි දු ඒ ධාතුව තත්සම වශයෙන් ව්‍යවහාරප්‍රාප්ත විය. බොහෝසෙයින් එය සිංහලෙහි ව්‍යවහාරයට පැමිණ තිබෙන්නේ සකර්මකත්වයෙනි, එහෙත් ධාතුප්‍රකෘතිය අකර්මක වේ, ඒ සකර්මකත්වයෙන් වහර යෙදෙන්නේ ප්‍රයෝජ්‍ය බලයෙනි. ශිෂ්ටව්‍යවහාරයෙහි යෙදෙන පරිද්දෙන් පදසිද්ධි ආදිය කරණු විනා මේක මෙසේ නම් මේකත් එසේ ම වියයුතු යයි හිස් තර්ක ඇති කර ගැණීම ශාස්ත්‍රීය නොවේ. "ගල-ගිලිහුම්හි" යන ධාතුවෙන් ප්‍රයෝජ්‍ය රහිතව නිපන් පද ද සිංහලෙහි නැත්තේ නොවේ.ගිලිහිම ද මොචන පර්යාය යි. මේ සිදතෙහි ම අන්අරුත්සමස්හි නිදසුන් කළ "ගිලිහුනු ගොනහුල් යමකින් හෙතෙම=ගුලුගොනහුල්" යනු ද පසරුත් ආදියරෙහි වූ "ගලන" යනු ද ඊට සාධකයි. "ගිලිහී, ගිලිහේ, ගිලිහෙන්නේ" යනාදී ක්‍රියාපදයෝ ද "ගල" ධාතුවෙන් නිපන් "ගිලි" යන පූර්වක්‍රියාපූර්වක "හි" ධාතුවෙන් සිද්ධ යි. ගලිතව වැටී යනාදි අර්ථයි.

## පියදුකිරියෙහි අකම්සකම්බේ.

**a. අකම් සකම් වේ- පියදුම් ලද විසැහි,**
**බුහුකම් සකම් පියදුම්- ලදහට ලවා හා වේ.**

**b. සුදෙට අතැවැසි ලවා මේ පිසවා. ඈහි. හකාරෙන් කිසි තන්හි නොවේ, "මුවවස්නි යුතු බුලත් දිදි දෙවා දරුවන්" මෙ ඈහි.**

## ඉති පියදු කිරිය.

---

a. භා—ප්‍රයොජ්‍ය ප්‍රත්‍යය වූ තන්හි අකර්මකධාතුව සකර්මක වීම ද, සකර්මකධාතුව විකර්මක වීම ද මෙහි නියමය යි. සිංහල ව්‍යවහාර යෙහි බොහෝ තන්හි ප්‍රයොජ්‍යයා කෙරෙන් පර ව "ලවා" යන නිපාතය ද යෙදේ.

වි—ප්‍රයොජ්‍ය වීමෙන් අකර්මකධාතුන්ගේ සකර්මකත්වය ද සකර්මකධාතුන්ගේ ද්විකර්මකත්වය ද, ද්විකර්මකධාතුන්ගේ ත්‍රිකර්මකත්වය ද පාලිසංස්කෘතයන්හිදු නියමය යි. කෙසේ වුවත් මෙයින් හැඟෙන්නේ ප්‍රයොජ්‍ය ප්‍රත්‍යය බලයෙන් විශෙෂකර්මයක් ලැබෙන බව යි. ක්‍රියාවකට යටත් වූ පදය කර්මභාවයට පැමිණීම ස්වභාවය යි. මෙබඳුතන්හිදු මෙහෙයීම් ක්‍රියාවට යටත් වීමෙන් ප්‍රයොජ්‍යයා කර්ම වේ.

b. භා—පූර්ව නිර්දිෂ්ට උදාහරණත්‍රය ප්‍රයොජ්‍ය බලයෙන් අකර්මකධාතුන්ගේ සකර්මකත්වයට උදාහරණ යි. එහි තත්ත්වය පෙර කියූ බැවින් මෙහි නොකියමු. "සුදෙට" යනාදි වාක්‍යය සකර්මක ධාතුන්ගේ ද්විකර්මකත්වයට උදාහරණ යි. එහි ප්‍රයොජ්‍ය රහිත වාක්‍යය "අතැවැසි මේ පිසා" යනු යි. මෙහි "අතැවැසි" යනු කර්තෘ යි, "මේ" යනු කර්ම යි. ප්‍රයොජ්‍ය වූ කල්හි අතැවැසියා සුදෙටුවාගේ මෙහෙයීමට යටත් වීමෙන් කර්ම විය. හේ ක්‍රියාසිද්ධිය කරණ බැවින් කර්ත්‍රර්ථ ද වේ. සිංහලෙහි බොහෝ තන්හි ඔහු කෙරෙන් "ලවා" යන පදය ද යෙදේ. "අතැවැසි ලවා" යනාදි වශයෙනි. මෙහි "මේ, අතැවැසි" යන දෙක ම කර්ම යි. "ලවා" යන්න පූර්වක්‍රියාර්ථ නිපාත යෙකි, හේ වනාහි "නුත්වා" යන ප්‍රෙරණාර්ථ පූර්වක්‍රියාවෙන් බිඳුනු නිපාතයක් විය හැකි වේ. එකල්හි "අතැවැසි ලවා" යන්නෙහි අර්ථය "අතැවැසියා මෙහෙයා" යනු යි. ඇතැම් තන්හි "ලවා" යන්න රහිත ව ද යෙදේ. "මුවවස්නි" යනාදි වාක්‍යය ඊට උදාහරණ යි. මුඛවාසයෙන් යුක්ත වූ තාම්බූලය දරුවන් ලවා දෙවා යනු ඒ වාක්‍යයෙහි අර්ථ යි. මුඛවාස නම් මුව සුවඳ කරණ එන්සහල් ආදි ද්‍රව්‍ය සමූහය යි.

තවද මෙහි නිර්දිෂ්ට 'ව' ප්‍රත්‍යය ඇතැම් තන්හි ප්‍රයොජ්‍ය රහිත ව ද යෙදේ. සංස්කෘතයෙහි ප්‍රයොජ්‍ය ප්‍රත්‍යය "ණිච්" හෝ "ණි" යනු යි. පාලියෙහි "ණෙ" ආදිය යි. පාලිසංස්කෘතයන්හි "චුර" ආදි ධාතුගණයා කෙරෙන් ප්‍රයොජ්‍යරහිත ව ස්වාර්ථවශයෙ නුදු මේ ප්‍රත්‍යයයෝ යෙදෙත්. සිංහලෙහිදු ඒ ධාතුගණයෙන් බිඳුනු ඇතැම් ධාතු කෙරෙන් ප්‍රයොජ්‍යරහිත ව ද 'ව' ප්‍රත්‍යය යෙදේ. "කියවයි, කැඳවයි" යනාදිවශයෙනි. මෙහි "කිය" ධාතුව චුරාදිගණයෙහි "කථ" ධාතුවෙන් ද "කැඳ" ධාතුව "ක්‍රන්ද" ධාතු වෙන් ද බිඳුනේ වේ.

ප්‍රයොජ්‍යක්‍රියාව නිමි.

---

විදිකිරිය.

**2. වත්මන් අනාරූ- නොවෙන් ව හොත අනදරින්,**
**අදරින් හෙත ත අන්- සබඳහට විදහන් විදි නම්.**

2. භා—වර්තමාන අනාගත දෙක්හි රූපභෙදයෙන් තොර ව හෙවත් වර්තමාන අනාගත දෙකට සම ව අනාදරයෙන් හෝ ආදර යෙන් හෝ අන්‍යශබ්ද ත ශබ්ද සම්බන්ධයට විධාන කිරීම විධික්‍රියා නම් වේ.

වි—යමක් නියොග කිරීමට හෝ ඇණවීමට ව්‍යවහාර කරණ ක්‍රියාව විධික්‍රියා යි සැලකිය යුතු යි. ඒ නියොගය හෝ ඇණවීම ආදරයෙන් හෝ අනාදරයෙන් ද කට හැකි වේ. ඒ නියොගය හෝ ඇණවීම ලබන්නහු "ත" ශබ්දය හෝ අන්‍ය ශබ්දයක් විය යුතු යි. එයින් පැවසෙන්නේ මේ ක්‍රියාවිධිය තශබ්ද කාරක අන්‍ය කාරක දෙක්හි පමණක් වන බව යි. මශබ්ද කාරකයෙහි නො වේ. කාලවශයෙන් වර්තමාන හෝ අනාගත වේ, ක්‍රියාව කාලවයෙහි රූපයෙන් සම වේ.

මේ විධික්‍රියාර්ථය වනාහි "විධි, නිමන්ත්‍රණ, ආමන්ත්‍රණ, අධ්‍යෙෂණ" ආදි වශයෙන් නානා විධ වේ. ඒ සියලු භෙදයෝ ම විධි ක්‍රියාවෙහි ඇතුළත් වෙත්. ඔවුහු ව්‍යවහාරානුසාරයෙන් දතයුතු යි. එහි දාසාදි පහත් කෙනෙකුට කරණ නියොගය විධි නම් වේ. "තෝ අද බත පිස" යනාදි වශයෙනි. අවශ්‍යයෙන් කටයුතු වූ ක්‍රියාවෙක්හි දූ දරු ආදීන්ට කරණ නියොගය නිමන්ත්‍රණ නම් වේ. "උඹ නිකරුණේ කල්ගත නොකර හොඳින් ඉගෙනීම කරපන්" යනාදි වශයෙනි. කැමැති නම් කිරීම පිණිස අනුදැනීම හෙවත් අවසර දීම ආමන්ත්‍රණ නම් වේ. මීට අනුමති

යයි ද කියනු ලැබේ. "පින්වත් තෙමේ කැමැති නම් මෙහි සැන සෙන්නේ" යනාදි වශයෙනි. සත්කාර පූර්වක ව්‍යාපාරය හෝ නියොගය අධ්‍යෙෂණ නම් වේ. "පින්වත් තෙමේ කාරුණාකර මේ ලමයාට උගන්වන්නේ" යනාදි වශයෙනි. විධික්‍රියා විෂයෙහි යෙදෙන ප්‍රත්‍යයයන් හා ඊට නිදසුන් දක්වන්නාහු "මෙහි අ, ඒ" යනාදිය කිහු.

a. **මෙහි-අ ඒ අන්නේ අන්නෑ අව් උ පස රූසි.**

**1. අ-බමුණ පනද බොජ. 2. ඒ-සැරදේ මහබා. 3. අන්නේ-මේ සාරූ මේ පිසන්නේ. 4. අන්නෑ-හිමි නුඹ දහම් දෙසන්නෑ. 5. අව් ගුණොනැන් නම් මෙහි බජව්. 6. උ-සජනෙනි ශහංන් දක්කු. මෙහි කිසිවිදි ආසිගැබ.**

ඉති විදිකිරිය.

---

a. භා—මේ විධික්‍රියාවෙහි ලා "අ, ඒ, අන්නේ, අන්නෑ, අව්, උ" යන ප්‍රත්‍යය සය නිර්දිෂ්ට යි. එහි එකවචන බහුවචන වශයෙන් පිරිසිදීමක් නැත ද උදාහරණානුසාරයෙන් දතහැකි වේ. එනම්-"අ ඒ අන්නේ අන්නෑ" යන සතර එකවචන වශයෙන් ද "අව්, උ" යන දෙක බහුවචන වශයෙන් ද සලකාගත හැකි වේ. කාරක වශයෙන් හෙවත් පුරුෂවශයෙන් පිරිසිදීම මෙසේ කට යුතුයි. එනම්-'අ-අන්නෑ' දෙක තශබ්දකාරක හෙවත් මධ්‍යම පුරුෂ වශයෙන් ද, 'ඒ-අන්නේ' යන දෙක අන්‍ය කාරක හෙවත් ප්‍රථම පුරුෂ වශයෙන් ද, "අව්, උ" යන දෙක මධ්‍යම පුරුෂ බහු වචන වශයෙන් ද, සැලකිය හැකි වේ.

1. භා—වාක්‍යයෙහි "බොජ" යනු විධික්‍රියා යි. "බොජ" ධාතුවෙන් පරව "අ" ප්‍රත්‍යය වීමෙන් සිඬ යි. බ්‍රාහමණය දෙවන දිනෙහි හෙවත් හෙට භොජනය කරව යනු වාක්‍යාර්ථ යි.

2. වාක්‍යයෙහි. "සැරදේ" යනු විධික්‍රියා යි. 'සැර' යන නිපාත පූර්ව "දිව්" ධාතුවෙන් පර ව "ඒ" ප්‍රත්‍යය වීමෙන් සිඬ යි. මහා භාග්‍ය ඇත්තේ චිරකාලයක් ජීවත් වේවා, යනු වාක්‍යාර්ථ යි මේ අන්‍ය කාරක වශයෙනි, මේ ආශීර්වාද ගර්භ විධික්‍රියා යි.

3. වාක්‍යයෙහි "පිසන්නේ" යනු විධික්‍රියා යි. 'පිස' ධාතුවෙන් "අන්නේ" ප්‍රත්‍යය යි. භක්තකාර තෙමේ බත පිසන්නේ යනු වාක්‍යාර්ථයි.

4. වාක්‍යයෙහි "දෙසන්නෑ" යනු විධික්‍රියා යි. "දෙස" ධාතුවෙන් "අන්නෑ" ප්‍රත්‍යය යි. ස්වාමිය ඔබවහන්සේ ධර්ම දෙශනා කරන්න යනු වාක්‍යාර්ථ යි.

5. වාක්‍යයෙහි "බජව්" යනු විධික්‍රියා යි. "බජ" ධාතුවෙන් "අව්" ප්‍රත්‍යය යි. මේ කෘතියෙහි ගුණයක් ඇත් නම් ඒ භජනය කරව්, යනු වාක්‍යාර්ථයි.

6. වාක්‍යයෙහි "දක්කු" යනු විධික්‍රියා යි. 'දක' ධාතුවෙන් 'උ' ප්‍රත්‍යය හා ககාරවිත්වයෙන් සිඩ යි. "දිස්" ධාතුයයි ද කියත්. සජ්ජනයෙහි ගුණයක් දර්ශනය කරව් යනු වාක්‍යාර්ථ යි. මෙහි ඇතැම් විධික්‍රියාවක් ආශීර්වාද ගර්භ කොට ඇති වේ.

වි-කාව්‍ය භාෂාවෙහි ඇතැම් ප්‍රයොගයන්හි ආශීර්වාද වශයෙන් ව්‍යවහාර කොට තිබෙන "සැරද" යන ක්‍රියාරූපය සමහරු "සැරදෙ" කියා ද ව්‍යවහාර කෙරෙත්. එහෙත් "සැරද" කියා යොදා තිබෙන ක්‍රියාරූපය "සැරදෙ" කියා ව්‍යවහාර කරන්නට ත් "සැරදෙ" කියා යොදා තිබෙන රූපය "සැරද" කියා ව්‍යවහාර කරන්නටත් යුක්තියක් නොපෙණේ. න ශබ්ද කාරක වශයෙන් යොදා තිබෙන තන්හි "සැරද" කියා ද, අන්‍යකාරක වශයෙන් යොදා තිබෙන තන්හි "සැරදෙ" කියා ද වියයුතු යි. එහි පුරුෂ වශයෙන් හා ප්‍රත්‍යය වශයෙන් ඒ විශෙෂය වීම මුත් අර්ථ වශයෙන් විශෙෂයෙක් නො ලැබේ. ආශීර්වාදාර්ථය ඒ කාරක දෙක්හි ම යෙදේ.

මෙහි කී "අන්නැ" යන ප්‍රත්‍යයරූපය "අන්න" කියා වහර යෙදෙන බැව් ද, ඒ එකවචන බහුවචන දෙක්හි සමව යෙදෙන බැව් ද පෙණේ, "තමුන්නාන්සේ වඩින්න, තමුන්නාන්සේලා වඩින්න" යනාදි වශයෙනි.

තවද උස් පහත් මැදුම් වහරින් විධික්‍රියාව වහරෙහි යෙදෙන බැව් ද, ඒ පැවසීමට තවත් ප්‍රත්‍යයයන් යෙදෙන බැව් ද පෙණේ. "තෝ කරපිය, උඹ කරපන්, මහත්මයා කරන්න" යනාදි වශයෙනි. මෙහි "පිය, පන්" යන දෙක ද ප්‍රත්‍යය වශයෙන් සැලකිය යුතු යි. "ව" ප්‍රත්‍යය ද විධික්‍රියාවිෂයෙහි යේදේ. "කරව" යනාදි වශයෙනි. "කියග" යන්න ද විධික්‍රියා යි.

විධික්‍රියාව නිමි.

---

ආසිකිරිය

a. ඉටු නොපත් කෙසද බඳ අනාඅරුත් පැතුම් ආසි නම්. මෙහි පසින් පර ව වාපස රුයි. 1. සරසවිය මා මුවකඹරැ ඉස් බේවා. 2. නරපවර වැජඹෙහිවා. 3. දිය ඕස කිරිමෙහි වත් වෙම්වා.

ඉති ආසිකිරිය.

a. භා—අභිමත වූ නොලත් අනාගතාර්ථයක් පැතීම ආසි නම් වේ. ඒ ආශිර්වාද ක්‍රියාව හා සම්බන්ධ වන්නා වූ ශබ්දය ප්‍රථම පුරුෂයට අයත් අන්‍යශබ්දයක්, හෝ මධ්‍යම පුරුෂයට අයත් "ත" ශබ්දය හෝ උත්තම පුරුෂයට අයත් 'ම' ශබ්දය හෝ විය යුතු යි. ආශිර්වාද ක්‍රියා සිඩියෙහි ප්‍රත්‍යයයෙන් පර ව හෙවත් වර්ත මාන ක්‍රියා පදයෙන් පර ව "වා" ප්‍රත්‍යය වේ.

1. වාක්‍යයෙහි "ඉස්බේවා" යන්න ආශිර්වාද ක්‍රියා යි. "ඉස්බ" ධාතුවෙන් පරව වර්තමාන ඒ ප්‍රත්‍යය වීමෙන් සිඩ වූ "ඉස්බේ" යන්නෙන් පරව 'වා' ප්‍රත්‍යය යි. සරස්වතී තොමෝ මාගේ මුඛ පද්මයෙහි විශ්‍රාමය කෙරේවා යනු වාක්‍යාර්ථ යි.

2. වාක්‍යයෙහි "වැජඹෙහිවා" යනු ආශිර්වාද ක්‍රියා යි. විජෘම් "ජඹ" ධාතුවෙන් වර්තමාන ත ශබ්ද කාරකයෙහි "එහි" යන විබත්පසින් නිපන් "වැජඹෙහි" යන්නෙන් පර ව 'වා' ප්‍රත්‍යය යි. නරශ්‍රෙෂ්ඨය තමුන්නාන්සේ විජෘම්භණය කෙරෙහිවා යනු වාක්‍යාර්ථ යි.

3. වාක්‍යයෙහි "වෙම්වා" යනු ආශිර්වාද ක්‍රියා යි. "වූ" ධාතු වෙන් වර්තමාන ම ශබ්දකාරකයෙහි "එම්" ප්‍රත්‍යය වීමෙන් නිපන් "වෙම්" යන්නෙන් පර ව "වා" ප්‍රත්‍යය යි. ලොකයාහට හිත කිරී මෙහි සමර්ථ වෙම්වා යනු වාක්‍යාර්ථ යි. මෙයින් කාරක තුණට උදා හරණ නිර්දිෂ්ටයි. බහුවචනයෙහි ද යොදගත යුතු යි. කාව්‍ය යන්හි 'වා' ප්‍රත්‍යයයෙන් තොරව ද ආශිර්වාද ක්‍රියාව ව්‍යවහාර කරණ ලද්දේ ය.

ආශිර්වාදක්‍රියාව නිමි.

---

<u>කම්කිරිය.</u>

a. මෙ වියූ සව් කිරිය-පෙදෙහි කිරිය කමරුත්,
බැරි ව විවැකුව කම්-පස යෙදෙන සේ කරණු.

a. භා—මෙහි කියන ලද්දා වූ සියලු ම ක්‍රියාවන් කර්මාර්ථ යට භාර ව හෙවත් කර්මකාරක කොට කියනු කැමැති වුවොත් එහි කර්මකාරක ප්‍රත්‍යය යෙදෙන පරිද්දෙන් ක්‍රියා සිඩිය කටයුතු යි.

වි—සියලු ම ක්‍රියාවෝ කර්තෘට හෝ කර්මයට භාරවූවෝ වෙත්, කර්තෘට භාර වූ ක්‍රියාවන්ගෙන් කර්ත්‍රර්ථයෙක් ද, කර්මයට භාර වූ ක්‍රියාවන්ගෙන් කර්මාර්ථයෙක් ද උක්ත වේ. මෙහි උද්දිෂ්ට වූ

ක්‍රියා විශෙෂයෝ කර්තෘට භාරවූවෝ යි. ඔවුන් කර්මයට භාර කොට කියනු කැමැති තන්හි මෙහි කියවෙන පිළිවෙළින් ක්‍රියා සිද්ධය කට යුතු යි. ඒ ක්‍රියාසිද්ධියෙහි පිළිවෙළ "අයුහි" යනාදි වශයෙන් කිහු.

b. **අයුහි දුපස මැද නපස පිළිපෙරැළි ද අනාවත්මන්හි පිළිපෙරැළි ද මත්වැඩි ද රූසි.**

b. **භා**—අතීතකාලික කර්මාර්ථ ක්‍රියාවක් සිඩ කටයුතු තන්හි ධාතුවෙන් පර ව පෙර අතීතකාලික වශයෙන් වියූ "ඒ ඉ ඊ" ආදි ප්‍රත්‍යයයක් වහරනුසරින් යොදා ඒ ධාතුවට හා ප්‍රත්‍යයට අතර 'න' ප්‍රත්‍යය ද පිළිපෙරැළි ද කිරීමෙන් ක්‍රියාසිඩිය කට යුතු යි. අනාගත වර්තමාන වශයෙන් කර්මාර්ථ ක්‍රියාවක් කියවිකල්හි කර්තෘකාරක ක්‍රියා රූපය ම පිළිපෙරැළියෙන් හා මාත්‍රා වෘඩියෙන් ද කර්මක්‍රියාවට පෙරළා ගතයුතු යි. එහිදු ඇතැම් ක්‍රියා රූපයෝ පිළිපෙරැළි මත්වැඩි යන දෙකෙන් ද, ඇතැම් ක්‍රියා රූපයෝ ඉන් එකෙකින් ද යුක්ත වෙත්. ඒ ව්‍යවහාරානුසාරයෙන් දතයුතු යි. සාමාන්‍යයෙන් ක්‍රියාව නිරූපසංගයෙන් සිදුවන පරිද්දෙන් ඇසේ නම් ඒ කර්ම ක්‍රියා යි දතයුතු යි.

මෙහි නිර්දිෂ්ට න ප්‍රත්‍යයයාගේ දන්තජත්වය හා මූර්ධජත්වය ද "ආන" ප්‍රත්‍යයාදියෙහි කී පරිද්දෙන් දතයුතු යි. මේ නයන්න මූර්ධජ ම යයි සපිර කිරීමට ඇතැම් අය කාව්‍ය විෂයෙහි එළි සම කිරීම සඳහා වර්ණයන් සම කොට යොදන ලද තැන් නිදසුන් කෙරෙත්, නුමුත් එබදු නිදර්ශනයෝ කාරණයට පමණ නො වෙත්. පද්‍යවිෂයෙහි එළි සම කිරීම ද එක්තරා චිත්‍රාලඞ්කාර ලක්‍ෂණ විශෙෂයෙකි. එබදු තන්හි ලක්‍ෂණ කීපයෙකින් සම වූ වර්ණයන් සියල්ලෙන් ම සම කොට යෙදීම ආලඞ්කාරිකයන්ගේ නියමයෙකි. වාග්භටාලඞ්කාරයෙහි:-

"යමකශෙලෂචිත්‍රෙෂු-බවයොර්ඩලයොර් නී භිත්,
නානුස්වාර විසගෞ ච-චිත්‍රභඞ්ගාය සම්මතෞ"

යනු කීහු. යමකාලඞ්කාර ශෙලෂාලඞ්කාර චිත්‍රාලඞ්කාරයන්හි බකාර වකාර දෙදෙනාගේ ද, ඩකාර ලකාර දෙදෙනාගේ ද, භෙද යක් නැති බවත්, චිත්‍රබන්ධ ව්‍යාඝාතය පිණිස අනුස්වාර විසර්ග දෙක නොගණිත ලද බවත් කවිසම්මතය යනු මෙහි අදහස යි. ව්‍යාකරණ ග්‍රන්ථයන්හි ද:-

"රලයොර්ඩලයොශ්චෛව-ශසයොර්බවයොස්තථා,
වදන්ත්‍යෙෂාව සාවර්ණ්‍ය- මලඞ්කාරවිදෙ ජනාඃ"

යනු කීහු. අලඞ්කාර ශාස්ත්‍රඥයෝ රකාර ලකාර දෙදෙනාගේ ද, ඩකාර ලකාර දෙදෙනාගේ ද, ශකාර සකාර දෙදෙනාගේ ද, බකාර වකාර දෙදෙනාගේ ද, එබඳු තවත් වර්ණයන්ගේ ද සවර්ණත්වය කියත් යනු එහි අදහස යි. මෙසේ හෙයින් සිංහල පද්‍ය විෂයෙහි එළිසම කිරීමෙහි ලා "නණ" දෙක ද සවර්ණත්වයෙන් සැලකූහ.

තවද හෙළුබසෙහි ප්‍රත්‍යය නකාරය රකාරයෙන් පරවුවත් ස්වරූපයෙන් ම සිටිනු විනා මූර්ධන්‍ය නොවේ යයි ද ඇතැම් අය කියති. එහෙත් එසේ කියන්නෝ "කරණ විබත්" යනාදියෙහි "කරණ" යන්න මූර්ධන්‍යණත්වයෙන් ද "කරන දේ" යනාදිවශයෙන් "කරන" කියා දන්ත්‍යජත්වයෙන් ද ව්‍යවහාර කෙරෙත්. එසේ වුව ද ඒ දෙතන්හි ම ප්‍රත්‍යය එකක් ම විය යුතු යි, එනම් 'න' ප්‍රත්‍යය විය යුතු යි. එහි එක්පදයෙක්හි මූර්ධන්‍ය වීමටත් එක් පදයෙක්හි නොවීමටත් යුක්තියක් නොපෙණේ. එහෙත් මේ දෙතන්හි එනම්- "කරණ විබත්, කරණ දේ" යන දෙතන්හි විශෙෂයක් ඇති බැවි අපිදු කියමු. එනම්, එහි වූ කකාරස්ථ අකාරයාගේ සංවෘත විවෘතත්වයෙහි ලා උසුරුවීමෙන් ලැබෙන විශෙෂය යි. ඒ ණකාරය පිළිබඳ උච්චාරණවිශෙෂයෙක් නොවේ. "කරණ විබත්" යන තන්හි "කරණ" ශබ්දයාගේ කකාරස්ථ අකාරය සංවෘතභාවයෙන් ද, ක්‍රියාවාචක වූ "කරණ" ශබ්දයාගේ කකාරස්ථ අකාරය විවෘත භාවයෙන් ද කියවේ. සිංහලෙහි ක්‍රියාවාචක වූ බොහෝතන්හි එලෙසින් කියවීම ස්වභාවයෙකි. "කළ වැඩේ, කළගෙඩිය" යනාදියෙන් ද ඒ දත හැකි වේ. සාමාන්‍යයෙන් සිංහලෙහි රකාරයෙන් පර වූ ප්‍රත්‍යයනකාරය නිත්‍යයෙන් මූර්ධන්‍ය වේ යයි ද, සෙසු තන්හි ව්‍යවස්ථිත විභාෂාවශයෙන් වේ යයි ද සැලකිය යුතුයි. කාමාර්ථ ක්‍රියාවට නිදසුන් දක්වන්නාහු "අගමගගිනි" යනාදිය කීහු.

**a 1. අගමගගිනි සොලෙස්තැස දැවිනි. 2 සුසිරිවතුරෙන් ඇණිඟග වැසේ. 3 සසුන් පිරිණන දනන් විසින් සතරරූ මැවෙන්නේ. මේ ඇ විමසනු.**

b **මෙහි අරුත්විශ්ලෙෂනවර ලබඳ සොදනු රැසි.**

a. භා—1. වාක්‍යයෙහි "දැවිනි" යනු කර්මාර්ථ ක්‍රියා යි. "දව" ධාතුවෙන් පරව අතීතාර්ථ ඉප්‍රත්‍යය වීමෙන් 'දව-ඉ' සිටිතන්හි 'න' පස වීමෙන් "දව-න-ඉ" කියා වේ. පසුව වකාරස්ථ අකාරයට පිළිපෙරළි ද දකාරස්ථ අකාරයට මත්වැඩි ද නකාරයේ ස්වර ලොපය ද වීමෙන් "දැවිනි" යි සිද්ධ යි. අග්‍රමාර්ගඥාන නමැති ගින්නෙන් කෙලෙස් නමැති තණලැහැබ දවනුලැබී යනු වාක්‍යාර්ථ යි.

2. වාක්‍යයෙහි "වැසේ" යනු කර්මාර්ථක්‍රියා යි. ඒ "වස" ධාතුවෙන් පරව වර්තමානකාලික ඒ ප්‍රත්‍යය වීමෙන් "වස-ඒ" යි සිටිතන්හි වකාරයේ මත් වැඩීමෙන් හා සකාරයේ ස්වර ලොපයෙන් සිද්ධ යි. සුචරිත නමැති ජලප්‍රවාහයෙන් අණුමාත්‍ර වූ හෙවත් ස්වල්ප වූ පාපය වසනු ලැබේ යනු වාක්‍යාර්ථ යි.

3 වාක්‍යයෙහි "මැවෙන්නේ" යනු කර්මාර්ථ ක්‍රියා යි. ඒ "මව" ධාතුවෙන් පරව අනාගත කාලික "අන්නේ" ප්‍රත්‍යය වීමෙන් "මව අන්නේ-මවන්නේ" යි සිටිතන්හි වකාරයෙහි පිළිපෙරළි වීමෙන් හා මකාරයෙහි මත් වැඩීමෙන් සිද්ධ යි. ශාසන පර්‍ය්‍යන්තයෙහි ධාතූන් විසින් ශාස්තෲන් වහන්සේගේ රූපය මවනු ලබන්නේය, යනු වාක්‍යාර්ථ යි.

b. කර්ම ක්‍රියාවෙහි අරුත් පවසන කල්හි 'ලබ' ධාතුව යෙදීම අභිමත යි. ඒ කර්මාර්ථය ප්‍රකට කිරීම පිණිස යි. "දැවිනි, දවනු ලැබී" යනාදි වශයෙනි. කර්මාර්ථ ක්‍රියාවකට යමෙක් කර්ම වේ නම් ඒ කර්ම වූ වස්තුව ඒ ක්‍රියාර්ථය හෙවත් ඒ ධාත්වර්ථය ලබන බැව් එයින් සූචිත යි.

වි—මේ කම් කිරිය විෂයෙහි විබත් පස යෙදීම ද වහරනුසෙරෙන් කටයුතු යි. ඉ පසින් "දැවිනි" යි වූවාක් මෙන් 'ඒ' පස යෙදීමෙන් "දැවුනේ" යනාදි වශයෙන් ද යොදගත යුතුයි, එහෙත් "වස" ධාතුවෙන් 'ඒ' පස යෙදීමෙන් 'වැසේ' යි සිද්ධ වූවාක් මෙන් "ඕ, ආ" පස යෙදීමෙන් "වැසෝ, වැසා" යනාදි වශයෙන් නොයෙදේ. මෙසේ කර්මාර්ථක්‍රියා රූපයන්ගේ සිද්ධිය පිළිබඳ අනුශාසනය කොට කම්කිරිය වෙසෙස් පවසන්නාහු "නිතැතින්" යනා ආදිය කීහු.

---

කම්කිරිය වෙසෙස්.

a නිතැතින් සැපයෙන සතු අරුත්හට ද මෙ පස රුසි. බැබලිනි, ඇඟි.

b. කුසුල් තෙම බිඳේ, මෙ ඈ තෙම සතු තෙම කම් නම්.

c. විදිවිසැහි සාරණු බොජනු ඈ වේ. මෙහි නුපස රුසි.

d. සව්තැන්හි යෙදෙන සේ බුහුබස් සලසනු.

**ඉති කම්කිරිය.**

a. භා—නිරුත්සාහයෙන් සම්පාදනය වන්නා වූ කර්ත්‍රර්ථ ක්‍රියාව පිළිබඳ ව ද මේ කම් කිරිය පස යෙදීම සෛංහලීයයන්ට අභිමත විය. "බැබලිනි" යනාදිය ඊට නිදර්ශන යි.

b. "කුසුල් තෙම බිඳේ" යන මේ ආදිය ස්වයංකර්තෘ ස්වයං කර්ම ප්‍රයෝග යි.

c. විධ්‍යර්ථකර්මක්‍රියා විෂයෙහි "කරණු, බොජනු" යනආදිය වේ. මෙහි 'නු' ප්‍රත්‍යය අභිමත යි.

d. සියලු තන්හි ම වහර යෙදෙන පරිද්දෙන් බහුවචන සලස්වා ගත යුතු යි.

ඞ—අකර්මකධාතුකක්‍රියාවෝ ප්‍රයෝජ්‍ය සහිත තන්හි මුත් අන් තන්හි කර්මාර්ථ නොවෙත්. එහෙත් අකර්මක ධාතුවලින් සිද්ධ වූ කර්මක්‍රියා රූපයෝ ද වහර යෙදෙත්. එසේ යෙදෙන්නේ කර්තෘගේ ක්‍රියාසම්පාදනයෙහි නිරුත්සාහිත්වය ඇති තන්හි ඒ ඇඟවීම පිණිස යි. "සඳ බැබලිති" යන තන්හි කර්තෘ වූ චන්ද්‍රයාගේ බැබලීමේ උත්සාහිත්වයෙක් නැත්තේ යි. "මිනිහා පොළොවෙහි සිටී" යි කී කල්හි කර්තෘ වූ මිනිහාගේ සිටීම පිළිබඳ උත්සාහිත්වය ඇති බැව් හැඟේ. "ගසෙන් වැටුනු මිනිහා පොළොවෙහි සිටවුනේය" කී කල්හි මිනිහාගේ පොළොවෙහි සිටවීම නිරුත්සාහයෙන් සිද්ධ යි. "සිටවුනේ" යනු කර්මක්‍රියා රූපයි.

ඇතැම් ප්‍රයෝගයන්හි ක්‍රියාවට යමෙක් කර්තෘවූයේ නම් ඒ පදය ම කර්ම ද වේ. හේ තෙමකතු තෙමකම් යයි කියනු ලැබේ. සංස්කෘතයෙහි කර්මකර්තෘ යයි ව්‍යවහාර කරණු ලැබේ. පාලිසංස්කෘත සිංහල යන භාෂාත්‍රයෙහි ම ඊට යෙදෙන ක්‍රියාව කර්මකාරක වේ. "කුසුල් තෙම බිඳේ" යන තන්හි "බිඳේ" යන ක්‍රියාව කර්මකාරක වේ, ඊට කර්තෘවූයේ ද කර්ම වූයේ ද කුසුල් තෙමේ මැයි. එබැවින් කුශූලය තෙමකතු තෙමකම් නම් වේ.

මේ තෙමකතු තෙමකම් විදිය බොහෝ අය වරදවා ව්‍යවහාර කරණ බැව් දනිමු. ඇතැම් ධාතුවිෂයෙහි තෙමකතු තෙමකම් නො යෙදේ. ධාතුහු-කර්මස්ථධාතු කර්තෘස්ථධාතු යයි දෙපරිදි වෙත්. යම් ධාතුවක් පිළිබඳ වූ ව්‍යාපාරය කර්මය කෙරෙහි පිහිටියේ නම් ඒ ධාතුව කර්මස්ථ වේ. කර්තෘකෙරෙහි පිහිටියේ නම් කර්තෘස්ථ වේ. 'පිස' ධාතුවේ ව්‍යාපාරය යමක් මෙලෙක්වීම් ආදි යයි, ඒ ගතිය කර්මය කෙරෙහි මුත් කර්තෘකෙරෙහි නොපිහිටයි, එ බැවින් ඒ ධාතුව කර්මස්ථ යි. 'යා' ධාතුවේ අර්ථය පාදාදි අවයව චලනය යි, ඒ අර්ථය කර්තෘ කෙරෙහි මුත් කර්මය කෙරෙහි නො පිටයි. එබැවින් ඒ ධාතුව කර්තෘස්ථ යි. සියලු ධාතුන් පිළිබඳ වූ ඒ ඒ අර්ථවිශෙෂ මෙලෙසින් කල්පනා කොට විනිශ්චය කරගත යුතුයි. මේ දෙකොටසින් කර්මස්ථ ධාතුවිෂයෙහි මුත් කර්තෘස්ථ ධාතුවිෂයෙහි තෙමකතු තෙමකම් නො යෙදේ. "කුසුල් තෙම

බිඳේ" කී තන්හි "බිඳ" ධාතුහුගේ අර්ථය කර්මස්ථ යි. බිඳීම යම් කිසි භාජනාදියක් කෙරෙහි මුත් ඒ බිඳින කර්තෘ කෙරෙහි නො පිහිටන බැවිනි. මෙහි අදහස මෙසේ දතයුතු යි. කුශලය හෙවත් කොටුව කිසිවෙකු විසින් බිඳලිය යුත්තෙකි, එහෙත් කල්යාමෙන් එහි උපකරණයන්ගේ දිරායාම කරණ කොට ගෙණ අන්‍යයකු විසින් කටයුතු අර්ථය ස්වයංසිඬ යි. එබැවින් කර්තෘ වූයේත් හේ මැයි, ඒ අර්ථය කුශූලය ම ලැබූ බැවින් කර්ම වූයේත් හේ මැයි.

"පෙණේ දකුණ මහසෙන් දෙව්රදපාය" යන තන්හි "මහසෙන්දෙව්රදපාය" තෙමකතු තෙමකම් විය හැකි වේ දැයි පරීක්ෂා කටයුතු යි. "පෙණේ" යන්නේ අර්ථය දර්ශනය හෝ දැනීම යි. ඒ අර්ථය කර්තෘ කෙනෙකු කෙරෙහි මුත් කර්මයක් කෙරෙහි නොපිහිටයි. එබැවින් ඒ තෙමකතු තෙමකම් වියහැකි නොවේ. එහෙත් බොහෝ අය එසේ කියති. එබඳු තන්හි "තා විසින්" යනාදි වශයෙන් හෝ 'තට' යනාදි වශයෙන් හෝ කර්තෘ පදයෙක් යෙදේ. මහසෙන් දෙව්රද පායට තම් කෙලෙසකින් වත් දර්ශන ක්‍රියාවක් නොකට හැකිවේ. බොහෝ අය මෙහි තතු නො දැන වරදවා ව්‍යවහාර කරණ බැවින් මේ ගැණ ආධුනිකයන් පරීක්ෂාකාරී විය යුතු යි.

සිංහලෙහි විධික්‍රියාව කර්මකාරක වන කල්හි ධාතු කෙරෙන් 'නු' ප්‍රත්‍යය යෙදේ. ඇතැම්හු මේ 'නු' ප්‍රත්‍යය දන්තජනයෙන් ම ව්‍යවහාර කෙරෙත්, ඒ පිළිබඳව ද අප අදහස 'ආත' ආදියෙහි මෙනි. රකාරයෙන් පරවූ 'නු' යන්න මූර්ධන්‍ය වන බැව් දක්වනු සඳහා ම සිද්ධාන්තසඞ්ග්‍රහ කර්තෘ පාදයන් විසින් මෙහි "කරණු, බොජනු" යි නිදර්ශන දෙකෙක් දක්වන ලද්දේ ය. මෙහි මේ උදාහරණවය දැක්වූයේ 'නු' යන්න සෑම තන්හිම සමව 'නු' යන ප්‍රකෘතියෙන් ම යෙදෙන බැව් දක්වනු සඳහා යයි ඇතැම් ආචාර්‍ය්‍යවරයෝ කියත්, එහෙත් භේදයක් ගැණ මුත් සමත්වයක් ගැණ එබඳු නිදර්ශන දැක්වීමක් වෛයාකරණ යන්ට වැඩි වශයෙන් රිසි නොවේ. "කරණු, බොජනු" යනාදියෙහි අර්ථය කරණු ලබව, අනුභව කරණු ලබව, යනාදි වශයෙනි.

"දැවුනු-දැවුනුහු, වැසෙත්-වැසෙති, මැවෙන්නේ-මැවෙන්නාහු" යනාදි වශයෙන් බුහුබස් යොදා ගතයුතු යි. එපමණ කුදු නොව, "දැවුනෙහි-දැවුනහු, දැවුනෙමි-දැවුනමු, වැසෙහි-වැසහු, වැසෙමි-වැසෙමු, මැවෙන්නෙහි-මැවෙන්නහු, මැවෙන්නෙමි-

මැවෙන්නමූ" යනාදි වශයෙන් පුරුෂ විෂයෙහි ද යොදා ගත යුතු යි. ක්‍රියාවන් කර්ම කාරක කිරීම ව්‍යවහාරානුසාරයෙන් මෙතෙහි කිරීමෙන් සපයා ගතහැකි වේ. එහි තත්ත්වය සලකා ගණු පිණිස නිදසුන් ස්වල්පයක් සඳහන් කරමූ.

| | කර්තෘ. | කර්ම. | කර්තෘ. | කර්ම. |
|---|---|---|---|---|
| අතීත:- | පිසී | පැසුනි | ගියේ | යැවුනේ |
| වර්ත:- | පිසේ | පැසේ | යේ | යැවේ |
| අනා:- | පිසන්නේ | පැසෙන්නේ | යන්නේ | යැවෙන්නේ |
| අතීත:- | දීනි | දෙවුනි | බී | පෙවුනි |
| වර්ත:- | දේ | දෙවේ | බෝ | පෙවේ |
| අනා:- | දෙන්නේ | දෙවෙන්නේ | බොන්නේ | පෙවෙන්නේ |
| අතී:- | කෑ | කැවුනි | කී | කියවිනි |
| වර්ත:- | කා | කැවේ | කියා | කියවේ |
| අනා:- | කන්නේ | කැවෙන්නේ | කියන්නේ | කියවෙන්නේ |

මෙලෙසින් දතයුතු යි, ක්‍රියාව කර්මකාරක වන කල්හි බොහෝ තන්හි වකාරයක් ආගම වශයෙන් යෙදෙන බැව් නිදසුන් වලින් පෙණේ. ඒ සියලු විශෙෂයෝ ම වහරනුසරින් දතයුතුයි.

**කම් කාරක ක්‍රියාව නිමි.**

---

අසබහව්කිරිය.

a. **නොකල නොසඳරූ-නොවෙන් වැ හොත අනියම්.**
**අරුත කල් අරුත හොත-කිරිය අසබහව් නමි.**

a. භා—කාලත්‍රයෙහි හා පුරුෂත්‍රයෙහි රූපභෙද රහිතව අනියමාර්ථවශයෙන් හෝ කාලාර්ථ වශයෙන් යෙදෙන ක්‍රියාව අසම්භාව්‍ය ක්‍රියා යි කියනු ලැබේ.

වි—සිංහලෙහි අසබහව් යන නමින් ව්‍යවහාර වන්නා වූ ක්‍රියාව අනියමාර්ථ කාලාර්ථ දෙක්හි යෙදෙන බැව් මෙහි නිර්දිෂ්ට යි. ඒ අර්ථවයෙන් කවර අර්ථයෙක්හි වුව ද අසබහව් කිරියෙන් වාක්‍ය පරිසමාප්තිය නොවේ, ඒ කිරිය වෙන කිරිය පදයක්හුගේ නිශචය රහිත බව හඟව යි. හෙද දෙපරිදි බැව් වහරින් පෙණේ. "ගමට යතොත් බැරි නැහැ. ගමට යතොත් යස ඉසුරු ලැබෙන්නට බැරි නැහැ" යනාදි වශයෙනි. මෙහි පූර්වවාක්‍යයෙන් ක්‍රියාසිද්ධිහුගේ අනියමය පමණක් සූචිතයි, අපර වාක්‍යයෙන් ක්‍රියා

සිඩි ඵලසිඩි දෙදෙනාගේ ම අනියම ය සූචිතයි. කවර ක්‍රියාවකින් පරව වුවත් "නම්" යන නිපාතය යෙදුනේ නම් ඒ ක්‍රියාව අනියම වේ. පාළියෙහි පරිකල්පාර්ථ සප්තම්ය අනියමාර්ථයෙහි නිර්දිෂ්ට යි. "දක්ඛිණෙන චෙ ගච්ඡෙය්‍ය න සකටං පරියාභවෙය්‍ය" යනාදි වශයෙනි. දකුණු පසින් යේ නම් ගැල නොපෙරළෙන්නේය යනු එහි සිංහලාර්ථ යි. සිහල වහරෙහි අනියම් අරුත අසබහව් කිරියට යෙදෙන කර්තෘ කතුවිබතින් යෙදේ. කල්අරුත් කිරිය විසාහි අදර අරුත කම් විබත් වන බැව් විබත් අදියරෙහි නිර්දිෂ්ට යි. අසබහව්හි යෙදෙන පස හා නිදසුන් දක්වන්නාහු. "මෙහි" යනාදිය කීහු.

**a. මෙහි තපස රුසි. 1. නො බැරි නැනැතියනපවග යත. 2. වණත බැරි මුනිගුණ සියල්. 3. උරදු කල් කරත ඔසුනි තනපා රඳවන්. මෙ ඇගි.**

a. භා—මේ අසම්භාව්‍ය ක්‍රියා විෂයෙහි 'ත' ප්‍රත්‍යය අභිමත යි. 1. වාක්‍යයෙහි "යත" යනු අසම්භාව්‍ය ක්‍රියා යි. 'යා' ධාතුවෙන් 'ත' ප්‍රත්‍යයය යි. උත්සාහවතුන් නිවණට යතොත් බැරි නො වේ යනු වාක්‍යාර්ථ යි. 2. වාක්‍යයෙහි 'වණත' යනු අසම්භාව්‍ය ක්‍රියා යි. 'වණ' ධාතුවෙන් 'ත' ප්‍රත්‍යය යි. සකලබුඩගුණය වර්ණනය කරතොත් බැරෑරුම් වේ යනු වාක්‍යාර්ථ යි. මේ දෙතන්හි අනියමාර්ථයෙහි අසම්භාව්‍යක්‍රියා යි. 3. වාක්‍යයෙහි 'කරත' යනු අසම්භාව්‍ය ක්‍රියා යි. 'කර' ධාතුවෙන් 'ත' ප්‍රත්‍යයය යි. ඖරස පුත්‍රයා කලුරිය කළ කල්හි ඖෂධයෙන් තනකිර නැවැත්විය යුතු යි යනු වාක්‍යාර්ථ යි. මේ කාලාර්ථ අසම්භාව්‍ය ක්‍රියා යි. මෙසේ 'ත' ප්‍රත්‍යයට නිදසුන් දක්වා නැවත ප්‍රත්‍යය විශෙෂයන් දක්වන්නාහු "ලෝවිසා" යනාදිය කීහු.

**b. 1—ලෝවිසා නො සිතිය හැකි. 2. බවුනෙන් මොක් දැක්ක හැකි. 3. සස් කිව යෙහෙකි. 4. සුසිරි කල මැනවි. මෙ ඇ ද අසබහව්හි රුසි. පස යෙදෙන සේ සලසනු.**

b භා—මෙහි-1. වාක්‍යයෙහි "සිතිය" යනු අසම්භාව්‍ය ක්‍රියා යි. "සිත" ධාතුවෙන් අප්‍රත්‍යය හා යකාරාගම පිළිපෙරළි වශයෙන් සිඩ යි. ලොක විෂය චින්තනය නොකට හැක්කේ ය යනු වාක්‍යාර්ථ යි. 2. වාක්‍යයෙහි "දැක්ක" යනු අසම්භාව්‍ය යි. "දක" ධාතුවෙන් පරව 'අ' ප්‍රත්‍යය හා දෙරූමත්වැනි විදි වශයෙන් සිඩ යි. භාවනාවෙන් මොක්‍ෂය දර්ශනය කට හැක්කේය යනු වාක්‍යාර්ථ යි. 3. වාක්‍යයෙහි "කිව" යනු අසම්භාව්‍ය යි. "කි" ධාතුවෙන් පරව අප්‍රත්‍යය හා වකාරාගම විධිවශයෙන්

සිඩ යි. සත්‍යය කියතොත් යහපති යනු වාක්‍යාර්ථ යි. 4. වාක්‍ය යෙහි "කාලු" යනු අසම්භාව්‍ය යි. 'කර' ධාතුවෙන් 'අ' ප්‍රත්‍යය හා රකාරයට ලකාරය වීමෙන් සිඩ යි. සුවිපිත්තිය කාලුයොත් මනොඥයි යනු වාක්‍යාර්ථ යි. මේ ආදිය ද අසම්භාව්‍ය ක්‍රියාවන් ගෙණ තවත් අසම්භාව්‍යක්‍රියා වහරෙහි පස යෙදෙන පරිද්දෙන් සොයා ගත යුතු බැව්ද කීහු.

වි—මෙහි අසම්භාව්‍ය ක්‍රියාව පිළිබඳව අනුශාසනය කරන් නාහු-තප්‍රත්‍යය අනියමාර්ථ කාලාර්ථ දෙකට සමභාවයෙන් "මෙහි තපසරුසී" යනුවෙන් විධාන කොට නැවත සාමාන්‍ය භාෂාව්‍යවහාරයෙහි ප්‍රකට වූ අසම්භාව්‍ය ක්‍රියා රූපයන් කිපයක් හඳුන්වා ඒ ආදිය ද අසම්භාව්‍ය ක්‍රියා විෂයෙහි ලා ගතයුතු බැව් කීහු. එයින් නිර්දිෂ්ට වූයේ අප්‍රත්‍යයාන්ත පමණෙකි. එහෙත් භාෂා ව්‍යවහාරයෙහි අසම්භාව්‍ය වශයෙන් යෙදෙන තවත් ක්‍රියාරූපයෝ ඇත්තාහ. ඇතැම් තන්හි "හොත" යන නිපාතය හා ඒ විකාර වීමෙන් වූ "හොත් ඔත්" දෙක ද යෙදේ. "කළ හොත, කළහොත් කළොත්-කරතහොත, කරතහොත්" ආදි වශයෙනි. ඇතැම් තන්හි කාලාර්ථ වශයෙන් 'ත්' යන්න ද යෙදේ. "කල් යත්" යනාදි වශයෙනි, වහරෙන් තවත් විමසිය යුතුයි.

අසම්භාව්‍ය ක්‍රියාව නිමි.

---

<u>පෙරකිරිය හා මුසුකිරිය සුතුර.</u>

ෲ. එකකතු කිරියෙනෙන්-පෙර කිරියට ඇ ආ ඊ,
ඉන් ලා යුතු ද වියුතු ද-මුසුබැවැ මින් මිනමිනි ද.

ෲ. භා—එක් කර්තෘ කෙනෙකු පිළිබඳ ක්‍රියා කිපයක් අතු රෙන් අපර ක්‍රියාවෙන් පූර්වයෙහි වූ ක්‍රියාවන්ට "ඇ ආ ඊ ඉන් ඇලා ආලා ඊලා ඉන්ලා" යන ප්‍රත්‍යයෝ ද, අපර ක්‍රියාව හා මිශ්‍ර භාවයෙන් පවත්නා ක්‍රියාවට "මින් මින මිනි" යන ප්‍රත්‍යයයෝ ද වහර යෙදෙත්.

වි—වාක්‍යයක් අවසන් වන්නේ එක් ක්‍රියාර්ථයෙකිනි. ඒ ක්‍රියාර්ථය සිඩ කරන්නා වූ ප්‍රධාන කර්තෘපද ද එකෙකි, ඒ කර්තෘ අවසානක්‍රියාවෙන් පෙර ඒ සම්බන්ධයෙහි ලා සිදුකරණ ක්‍රියාවෝ පූර්වක්‍රියා නම් වෙත්. ඒ සම්බන්ධයෙහි පවත්නා පූර්වක්‍රියා එකක් හෝ කිපයක් ඇතිවිය හැකි වේ. අපර ක්‍රියාවට යමෙක් කර්තෘ වී නම් පූර්ව ක්‍රියාවට ද හේ ම කර්තෘ වේ. එබැවින් "එකකතුකිරිය නෙන්" ? කීහු.

"මිනිහා ගමට ගියේය" යි කිකාල්හි පෙරකිරියක් නැත්තේ ය. "මිනිහා කාලා ගමට ගියේය"යි කිකල්හි "කාලා"යි පෙරකිරිය එකෙකි. "මිනිහා නාලා කාලා ගමට ගියේය"යි කිකල්හි "නාලා කාලා"යි පෙරකිරිය දෙකෙකි. මෙපරිද්දෙන් පෙරකිරිය පද තවත් යෙදිය හැක. ඇතැම් ප්‍රයොගයන්හි භින්නකර්තෘක ව ද පෙර කිරිය යෙදෙන බැව් පෙණේ. "රකුසා දැක බිය උපන්නේය" යනාදි විශයෙනි. මෙහි "උපන්නේය" යන අවසානක්‍රියාවෙහි කර්තෘ "බිය" යනු යි. "දැක" යන පෙරකිරියට ඒ කර්තෘ නොවේ. එහෙත් අර්ථවශයෙන් සලකනකල්හි මෙබඳුතන්හි ද එකකර්තෘකත්වය ම සලකාගතහැකි වේ. බියට යමෙක් ආශ්‍රය වීනම් දර්ශනයේ ආශ්‍රය ද එය ම බැවිනි. මෙබඳු තන්හි "රකුසා දැක සිටියහුට බිය උපන්නේ ය"යි අර්ථ ගතයුතු යි.

තවද ඇතැම් ප්‍රයොගයන්හි අවසානක්‍රියාර්ථය හා පූර්වක්‍රියාර්ථය යන දෙකම එකවිට ද සිද්ධ වේ. "ඒ මිනිහා මුවඅයාගෙණ නිදයි"යනාදි වශයෙනි. මෙහි මුව අයාලීමත් නිදීමත් දෙකම එක විට සිද්ධ යි. ප්‍රතිෂෙධාර්ථනිපාතාදීන්ගේ යොගයෙහි පූර්වක්‍රියාව නාමපදාර්ථවාචක හෝ අපරක්‍රියාර්ථවාචක හෝ වේ. "දීලා කමක් නැහැ" යනාදිවශයෙනි. මෙහි "දීමෙන් කමක් නැහැ" යන අර්ථය හෝ නොදෙමි යනාදි අර්ථයෙක් හෝ වාච්‍ය වේ. "දීලා" යනු පූර්ව ක්‍රියා යි.

එකකර්තෘකත්වයෙන් අපරක්‍රියාව සමග මිශ්‍රව පවත්නා ක්‍රියාව මිශ්‍රක්‍රියා නම් වේ. "ඒ මිනිහා කාමින් ඇවිදී" යනාදි වශයෙනි. මෙහි කෑම ද ඇවිදීම හා මිශ්‍ර බැවින් "ඇවිදිමින්" යන්න මුසුකිරි යයි. පෙරකිරිය දෙරූවීමෙන් ද මේ අර්ථය ලැබේ. "ඒ මිනිහා කකා ඇවිදී" යනදි වශයෙනි. මේ දෙකිරියෙන් පළමු කොට පෙර කිරියට නිදසුන් දක්වන්නාහු "බවණව්" යනාදිය කිහු.

---

පෙරකිරිය නිදසුන්.

**a. 1 ඇ-බවණව් තැරැ ශහ විදික්. 2 ආ-පෙරුම් පුරා බුදුවූ. 3 ඊ-ගිරිනිල්මල්කැණෙකෑයි සැකි. 4 ඉන්-පවිටු කොබෑ ගොසින් රැකේ. 5 ඇලා-දිවුමගුල් මතඟු දැකැලා නැවැත්. 6 ආලා-කරණී පිරික්සාලා කරණු. 7 ඊලා-බමර පොසොන් පතරැ මි බිලා යේ. 8 ඉන්ලා-සගශහ ගොසින්ලා නහමව්.**

a. භා-1 වාක්‍යයෙහි "තැරැ" යනු පෙරකිරිය පද යි. "තර" ධාතුවෙන් 'ඇ' ප්‍රත්‍යය හා තකාරයෙහි අකාරයට මතැස් වැඩීමෙන් සිද්ධයි. සසරසයුර එතර කොට සුව විඳිත් යනු වාක්‍යාර්ථ යි.

2. වාක්‍යයෙහි "පුරා" යනු පෙරකිරිය යි. "පුර" ධාතුවෙන් "ආ" පස යි, පාරමීපූරණය කොට බුදුවූ යන අර්ථයි.

3. වාක්‍යයෙහි "සැකී" යනු පෙරකිරිය යි. "සැක" ධාතුවෙන් "ඊ" පස යි. ගිනිහිරිමල්කැණක් යයි සැක කොට යනු වාක්‍යාර්ථයි.

4. වාක්‍යයෙහි "ගොසින්" යනු පෙරකිරිය යි. "යා" ධාතුවෙන් "ඉන්" ප්‍රත්‍යය හා "යා" ධාතුවට නිපාතනවශයෙන් "ගොස්" යි ආදෙශ වීමෙන් සිද්ධ යි. පාපිෂ්ඨතෙමේ කොහි ගොසින් රුකෙන් නේ ද යනු වාක්‍යාර්ථයි.

5. වාක්‍යයෙහි "දැකැලා" යනු පෙරකිරිය යි. "දක" ධාතුවෙන් පරව "ඇලා" ප්‍රත්‍යයය යි. දුෂ්ටමඬගලිකාව මාතඬගයා දැක නැවතු නිය. යනු වාක්‍යාර්ථයි.

6. වාක්‍යයෙහි "පිරික්සාලා" යනු පෙරකිරිය යි. "පිරි" පූර්ව "ඉක්ස" ධාතුවෙන් "ආලා" ප්‍රත්‍යයය යි. කටයුත්ත පරීක්ෂා කොට කටයුතු යි යනු වාක්‍යාර්ථ යි.

7. වාක්‍යයෙහි "බිලා" යනු පෙරකිරිය යි. "පා" ධාතුවෙන් පරව "ඊලා" ප්‍රත්‍යය යි. භෘඞ්ගතෙමේ මල්පතරෙහි මධුපානය කොට යේ යනු වාක්‍යාර්ථ යි.

8. වාක්‍යයෙහි "ගොසින්ලා" යනු පෙරකිරිය යි. "යා" ධාතුවෙන් "ඉන්ලා" ප්‍රත්‍යය යි. "ගොසින්" යන්න මෙන් සිද්ධ යි. සග සැපත ගමනය කොට බලව් යනු වාක්‍යාර්ථයි. මෙසේ "ඇ" ආදි, ප්‍රත්‍යයයන්ට පිළිවෙළින් නිදසුන් දක්වා තවත් භාෂාවෙහි පෙණෙන පෙරකිරිය වෙසෙස් දක්වන්නාහු "දකරින්"යනාදිය කිහු.

---

පෙරකිරිය වෙසෙස්.

**a දකරින්-අවුත්, අවුදු, ගොස්, යනු ද රූයි.**

**b. මුදුගණී, කිශාලන්නේ, ඇ පෙරකිරියපසතින් වූ ගණලපස ඇ දුවූසේ.**

**ඉති පෙරකිරිය.**

---

a. භා—සූත්‍රොක්ත දකාරබලයෙන් "අවුත්, අවුදු, ගොස්" යන මේ පෙරකිරියපද ද අභිමත යි.

වි—"අවුත්, අවුදු" යන දෙතන්හි 'අ' පූර්ව "යා" ධාතුවෙන් පරව "ඇ" ප්‍රත්‍යය යි. "අ-යා-ඇ" යි සිටිකල්හි "යා ඇ" දෙකට නිපාතනවිධිවශයෙන් "වුත් වුදු" යි ආදෙශ වීමෙන් "අවුත්, අවුදු"යි සිද්ධ යි. "ගොස්" යන්න නිපාවිදියෙහි කියනලදී.

b. භා — "මුදගණී, කියාලන්නේ" යනාදිය පූර්වක්‍රියාප්‍රත්‍යයාන්තයන් කොරෙන් වූ "ගණ, ල" යනාදි ප්‍රත්‍යය හෙවත් 'ගණ' ප්‍රත්‍යයාන්ත හෝ 'ල' ප්‍රත්‍යයාන්ත පූර්වක්‍රියාව ධාතු ආකාරයෙන් සිඩ යි.

වි—මේ "මුදගණී" යනාදිය ද සිංහලෙහි වූ ක්‍රියාවිශෙෂයෙකි. මොවුන්ගේ සිඩියෙහි පූර්වක්‍රියාවෙන් පර ව "ගණ" ප්‍රත්‍යය හෝ "ල" ප්‍රත්‍යය හෝ යෙදේ. ඒ පූර්වක්‍රියා සහිත ප්‍රත්‍යයාන්තරූපය ධාතුරූපයක් මෙන් සලකා ඉන් පර ව ධාතු කොරෙන් යෙදෙන ප්‍රත්‍යය විශෙෂයන් යෙදීමෙන් ක්‍රියාදිය සිඩ යි. මෙහි "මුද, කියා" යන දෙක පූර්වක්‍රියා පද යි. ඉන් පරව "ගණ, ල" වූකල්හි "මුදගණ, කියාල" කියා වේ. ඒ රූපදෙක ධාතුරූප දෙකක් මෙන් සලකා ඉන් පරව වත්මන් අන්කරු එකබස 'ඊ' යෙදීමෙන් "මුදගණී" කියා ද, අනාගත අන්කරුඑකබස "අන්නේ" යෙදීමෙන් "කියාලන්නේ" කියා ද වේ. මොවුහු ද "මුදගණී, මුදගණීත්, කියාලයි, කියාලත්" යනාදි වශයෙන් යෙදෙත්. "මුදගණී" යන්නේ අර්ථය මුදයි යනු යි. "කියාලයි" යන්නේ අර්ථය "කියයි" යනුයි.

මෙහි "ගණ ල පස ඈ" යන තන්හි "ඈ" සදින් "ද දම" ආදිය ද ගැණේ. එයින් "කියාදෙයි, කරදෙයි, පිසදමයි, කියාදමයි" යනාදිය සිඩ යි.

මේ "මුදගණී" යනාදි ප්‍රයොග පූර්වක්‍රියාපූර්වක ගණ-ගැණුම්හි ලා ගැණුම්හි, ද-දීමෙහි, දම-දැමුම්හි" යනාදි ධාතුන්ගෙන් සිඩය යි ද සිතිය හැකි වේ. එහෙත් ඒ ප්‍රයොගයන්හි වූ "ගණ ල" ආදිය ධාත්වර්ථවාචක නොවන බැවින් ප්‍රත්‍යයවශයෙන් සැලකුහ.

පෙරකිරිය නිමි.

---

මුසුකිරිය නිදසුන්.

a. **1.** මින්-මරසක් තනමින් පැලා. **2.** මින-සිකිනට පිස මින. **3.** මිනි-මුනිරිවි උදදෙන තිතුඑකැන් මිලිශෙමිනි අතුරු දන් බිජි.

ඉති කිරියමුසු.

---

a. භා—1 වාක්‍යයෙහි "තනමින්" යනු මුසුකිරිය යි. "තන" ධාතුවෙන් "මින්" ප්‍රත්‍යය යි. මාරසෙනාව වෙවුලමින් පැන ගියාය යනු වාක්‍යාර්ථ යි.

2 වාක්‍යයෙහි "පියමින" යනු මුසුකිරිය යි, "පිය" ධාතුවෙන් පරව "මින" ප්‍රත්‍යය යි. මයුරයන්ට හරිමින් යනු වාක්‍යාර්ථ යි.

3 වාක්‍යයෙහි "මිලියෙමිනි" යනු මුසුකිරිය යි. "මල" ධාතුවෙන් පරව "මිනි" ප්‍රත්‍යය යි. යකාරගම හා පිළිපෙරළියෙන් සිඬ යි. බුඬ නමැති සූර්‍ය්‍යා උදාවනකල්හි තීර්ථක නමැති තාරකා සමූහය මැලවෙමින් අතුරුදන් විය යනු වාක්‍යාර්ථ යි.

වි—පාලිසංස්කෘතයන්හි මිශ්‍රක්‍රියායි ක්‍රියාවිශෙෂයෙක් නැත්තේ ය. පාලියෙහි "අන්ත, මාන, ආන" ආදිප්‍රත්‍යයාන්ත කෘදන්තයෝ ද, සංස්කෘතයෙහි "ශතෘ ශාන" අන්තයෝ ද, මිශ්‍රක්‍රියා යි සැලකිය හැකි වෙත්. "සො ගච්ඡන්තො භත්තං භුඤ්ජති- හෙතෙමේ යමින් බත් බුදී." මේ පාලි වාක්‍යය හා සිංහල වාක්‍යය යි. "තෙන ගච්ඡතා භත්තං භුජ්ජතෙ" යන පාලිවාක්‍යයෙහි "තෙන, ගච්ඡතා" යන දෙක තතු විබති. ඒ වාක්‍යය සිංහල කළ කල්හි "ඔහු යමින් බත් බුදිනු ලැබේ" යනු වේ. එයින් දතයුත්තේ පාලිසංස්කෘතයන්හි මිශ්‍රක්‍රියාව ඒ ඒ තන්හි යෙදෙන පරිද්දෙන් විභක්ති වෙනස් වීමෙන් යෙදෙන බව හා සිංහලෙහි සැමතන්හි ම නොවෙනස් ව යෙදෙන බව යි.

**මිශ්‍රක්‍රියාව නිමි.**

---

a. **සාල්කිරිය අරුත් පවසනු වස් මෙහි සන්පමණෙක් විගනලදි, විතර වහරෙන් විමසනු.**

**කිරිය අදියර සත්වනු.**

---

a. භා—මේ ක්‍රියාධිකාරයෙහි ලා ධාතූන් පිළිබඳ කාලාර්ථයන් හා ක්‍රියාර්ථයන් පවසනු පිණිස සංක්‍ෂෙපමාත්‍රයෙක් ප්‍රකාශිත යයි ද, විස්තර ව්‍යවහාරයෙන් විමසාගතයුතුබැව් ද කිහු.

# ක්‍රියාධිකාරය

## නිමි

—— 8 ——

### 8 පසරුත් අදියර.

"පසන් අරුත් ඇතියේ=පසරුත්" යනු නිරුක්ති හෙයින් ප්‍රත්‍යයාර්ථයෙන් යුත් ශබ්දය පසරුත් නම් වේ. ප්‍රත්‍යයාර්ථ ශබ්දානුශාසනයෙන් පිරිසිඳිනු ලද අදියර පසරුත් නමින් ව්‍යවහෘත යි.

පාලිසංස්කෘත ව්‍යාකරණයන්හි "තද්ධිත, කිතක-කෘදන්ත" නමින් පසරුත් අදියර දෙකෙක් පිරිසිඳින ලද්දේ ය. ඒ දෙක්හිදු කොටස් කොටස් පිරිසිඳ සූත්‍රරාශියක් ගෙණහැර දැක්වීමෙන් විශාල අනුශාසනයෙක් කරණ ලද්දේ ය. සිදත්සඟරාව සංක්ෂිප්ත ව්‍යාකරණයෙකි. එසේම සිංහල ශබ්දයන් පිළිබඳ ව පාලිසංස්කෘතයන්හි මෙන් විශාල අනුශාසනයෙක් නොකටහැකි වේ. එසේ වුවද භාෂාවිෂයෙහි පසරුත්සද වෙසෙසක් ඇති බැවින් එපමණක් දක්වනු සඳහා ඒ අදියර දෙක්හි ම වූ ශබ්දයන් පසරුත් බැවින් අදියර දෙක ම එකක් කොට පිරිසිඳීමෙන් අනුශාසනය කරන්නාහු "දසින් නෙමෙන්" යනාදිය කීහු.

---

පසරුත් සුතුර.

**a. දසින් නෙමෙන් හොත-සර අරුතට නිසි පසන්,**
**සපයා සදන් පසරුත්-හිමි නොලැගැ ලෝවහරන්.**

a. භා—ධාතුන් කෙරෙන් හෝ නාමයන් කෙරෙන් අර්ථයට යෝග්‍ය වූ ප්‍රත්‍යයයන් යොදා ඡේකලෝකව්‍යවහාර සීමාව උල්ලඞ්ඝනය නොකොට ප්‍රත්‍යයාර්ථශබ්දසම්පාදනය කටයුතු යි.

වි—මෙහි ප්‍රත්‍යයාර්ථශබ්ද සම්පාදනය එක් සූත්‍රයෙක්හි ලා අනුශාසනය කළ නමුදු ප්‍රත්‍යයාර්ථ ශබ්දයන්ගේ සිද්ධිය දෙපරිදි වේ. එබැවින් "දසින් නෙමෙන් හොත" යනු කීහු. පාලිසංස්කෘතයන්හි ධාතුන් කෙරෙන් ප්‍රත්‍යයයන් යෙදීමෙන් නිපන් ශබ්දයෝ "කිතක-කෘදන්ත" යන නමින් ද, නාමයන් කෙරෙන් ප්‍රත්‍යයයන් යෙදීමෙන් නිපන් ශබ්දයෝ "තද්ධිත" යන නමින් ද ව්‍යවහාර කරණ ලදහ. මෙහි පළමු කොට ඒ දෙකොටසෙන් ධාතුප්‍රත්‍යය යෝගය පවසන්නාහු "දසින් වන පස" යනාදිය කීහු.

**b. දසින් වන පස සකරු අරුත්හි ද හවිහි ද වේ.**

b. භා—ධාතු කෙරෙන් වන්නාවූ ප්‍රත්‍යය "කර්ම කර්තෘ කරණ සම්ප්‍රදාන අවධි ආධාර" යන කාරකාර්ථ සයෙහි හා භාවයෙහි ද යෙදේ.

වි—අර්ථය දරණ අර්ථයෙන් ධාතුය යි කියනු ලැබේ. ඒ අර්ථය උපුටා ගැණීමට හේතුවූයේ ප්‍රත්‍යය යි. එබැවින් හුදකලා ධාතුව හෝ ප්‍රත්‍යය අර්ථවත් නොවේ. ධාතුප්‍රත්‍යය සංයෝගයෙන් නිපන් ශබ්දප්‍රකෘතිය අර්ථවත් වේ. ධාතුව වනාහි යථොක්ත කාරකාර්ථයන්ට හා භාවාර්ථයට සාධාරණත්වයෙන් සිටිනේ වේ. එබැවින් ඒ ඒ තන්හි යෙදුනාවූ ප්‍රත්‍යයාර්ථයන්ගේ වශයෙන් ශබ්දයන්ගේ

අර්ථවිවේචනය කටයුතු සි. කාරකාර්ථයන්ගේ තත්ත්වය නොදත් නකුට ශබ්දයන්ගේ තත්ත්වාර්ථය නොදත හැකි වේ. එහෙත් පාලිසංස්කෘතාදියෙන් බිඳුනා වූ බොහෝ සිංහලශබ්දයන්ගේ ධාතුප්‍රත්‍යය විවේචනය නොකට හැකි බැවින් ඔවුන්ගේ අර්ථ විවේචනය ද දුෂ්කර වේ. එසේ වුවද කාරකාර්ථාදිය දැනගැණී මෙන් සාමාන්‍යයෙන් ශබ්දයන්ගේ අර්ථය ලැබෙන ආකාරය දත හැකි වේ. එබැවින් කාරකාර්ථාදියෙහි තත්ත්වය මෙලෙසින් දැන සිත්හි ලා දැරිය යුතුසි.

---

## සකරු අරුත් හා හව්තතු.

ධාතුනිෂ්පන්න වූ යම් ශබ්දයෙකින් වාච්‍ය වූ පදය හෝ වස්තුව ඒ ධාතුහුගේ අර්ථය ලබන්නෙක් වේ නම් ඒ ශබ්දගත ප්‍රත්‍යය හෝ ඒ ශබ්දය කර්මකාරකයයි ද, .... ධාත්වර්ථය කරන්නෙක් වේ නම්......කර්තෘකාරක යයි ද,......ධාත්වර්ථයට ඉවහල් වන්නෙක් වේ නම්......කරණකාරකයයි ද, ධාත්වර්ථයට යොග්‍ය වේ නම්......සම්ප්‍රදානකාරක යයි ද, ධාත්වර්ථයට ඉමෙක් වේ නම් .. ...අවධිකාරක යයි ද,......ධාත්වර්ථය දරන්නෙක් වේ නම්...... ආධාර කාරක යයි ද, දත යුතුසි. යම් ශබ්දයෙකින් කිසිත් වස්තු විශෙෂයක් වාච්‍ය නොව හුදු ධාත්වර්ථමාත්‍රය ප්‍රකාශ වේ නම් ඒ ශබ්දගත ප්‍රත්‍යය හා ශබ්දය භාවාර්ථය සි ද දතයුතු සි. ඒ කර්ම කාරකාදීන්ගේ ධාතුප්‍රත්‍යයවිභාගය හා අර්ථවිභාගය මේ දක්වන උදාහරණානුසාරයෙන් දත යුතුසි.

---

## කම්කරු පසින් නිපන් සද.

**ක. කටයුතු=කරණී. පියයුතු=පැන්. බුදියයුතු=බොදුන් කෑයුතු=කදු. ගොතනලද=ගත්. දෙනලද=දත්. මෙ ඈ කම් කරුපසින් නිපන්.**

භා—මෙහි "කරණී" යන්න "කර" ධාතුවෙන් පරව "අනී" ප්‍රත්‍යය වීමෙන් සිද්ධ සි. "නී" ප්‍රත්‍යය සි ද කිය හැකි වේ. පාලි සංස්කෘතයන්හි ශබ්දය "කරණීය" යනු සි. එහි ප්‍රත්‍යය "අනීය" යනුසි. "කර" ධාතුවේ අර්ථය කිරීමයි. "කරණී" යන්නෙන් කිරීම ලබන්නෙක් වාච්‍ය වේ.

"පැන්" යන්න "පා" ධාතුවෙන් පරව "අන්" ප්‍රත්‍යය හා ශබ්දධර්මවශයෙන් මාත්‍රාංශවෘද්ධිය වීමෙන් සිද්ධ සි. "ඇන්" ප්‍රත්‍ය

යයි ද කියත්. පාලිසංස්කෘතයන්හි ශබ්දය "පානීය" යනු යි. පා ධාතුවේ අර්ථය බීම යි. "පැන්" යන්නෙන් බීම ලබන්නෙක් වාච්‍ය වේ. එනම් පියයුතු ජලය යි.

"බොදුන්" යන්න "බොජ" ධාතුවෙන් පරව "අන්" පස හා ශබ්ද ධර්මවශයෙන් පිළිපෙරළි දකාරාදේශ වීමෙන් සිද්ධ යි. පාලිසංස්කෘත ශබ්දය "භොජන" යනු යි. "බොජ" ධාතුවේ අර්ථය බුදීමයි. "බොදුන්" යන්නෙන් බුදීම ලබන්නෙක් වාච්‍ය වේ. එනම් බුදියයුතු ආහාරයෙකි.

"කදු" යන්න "කද" ධාතුවෙන් පරව "උ" පස වීමෙන් සිද්ධ යි. පාලිශබ්දය "ඛජ්ජ" කියා ද සංස්කෘත ශබ්දය "ඛාද්‍ය" කියා ද වේ. "කද" ධාතුවේ අර්ථය කෑම යි. 'කදු' යන්නෙන් කෑම ලබන්නෙක් වාච්‍ය වේ. එනම් කෑයුතු ආහාරයෙකි.

"ගත්" යන්න "ගොත" ධාතුවෙන් පරව "අ" ප්‍රත්‍යය ව ධාත්වන්ත අකාරය ද සමග ඒ ලොප්වීමෙන් හා ශබ්දධර්මවශයෙන් පිළිපෙරළි වීමෙන් සිද්ධ යි. පාලිශබ්දය "ගන්ථ" කියා ද, සංස්කෘත "ග්‍රන්ථ" කියා ද වේ. "ගොත" ධාතුවේ අර්ථය ගෙතීම යි, හෙවත් රචනා කිරීම යි. "ගත්" යන්නෙන් ගෙතීම ලබන්නෙක් වාච්‍ය වේ. එනම් ග්‍රන්ථවිශෙෂ යි.

"දන්" යන්න "දා" ධාතුවෙන් පරව "අන්" පස වීමෙන් සිද්ධ යි. පාලිසංස්කෘතශබ්දය "දාන" යනු යි. "දා" ධාතුවේ අර්ථය දීම යි. "දන්" යන්නෙන් දීම ලබන්නෙක් වාච්‍ය වේ. එනම් දියයුතු වස්තුව යි.

වි—මෙහි නිදසුන් කළ "කරණී" යන තැන්හි ප්‍රත්‍යය මූර්ධන්‍ය 'ණී' යන්න යයි සමහරු තියති. එය මාතෘභාෂාමය ව්‍යාකරණ යන්ට හා වෛයාකරණ රීතියට ද සම නොවේ. පාලිසංස්කෘත යන්හි මේ ප්‍රත්‍යයරූපය "අනීය" යනු යි. එබැවින් සිංහල ප්‍රත්‍යය රූපයද "අනි" කියා හෝ "නී" කියා හෝ වියයුතු යි. බොහෝ ප්‍රකෘතීන්ට සාධාරණත්වයෙන් ප්‍රත්‍යය විධානය වෛයාකරණ රීතිය යි. එහෙයින් ම පාලිසංස්කෘතයන්හි "අනීය"යි ප්‍රත්‍යය විධානය කරණලද්දේ ය. ප්‍රත්‍යය ප්‍රකෘතිය එසේ සාධාරණත්ව යෙන් යෙදුනු පසු එහි නයන්න මූර්ධන්‍යවීමට යොග්‍ය තන්හි මූර්ධන්‍ය වේ. ඒ ආදෙශ විධි වශයෙන් වන්නාවූ විකාරයෙකි. පාලිසංස්කෘතයන්හි "දා-අනීය-දානීය-ගම-අනීය-ගමනීය" යනා දියෙහි ප්‍රත්‍යයයාගේ ප්‍රකෘතිය ද, "කර-අනීය-කරණීය-හර-අනීය-හරණීය" යනාදියෙහි නකාරයාගේ මූර්ධන්‍යත්වයෙන්

ප්‍රත්‍යයවිකෘතිය ද වේ. මෙහි ම සපදන් කරු අරුතට නිදසුන් කළ "දුනී" යන තන්හිදු ප්‍රත්‍යය "අනී" හෝ "නී" යනුයි. "කරණී" යන තන්හි "ණී" කියාත් "දුනී" යන තන්හි "නී" කියාත් ප්‍රත්‍යය විභාගය කරතොත් ඒ ශාස්ත්‍රීය නොවේ. එහෙත් "නී"යි ප්‍රත්‍යය රූපය ගත්කල්හි මූර්ධජත්වයට යෝග්‍ය තන්හි නකාරයට මූර්ධජණකාරය කිරීමට සූත්‍රයක් හෙළුවියරණෙහි නැතැයි ද කිය හැකි වේ. එසේ කීම ද යෝග්‍ය නොවේ. එපමණකුදු නොව තවත් නොයෙක් වර්ණයන්ට ආදේශ වශයෙන් ලැබී තිබෙන ඒ ඒ වර්ණයන් කිරීමට ද හෙළුවියරණෙහි වෙන් වෙන් සූත්‍ර නැති බැවිනි.

---

<u>කතුකරුපසින් නිපන් සද.</u>

**2. කරණුයේ=කතු. ගණන්නේ=ගැණි. විදිනේ=වැදි. යදනේ=යදි. දුවන්නේ=දුවා. පසින් නොයන්නේ=පන්වා. උරෙන් යනුයේ=උරා. පැන් ඉස්නේ=පැනි.**

2. භා — මෙහි "කතු" යන්න "කර" ධාතුවෙන් පරව "තු" ප්‍රත්‍යය හා රකාරය ලොප් වීමෙන් සිඩ යි. "කතු" යන්නෙන් කරධාත්වර්ථය වූ කිරීම සිදුකරන්නෙක් හෙවත් කර්තෘ කෙනෙක් වාච්‍ය වේ.

"ගැණී" යන්න "ගණ" ධාතුවෙන් පරව 'ඉ' ප්‍රත්‍යය හා ශබ්දධර්මවශයෙන් වූ මාත්‍රාංශ වෘද්ධියෙන් සිඩ යි. "ගණ" ධාතුවේ අර්ථය ගිණීම යි. "ගැණී" යන්නෙන් ගිණීම කරන්නෙක් වාච්‍ය වේ. එනම් ගණක තෙමේ යි.

"වැදි" යන්න "විද" ධාතුවෙන් පරව 'ඉ' ප්‍රත්‍යය හා පිළිපෙරළි මතැස් වැඩි විදියෙන් සිඩ යි. "විද" ධාතුවේ අර්ථය විදීමයි. "වැදි" යන්නෙන් විදීම කරන්නෙක් වාච්‍ය වේ. එනම් ව්‍යාධයෙකි.

"යදි" යන්න "යද" ධාතුවෙන් පරව "ඉ" ප්‍රත්‍යය වීමෙන් සිඩ යි. "යද" ධාතුවේ අර්ථය ඉල්වීම යි. "යදි" යන්නෙන් ඉල්වීම කරන්නෙක් වාච්‍ය වේ. එනම් යාචකයෙකි.

"දුවා" යන්න "දව" ධාතුවෙන් පරව "ආ" ප්‍රත්‍යය හා මත් වැඩීමෙන් සිඩ යි. "දව" ධාතුවේ අර්ථය දිවීම යි. "දුවා" යන්නෙන් දුවන්නෙක් වාච්‍ය වේ.

"පන්වා යන්න 'පා' ශබ්දය හා 'න' නිපාතය පූර්වකොට ඇති "යා" ධාතුවෙන් පරව "ආ" ප්‍රත්‍යය වීමෙන් සිද්ධ යි. ඒ සිද්ධියෙහිදී "පා න යා ආ" කියා සිටිතන්හි පා යන්නේ මාත්‍රාහානිය ද නයන්නේ ස්වර ලොපය ද යකාරයට වකාරය ද වීමෙන් "ප න් වා ආ" යනු වේ. පසුව 'වා ආ' යන දෙක පෙරසර ලොප්විදියෙන් සන්ධිවූ කල්හි "පන්වා" යනු වේ. මෙහි පූර්ව වූ පා ශබ්දය කරණ කාරක යි. එබැවින් "පන්වා" යන්නෙන් පයින් නොයන්නෙක් වාච්‍ය වේ. එනම් පන්නග යි හෙවත් සර්ප යි. පාලිසංස්කෘත "පන්නග" ශබ්දය ද "පාද" ශබ්දය හා 'න' නිපාතය පූර්ව කොට ඇති ගමනාර්ථ "ගම" ධාතුවෙන් සිද්ධ යි.

"උරා" යන්න "උර" ශබ්ද පූර්ව 'යා' ධාතුවෙන් පර ව "ආ" ප්‍රත්‍යය වීමෙන් සිද්ධ යි. ඒ සිද්ධියෙහිදී "උර-යා-ආ" යි සිටි තන්හි "ය" ලොපය යි. මෙහි 'උර' ශබ්දය ද කරණකාරක යි. එබැවින් "උරා" යන්නෙන් වක්ෂසින් ගමන් කරන්නෙක් වාච්‍ය වේ. එනම් උරග යි.

"පැනි" යන්න "පැන්" ශබ්දෝපපද "ඉස්" ධාතුවෙන් පරව 'ඉ' ප්‍රත්‍යය වීමෙන් සිද්ධ යි. ඒ සිද්ධියේදී "පැන්-ඉස්-ඉ" යි සිටි තන්හි ධාත්වන්ත සකාරය ලොප් වූ කල්හි "පැන් ඉ ඉ" කියා වේ. නැවත පෙරසරලොප් සඳ විදියෙන් "පැනි" යි සිද්ධ යි. "ඉස්" ධාතුවේ අර්ථය කැමැතිවීම යි. එබැවින් "පැනි" යන්නෙන් පැන් කැමැති වන්නෙක් වාච්‍ය වේ.

මේ කර්තෘකාරක ශබ්දයෝ සංඥාවාචකත්වයෙන් නිෂ්පන්න යහ. ක්‍රියාවාචකත්වයෙන් නිපන් කර්තෘකාරක ශබ්දයන් දක්වන්නාහු "සොබන" යනාදිය කීහු.

b. **සොබන කොබන ලොබන ලලන ගලන බබලන වස්නා තුස්නා මුස්නා උදුල හමල වහල තිපි. සිපි කැපි දූපි කිපි කුමුමු, මෙ ඈ කතුකරුපසින් නිපන්.**

b. හා—මේ "සොබන" යනාදිය "සොබ" ආදි ධාතුන්කෙරෙන් "අන" ආදි ප්‍රත්‍යය වීමෙන් සිද්ධ යි. ඔවුන්ගේ සිද්ධිය විස්තර වශයෙන් දක්වීමෙන් පොත මහත්වන බැවින් මෙහි සංක්ෂෙප ක්‍රමයෙකින් පවසමු.

| ධාත්වර්ථ | ධාතු | ප්‍රත්‍යය | | සිඬපද | උක්තපද |
|---|---|---|---|---|---|
| හෙබීම | සොබ- | අන | = | සොබන | මැදුර |
| කැලඹීම | ඛොබ- | ,, | = | ඛොබන | මුහුද |
| ගිජුවීම | ලොබ- | , | = | ලොබන | මිනිස් |
| ලෙලදීම | ලල- | ,, | = | ලලන | ලිය |
| ගිලිහීම | ගල- | ,, | = | ගලන | දිය |
| බැබලීම | බබල | ,, | = | බබලන | සඳ |
| වැසීම | වස-වස්= | නා | = | වස්නා | වැසි |
| තුටුවීම | තුස-තුස් | ,, | = | තුස්නා | දන |
| මිදීම | මුස-මුස් | ,, | = | මුස්නා | ,, |
| දිලිසීම | උ-දල | අ | = | උදුල | කැලුම් |
| හැමීම | හම | ල | = | හමල | හුළං |
| වැහීම | වහ | ,, | = | වහල | දිය |
| තුටුදීම | තුස | ඉ | = | තිවි | මිනිස් |
| වෙවුලුම | කපි | ,, | = | කැපි | මුහුද |
| දූපුම | දප | ,, | = | දූපි | ඇත් |
| කිපීම | කිප | ,, | = | කිපි | ,, |
| කිමිදීම | කුමුද | උ | = | කුමුවු | ,, |

මේ ධාත්වර්ථයන් අකර්මක බැවින් මේ "සොබන" ආදි පදයෝ කර්මකාරකයෙහි නොයෙදෙත්. මේ පදයන්ගේ නිෂ්පත්තිය පිළිබඳ ආදේශාදිය සිඬපදානුසාරයෙන් දතයුතු යි. "සොබන" යනාදියෙහි ප්‍රත්‍යය 'න' යන්න යයි ද කියත්. මෙහි "මැදුර" යනාදිය උක්තපදවශයෙන් දක්වූ නමුදු ඒ ඒ ශබ්දයන්ගෙන් වාච්‍ය වියහැකි කවරෙක් වුවත් යෙදේ. ක්‍රියාවාචක බැවින් මොවුන්ගේ කාලභේදය ද ඇති වියයුතු යි. "සොබන" යනාදිය වර්තමාන වශයෙන් ද, "උදුල" යනාදිය අතීත වශයෙන් ද වහර යෙදේ.

මෙසේ කර්මකාරකවශයෙන් නිපන් පද හා කර්තෘකාරක වශයෙන් නිපන් පද වෙන් වෙන් වශයෙන් නිදසුන් කොට ඉක්බිති ඒ කාරකද්වයට සම ව නිපන් පදයන් දක්වන්නාහු "කොටූ වැටූ" යනාදිය කීහු.

කම් කතුකරුදෙකට සම සද.

ඞ. කොටු වැටු ගැහැටු වුහුටු දුටු පිවිටු කැපු සැපු දැපු ලූ බැලූ ගැලූ දුරු පිරු වැරු සැරු මැරු වැළු හෙළු නෙළු වෙළු පැළු කියු ලියු පියු කළ හළ වළ සුන් බුන් හුන් මුන් දුන් එන කන දෙන, මෙ ඈ කම්කතුකරු දෙකට සම පසින් නිපන්.

| ධාත්වර්ථ | ධාතු | ප්‍ර: | පද. | ධාත්වර්ථ | ධාතු | ප්‍ර: | පද. |
|---|---|---|---|---|---|---|---|
| කෙටීම | කොට- | උ | = කොටු | හෙළීම | හෙළ | උ | =හෙළු |
| වැටිකිරීම | වට- | ,, | = වැටු | හොළීම | හොළ | ,, | =හොළු |
| ගැටීම | ගහට- | ,, | = ගැහැටු | වෙළීම | වෙළ | ,, | =වෙළු |
| හැරීම | වි-සද- | ,, | = වුහුටු | පෑළීම | පළ | ,, | = පැළු |
| දැකීම | දිස- | ,, | = දුටු | කීම | කිය | ,, | = කියු |
| පිවිසීම | ප-විස | ,, | = පිවිටු | ලිවීම | ලිය | ,, | = ලියු |
| කැපීම | කප- | ,, | = කැපු | වැසීම | පිය | ,, | = පියු |
| සැපීම | සප- | ,, | = සැපු | කිරීම | කර | අ | = කළ |
| කීම | දප- | ,, | = දැපු | හැරීම | හර | ,, | = හළ |
| බහාලීම | ලා | ඌශ | = ලූ | වැසීම | වර | ,, | = වළ |
| බැලීම | බල- | ,, | = බැලූ | සිඳීම | සිඳ | උන් | = සුන් |
| ගිලීම | ගල | ,, | = ගැලූ | බිඳීම | බිඳ | ,, | = බුන් |
| දූරීම | දර | උ | = දැරූ | හිඳීම | හිඳ | ,, | = හුන් |
| පිරීම | පුර | ,, | = පිරූ | විඳීම | විඳ | ,, | = වුන් |
| වැළකීම | වර | ,, | = වැරූ | දීම | දා | ,, | = දුන් |
| සැරසීම | සර | ,, | = සැරූ | ඊම | ඉ- | අත | = එන |
| මැරීම | මර | ,, | = මැරූ | කෑම | කා- | අත | = කන |
| වැළහීම | වළ- | උ | = වැළු | දීම | දා | අත | = දෙන |

මේ පදයන්ගේ සිද්ධිය ද සිද්ධපදානුසාරයෙන් සපයාගත යුතු යි. "සුන්" ආදියෙහි ධාත්වන්තදකාර ලොපය යි. මේ නිදසුන් වලින් "එන" යනාදි තුණ හැර සෙසුපද අතීත වශයෙන් වහර යෙදේ.

තවද මේ ක්‍රියාවාචක පදයන් මෙහි කර්ම කතෘකාරකදෙකට සම්පසින් නිපන්යයි කියනලද්දේ නමුදු බොහෝ පදයන් සෙසු කාරකයන්හි ද යෙදෙන බැව් පෙණේ.. ව්‍යවහාරානුසාරයෙන් දතයුතු යි. ඒ මෙසේ යි.

කර්මකාරක ඒ මිනිහා කොටු වී අවසන් විය.
කර්තෘ ,, වී කොටු මිනිහා ගියේ ය.
කරණ ,, වී කොටු මොහොල කැඩුනා.
ආධාර ,, වී කොටු වංගෙඩිය පැළුනා.
සම්ප්‍රදාන, ඒ මිනිහා දන් දුන් භික්ෂු වැඩියේ ය.
අවධි ,, වඳුරා වැටුනු රුක කඩා වැටුනේ ය.

මේ පිළිවෙළින් ඒ ඒ පදයන්ගේ යෙදීම ව්‍යවහාරානුසාර යෙන් දතයුතු යි.

කරණ කරු පසින් නිපන්සද.

**3. එසින් යේනුයි=යන්. එසින් වසානුයි=වසන්. එසින් සනහානුයි=නහනු. එසින් කොරේ නුයි=කර. මෙ ඈ කරණ කරු පසින් නිපන්.**

3. භා—මෙහි "යන්" යන්න "යා" ධාතුවෙන් පරව "අන්" ප්‍රත්‍යය වීමෙන් සිඬ සි. යා ධාතුවේ අර්‍ථය ගමන සි. "යන්" යන්නෙන් ගමනට කරණ වූවෙක් වාච්‍ය වේ. එනම්:-රථාදි යාන සි.

"වසන්" යන්න "වස" ධාතුවෙන් පරව "අන්" ප්‍රත්‍යය වීමෙන් සිඬ සි."වස" ධාතුවේ අර්‍ථය වැසීම සි."වසන්" යන්නෙන් වැසීමට කරණවූවෙක් වාච්‍ය වේ. එනම්-වස්ත්‍රාදිය සි.

"නහනු" යන්න "නහ" ධාතුවෙන් පරව 'නු' ප්‍රත්‍යය වීමෙන් සිඬ සි. නහ ධාතුවේ අර්‍ථය පිරිසිදු කිරීම සි. "නහනු" යන්නෙන් පිරිසිදු කිරීමට කරණ වූවෙක් වාච්‍ය වේ. එනම්-ස්නානීය ද්‍රව්‍යය සි.

"කර" යන්න "කර" ධාතුවෙන් පරව 'අ' ප්‍රත්‍යය වීමෙන් සිඬ සි. 'කර' යන්නෙන් කිරීමට කරණ වූවෙක් වාච්‍ය වේ. එනම්-හස්තය සි.

---

සපදන් කරුපසින් නිපන්සද.

**4. ඕහට දෙනු ලැබේ නුයි=දනි, බමුණු. මෙ ඈ සපදන් කරු පසින් නිපන්.**

4. භා—මෙහි "දනි" යන්න 'ද' ධාතුවෙන් පරව 'අනි' හෝ 'නි'ප්‍රත්‍යය වීමෙන් සිඬ සි."දනි" යන්නෙන් දීමට යොග්‍යවූවෙක් වාච්‍ය වේ. එනම්-බමුණු තෙමේ සි.

---

අවදි කරුපසින් නිපන්සද.

**5. ඔහු කෙරෙන් බන් නුයි=බෙම්, රකුසු. මෙ ඈ අවදි කරු පසින් නිපන්.**

5. මෙහි 'බෙම්' යන්න 'බා' ධාතුවෙන් පරව 'ඉම්' ප්‍රත්‍යය හා පිළිපෙරළි වීමෙන් සිඬ සි. බා ධාතුවේ අර්‍ථය බියපත්වීමයි. 'බෙම්' යන්නෙන් බියපත් වීමට ඉම් වූවෙක් වාච්‍ය වේ. එනම්-රාක්‍ෂසයි.

---

අදරකරුපසින් නිපන්සද.

**6. එහි වෙත් නුයි=බිම්. එහි සැපත් පිරේ නුයි=පුර. මෙ ඈ අදරකරු පසින් නිපන්.**

6. භා — මෙහි "බිම්" යන්න 'වූ' ධාතුවෙන් පරව 'ඉම්' ප්‍රත්‍යය හා වකාරයට බකාරය වීමෙන් සිඩ සි. වූ ධාතුවේ අර්ථය වීමයි, "බිම්" යන්නෙන් වෘක්‍ෂලතාදීන්ගේ ඇතිවීමට ආධාරවූවෙක් වාච්‍ය වේ. එනම්– භූමිය යි.

"පුර" යන්න "පුර" ධාතුවෙන් පරව 'අ'ප්‍රත්‍යය වීමෙන් සිඩ සි. පුර ධාතුවේ අර්ථය පිරීමයි. 'පුර' යන්නෙන් සමපත් පිරීමට ආධාරවූවෙක් වාච්‍ය වේ. එනම්– නගරය සි.

---

හව්පසින්නිපන්සද.

**7. කරණු දෙනු වලඳනු මැඟුම් නැඟුම් සිඳුම් නැමදුම්, මෙ ඈ හව්පසින් නිපන්.**

7. භා — මෙහි "කරණු දෙනු වලඳනු" යන තුණ "කර ද වලඳ" යන ධාතු කෙරෙන් පරව 'නු' ප්‍රත්‍යය වීමෙන් ද, 'මැඟුම් නැඟුම් සිදුම් නැමදුම්" යන සතර "මඟ නඟ සිඳ නමද" යන ධාතු කෙරෙන් 'උම්' ප්‍රත්‍යය වීමෙන් ද සිඩ සි. කිරීම දීම වැලදීම බැලීම නැගීම සිඳීම නැමදීම යන අර්ථ සි. මේ පදයන්ගෙන් ධාත්වර්ථමාත්‍රය මුත් කිසි වසතුවෙක් වාච්‍ය නොවේ. ධාතුකෙරෙන් ප්‍රත්‍යය යෙදීමෙන් සිඩ වූ ශබ්දයන්ගේ තත්ත්වය,මෙසේ දතයුතුසි.

වි — පාලිසංසකෘතභාෂාවන්හි 'යු' ප්‍රත්‍යයට 'අන' ආදෙශ වීමෙන් "කරණ ගමන" ආදිය සිඩ සි. ඒ 'යු' ප්‍රත්‍යය වනාහි කාරක සයට හා භාවයට ද සාධාරණ වේ. ඒ 'යු' ප්‍රත්‍යයාන්ත ශබ්ද සිංහලෙහි "ඇන් උන් අන් ම අන නා නු උම්" අන්තවශයෙන් දක්නා ලැබේ. ඒ මෙසේ දත යුතු සි.

| පාලි | සිංහල | පාලි | සිංහල |
|---|---|---|---|
| පාන | පැන් | සොභන | සොබන |
| භොජන | බොජුන් | වසසන | වස්නා |
| දාන | දන් | කරණ | කරණු |
| දාන | දීම | මගගන | මැඟුම් |

ධාතු කෙරෙන් ප්‍රත්‍යය වීමෙන් නිපන් ශබ්දයෝ ක්‍රියාවාචක සංඥවාචක වශයෙන් දෙකට බෙදෙත්. සිඩවූ යම් ශබ්දයෙකින් ක්‍රියාර්ථය පමණෙක් ම වේ නම් ඒ ශබ්දය ක්‍රියාවාචක වේ. එනම්– "සොබන, කරණු" යනාදිය සි. මෙබඳු ශබ්දයන්ට අරුත්කිරිය හා හව්කිරිය යයි කියති. යම් ශබ්දයෙකින් ක්‍රියාර්ථ රහිත වසතුවෙක් වාච්‍ය වේ නම් ඒ ශබ්දය සංඥවාචක වේ. එනම්– "යන්, නහනු, දැනී" යනාදිය සි. මේ සියල්ල ම භාෂානුසාරයෙන් දතයුතු සි.

**දසින් නිපන් පසරුත් සද නිමි.**

## තෙමෙත් නිපන් පසරුත් සද.

ඉ. මනුහු පිත්=මන්වා, නර. දනුව පිත්=දන්වා, අසුර. සමණගු පිත්=හෙරණ. සුගත් දෙව් මෝහට=සොගත්, උවසු. වා දෙව් මෙදෙසට=වසඹ. නකත් දතුයේ=නැකති. පදනට ගිය=පදී. දනන් සුමු=දෙනෙනා. සිසල් ලෙව්=ලෝනා. ගම්හි වූයේ=ගැමි. සඟෙහි වූයේ=සැඟි. රුවනින් දඬුයෙන් මවන ලද්දේ=රුවන්මුවා, දඬුමුවා. තුරු මෙන්=තුරුවත්. නැව් දවවනුයේ=නැවි. තොට නියුතුවූයේ=තොටි. කුම්කොරෙම් දු සි පිළිවිස කරණුයේ=කිකරු. දිපැතියේ=දිමුත්. නිස ඇතියේ=නිසවත්. බල, කර, අත් ඇතියේ=බිලි, කිරි, ඇත්. සබට රහ=සැබි. මෙ ඈ නමින් පරව ඒ ඒ අරුත් පසින් නිපන්.

ඉ. භා—නාම කෙරෙන් පරව ඒ ඒ අර්ථයන්හි ඒ ඒ ප්‍රත්‍යය විශෙෂයන් වීමෙන් නිපන් ශබ්දයෝ ද පසරුත් සද නම් වෙත්. පාලිසංස්කෘතයන්හි මේ ශබ්දවිශෙෂයට හා එහි වූ ප්‍රත්‍යය විශෙෂයට "තද්ධිත" යයි කීහු. එබැවින් මෙහි ලා "තද්ධිත" යන්නේ අර්ථය ද දතයුතු යි. ඒ ඒ අර්ථයන්ට හෝ නාමයන්ට හිතවූ ප්‍රත්‍යය විශෙෂයට තද්ධිතය යි කියනුලැබේ. සමාසයට හිතවූ යන අර්ථයෙන් ද තද්ධිතය යි කියනුලැබේ.

භාෂාවිෂයෙහි පදයන්ගේ සංක්ෂෙපය සඳහා සමාසය යි ශාස්ත්‍රවිධියෙක් අනුශිෂ්ට යි. "මනුහු පිත්" යන පදවය සමාස ශාස්ත්‍රයෙහි ලා "මනුපිත්" යි එක් පදයක් කිරීමෙන් සංක්ෂිප්තකට හැකි වේ. එයින් පදවය එක්පදයක් බවට පැමිණියේ නමුදු නාම වශයෙන් දෙකෙක් මැ යි. ඒ නාම දෙකෙන් එක් නාමයක්හුගේ අර්ථය වෙනුවට ප්‍රත්‍යයයක් යෙදීමෙන් ඒ නාමවය එක් නාමයක් කිරීමෙන් වූ අතිසංක්ෂිප්ත භාවය තද්ධිතයෙන් කරණුලැබේ. එනම්– "මනුපිත්" යන්න "මන්වා" යි ව්‍යවහාර කරණුලැබේ. මේ මෙසේ හෙයින් තද්ධිතප්‍රත්‍යය නාමයක් වෙනුවට යෙදෙන ප්‍රත්‍යය බැවින් නාමයට ද, ඒ නාමය පිළිබඳ අර්ථය වෙනුවට යෙදෙන බැවින් අර්ථයට ද, සමාස පද අතිසංක්ෂිප්ත කිරීමට යෙදෙන බැවින් සමාසයට ද හිත වේ. තද්ධිතයන් ඒ ඒ නාමාර්ථාදියට හිත බැවින් තද්ධිත ප්‍රත්‍යයයන්ගේ අර්ථයෝ මෙතෙකැ යි කිව නොහැකි වෙත්. අර්ථ විශෙෂයෝ භාෂාව්‍යවහාරානුසාරයෙන් දතයුතු යි.

මෙහි "මන්වා" යනාදිය උදාහරණ යි. මනුහුගේ පුත්‍රයා ය දනුවගේ හෙවත් අසුරමවගේ පුත්‍රයා ය යන අර්ථයෙහි "මනු, දනු" ශබ්දයන් කෙරෙන් 'වා' ප්‍රත්‍යය හා නකාරස්ථ උකාරලොපයෙන් "මන්වා, දන්වා" යනු සිද්ධ යි. මන්වා නම් මනුෂ්‍ය යි, දන්වා නම්

අසුර යි. ශ්‍රමණයාගේ පුත්‍රයා ය යන අර්‍ථයෙහි "සමණ" ශබ්දයා කෙරෙන් "ණ" ප්‍රත්‍යය හා "සමණ" ශබ්දයට හකාරාදෙශ වීමෙන් "හරණ" කියා වේ, පසුව හකාරයේ පිළිපෙරළි වීමෙන් "හෙරණ" යි සිඩ යි. මේ ශබ්දත්‍රය අපත්‍යාර්‍ථප්‍රත්‍යයෙන් සිඩ යි.

සුගත් තෙමේ යමෙකුට දෙවි වේ නම් ඔහු පැවසීමෙහි "සුගත්" ශබ්දයා කෙරෙන් 'අ' ප්‍රත්‍යය යෙදීමෙන් "සුගත්-අ" කියා වේ, පසුව ප්‍රත්‍යය ලොපයෙන් හා පිළිපෙරළියෙන් "සොගත්" යි සිඩ යි. සොගත් නම් උවසුයි. වාතය තෙමේ යම් දිශාවකට දෙවි වී නම් ඒ දිශාව පැවසීමෙහි 'වා' ශබ්දයා කෙරෙන් 'යයඹ' ප්‍රත්‍යය යෙදීමෙන් හා මාත්‍රාහානිවීමෙන් "වයඹ"යි සිඩ යි. මේ දෙතන්හි දෙවතාර්‍ථප්‍රත්‍යය යි.

'නකත්' ශබ්දයා කෙරෙන් ජානනාර්‍ථයෙහි 'ඉ' ප්‍රත්‍යය වීමෙන් හා මාත්‍රාංශවෘඩියෙන් "නැකති" යි සිඩ යි, නකත් දන්නේ "නැකති" නම් වේ.

"පද" ශබ්දයා කෙරෙන් හිතාර්‍ථයෙහි 'ඊ' ප්‍රත්‍යය වීමෙන් "පදී" යි සිඩ යි. පදයන්ට හිතවූයේ පදී නම් වේ.

"දන" ශබ්දයා කෙරෙන් සමූහාර්‍ථයෙහි "තා" ප්‍රත්‍යය හා පිළිපෙරළියෙන් "දෙනෙතා"යි සිඩ යි. ජන සමූහතෙමේ "දෙනෙතා" නම් වේ.

"ලෙව්"ශබ්දයා කෙරෙන් සකලාර්‍ථයෙහි "තා"ප්‍රත්‍යය වීමෙන් "ලෙව්තා" යි සිඩ යි. සකලලොකතෙමේ "ලෙව්තා" නම් වේ.

"ගම්, සග" ශබ්දයන් කෙරෙන් භවාර්‍ථයෙහි 'ඉ' ප්‍රත්‍යය හා මාත්‍රාංශවෘඩිය වීමෙන් "ගැමි, සැගි" යි සිඩ යි. ගම්හි වූයේ "ගැමි" නම් ද, සගෙහි වූයේ "සැගි" නම් ද වේ.

"රුවන්, දඹු" ශබ්දයන් කෙරෙන් තත්ප්‍රකෘතාර්‍ථයෙහි "මුවා" ප්‍රත්‍යය වීමෙන් "රුවන්මුවා, දඹුමුවා" යි සිඩ යි. රුවනින් කළ ආභරණාදිය "රුවන්මුවා" නම් ද, කාංස්‍යයෙන් කළ භාණ්ඩාදිය "දඹුමුවා" නම් ද වේ.

"තුරු" ශබ්දයා කෙරෙන් උපමාර්‍ථයෙහි "වත්" ප්‍රත්‍යය වීමෙන් "තුරුවත්" යි සිඩ යි. වෘක්‍ෂය වැනි වූයේ "තුරුවත්" නම් වේ.

"නැව්" ශබ්දයා කෙරෙන් ධාවාපනාර්‍ථයෙහි "ඉ" ප්‍රත්‍යය වීමෙන් "නැවි" යි සිඩ යි. නැව දුවවන්නේ "නැවි" නම් වේ.

"තොට" ශබ්දයා කෙරෙන් නියුක්තාර්‍ථයෙහි "ඉ" ප්‍රත්‍යය වීමෙන් "තොටි" යි සිඩයි. තීර්‍ථයෙහි නියුක්ත වූයේ "තොටි" නම් වේ.

"කිම්-කර" ශබ්දයන් කෙරෙන් පෘච්ඡාර්ථයෙහි 'උ' ප්‍රත්‍යය හා මකාරලොපයෙන් "කිකරු" යනු සිඩයි. කිම කරන්නෙම් දැයි පිළිවිස කරන්නේ "කිකරු" නම් වේ.

"දිප්" ශබ්දයා කෙරෙන් අස්ත්‍යර්ථයෙහි 'මත්' ප්‍රත්‍යය හා පකාරලොපය ද මකාරයෙහි අකාරයට පිළිපෙරළි ද වීමෙන් "දිමුත්" යි සිඩ යි. දීප්තිය ඇත්තේ "දිමුත්" නම් වේ.

"නිය" ශබ්දයා කෙරෙන් අස්ත්‍යර්ථයෙහි "වත්" ප්‍රත්‍යය වීමෙන් "නියවත්" යි සිඩ යි. ඥනය ඇත්තේ "නියවත්" නම් වේ.

"බල, කර" ශබ්දයන් කෙරෙන් "ඉ" ප්‍රත්‍යය හා පිළිපෙරළි වීමෙන් "බිලි, කිරි" යි සිඩ යි. බල ඇත්තේ 'බිලි' නම් ද, හස්තය (සොඬ) ඇත්තේ "කිරි" නම් ද වේ.

"අත්" ශබ්දයා කෙරෙන් අස්ත්‍යර්ථයෙහි 'ඉ' ප්‍රත්‍යය ලොපය හා මාත්‍රාංශවෘඩියෙන් "ඇත්" යි සිඩ යි. "කිරි" යන්නෙහි අර්ථයි

"සබ" ශබ්දයා කෙරෙන් අභිප්‍රාර්ථයෙහි 'ඉ' ප්‍රත්‍යය හා මාත්‍රාංශ වෘඩි වීමෙන් "සැබි" යි සිඩ යි. සභාවට සුදුස්සේ "සැබි" නම් වේ.

ඇතැම් ශබ්දයෝ ප්‍රත්‍යයවත් වීමෙන් ද නොවීමෙන් ද අර්ථකිපයක් ඇසුරු කොට වහර යෙදෙත්. ඔවුන් ඒ ඒ තන්හි ප්‍රත්‍යයවත් කිරීම් වශයෙන් හෝ අභෙදොපචාරවශයෙන් ගතයුතු බැව් දක්වීම සඳහා "ඉඳුරු" යනාදිය කිහු.

**a. ඉඳුරු ගිනි යම් ඈ දසගු නම හිමියන් නමින් ද, මල් පිලි ඈ ඒ ඒ ලිය රුක් නමින් ද, අබේදුවසරින් පසවත් කිරිමෙන් හොත වහර යෙදෙත්.**

## පසරුත් අදියර අටවනු.

a. "ඉඳුරු ගිනි යම්" ආදි දිශාවෝ ඒ ඒ දිශාවන්ට ස්වාමිවූ ඒ ඒ දෙවතාවිශෙෂයන්ගේ නාමයෙන් ද, ඒ ඒ වෘක්ෂලතාදිය පිළිබඳවූ මල්ගෙඩි ආදිය ඒ ඒ වෘක්ෂලතාදීන්ගේ නාමයෙන් ද අභෙදොපචාරයෙනුත් ප්‍රත්‍යයවත් කිරීමෙනුත් ව්‍යවහාරයෙහි යෙදෙත්.

වි—ඉඳුරු ගිනි යම් ආදිය ඒ ඒ දිශාවන්ට ද, ඒ දිශාවන්ට අධිපති වූ දෙවතාවිශෙෂයන්ට ද ව්‍යවහාර කෙරෙත්. "ඉඳුරු ගිනි යම්" යන තුණ ඉන්ද්‍ර අග්නි යම යන දෙවතා නාමයෝ වෙත්. ඒ නාමයන් ඔවුන් අධිපති කොට ඇති දිශාවන්ට ද ව්‍යවහාර කෙරෙත්. එනම් 'ඉඳුරු' යනු පෙරදිගට ද, 'ගිනි' යනු පෙරනු

දිගට ද හෙවත් ගිනිකොණට ද, ‘යම්’ යනු දකුණුදිගට ද නමි. මෙසේ ව්‍යවහාරවන්නේ ප්‍රත්‍යයවත් කිරීම් වශයෙනි. එනම්- “ඉඳුරු දෙව් මෙදෙසට= ඉඳුරු, ගිනි දෙව් මෙදෙසට= ගිනි, යම දෙව් මෙදෙසට=යම්” යි ප්‍රත්‍යයවත් වියයුතු යි මේ ‘ඉඳුරු’ ආදි නාමයන් කෙරෙන් ‘අ’ ප්‍රත්‍යය යෙදී ලොප් වූයේ වේ. මෙසේ මේ “ඉඳුරු” ආදි නාම ඒ ඒ දිශාවන්ට හා අධිපතීන්ට ව්‍යවහාර කරණ බැවින් ඔවුන්ගේ අර්ථය සලකා ගැණීම අභෙදෛපචාර යෙන් කටයුතු යි. අභෙදෛපචාර නම් තැනට සුදුසු ලෙස හැසිරී මයි. “ඉඳුරුට පුදයි” කී කල්හි පිදීම ඒ දිශාවට යයි ගතහොත් ඒ හෙදෛපචාරයෙකි, හෙවත් තැනට නුසුදුසු හැසිරීමෙකි. එහි අධිපති දෙවතාවාට යයි ගතහොත් ඒ අභෙදෛපචාර යි. එසේම “ඉඳුරෙන් ඉර උදා වේ” කී කල්හි ඉර උදාවීම ඒ දෙවතාවාගෙන් යයි ගතහොත් ඒ හෙදෛපචාරයෙකි, ඒ දිශාවෙන් යයි ගතහොත් ඒ අභෙදෛපචාර යි. “ඉඳුරු ගිනි යම් ඈ” යන තන්හි ඈසඳින් “නිරිත වරුණ” ආදිය ද ගතයුතු යි.

ඒ ඒ ගස් වැල් ආදීන්ගේ නාමයන් ඒ ගස් වැල් ආදිය පිළිබඳ පුෂ්පඵලාදීන්ට ව්‍යවහාරකිරීම ද ප්‍රත්‍යයවත් වීමෙන් විය යුතු යි. “පොල්” යනු වෘක්ෂ විශෙෂයෙකි. “පොල්හි වූයේ=පොල්” කියා ඒ ප්‍රත්‍යය වත් කළ කල්හි පුෂ්පඵලාදිය ද “පොල්” නමින් ව්‍යවහාර කට හැකි වේ. එහිදු අර්ථය සැලකීම අභෙදෛපචාරයෙන් කටයුතු යි. යමකු කොස් බතල ආදියක් අනුභව කරමින් සිට පොල් ගෙණෙව යි කිසිවකුට කී කල්හි පොල්ගසක් ගෙණැවිත් දුන්නොත් ඒ හෙදෛපචාරයෙකි, ගාපු පොල් මද ගෙණැවිත් දුන් නොත් ඒ අභෙදෛපචාර යි. සෙස්ස ද මෙලෙසින් සලකාගත යුතු යි.

දූන් ඒ ඒ පලාත්වල නාමයන් ඒ ඒ පලාත්වල අධිපතීන්ට ද ව්‍යවහාර කෙරෙත්. “මඩුවන්වල, නුගවෙල, එල්ලාවල” යනාදිවශයෙනි, ඒ නාමයෝ ද ප්‍රත්‍යයවත් කටහැකි වෙත්. “මඩු වන්වලට හිමි වූයේ=මඩුවන්වල” යනාදිවශයෙනි. ඔවුන්ගේ ව්‍යව හාරය ද අභෙදෛපචාරවශයෙන් කටයුතු යි.

තද්ධිතපදවලින් ද “කර්ම කර්තෘ සම්ප්‍රදාන සම්බන්ධ ආධාර” යන මේ අර්ථයෝ උක්ත වෙත්. ඒ පිළිවෙළ උත්අවුත් අදියරෙහි පව සන බැවින් මෙහි නොලියමු.

තවද මේ දෙවැදෑරුම් වූ පසරුත් අදියරෙහි ශබ්දයෝ පාලි සංස්කෘත ශබ්දයන්ගෙන් බිඳගත හැකි වෙත්, එබැවින් ඒ ශබ්ද යන් නිදසුන් කිරීම වුවමනා නැතැයි ද ඇතැමුන්ගේ මතයෙකි.

එහෙත් සිද්ධාන්තසඞ්ග්‍රහකර්තෘපාදයන් ද ඒ මතයෙහි සිට යථෝක්ත ශබ්දයන් පිළිබඳ අනුශාසනය නොකෙළේ නම් සිංහලව්‍යාකරණය පිළිබඳ මහත් ඌනත්වයෙක් කෙළේ වේ. එසේ කෙළේ නම් සිංහල පමණක් ඉගෙණගන්නෝ භාෂාවිෂයෙහි ඒ මේ වියරණවිදි ඇති බවක් වත් කෙසේ දැනගණිද්ද?.

## ප්‍රත්‍යයාර්ථාධිකාරය.

### නිමි.

---

### 9. වුත් අවුත් අදියර.

**a. බජන නම විබත්-කම්කතුරුතු අවුතු නම්.**
**බහු දෙදෙන වුතු නම් වෙත්-පළමුවිබත් බජනුවෝ.**

**b. ලබද සුතු කමන වුතු නම් නැත අවුතු නම්,**
**වුතු වන කම් කතු අවුත්-කතු වුතුවන අවුත් කම්.**

a. භා—යම්කලෙක්හි කර්මාර්ථය පැවසීමට කම්විබත යෙදේ නම් ඒ කර්මාර්ථය ද, කර්තෘ අර්ථය පැවසීමට කතුවිබත යෙදේ නම් ඒ කර්තෘ අර්ථය ද අනුක්ත යි. ඒ කර්මාර්ථකර්තෘඅර්ථයන්හි පෙරවිබත වේ නම් එබඳු කර්මකර්තෘඅර්ථයෝ උක්ත වෙත්.

b. භා—ලබ ධාතුහුගේ අර්ථයෙන් යුක්තවූ කර්මාර්ථය උක්ත කර්මාර්ථ නම් ද, ලබධාත්වර්ථයෙන් තොරවූ කර්මාර්ථය අනුක්ත කර්මාර්ථ නම් ද වේ. යම් වාක්‍යයෙක්හි කර්මය උක්ත වේ නම් එහි කර්තෘ අනුක්ත වේ. කර්තෘ උක්ත වේ නම් කර්මය අනුක්ත වේ.

වි—භාෂාවිෂයෙහි කර්මකර්තෘ අර්ථයෝ දෙවිදියෙකින් ප්‍රකාශ වෙත්. ඉන් එක් කර්මාර්ථයෙක් විභක්තිබලයෙන් ප්‍රකාශ වේ. ඒ අනුක්ත කර්මාර්ථය යි. එක් කර්මාර්ථයෙක් ප්‍රත්‍යය බලයෙන් හෙවත් ප්‍රත්‍යයවත් ශබ්ද බලයෙන් ප්‍රකාශ වේ, ඒ උක්තකර්මාර්ථය යි. එහි උක්තකර්මාර්ථය පැවසෙන්නේ පෙරවිබතෙනි. විභක්තිරහිතවූ කවර ශබ්දයෙක්හි වුවත් අර්ථය ප්‍රකට නොවන බැවිනි. භාෂාව්‍යවහාරයෙහි වනාහි ඒ උක්තකර්මාර්ථය ලබධාතුහුගේ අර්ථයෙන් යුක්ත වේ, අනුක්තකර්මාර්ථය එසේ ලබධාත්වර්ථයෙන් යුක්ත නොවේ. යම් වාක්‍යයෙක්හි කර්මය උක්ත වේ නම් එහි කර්තෘ අනුක්ත වේ, කර්තෘ උක්ත නම් කර්මය අනුක්ත වේ. කවර වාක්‍යයෙක්හි වුවත් ඒ දෙකම උක්ත හෝ අනුක්ත නොවේ.

පාලිසංස්කෘතව්‍යවහාරයෙහි උක්තකර්මාර්ථය පැවසීමට 'ලභ' ධාතුව යෙදීමෙක් නැත්තේ ය. ලබධාතුව යෙදීම සිංහලව්‍යවහාරය යි. ස්වභාවයෙන් උක්ත වුවත් අනුක්ත වුවත් කර්මය ක්‍රියාර්ථය

ලබන්නෙකි. ඒ කර්මස්වභාවය යි. ඒස්වභාවයෙහි ලා වැඩි අයිතියක් පැවසීමට උක්ත තන්හි 'ලබ'ධාතුව යෙදීම සිහලවහරෙහි පැවතේ. කම්කතුදෙදෙනාගේ උක්තානුක්තභාවය පළමු කොට හුදුකිරිය පද විෂයෙහි ලා හෙවත් ආඛ්‍යාතවිෂයෙහි ලා දැක්වීම සඳහා "දහම්" යනාදිය කිහු.

<u>හුදුකිරියපෙදෙන් වුත් අවුත්.</u>

**a. "දහම් නරදම් සැරිහු විසින් දෙසිති" මෙ ඇඟි කම් වුත් කතු අවුත් නම්.**

**b. "එ දම් අරිසඟ පිළිපදනේ"සි මෙ ඇඟි කතුවුත් කම් අවුත්.**

**ඉති හුදුකිරියපෙදෙන් වුත් අවුත්.**

a. භා— "දහම්" යනාදි වාක්‍යයෙහි "දෙසිති" යන ක්‍රියා පදය කර්මාර්ථයෙහි නිෂ්පන්න යි, ඒ වනාහි ලබ ධාතුවේ අර්ථයෙන් යුක්ත යි. එබැවින් "දහම්" යනු උක්ත කර්ම යි, පෙරවිබති. "නරදම් සැරිහු" යනු අනුක්ත කර්තෘ යි. කතුවිබති. බුදුන්විසින් ධර්මය දෙසනු ලැබිය යනු එහි අර්ථයි.

b. භා— මේ වාක්‍යයෙහි "පිළිපදනේ" යන ක්‍රියාපදය කර්තෘාර්ථයෙහි නිෂ්පන්න යි. එබැවින් එයින් "අරිසඟ" යන කර්තෘ උක්ත වේ. "එදම්" යනු අනුක්ත කම් යි.

<u>අකම්කිරියනෙන් වුත්කතු.</u>

**a. ගිම්රිවිතෙදිනදන්-ගජරජ කුමුටු වනවිල්,**
**එහි පිළිබිඹු බහු බලා-නොසැහැ වනසන මෙනෙනෙව්.**
**මෙ ඇ අකම් කිරියනෙන් වුත්කතු.**

a. භා—"ග්‍රීෂ්මසූර්‍ය්‍යතේජසින් ඛේදයට පැමිණියා වූ(අමාරු වූ) හස්තිරාජ තෙමේ වනතඩාගයෙහි ඔහුගේ ප්‍රතිබිම්බය දැක නොයිව සිය හැකි ව ඒ වනසන්තා වූ සිතෙන් මෙන් වනතඩාගයෙහි කිමිද්දේය" යනු ගීයෙහි අර්ථයි. මෙහි "කුමුටු" යන ක්‍රියාපදය අකර්මක ද කර්තෘකාරක ද වේ. එබැවින් "ගජරජ" යනු එයින් උක්ත කර්තෘ යි. "වනවිල්" යනු එහි අනුක්තාධාරයි.

<u>සකම්කිරිය නෙන් වුත්කතු.</u>

**b. රුදුරුබිෂෙනිතුන්-හදදුරට පිවිටු කම්,**
**එහි දෙහට කමොල් දෙක්-වත්නට වැරැදු කො රැකෙක්**

b. භා—අනඞ්ගතෙමේ ඊශ්වරයා කෙරෙන් වූ බියෙන් ස්ත්‍රීන් ගේ හෘදය නමැති දිරුරුක්සිදුරට පිවිසියේ ය, එහි දී ද ඕහට දුක්

දෙත්, මේ මෙසේ හෙයින් සමර්ථ වූවින්ට විරුඬව කොහි රුකිය හැකි වේ ද. මේ වාක්‍යයෙහි "පිවිටූ" යන්න සකර්මක ධාතුනිෂ්පන්න කර්තෘකාරක ක්‍රියාපදයෙකි. එබැවින් ඒ යොගයෙහි "තම්" යන කර්තෘ තෙමේ උක්ත වේ. "හදදූදුරට" යි කර්මය අනුක්ත වේ.

---

<u>අරුත්කිරියනෙන් වුත්කම්.</u>

c. **සලෙලු තිළි දූකා-පියොවුරු බෙණද පියබඳ,**
**වුහුමෙහි සක්නරද හිස-නැනවි උදුරණ සිනෙනෙව.**

**මෙ ඇ අරුත්කිරිඝනෙන් වුත් කම්.**

c. භා—සලලාල තෙමේ ප්‍රිය කාන්තාවගේ පයොධර නමැති පර්වතය දූකා සතුටු ව එහි හරණලද ඇස්නමැති යහුල උදුරණ අදහසින් මෙන් හිස සෙලෙව්වේය.

වි – මේ වාක්‍යයෙහි "වුහුටු" යනු අර්ථ ක්‍රියා යි, ඒ කර්මකාරක යෙහි නිෂ්පන්න යි. එබැවින් "සක්නරද" යනු එයින් උක්තකර්ම යි. "සලෙලු විසින්" කියා කර්තෘපදයෙක් අනුක්ත වේ.

තවද මේ වාක්‍යයෙහි "තිළි, දූකා, වුහුටු, නැනවි" යන සත රම ක්‍රියාපදයෝ වෙත්, මේ සතරට ම කර්තෘ වූයේ "සලෙලු" යන පදය යි. ඒ වනාහි "නැනවි" යන්නට උක්ත කර්තෘ වශයෙන් ද "වුහුටු" යන්නට අනුක්ත කර්තෘ වශයෙන් ද යෙදේ. මේ ක්‍රියා පදයන් අතුරෙන් "නැනවි" යන්න ප්‍රධාන වේ. එබැවින් ඊට සමානත්වයෙන් "සලෙලු" යන්න පෙර විබතින් යෙදුනේ වේ. සියලු වාක්‍යයන්හි ම ප්‍රධාන ක්‍රියාපදය අපෙක්‍ෂා කොට ම කර්තෘ පදය යෙදෙන බැව් මෙයින් සලකා ගතයුතු යි.

මෙසේ හුදුකිරිය පෙදෙන් හා අරුත් කිරිය පෙදෙන් වුත් අවුත් විදි දක්වා නැවත සමස් ආදියෙනුදු වුත් අවුත් විදි ඇති බැව් සඳහන් කරන්නාහු "ඒ ඒ විබත්හි" යනාදිය කිහු.

d. **ඒ ඒ විබත්හි අරුත්හි සමස් පස් නම නම විබත් අරුත් වුනුනම් කෙරේ. අන් කිරිඝක් නැත පෙරවිබත් අත්හට වුදු යොදනු.**

**වුත් අවුත් අදිඝර නවවනු.**

d. භා—යම් විභක්ත්‍යර්ථයෙක්හි යම් අන්‍යාර්ථසමාසපදයෙක් සිඬ වේ නම් ඒ සමාසපදය තෙමේ ඒ විභක්ත්‍යර්ථය උක්ත කෙරේ, යම් අර්ථයෙක්හි යම් ප්‍රත්‍යයෙක් වේ නම් ඒ ප්‍රත්‍යය හෙවත් ප්‍රත්‍ය වත් ශබ්දය තෙමේ ඒ අර්ථය උක්ත කෙරේ. යම් වාක්‍යයෙක්හි අන්‍ය වූ ක්‍රියා විශෙෂයක් නැති ව පෙරවිබත විද්‍යමාන වේ නම් ඒ පෙර විබත් අරුත පැවසීමට "වූ" ධාතුක ක්‍රියාපදයෙක් යෙදිය

යුතුයි. ඒ මෙසේයි– "මිනිහෙක්" යි කී කල්හි ප්‍රථමා විභක්ත්‍යන්ත පදය ක්‍රියා රහිත වේ, එබැවින් එහි "මිනිහෙක් වේ" යනාදි වශයෙන් වූ ධාතුක ක්‍රියාපදයෙක් යෙදේ.

වි—උක්තවිධිය පිළිබඳ ව මෙහි ලෙශමාත්‍රයෙක් නිර්දිෂ්ටයි, එබැවින් අප විසිනුදු ඒ පිළිබඳව තවත් ස්වල්පවිස්තරයෙක් කරණු ලැබේ. සමාසයෙන් "කර්ම කර්තෘ කරණ සම්ප්‍රදාන අවධි ආධාර සම්බන්ධ" යන අර්ථ සත ද, තද්ධිතයෙන් "කර්ම කර්තෘ ආධාර සම්බන්ධ" යන සතර ද, ආඛ්‍යාතයෙන් "කර්ම කර්තෘ" දෙක ද, කෘදන්තයෙන් කර්මාදිකාරක සය ද උක්ත වේ. ඒ මෙසේ දත යුතු යි.

---

### සමාසයෙන් උක්ත.

| සමාසපද. | | උක්තපද. | සමාසපද. | | උක්තපද. |
|---|---|---|---|---|---|
| කර්ම– | එරුණුහස් | තළා | සම්ප්‍ර– | දුන්වත් | බමුණු |
| කර්තෘ– | දුම්දුරු | මුනි | අවධි– | ගුලුගොනහුල් | රුක් |
| කරණ– | සුත්බත් | අට | ආධාර– | මත්තේගජ | රන් |
| සම්බන්ධ– | දසබල | මුනි | | | |

---

### තද්ධිතයෙන් උක්ත.

| තද්ධිතපද. | | උක්තපද. | තද්ධිතපද. | | උක්තපද. |
|---|---|---|---|---|---|
| කර්ම– | රුවන්මුවා | අබරණ | ආධාර– | යසවත් | කිවි |
| කර්තෘ– | ගැමි | මිනිස් | සම්බ:– | සොගත් | උවසු |

---

### ආඛ්‍යාතයෙන් උක්ත.

කර්ම– මිනිහා විසින් බත පැසේ. කර්තෘ– මිනිහා බත පිසා.

---

### කෘදන්තයෙන් උක්ත.

| කෘදන්තපද. | | උක්තපද. | කෘදන්තපද. | | උක්තපද. |
|---|---|---|---|---|---|
| කර්ම– | බොජුන් | අහර | සම්ප්‍ර:– | දනී | බමුණු |
| කර්තෘ– | කතු | මිනිස් | අවධි– | බෙම් | රකුසු |
| කරණ– | කර | අත් | ආධාර– | බිම් | පොළෝ |

මෙහි "එරුණුහස්" ආදි සමාසපද කර්ම ආදි විබත් අරුත්හි නිපන් බැවින් 'තළා' ආදි පදයෝ ද "රුවන්මුවා, පැසේ, බොජුන්" යනාදි ප්‍රත්‍යයාන්ත පද කර්මාදි අර්ථයන්හි නිපන් බැවින් එයින් "අබරණ, බත, අහර" යනාදි පදයෝ ද උක්ත වෙත්. සෙස්ස ද මෙලෙසින් දතයුතු යි.

## උක්තානුක්තාධිකාරය

නිමි.

## කිරියකරුසබඳඅදියර.

a. කම් කතු කරණ හා- සපදන් අවදි අදර ද,
මෙ වියූ විබත් සයට ම- කරු නම් වියූ පඬුවෝ.

b. කිරිය නිපැත්මට- හේනෙන් මෙ සකරු නම්,
සබඳ අලපෝ බිහි වූ- මෙ වැනි අයුරක් නො ලදින්.

c. යොදනු සබඳ නම්- මෙ විබත් කිරිය පද හා,
මෙ විනා නො මැති වැකියෙක්- විවැකු අරුත් පවසන.

a. භා—"කර්‍ම කර්‍තෘ කරණ සම්ප්‍රදාන අවධි ආධාර" යන මේ විභක්ති සයට ම පණ්ඩිතයෝ කාරක යන නාමය කීහු.

ď. ක්‍රියා නිෂ්පත්තියට හෙතු වන හෙයින් මේ සය කාරක නම් වේ. ක්‍රියා නිෂ්පත්තියට හෙතුවන්නාවූ ආකාරයක් නොලත් හෙයින් සම්බන්ධ ආලපන දෙදෙන කාරකයන්ගෙන් වහිර්භූත වූහ.

c. මේ විභක්තීන් ක්‍රියාපදයන් හා යෙදීම ක්‍රියාකාරකපද සම්බන්ධ නම් වේ. මේ ක්‍රියාකාරකපද සම්බන්ධය හැර කියනු කැමති අර්ථයක් පවසන්නා වූ වෙන වාක්‍යයෙක් නො මැත්තේ ය.

වි—ක්‍රියානිෂ්පත්තියට හෙතුය යන අර්ථයෙන් කම් විබත් ආදි සයට කාරකය යි කීහු. කාරක පදයක් නැත්තේ නම් කෙසේ වත් ක්‍රියාවක් නො ලැබේ. එහි තාත්පර්‍ය කිරිය විදිය හැඳින් වීමේදී ප්‍රකාශිත යි.

---

## කිරියකරුපදන් යොදන අයුරු.

a. "මුළුදෙට පාපිඩු කනාඉකිලියේ සඳුන්කපින් පිසැ සඟනට දී බෙවෙන් මිදිනි" ඉති කිරියකරුපදන් යොදන අයුරු. සියල් තැනැ යතලබින් යොදනු.

කිරියකරුසබඳ අදියර දසවනු.

a. භා—මෙහි "මිදිනි" යන ක්‍රියාව සමග "මුළුදෙට" යන කර්‍තෘ කාරකයාගේ හා "බෙවෙන්" යන අවධිකාරකයාගේ ද, "දී" යන පෙරකිරිය සමග "සඟනට" යන සම්ප්‍රදාන කාරකයාගේ ද, "පිසැ" යන පෙරකිරිය සමග "සඳුන් කපින්" යන කරණ කාරකයාගේ හා "කනාඉකිලියේ" යන ආධාරකාරකයාගේ ද "පාපිඩු" යන කර්‍මකාරකයාගේ ද සම්බන්ධය යි. මේ වාක්‍යය කාරකසයෙන් ම යුක්ත යි. එහෙත් සියලු වාක්‍යයෝ ම එසේ නොවෙත්. ඒ ඒ තන්හි අදහස් පැවසීමෙහි ලා ක්‍රියා හා කාරකපදයන් ලැබුනු පමණින් වාක්‍ය යොදාගත යුතු යි. හේ මෙසේ යි:—

| කාරක. | වාක්‍යය. |
|---|---|
| 1. | මිනිහෙක් වේ. |
| 2. | මිනිහා බත් පිසන්නෙක් වේ. |
| 3. | මිනිහා ගින්නෙන් බත් පිසන්නෙක් වේ. |
| 4. | මිනිහා ගින්නෙන් සැළියෙහි බත් පිසන්නෙක් වේ. |
| 5. | මිනිහා ගින්නෙන් සැළියෙහි බත් පිස සඟනට දෙන්නෙක් වේ. |
| 6. | මිනිහා ගින්නෙන් සැළියෙහි බත් පිස සඟනට දී බෙවෙන් මිදෙන්නෙක් වේ. |

මේ වාක්‍ය සය එක් කාරකයක් විෂය කොට ඇති වාක්‍යය, කාරක දෙකක් විෂය කොට ඇති වාක්‍යය යනාදි වශයෙන් දත යුතු යි. තව ද වාක්‍යයන් යෙදීමේදී වාක්‍යාර්ථය අවසන් කරණ ක්‍රියා පදය ත් ඒ හා සම්බන්ධය ලබන්නා වූ ප්‍රධාන පදය ත් යන දෙක විශෙෂයෙන් සලකා බැලිය යුතු යි. වාක්‍යය අතර කොපමණ ක්‍රියාපද ඇතත් ඉන් ප්‍රධාන ක්‍රියාපදය සලකා කර්තෘ කර්ම යෙදිය යුතු යි. ප්‍රධාන ක්‍රියාව කර්තෘ කාරක නම් ඒ හා යෙදෙන කර්තෘ පෙර විබතින් හා කර්මය කම් විබතින් ද, ප්‍රධාන ක්‍රියාපදය කර්ම කාරක නම් ඒ හා යෙදෙන කර්තෘ කතු විබතින් හා කර්මය පෙර විබතින් ද යෙදීම නියමය යි.

"ඒ මිනිස්සු කරණ කටයුතු යද්දී කීහු" යන වාක්‍යයෙහි ප්‍රධාන ක්‍රියාපදය "කීහු" යනු යි. ඒ කර්තෘකාරක වේ, එබැවින් ඒහා සම්බන්ධ වූ කර්තෘ පදය "මිනිස්සු" යි පෙරවිබත් විය. කර්මය "කටයුතු" යි කම් විබත් විය. මේ වාක්‍යයෙහි "කරණ, යද්දී" යන දෙක ද ඒ මිනිසුන්ගේ ම කර්තෘත්වයෙන් පැවැති ක්‍රියාපද දෙකෙකි, එහෙත් ඒදෙක අප්‍රධාන වේ. ඒ දෙක අපෙක්ෂා කොට යෙදෙත් හොත් "මිනිසුන්" යි කතු විබතින් හෝ කම් විබතින් යෙදියයුතු යි, එහෙත් එසේ නොයෙදේ.

"සොරුන් විසින් මිනිස්සු වටලාගෙණ පෙළෙති ("පෙළනු ලබත්") යන වාක්‍යයෙහි ප්‍රධාන ක්‍රියාපදය "පෙළෙති" යනු යි, ඒ කර්මකාරක වේ, එබැවින් ඒ හා සම්බන්ධ වූ ප්‍රධාන පදය "මිනිස්සු" යනු යි. ඒ උක්තකර්මාර්ථයෙහි පෙරවිබති. ඒ වාක්‍යය අතර වූ "වටලා ගෙණ" යන පෙරකිරිය පද අප්‍රධාන වේ. ඒ පෙරකිරිය පද අපෙක්ෂා කොට කර්මය යෙදුනේ නම් "මිනිසුන්" යි කම් විබත් වියයුතු යි, එහෙත් එසේ නොයෙදේ. වාක්‍යයන්හි සදෙෂත්ව යෙන් සැලකිය යුතු බොහෝ පාඨයෝ යොජකයන්ගේ අපරීක්ෂා කාරිත්වයෙන් ඇතැම්තන්හි යෙදෙති, මෙහි එබඳු වාක්‍ය සවල්ප යක් ද දක්වමු.

| සදෙස් වාක්‍ය | නිදෙස් වාක්‍ය |
|---|---|
| 1 එහි මිනිස්සු නැති බව දනිමි. | එහි මිනිසුන් නැති බව දනිමි. |
| 2 ඔවුහු උතුමෝ බව ද දනිමි. | ඔවුන් උතුමන් බව දනිමි. |

| | | |
|---|---|---|
| 3 | ඔහු මිනිසෙක් බව දනිමි. | ඔහු මිනිසකු බව දනිමි. |
| 4 | මිනිසෙක් විසින් කළ කර්මය. | මිනිසකු විසින් කළ කර්මය. |
| 5 | ඒ මිනිසෙක් සිටි තැනකි. | ඒ මිනිසකු සිටි තැනෙකි. |
| 6 | ඒ මිනිසෙක් සඳහා දුන් වස්තුවකි. | ඒ මිනිසකු සඳහා දුන් වස්තුවෙකි. |
| 7 | ගනකුරු විස්සෙක් වෙත්. | ගනකුරු විස්සෙක් වේ. |
| 8 | මිනිස්සු විස්සෙක් වේ. | මිනිස්සු විස්සෙක් වෙත්. |
| 9 | අරමුණු නිසා සිත් උපදිත්. | අරමුණු නිසා සිත් උපදී. |
| 10 | ඇතැම් කෙනෙක් මෙසේ කියයි. | ඇතැම් කෙනෙක් මෙසේ කියත්. |
| 11 | ඇතැම් කෙනකු කී දේ. | අතැම් කෙනකුන් කී දේ. |
| 12 | එක්කෙනෙක් පිළිවිසී. | එක්කෙනෙක් පිළිවිසිත්. |
| 13 | එක්කෙනකු කී දේ. | එක්කෙනකුන් කී දේ. |

මේ වාක්‍යයන්හි වූ සදෝෂත්වය මෙසේ යි. එනම්- සියලු තන්හි ම "බව" ශබ්දය හා යෙදෙන පදය සබඳ විබත් වියයුතු යි. මෙහි වූ "මිනිස්සු, ඔවුහු, උතුමෝ. මිනිසෙක්" යන මොහු පෙර විබත් පදයෝ යි. සිහල වහරෙහි ඇතැම් තන්හි ශබ්දයන් කෙරෙන් "එක්" යන්න යෙදේ: ඒ අනත කොට ඇත්තාහු පෙර විබත් වශයෙන් වහර යෙදෙත්. එනම්-"මිනිසෙක්" යනාදිය යි. පෙර විබත් නොවන තන්හි ශබ්දාන්තයෙහි "අක්" යන්න යෙදේ. "මිනිසක්" යනාදි වශයෙනි. කම් කතු සබඳ විබත් විෂයෙහි ඒ "අක්"රූපය ම හෝ ඉන් පරව "උ" ආදි පස යෙදීමෙන් "මිනිසකු" ආදි වශයෙන් හෝ යෙදේ. මේ පැරණිවහරයි. ඇතැම් තන්හි "එක්" අන්තයෙනුදු "උ" පස ආදිය යෙදීමෙන් කම් විබත් ආදියෙහි "මිනිසෙකු" යනාදි වශයෙන් ද යෙදේ.

4, 5, 6- වාක්‍යයන්හි "කළ, සිටි, දුන්" යන ක්‍රියාවන් හා සම්බන්ධ වූ කර්තෘ කතුවිබත් වියයුතු යි. "සඳහා" යන්න සමග යෙදෙන පදය කම්විබත් විය යුතු යි. "තැනකි, වස්තුවකි" යන දෙක ද පෙරවිබත් විය යුතු යි. එකල්හි "එක්" අන්ත වීමෙන් "තැනෙකි, වස්තුවෙකි"යි වීම යෝග්‍ය යි. 7 වාක්‍යයෙහි "ගනකුරු" යනු අප්‍රාණිවාචක වේ, සිංහලෙහි අප්‍රාණිවාචක ශබ්ද ප්‍රකෘතිය එකවචන වශයෙන් යෙදීම පෞරාණික ව්‍යවහාරය යි. එලෙසින් ගත් කල්හි එහි ක්‍රියාව ද එකවචන විය යුතුයි. 8 වාක්‍යයෙහි "මිනිස්සු" යන ප්‍රකෘති කර්තෘ බහුවන යි, එබැවින් එහි ක්‍රියාව ද බහුවචන විය යුතුයි. 9 වාක්‍යයෙහි ද "සිත්" යන්න අප්‍රාණිවාචක බැවින් එකත්වයෙන් සලකනු ලැබේ. 10, 11, 12, 13 වාක්‍යයන්හි "කෙනෙක්" යන්න බහුවචන වශයෙන් ව්‍යවහාර ප්‍රාප්ත යි. එබැවින් එය එකවචන වශයෙන් යෙදීම සදෝසි. තවත් මෙලෙසින් ඇතිවිය හැකි දෝෂයෝ බොහෝ වෙත්, භාෂානුසාරයෙන් දත යුතු යි. තවත් විභක්ත්‍යන්ත කිරීමේදී වරදවා ව්‍යවහාරකරණ

පදයෝ ද බොහෝ වෙත්. "ධර්‍මතාව" යනාදිය "ධර්‍මතාවය" යනාදිවශයෙන් ද "රටවල" යනාදිය "රටවල්වල" යනාදි වශයෙන් ද සමහරු ලියති කියති. ඒ සදොස් ව්‍යවහාර යි.

# ක්‍රියාකාරකපදසම්බන්‍ධාධිකාරය

## නිමි.

---

## අලඞ්කාරකාණ්ඩය.

"සදරුත්විදි සියල්" යනාදි සූත්‍රසම්බන්‍ධයෙන් කරණලද්දාවූ වියරණවිදි පිළිබඳ අනුශාසනය "සන්අදියර" ආදි අදියර දශයෙකින් සමාප්ත විය. එයින් පද්‍යබන්‍ධනාදියට වුවමනා වියරණවිදි දතහැකි වේ. එහෙත් පද්‍යබන්‍ධනය කරන්නවුන් විසින් දතයුතු වූ තවත් ගණවිභාගාදි බොහෝ ලක්‍ෂණයෝ ඇත්තාහ. මෙහි ඉන් ස්වල්පයකුදු පවසනුවස් "ඉති වියරණ දූන" යනාදිය කීහු.

a. ඉති වියරණ දූන- කිවියර පදී බඳනා,
ඉටු නිටු ගණ අකුරු ඈ- ලකුණු විමසා බඳනේ.

a. භා—සිදතෙහි අනුශාසනය කළ පරිද්දෙන් වියරණවිදි දූන පද්‍යබන්‍ධනය කරන්නාවූ කාව්‍යකාර තෙමේ ඉෂ්ටානිෂ්ටගණ අක්‍ෂරයොනි ආදි ලක්‍ෂණයන් විමසා දූන පද්‍යබන්‍ධනය කරන්නේ ය.

වි—පද්‍යවිෂයෙහි වූ ගණඅක්‍ෂරාදිය ඉෂ්ට වීමෙන් කාව්‍යකර්තෘට හා කාව්‍යනායකයාහට ඉෂ්ටවිපාක ලැබෙන බැව් ද, අනිෂ්ට වීමෙන් අනිෂ්ට විපාක ලැබෙන බැව් ද කවිසම්මත යි. එබැවින් කිවියර විසින් ඒ විභාගයන් දූන පද්‍යබන්‍ධනාදිය කටයුතු යි. එහි පළමු කොට ඉෂ්ටානිෂ්ටගණවිභාගය පවසන්නාහු "සියලු පටන්" යනාදිය කීහු.

---

## ඉටු නිටු ගණ.

a. සියලු පටන් මැද අවසන වන ගල නා
එ මනබයජරසත ගන නම්නට ග නා
දියොද සෙනා ලෙඩ දල සෝමර වැස නා
පටනබිදන් පසැ සිටුවා කල කොමෙ නා

d. තිසකුරු ගෙණෙක් නම්. නිමෙස් කල් මත්. උසුරු විමෙහි එක්මත් ඇතියේ ලුහු නම්. දෙමත් ඇතියේ ද හලින් පෙරටු ද ගුරු නම්. ගත් අඩමත් ඇතියේ. ඇජ්ඈ මතකින් වැඩියෙන් මත්වැඩි නම්.

c. 1 ම-සෙත් වේවා
2 න-තොපට
3 බ-වේ සුබ
4 ය-තිලෝනා
5 ජ-මඩෝර
6 ර-බාරුසි
7 ස-නරසි
8 ත-සජ්දූහි

a. භා — ගණය මුලුල්ල ම ගුරු වූ කල්හි මගණ නම් ද, ලඝු වූ කල්හි නගණ නම් ද, මූලකුර පමණක් ගුරු වූ කල්හි බගණ නම් ද, ලඝු වූ කල්හි යගණ නම් ද, මැදකුර පමණක් ගුරු වූ කල්හි ජගණ නම් ද, ලඝුවූ කල්හි රගණ නම් ද, අගකුර පමණක් ගුරුවූ කල්හි සගණ නම් ද, ලඝු වූ කල්හි තගණ නම් ද වේ. මේ ගණ අට පිළිවෙළින් "දිය ඔද සෙත් ආයු ලෙඩ දළසෝ මර වැසන" යන අෂ්ටවිපාකයන් දෙන සුලු වේ. පද්‍යයාගේ ආදි යෙහි ද කාව්‍යනායකයාගේ නම දෙපසෙහි ද මේ ගණයන් යෙදී මෙන් ඒ ඒ විපාකයෝ ලැබෙත්. මේ ගණයන් පිරිසිදින පිළිවෙළ පවසන්නාහු "තියකුරු" යනාදිය කීහු.

b. භා — මෙහි ගණයක ප්‍රමාණය අකුරු තුණෙකැ යි කීහු. ඒ ගණභෙදය වනාහි ගුරු ලඝු භෙදයෙන් ඇතිවන බැවිනුත්, ගුරුලඝුභෙදය, මාත්‍රාභෙදයෙන් ඇතිවන බැවිනුත්, දෙවනුව මාත්‍රාප්‍රමාණය කීහු එනම්-ඇසිපිය හෙළන පමණවූ කාල විශෙෂය මාත්‍රාවෙකි. උච්චාරණයෙහි එබඳු මාත්‍රා එකක් ඇති වර්ණය ලඝු නම් වේ. එබඳු මාත්‍රා දෙකක් ඇති වර්ණය ද, මාත්‍රා දෙකක් නැතත් හල් කුරකින් පෙරටු වූ වර්ණය ද ගුරු නම් වේ. හුදකලා හල් කුරෙහි ප්‍රමාණය මාත්‍රාර්ධයෙකි. එබැවින් හුදකලා හල්කුර ලඝුවෙක් ද නොවේ. "ඇප්" ආදිතන්හි 'ඇ' යන්න අයන්නට මාත්‍රාවක්නොව මාත්‍රාංශයක් වැඩීමෙන් ඇතිවන වර්ණයක් බැවින් ගුරෙක් නොවේ. ගුරුලඝු නියමය මෙලෙසින් දත යුතු යි.

c. ඉක්බිති ඒ ඒ ගණයන්හි ගුරුලඝු යෙදෙන පිළිවෙළ නිදසුන්වලින් පවසන්නාහු. "ම- සෙත් වේවා" යනාදිය කීහු. "සෙත් වේවා"යන අකුරු තුණ මගණයට නිදර්ශන යි. "තොපට" යන අකුරු තුණ නගණයට නිදර්ශන යි. යනාදි වශයෙන් දත යුතු යි. සැමතන්හි ම හලින් පෙරටු වූ අකුර ඒ හල්කුරත් සමග එක් ගුරක් හැටියට ගණු ලැබේ. දීර්ඝාක්ෂරය ද ගුරු යි. හුදකලා හ්‍රස්වාක්ෂරය ලඝු යි. ගුරට "⌣" මේ ලකුණ ද, ලඝුවට '–' මේ ලකුණ ද ව්‍යවහාර කරණු ලැබේ. මෙලෙසින් ගණ ගුරුලඝුවින්‍යාස නිදර්ශන ඉෂ්ටානිෂ්ට විපාක දෙවතා යන සියල්ල ම මෙහි දක්වන පිළිවෙළින් දත යුතු යි.

## අෂ්ටගණ වින්‍යාසය.

### ඉටුගණ.

| ගණ. | ගුරුලඝුවින්‍යාසය. | | | | නිදර්ශන | විපාක | දෙවතා |
|---|---|---|---|---|---|---|---|
| 1 ම– | සියලු ගුරු | ⌣ | ⌣ | ⌣ | සෙත්වේවා | දිය | භූමි |
| 2 න– | ,, ලුහු | – | – | – | තොපට | ඔද | දෙව |
| 3 බ– | පටන් ගුරු | ⌣ | – | – | වේසුබ | සෙත් | චන්‍ද්‍ර |
| 4 ය– | ,, ලුහු | – | ⌣ | ⌣ | තිලෝනා | ආයු | ජල |

### අනිටුගණ.

| ගණ. | ගුරුලඝුවින්‍යාසය. | | | | නිදර්ශන | විපාක | දෙවතා |
|---|---|---|---|---|---|---|---|
| 5 ජ– | මැද ගුරු | – | ⌣ | – | මඩෝර | ලෙඩ | සූර්‍ය්‍ය |
| 6 ර– | ” ලුහු | ⌣ | – | ⌣ | බාරුසී | දළසෝ | අග්නි |
| 7 ස– | අවසන ගුරු | – | – | ⌣ | නරසී | මර | වායු |
| 8 ත– | ,, ලුහු | ⌣ | ⌣ | – | සප්දැහි | වැසන | ආකාශ |

වි—මේ අටගණය යි කියනුලබන්නේ ‘මධ්‍යා’ නම් ඡන්‍දසෙහි හෙවත් අකුරුතුණේ ඡන්‍දසෙහි වෘත්ත සඛ්‍යාව යි. වෘත්තය කියන්නේ ඒ ඒ ඡන්‍දසුන්ගේ උච්චාරණයෙහි ගුර.ලඝුවශයෙන් පවත්නා උච්චාරණභෙදය යි. එක් අකුරෙක් ගුරුලඝුභෙදයෙන් දෙවිදියෙකින් ද, අකුරු දෙකෙක් සතර විදියෙකින් ද, අකුරු තුණෙක් අටවිදියෙකින් ද, අකුරු සතරෙක් සොළොස් විදයෙකින් ද උච්චාරණය කටහැකි වේ. මේ ආදිවශයෙන් උච්චාරණ භෙදය දතයුතුයි ඒ භෙදයෝ ඒ ඒ ඡන්‍දසුන්ගේ වෘත්තයෝ වෙත්. එනම් එකාක්‍ෂර ඡන්‍දසෙහි වෘත්ත 2 යි. ද්‍ව්‍යක්‍ෂරඡන්‍දසෙහි වෘත්ත 4 යි. ත්‍ර්‍යක්‍ෂර ඡන්‍දසෙහි වෘත්ත 8 යි. චතුරක්‍ෂර ඡන්‍දසෙහි වෘත්ත !6 යි. යනාදි වශයෙනි.

“අ” යන්න ලඝුභාවයෙන් ‘අ’ කියා ද, ගුරුභාවයෙන් ‘ආ” කියා ද උසුරුවිය හැකි වේ. එසේම ‘අ’ දෙකක් “ආ ආ” කියා ද, “අ ආ” කියා ද, “ආ අ” කියා ද, “අ අ” කියා ද උච්චාරණය කට හැකි වේ. ඒ පිළිවෙළින් අකුරු තුණෙක් අටවිදියකින් උච්චාරණය කට හැකි වේ. ඒ උච්චාරණ භෙදාෂ්ටකය අටගණ යයි කීහු. ඒ ගණ අට මෙහි ප්‍රස්තාරක්‍රමයෙන් වින්‍යස කරණු ලැබේ. ප්‍රස්තාර කිරීමේදී ඒ ඒ ඡන්‍දසුන්ගේ ගුරුවෘත්තය මුලින් තබා ලඝු වෘත්තය තෙක් මේ පිළිවෙළින් වින්‍යාස කටයුතු යි.

---

### ත්‍ර්‍යක්‍ෂර ඡන්‍දසෙහි ප්‍රස්තාරය.

| උච්චාරණය. | ගුරුලඝුවින්‍යාසය. | | | ගණනාම. | විපාක. |
|---|---|---|---|---|---|
| ආ ආ ආ | ⌣ | ⌣ | ⌣ | ම | ඉෂ්ට |
| අ ආ ආ | – | ⌣ | ⌣ | ය | ඉෂ්ට |
| ආ අ ආ | | – | ⌣ | ර | අනිෂ්ට |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| අ අ ආ | – | – | ‿ | | ස | ,, |
| ආ ආ අ | ‿ | ‿ | – | | ත | ,, |
| අ ආ අ | – | ‿ | – | | ජ | ,, |
| ආ අ අ | ‿ | – | – | | බ | ඉෂ්ට |
| අ අ අ | – | – | – | | න | ඉෂ්ට |

මේ ශාස්ත්‍රයෙහි ත්‍ර්‍යක්ෂර ඡන්දසින් ම ගණව්‍යවහාරය කිරීමටත්, ඊට ගණය යි ව්‍යවහාර කිරීමටත්, ඒ ගණ අතුරෙන් කොටසක් ඉෂ්ට වීමට හා කොටසක් අනිෂ්ට වීමටත් හේතුව කවරේදැයි විමසිය යුතු යි. මේ ශාස්ත්‍රය වනාහි ශබ්දෝච්චාරණ භේදය මුල් කොට ඇති ශාස්ත්‍ර විශේෂයෙකි. වර්ණසමූහයක් හෙවත් ශබ්ද සමූහයක් උච්චාරණය කිරීමේදී ඔවුන් තුණ තුණ පිරිසිඳීමට එක් හේතුවෙක් නම්– උසුරුවනු ලබන වර්ණයන්ගේ හෝ ශබ්දයන්ගේ පරම්පරාව උත්පත්ති ස්ථිති භඞ්ග කියා හෝ, ආරම්භ මධ්‍ය අවසාන කියා හෝ තුණ තුණ පිරිසිඳීමය යි සිතිය හැකි වේ එක් හේතුවෙක් නම්– ත්‍රිසඞ්ඛ්‍යාව ක්‍රියාරම්භාදියෙහි බොහෝසේ ව්‍යවහාර කිරීම යයි ද සිතිය හැකි වේ. එහෙයින් මේ ශාස්ත්‍රය සැපයීමෙහි ලා ත්‍ර්‍යක්ෂර ඡන්දස ගන්නාලද්දේ ය. එයින් වෘත්තයන් ගිණීම කරණු ලබන බැවින් ගණය යි කියනු ලැබේ. ඒ ගණයන්ගෙන් කොටසක් ඉෂ්ට වීමටත් කොටසක් අනිෂ්ට වීමටත් හේතුව ශබ්දසංයෝග බලය යි. ද්‍රව්‍යසංයෝග බලයෙන් නානාවිධ ඉෂ්ටානිෂ්ට විපාක ලැබෙන බැව් ලෝකප්‍රසිද්ධ යි. ශබ්ද සංයෝගබලයෙනුදු එසේ ඉෂ්ටානිෂ්ට විපාක ලැබෙන බැව් සැලකිය යුතු යි.

මෙසේ මේ ගණ විභාගය දැන පද්‍යයාගේ ආදියෙහි ද නාමයක් යොදන පද්‍යයක් වුවොත් ඒ නාමයාගේ දෙපසෙහි ද ඉෂ්ට ගණයන් යෙදීම කටයුතු යි. පද්‍යය මුලුල්ල ම ඉෂ්ටගණයන්ගෙන් යුක්ත වුවොත් ඒ පද්‍යය අතිශයින් ම ඉෂ්ටඵලදැයි වේ. එසේ හෙයින් ශාස්ත්‍රඥයෝ මේ ගණයන්ගේ මිත්‍රාමිත්‍රතාදිය හා ඔවුන් යෙදීමෙන් ඇතිවිය හැකි ඵල විපාකාදිය ද දැක්වූහ.

එහි මගණ නගණ දෙක මිත්‍රගණය යි ද, බගණ යගණ දෙක දාසගණය යි ද කියනු ලැබේ. එහි පද්‍යාදියෙහි මිත්‍රගණයෙන් පරව මිත්‍රගණ යෙදීමෙන් ධනලාභය ද, මිත්‍රගණයෙන් පරව දාසගණ යෙදීමෙන් අභිවෘද්ධිය ද වේ. දාසගණයෙන් පරව මිත්‍රගණ යෙදීමෙන් ධෛර්‍යලාභය ද, දාසගණයෙන් පරව දාසගණ යෙදීමෙන් අධික ගුණය ද වේ. මේ ගණ යෙදීම් ආදිය පිළිබඳ විශේෂාවබෝධය පිණිස මෙහි නිදර්ශනයක් දක්වන්නෙමු.

1 "සැරද සුලකළ කුරු
2 මියුරු තෙපලෙන් රඳනා
3 රජකුල රහසැ මැතිනිය
4 සියතිහි සැළලිහිණිසඳ".

මේ පද්‍යයෙහි 1 පෙදෙහි නගණ තුනෙකි. 2 පෙදෙහි නගණ එකක් හා සගණ දෙකෙකි. 3 පෙදෙහි නගණ තුණක් හා ලඝු දෙකෙකි. 4 වෙනි පෙදෙහි ද එසේ යි. මෙහි ආදි ගණය නගණ යයි; එහෙයින් ඉෂ්ට යි. "සැළලිහිණි" යන නාමයාගේ ආදිපාර්ශ්වයේ සිටියේ ද නගණයෙකි. එනම්–'යතිහි' යනු යි. හෙද ඉෂ්ට යි. මේ පද්‍යය නගණ බහුලත්වයෙන් යුක්ත බැවින් මෙහි මිත්‍රගණයෙන් පරව මිත්‍රගණ යෙදීම බොහෝ සෙයින් සිද්ධ යි. එබැවින් මේ පද්‍යය අතිශයින් ම ඉෂ්ටඵලදායි වේ. ගණයන් පිළිබඳ විපාක පවසන්නා වූ ඡන්දශ්ශාස්ත්‍රඥයෝ:—

"මො භූමිස්ත්‍රිගුරුඃ ශ්‍රියං දිශති යො වෘද්ධිං ජලං චාදිලො
රොගග්නිර්මධ්‍යලඝුර්විනාශමනිලො දෙශාටනං සොන්ත්‍යගඃ,
තො ව්‍යොමාන්තලඝුර්ධනාපහරණං ජොග්නෞ රුජං මධ්‍යගො
භශ්චෙන්ද්‍රො යශ උජ්ජ්වලං මුඛගුරුර්නො නාක ආයුස්ත්‍රිලඃ"

යනු කීහු. ම යන්න භූමිගණ යි, ගුරුතුණක් ඇත්තේ ය. එයින් ලැබෙන විපාකය සම්පත්ති දායක යි. ය යන්න ජලගණ යි. ආදිලඝු යි. විපාකය වෘද්ධිදායක යි. ර යන්න ගිනිගණ යි. මධ්‍ය ලඝු යි. විපාකය විනාශදායක යි. ස යන්න වායුගණ යි. අන්ත ගුරු යි. විපාකය දේශාටනය යි. ත යන්න ආකාශගණ යි. අන්ත ලඝු යි. විපාකය ධනවිනාශය යි. ජ යන්න සූර්‍ය්‍යගණ යි. මධ්‍ය ගුරු යි. විපාකය රෝගදායක යි. භ යන්න චන්ද්‍රගණ යි. ආදි ගුරු යි. විපාකය කීර්ත්ති දායක යි. න යන්න දෙවගණ යි. ත්‍රි ලඝු යි. විපාකය ආයුදායක යි. ගණවිභාගය මෙලෙසින් සාමාන්‍යයෙන් දත යුතු යි.

---

ඉටු නිටු වණ.

2 ඒක යමරජ අණනළ අං අවාකා ර
උපබගහා නරනමිතිරි වේ අමර ර
සුරකර පෙරපසැ වැඩ දේ අවාකා ර
නසා සුබ සිසල් නරකුරු මැදුම් ස ර

ඉති ඉටු නිටුවණ.

---

2. භා—ඉෂ්ටානිෂ්ට වර්ණවිභාගය මෙකියන පරිද්දෙන් දත යුතු යි.

අපාශාක්ෂර– "එ ඒ ක ය ම ර ජ අ ආ ණ න ළ අං" 13 යි. අනිෂ්ටයි.
මනුෂ්‍යාක්ෂර "උ ඌ ප බ ග හ" 6 යි. ඉෂ්ටයි.
දෙවාක්ෂර "ඉ ඊ ඔ ඕ ට ඛ ත ද ල ව ස" 11 යි. අනිෂ්ටයි.

වි—යථොක්ත ගණ යෙදීම මෙන් මේ වර්‍ණයන්ගේ යෙදීම ද පද්‍යයාගේ මුල හා නාමපාර්‍ශ්වයෙහි ද කටයුතු යි. "සැරද" යනාදි පද්‍යයෙහි මුලකුර සයන්ත යි. ඒ දෙවාක්‍ෂරයෙකි, එබැවින් අනිෂ්ට යි. නාමයේ පෙරපස වර්‍ණය හයන්ත යි. ඒ මනුෂ්‍යාක්‍ෂර යි. එබැවින් හෙද ඉෂ්ට යි. පරපස වර්‍ණය සයන්ත යි. හේ අනිෂ්ට යි. එසිනුදු ඒ පද්‍යය ඉෂ්ට ඵලදයි වේ. තවද වර්‍ණයෙකින් ලැබෙන විපාකය ගණයෙකින් ලැබෙන විපාකයට වඩා අල්පතර වේ. අකුරු තුණක සම්බන්ධය වඩා බලසම්පන්න විය හැකි බැවිනි.

---

ඉටු නිටු යොන්.

3 අබතල ඇ වග වණ සිටි පිළිවෙළි නා।
සොඳ නකුල් මියු මහවත් වග සපු නා।
තුරඟ බිලිපුටු සරඟන් දූන කෙමෙ නා।
පෙර පස යොන් බඳු නම යෝනට සොබ නා।

ඉති ඉටු නිටු යොන්.

---

3. නා—"අබතල" ආදිවර්‍ගයෙහි වර්‍ණයන් සිටි පිළිවෙළින් "නකුල් මියු මහවත් වග සප් තුරඟ බිලිපුටු සරඟ" යන මේ සත්ත්වයොනීන් ඒ වර්‍ණයන් හා යුක්ත කොට අවිරුඬ යොනී බලා නාමයොනියට ශොභන වූ වර්‍ණ පද්‍යයාගේ ආදියෙහි හා නාමය දෙපස ද යෙදිය යුතු යි.

වි—මෙහි "අබතල ඇ වග" යන්නෙන් "අ ආදි වර්‍ගය, බආදි වර්‍ගය, ත ආදි වර්‍ගය, ල ආදි වර්‍ගය" කියා වර්‍ග සතරෙක් ගණු ලැබේ. එහි "අ ආ ඉ ඊ උ ඌ එ ඒ" යන අට අආදි වර්‍ගය යි. "බ ඕ ක ග ජ ට ඩ ණ" යන මේ අට ,බආදිවර්‍ගය යි. "ත ද න ප බ ම ය ර" යන අට තආදිවර්‍ගය යි. "ල ව ස හ ළ අං" යන මේ සය ලආදිවර්‍ගය යි. අටකොන් චක්‍රයෙක්හි කොන් අටෙහි පළමු වරට පිළිවෙළින් අආදි වර්‍ගයෙහි වර්‍ණ අට ද, ඊලඟට බ ආදි වර්‍ගයෙහි අට ද, ඊලඟට තආදි වර්‍ගයෙහි අට ද, පසුව ල ආදි වර්‍ගයෙහි වර්‍ණ සය ද යෙදිය යුතු යි. එහිදු පළමු කෝණය පටන් පිළිවෙළින් නකුල් ආදිය යෙදිය යුතු යි. එහි පිළිවෙළ මේ චක්‍රයෙන් බලා ගතයුතු යි.

## අඹතල චක්‍රය.




මේ ශාස්ත්‍රනියමයෙහි ලා මෙහි 1 වන කොණයෙහි වර්ණ සතර නකුලාක්‍ෂර යි. නකුල් නම් මුගටි යි. 5 වන කොණයෙහි වර්ණ නාගාක්‍ෂර යි. එබැවින් මේ දෙකොටස අන්‍යොන්‍ය විරුද්ධවර්ණ යයි සැලකිය යුතු යි. නකුලයන් හා නාගයන් මෙනි. 2 වැන්න 6 වැන්න යනාදිය ද එලෙසින් දත යුතු යි. එහි 2 වැන්න මහිෂාක්‍ෂර නම් ද, 6 වැන්න අශ්වාක්‍ෂර නම් ද, 3 වැන්න උලූකාක්‍ෂර නම් ද, 7 වැන්න කාකාක්‍ෂර නම් ද,4 වැන්න ව්‍යාඝ්‍රාක්‍ෂර නම් ද,8 වැන්න මෘගාක්‍ෂර නම් ද වේ. ඔවුහු ද අන්‍යොන්‍ය විරුද්ධය යි සැලකිය යුතු යි.

යම් පද්‍යාදියෙක්හි යමෙකුගේ නාමයක් යොදතහොත් එහි ආදි වර්ණය හා නම දෙපස වර්ණය නාමයොනියට හෙවත් නාමයේ මූලකුරට අවිරුද්ධ වූ වර්ණ මේ චක්‍රයෙන් බලා යෙදිය යුතු යි. "සැරද" යනාදි පද්‍යයෙහි නාමය "සැළලිහිණි" යනු යි. පද්‍යයෙහි මූලකුර ද සයන්න යි. එබැවින් ඒ මූලකුර නාමයොනිය වූ සයන්නට අවිරුද්ධ වේ. නාමයට ආදි පාර්ශ්වයේ වර්ණය හයන්න යි. හෙ ද නාමයොනියට අවිරුද්ධ වේ. අපරපාර්ශ්වයේ වර්ණයද ස යන්න යි. හෙද නාමයොනියට අවිරුද්ධ වේ. මෙහි ඒ ඒ නාමයන්ගේ මූලකුර නාමයොනිය යි සැලකිය යුතු යි. **දීනකතත් ආදියටසම වූ අක්‍ෂරයක් මුල් කොට නම් තැබීම ප්‍රාචීනයන් අතරපවත්නා සිරිතෙකි, ඒ අක්‍ෂරය නාමයොනිය යි.**

## කාව්‍යදෝෂ.

### 1 පදිදුබාදෙස්.

1 පදිදුබා මැද-සසඳ සඳ සමස් පස්,
විබත් කරණු විදෙද්-නොරිසික් රුසි විසි දක්.

1. භා—පාදසතරෙකින් යුත් කව් සිලෝ ආදිය පද්‍ය නම් වේ. එබඳු පද්‍යයක්හුගේ දෙවනපාදයෙහි අග හා තුන්වන පාදයෙහි මුල එකතු කොට සන්ධි සමාස ප්‍රත්‍යය විභක්ති කිරීම පඬිදනෝ රුචි නොකෙරෙත්. එබැවින් එසේ කිරීම කාව්‍යදෝෂයෙකි.

වි—පද්‍යයෙක් පාද සතරෙකින් යුක්ත වේ. ඒ පද්‍යයන්ගේ උච්චාරණය ගද්‍යයන්ගේ උච්චාරණය වැනි නොවේ. ඒ ඒ පද්‍යවිශෙෂයෝ වෘත්තවශයෙන් උච්චාරණය කටයුතු වෙත්. එසේ උච්චාරණය කරණ කල්හිදු පාදවසානයන්හි නැවැත්ම ද ඇතිවිය යුතු සි.එබැවින් සියලු පද්‍යයන්ගේ ම පාදන්තයෙහි යතිය ඇතිවිය යුතු සි. එහෙත් උච්චාරණයෙහිදී ප්‍රථම පාදවසානය හා තෘතීය පාදවසානය ඉතා සියුම් නැවතීමෙකින් යුක්ත විය යුතු සි. ඇතැම්විට ඒ අවසානයේදී නැවතුම්පලක් බැව් අඟවා ඒ උච්චාරණ ව්‍යාපාරයෙන් ම දෙවන පෙදෙහි හෝ සතරවනපෙදෙහි මුල ඬැහැ ගත හැකි වේ. එබැවින් පලමුවනපෙදෙහි අග හා දෙවන පෙදෙහි මුල ද, තෙවන පෙදෙහි අග හා සතරවන පෙදෙහි මුල ද එකතු කොට සන්ධිආදිය කිරීම දෝෂයෙක් නොවේ. පද්‍යයාගේ ත්‍විතීයපාදවසානය වනාහි විශෙෂ විශ්‍රාමස්ථානයෙකි. හෙවත් උච්චාරණ ව්‍යාපාරය නවත්වා සිටිය යුතු තැනෙකි. එබැවින් ඒ ත්‍විතීය පාදවසානය සන්ධිසමාසාදියෙන් තෘතීයපාදය හා සම්බන්ධ කල හොත් එසේ නවත්වා සිටින්නට නොහැකි වේ. එහෙයින් පද්‍යයාගේ විභාගමධ්‍යයෙහි සන්ධි ආදිය කිරීම සදෝෂත්වයෙන් නිදීෂ්ට සි.

### 2 පුනරුක් දෙස්.

2 අතින් පෙදෙන් හොත-පවසන පුන වියුවා,
පුනරුක් අරුත් ඒ දනු-ශල සද ද පුනරුක් සේ.

2. භා—එක් වාක්‍යයක් විෂයෙහි කියූ අර්ථය හෝ පදය නැවත කීම පුනරුක්ත දෝෂ නම් වේ. පදය ම පමණක් නොව ශබ්දය වුවත් නැවත කීම පුනරුක්ත සේ සැලකිය යුතු සි.

වි—පුනරුත් යන්නෙහි අර්ථය නැවත කියන ලද්ද හෝ නැවත කීම යනු යි. එක් වාක්‍යයක් විෂයෙහි කියනලද අර්ථයෙක් හෝ පදයෙක් නැවත කියේ නම් ඒ සදොස් වේ. එසේ කීම උම්මත්තකාලාපයක් සමාන බැවිනි. අර්ථපුනරුක්තිය සැමතන්හි ම සදොස් වේ. පදපුනරුක්තිය වනාහි අනුප්‍රාසයමකාදි ශබ්දාලඞ්කාර විෂයෙහි ද විත්ත කොට කියයුතු ශොකාදියෙහි ද වූයේ නිදොස් වේ. ඒ උත්කෘෂ්ට ගුණත්වයෙන් නිර්දිෂ්ට යි. ඒ සඳහා සාහිත්‍යසාර යෙහි "පතත්ප්‍රකර්ෂමුක්ෂිප්තානුප්‍රාසයමකාදිකම්" යි කීහු. මේ දොෂ යෙන් හරිණලද්දා වූ අනුප්‍රාසයමකාදිය නැවත පතනයවන්නේ නම් ඒ උත්කර්ෂගුණයෙක් වේ යනු එහි අර්ථයි.

තවද මේ පුනරුක්තිදොෂය මේ ගීයෙහි කීපරිද්දෙන් "අර්ථ පුනරුක්ති පදපුනරුක්ති ශබ්දපුනරුක්ති" වශයෙන් තෙපරිදි යයි ඇතමුන්ට සිතිය හැකි වේ. එහෙත් මේ දොෂය දෙපරිදි මුත් තෙපරිදි නොවේ. මේ දොෂය වනාහි ඇතැම් සංස්කෘත අලඞ්කාර ග්‍රන්ථයන්හි "පදපුනරුක්ති අර්ථපුනරුක්ති" යන නාමවයෙන් ද, ඇතැම් අලඞ්කාරග්‍රන්ථයන්හි "ශබ්දපුනරුක්ති, අර්ථපුනරුක්ති" යන නාමවයෙන් ද ව්‍යවහාර කරණලද්දේ ය.

සරසවතීකණ්ඨාභරණයෙහි:-

"පදං පදාර්ථවාභිනෙනෟ යත්‍ර තත්පුනරුක්තිමත්"

යනු කීහු. යම් වාක්‍යයෙක්හි (නැවත කියනලද්දාවූ) පදය හෝ පදාර්ථය (අර්ථවශයෙන්) අභිධාන නම් ඒ පුනරුක්ති ඇත්තේ වේ යනු එහි අර්ථ යි.

කාව්‍යාදර්ශයෙහි:-

"අවිශෙෂෙණ පූර්වොක්තං යදි භූයොපි කීර්ත්‍යතෙ,
අර්ථතඃ ශබ්දතො වාපි තදෙකාර්ථං මතං යථා"

යනු කීහු. පූර්වයෙහි කියනලද්ද විශෙෂාර්ථ රහිතව අර්ථවශ යෙන් හෝ ශබ්දවශයෙන් නැවත නැවත පවසනු ලැබේ නම් ඒ ඒකාර්ථදොෂ යයි දන්නාලදී යනු එහි අර්ථ යි. මෙයින් අඟවන අදහස නම් පදපුනරුක්ති ශබ්දපුනරුක්ති යන ව්‍යවහාරවයෙන් එකක් ගතයුතු බව යි. එබැවින් ඒ ව්‍යවහාරවයට අනුව මෙහි "පෙදෙන්" යි කියා නැවත "යළි සදද පුනරුත් සේ" යනු කීහු. පද ශබ්ද යන ව්‍යවහාරවයෙහිදු ස්වල්පමාත්‍ර විශෙෂයක් ඇති බැවින් මෙහි මෙසේ පවසන ලද්දේ යයි ද හැයේ. බොහෝ තන්හි විභක්ත්‍යන්ත නුවූයේ ශබ්ද යයි ද ව්‍යවහාර කරණු ලැබේ.

පදවශයෙන් වුවත් ශබ්දවශයෙන් වුවත් කියනලද්ද නැවත කියේ නම් ඒ එක් පුනරුක්තියෙකැයි දත යුතු යි. පුනරුක්තිදෙෂයට නිදසුන් දක්වන්නාහු "වණනට" යනාදිය කිහු.

ෂ වණනට මෙ දලද-දල දෙනුයෙ දලද නම්,
සොවිනොබල තුනු තුනුවග-සිහු කොළෙනග කරැනිගා.

ෂ. භා—මෙහි "දලද" යන්න 'දල' යන කර්මය උපපද කොට ඇති 'දා' ධාතුවෙන් සිඩ යි. "දල දෙනුයෙ"යන තන්හි ද්‍ 'දල' යන කර්මය හා දා ධාතුක අර්ථ ක්‍රියාපදයෙක් වේ. එබැවින් මේ දෙක ශබ්දවශයෙන් වෙනස් වුව ද අර්ථවශයෙන් එකක් සේ සැලකිය හැකි වේ. "දලද දලද" යන දෙක පදවශයෙන් හා අර්ථවශයෙන් ද එකක් සේ සැලකිය හැකි වේ. මේ මෙසේ වුව ද අභින්නාර්ථ වුවොත් පමණක් පුනරුක් දෙස් යයි සංස්කෘත අලඞ්කාර ශාස්ත්‍රඥයන්ගේ කිම බැවින් භින්නාර්ථත්වයෙන් ගතහැකි වුවොත් නිදෙස් වේ. මේ නිදර්ශනය එකාර්ථත්වයෙන් හා භින්නාර්ථත්වයෙන් ද සැලකිය හැකි වේ.'දල'ශබ්දය ජලවාචක ද අග්නිවාචක ද වේ.එබැවින් "මෙදලද, මේ ජලදයක තෙමේ හෙවත් මේ මේඝය තෙමේ; වණනට, විරහිණීන්ට; දලදෙනුයේ, දාහදනය කරණුයේ; දලද නම්, දාහදයක් නම් වේ. මේඝය ජලදයක වුවත් විරහිණීන්ට දාහදනය කරණ හෙයින් දාහදයක නම් වේ යන භාවය යි. මෙසේ අර්ථ ගත්කල්හි එකාර්ථ නොවේ. මෙදලද, මේ ජලදයක තෙමේ; දල දෙනුයේ, ජලය දෙන්නේ; දලදා නම්; ජලදයක නම් වේ; කියා අර්ථ ගත්කල්හි එකාර්ථ වේ. එකල්හි පුනරුක් දෙසින් දූෂිත යි.

දෙවන පාදයෙහි අර්ථය-අනඞ්ගතෙමේ ශොකයෙන් දුර්වලවූ තන්වඞ්ගියගේ ශරීරය නිග්‍රහ කොට කෘශ කෙළේ ය යනුයි. මෙහි "තුනුවග" යන්නෙන් කෘශ ශරිර ඇත්තියක් ප්‍රකාශ වේ; කෘශ ශරිර ඇත්තියක් කෘශ කෙළේය යි කීමෙන් කියනලද අර්ථය නැවත කියේ වේ. එහෙත් "තිගා සිඟුකෙළෙ"යි කීමෙන් එහි භින්නාර්ථත්වයෙක් ද ගත හැකි වේ. අතිශයින් කෘශ කෙළේය යන අර්ථය හැඟෙන බැවිනි. "තුනු, තුනුවග" යන තන්හි "තුනු" යන්න ශබ්දවශයෙන් මුත් පද වශයෙන් නොගැණේ. එබැවින් ශබ්දපුනරුක්ති යි. මෙහි ශබ්දවය භින්නාර්ථ යි. පූර්ව 'තුනු' ශබ්දය ශරීරවාචක ද, අනෙක කෘශවාචක ද වේ.

තවද ඇතැම් අලඞ්කාරශාස්ත්‍රඥයන් අර්ථපුනරුක්තිය පමණක් සදෙෂත්වයෙන් සැලකූ බැව් පෙණේ. සාහිත්‍යාගාරයෙහි:—

“පුනරුක්තඃ පදාර්ථො වා වාක්‍යාර්ථො වා විරුක්තිමාන්”

යනු කීහු. නැවත කියනලද්දවූ පදාර්ථය හෝ වාක්‍යාර්ථය විරුක්තිදෝෂ ඇත්තේ ය, යනු එහි අර්ථ යි. මෙයින් නැවත කියනලද අර්ථය පමණක් පුනරුක් බැව් සූචිත යි. මීට නිදසුන් දක්වන්නාහු:—

“මෘගාක්ෂි තව නෙත්‍රෙ තු හරිණ්‍යා ඉව සුන්දරෙ,
රාධෙ විහර කෘෂ්ණෙන කෘෂ්ණ සංරස රාධයා”

යනු කීහු. මෘගාක්ෂිය තීගේ නෙත්දෙක මෘගධෙනුවකගේ මෙන් සොඳුරු ය. මේ මෙහි ප්‍රථමාර්ධයෙහි අර්ථ යි. මෙහි “මෘගාක්ෂි” යන සම්බොධනපදයෙන් ගම්‍යමාන වූ කාන්තාවගේ මෘගනෙත්‍ර සමානත්වය “හරිණ්‍යා ඉව” යන පදවයෙන් කියවෙන බැවින් පදාර්ථ පුනරුක්ති යි. ශ්ලෝකයාගේ විතීයාර්ධයෙහි අර්ථය නම්-ශ්‍රී කාන්තාව ඔබ කෘෂ්ණ සමග වාසය කරන්න. කෘෂ්ණ ඔබ ශ්‍රී කාන්තාව සමග කාමාස්වාදනය කරන්න, යනු යි. මෙහි පූර්ව වාක්‍යයෙහි අර්ථයම අපරවාක්‍යයෙන් කියවෙන බැවින් වාක්‍යාර්ථ පුනරුක්ති යි.

---

## 3 විරුදු අරුත් දෙස්.

**3 පදසසගින් හොත-බෙදුමෙන් හොත අතින් හෝ,**
**හුණා නිමු ගැමි අරුත්-එවිරුදු අරුත් දෙස් නම්.**

3. භා—පදසංසර්ගයෙන් හෙවත් පද ගැළපී ඇසීමෙන් හෝ පදහෙදයෙන් හෙවත් පද බිඳීඇසීමෙන් හෝ අර්ථයෙන් හෝ පදාදිය විෂයෙහි අශිෂ්ට වූ හෝ ග්‍රාම්‍ය වූ අර්ථයෙක් ඇසේ නම් ඒ පදාදිය විරුද්ධාර්ථදෝෂ දූෂිත යි.

වි—පදාදිය උච්චාරණය කරණ කල්හි ශිෂ්ටයන් විසින් අශිෂ්ට වශයෙන් හෝ ග්‍රාම්‍යවශයෙන් පිළිකුල් කටයුතු අර්ථ ඇසේ නම් ඒ විරුද්ධාර්ථදෝෂ යි. ඒ අශිෂ්ටත්වය හෝ ග්‍රාම්‍යත්වය වනාහි පදාදියෙහි යොදනලද ඇතැම් පදයන් එකතුව ඇසීමෙන් හෝ ඇතැම් පදවලින් බිඳී ඇසීමෙන් හෝ යොදනලද හුදකලා පදාර්ථයාගේ අයොග්‍යත්වයෙන් හෝ ඇති වේ.

සංස්කෘතඅලඞ්කාර ග්‍රන්ථයන්හි මෙලෙසින් කියනලද විරුද්ධාර්ථදෝෂයෙක් නොපෙණේ. කාව්‍යාදර්ශයෙහි-

“පදසන්ධානවෘත්ත්‍යා වා වාක්‍යාර්ථත්වෙන වා පුනඃ,
දුෂ්ප්‍රතීතිකරං ග්‍රාම්‍යං යථා යා භවතඃ ප්‍රියා.”

යනුවෙන් පදයන් එකතු ව පැවැත්මෙන් හෝ වාක්‍යාර්ථයෙන් හෝ දුෂ්ටාර්ථාවබෝධයක් ඇති කෙරේ නම් ඒ ග්‍රාම්‍ය දෝෂය යි කීහු. "යා භවතඃ ප්‍රියා" යනු ඊට නිදර්ශන යි. මෙහි "යා" යන පදය හා "භවතඃ" යන පදය එකතු ව ඇසීමෙන් අශිෂ්ටාර්ථාව බෝධයෙක් ලැබේ. එනම් "යාභවතඃ" යි "යභ-මෛථුනේ" යන ධාතුවෙන් සිඬ වූ පදයක් මෙන් ඇසේ.

ග්‍රාම්‍යලක්ෂණ දක්වන්නා වූ ඇතැම් ආලඞ්කාරිකයෝ මීට වෙනස් වූ ලක්ෂණ ද දක්වූහ. සාහිත්‍යසාරයෙහි-

"ලෝකමාත්‍රප්‍රසිතං ග්‍රාම්‍යං ප්‍රුල්ලගල්ලාසි වල්ලභෙ"

යනු කිහු. සාමාන්‍ය ලෝකයා අතර ප්‍රවර්ත්ත ව්‍යවහාරය ග්‍රාම්‍ය නම් වේ යනු එහි අර්ථ යි. "ප්‍රුල්ලගල්ලාසි" යනාදිය ඊට නිදර්ශන යි. ප්‍රිය කාන්තාව තී පිපුනු කොපුල් ඇත්තීය. යනු එහි අර්ථ යි. එසේ කීම ග්‍රාම්‍ය යි.

සිඬාන්ත සඞ්ග්‍රහයෙහි "විරුද්ධ අරුත් දෙස්" යන් නමින් දක්වනලද දෝෂය ලක්ෂ්‍යලක්ෂණභාව යුක්ත බැවින් මෙහි ලා ඒ ගතයුතු යි. වක්තෘහට අදහස් වූ අර්ථයට විරුඬ වූ අර්ථයක් ඇසීමෙන් පැවසෙන අර්ථය විරුඬාර්ථ නම් වේ. එයින් වූ දෝෂය විරුඬාර්ථ දෝෂ යි. යනු සිදතෙහි කී ලක්ෂණයෙහි තාත්පර්යාර්ථ යයි. තල්ලක්ෂ්‍යය දක්වන්නාහු "දිවිරඟ" යනාදිය කීහු.

෧. දිවිරඟ විසකුණන්-තොප කිත් තිළිය නස්නට,
සොමිගුණ බමව ගිමි නිති-දසදෙසන සොඳ හැනිසේ

෧. භා—"ස්වාමිය විචක්ෂණයන්ගේ ජිහ්වා නමැති රඞ්ගයෙහි යුෂ්මත්හුගේ කීර්ති නමැති නාටිකාව විසින් නැටීමට සෞම්‍ය ගුණය කුන්දකුසුම වනයක් මෙන් දශදිශාන්තයෙහි නිරන්තරයෙන් පතුරුවනු මැනව" යනු වක්තෘහුගේ අදහස යි. එහෙත් මේ පද්‍යයෙන් ඊට විරුඬාර්ථයෙක් ද ඇසේ. එසේ ඇසෙන්නේ පදසංසර්ගාදියෙනි. ඒ මෙසේ යි. මෙහි "දිවි රඟ විසකුණන්" යන පදයන් එක්තන්හි ලා යෙදීමෙන් හා "විසකුණන්" යන්න "වි-සකු-නන්" යි බෙදී ඇසීමෙන් ද, එසේම "කිත් තිළිය නස්නට" යන පදයන් එක්තන්හි ලා යෙදීමෙන් හා "කිත්ති-ලිය-නස්නට" යි බෙදී ඇසීමෙන් ද අශිෂ්ට වූ ද ග්‍රාම්‍ය වූ ද අර්ථයෙක් ඇසේ. එනම් එසේ වූ කල්හි "දිවිරඟ වි සකු, නන් තොප කිත්ති ලිය නස්නට" යි ශ්‍රූයමාණ වාක්‍යයෙක් වේදේ. "නන් කිත්ති (යුත්) තොප දිවිරඟ ලිය නස්නට සකු වි" යනු එහි පදසම්බන්ධය යි. මෙහි "දිවිරඟ" යන්නෙන් ජීවමානත්‍වය යන අර්ථය ද, "සකු වි" යන දෙකෙන් සමර්ථ වී යන අර්ථය ද හැඟේ. "නස්නට" යන්න හුදකලාව ම අනිෂ්ටාර්ථ යි. නැසීමට යන අර්ථයක් ඇති බැවිනි.

ගීයෙහි චිතීයාර්ථයෙහි "සොම්ගුණ බමව" යන අර්ථය ද අතිෂ්ටත්ව යෙන් හැඟේ. සෞම්‍යගුණය භ්‍රමණය කිරීම සෞම්‍යගුණය පෙරළීමක් මෙන් හැඟෙන බැවිනි.

---

## 4 උපිළිවෙළ දෙස්.

a. පෙර පිළිවෙළ ශෙදි-පසුපෙදෙ ඉකුත් වි නම්,
ඵ උපිළිවෙළ නම් දෙස්-පැවසූ පදි පඬුවෝ.

b. සිඟහ පිශනම වූ-ගිරිඳු සිරි විසිනට,
කසුන් කලඅඳේ මේ වන්-දෙවිශෝ සෙනෙළවත්වා.

a. භා—පද්‍යාදියෙහි පූර්වපක්ෂයෙහි යෙදූ පිළිවෙළ අපරපක්ෂයෙහි ඉක්ම වී නම් ඒ උපිළිවෙළ දෙස් නම් වේ.

වි—පද්‍යාදීන්ගේ පූර්වපක්ෂයෙහි යම් කිසි පදසම්බන්ධයක් යොදා ඉක්බිති ඒ පදයන් හා අන්‍යෝන්‍ය සම්බන්ධය ඇති පදයන් යොදන කල්හි පූර්වපක්ෂය හා සම්බන්ධය ඇති පිළිවෙළින් යෙදිය යුතු යි. එසේ නොයෙදීමෙන් ඒ පද්‍යාදිය උපිළිවෙළ දෙසින් දූෂිත වේ. ඒ උපිළිවෙළ ලකුණු පවසනු වස් "සිගහ" යනාදිය කීහු.

b. භා—"පාර්තී ශ්‍රීකාන්තා සරස්වතී" යන කාන්තාවන් තුන්දෙනාගේ නිරන්තර ප්‍රියවල්ලභ වූ "බ්‍රහ්ම ඊශ්වර විෂ්ණු" යන දෙවිවරු තුන්දෙන ශාන්තිදනය කෙරෙත්වා යනු මෙහි අර්ථයි. මෙහි පාර්තියගේ වල්ලභයා ඊශ්වර තෙමේ ද, ශ්‍රීකාන්තා වගේ වල්ලභයා විෂ්ණු තෙමේ ද, සරස්වතියගේ වල්ලභයා බ්‍රහ්ම තෙමේ ද වේ. එබැවින් මෙහි පෙරපසෙහි යෙදූ පිළිවෙළ අපරපසෙහි නොමැත්තේ යි; එසේ හෙයින් මේ පද්‍යය උපිළිවෙළ දෙසින් දූෂිත යි. අපරපක්ෂයෙහි "කලඅඳේ මේ කසුන් වන්"යි යෙදී නම් යථොක්ත දෝෂයෙන් විරහිත වේ.

වි—මෙහි "උපිළිවෙළ" යන්නෙහි අර්ථය පිළිවෙළට විරුඬය යනු යි. "පිළිවෙළ" යන්න "පටිපාටි" යන්නෙන් හෝ "පරිපාටි" යන්නෙන් බිඳුනේ වේ. "ක්‍රම" ශබ්දය ද "පරිපාටි" යන්නට පර්‍යාය වේ. එබැවින් සංස්කෘත අලඞ්කාර ග්‍රන්ථයන්හි මේ දෝෂය "අක්‍රම, අපක්‍රම, භින්නප්‍රක්‍රම, ක්‍රමභ්‍රෂ්ට" යන නාමයන් ගෙන් ව්‍යවහෘත යි. සරස්වතීකණ්ඨාභරණයෙහි මේ දෝෂය ක්‍රම භ්‍රෂ්ටත්වයෙන් ව්‍යවහෘත යි. එහි ඒ දෙවැදෑරුම් කොට කීහු. "ක්‍රම භ්‍රෂ්ටං ද්විධාර්ථීඃ ශාබ්දො වා යත්‍ර න ක්‍රමඃ" යනාදි වශයෙනි. මෙයින් ක්‍රමභ්‍රෂ්ටත්ව දෙකෙක් උද්දිෂ්ට යි. ඉන් එකෙක් අර්ථයෙන් වූ ක්‍රමභ්‍රෂ්ටත්වය යි; අනෙක ශබ්දයෙන් වූ ක්‍රමභ්‍රෂ්ටත්වය යි. එහි උද්දෙශ ප්‍රතිනිර්දේශයන්හි උද්දෙශක්‍රමයෙන් ප්‍රතිනිර්දේශය කට

යුතු සි. එසේ නොකිරීම අර්ථයෙන් වූ ක්‍රමභ්‍රෂ්ට යයි. මේ දෝෂයෙන් අර්ථවිරෝධය ද වේ. පද්‍යාදියෙහි ශබ්දයොජනය ද ඒ ඒ ශබ්දයන්ගෙන් වාච්‍යවූවන්ගේ ගරුභාවය සලකා කටයුතු සි. එසේ නොයෙදුව හොත් ශාබ්දක්‍රමභ්‍රෂ්ටය සි. ඒ සඳහා සාහිත්‍යසාරයෙහි "යදූර්ධ්වං යත් පදං යොග්‍යං තතොන්‍යත්‍ර තදක්‍රමම්" යනුවෙන් අක්‍රමදෝෂ යයි කීහු. යමකට මුලින් යෙදියයුතු යම් පදයෙක් අගින් යෙදුයේ නම් අක්‍රමදෝෂ නම් වේ යනු එහි අර්ථ සි.

"තුරඞ්ගමථ මාතඞ්ගං ප්‍රයච්ඡාස්මෙ මදාලසම්,
කාන්තිප්‍රතාපෞ භවතඃ සූර්‍ය්‍යාචන්ද්‍රමසොඃ සමෞ"

යන ශ්ලොකය මේ දෙවිදියට ම නිදසුන් වේ. මොහුට මදාලසවූ අශ්වයකුදු ඇතකුදු දෙව; භවත්හුගේ කාන්ති ප්‍රතාප දෙක සූර්‍ය්‍යචන්ද්‍ර දෙදෙනාට සම වේ. යනු එහි අර්ථ සි. මෙහි "මාතඞ්ග" ශබ්දය 'තුරඞ්ග' ශබ්දයට මුලින් යෙදිය යුතු වේ. එසේ නොයෙදූ බැවින් ශබ්ද පිළිබඳ ක්‍රමභ්‍රෂ්ටය සි. මෙහි දෙවන පාදයෙහි වූ කාන්ත්‍යර්ථය චන්ද්‍රයා කෙරෙහි ද ප්‍රතාපාර්ථය සූර්‍ය්‍යයා කෙරෙහි ද ඇති බැවින් "චන්ද්‍ර" ශබ්දය මුලිනුත් 'සූර්‍ය්‍ය' ශබ්දය අගිනුත් යෙදීම ක්‍රම යයි එසේ නොයෙදීමෙන් අර්ථය පිළිබඳ ක්‍රමභ්‍රෂ්ටය විය. සිදතෙහි නිදසුන ද මීට සම වේ.

---

## 5 නේදෙස්.

**a. ලේවන් සමුදුරෙන්-උලැගිසෙ වරහ දෙරණන,**
**විඹයුතු බැවින් මුහුසුන්-සප්ලේ මෙ වේ නේදෙස්.**

යම් පද්‍යාදියෙක්හි වක්තෘහු විසින් අදහස් කළ අර්ථය එහි ප්‍රකට නොවීමෙන් අන්‍යයන් විසින් පමුණුවාගතයුතු වුවොත් ඒ පද්‍යාදිය නෙයාර්ථ දෝෂ දූෂිත වේ. අර්ථව්‍යක්තිය හෙවත් අර්ථය ප්‍රකටත්වයෙන් සම්පූර්ණ කොට කීම කාව්‍යයක් පිළිබඳ දශප්‍රාණයෙන් එකෙකි. එසේ නොකිමෙන් මේ දෝෂය ඇති වේ.

a. භා—මේ පද්‍යයේ ප්‍රථමපාදය නෙයදෝෂයට උදහරණ සි. වරාහකයා විසින් රුධිරවර්ණසමුද්‍රයෙන් පොළොව උදුරණ ලද් දේය යනු එහි අර්ථ සි. එහෙත් මෙහි වක්තෘහුගේ අදහස වරාහකරූප වූ විෂ්ණු විසින් කුරවලින් සුන් කරණලද නාගයන්ගේ රුධිරයෙන් ලේවන් වූ මුහුදෙන් පොළොව උඬරණය කරණලදී. යනු සි. ඒ අර්ථය මෙහි පමුණුවා ගතයුතු බැවින් නෙයාර්ථදෝෂ සි. පද්‍යයාගේ විතීයාර්ධයෙන් ඒ බැව් ප්‍රකාශිත සි. "මූලොච්ඡින්න වූ සර්පරුධිරය කියයුතු බැවින් මේ නේදෙස් නම් වේ" යනු එහි අර්ථ සි.

සාහිත්‍යදර්පණයෙහි නෙයාර්ථදෝෂයට නිදසුන් දක්වන්නාහු "උද්ධූතකමලලෞහිත්‍යෛර්වක්‍රාභිර්භූෂිතා තනුඃ" යි කීහු. මේ පද්‍යාර්ථයෙහි ලා වක්තෘහු විසින් අදහස් කළ අර්ථය නම්-විශේෂයෙන් බබලන්නා වූ පද්මරාග මාණික්‍යයන් කරණ කොට ගෙණ වාමාවන් විසින් හෙවත් අධම ස්ත්‍රීන් විසින් ශරීරය සරසන ලද්දේය යනු යි. එහෙත් මෙහි "කමලලෞහිත්‍ය" ශබ්දයෙන් අදහස් කළ පද්මරාගාර්ථයත් "වක්‍රා" ශබ්දයෙන් අදහස් කළ වාමාස්ත්‍රී අර්ථයත් ලාක්ෂණිකවශයෙන් පමුණුවා ගතයුතු වේ. මෙබඳු යෙදුම් නෙයාර්ථදෝෂ යුක්ත යි.

---

## 6 අසබහව්දෙස්.

a· එනට දිෂ දේවා-රිවි රා උරා සට මැණ,
නොපැලැඟිසොලෙනැසුරු-එමෙ දෙස් අසබහව් නම්.

a. භා—පද්‍යාදියෙහි ස්ථානෝචිත නුවූ හෙවත් තැනට සුදුසු නුවූ වර්ණනාව හෝ පද යෙදීම දෝෂයෙකි. මෙහි ඊට අසබහව් දෙස් යයි කීහු. මේ ගීයේ ප්‍රථමාර්ධය ඊට නිදසුන් වේ. "රාහු නමැති සපියාහට කණ්ඨමාණික්‍යයක් බඳු වූ සූර්ය්‍යී තෙමේ ඒ යුෂ්මත්හට ජයදනය කෙරේවා" යනු එහි අර්ථ යි. මෙයින් වාච්‍ය වූයේ තැනට සුදුසු නුවූ වර්ණනාවෙකි. මෙහි සූර්ය්‍යියාගෙන් ජය ඉල්වීමෙහි ලා ඔහුට කළ වර්ණනාව රාහුග්‍රස්ත සූර්ය්‍යියා යනු යි. ඒ වර්ණනාව ස්ථානෝචිත නොවේ. රාහුග්‍රස්තසූර්ය්‍යියාහට ජයදනය නොකට හැකි බැවිනි. ගීයෙහි විතීයාර්ධයෙන් පැවසූයේ පූර්වාර්ධයෙහි කළ වර්ණනාව ඒ ආශ්‍රයට අනුචිතවූවක් කළ හෙයින් අසම්භාව්‍යදෝෂ වන බව යි.

වි—සංස්කෘත අලඞ්කාර ග්‍රන්ථයන්හි මේ දෝෂය අනුචිතාර්ථ දෝෂ යන නාමයෙන් කීහු. 'මෙහි කී "අසබහව්" යන්න "අසම්භාව්‍ය" ශබ්දයෙන් බිඳුනේ වේ. "අසම්භාව්‍ය" යන්න ද "අනුචිත" යන්නට පර්යාය වේ. අනුචිතාර්ථදෝෂයට නිදසුන් දක්වන්නාහු: "ශූරා අමරතාං යාන්ති පශුභූතා රණාධ්වරෙ" යනු කීහු. වීරයෝ සඞ්ග්‍රාමයඥයෙහි පශුස්වරූපවූවෝ හෙවත් ඡේද්‍යස්වරූපවූවෝ දෙව්බවට පැමිණෙත් යනු එහි අර්ථ යි. මෙහි "පශු" යන පදයෙන් සතුතියට සුදුසු වූ ශූරයන්ගේ කාතර භාවය හෙවත් අධීරභාවය පැවසූ බැවින් ඒ අනුචිත වේ. මෙලෙසින් තැනට නුසුදුසු වූ පද යෙදීමෙන් මේ දෝෂය ලැබේ.

## 7 ගුළුඅරුත්දෙස්.

**අ. දෙව් බරඩ අඩනෙත්-පස්විසිවා රකන තා,**
**නැසුනතැ අරුත් ඇතිසෙන්-මේ දනු ගුළු අරුත්දෙස්.**

අ. භා —ගූඪ වූ අර්ථ හෙවත් සැඟවුනාවූ අර්ථ ඇති වීමෙන් වූ දෝෂය ගුළුඅරුත්දෙස් (ගූඪාර්ථදෝෂ) නම් වේ. මේ ගීයෙහි ප්‍රථමාර්ධය ගූඪාර්ථදෝෂයට නිදර්ශන යි. "තිනෙත්" (ඊශ්වර) දෙවි තෙමේ ශතවර්ෂයක් තා රක්‍ෂා කෙරේවා. යනු එහි අර්ථ යි. මෙහි අන්තඃප්‍රච්ඡන්න වූ අර්ථ ඇති හෙයින් මේ ගුළුඅරුත්දෙස් නම් වේ. යනු ද්විතීයාර්ධයෙහි අර්ථ යි.

වි—මෙහි "තිනෙත්"යි කියයුත්ත "බරඩඅඩනෙත්" කියා ද "සියවා"යි කියයුත්ත "පස්විසිවා" කියා ද යොදනලද්දේ ය. එහි "බර" යන්න දොළොසට නම්. බරෙන් අඩ සය යි, එයින් අඩ තුණ යි. එසේ ගත්කල්හි "බරඩඅඩනෙත්" යන්නෙහි අර්ථය "තිනෙත්" යනු යි. එබැවින් එහි අර්ථය අන්තඃප්‍රච්ඡන්නවූයේ හෙවත් ගූඪවූයේ වේ. පසින් ගුණකරණලද විස්ස පස්විසි නම්වේ. එකල්හි "පස්විසිවා" යන්නෙහි අර්ථය සියක්වස් යනු යි. එබැවින් එහි අර්ථය ද ගූඪවූයේ වේ.

තවද සංස්කෘත අලඞ්කාරග්‍රන්ථයන්හි මෙබඳු යෙදුම් අපුෂ්ටාර්ථ දෝෂයුක්තය යි කිහු. ඒ දක්වන්නා වූ සාහිත්‍යසාරකාරයෝ:-

"අපුෂ්ටාර්ථං තු තච්ඡේදයං-ප්‍රකෘතානුපයෝගි යත්,
විංශත්‍යර්ධාබ්ධිවක්ත්‍රෝ මාං-විෂ්ණයෙනෝ නිරක්‍ෂතු"

යනු කිහු. යම් පදයෙක් වර්ණිතාකටයුත්තෙහි විශෙෂ උපකාර යක් පිණිස නොපවතී නම් ඒ අපුෂ්ටාර්ථදෝෂ යි මෙහි "පඤ්චවක්ත්‍රඃ"යි කියයුත්ත "විංශත්‍යර්ධාබ්ධිවක්ත්‍රඃ"යි කියනලදී. විස්සෙන් අඩකින් අබක් වක්ත්‍ර ඇත්තේ යනු එහි අර්ථ යි. මේ පදකිපයක් යෙදීමෙන් වර්ණිතයෙහි විශෙෂාර්ථයෙක් නොලැබේ. ඊශ්වර තෙමේ පඤ්චවක්ත්‍රාමයන්ගෙන් මා රකිවා යනු අපරාර්ධයෙහි අර්ථ යි.

"සරස්වතී කණ්ඨාභරණයෙහි "යත්‍ර තුච්ඡාභිධෙයං ස්‍යාද පුෂ්ටාර්ථං තදුච්‍යතෙ" යනුවෙන් යමෙක් තුච්ඡ වූ වාක්‍යාර්ථ ඇත්තේ නම් ඒ අපුෂ්ටාර්ථ යයි කියනු ලැබේ යනු කිහු.

සංස්කෘතඅලඞ්කාරග්‍රන්ථයන්හි ගූඪාර්ථදෝෂය යි ලකුණු කරණලද්දේ අනෙකෙකි. ඒ "ප්‍රයුක්තමප්‍රසිද්ධාර්ථං ගූඪාර්ථං පරිකීර්ත්‍යතෙ" යනාදිවශයෙන් නිදිෂ්ට යි. ප්‍රසිද්ධාර්ථ අප්‍රසිද්ධාර්ථ දෙක්හි වූ යම්පදයෙක් අප්‍රසිද්ධාර්ථයෙහි යොදනලද්දේ නම් ඒ ගූඪාර්ථ යයි කියනු ලැබේ. යනු එහි අර්ථ යි.

8 බුන්ලිඟු-බස් දෙස් හා උසාව හිසුවම් දෙස්.

a. **සිසි සේහසක මෙන්-විමලඹරය තලන් මෙන්,**
**රිවි එව් කාදේ සොබනේ-නහ එව බෙලෙ හිමිගෙරෙන්.**

b. **බුන්ලිඟුබස මෙසේ-උසාව හිසුවම් මහදෙස්,**
**විමසා කව් කරණුයේ-සබමැද යස බජනුයේ.**

c. **මේ ඈ සුණු වරා-පොරණැදුරන් දැන පදි,**
**මත්සඳ එලි ද යවහන්-සමසේ යොදා බඳනේ.**

a. භා—මෙහි දෙෂ සතරෙක් නිදීෂ්ට සි. එනම්-භින්නලිඞ්ග දෙෂ, භින්නවචනදෙෂ, උත්කෘෂ්ටොපමාදෙෂ, නීචොපමාදෙෂ" යන සතර සි. උපමා උපමෙය සම්බන්ධයෙහි උපමාපදයාගේ ලිඞ්ගය උපමෙය පදයෙන් අනෙකෙක් වී නම් ඒ භින්නලිඞ්ගදෙෂ සි. මෙහි "සේහසක" යනු උපමා සි. ඒ ස්ත්‍රීලිඞ්ග සි. "සිසි" යනු උපමෙය සි. හේ පුංලිඞ්ග සි. උපමාපදයාගේ වචනය උපමෙය පදයෙන් අනෙකෙක් වී නම් ඒ භින්නවචන දෙෂ සි. මෙහි "තලන්" යනු උපමා සි. හේ බහුවචන සි. "විමලඹරය" යනු උපමෙය සි. හේ එකවචන සි. උපමාපදය උපමෙය පදයට නොසම වූ උසස් අර්ථයක් පවසන පදයක් වුවොත් ඒ උත්කෘෂ්ටොපමා දෙෂය සි. මෙහි "රිවි" යනු උපමා සි. ඒ උත්කෘෂ්ට වේ. "කාදේ" යනු උපමෙය සි, ඒ නීච සි. උපමාපදය උපමෙයපදයට නොසම වූ නීචාර්ථයක් පවසන පදයක් වුවොත් ඒ නීචොපමාදෙෂ සි. මෙහි "නහ" යනු උපමා සි, හේ නීච සි. "බෙලෙ" යනු උපමෙය සි, හේ ඊට වඩා උත්කෘෂ්ට සි. චන්ද්‍රයා ශ්වෙතහංසධෙනුවක් වැනි වේ. නිර්මල වූ ආකාශය තඩාගයක් වැනි වේ. කතමැදිරියා හිරුමෙන් සොබනේ වේ. මෙහෙකරු තෙමේ ස්වාමියා කෙරෙහි ගෞරවයෙන් ශුනකයෙකු වැනි වේ. යනු ගීයෙහි අර්ථ සි.

b. භා—මේ කියන ලද්දා වූ භින්නලිඞ්ග භින්නවචනදෙෂ හා උත්කෘෂ්ටොපමා නීචොපමා දෙෂ ද පූර්වොක්ත දෙෂ ද යන මේ මහා දෙෂයන් විමසා බලා කවි කරණ තැනැත්තේ සභා මධ්‍යයෙහි කීර්තිය භජනය කරන්නේ ය.

c. භා—මේ ආදි වූ දෙෂයන් නිවාරණය කොට පුරාණ ආචාර්ය වරයන්ගේ පද්‍යයන් දැන මාත්‍රා විභාග ඡන්දස් විභාග එලි යවහන් යන වොවුන් සමවන පරිද්දෙන් පද්‍යබන්ධනය කරන්නේ ය.

වි—මෙහි කියනලද මේ දෙෂයෝ අනුක්‍රමයෙන් නිදීෂ්ට සි. දෙෂයෝ මෙපමණෙකුදු නොවෙති. කාව්‍යවිෂයෙන් බැහැර කට යුතු වූ තවත් බොහෝ දෙෂයෝ ඇත්තාහ. ඒ දෙෂ සංස්කෘත

අලඞ්කාරශාස්ත්‍රයෙන් දතයුතු සි. මේ බොහෝ දොෂයන්ගේ ගුණපක්ෂයකුදු ඇත්තේ වේ. හෙවත් නිදෙස් විදිද ඇත්තේ වේ. ඒ පිළිබඳ විශෙෂවිභාගයෝ ද බොහෝ වෙත්. ඔවුහු ද සංස්කෘතාලඞ්කාරයන්ගෙන් ම දතයුතු සි. සාමාන්‍යයෙන් මේ දොෂ පණ්ඩිතයන්ට ජුගුප්සාජනක නොවනසේ යෙදුව හොත් නිදෙස් වේ.

මේ හැර මාත්‍රාවිභාග ඡන්දෙවිභාග දෙක ද පද්‍ය බන්ධන විෂයෙහි දතයුතු වේ. එහි මාත්‍රාවිභාග නම් ඒ ඒ වෘත්ත විශෙෂයන් පිළිබඳ මාත්‍රානියමය සි. ඡන්දෙවිභාගය නම් වෘත්තයන් පිළිබඳ වූ අක්ෂරනියමය සි. ඒ විභාගවය ඡන්දශ්ශාස්ත්‍රයෙන් දතයුතු සි. සිංහල පද්‍යවිෂයෙහි "එළි යවහන්" යන ලකුණු දෙකෙකුදු ඇත්තේ වේ. එහි එලි නම් විරාමය සි. එනම් කවිය පිළිබඳ පදසතරෙහි අවසාන අකුරු සතර සි. ඒ අකුරු සතර සම කොට යෙදීම පද්‍යවිශෙෂයක් පිළිබඳ නියමයෙකි. හෙද සිංහළ කවි සමයෙහි වූ එක්වර්ණාලඞ්කාර ලක්ෂණයෙකි. සංස්කෘතාදියෙහි ද ඇතැම් යමකාදි වර්ණාලඞ්කාරයන්හි මේ ලක්ෂණය යෙදේ. ඒ මේ වර්ණසමත්වය පද්‍යයන්ගේ මධ්‍යයෙහි ද කරණු ලැබේ. එහෙත් අවසානයෙහි වර්ණ සතර සම කිරීම විශෙෂ නියමයෙකි. ඊට එලිසම කිරීමය යි කියනු ලැබේ.

වර්ණාලඞ්කාර බන්ධනය වනාහි ඇසීමෙන් හා දැකීමෙන් ද ප්‍රිය උපදවන අලඞ්කාර විශෙෂයෙකි. එබැවින් දන්තජ 'න' යන්න මූර්ධජ 'ණ' යන්න කොට ද, මූර්ධජ 'ණ' යන්න දන්තජ 'න' යන්න කොට ද දන්තජ 'ල' යන්න මූර්ධජ 'ළ' යන්න කොට ද, මූර්ධජ 'ළ' යන්න දන්තජ 'ල' යන්න කොට ද සම කිරීම නිදෙස් වේ. එසේ සම කොට යොදනලද සිංහල පද්‍යයෝ අප්‍රමාණ වෙත්.

| | | |
|---|---|---|
| 1 | අතුපතර කපම් | න |
| | මොර කන්නවුන් විලසි | න |
| | ඇන්නෑයෙන් කර | න |
| | නසා රට තොට නුපයත් ද | න |
| 2 | නුවන් කණුපුල් ලෙ | ළ |
| | දසනග කිරණ මිණි වැ | ළ |
| | තුනුරන්ලිය උදු | ළ |
| | මෙ තොප ඇදිසේ සිතමි සත තු | ළ |

යනාදි වශයෙනි. 1 වන කවෙහි තෙවෙනි පදයෙහි "කරණ" යන තන්හි ණයන්න සෙසු පදයන්ගේ අවසානයෙහි වූ නයන් නට සමකළ බැවි ද, 2 වන කවෙහි සිවුවෙනි පෙදෙහි "තුළ යන

තන්හි "ළ" යන්න සෙසු පදයන්හි 'ල' යන්නට සමකළ බැව් ද දතයුතු යි. මෙහි "සියලු පටන්" යනාදි කවෙහි "අටගණා" යන තන්හි ණයන්ත දන්තජ කිරීමෙන් "අටගනා"යි සෙසු පාදාන්ත යන්හා සම කරණ ලද්දේ ය. සංස්කෘතවර්ණාලඞ්කාර විෂයෙහි මීට වඩා නොසම වූ වර්ණ ද සමකොට යොදා තිබේ. එය මෙහි 174 වන පිට බලා දතයුතු යි.

පද්‍යයන්ගේ පාදාන්තවර්ණයන් "ය ව හ න්" යන මේ වර්ණයෙකින් සම කොට යෙදුව හොත් ඒ දෝෂයෙකි. ඊට යවහන් දෙස් යයි කියනු ලැබේ. පාදාන්තය මේ 'ය' ආදි වර්ණයෙකින් සම කරණවිට ඒ වර්ණයාගේ ආදියෙහි වූ වර්ණය ද සතර පෙදෙහි හෝ සම කොට යොදත් හොත් ඒ දෝෂය භඞ්ග වේ. දෙපෙදෙක්හි එසේ යෙදීමෙන් ද ඒ දෝෂය භඞ්ගවේය යි සමහරු කියති.

ග නේ මිණි බැබලි කිරණෙව් සත — පා ය
ර නේ යටග සැවුලිඳු දද ගළ — පා ය
අ නේ ලකළ කළ පුර අප නර — පා ය
පෙනේ දකුණෑ මහසෙන් දෙව් රද — පා ය

අහිරික අනොත — ප ය
පවට විළි නැති නොබ — නු ය
නොසන්හුන් සිත — නු ය
දනුව උදහස් නමැයි සැබ — ව ය

යකාරාදියෙන් එලිසම කිරීමේ තත්ත්වයත්, එසේ කිරීම සදෙස් බවත්, මෙලෙස යෙදීමෙන් ඒ දෝෂය භඞ්ග වන බවත් මෙයින් දත හැකි වේ. භාෂාවශයෙන් 'ය' යන්න 'යැ' යන්න වීමෙන් ද මේ දෝෂය භඞ්ග වේ. එබැවින් මේ පිළිබඳව විශෙෂවර්ණනයක් කිරීම වුවමනා නොවේ.

"අපාර්ථං ව්‍යර්ථමෙකාර්ථං සසංශයමපක්‍රමම්,
ශබ්දහීනං යතිභ්‍රෂ්ටං භින්නවෘත්තං විසන්ධිකම්.

දෙශකාලකලාලොකන්‍යායාගම විරොධි ච,
ඉති දෝෂා දශෛවෛතෙ වර්ජ්‍යාඃ කාව්‍යෙෂු සූරිභිඃ".

යනුවෙන් '1. අපාර්ථ 2. ව්‍යර්ථ 3. එකාර්ථ 4. සසංශය 5. අපක්‍රම 6 ශබ්දහීන 7. යතිභ්‍රෂ්ට 8. භින්නවෘත්ත 9. විසන්ධික 10. දෙශාදිවිරොධ"යි කාව්‍යවිෂයෙහි හළයුතු වූ දශදොෂ කෙනෙක් නිර්දිෂ්ට යි.

1. එහි උම්මත්තකවචනයන් වැනි වූ අන්‍යොන්‍ය සම්බන්ධ රහිත අර්ථයන් යෙදීම අපාර්ථ දොෂ යි.

2. පරස්පරවිරුද්ධ අර්ථයන් යෙදීම ව්‍යර්ථ දෝෂ යි. "සියලු සතුන්ට මෛත්‍රිය කරණ තමුන්නාන්සේ සතුරන් නෂ්ට කරණු මැනවි" යනාදිවශයෙනි. මෙහි සියලු සතුන්ට මෛත්‍රිය කරන්නකුට සතුරන් නෂ්ට කරණු මැනවැයි කීම පරස්පරවිරුද්ධ යි.

3. ඒකාර්ථදෝෂ නම් පූර්වෝක්ත පුනරුක්ත දෝෂය යි.

4. නිශ්චය පිණිස කියනලද්දේ සැකයට කරුණු වේ නම් ඒ සසංශය දෝෂ යි. "නියවත් දෙනෝ සෙරෙන් පත ගුණහුන්නන්ට වස දේ" යන වාක්‍යයෙහි අභිමතාර්ථය ඥානවත් ජනයා කලකින් පැමිණියා වූ ගුණවතුන්ට ජලය දේ" යනු යි. එහෙත් "ඥානවත් ජනයා කලකින් පැමිණි ගුණශූන්‍යයන්ට විෂ දේ" යන අර්ථය ද ගතහැකි බැවින් එසේ දේ යි සැක කට හැකි වේ. එබැවින් මෙබඳු යෙදුම් සංශයදෝෂ යුක්ත යි.

5. අපක්‍රමදෝෂය මෙහි පූර්වෝක්ත යි.

6. ව්‍යාකරණරීතිවලට අනුගත නුවූ එහෙයින් ම අඥයන්ට මුත් ප්‍රාඥයන්ට අභිමත නුවූ ශබ්දයන් යෙදීම ශබ්දහීන හෙවත් අපශබ්දදෝෂ යි.

7. ඡන්දශ්ශාස්ත්‍රයෙහි ඒ ඒ වෘත්තභේදයන්හි යතිනියමයෙක් ඇත්තේ වේ. ඒ නියමිත ස්ථානයන්හි පදච්ඡේද කටහැකි පරිද්දෙන් පද්‍යබන්ධනය කටයුතු යි. එබඳු තන්හි පදච්ඡේද නොකට හැකි වුවොත් ඒ යතිභ්‍රෂ්ට දෝෂ යි.

යොන්මත්වැල නම් වෘත්තයෙහි පාදයක් මාත්‍රාදෙළොසෙකින් යුක්ත විය යුතු යි. එහි මාත්‍රා සයෙන් සයට යති නියමය යි. "රුදි අදතින් දිගුනුවනී"ය යු ඒ වෘත්තයෙහි එක් පාදයෙකි. මෙබඳු පාද සතරෙකින් පද්‍යය පිරේ. මෙහි "රුදිඅදතින්" යන තන්හි මාත්‍රා සයෙකි. ඒ සයෙන් පදච්ඡේද කට හැකි වේ. යමෙකු මේ වෘත්තයේ එක්පාදයෙක් "පිරිසිදුදහමේ රිසියෙන්" යි කරණු ලැබේ නම් යතිභ්‍රෂ්ටදෝෂයෙන් යුක්ත වේ. මෙහි "පිරිසිදුදහ" යන්නෙන් මාත්‍රා සය පිරේ. ඒ සයෙන් පදච්ඡේද නොවන බැවින් යති භ්‍රෂ්ට යි.

8. ඒ ඒ වෘත්තයන්හි නියමිත මාත්‍රාවර්ණාදිය අඩුවැඩිවීමෙන් භින්නවෘත්තදෝෂය යෙදේ.

9. පද්‍යවිෂයෙහි සන්ධි කටයුතු තැන් විසන්ධි කොට යෙදීමෙන් වූ දෝෂය විසන්ධි දෝෂ නම් වේ. එහෙත් සිංහල පද්‍යවිෂයෙහි විසන්ධි කොට යෙදීම කවීන්ට රිසි වූ බැවින් ඒ දෝෂය නොලැබේ.

10. දෙශවිරොධ, කාලවිරොධ, කලාවිරොධ, ලොකවිරොධ න්‍යායවිරොධ,ආගමවිරොධ වශයෙන් විරොධිදොෂය සවැදෑරුම් වේ.

එහි යම් පෙදෙසෙක්හි නැති දේ එහි ඇති ලෙස කියත් හොත් ඒ දෙශ විරොධ යි. යම්කාලයෙක්හි නැති දේ ඒ කාලයෙහි ඇතිලෙස කියත් හොත් ඒ කාලවිරොධ යි. නෘත්‍යගීතාදි චතුඃෂෂ්ටි කලාවෝ කලා නම් වෙත්. ඒ ඒ කලාවිශෙෂයන්හි නැති ගුණාදිය එහි ඇතිලෙස කීම කලාවිරොධ යි. භූතසමූහයා ලොක නම් වේ, යම් භූතයෙකුට නැති දේ ඇති ලෙස කීම ලොක විරොධ යි. හෙතුවිද්‍යාත්මක හෙවත් යුක්තිමූලකශාස්ත්‍ර විශෙෂය න්‍යාය යි. යම් න්‍යායයෙක්හි නැති ස්වභාවයක් එහි ඇති ලෙස කීම න්‍යාය විරොධ යි; යම් ආගමයෙක්හි නැති ස්වභාවයක් එහි ඇතිලෙස කීම ආගම විරොධ යි.

මේ දොෂයන්ගේ විශෙෂවර්ණනාදිය සියබස්ලකර ආදියෙන් බලා දත හැකි බැවිනුත් ඒ වර්ණනාවන් කිරීමෙන් පොත මහත් වන බැවිනුත් වර්ණනය නොකරමු.

## ඉෂ්ටානිෂ්ටාධිකාරය.

නිමි.

---

## 12 ලකර අදියර.

"කාව්‍යශොභාකරාන් ධර්මානලඞ්කාරාන් ප්‍රචක්ෂතෙ"

යනු දණ්ඩ්‍යලඞ්කාර වචනහෙයින් කාව්‍යශොභාකර වූ ගුණ විශෙෂයෝ අලඞ්කාර නම් වෙත්. අත්වලලු පාවලලු ආදි ආභරණ විශෙෂ සත්ත්වශරීරය හොබවාලීමට ඉවහල් වන්නාක් මෙන් ඔවුහු ද කාව්‍යශරීරය හොබවාලීමට ඉවහල් වෙත්. සත්ත්ව ශරීරශොභාකරවූ අලඞ්කාරයන් මෙන් කාව්‍යශරීරශොභාකරවූ අලඞ්කාරයෝ ද අපමණ වෙත්. එහෙත් පෞරාණික සංස්කෘත කවීන් විසින් ලක්ෂ්‍යලක්ෂණයන් හා තදනුරූප නාමයන් දක්වීමෙන් උපමාරූපකාදි බොහෝ අලඞ්කාරවිශෙෂයන් සඞ්ග්‍රහ කොට නානාවිධ අලඞ්කාරග්‍රන්ථයෝ රචනාකරණලද්දහ. මේ සිදතෙහි වනාහි කාව්‍යශොභාකර වූ අලඞ්කාර ශාස්ත්‍රයකුදු ඇති බැව් පමණක් සඳහන් කරණු සඳහා බොහෝ සේ කාව්‍යවිෂයෙහි ප්‍රකට ව පෙණෙන උපමාලඞ්කාරාදි අලඞ්කාරලක්ෂණ එකොළොසක් පමණක් දක්වූහ. එබැවින් සවිස්තරභාවයෙන් අලඞ්කාර දනගණු කැමැත්තවුන් විසින් ඒ සංස්කෘතාලඞ්කාරග්‍රන්ථ හා සිය බස්ලකර ද පරිශීලනය කටයුතු යි. අලඞ්කාර ශාස්ත්‍රයෙහිදු

බොහෝ අලඞ්කාරයන්හි පැණෙන උපමා උපමෙය ලක්‍ෂණය හඳුන්වනු කැමැත්තාහු මෙහි පළමු කොට "සමහවිශටතැකු" යනාදිය කීහු.

---

උවම් උවමේ ලකුණු.

**ඞ. සමහවිශට තැකු-කිසිවක් උවම් නම් වේ,**
**ලබනුශෙ උවම් ඒ හා-උවමේ නමින් පළ වේ.**

ඞ. භා—සමභාවයට තර්කණය කරණලද වස්තුව උපමා නම් ද, ඒ සමභාවය ලබන වස්තුව උපමෙය නම් ද වේ.

වි—ලොකප්‍රසිද්ධ වූ චන්‍ද්‍ර සූර්‍ය පද්ම සාගර ආදීහු ඔවුනොවුන් හා සම කිරීම පිණිස කවීන් විසින් තර්කණය කරණලද වස්තූහු වෙත්. මෙහි ඒ වස්තු උපමාය යි ද, ලක්‍ෂණ සංස්ථානාදිවශයෙන් ඔවුන්ගේ සමානත්වය ලබන වස්තු උපමෙයය යි ද කීහු. එනම්-වර්ණසෞන්දර්‍ය්‍යාදියෙන් යුත් මුහුණක් දැක ඒ "මුහුණ සඳ වැනි" යයි කියති. මෙහි "සඳ" උපමා නම් ද "මුහුණ" උපමෙය නම් ද වේ. සෙස්ස ද මෙසේ දතයුතු යි.

තවද "උපමා, උපමෙය" ශබ්දයන්ගේ නිර්වචනාර්ථය සලකත් හොත් යමක් සම කිරීමට ඉවහල් වූ වස්තුව උපමාය යි ද, ඒ සමානත්වය ලබන වස්තුව උපමෙයය යි ද ගතයුතු වේ. "උපමා" ශබ්දය වෙනුවට "උපමාන" කියා ද ව්‍යවහාර කරණු ලැබේ.

උපමාලඞ්කාරවිෂයෙහි වනාහි "උපමානය, උපමෙයය, ඖපම්‍යවාචිපදය, සාධාරණධර්මය" යන අර්ථසතරෙක් ලැබේ. එහි සාධාරණ භාවයෙන් ප්‍රසිද්ධ වූ පදාර්ථය උපමාන යි. "සඳ වැනි මුහුණ" යන තන්හි සඳ සාධාරණභාවයෙන් ප්‍රසිද්ධ වූ පදාර්ථයක් බැවින් උපමාන යි. ඊට සම කිරීමට කවීන්ට ගොචර වූ පදාර්ථය උපමෙය යි. එනම්-මෙහි වූයේ මුහුණ යි. යම්පදයෙකින් ඒ දෙදෙනාගේ සමානත්වය පැවසේ නම් ඒ ඖපම්‍යවාචිපදය යි. එනම්-මෙහි වූයේ "වැනි" යන පදය යි. "වැනි, මෙන්, එව්, බඳු, අයුරු" යනාදිවශයෙන් ඒ පදයෝ බොහෝ වෙත්. උපමා උපමෙයදෙක්හි සඞ්ගත වූ ස්වභාවය සාධාරණ ධර්ම යි. ඒ මෙහි සඳ මුහුණ යන දෙක්හි වූ මනොහර භාවාදිය යි.

---

1 වස්තූපමාලඞ්කාරය.

**1. නුවන් ඉඳුවර වන්-ඉඳු වන් මුවන් සවැණිය,**
**සමදම් ඉති යෙදුසෙන්-මෙ විශු වත් උවම් නම්.**

1. භා—සර්වඥයන්වහන්සේගේ නෙත් සහල නිල්මහනෙල් පෙති දෙකක් වැනි ය. වක්‍ත්‍රය චන්ද්‍රයා වැනි ය යනු. මෙහි සමාන ධර්මයන් යෙදූහෙයින් මේ වස්තූපමාලඞ්කාර නමැයි කීහු.

වි—වස්තුවක් උපමා කොට ඇති අලඞ්කාරය "වත් උවම්" නම් වේ. මෙහි "ඉඳුවර, ඉඳු" යන දෙක උපමා යි. ඒ වස්තු දෙකෙකි. "නුවන්, වුවන්" දෙක උපමෙය යි. හෙද වස්තු දෙකෙකි. මෙහි උපමා උපමෙයයන්ගේ වර්ණසංස්ථානසෞන්දර්යාදිය සමාන ධර්ම යි. හෙවත් සාධාරණ ධර්ම යි. "වන්" යන්න ඖපම්‍යවාචි පද යි.

---

2 අද්භූතොපමාලඞ්කාරය.

**2. ඉඳු සැව් පිරිවැදූ-මහමෙර ලොව දූගුම් වන,**
**සුගතිඳු බඳ එබඳු වි-හඟනේ අබුතුවම් නම්.**

භා—දෙව්දුන්නෙන් වටකරණලද මහමෙරක් ලොකයෙහි ඇවිද්ද හොත් සුගතෙන්ද්‍රයන්වහන්සේගේ ශරීරය එබඳුය කියා හඟින්නේ නම් ඒ අද්භූතොපමා නම් වේ.

වි—"අබුතුයෙක් උවම් වූයේ යමක්හට ද ඒ=අබුතුවම්" යනු නිරුක්ති හෙයින් අද්භූතවූවක් හෙවත් පුදුමදෙයක් උපමාකොට ඇති අලඞ්කාරය අද්භූතොපමා නම් වේ. දෙව්දුන්නෙන් වටකළ මහමෙරක් ලොකයෙහි ඇවිදිතොත් ඒ අද්භූතයෙකි. මෙහි ඒ අද්භූතය උපමා වශයෙන් සැලකූහ. සුගත් සිරුර එහි උපමෙය යි. ශොභාවද්භාවාදියෙන් තත්සදෘශ බැවිනි. "බඳු" යනු ඖපම්‍ය වාචිපද යි.

---

3 ශ්ලෙෂොපමාලඞ්කාරය.

**3. පෙදෙන් අතින් හොත-දෙවනට සම ගුණ සොඳ,**
**පවසන සබඳ අරුතෙන්-එ වියූ සෙලෙසුවම් නම්.**

3. භා—පදයෙන් හෝ අර්ථයෙන් හෝ උපමා උපමෙය යන උභය වස්තුවට සමවූ ගුණ යොදා අර්ථයෙන් සම්බන්ධය පවසත් හොත් ඒ ශ්ලෙෂොපමා නමැ යි කීහු.

වි—වර්ණනාකරණ පදයන් උපමා උපමෙය දෙකම වැලඳ ගැණී මෙන් වූ අලඞ්කාරය ශ්ලෙෂොපමාලඞ්කාර නම් වේ. උපමා උපමෙය සම්බන්ධය ඇති වාක්‍යයෙක්හි ඒ දෙකෙන් එකක් වර්ණනා කිරීමට යෙදූ පද අනික් පදය ද වැලඳ ගතහොත් එයින් ශ්ලෙෂොපමාලඞ්කාරය සිද්ධ යි. ඒ වර්ණනාකරණ පදයන්ගේ වැලඳ

ගැණීම වනාහි ඇතැම්විට පදවශයෙන් ද, ඇතැම් විට අර්ථවශයෙන් ද වේ. පදවශයෙන් වැලඳ ගැණීම ඇති තන්හි ඒ වර්ණිතා කරණපදයෙන් උපමා පක්ෂයෙහි එක් අර්ථයෙක්ද, උපමේය පක්ෂයෙහි එයින් අන්‍යවූ අර්ථයෙක් ද පැවසේ. අර්ථවශයෙන් වැලඳ ගැණීම ඇතිතන්හි උපමාඋපමේය දෙපක්ෂයෙහි ම එක් අර්ථයෙක් පැවසේ. එහි පළමු කොට පදශෛලෂයට නිදසුන් දක්වන්නාහු "පියවිරුවඩා" යනාදිය කීහු.

a. පියවිරුවඩා-කොස්දඹු පත් ගුණයිනෝ,
දලපල්දුගැ ද සිටියේ-පැරදි පියුමැය සරණින්.

a හා—මෙහි "පියුම" උපමා යි. "(ඇය) සරණ" උපමේය යි. "පියවිරුවඩා කොස් දඹුපත් ගුණ" යන මොහු ඔවුන් වර්ණිතා කරණ පදයෝ යි. මොවුන් උපමා උපමේය . දෙක හා සම්බන්ධ වීමෙන් වූ අර්ථ සම්බන්ධය මෙසේ යි. එනම්-

"පියවිපැහැය වඩා කොෂ නාල පත්‍ර සූත්‍රයන්ගෙන් සඞ්ගත ව ජලපඞ්කදුර්ගයෙහි සිටි පියුම තෙමේ-ජනානුරාගය වඩා කොෂ්ඨ සෛන්‍ය වාහන ෂඩ්ගුණ යන මෙයින් සඞ්ගතවූ ඇයගේ චරණයෙන් පැරදුනේ ය යනු යි. මෙයින් පදශෛලෂබ්ධය සුගම යි. අර්ථශෛලෂයට නිදසුන් දක්වන්නාහු "සුවට" යනාදිය කීහු.

b. සුවිට කෙමෙනුලැගි-අඹරත රැඳි කොකුම්වන්,
තරුසුන් ඇලැ සපනුයේ-වම්නෙනෙ නොමලතික්රැස්.

b. හා—මෙහි "ලතික්රැස්" යනු උපමා යි. "වම්නෙන" යනු උපමේය යි. "සුවට කෙමෙනුලැගි අඹරතරැඳි කොකුම්වන්" යන මොහු ඔවුන් වර්ණිතා කරණ පදයෝ යි. මොවුන් උපමා උපමේය දෙක හා සම්බන්ධ වීමෙන් ලැබෙන අර්ථසම්බන්ධය මෙසේ යි. එනම්-

"ශීතකාලයෙහි තාගේ සතුරන් සන්සිඳුවන්නේ-ඉතාවට වූ ක්‍රමයෙන් උල්ලඞ්ඝිත වූ වස්ත්‍රාන්තරයෙහි රජිත වූ කුඞ්කුම වර්ණ වූ වනිතාවගේ පයොධරය නො වේ. ඒ ඉතා වට වූ ක්‍රමයෙන් උල්ලඞ්ඝිත වූ ආකාශාභ්‍යන්තරයෙහි රජිත වූ කුඞ්කුම වර්ණ වූ තරුණ සූර්‍ය්‍ය තෙමේ යි" යනු යි. මෙහි උපමා උපමේය දෙක්හි ම "සුවට, කෙමෙනුලැගි, කොකුම්වන්" යන මොවුහු අර්ථ වශයෙන් සම්බන්ධ යි. "අඹරත රැඳි" යන්න පදවශයෙන් සම්බන්ධ යි.

---

4 නිඥෙපමාලඞ්කාරය.

**4. සොම් කිරණ සුලු-රිවිසැඬ සයුරැ නනනුයේ.**
**කාහි නට ලොවැ උවම් වේ-මෙ විදූ නිදි උවම් නම්.**

4. භා—චන්ද්‍රයා ක්‍ෂය වන සුලු ය. සූර්‍ය්‍යයා චණ්ඩය. සාගරය සැලෙන්නේ ය. (එබැවින්) ලොකයෙහි කවරෙක් නුඹට සම වේ ද. මෙසේ කියන ලද්දේ නින්‍දෝපමා නම් වේ.

වි—නින්‍දා සහිත උපමා ඇති අලඞ්කාරය නින්‍දෝපමා නම් වේ. උපමාපදයට නින්‍දාකිරීමෙන් උපමෙයපදයාගේ උත්කෘෂ්ටගුණයක් පවසත් හොත් ඒ නින්‍දෝපමා යි කියනු ලැබේ. පූර්වපක්‍ෂලොස්වක් දිනයෙහි වූ සඳ අවපසලොස්වක් දින තෙක් කලාවෙන් කලාව ක්‍ෂය වන බැවින් ඒ පැවසීම ද, සූර්‍ය්‍යයා රශ්මියෙන් චණ්ඩ බැවින් ඒ පැවසීම ද, සාගරය කම්පාවන බැවින් ඒ පැවසීම ද, උපමා වූ ඒ චන්ද්‍ර සූර්‍ය්‍ය සාගරයන්ට නින්‍දා කිරීමෙකි. එයින් උපමෙය වස්තුව ඒ දොෂයන්ගෙන් විනිර්මුක්ත යයි ද, එයින් ම උපමෙයයාගේ උත්කෘෂ්ට භාවයෙක් ද සූචිත යි.

---

5 විරුද්ධොක්ත්‍යලඞ්කාරය:

**5. ඇති නැති කර හොත-නැති ගුණ කර ද ඇති සේ,**
**පවසන වෙසෙස් අරුතක්-එ වියු විරුදුවා නම්.**

**a. කණුදු නැති වනක්-නොදෙනු දනුමෝ පුවතින්,**
**මහබා නො බිඝ නැත්තෙහි-පරනට කෙසේ බිඝ දෙති.**

5. භා—විද්‍යමාන ගුණය අවිද්‍යමාන කොට හෝ අවිද්‍යමාන ගුණය විද්‍යමාන කොට හෝ විශෙෂාර්ථයක් පවසත් හොත් ඒ විරුද්ධොක්තිය යි කීහු. මීට නිදර්ශන දක්වන්නාහු "කණුදු" යනා' දිය කීහු.

a. භා—කණ්ඨීරජයා පවා අවිද්‍යමාන වස්තුවක් නුදුන් බැව් වෘත්තාන්තයෙන් අපි දනිමු. මහාභාග්‍ය ඇතියෙනි තමුන්නාන්සේ බිය නැත්තෙහි ය. අන්‍යයන්ට කෙසේ භයදානය කරන්නෙහි ද?.

වි—විරුද්ධ වූ වචන හෙවත් කීම් ඇති අලඞ්කාරය විරුදුවා හෙවත් විරුද්ධොක්ති නම් වේ.

ඇතැම් සංස්කෘතඅලඞ්කාරග්‍රන්ථයන්හි "විරොධ" යන නාම යෙන් ද, ඇතැම් තන්හි "විරොධාභාස" යන නමින් ද අලඞ්කාර යෙක් නිර්දිෂ්ට යි. නමින් වෙනස් වුවත් ඒ දෙක ම එකෙකි. "විරු දුවා" යන්න ද "විරොධාභාස" යන්නෙන් බිඳිය හැකි වේ. වාග්භ ටාලඞ්කාරයෙහි:—

"ආපාතෙ හි විරුද්ධත්වං යත්‍ර වාක්‍යෙ න තත්ත්වතඃ,
ශබ්දාර්ථකෘතමාභාති ස විරොධඃ ස්මෘතො යථා"

යනු කීහු. යම් වාක්‍යයෙක් ශ්‍රවණවිෂය වූ කෙණෙහි පමණක් ශබ්දයෙන් හෝ අර්ථයෙන් ජනිත වූ විරුද්ධත්වයක් පවසා නම්

පසුව තත්ත්වවශයෙන් බැලීමේදී එයින් විරුද්ධත්වයෙක් නොපැවසේ නම් ඒ විරෝධ යයි කියනලදී. යනු එහි අර්ථ යි.

මෙහි කියනලද්දේ ඇති ගුණ නැතිසැටියෙන් හෝ නැති ගුණ ඇති සැටියෙන් හෝ වෙසෙස් අරුතක් පැවසීමෙන් මේ අලඞ්කාරය සිඬ බව යි. මෙහි දක් වූ නිදර්ශනය මේ දෙවිදියට ම නොසම නොවේ. එනම්–"කණුදු නැතිවතක් නොදෙනු දනුමෝ"යී ශ්‍රවණ විෂය වූ කොණෙහි ඒ කීමෙහි විරුද්ධත්වයෙක් පැවසේ, එසේම ඒ ඇති ගුණයක් නැති සැටියෙන් කීමෙක් ද වේ. කුමක් හෙයින්ද යත්? කණ්රජයා මහාත්‍යාගියෙකු හෙයිනි. යථොක්ත වාක්‍යය කිකොණෙහි වැටහෙන අර්ථය නම්–කණ්රජයා පවා අන්‍යයන්ට නැති වස්තු ඔවුන්ට නොදෙන බව යි. එහෙත් මෙහි අපරාර්ථයට සම කොට තත්ත්වාර්ථය සලකන කල්හි වැටහෙන අර්ථය මහාත්‍යාගියකු වූ කණ්රජයා පවා තමාහට නැති වස්තුවක් අන්‍යයන්ට නොදෙන බව යි. අපරාර්ථය යම්කිසි රජකු පිළිබඳ වේ. පූර්වාර්ථය හා සම කොට එහි තත්ත්වාර්ථය ගත් කල්හි "එම්බා මහා භාග්‍යය ලොක ප්‍රසිඬ මහාත්‍යාගියකු වූ කණ්රජයා පවා නැති වස්තුවක් නොදෙන බව අපි දනිමු. එසේ ඇති කල්හි තමුන්නාන්සේ තම හට නැති ධිය අන්‍යයන්ට කෙසේ දෙන්නෙහි ද, යන අර්ථය පැවසේ. මෙයින් පැවසෙන විශෙෂාර්ථය නම්–භාග්‍යවතය පිළිබඳ පැවැත්ම සාමාන්‍ය දනයන්ගේ පැවැත්මට වඩා විශෙෂ බව යි. සාමාන්‍ය පැවැත්ම ඇතිදෙයක් මුත් නැති දෙයක් නොදිය හැකි බව යි. ධිය වනාහි තමහට නැතත් අන්‍යයන්ට දිය හැකි වේ. ඒ විශෙෂයෙකි. මේ රජහු ධිය ඇත්තකු බැව් පැවසීම ද විශෙෂාර්ථයක් සේ සැලකිය හැකි වේ. තවද මේ නිදර්ශනයෙන් පැවසෙන්නේ ඇති ගුණ නැති සැටියෙන් කීම පමණෙකි.

"කුණුදු" යනාදි ගීය පිළිබඳ අප අදහස සෙසු සන්නයන්හි අර්ථ කීමට හා අදහස දක්වීමට සම නොවේ. තත්ත්වඥයෝ විම සත්වා.

---

6 උභයභාෂාලඞ්කාරය.

**6. උතුරු පසුතුරු දෙන-දෙදෙනකු වදන් පිරියත,**
**වැණිඹවි සිරිත් වෙසෙසක්–පලවතුබබස් නම් වේ.**

6. භා—උත්තරප්‍රත්‍යුත්තර දෙන්නාවූ දෙදෙනෙකුන්ගේ කථාවසානයෙහි වර්ණනා කරණු කැමති චාරිත්‍ර විශෙෂයක් පල වත් හොත් ඒ උභයභාෂාලඞ්කාර නම් වේ. මීට නිදසුන් දක්වන් නාහු "සඳවණසිඳු" යනාදිය කීහු.

ය. සඳවණ සිඳු කිඹ කුඹුයොන නම සන — ග
කිවි සෙවෙන නොද වැලිනි ශල නොගො — ග
අරුණු කිහෙනි වී සොරළුන් ලැබෑ හුරි — ග
පැවිවනෙදෙසෑ යුද පතිරජ දිශ ඉසු — ග

ය. භා—මේ උභයභාෂාලඞ්කාර බැවින් දෙදෙනෙකු පිළිබිඳ කථාප්‍රවෘත්තියකින් සඞ්ගෘහිත යි. එනම්- සාගරය හා මහාවාලුකා නදිය පිළිබඳ කථාප්‍රවෘත්තියකින් සඞ්ගෘහිත යි.

මෙහි පළමු කොට සාගරය තෙමේ "සඳවණසිඳු" යන අන්‍යතදී නාමයෙකින් මහාවාලුකානදියට ආමන්ත්‍රණය කෙළේ යි. එනම් "සඞ්ඛ්‍යාවර්ණිතදී" යයි. නැවත මහා වලුකානදී තොමෝ "කුඹුයෙන" යි කීවාය හෙවත් "කුඹු යොන" යන නාමයෙන් ආමන්ත්‍රණය කළා ය. "කුඹු යොන්" යනු අගස්තියාට නමෙකි. මේ දෙකම දෙදෙනාගේ සතුරු නම් දෙකෙකි. සියලු ම නදීහු සාගරයාගේ භාර්‍ය්‍යාවෝ යි. එක් ස්වාමියෙකුගේ භාර්‍ය්‍යාවෝ බොහෝ වෙත් නම් ඔවුහු එකිනෙකාට සැතිරියෝ වෙත්. එබැවින් සඳවණසිඳුව මහාවාලුකා නදියගේ සැතිරියෙකි. අගස්තියා සාගරයේ ජලය හස්තපුටයට ගත්දා පටන් අගස්තියා සාගරයාගේ සතුරෙකි. එබැවින් සාගරය තෙමේ-තී සතුරුගේ නාමය කුමට කියෙහි දැයි ඇසීය. මහාවාලු කානදී තොමෝ ද—තෝත් මගේ සැතිරියගේ නාමය කුමට කියෙහි දැයි ඇසීය. නැවත සාගරය විචාරන්නේ (ඒ එසේ වේවා) එම්බා වාලුකානදිය තී ප්‍රකෘතියෙන් ගෞරවර්ණීය, කවර හෙයකින් අරුණවර්ණිවූයෙහි දැයි ඇසීය. සොරලයන්ගේ රුධිරය ලැබ එසේ වීම්ය යි මහාවාලුකානදිය උත්තර දුන්නීය. (එහෙනම්) ඒ පෙදෙසෙහි ප්‍රතිරාජජගදීශ්වරයා යුද්ධයක් පටන්ගත්තා වනැ යි කථාව අවසන් කෙළේ යි. මේ උභයභාෂාව්‍යාජයෙහි වර්ණනීය වූ ප්‍රතිරාජ්ජගදීශ්වර යුද්ධය පළ විය. එලෙසින් ඒ වමකතාරජතක බැවින් මේ උභයභාෂාලඞ්කාර යි.

වි— දෙදෙනෙකු පිළිබඳ උත්තර ප්‍රත්‍යුත්තර වශයෙන් කථා ප්‍රවෘත්තියක් ඇති අලඞ්කාරය උභයභාෂා නම් වේ.

මේ වනාහි අලඞ්කාරග්‍රන්ථයන්හි මේ නාමයෙන් නොව "අප්‍රස්තුතප්‍රශංසා" යන නාමයෙන් ව්‍යවහාර කරණ ලද්දේ ය. යම් අලඞ්කාරයෙකින් වර්ණිත නුවූවක්හුගේ වර්ණනයෙක් වේ නම් ඒ අප්‍රස්තුත ප්‍රශංසා නම් වේ. එහි භෙදයෝ බොහෝ වෙත්. මේ "සඳවණසිඳු" යනාදි නිදර්ශනයෙන් ද අප්‍රස්තුතවූ ප්‍රතිරාජජගදීශ්වරයන්ගේ යුද්ධාරම්භය වර්ණිත විය. මේ නිදසුන කුවලයානන්දයෙහි "කාලින්දි" යනාදි ශ්ලෝකය ආශ්‍රය කොට කරණලදි.

### 7 නින්‍දාප්‍රශංසාලඞ්කාරය

**7 ගරහා කිසිලෙසින්-පවසන උසාව අරුතක්,**
**එ වියූ නිඳිපසස් නම්-ලකරමහගතුගතුවෝ.**

**a. ගණුතු තොප කොරෙන්-මනහඳූරිඟසිලිඟ සැම්,**
**පරහු පිරිරූ නඳුරෙන්-එබැවිනි හගිම් මහබා.**

7 භා—එක්වාක්‍යයෙක්හි ම කිසිවිදියෙකින් නින්‍දාවක් කොට කිසිවිදියෙකින් උත්කෘෂ්ට අර්ථයක් පවසත් හොත් අලඞ්කාර මහාග්‍රන්ථයන් උගත් පඬුවෝ ඒ නින්‍දාප්‍රශංසාලඞ්කාරය යි කිහු. ඊට නිදසුන් දක්වන්නාහු ‘ගණුතු’ යනාදිය කිහු.

a. භා—මහත් බාහු ඇත්තෙනි ඛඞ්ගලතාවක්සේ ශ්‍යාමවර්ණ වූ චණ්ඩාලදූරිකාව යුෂ්මතුන් හස්තයෙන් ගත්කල්හි හෙවත් සරණපාවාගත් කල්හි ඒ හෙතුකොට ගෙණ අන්‍ය ඥාතිමිත්‍රාදීහු තා දුරින් දුරු කළහ යි සිතමි. මේ මෙහි එක්ලෙසකින් අර්ථ ගත හැකි ආකාරය යි මෙයින් නින්‍දාවෙක් පැවසේ.

“මහාභාග්‍ය ඇත්තෙනි හස්තිස්කන්ධ පවා විදාරණය කරන්නා වූ ශ්‍යාමවර්ණ ඛඞ්ගලතාව යුෂ්මත්හු හස්තයෙන් ගත්කල්හි ඒ හෙතු කොට ගෙණ සතුරෝ යුෂ්මත්හු සමීපයෙන් දුරුව ගියහ” යනු එක්ලෙසකින් අර්ථ ගතහැකි ආකාරය යි. මෙයින් ප්‍රශංසාවෙක් පැවසේ. එබැවින් මේ අලඞ්කාරය නින්‍දාප්‍රශංසා නම්.

වි—යම් අලඞ්කාරයෙක් නින්‍දාප්‍රශංසාදෙකෙන් යුක්ත වේ නම් ඒ නින්‍දාප්‍රශංසා යි කියනු ලැබේ. සංස්කෘත අලඞ්කාර ග්‍රන්ථයන්හි මේ අලඞ්කාරය “ව්‍යාජස්තුති” යන නාමයෙන් ව්‍යවහෘත යි. ඒ පවසන්නා වූ සාහිත්‍යසාරයෙහි- “නින්‍දාස්තුතිභ්‍යාංස්තුතන්‍යාදි සිඬිර් ව්‍යාජස්තුතිර්මතා” යනු කිහු. නින්‍දාමුඛයෙන් ස්තුතියක් හෝ ස්තුතිමුඛයෙන් නින්‍දාවෙක් හෝ වේ නම් ඒ ව්‍යාජස්තුති ය යි දන්නාලදී යනු එහි අදහස යි.

---

### 8. අන්‍යාලාපාලඞ්කාරය.

**8. නැසි ලෙහි තුබූ-කිසි හව් පළ කරණු වස්,**
**පවසන අනක් කරුණක්-එ වියූ අන් අලප් නම්.**

8. භා—සිත්හි ගුප්ත ව තුබුනා වූ කිසි අදහසක් ප්‍රකට කරණු පිණිස අන්‍ය වූ අර්ථයන්ගෙන් යුත් කරුණක් පවසත් හොත් ඒ අන්‍යාලාප නමැ යි කිහු.

වි—කථිතාර්ථයෙන් අන්‍ය වූ අර්ථයක් ඇති අලඞ්කාරය අන්අලප් නම් වේ. සංස්කෘත අලඞ්කාර ග්‍රන්ථයන්හි මේ අලඞ්කාරය සමාසෝක්ති අන්‍යෝක්ති යන නම් දෙකෙන් ම ව්‍යවහාර කරණ ලද්දේ ය. වාග්භටාලඞ්කාරයෙහි:-

'උච්‍යතෙ වක්තුමිෂ්ටස්‍ය-ප්‍රතීතිජනනක්‍ෂමම්,
සධර්මං සා සමාසෝක්ති-රන්‍යෝක්තිරභිධීයතෙ.

යනු කීහ. යම් තැනෙක්හි කියනු කැමති වස්තුවක්හු ගේ අව බොධය ඇති කිරීමට සමර්ථ වූ සමානධර්මවත් අන්වස්තුවෙක් කියනු ලැබේ නම් ඒ සමාසෝක්ති හෝ අන්‍යෝක්ති ය යි කියනු ලැබේ යනු එහි අර්ථ යි. මේ අලඞ්කාරවිශෙෂයෙහි දු උපමාඋපමෙය වශයෙක් ඇත්තේ වේ, ඉන් උපමෙය පක්‍ෂය ගුප්ත කටයුතු බැවින් ඒ සිත තබා ගෙණ ඒ හැහෙනලෙස උපමාපක්‍ෂය පමණක් කියන බැවින් මේ අලඞ්කාරයෙහි සංක්‍ෂිප්තභාවයෙක් ඇත්තේ වේ. එබැවින් සමාසෝක්ති ය යි කියන ලදී. මෙහි සිත්හි අදහස ඇඟවීමට අනෙකක් පවසන බැවින් "අන්‍යෝක්ති" ය යි ද කියන ලදී. "අන්‍යාලාප" යනු ද එම අර්ථ යි. ඊට නිදසුන් දක්වන්නාහු "මගා" යනාදිය කීහ.

a. මගා මැගී සුව විසලි — ම ලි ශා
තිලී දෙළි වැස එසලි — ම ලි ශා
බොම් විම් ලි තුඩු විලි — පි ලි ශා
පිලින් නෙලෙන් උලැගී බැලි — මි ලි ශා

a. භා—මාර්ගික වූ ගිරවෙක් විශාල වූ පුෂ්පයන් දැක තුටු වී ගටගත් දෙළදුක් ඇති ව ඒ ඉඹුල් රුකෙහි වැස පැසුනු ඉඹුල් පලෙක්හි මධුපානය කෙරෙමි යි කීයා තුඩ ප්‍රක්‍ෂෙප කෙළේ සුළ ඟින් උඩට නැංගා වූ පුළුන් මලාන ව බැලී ය.

වි—මෙහි උපමා පක්‍ෂය පමණෙක් නිර්දිෂ්ට යි. එයින් උපමෙය පක්‍ෂය හඟවනු ලැබේ. "මැගීසුව" යනු උපමා යි. මාර්ගිකවූ පුරුෂයෙකු උපමෙය විය යුතු යි. සෙස්ස ද ඒ පිළිවෙළින් සලකා ගතයුතු යි. මේ සඳහා වාග්භටාලඞ්කාරයෙහි:-

"මධුකර මා කුරු ශොකං-විචර කරීරද්‍රුමස්‍ය කුසුමෙෂු,
ක්‍ෂතතුහිනපාතදලිතා-කථං නු සා මාලතී මිලති" යි

නිදසුන් කරණලදී. එම්බා භ්‍රමරය ශොක නොකරව. දලුක් ගසේ . මල්වල හැසිරෙව, ඝන වූ හිමපතනයෙන් විනෂ්ට වූ ඒ මාලතීලතා තොමෝ නැවත කෙසේ එකතු වන්නී ද යනු එහි අර්ථ යි. මෙහි "මධුකර" යනු උපමා යි. කිසියම් පුරුෂයෙක් උපමෙය යි. "මාලතී" යනු උපමා යි, ඔහුගේ නෂ්ටකාන්තාව උපමෙය යි. "කලීරද්‍රුම පුෂ්ප" උපමා යි, අන්‍යස්ත්‍රීහු උපමෙය යි.

## 9. උත්ප්‍රෙක්‍ෂාලඞ්කාරය.

**9. පිණවි අයුරෙකින්-ඇසිරෙණ අරුත් වෙසෙසක්,**
**සලකනු අන් අයුරෙකින්-ඒ දනු උපේ ලකර.**

a. **අපොලනරිඟොර බිමැ-නනබඳුපෙද නොසැහැ මෙන්,**
**බිණෙනෙව් ගිනිනුවන්වන්-කනකන්කපල් පල්ලේ.**

9. **භා**—ප්‍රකෘතිආකාරයෙකින් පවත්නා අර්ථවිශෙෂයක් අන්‍ය ආකාරයෙකින් සලකනු ලැබේ නම් ඒ උත්ප්‍රෙක්‍ෂාලඞ්කාරය යි දතයුතු යි.

a. **භා**—පයෝධරාකාර වූ පන්දුව නොඉවසා මෙන් නැවත නැවත බිම ගසන කල්හි ඒ කාන්තාවගේ නයනාකාර වූ කර්ණෝත්පලය භීතියෙන් මෙන් පාදතලයෙහි වැටුනේ ය.

මෙහි ප්‍රකෘතිආකාරය නම් ක්‍රීඩාව සඳහා පන්දු ගසන්නා වූ කාන්තාවගේ කර්ණෝත්පලය චලිත වීමෙන් දෙපතුල ඇදවැටීම යි. ඒ බියෙන් මෙන් වැටුනේය යි කීම උත්ප්‍රෙක්‍ෂා යි. හෙවත් කවිහුගේ අන්‍යාකාරයෙකින් සැලකීම යි

**වි**—කවිහු විසින් යම් කිසිවක් හුගේ සිද්ධත්වය හැර අන්‍යාකාරයෙකින් සම්භාවනය කිරීම හෙවත් විතර්කණය කිරීම උත්ප්‍රෙක්‍ෂා නම් වේ. "හඟිම්, සිතම්, පිරික්සම්, විසිතෙම්, සැකියෙම්, මෙන්, එව්" යනාදිය උත්ප්‍රෙක්‍ෂාව්‍යඤ්ජක හෙවත් උත්ප්‍රෙක්‍ෂාව අඟවන පද යි. මේ උත්ප්‍රෙක්‍ෂාලඞ්කාරයෙහි ද උපමාඋපමෙයසම්බන්ධයෙකු දු ඇත්තේ ය. මෙහි උත්ප්‍රෙක්‍ෂාව්‍යඤ්ජකත්වයෙන් නිර්දිෂ්ට "මෙන්, එව්" යන පදයෝ උපමාව්‍යඤ්ජකයෝ ද වෙත්. එහි භෙදය නම්—උපමාලඞ්කාරයේ දී උපමාහුගේ සිද්ධත්වය අවශ්‍යයෙන් ඇති විය යුතු යි, උත්ප්‍රෙක්‍ෂාවෙහි දී උපමාහුගේ සාධ්‍යත්වය හෙවත් සිද්ධකටයුතු බව අවශ්‍යයෙන් ඇතිවිය යුතු යි. එබැවින් උත්ප්‍රෙක්‍ෂාවෙහි දි "මෙන්, එව්" ආදිය ක්‍රියාවාචක පදයක් සමග ද, උපමාවෙහි දී නාමපදයක් සමග ද යෙදේ.

---

## 10. රූපකාලඞ්කාරය.

**10. සමුදු එකනැ හෝ-අන්අරුත් රූහවිණෙකින්,**
**ඕකපා සුරෙන් පවසනා-එ වියු රූලකර නම්.**

10. **භා**—සමුදායාර්ථයෙක්හි හෝ එකාර්ථයෙක්හි වූ රූප ස්වභාවයක් කරණ කොට ගෙණ අන්‍ය වූ අර්ථයක් හෝ වස්තුවක් ආකාරයෙන් විකල්පනය කොට පවසත් හොත් ඒ රූපකාලඞ්කාර නමැ යි කීහු.

වි—රූපණය කිරීමෙන් හෙවත් එක් රූපයක් අනිකුදු රූපයක් හා සම කොට පැවසීමෙන් වූ අලඞ්කාරය රූපකාලඞ්කාර නම් වේ. මේ රූපකාලඞ්කාරය ද උපමාලඞ්කාරයෙහි ම විශෙෂයෙකි. උපමාලඞ්කාරය උපමාඋපමෙය දෙදෙනාගේ භෙදත්වයෙන් ද, රූපාලඞ්කාරය උපමාඋපමෙය දෙදෙනාගේ අභෙදත්වයෙන් ද සිඬ සි. එහෙයින් අලඞ්කාරශෙඛරයෙහි– "තද්‍රූපකමභෙදො යදුපමානොපමෙයයොඃ" යනු කිහු. යම් හෙයකින් උපමා උපමෙය දෙදෙනාගේ අභෙදයෙක් පැවසේ නම් ඒ රූපක නම් වේ යනු එහි අර්ථ සි. උපමා උපමෙය දෙදෙනාගේ වෙනස ඇතත් ඒ මුවහ කොට එක ස්වරූපයෙන් දැක්වීම රූපක නමැයි දතයුතු සි. "සඳ වැනි මුහුණ" කී කල්හි උපමාලඞ්කාර සි, මෙසේ කී කල්හි උපමා උපමෙය දෙදෙනාගේ එක දෙශයෙකින් වූ සාම්‍යයක් මුත් එකස්වරූපත්වයෙක් නො පැවසේ. "මුහුණ නමැති සඳ" හෝ "මුහුණ ම සඳ" හෝ යි කී කල්හි රූපකාලඞ්කාර සි. මෙසේ කී කල්හි උපමාඋපමෙය වූ "සඳ මුහුණ" යන දෙදෙනාගේ එක ස්වරූපත්වයෙක් පැවසේ. රූපකාලඞ්කාරභෙදයෝ බොහෝ වෙත්. ඔවුහු මෙහි නො පැවසිය හැකි වෙත්. මේ රූපකය වනාහි අර්ථ හෙවත් වස්තු සමූහයක් එකතු වීමෙන් හෝ එක් අර්ථයෙකින් හෙවත් වස්තුවෙකින් හෝ සෑදේ. මෙහි රූපකාලඞ්කාරයට නිදසුන් දක්වන්නාහු "යසපඬෙරොහු" යනාදිය කිහු.

**෧. යසපඬෙරොහු සුදුල්-කොමිසිසි කෙසුරු ගහරැස්,**
**සේවලා දල නල-කෙලෙස් දියවිල බිජී.**

අ. **හා**—චන්ද්‍ර නමැති කර්ණිකාවකින් ද, තාරකාසමූහ නමැති කෙශරයන්ගෙන් ද, සුදු වලා නමැති පත්‍රවලින් ද, කෛලාසපර්වත නමැති නාලයෙන් ද යුක්ත වූ ඔහුගේ මොනවට පිපියා වූ යසස් නමැති හෙලපියුම ලොක නමැති තඩාගයෙහි භ්‍රාජිත වී.

වි—මෙහි-"සිසිකොමි, ගහරැස්කෙසුරු, සේවලාදල, කෙලෙස්නල" යන මේ රූපකයන්ගේ සමුදායස්වභාවය ආකාරයෙන් පුණ්ඩරීකස්වරූපයට පමුණුවා ඒ පුණ්ඩරීකය වනාහි යස නමැති පඬෙර ය යි පවසනු වස් යස පඬෙර දෙක ද රූපණය කරණ ලද්දේ ය. එය භ්‍රාජිත වීමට ආධාර වූ ස්ථානය ද ආකාරයෙන් රූපණය කරන්නාහු ලොකය තඩාගාකාරයෙන් සලකා එකාර්ථ රූපකවශයෙන් "දියවිල" යි රූපණය කරණ ලද්දේ ය.

මේ රූපකාලඞකාරය පිළිබඳ භෙදයෝ බොහෝ සි, ඉන් "සමස්තරූපක, ව්‍යස්තරූපක" යයි ද භෙද දෙකෙකි. උපමාඋපමෙය දෙක සමාස කිරීමෙන් රූපණය කළහොත් ඒ සමස්තරූපක සි. නැත් නම් ව්‍යස්තරූපක සි. මෙහි "යසපඬෙර, සේවලාදල, දියවිල" යන තුණ සමස්තරූපක සි. "කොමි සිසි, කෙසුරු ගහරුස්, නල කෙලෙස්" යන තුණ ව්‍යස්තරූපක සි.

---

## 11. හෙතුරූපකාලඞකාරය.

**11. ගැඹුරෙන් සයුරු වී-සොමිගුණෙනිඳු රිවි තෙදින්,**
**ඇදුරු දිරි තිලිනෙන්-සුරතුරු මෙ හේරු නම්.**

11. පින්වත් තෙමේ ගැඹුරු ගුණය හෙතු කොට ගෙණ සාගරය විය, සෞම්‍යගුණය හෙතු කොට ගෙණ චන්‍ද්‍රයා විය, තෙජෝගුණය හෙතුකොට ගෙණ සූර්‍ය්‍යයා විය. ධෛර්‍ය්‍යගුණය හෙතුකොට ගෙණ පර්‍වතය විය. ත්‍යාගගුණය හෙතු කොට ගෙණ කප්රුක විය. මෙලෙසින් කියන ලද්දේ හෙතුරූපකාලඞකාර සි.

වි—හෙතු දක්වා උපමා උපමෙය රූපණයෙන් කළ අලඞකාරය හෙතුරූපක නම් වේ. මෙහි "සයුරු, ඉඳු, රිවි, ඇදුරු, සුරතුරු" යන මොහු උපමා වෙත්. යම් කිසි උතුමෙක් උපමෙය වේ. ඒ උතුමා ගැඹුරු ගුණය හෙතු කොට ගෙණ සාගරරූප කරණ ලද්දේ ය. සෙස්ස ද එලෙසින් දත යුතු සි.

රූපකාලඞකාර භෙදයෝ බොහෝ වෙත්, කාව්‍යාදර්ශයෙහි ඉන් විස්සෙක් නිදිෂ්ට සි. මෙහි සාමාන්‍යයෙන් රූපකාලඞකාරය ලකුණු කොට ඒ ලක්‍ෂණ අඟවනු සඳහා "යසපඬෙර" යනාදි නිදර්ශනය දක්වන ලද්දේ ය. ඒ නිදර්ශනය ද සමස්තරූපක ව්‍යස්තරූපක සමස්තව්‍යස්තරූපක යනාදි භෙද කීපයෙකින් සඞගෘහීත සි, පසුව "ගැඹුරෙන්" යනාදියෙන් හෙතුරූපකය නිදර්ශිත සි.

සිදත්සඟරාව වියරණවිදිවලින් සංක්‍ෂිප්ත වූවාක් මෙන් මෙසේ අලඞකාරවලිනුදු සංක්‍ෂෙප කරණ ලද්දේ ය.

අලඞකාරනිර්දෙශය මෙසින් අවසන් කොට දැන් කාව්‍යබන්ධන යන්ට තවත් උපදෙශයක් දෙන්නාහු "යඟ ඇ" යනාදිය කීහු

**a. යඟ ඇ වණන් මුත්-තුබු පද නොලා සඳවස්,**
**නොමලැඟැ පෙර කිවිසමා-සාවිබැඳ සසබඳ දෙවා.**

**ලකර අදිසර දෙලොස්වනු.**

ඝ. ඝා—ඡන්‍දස් පිණිස යකාර හකාරාදි වර්‍ණයන් හැර අන්‍ය වූ අර්‍ථශූන්‍ය පදයන් නොබහා පූර්‍වකවිසමය ද උල්ලඞඝනය නො කොට කව් බැඳ කිර්‍ත්තිශරීරය ජිවත් කරව්.

වි—පද්‍යබන්‍ධනයෙහිදී ඡන්‍දස් සඳහා හෙවත් ඒ ඒ තන්හි ඌනපූරණස්ථානයන් සඳහා සිය් පද යොදන්නට වන බැවින් එසේ යොදන්නට වූ තන්හි "ය, හ" ආදි වර්‍ණයන් මූත් අර්‍ථශූන්‍ය පදයන් යෙදීම මෙයින් වළක්වන ලද්දේ ය. භාෂාවෙහි "ය හු" ආදි ඇතැම් නිපාතයෝ පදපූරණාර්‍ථ වෙත්. ඡන්‍දස පිළිබඳව වෙන විදියකින් පිරිමසා නොලිය හැකි ඌනතාවයක් වූ තන්හි ඒ නිපාතයෙකින් ඒ පිරිමසා ගතයුතු බැව් මෙයින් සූචිතයි.

1 අ ග පිපි මල්මලිගිය ලිය කැ ලේ ඝා
ව ග බැඳ හෙන රජහස පුල් වි ලේ ඝා
ල ග සිටිතුරු ගිලිහුනු රෙනවු ලේ ඝා
ම ග බැස ගව පළ හෙල වැලි තෙ ලේ ඝා

| | | | | | |
|---|---|---|---|---|---|
| 2 සිල් සෙනහ | හු | යස සෙමෙර | හු | මෙත් සත | හු |
| ගුණබරණ | හු | දම් කිරුළ | හු | නැණකග | හු |
| බුන් අරග | හු | තද තෙදණ | හු | සිරි පුර | හු |
| සුර ඇදුර | හු | හැර කවර | හු | වණිති ඔ | හු |

මෙහි 'ඝා හු' දෙක පදපූරණ වශයෙන් යොදනලදී, මෙලෙසින් කව්සමයෙහි පදපූරණ වශයෙන් යොදන ලද ප්‍රයොගයෝ බොහෝ වෙත්. ඔවුහු කව්සමයෙන් දතයුතුයි.

## අලඞකාරාධිකාරය

නිමි.

---

මෙතෙකින් අලඞකාරකාණ්ඩය අවසන් කොට ග්‍රන්‍ථකරණය පිළිබඳ වූ වෘත්තාන්තමාත්‍රයක් පවසනු වස් "මැපෙළ" යනාදිය කීහු.

1 මැපෙළ පමණ සිඹි-කිව්මන් දනන් පසසන,
ගරහන ශළිඳු කාම් කිම්-පඬුවෝ ම මෙහි පමණෝ.

2 දුහුනදනහට මුත්-මෙ කුඩු සිදතින් විශතිනි,
පිරියන්නට නැනදනක්-මෙහි කළ මතැනැ තුස්වා.

3 දකාණලකා සිශල්-බුජමහවුරෙනි රක්නා,
දෙදෙ රදළ ශම් විමනගැ-පතිරජදෙව්සැරදෙනෝ.

4 අදරෙන් ශදන බහු-විබතැ නිරණ සිශබසැ,
පල කරණු වස් මෙ සොලෙම්-කුළුණෙන් සිදත්සඟරා.

1. භා—මාත්‍රෘකාපාලිය පමණක් දැනගත්තා වූ හෙවත් ග්‍රන්ථෛකදෙශමාත්‍රයක් දැනගත්තා වූ පණ්ඩිතම්මන්‍යජනයන් (මේ කෘතිය ගැණ) ප්‍රශංසා කළත් නින්‍දා කළත් ඉන් කිනම් වැඩෙක් හෝ අවැඩෙක් ද, මේ කෘතියෙහි පමණවූවෝ පණ්ඩිතයෝ මැයි, පණ්ඩිතම්මන්‍යයෝ නොවෙති යි සේයි.

2. ව්‍යක්තයෙහි මේ කුඩා සිදත්සඟරාවෙන් ආධුනික ජනයාට මුත් සමර්ථයන්ට ප්‍රයොජනයක් නැතත් මේ ග්‍රන්ථ සම්පාදනයෙහි ලා මා කළ උත්සාහයෙහි තුටු වව්.

3. මුලු දක්ෂිණ ලඞ්කාව බාහු නමැති ප්‍රාකාරයෙන් රක්ෂණය කරන්නා වූ රදළගම්වංශ නමැති විමානාග්‍රයෙහි ධ්වජයෙක් වූ ප්‍රතිරාජ දෙව තෙමේ චිරකාලයක් ජීවත් වේවා.

4. ඒ ප්‍රතිරාජදෙවයන් ආදරයෙන් ආයාචනය කළ කල්හි ස්වකීය සිංහල භාෂාවෙහි විභක්ත්‍යාදීන්ගේ නිර්ණය ප්‍රකාශකරණු පිණිස මේ සිද්ධාන්තසඞ්ග්‍රහය කාරුණාවෙන් රචනා කෙළෙමි.

---

කතෘනාම ශාස්ත්‍රනාමගර්භචක්‍රය.

මෙහි ප දනු ව ග දැන විෂරණ සි ඳුබ ජ මි න
නිතැ ති නිම ත පසිඳ විනඩන ද පිනි පි ලෙ න
ශ ස . ර ලදි ගෙ ලබෙන විනරප ත සයු රු මෙ න
නග නු මෙලක නිති දිශ දදන නර නතමි න

**සිදත්සඟරාව නිමි.**

භා - මේ සිද්ධාන්ත සඞ්ග්‍රහයෙහි අඞ්ගසූත්‍ර උපාඞ්ගසූත්‍රයන් දැන ව්‍යාකරණ නදීන් භජනය කරමින් නිතර දපියෙන් උඩත වන්නාවූ විතණ්ඩවාදීන්ගේ මානය ප්‍රච්ඡින්න කොට විස්තරප්‍රාප්ත සාගරය මෙන් අප්‍රමාණ මත්ස්‍යයන් ඇති ඥෙහෝ නොහොත් අප්‍රමාණ ප්‍රඥ ඇති දිශාවන්හි එළඹෙන කීර්ති නමැති රල ඇති ජන තෙමේ නිරන්තරයෙන් මේ ලඞ්කාවෙහි ජයධ්වජය ඔසවන්නේ ය.

මේ වනාහි චිත්‍රාලඞ්කාරාන්තර්ගත වූ චක්‍රබන්ධනයෙකි, මීට ෂඩරචක්‍ර යයි කියනු ලැබේ. මෙහි ''පතිරජපිරුවනගෙසිදත'' යනුවෙන් කතෘනාම ශාස්ත්‍රනාම දෙක අක්ෂර වින්‍යාසක්‍රමයෙකින් පළකරණ ලද්දේ ය. ඒ වනාහි මේ කවෙහි යොදතිබෙන ආකාරයෙන් දතයුතු යි.

**විස්තරගැටපදවිවරණ සහිත**

## සිදත්සඟරා භාවසන්නය

**නිමි.**

---

**ශ්‍රී රස්තු.**



